

සම්පිණ්ඩිතමහානිදාන

නම්

පැරණි බුදුසිරිත.

සම්පිණ්ඩිතමහානිදන නම්

පැරණිබුදුසිරිත

කොල්ලුපිටියේ මහින්ද සඞ්ඝරක්ඛිත ස්ථවිර

සම්පිණ්ඩිතමහානිදන නම්
පැරණිබුදුසිරිත

අනුවාදය

කොල්ලුපිටියේ මහින්ද සඞ්ඝරක්ඛිත ස්ථවිර
බී.ඒ. ගෞරව (කැලණිය) පී.එච්.ඩී (දිල්ලි)
කැලණිය විශ්වවිද්‍යාලය පාළි හා බෞද්ධඅංශයේ
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
ශ්‍රීකල්‍යාණී රාජමහාවිහාරාධිපති

2549
2006

සාගරූපම සෙනෙහසින්
මා හදා වඩා සසුනට පුද කළ
මාගේ
මැණියන් හා
පියාණන් වෙත

පටුන

සංඥාපනය	I – XV
ස්තුතිය	XVII
අතිදූරදූරෙ නිදානය	1 – 6
අතිදූරෙ නිදානය	6 – 18
දූරෙ නිදානය	18 – 102
අවිදූරෙ නිදානය	102 – 151
පරිනිර්වාණ කතාව	227 – 274
සංගීති කතා	274 – 285
මහාකාශ්‍යප තෙරුන් වහන්සේගේ පරිනිර්වාණ කතාව	285 – 293
අනාගත කතා	294 – 321
ධම්මපිණ්ඩය	322 – 398

සංශුද්ධපනය

සමපිණ්ඩිතමහානිදානය වර්තමානයෙහි පාලිභාෂාසාහිත්‍ය විද්වතුන් අතර අප්‍රකට මේතාක් මුද්‍රණයෙන් අප්‍රකාශිත පුස්කොළ ග්‍රන්ථවලට පමණක් සීමාවූ පෞරාණික පාලිග්‍රන්ථයකි. එහි පුස්කොළ පිටපත් ගණනාවක් තිබෙන බවට තොරතුරු සටහන්ව තිබේ. වර්ෂ 1959 දී පේරාදෙණිය විශ්වවිද්‍යාලය පුස්තකාලයාධිපති කේ.ඩී. සෝමදාස මහතා විසින් සම්පාදිත, සංස්කෘතික දෙපාර්තමේන්තුව මගින් ප්‍රකාශිත "ලංකාවේ පුස්කොළ පොත් නාමාවලිය" නම් ප්‍රකාශනයෙහි ඒ බව සඳහන්ය. එයට ඇතුළත්ව නැති කෞතුකාගාර පුස්තකාලයෙහි අංක 1450-AO.9, 1451-6N.4, 1452-5.8 යටතේ පිටපත් තුනක් ද වෙයි. නමුත් සමපිණ්ඩිතනිදාන නමින් ගත හැක්කේ අංක 1450-AO.9 පිටපත පමණකි. එකසමානව ලියා ඇති කුඩාප්‍රමාණයේ සෙසු පිටපත් දෙක සමපිණ්ඩිතනිදාන අනාගතකථා නම් පරිච්ඡේදයෙන් උපුටා ගත් ගාථාපන්තියක් වටා ලියූ සිංහල අර්ථවර්ණනයකි.

පැල්මඩුල්ල රූපඅරුණ පුරාණ පිරිවෙන් විහාරාධිපති බෙංගමුවේ ධම්මදින්න නායක සවාමීන්ද්‍රයන් වහන්සේ අනාරාධිතව සිය කැමැත්තෙන් එහි පුස්තකාලය සතු පිටපත අප අතට පත් කොට ඒ පිළිබඳ විමර්ශනයක් කරන ලෙස දන්වූහ. එය කියවා බැලීමෙන් අපට පෙනී ගියේ එය පර්යේෂණාත්මක ඇගයීමකට ලක් කොට පාලි උගතුන් වෙතින් ගිලිහී යන්නට නොදී මුද්‍රණයෙන් ප්‍රකාශයට පත් කළ යුතු බවයි. ඒ සඳහා ප්‍රමාණවත් පිටපත් කීපයක් සොයා ගැනීම අනිවාර්ය අත්‍යවශ්‍ය කරුණක් බැවින් ඒ සඳහා ගත් උත්සාහය ප්‍රමාණවත් තරම් සාර්ථක නොවූයේ නොඑක් ගැටළු නිසාය.

මහනුවර හයගිරි විජයසුන්දරාරාමයේ පිටපත අපට ඉතා පහසුවෙන් ලබාගත හැකිවිය. කදිම නිර්මාණයක් වූ ඒ පොත ලියා ඇත්තේ කාම්බෝජ අක්ෂරයෙනි. කාම්බෝජ භික්ෂූන් වහන්සේ

කෙනකු ලවා කියවා බැලූ නමුත් එය අසම්පූර්ණ පිටපතකි. හඟුරන්කෙත පොතේ ආරම්භය සහ අවසානය පැල්මඬුල්ල පොතට සමානය. සම්පූර්ණය. නමුත් ලබා ගත නොහැකි විය. දොඩන්දූව ශෛලබිම්බාරාමයේ සහ කොස්ගොඩ සිරිනිවෙසාරාමයේ පිටපත් සොයා ගිය විට දැනගන්නට ලැබුණේ ඒවා අසථානගතව ඇති බවයි. මීඇල්ල ගණේගොඩ පුරාණ විහාරයේ පිටපත අසම්පූර්ණ බව සඳහන්ය. මේ නිසා පැල්මඬුල්ල පිටපතට අතිරේකව ලබා ගත හැකි වූයේ කහව තෙල්වත්ත සිරිසොහනාරාමයේ පිටපත පමණකි. ශාසත්‍රීය තුලනයක් සඳහා මෙය කිසිසේත් ප්‍රමාණවත් නොවෙතත් පොත ආරක්ෂා කිරීම අරභයා මේ මට්ටමින් හෝ එළිදැක්වීමට අදහස් කළෙමු. පිටපත් කරන්නවුන් අතින් සිදුවිණැයි සිතිය හැකි අඩුවැඩිකම් සහ අක්ෂර විනාසයේ වෙනස්කම් හැරුණු විට දෙපොත සමානය. එනිසාම ආකුලව්‍යාකුලව ගියතැන් සමහරක් නිරාකරණය කර ගැනීම බෙහෙවින් උගහටය. ඒ හේතුවෙන් ග්‍රන්ථාගත විෂයපථය ග්‍රහණය කර ගැනීමට ප්‍රබල බාධාවක් නොමැති බව ද කිව යුතුය.

සම්පිණ්ඩිතමහානිදානය ගැන අපට හමු වන පැරණිම සටහන මහනුවර යුගයට අයත්ය. වැලිවිට ශ්‍රීසරණංකර සඞ්ඝරාජයන් වහන්සේගේ ප්‍රධාන ශිෂ්‍යවරයකු වූ මල්වතු මහාවිහාර පාර්ශ්වයේ ප්‍රථම මහානායක ධුරන්ධර තිබ්බටුවාවේ ශ්‍රීසිද්ධාර්ථ බුද්ධරක්ෂිත මාහිමියෝ සිය ශ්‍රීසද්ධර්මාවවාදසංග්‍රහය නම් සිංහල ගද්‍යකෘතියෙහි මෙසේ සඳහන් කරති. "ශ්‍රද්ධාබුද්ධි සම්පන්න සත්පුරුෂ ජනයන්ගේ උත්සාහ වඩවනු පිණිස සොළසැකි නිදානයෙහි හා සොදත්තක-නිදානයෙහි ද මහාසම්පිණ්ඩිතනිදානයෙහි ද ආ ක්‍රමයෙන් එම බාහිරනිදානාදි මෙහි දැක්විය යුතු විසිතුරු නිදාන කතාවන් සංග්‍රහ කොට දක්වම්හ."[1] උන්වහන්සේ එම කෘතියට සම්පිණ්ඩිත-මහානිදානයෙන් සමහර කොටස් ද උපුටාගෙන තිබේ.

1. ශ්‍රීසද්ධර්මාවවාදසංග්‍රහය - 24 පිට. පණ්ඩිත වේරගොඩ අමරමොලි නාහිමිසංස්කරණය 1956.

මෑත භාගයෙහි මේ ග්‍රන්ථය පිළිබඳව සටහනක් තබා ඇත්තේ පාලිභාෂාසාහිත්‍ය විශාරදයකු වූ අගගමහාපණ්ඩිත මහාචාර්ය පොල්වත්තේ ශ්‍රීබුද්ධදත්ත නායක සාමීන්ද්‍රයන් වහන්සේ විසිනි. සම්පිණ්ඩිතමහානිදාන පුස්කොළපොත් පිටපතක් කියවා ඒ පිළිබඳ අගතා විස්තරයක් සාකීය "පාළිසාහිත්‍යය" නම් කෘතියෙහි ඇතුළත් කොට තිබේ.[2] ඒ අනුව ජිනකාලමාලි නම් පාලිපද්‍යග්‍රන්ථයෙහි නිදානකතාව සම්පිණ්ඩිතමහානිදානකතාවට බෙහෙවින් සමානය. මෙහි පිටපත් බුරුම රටෙහි ද විද්‍යමානය. අපට හමුවන යථොක්ත තොරතුරුවලින් අනාවරණය වන්නේ මෙම සම්භාව්‍ය පාලි කෘතිය අතීතයෙහි බුරුමය, කාම්බෝජය, ශ්‍රීලංකාව වැනි බෞද්ධරටවල ප්‍රචලිතව පවතින්නට ඇති බවයි.

යො වීසතාසඞ්ඛ්‍යකප්පානි
සතසහස්සාධිකෙපි ච
ඛෙදං ගතො ලොකහිතාය නාථො
බුද්ධස්ස තස්සෙව නමො කරොමි

බුද්ධස්ස ධම්මස්ස ගණුත්තමස්ස
නමො කරිත්වා රතනත්තයානං
සම්පිණ්ඩිතං නාම මහානිදානං
වක්ඛාමි ආචරිය පරම්පරෙහි

යනු සම්පිණ්ඩිතමහානිදානයෙහි ආරම්භක පද්‍යයුගමයයි. පැරණි ගත්කතුවරයන්ගේ සම්ප්‍රදායානුගත ඉෂ්ටදෙවතා නමස්කාරය වශයෙන් කතුවරයා තෙරුවන් නැමද ආචාර්ය පරම්පරානුසාරයෙන් සම්පිණ්ඩිතමහානිදානය ප්‍රකාශ කරමියි එම ගාථා දෙකෙන් පවසයි. ඒ සමගින් ග්‍රන්ථනාමයත් එහි ආකෘතික සාරූපයත් පැවසේ. සම්පිණ්ඩිතමහානිදාන යනු ග්‍රන්ථනාමයයි. එය ආචාර්ය පරම්පරානුසාරයෙන් දැක්වීම ආකෘතියෙහි සාරූපයයි.

2. පාලිසාහිත්‍යය II කාණ්ඩය 454-57 පිටු
පොල්වත්තේ බුද්ධදත්ත නාහිමි 1952

නි පූර්ව දා ධාතුවෙන් නිර්මාණය වූ නිදාන යන පාලිශබ්දය අර්ථ රාශියක වැටේ. හේතුව, පදනම, මූලාශ්‍රය, සම්භවය, ජාතක ප්‍රස්තාවනාව, විෂය, අරමුණ, සන්දර්භය, උත්පත්තිය ආදි වශයෙනි. ජාතකට්ඨකථා නිදානවණ්ණනාවෙහි සහ බුද්ධවංසට්ඨකථා නිදානකථාවෙහි දක්වා ඇත්තේ බෝසත්සිරිත හා බුදුසිරිතයි. ඒ අනුව නිදාන යන්නෙන් මේ බෝසත්සිරිත හා බුදුසිරිත ගැනේ. බොධිසත්ත, බුද්ධ සංකල්පවල පදනම සන්දර්භය උපත පිළිබඳ විස්තර විවරණ ගෙනහැර දැක්වීම පාලි නිදානයන්හි අභිප්‍රෙතාර්ථය වන්නට ඇතැයි සිතේ.

නිදානයෙහි ප්‍රභෙද, කාලපරිවෙඡ්දය, විෂය පථය ආදියෙහි දුරාතීතයෙහි පටන් බෞද්ධනිකායයන් අතර විවිධ මතිමතාන්තර පැවති බව දක්නට ලැබේ. විශේෂයෙන් මහායාන ථෙරවාද සම්ප්‍රදායයන් අතර එකිනෙකට වෙනස් සම්භාවනා පවතී. එකී මත සම්භාවනා ඔවුන් අතර සංවර්ධනය වෙමින් ව්‍යාප්තියට පත් ආකාරය ද දක්නට ලැබේ. කෙසේ හෝ නොඑක් ආචාර්ය පරම්පරා මඟින් පිළිගත් නිදානයේ ප්‍රභෙද සහ කාලනියමයන් කැටිකොට සම්පිණ්ඩිතමහානිදානය සකස් කොට ඇති වග එහි නාමයෙන්ම පෙනේ. එක් ඇදුරු පරපුරකට පමණක් අයත් මතයක නොපිහිටා කතුවරයා ආරම්භක පද්‍යයෙහි යෙදූ ආචරියපරම්පරෙහි යන බහුවචන පදයට අනුරූපව ආචාර්ය පරම්පරාවල මත සම්පිණ්ඩනය කොට මේ නිදානකතාව සංකලනය කොට තිබේ. සම්පිණ්ඩිත යන අතීත කෘදන්ත පදයෙන් එකරාශිකළ (=brought together) ප්‍රතිසංස්කෘත (=restored) එකාබද්ධ (=Compact) යන අරුත් පැවෙසයි.[3] ඒ අනුව මෙම ග්‍රන්ථය කෙවලමතවාදයක අනුකරණයක් නොව මතවාද සංකලනයෙන් කළ නිදහස් නිර්මාණයක් සේ පිළිගත හැකිය.

අප විසින් විමර්ශනයට භාජනය කරන ලද සම්පිණ්ඩිතම-

3. Pali-English Dictionary (P.T.S.) p.692- 1956

මහානිදානයෙහි අවසන් පරිච්ඡේදය පසුව යා කරන ලද චෙතමම ධර්ම නිබන්ධයකැයි සිතිය හැකිය. සන්තිකෙනිදාන විවරණය කතුවරයාගේ උද්දෙසය ඉක්මවා යමින් ධාතුවිභාජනකථා සඞ්ගීතිකථා මහාකස්සපත්‍ථෙර-පරිනිබ්බානකථා අනාගතකථා යන පරිච්ඡේද නිසා ග්‍රන්ථය ක්‍රමයෙන් සංවර්ධනය වී ඇති බවක් පෙන්වයි. ධම්මපිණ්ඩ නමින් හැඳින්විය හැකි පරිච්ඡේදයෙන් පසු නැවත නමස්කාරපාඨය ගෙන පදයෙන් පදය අර්ථකථනයක යෙදෙයි. අනතුරුව දක්වා ඇති නමස්කාර ගාථාවෙන් සම්බුද්ධ පරම්පරා ගත සාක්‍යත්‍තකීමහානිදානය පවසමී කියැවෙයි. එහෙත් එවැන්නක් නොමැති අතර සම්පිණ්ඩිතනිදානකථා නිට්ඨිතා යන පරිසමාප්ති පාඨය ලියා ඇත.

ග්‍රන්ථ පරිසමාප්තියක් නොව සමාරම්භයක් අඟවන ප්‍රකාශයකින් පසු එකවරටම මෙසේ සටහන් කළේ මන්දැයි පැහැදිලි නැත. සම්පිණ්ඩිතමහානිදානයට පසු පසුව කොටස් එකතුවීමෙන් සංවර්ධනය වූ බවට එය එක් ඉඟියක් බඳුය. කෙසේ නමුත් අවසන්වරට ප්‍රකාශ කරන්ට උද්දෙසිත සාක්‍යත්‍තකීනිදානය සොත්‍යත්‍ථකී නිදානය ද ශ්‍රීසද්ධර්මාවවාදසංග්‍රහයෙහි සඳහන් සොදත්‍තකනිදානය දැයි අපි නොදනිමු. කෙසේ නමුත් සම්පිණ්ඩිතමහානිදාන පරිසමාප්තිය තවදුරටත් විචාරණීය වන්නේ අපගේ මහාවංසය මෙන් වරින්වර සංවර්ධනයට පත්කරන ලද්දක්දැයි අනුමාන කළහැකි නිසාය.

නිදාන ප්‍රභෙදවලින් ඇරඹෙන සම්පිණ්ඩිතමහානිදානයෙහි පළමුවෙන්ම දූරෙනිදාන අවිදූරෙ නිදාන සන්තිකෙ නිදාන වශයෙන් පොරාණාචාර්යවරු නිදානය ත්‍රිවිධ භෙදයෙන් කැමති වෙති සඳහන්ය. නමුත් පොරාණාචාර්යවරයන් ගැන කිසිවක් සඳහන් නොවෙයි. බුද්ධඝොස, ධම්මපාල යන අට්ඨකථාචාර්යවරයන් දක්වා ඇත්තේ ද නිදානය තෙවැදෑරුම් බව යි.[4] පොරාණකත්‍ථෙරා, පුබ්බාචරියා, පොරාණාචරියා, අට්ඨකථාචරියා යනුවෙන්

4. ජාතකට්ඨකථා (හේ.මු) 1 පිට 1926
මධුරත්‍ථවිලාසිනී (හේ.මු.) 4 පිට 1922

අට්ඨකථාවන්හි සඳහන් නාම පිළිබඳ පර්යේෂණයෙහි යෙදෙමින් ඊ.ඩබ්. අදිකාරම් මහතා "යෙ පොරාණාචරියා තෙ යෙව අට්ඨකථාචරියා" යන ගන්ධවංස පාඨය ද සහාය කොට ගනිමින් අටුවාචාරීන් හා පොරාණයන් අතර සමීප සබඳතාවක් පැවති බව සිතිය හැකිය යි කියයි.[5] අටුවාවලට ඇතුළත්නොවී විවිධ නිකායයන්හි මුඛපරම්පරාගතව පැවත ආ විස්තර ව්‍යාඛ්‍යානවල ආචාර්යවරුන් බව මහාචාර්ය ජී.පී. මලලසේකර මහතාගේ මතය වේ.[6] කෙසේ නමුත් පොරාණාචාර්යවරුන් සහ අට්ඨකථාචාර්යවරුන් අතර ඇත්තේ සමාන බවක් නම් නිදානයෙහි ත්‍රිවිධ භෙදය දෙපක්ෂයම පිළිගත් මතයකි. බුද්ධඝොස ධම්මපාල අට්ඨකථාචාර්යවරුන් අටුවා සම්පාදනය කරන ලද්දේ මහාවිහාර මතයට අනුරූපව නම් මහාවිහාරයෙහි මෙන්ම අටුවාචාරීන්ගේත් පොරාණාචාර්යන්ගේත් ත්‍රිවිධ භෙදය ථෙරවාදී මතය සේ පිළිගත හැකිය.

දෙවැනිව වෙනත් ආචාර්ය වරුන්ගේ පිළිගැනීමට අනුව අතිදූරෙනිදාන දූරෙනිදාන අවිදූරෙ නිදාන සන්තිකෙනිදාන වශයෙන් නිදානයෙහි චතුර්විධ භෙදය ඉදිරිපත් කොට තිබේ. එහිලා පොරාණාචාර්ය මතයෙහි ප්‍රතික්ෂෙප කිරීමක් හෝ වෙනස් කිරීමක් නොමැත. පොරාණාචාර්ය මතයෙහි මූලට අතිදූරෙනිදාන නමින් අතිරේක භෙදයක් එකතු කිරීම පමණක් සිදුවී තිබේ. එමඟින් බෝසත් චර්යාවේ කාලය දීපඞ්කරබුද්ධ කාලයෙන් තවත් ඈතට විහිදෙයි. එම මතයෙහි අපරෙ ආචරියා යනු හඳුනා ගැනීමට සාධකයක් නොමැත. තෙවනුව දක්වා ඇත්තේ නිදානයෙහි පංචවිධ භෙදයයි. එය කාගේ මතයදැයි හඳුනා ගැනීමටද කිසිදු ඉඟියක් නොමැත. මෙහිදී ද ත්‍රිවිධභෙදය හෝ චතුර්විධ භෙදය වෙනස්වීමකට හෝ ප්‍රතික්ෂෙප කිරීමට ලක් නොවෙයි. චතුර්විධභෙදයෙහි මූලට අතිදූරදූරෙ නිදාන නමින් අතිරේක භෙදයක් එක්වෙයි. එනිසා බෝසත් සිරිත අතිදූරෙ නිදානයටත් වඩා ඈත අතීතයට විහිදෙයි.

5. පැරණි ලක්දිව බෞද්ධ ඉතිහාසය 63-66 පිටු.
ඊ.ඩබ්. අදිකාරම් (දෙවන මුද්‍රණය) 2003

6. ලංකා පාලිසාහිත්‍යය 1. අධොලිපිය 63 පිට.
ගුණපාලමලලසේකර (ප්‍රථම සිංහල මුද්‍රණය) 1965

ත්‍රිවිධ භෙදයට අනුව බෝසත් සිරිත දීපඞ්කර බුද්ධකාලයෙන් ඇරඹෙයි. එතැන් සිට බුදුවීම තෙක් කාලය සාරාසංඛ්‍ය කල්ප ලක්ෂයකි. චතුර්විධ භෙදයට අනුව බෝසත් සිරිත ඇරඹෙනුයේ පුරාණසක්‍යමුනි බුද්ධ කාලයෙනි. එතැන් සිට දීපංකරබුද්ධකාලය දක්වා අසංඛ්‍ය කල්ප නවයකි. පංචවිධභෙදයට අනුව බෝසත් සිරිත බ්‍රහ්මදෙව බුද්ධකාලයෙන් ඇරඹෙයි. එතැන් සිට පුරාණසක්‍යමුනි බුද්ධකාලය දක්වා අසංඛ්‍යකල්ප හතකි. සියල්ල එකතුව බෝසත් අවදිය කල්පලක්ෂයක් අධික කොට ඇති අසංඛ්‍යකල්ප විස්සකි. සම්පිණ්ඩිතනිදානකතුවරයා ඒ මතය පිළිගත් කෙනෙකු බව ඔහුගේ ග්‍රන්ථාරම්භ නමස්කාරගාථාවලින් හැඟේ.

අතිදූරදූරෙ නිදාන, අතිදූරෙ නිදානකතා ප්‍රථමයෙන් විස්තර කිරීම සඳහා සම්පිණ්ඩිතමහානිදානයෙහි බෝසත් සිරිත් කීපයක් ඉදිරිපත් කොට ඇත. මාතුරුද්ධාරක නාවික, සත්තුතාපනරාධිප, සිද්ධත්‍ථතෙලදායිකා රාජකුමාරී, බ්‍රහ්මඉසි යන කතා ඒවාය. එම කතා කිසිවක් පාලිජාතක සංග්‍රහයෙහි දක්නට නොලැබේ. බ්‍රහ්මඉසි පුවත සම්පූර්ණයෙන්ම මහායාන ජාතක සංග්‍රහයකැයි කියැවෙන ආර්යශූරපාදයන්ගේ ජාතකමාලා නම් සංස්කෘත ග්‍රන්ථයෙහි එන ව්‍යාඝ්‍රීජාතකයයි. සෙසු කතා සියල්ල ශ්‍රීසද්ධර්මාවවාද සංග්‍රහයෙහි ඇතුළත්ව ඇත. ඒවා සොළසැකි නිදානයෙන් ගත් බව එහිම සඳහන්ය. සොළසැකි නිදානය දැනට නාම්මාත්‍රාවශෙෂය. කෙසේ වෙතත් බෝසතුන්ගේ මනඃප්‍රණිධිය හා වාක්ප්‍රණිධිය නිරූපණය අතිදූරදූරෙ නිදාන අතිදූරෙනිදාන දෙක්හි අභිප්‍රායයි.

මෙහි සියලු ආචාර්යමතවල ඇතුළත් දූරෙනිදාන අවිදූරෙනිදාන දෙක ජාතක නිදාන කථාවටත් බුද්ධවංස නිදානවණ්ණනාවටත් සමාන වෙයි. වර්ණනා ප්‍රදෙශ අතින් ජාතකනිදානකතාව සංක්ෂිප්තය. බුද්ධවංස නිදානවණ්ණනාව විස්තරාත්මකය, සම්පිණ්ඩිතමහානිදානය ඒ දෙකටම වඩා විස්තරාත්මකය. ජාතක, බුද්ධවංස නිදානවිස්තර කෙතරම් සමීපද යන්න දෙපොතෙහි

නිදානාරම්භ වාක්‍යවලින්ම පැහැදිලි වෙයි. "ඉමානි තීනි නිදානානි දස්සෙත්වා චණ්ණියමානා යෙ නං සුණන්ති, තෙහි සමුදාගමතො පට්ඨාය විඤ්ඤාතත්තා යස්මා සුට්ඨු විඤ්ඤාතා නාම හොන්ති.[7] "ඉමානි තීනි නිදානානි දස්සෙත්වාව වණ්ණිතා සුවණ්ණිතා නාම හොති. යෙ ච නං සුණන්ති තෙහි සමුදාගමතො පට්ඨාය විඤ්ඤාතත්තා සුවිඤ්ඤාතාව හොති"[8] යථොක්ත නිදාන දෙක පිළිබඳ සම්පිණ්ඩිතමහානිදාන විස්තර අටුවාග්‍රන්ථ සමඟ සැසඳෙන නමුත් එහි මාරයුද්ධය වඩා සමීපවන්නේ අශ්වඝොෂයන්ගේ බුද්ධචරිතය සමඟින් බව පෙනේ.[9] බුද්ධඥානයෙහි පරම ගම්භීරතා විස්තරය නිමවන්නේ "ඉමානි ඡ අසාධාරණඤාණානි ඡත්තිංසකොටි සතසහස්සානි මහාවජිරඤාණානි අරහත්තඵලප්පත්ත සමයේ උප්පජ්ජිංසු"[10] යනුවෙනි.

සන්තිකෙනිදාන වර්ණනය සඳහා මහාවග්ග මහාඛන්ධකය, මහාපරිනිබ්බානසුත්ත ප්‍රමුඛ සූත්‍රධර්ම සහ තදනුබද්ධ අට්ඨකථා මූලාශ්‍රය වී තිබේ. ඒ අතර ඒ කිසිතැනකින් හමුනොවන විස්තර රාශියක් ද අන්තර්ගතය. බුදුරදුන්ගේ ප්‍රථම දේශනයවූ ධම්මචක්කප්පවත්තන සූත්‍රයේ ආකෘතිය දැනට අප අතර භාවිතවන සූත්‍රයේ ආකෘතියට වඩා වෙනස්ය. දෙශනයේ නිමාවත් සමඟ බූමාටු දෙවියන් පටන් අකනිට්ඨ දෙවියන් තෙක් සාධුනාදය පැතිරගිය බව වර්තමාන ප්‍රකට සූත්‍රයේ සඳහන්ය. බුදුරදුන් පංචවර්ගීයයන් අමතා ඔදහථ භික්ඛවෙ සොතං, අමතමධිගතං, අහං අනුසාසාමි, අහං ධම්මං දෙසිස්සාමි" යයි වදාළ බස් අසා අපිත් ඒ දුර්ලභ උතුම් ධර්මය අසන්නට යමුයි බූමාටු දෙවියන් පටන් අකනිට්ඨවාසීන් තෙක් සාධුනාදය පැතිර එහි රැස්වූ බව සම්පිණ්ඩිතමහානිදානයෙන්

7. ජාතකට්ඨකථා (හේ.මු) 1 පිට 1926
8. මධුරත්ථවිලාසිනී (හේ.මු.) 4 පිට 1922
9. අශ්වඝොෂ බුදුධචරිතය (1 භාගය) 13 පරි. 157-75 පිටු. චෞද්ධම්භා විද්‍යාභවන්. 1993 මුද්‍රණය.
10. සම්පිණ්ඩිතමහානිදාන - සන්තිකෙ නිදාන

කියැවෙයි.[11] අටළොස් කෙළක්වූ දෙවියන් අතර මිනිසුන්ගෙන් සිටියේ පස්වග තවුසන් පමණකි යන කියමන සමඟ මෙය වඩා යොගය බව හැඟේ.

තථාගතයන් වහන්සේ පාංශුකූල චීවරයක් ලබා ගැනීම පිළිබඳ අසිරිමත් පුවත ථෙරවාදීන්ගේ බුද්ධචරිත විස්තරවල නොදක්නා ලැබේ. උරුවෙලකස්සප ජටිලයන්ගේ ආරාම පරිශ්‍රයෙහි නවාතැන් ගෙන සිටි උන්වහන්සේට සිය දිරාපත් සිවුරු වෙනුවට පාංශුකූලයක් ලබා ගැනීම අවශ්‍ය විය. උන්වහන්සේ සොහොනට ගියහ. රාධ නම් බමුණකුගේ පුණ්ණා නම් දාසියගේ ඉදිමී කුණුවී පණුවන් පිරී ගිය මිනිය ඔතා තුබූ චිසිරියන් දිග දොළොස්රියන් පළල වස්ත්‍රය දුටහ. සියතින්ම එය ගෙන සෝදා වේලා කපා මසා පඬුපොවා සිවුරක් කොට පරිභොග කළහ. මෙම මානුෂීය ක්‍රියාවලිය විස්තර කොට ඇත්තේ අතිමානුෂීයත්වයෙනි. මේ පුවත මේ අයුරින්ම ලලිතවිස්තර නම් මහායාන බුද්ධචරිතයෙහි විවරණය වෙයි[12] දුෂ්කරක්‍රියා සමයෙහි දුබල වූ සිවුරු වෙනුවට මෙය සකස්කොට ගෙන බෝමැඩට වැඩි බව පමණක් එහි ඇති වෙනසයි.

සමන්තපාසාදිකා විනය අටුවාවෙහි මෙන්ම අපේ වංසකථාවල සඳහන් බුදුරදුන්ගේ ප්‍රථම ලංකාගමනය සිදුවූයේ කස්සප ආරාමයේ සිටි දිනවල බව ද මෙහි සඳහන්ය. මහායාගයකට මහසෙනඟ රැස්වන එදින ගෞතමයන් අද මෙහි නොසිටිය හොත් මැනවැයි කාශ්‍යප සිතූ සිත දත් උන්වහන්සේ එදින ලංකාගමනය සිදුකළ බව එහි පවසා ඇත. අග්‍රශ්‍රාවක දෙනමගේ සම්ප්‍රාප්තිය මෙන්ම අපවත් වීමද විස්තර කිරීමට මේ නිදාන කතාවෙන් අවස්ථාව ලබා ගෙන තිබේ. රහතුන්ම සත්නමක් සිටි පවුලකට අයත් සැරියුත් තෙරණුවෝ ජාතගාමයෙහි ජාතොවරකයෙහි අපවත් වූහ.

---

11. සම්පිණ්ඩිතමහානිදාන - සත්තිකෙ නිදාන

12. ලලිතවිස්තරය නෛරඤ්ජන පරිවර්ත 28-30 පිටු. විද්‍යාලංකාර විශ්වවිද්‍යාලය ප්‍රකාශනය 1961.

උන්වහන්සේගේ ශරීරධාතු රැගෙන ආවේලෙහි බුදුරජාණන් වහන්සේ දෝතින් පිළිගෙන ගුණ වනා දෙව්රම් දොරටුවෙහි සෑයක් තනවා තැන්පත් කරවූහ. කාලසිලා පර්වතයෙහි අපවත්වූ මුගලන් තෙරුන්ගේ ධාතු ද පිළිගෙන සෑයක් කරවා තැන්පත් කරවූහ.

මින් පසු පරිනිබ්බානකථා විස්තරයට මහා පරිනිබ්බානසූත්‍රය ප්‍රධාන මූලාශ්‍රය වී තිබේ. බරණැස ප්‍රථම වස්විසීමෙහි පටන් බෙළුවගම අවසන් වස්විසීමතෙක් වස්විසූ ස්ථාන දැක්වෙන විස්තරයෙහි පිළිවෙළින් ස්ථාන තිහක් සඳහන්ය. අවසන් ස්ථානය ද සඳහන්ය. සෙස්ස ගිලිහී ඇත. පිටපත් කිරීම්වලදී සිදුවූවක්දැයි නොකිව හැකිය. බුද්ධදෙහය ආදාහනය සඳහා ගෙනයන අතරමඟ බන්ධුලමල්ලිකාවන් සිය ගෙදොරකඩ පෙරහැර නවතා සිය සැමියාගේ මරණින් පසු නොපැළදී මහාලතාපසාධනය සුවඳදියෙන් සෝදා ඔපදමා බුද්ධදෙහයට පැළඳ වූ බවක් ද සඳහන් ය.

බුදුන් පිරිනිවි බස ඇසූ අජාසත්රජ සිහි සුන්ව ඇද වැටුණේය. එසේ වෙතැයි කල්තබා සිතූ ඇමතියෝ වෙදවරුන් විමසා ඔවුන්ගේ උපදෙස් මත බෙහෙත් ඔරු සාදවා තබා රජු එහි හොවා සුවපත් කරවූහ. පසුව ධාතු පතා කුසිනාරාවට ගිය රජතුමා ද්‍රොණබමුණාගේ ධාතු බෙදීමෙන් ලත් කොටස රජගහනුවරට ගෙනගියේ උත්කර්ෂවත් අයුරිනි. පසුපසුව ධාතු ලබා ගැනීමට පැමිණියවුන්ට මහාකස්සප ආනන්ද තෙරවරුන් පාරිභොගික වස්තූන් බෙදා දීම පිළිබඳ කමනීය විස්තරයක් ද එයි. නිදානකථා උද්දෙසයන්හි සඳහන් පරිදි නම් සන්තිකෙනිදානය බුද්ධපරිනිර්වාණයෙන් අවසන් විය යුතුය. එහෙත් ධාතුවිභාජනය ද ඊට ඇතුළත්ව තිබේ. මහාපරිනිබ්බානසූත්‍රයෙහි ද එය ඇතුළත් ය.

සම්පිණ්ඩිතමහානිදානයේ අරමුණ නිදාන කතා දැක්වීම බව ආරම්භයෙහිදී ප්‍රකාශ විය. එහෙත් එවැනි සමාජතියක් නොපෙනෙන අතර සංගීතිකථා නමින් නවපරිච්ඡේදයක් අරඹා ප්‍රථම ධර්මසංගීතිය

විස්තර කරයි. මේ විස්තරය ථෙරවාද සම්ප්‍රදායයෙහි විස්තරය හා සැසඳෙයි. අනතුරුව මහාකස්සපත්‍ථෙර පරිනිබ්බානකථා නමින් එක් කොට ඇති පරිච්ඡේදයෙහි මහාකස්සප තෙරුන් පිළිබඳව ථෙරවාද පොතපතෙහි නොසඳහන් කරුණු රාශියක් දක්නට ලැබේ. සංගායනාවෙන් ධර්මවිනය චිරස්ථායීවීමට කටයුතු යෙදූ කාශ්‍යප තෙරණුවෝ ධාතූන් වහන්සේලා සුරක්ෂිත කොට තැබීමේ වැදගත්කම සැලකූහ. ධාතු ඒකරාශි කොට දීමේ වගකීම භාරගෙන නිධානය ඉදිකිරීම අජාසත්රජුට භාරකළහ. හෙතෙම පොළොව අසූරියනක් සාරවා තඹතහඩු යොදා ථූපාරාම චෙතියඝරය තරම් ගෙයක්කොට විචිත්‍රාලංකාර කොට ධාතුනිධන් කොට මතු පියදාස නම් කුමරෙක් අශොක නමින් රජව මේ ධාතු ගෙන විසුරුවා පතුරුවා පූජාසත්කාර කරන්නේයයි ලියා තබා ආරක්ෂා පිණිස බලසංඝාට යන්ත්‍රයක් ද යෙදවීය. නිධන්ගැබ ලොහයෙන් වසා පස් අතුරා ඒ මත සෙල්මුවා සෑයක් කරවීය.[13]

ධාතුනිදානය පිළිබඳ විස්මය ජනක අසිරිමත් විස්තරය එම කථාවේ පූර්වාර්ධය බඳුය. එහි අපරාර්ධය රසවාහිනී නම් පාලිකථාසංග්‍රහයෙහි තෙභාතික වස්තුවෙන්[14] හමුවෙයි. සුවාසූ දහසක් වෙහෙර විහාර ඉදිකළ අශොක රජ ධාතු ලබා ගැනීමට විපරම් කළේය. එහිදී එකසියවිසිවස් මහතෙර නමකගෙන් ලත් ආරංචියක් අනුව සෙල්මුවා සෑය සොයා කැණබැලීය. පෙරකී බලසංඝාට යන්ත්‍රය සහිත ධනතුගෘහය සහ ලිපිය හමුවී ධාතු ලබා ගත්තේය.

ධාතුනිධාන කටයුතු අවසන් වීමෙන් පසු කාශ්‍යප තෙරණුවෝ තමන්ගේ ආයුසංස්කාරය බලා පිරිනිවීමට අදහස් කළහ. එකසිය විසිවන වියේ සිටි උන්වහන්සේ පිරිනිවන්පානා බව රජුට දැනුම්

13. සම්පිණ්ඩිතමහානිදාන - මහාකස්සපත්‍ථෙර පරිනිබ්බාන කථා.

14. රසවාහිනී - තෙභාතිකමධුවාණිජකයානංවත්ථු. 95-96 පිටු. සරණතිස්ස ථෙර සංස්කරණය 1913

දීම සඳහා වැඩි නමුත් ඔහු නිදා සිටි බැවින් ඇමතියන්ට දන්වා වැඩියහ. රජගහනුවර කුක්කුටසම්පාතපබ්බත නම් පර්වත තුන අතර පිරිනිවන් පානා බවත් එය දැක ගැනීමට අවශ්‍ය නම් එහි රැස්වන ලෙසත් භික්ෂූන්ට දන්වා වැඩියහ. එහිදී මහපිරිස් මැද දම්දෙසා පෙළහර දක්වා දිව්‍යොපහාර මැද පිරිනිවියහ. ඒ සමඟම උන්වහන්සේගේ අධිෂ්ඨානය පරිදි පර්වතතුන මුදුනින් එකඝන විය. ආරංචිය ඇසූ සැණින් අජාසත්රජ බුද්ධපරිනිර්වාණය ඇසූ කෙණෙහි මෙන් සිහිසුන් විය. එදින ද බෙහෙත් ඔරු සූදානම් කොට ගෙන සිටි ඇමතියෝ රජු සුවපත් කරවූහ.

රජු මහපිරිස් සමඟ කුක්කුටසම්පාත පර්වතය වෙත ගිය විට සැදැහැබලය නිසාත් තෙරණුවන්ගේ අධිෂ්ඨානබලය නිසාත් පර්වතය විවරව දෙහය දිස්විය. දිව්‍යොපහාර සහිත දෙහයට පුදපූජා කොට නිමවීමත් සමඟ යළිත් පර්වතතුන එකඝන විය. අදත් දෙහය එතුළ පවතී. මතු මෙතේ බුදුන් භික්ෂූසංඝයා පිරිවරා එහි වඩින අතර දෙහය පර්වතය විවරවී නික්ම බුද්ධහස්තය මත පිහිටයි. උන්වහන්සේ තෙරණුවන්ගේ ගුණ වනා අවසන් වීමත් සමඟම අත්ලමතම ගිනිගෙන ආදාහනය වෙයි. ඉන්දීය සංචාරයේදී මේ තොරතුරු තමන්ට අසන්නට ලැබුණ බව හියුං සියෑං සඳහන් කොට තිබේ.[15]

මෙම පරිච්ඡේදාවසානයෙහි මෙතේබුදු සිරිත හා සබඳතාවක් ඇතිවීමෙන් අනතුරුව අනාගතකථා නමින් නව පරිච්ඡේදයකට යොමුවෙයි. අනාගතවංසයෙහි මෙන් මෙහි ඇත්තේ මෙතේ බුදුසිරිතයි. ගෞතම බුදුන් වෙතින් සංකස්සපුරයෙහි දී විවරණ ලබා පැවිදිව මිරණින් මතු දෙව්ලොව උපන් මෙතේ බෝසත්හු දැනටත් එහි වසති. ඒ බව ඒත්තු ගැන්වීමට අගනා කතාවක් ද එහි ඇතුළත් කොට තිබේ. ඒමේසේය. තම්බපණ්ණි දීපයෙහි රොහණජනපදයෙහි

15. හියුං සියෑං භ්‍රමණවෘත්තාන්තය 257-58 පිටු.
පොල්වත්තේ ශ්‍රී බුද්ධදත්ත නාහිමි 1952

මලයදෙව තෙරණුවෝ[16] චූළාමණි චෙතියට මල් පූජාකිරීම පිණිස දෙව්ලොව වැඩියහ. එතැනට පැමිණි දෙවිවරුන් ගැන ශක්‍රයාගෙන් තොරතුරු ද විමසූහ. අනුරාධපුරයෙහි සිටි බොහෝ දන්පින් කොට දෙව්ලොව උපන් තන්තවාය දිව්‍යපුත්‍රයා එක්කෙනෙකි. දුටඨගාමිණි දිව්‍යපුත්‍රයා එක් කෙනෙකි. සද්ධාතිස්ස දිව්‍යපුත්‍රයා එක් කෙනෙකි. යසසින් සියල්ලන් අබිබවා පැමිණියේ මෙතේ බෝසත් දිව්‍යපුත්‍රයාය. එතුමන් සමඟ සතුටු සාමීචියෙහි යෙදි පෙරළා මිහිබට මලයදේව තෙරණුවෝ මිනිසුන්ට ඒ බව විස්තර කළහ.[17]

අනතුරුව මෙතේ බුදුසිරිත විස්තර කොට නිමවා අනාගතකථා නිට්ඨිතා යනුවෙන් එහි සමාප්තිය දක්වන නමුත් ග්‍රන්ථය අවසන් නොවෙයි. වෙනමම ග්‍රන්ථයකැයි අනුමාන කළ හැකි අවසන් පරිච්ඡේදය ඇරඹෙන්නේ එතැන් සිටය. මේ පිළිබඳව මුලදී ද ග්‍රන්ථපරිමාණය සලකා බලමින් මදක් සාකච්ඡා කළෙමු. අනාගතකථාවෙන් පසු කර්තෘසඳර්ශක පාඨයක් ද සඳහන්ය. "ඉදං ධම්මපිණ්ඩං නාම අනුපුබ්බ පුබ්බාචරියවචනපරම්පරාරිතා බුද්ධධම්ම විපච්චණික අහිතචිත්තෙන විචිත්තකථිනා ජිනවර ධම්මොදයෙන නාම ධම්මභාණෙන අභිසඞ්ඛතං නිද්දිට්ඨමෙව හොතීති." යනු එම පාඨයයි. මේ අනුව ධම්මපිණ්ඩ නම් කෘතිය විචිත්‍රකථික ධම්මභාණක ජිනවරධම්මොදයනම් තෙරණුවන් විසින් සංගෘහිතය. රතනත්‍රය නමස්කාර කොට නව පරිච්ඡේදය අරඹමින් "තතො පරං බුද්ධවංස පරිදීපකස්ස ධම්මසම්පිණ්ඩනස්ස අට්ඨකථං ච ගණ්ඨිවරං ච සමොධානෙත්වා කථෙස්සාමි" යි සඳහන්ය. එයින් මුලින් යෙදූ කර්තෘසඳර්ශක පාඨයෙහි සඳහන් වන ධම්මපිණ්ඩය නම් ධම්මසම්පිණ්ඩනස්ස යන පදයෙන් ද කියැවෙන මේ පරිච්ඡේදයයයි සිතමු.

16. පැරණි ලක්දිව බෞද්ධ ඉතිහාසය - ඊ.ඩබ්. අදිකාරම් 158-60 පිටු. මලයදෙව තෙර විස්තර සඳහා බලන්න.

17. සම්පිණ්ඩිතමහානිදාන - අනාගතකථා.

ධම්මපිණ්ඩය අගනා ධර්මව්‍යාඛ්‍යානයකි. එහි සම්පිණ්ඩිතමහානිදානයෙහි විස්තරවූ කරුණු බොහොමයක් පුනරුච්චාරණය වෙයි. කල්පවිස්තරය, පටිච්චසමුප්පාදය, අභිධර්මපිටකය පිළිබඳ විස්තර ඒ අතර වෙයි. ඒකකර්තෘක නොවන බවට එය උදාහරණයකි. ධම්මපිණ්ඩය අවසානයෙහි තවත් පොතකට මුල පුරමින් එක්වරම සම්පිණ්ඩිතනිදානකථා නිට්ඨිතා යි පොත අවසන් කොට තිබේ.

බෝසත් සිරිත බුදු සිරිත ධර්මය දර්ශනය ශාසන ඉතිහාසය සම්බන්ධයෙන් වටිනා මූලාශ්‍රයයක් වශයෙන් සැලකිය යුතු සම්පිණ්ඩිත මහානිදානය කවර කලෙක කවුරුන් විසින් රචනා කරන ලදදැයි හරියටම නිශ්චය කළ නොහැකිය. නිදානකථා කොටස අටුවා සමයෙහි හෝ තදාසන්න කාලයක රචනා කරන ලදැයි එහි භාෂාව, රචනා ශෛලිය මෙන්ම විෂයසංග්‍රහය අනුව අනුමාන කළ හැකිය. අන්තර්ගත ලාංකෙය තොරතුරු අනුව මෙය ලාංකෙය උගතකුගේ හෝ කීපදෙනෙකුගේ කෘති සංග්‍රහයකැයි කීමට වඩා යමක් නොකිව හැකිය. බුරුම, කාම්බෝජ සහ ලංකාවේ පිටපත් වැඩිගණනක් එකරාශි කොට ගැඹුරු ශාස්ත්‍රීය පර්යේෂණයකින් පාළිභාෂා සාහිත්‍යයෙහි මෙන්ම ධර්මදර්ශනයන්හි උන්නතියට අදාළ බොහෝ කරුණු සම්පිණ්ඩිතමහානිදානයෙන් අනාවරණය කරගත හැකිය.

මේ පෞරාණික පාලිග්‍රන්ථය සිංහලෙන් පළ කිරීමට අදහස් කළේ එය අප රටේ පොදු බෞද්ධ ජනතාවගේ ශ්‍රද්ධා බුද්ධි වර්ධනයට වටිනා අනුබලයකැයි පෙනී ගිය හෙයිනි. බසකින් බසකට අනුවාද කිරීමේදී මතුවන දුෂ්කරතා බොහෝ ය. ඒ අතර සම්පිණ්ඩිතමහානිදාන ග්‍රන්ථයෙහි දක්නට ලැබෙන ආකුලව්‍යාකුල පද, පාඨ, ඡේද හේතුවෙන් ද ගැටළු ඇත්තේ ය. ඒ සියලු කාරණා හේතුවෙන් අපගේ අනුවාදය සර්වතොභද්‍රයයි නොකියමු.

මෙය පදයෙන් පදය අනුවාද කරමින් කළ ඡායානුවාදයක් නොවන අතර භාවානුවාදයක් ලෙසින් ඉදිරිපත් කොට ඇත. එබැවින් මවුපොතේ විෂය බද්ධ අදහස් කිසිවක් බැහැර නොවන සේ අනුවාද

කිරීමට උත්සාහවත් වූයෙමු. ධර්ම විෂයගත පාරිභාෂික පද වැඩි වශයෙන් තත් වූ පරිද්දෙන් අනු වාදයෙහි ද යොදන ලද්දේ ධර්මාර්ථයට පැටහැණි නොවන සේ යථාර්ථය උකහා ගැනීමට ඉඩ තැබීමක් වශයෙනි. ඓතිහාසික වශයෙන් ලක්දිව පැවති බෞද්ධ සම්මත බුදුචරිතය හඳුන්වා දීමේ ප්‍රමුඛ අභිප්‍රායයෙන් මේ "සමපිණ්ඩිත මහානිදාන නම් පැරණිබුදුසිරිත" ග්‍රන්ථය අනුවාදිතය.

කොල්ලුපිටියේ මහින්දසඞ්ඝරක්ඛිත ස්ථවිර

ශ්‍රීකල්‍යාණි රාජමහාවිහාරය,
කැලණිය.
20.03.2006

ස්තුතිය

මේ ග්‍රන්ථය සැකසීමේදී අපට ප්‍රමුඛ සහායක් ලැබුණේ අප හිතවත් රාජකීය පණ්ඩිත ශාස්ත්‍රපති කීර්ති නාරම්පනාව මහතාගෙනි. එහි ලා මහාචාර්ය කපිල අභයවංස මහතා සමඟ කළ සාකච්ඡා ද බෙහෙවින් ප්‍රයෝජනවත් විය. ග්‍රන්ථය ඉක්මනින් නිමකිරීම සඳහා නිතර මා දිරිගන්වමින් පිටපත් සකස්කිරීම සෝදුපත් බැලීම ආදියෙන් ශ්‍රී කල්‍යාණි රාජමහාවිහාරයේ කෘත්‍යාධිකාරී, විද්‍යාලංකාර පිරිවෙන්හි ආචාර්ය මොරවක ධම්මානන්ද, ශාස්ත්‍රවේදී ඉසුරුමුනියේ පඤ්ඤා-ලංකාර යන ස්ථවිරයන් වහන්සේලාගෙන් සහ ශාස්ත්‍රවේදී ජයන්ති ශ්‍රියානි නාරම්පනාව මහත්මියගෙන් ද ලත් සහාය ඉමහත්ය.

සම්පිණ්ඩිතමහානිදාන ග්‍රන්ථයෙහි දී මෙන්ම මෙහිදී ද මුද්‍රණ කටයුතු සම්බන්ධීකරණයෙන් අපට සහාය දක්වන ලද්දේ අධ්‍යාපන අමාත්‍යාංශයේ හිටපු අතිරේක ලේකම් ශාස්ත්‍රපති සිරිසේන විතානගේ මහතා විසිනි. පිටපත පරිගණකගත කිරීමෙහිලා මරදාන ඩිසයින් සිස්ටම්ස් ආයතනයේ රාජපක්ෂ මහතාගෙන් මෙන්ම එස්.ඒ. නිරෝෂි ප්‍රියංජලා මහත්මියගෙන් ලත් සහාය ද සිහිපත් කටයුතුය. මෙසේ හැම අයුරින් අපගේ කාර්යය සඳහා සහාය පළකළ සියලු දෙනාහට අපගේ කෘතඥතා පූර්වක ස්තුතිය පිරිනමමු.

කොල්ලුපිටියේ මහින්ද සඞ්ඝරක්ඛිත ස්ථවිර

සම්පිණ්ඩිතමහානිදාන නම්

පැරණී බුදුසිරිත

යම් ලෝක නාථයාණ කෙනෙක් විසිඅසංඛ්‍ය කල්ප ලක්ෂයක් ලෝක හිතාර්ථය පිණිස දුක් ගත් සේක් ද ඒ බුදුරජාණන් වහන්සේට නමස්කාර කරමි.

බුදුරජාණන් වහන්සේට, ධර්මයට, උතුම් සංඝ සමූහයාට යන රත්නත්‍රයට නමස්කාර කොට ආචාර්ය පරම්පරානුසාරයෙන් සම්පිණ්ඩිතමහානිදානය ප්‍රකාශ කරමි.

මෙහි ලා නිදානය කී ආකාර වෙයි ද? පොරාණාචාර්යවරු නිදානය තෙවැදෑරුම්ව කැමති වෙති. ත්‍රිවිධ නිදානය කුමක් ද? දූරෙ නිදානය, අවිදූරෙ නිදානය, සන්තිකෙ නිදානයයි. දූරෙ නිදානය කෙසේ ද? දීපඞ්කර බුදුන් ආදි කොට වෙස්සන්තරාත්මභාවය තෙක් කිව යුතුය. මෙය දූරෙ නිදානයයි. අවිදූරෙ නිදානය කෙසේ ද? වෙස්සන්තරාත්මභාවයෙහි පටන් අභිසම්බොධිය තෙක් කිව යුතුය. මෙය අවිදූරෙ නිදානයයි. සන්තිකෙ නිදානය කෙසේ ද? අභිසම්බොධියෙහි පටන් පරිනිර්වාණය තෙක් මෙදෑතුර යම් යම් තැනෙක්හි භාග්‍යවතුන් වහන්සේ විසූසේක් ද ඒ තාක් කිව යුතුය.

වෙනත් ආචාර්යවරු අතිදූරෙ නිදානය, දූරෙ නිදානය, අවිදූරෙ නිදානය, සන්තිකෙ නිදානය යි සිවුවැදෑරුම් නිදානය කැමති වෙති. අතිදූරෙ නිදානය කෙසේ ද? බ්‍රහ්මදෙව බුදුන් ආදි කොට දිවකුරු බුදුන් තෙක් වෙයි. දූරෙ නිදානය කෙසේ ද? දිවතුරු බුදුන් පටන් වෙසතුරු අත්බැව් තෙක් වෙයි. අවිදූරෙ නිදානය කෙසේ ද? වෙසතුරු අත්බැව් පටන් අභිසම්බොධිය තෙක් වෙයි. සන්තිකෙ නිදානය කෙසේ ද? අභිසම්බොධියෙහි පටන් පරිනිර්වාණය තෙක් වෙයි.

නැවත ද අතිදූරදූරෙ නිදානය, අතිදූරෙ නිදානය, දූරෙ නිදානය, අවිදූරෙ නිදානය, සන්තිකෙ නිදානයයි නිදානය පස් වැදෑරුම් වෙයි.

අතිදූරදූරෙ නිදානය කෙසේ ද? මැණියන් ගොඩ ලූ තරුණ නැවියාණෝය. ගජප්‍රිය ශත්‍රැකාප නරපතියාණෝ ය. ව්‍යාඝ්‍රධෙනුවට දිවි පිදූ බ්‍රහ්ම ඍෂිවරයාණෝය. අබතෙල් පිදූ රාජ කුමාරිකාවෝ ය. යන මෙයින් දත යුතුය.

මැණියන් ගොඩ ලූ තරුණ නැවියාණෝය යන මෙය කෙසේ දත යුත්තේ ද? මේ මහාභද්‍ර කල්පයෙන් කප් ලක්ෂයක් අධික අසංඛ්‍යකල්ප විස්සකට ඈත අතීත කාලයෙහි කිසියම් සුපාප ජනපදයෙක්හි මනා කළුකෙහෙ ඇති හදයෙඟවනයෙන් යුත් ඤාණබුද්ධි සම්පන්න තරුණ නැවියෙක් පියාගේ අභාවයෙන් සියලු ධනය වියදම් කොට මැණියන්ම පෝෂණය කරන්නේය. ඉක්බිති ඒ නැවියා වෙළඳාම් පිණිස ස්වර්ණභූමියට යනු කැමතිව බොහෝ බඩු රැස්කොට මැණියන් හා වෙනත් බඩු නැවට පටවා මුහුදට පිළිපන්නේය. නැව යොදුන් දහයක් විස්සක් පසු කොට වෙරළ නොපෙනී ගිය කල්හි එකෙණෙහි හටගත් මහසැඩ කුනාටුවකින් මුහුදුදිය කැළඹී බිහිසුණු මහරළ හටගත්තේය. මහරළින් මුහුද කැළඹී ගියේ ය. සයුර කැළඹීමෙන් සසල දළ රළපෙළ නිරන්තර ගැටීමේ වේගයෙන් සුන්බුන් වූ නැව එහින් මෙහින් දිය පිරීමෙන් ගිලී ගියේ ය.

ඉක්බිති මිනිස්සු තැන තැන පාවෙමින් මරණයට පැමිණියාහුය. අනතුරුව පාවී යන සිය මැණියන් දැකීමෙන් නැවියාට උපන් කරුණාවෙන් "අහෝ මාගේ මැණියන් මරුමුවට පත්වනු කෙසේ බලා සිටිමි ද? අපොයි හිතවතුනි, මාගේ ජීවිතයෙන් කවර පලක් ද? උපකාරී මැණියන් එගොඩ කරන්නෙමි. මේ සාගරයෙන් මැණියන් එතෙර නොකරන්නෙම් නම් පින්වතුනි, කෙසේ නම් ජනතාව සංසාර සාගරයෙන් එගොඩ කරන්නෙම්දැ"යි සිතිණ. මෙසේ සිතා හෙතෙම වැඳ වැටී මේ පෙරපැතුම් පැතීය.

මම එතෙර වී මුළාවූවන් එතෙර කරමි. දමනය වී අදාන්තයන් දමනය කරන්නෙමි. සැනසී බියට පත්වූවන් සනසා ලන්නෙමි.

අවබෝධ කොට නිදිගත්තවුන් පුබුදුවා ලන්නෙමි. දැවෙන්නවුන් සනසවන්නෙමි. බැමිවලින් මිදී බැමිවලින් මුදවා ලන්නෙමි. නිවී නිවාලන්නෙමි. මම ශාන්ත ධර්මයෙන් දැඩි අදිටනින් යුතු වෙමි."

ඔහු මෙසේ පැතුම් පතා තමන්ගේ මෑණියන් දෑතින් වඩා ගෙන එගොඩ කරවීය. ඒ සත්පුරුෂයා මෙසේ මෑණියන් එතෙර කොට දිවිහිමියෙන් කුශලකර්ම කොට දෙව්ලොව පැමිණියේය.

තවද ගජප්‍රිය ශත්‍රුතාප නම් රජෙක් වෙයි යන මෙය කෙසේ දතයුතු වන්නේ ද? ඈත අතීත කාලයෙහිම ඇතුන්ට ප්‍රිය කළ ශත්‍රුතාප නම් රජෙක් මධ්‍ය දේශයෙහි රමණක නම් නුවර වාසය කළේය. ඒ රජුගේ එක් මඟුලැතෙක් විය. හස්ත්‍යාචාර්යයා විසින් ඔහු මැනවින් හික්මවන ලද්දේ ය. දිනක් උයන්බිමට යනු කැමැති වූ රජ ඒ ඇතු පිට නැගී සිවුරඟසෙන් පිරිවරා උයනට ගියේ ය. ඒ ඇත් තෙම ඒ වනාන්තරයෙහි වෙනත් ඇතින්නකගේ ඉව දැනී කාමරාගයෙන් පීඩිතව ඉවසා ගත නොහැකිව තට්ටම් කන්තල ගසා දුවන්නට පටන් ගත්තේ ය. දුවන ඇතු රඳවා ගත නොහැකිවූ රජ ගොස් අත්තක එල්ලී නතර විය. ඇතා දිව ගොස් ඇතින්න හා එක්විය. අනතුරුව සිවුරඟ සෙනග වනාන්තරය පීරා ඔබ මොබ දුවමින් ඇතු පිටින් බැස සිටි රජු පිරිවරාගත්හ. ඉක්බිති රජ ඒ පිරිස සමඟ පෙරළා නුවරට පැමිණ කිපී හස්ත්‍යාචාර්යවරයා කැඳවා "ආචාර්යය, කුමක් නිසා තෝ මේ ඇතු නොහික්ම වූයෙහි ද? කීකරු නොකරන ලදුවම හොඳින් කීකරුයයි කියන්නෙහි ද? එසේ නම් දැන් මෙබඳු විකාරයක් කරන ලද්දේ මන්දැ"යි ඇසීය. ආචාර්යයා රජුට "දේවයිනි, ක්ෂමාවුව මැනව. ඒ ඇතා මනාව හික්මුණේය, කීකරුය. සොඳුරු සිවුකුලයෙන් ශ්‍රේෂ්ඨය, ඔහු ඇතින්නකගේ ගන්ධරාගයෙන් මෙසේ විකාර කරයි. නමුත් දේවයිනි, එසේ නොසිතුව මැනව. ඒ ඇතු ජාතිය සිහිකොට මොහොතකින් එනු ඇතැ"යි කීය.

එවේලහිම ඇතා සිය ජාතිය සිහිවීමෙන් කනස්සල්ලට පත්ව ඇතින්න හැරදමා පැමිණියේය. මහජනයා පැමිණි ඇතු දැක

සතුටටත් පුදුමයටත් පත්ව ඇතු පිරිවරාගත්හ. ඇතා ඇත්හලට වැද සිටියේය. එවිට හස්ත්‍යාචාර්ය තෙම "දෙවයිනි, මේ ඇතුගේ සුශික්ෂිතබව බලනු මැනව. ඉදින් නොපිළිගන්නෙහි නම් පරීක්ෂා කළ මැනැවැ"යි කියා රජු ඉදිරියෙහිම රත්වූ ඇවිලෙන ගිනිදැල් සහිත යගුළියක් ආලිඛනය කරවීය. ඒ ඇතා දැවෙද්දීත් ඉවත නොදා එතැනම මරුමුවට පත්විය. රජ ඇතු දැක "ආචාර්යය, ඔහු නොහැඬුයේ මන්දැ"යි විමසීය. "එසේ ය දේවයිනි, ඇතා සුවචය. රාගයෙන් රත්වූවෝ එසේය"යි කීය. එයසා සංවේගයට පත් රජතෙම "රාගය මෙතරම් ලාමකය. මම දැන් රාගය මුලින්ම උදුරා දමන්නෙමි"යි සිතීය. පැතුම් පැතීය.

> මම සසර තරණය කොට මුළාවූවන් තරණය කරවන්නෙමි.
> දමනය වී දමනය කරවන්නෙමි. සැනසී සනසවා ලන්නෙමි.
> බුදුව කෙලෙස් නිදි ගත්තවුන් පුබුදුවන්නෙමි.

මෙසේ ඒ සත්පුරුෂයා රාග උපාදානයන්හි අනුත්සුකව ස්වර්ගයෙහි උපන්නේය.

බ්‍රහ්මඍෂි ව්‍යාඝ්‍ර ධෙනුවට දිවි දුන්නේය යන අනෙකක් ද වෙයි. මෙය කෙසේ දත යුතු වන්නේ ද? අතීතයෙහි හිමවත් පෙදෙසෙහි ඍෂිවරු සමූහයක් වූහ. ඒ ඍෂි සමූහයාගේ ආචාර්ය-වරයා බ්‍රහ්මඍෂි නම්. අජිත නම් එක් අග්‍රශිෂ්‍යයෙක් ද විය. ඒ අග්‍රශිෂ්‍යයා නම් ආර්ය මෛත්‍රෙය බෝසතාණෝ ය. එක් කලෙක ඍෂිගණාචාර්ය බ්‍රහ්මඍෂි අග්‍රශිෂ්‍යයා සමඟ වනමුල් ඵල අහර සඳහා වනයට ගියේ ය.

එකල කඳුබෑවුම් අතර මහා ප්‍රපාතයෙක ළපටි පැටවුන් ඇති සාපවසින් පීඩිත කෘශතර සිරුරින් මරණාසන්නවූ බඩසාබලයෙන් සිය පැටවුන් කනු කැමතිව දැල්වූ ඇසින් කඩා හැලුණු දෙකනින් සොලවන වලිගයෙන් රෑරූ යන බියකරු ගෙරවීමෙන් යුතුව සිටින ව්‍යාඝ්‍රධෙනුවක දුටුවේය. ඒ දැක හටගත් කරුණාවෙන් බ්‍රහ්මඍෂි "ඇත්තෙන්ම අපොයි මේ ව්‍යාඝ්‍රධෙනුව සාගින්නේය. ක්ලාන්ත

ශරීර ඇත්තීය. මරණාසන්නය. තම පැටවුන් කනුකැමැත්තීය. "යි සිතා පිටුපස සිටි අග්‍රශිෂ්‍ය මෙතේ බෝසතුන් අමතා යන්න, සිංහාදීන් හැර දමන ලද්දක් ගෙන එවයි කීය. හෙතෙම ඔබ මොබ සොයාත් කිසිවක් නොලැබිය. ඔහු ගිය පසු බ්‍රහ්මඍෂි "නොගැළපෙන්නක් කළෙමි. අනුන්ගේ මස් පිදීමෙන් මට කවර පලයක් ද? දැන් මම ජීවිතය පුදන්නෙමි"යි සිතීය. කුමක් නිසා ද? මාගේ මේ ශරීරය නිස්සාරය. අසූචි දුගඳ කුණපවලින් පිරුණේය. ඇස් ඇති පණ්ඩිත පුරුෂයන් විසින් නින්දිතය. මේ ජීවිතය නම් අසාරය. සාර විරහිතය. ක්ෂණිකය. දුක් බහුලය. උපායාස බහුලය. මරණය කෙළවර කොට ඇත්තේ ය. තණ අග පිනිබිඳුවක් දියබුබුලක් මිරිඟුවක් මෙන් නැසෙනසුලුය. මම ඒ සාර රහිත කයින් නිසරු ජීවිතය හරවත් සදහම් වර සිරුරක් බවට පෙරළන්නෙමි"යි සනිටුහන් කොට මනඃප්‍රණිධාන කළේය.

මම එතෙරව මුළා වූවන් එතෙර කරන්නෙමි. දමනය වී දමනය කරන්නෙමි. සැනසී සනසා ලන්නෙමී. බුදුවී පුබුදුවන්නෙමි.

හෙතෙම මෙසේ පතා කරුණාව උපදවමින් කඳුමුදුනින් සිය ජීවිතය හෙළී ය. එවිට එතුමාට මල්වැසි වැස්සේ ය. මෙසේ සත්පුරුෂ තෙම සැයාත්මය පරිත්‍යාග කොට සඞ්ගයෙහි උපන්නේය.

තවද, රජකුමරිය අබතෙල් පිදුවාය යන මෙය කෙසේ දත යුත්තේ ද? අතීත කාලයෙහි බරණැස් ප්‍රදේශයෙහිම පුරාණදීපඞ්කර නම් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ ලොව උපන්හ. ඒ බුදුරදුන්ගේ සුළුමැණියන් දුටු විසුද්ධාදෙවී නම් සොහොයුරු රජකුමරියක් වූවාය. එකල එක් මහලු භික්ෂුනමක් තෙල් පිණ්ඩපාත කොට නිතර බුදු පහන් දල්වන්නේ දිනක් තෙල් පිණිස රජගෙට ගියේ ය. ඒ කුමරිය මහලු භික්ෂූන් වහන්සේට අබතෙල් පුදමින් "ස්වාමීනි, මේ අබතෙල් පූජාවෙන් හා අනිකුත් කුසලයන්ගෙන් අනාගතයෙහි මම පිරිමියෙක් වී බුදු වන්නෙමි"කියා මෙසේ ප්‍රාර්ථනා කළාය.

මම එතෙර වී මුළාවූවන් එතෙර කරන්නෙමි. දාන්තව දමනය

කරන්නෙමි. සැනසී සතසවා ලන්නෙමි. බුදුවී ප්‍රබුද්ධ කරන්නෙමි.

මෙසේ ඇයගේ පෙරපැතුම වශයෙන් අබතෙල් පිදුවාය. ඉක්බිති ඒ මහලු තෙරණුවෝ ඇය පිදූ අබතෙල් ගෙන විහාරයට ගොස් පහන් දල්වා "නාථයාණනි, යම් සේ ඔබ වහන්සේ දීපඞ්කර නම් බුදුහු වෙත් ද මම ද එසේ මතු දීපඞ්කර නම් බුදු වන්නෙමි"යි වාග්භේද කළහ. මෙසේ ඒ මහලු තෙරණුවෝ වචනයෙන් පවසා ඒ රජකුමරියගේ ප්‍රාර්ථනාව ද සැලකළහ. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ නිරාවරණ අනාගත ඥාණයෙන් බලා ඒ තෙරුන්ගේත් කුමරියගේත් පැතුම් සඵලවන බව දැන උන්වහන්ස්ට "භික්ෂුනම, ඔබ ද අනාගතයෙහි දීපඞ්කර නම් බුදුව මාගේ නැගණියට ද අනාගතය සඳහා විවරණ දෙව"යි නියම කළසේක. උන්වහන්සේ බුද්ධනියමය පිළිගත්හ. මෙසේ රජකුමරිය අබතෙල් පුදා ඒ ප්‍රාර්ථනය කොට දෙව්ලොව උපන්නා ය.

මේ අතිදූරදූරෙ නිදාන නම්.

අතිදූරෙ නිදානය නම් කුමක් ද? බ්‍රහ්මදෙව බුදුන් පටන් දීපඞ්කර බුදුන් තෙක් කිව යුතුය. කෙසේ ද යත්? එතැන් පටන් අප බෝසතාණෝ කප් සුවහසක් අධික අසංඛ්‍යකල්ප විස්සෙක්හි දානසීලාදි බුදුකුරු දහම් වඩා බුදුබවට පැමිණිසේක. තවද මෙහි ලා කල්ප ප්‍රමාණය කිව යුතුය.

ඉක්බිති එක්තරා භික්ෂුනමක් භාග්‍යවතුන් වහන්සේ කරා එළඹ වැඳ පසෙක හිඳ මෙසේ සැලකළේය. "ස්වාමීනි, කල්පය කොතරම් දීර්ඝ ද?" "භික්ෂුනම, කල්පය ඉතා දීර්ඝය. මෙතරම් වසර සියයකි, දහසකි කියා ගණන් කිරීමට අපහසුය" "ස්වාමීනි, උපමාවක් කළ හැකි ද?" "භික්ෂුනම, පුළුවන. භික්ෂුනම, යොදුනක් දිග යොදුනක් පළල, යොදුනක් උස කට ගසා අබඇට පිරවූ ලොහනගරයක් යම් හැටියකින් තිබේ නම් එක් මිනිසෙක් අවුරුදු ලක්ෂයකට වරක් එක

අබ ඇටයක් ඉවත් කරයි නම් පිළිවෙළින් ඉතා ඉක්මනින් අබඇට ටික අවසන් වෙයි. කල්පය නම් අවසන් නොවෙයි. භික්ෂුනම, කල්පය මෙතරම් දීර්ඝය.

භාග්‍යවතුන් වහන්සේ අනෙකක් ද වදාළහ. "භික්ෂුනම, යම්සේ යොදුනක් දිග යොදුනක් පළල යොදුනක් උස එකඝන නොසිදුරු ගල්පර්වතයෙක් වෙයි. මිනිසෙක් අවුරුදු ලක්ෂයකට වරක් දුහුල් සළුවකින් එය පිසදමයි. භික්ෂුනම, මේ උපායෙන් ඉතා ඉක්මනින් ගල්පර්වතය ගෙවී අවසන් වෙයි. කල්පය නම් අවසන් නොවෙයි. භික්ෂුනම, කල්පය මෙතරම් දීර්ඝය"යි වදාළ සේක. මේ සූත්‍ර ක්‍රමයෙන් කල්පයෙහි දික්බව දත යුතු ය.

සුඤ්ඤකප්ප අසුඤ්ඤකප්ප යයි කල්පය දෙයාකාර වෙයි. සුඤ්ඤකප්පයෙහි බුදු, පසේබුදු, සක්විත්තෝ නොඋපදිති. ගුණ ශූන්‍ය නිසාත් ගුණවතුන් ශූන්‍ය නිසාත් ශූන්‍ය කල්පයයි කියනු ලැබේ. අශූන්‍ය කල්පය සාර, මණ්ඩ, වර, සාරමණ්ඩ, භද්‍ර කියා පස් ආකාර වෙයි. සාර රහිත, ගුණයෙන් හිස් ලොකයෙහි ගුණසාර උත්පාදක සම්මාසම්බුදුරජාණන් වහන්සේ උපදනා කල්පය සාරකල්පයයි කියනු ලැබේ. උපන් ගුණසාර ඇති ලොව දෙවැනි ලෝනා කෙනෙකුන් උපදනා කල්පය මණ්ඩ කල්ප නමි. යම් කල්පයෙක බුදුවරු තෙනමක් උපදිත් නම් එය වර කල්ප නමි. යම් කල්පයක සතර බුදු කෙනෙක් උපදිත් ද එය පළමු කල්පයට වඩා විශිෂ්ට හෙයින් සාරමණ්ඩ කල්ප නමි. යම් කල්පයක පස් බුදු කෙනෙක් උපදිත් ද එය භද්‍රකල්ප නමි. එය නුග, අත්තික්කා මල් මෙන් අතිශයින් දුර්ලභය. පළමු ව උපදනා බුදුහු දෙවැනිව උපදනා බුදුන් ද දෙවැනිව උපදනා බුදුහු තෙවැනිව උපදනා බුදුන් ද වශයෙන් ප්‍රකාශ කරන්නාහ. එම කල්පයෙහි ත්‍රිහෙතුක ප්‍රතිසන්ධි ලැබුවාහු පිරිනිවෙති. දුහෙතුකයෝ සුගතිගාමී වෙති අහෙතුකයෝ කලණ මිතුරන් ඇසුරෙන් සහෙතුකයෝ වෙති. කලණසැප බහුල හෙයින් භද්‍රකල්ප නම් වෙයි. මෙ නයින් අශූන්‍ය කල්පය පස් වැදෑරුම් වෙයි.

පර්යාය වශයෙන් කල්පය අන්තර, සංවට්ට, සංවට්ටට්ඨායී, විවට්ට, විවට්ටට්ඨායි, මහා යනුවෙන් සවැදැරුම් වෙයි. අන්තර-කප්පය සත්‍යන්තර, රොගන්තර, දුබ්භික්ඛන්තර යනුවෙන් තෙවැ-දැරුම් වෙයි. සත්‍යන්තරකප්ප නම් ආදිකල්පික අසංඛ්‍යායුෂ්ක මිනිසුන් ක්‍රමයෙන් පිරිහී දසවස් ආයු බවට පැමිණි කල්හි ආයුධයෙන් හෝ රෝගයෙන් හෝ සාගතයෙන් හෝ අනතුරට පත්වෙති. අන්තරකප්ප නම් මෙයයි. කප නස්නා මහවැස්සෙහි පටන් සප්තසූර්යයන්ගේ පහළවීමෙන් ගිනිජාලා හටගැනීම තෙක් මේ කාලය සංවට්ට කප්ප නම්. කප නස්නා ගිනිජාලා හටගැනීමේ පටන් කෙළ ලක්ෂයක් සක්වළ පුරාලන සම්පත් මහාමෙඝය තෙක් මේ කාලය සංවට්ටට්ඨායී කල්ප නම්. සම්පත් මහාමෙඝයහි පටන් ඉරහඳ පහළවීම තෙක් මේ කාලය විවට්ට කප්ප නම්. ඉරහඳ පහළවීමේ පටන් කප වනසන මහමෙඝය තෙක් මේ කාලය විවට්ටට්ඨායී කල්ප නම් වෙයි. සංවට්ටාදි මේ සතර කල්පය එක් මහාකල්පයක් නම් වන්නේය. කල්ප ගණනය මෙසේ ගත යුතුය.

මෙහි ලා අසංඛ්‍ය ගණනය මෙසේ ගත යුතුය. දසය සියය දහස ලක්ෂය කෝටිය ප්‍රකොටිය නහුතය නින්නහුතය නහුතනහු තය බිඳු ඛම්භ නික්ඛම්භ සඬ්ඛ අක්ඛොහිණි අබ්බුද නිරබ්බුද අහහ අබබ අටට සොගන්ධික උප්පල කුමුද පුණ්ඩරීක පදුමය කථාන මහාකථාන අසඞ්ඛ්‍යය යනුයි. විස්තර වශයෙන් වනාහි දසක දහය සියයකි. සියයේ දසය දහසකි. දහස් සියය ලක්ෂයකි. ලක්ෂ සියය කෝටියකි. කෝටි ලක්ෂ සියය ප්‍රකොටියකි. ප්‍රකොටි ලක්ෂ සියය කෝටිප්‍රකෝටියකි. කෝටි ප්‍රකොටි ලක්ෂ සියය නහුතයකි. නහුතලක්ෂ සියය නින්නහුතයකි. නින්නහුත ලක්ෂ සියය නහුතනහුතයකි. නහුතනහුත ලක්ෂ සියය බිඳුවකි. බිඳු ලක්ෂ සියය ඛම්භයකි. ඛම්භලක්ෂ සියත නික්ඛම්භයකි. නික්ඛම්භ ලක්ෂ සියය සංඛයකි. සංඛ ලක්ෂ සියය අක්ඛෝහිණියකි. අක්ඛෝහිණි ලක්ෂ සියය අබ්බුදයකි. අබ්බුද ලක්ෂ සියය නිරබ්බුදයකි. නිරබ්බුද ලක්ෂ සියය අහහයකි. අහහ ලක්ෂ සියය අබබයකි. අබබ ලක්ෂ සියය අටටයකි.

අටට ලක්ෂ සියය සෝගන්ධිකයකි. සෝගන්ධික ලක්ෂ සියයය උප්පලයකි. උප්පල ලක්ෂ සියය කුමුදයකි. කුමුද ලක්ෂ සියය පුණ්ඩරීකයකි. පුණ්ඩරීක ලක්ෂ සියය පදුමයකි. පදුම ලක්ෂ සියය කථානයකි. කථාන ලක්ෂ සියය මහාකථානයකි. මහාකථාන ලක්ෂ සියය අසංඛ්‍යයකි. මහා කල්පයන්ගේ අසංඛ්‍යය සියයෙන් වැඩි කළ යුතුය.

අප බෝසත්හු එයින් සත් අසංඛ්‍යයෙක බ්‍රහ්මදෙවාදි බුදුවරුන් විෂයෙහි දන් දී බුදුබව පිණිස සිත් ඉපදවීම සිදු කළහ. අසංඛ්‍යය නවයෙක්හි පුරාණසක්‍යමුනි ආදි බුදුවරුන් විෂයෙහි දන් දී වාක්හෙදය සිදුකළහ. අසංඛ්‍යය සතරෙක දීපඞ්කරාදි සුවිසි බුදුවරුන් විෂයෙහි මහාපරිත්‍යාග කොට කායප්‍රණිධාන ඇතිකළහ. එයින් අතිදූරෙ නිදානය බෝසතුන්ගේ චිත්තෝත්පාදය දක්වන බව දතයුතුය. කෙසේ දත යුත්තේ ද? මෙයින් කප් ලක්ෂයක් අධික අසංඛ්‍යය විස්සකට පෙර නන්ද නම් අසංඛ්‍යය කල්පයක් විය. එම අසඛ්‍යයයෙහි එක් කල්පයෙක කරනන්ද නම් මහානගරයෙහි බ්‍රහ්මදෙව නම් තථාගත අර්හත් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ ලොව පහළ වූ සේක. උන්වහන්සේ ධර්ම දේශනා කරන සේක. සුත්ත, ගෙය්‍ය, වෙය්‍යාකරණ, ගාථා, උදාන, ඉතිවුත්තක, ජාතක, අබ්භුතධම්ම, වෙදල්ල යන මේ නවාංග බුද්ධශාසනය දෙවිමිනිසුන් විෂයෙහි පිහිටුවා දේශනා කරමින් මුල කලණ මැද කලණ අග කලණ අර්ථවත් ව්‍යඤ්ජනවත් සාකල්‍යයන් පිරිපුන් පිරිසිදු බඹසර ප්‍රකාශ කළසේක. එකල බොහෝ මිනිස්සු සෝවාන්ඵලාදියට පැමිණියහ.

ඉක්බිති දෙවාතිදෙව බ්‍රහ්මදෙව භාග්‍යවතුන් වහන්සේ භික්ෂුසඞ්ඝයා පිරිවරා ලෝකානුකම්පා පිණිස ගම් නියම්ගම් ජනපද රාජධානිවල චාරිකා කරනසේක්, අනුපිළිවෙළින් අරිට්ඨ පුරයට පැමිණ අරිට්ඨපුර රජඋයන්හි වැඩ වසති. එනුවර අතිදෙව නම් ධාර්මික ධර්මරාජ මහත්බල මහර්ධි මහානුභාව ඇති ආඪ්‍ය මහාධන මහාභොග යුත් පිරිපුන් කොටුගුළු ඇති ඇතුන් සැට දහසක් අසුන් සැට දහසක් ද අනූකෙළක් යොධයන් සහිත අනන්තබලවාහන ද

ඇති අතිදෙව නම් රජෙක් විය. මෙබඳු සකලගුණ සම්පන්න රජුට සිරිගුත්ත නම් පණ්ඩිත ඇමතියෙක් සිටියේ ය. හේ වනාහි මෛත්‍රෙය බෝසතාණෝය. අතිදෙව මහරජු අර්ථයෙහි ධර්මයෙහි පිහිටුවීය.

එදින මහරජ මතුමහල්තලයෙහි නාරිගණයා පිරිවරා සීමැදුරු කවුළු පෙදෙසෙහි හුන්නේ ය. ඉක්බිති සිරිගුත්ත පිරිවර සමඟින් කිසියම් කටයුත්තක් පිණිස උයන් දොරටුව ඉදිරියෙන් පිටිනුවරට යන්නේ මහබික්සඟන පිරිවැරූ අතිශයින් මනහර සියලු ජන නුවන් සනසන සෞම්‍ය දර්ශන ඇති රන්වන් සිරුරින් නිකුත් පිඟුවන් වරරසින් බබළන දේදුනු කළඹක් සේ රැලිදුන් උතුම් ගෙල පෙදෙස් ඇති ව්‍යාමප්‍රභායෙන් බබළන සකලාංග යුත් ගසක් මූල වැඩහුන් ඒ බ්‍රහ්මදෙව භාග්‍යවතුන් වහන්සේ දුටුවේය. සිරිගුත්ත පෙර නුදුටුවිරූ හෙයින් ආශ්චර්ය අද්භූතව විස්මය පත්ව "කිමෙක් ද? ශොභාවෙන් අගතැන්පත් මෙතෙම ගසමුල බබළන්නේ ය"යි පිරික්සා බලන්නේ පරම්පරා වචනයෙන් පෙර අසා ඇති බැවින් ඒකාන්තයෙන් ඒ බ්‍රහ්මදෙව අර්හත් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ මෙහි වැඩිසේක් වනැයි සිතා අපොයි ඇත්තෙන්ම අතිමහත් ලැබීමකි. ඉතින් දැන් නයනරසායන පරම දුර්ලභ බුද්ධරූපය දකින්නට ලබමි කියා ඉපිළි ඉපිළී තුටුපහටුව ප්‍රමුදිතව පස්වනක් ප්‍රීතියෙන් පිනා ගිය දෙහයෙන් උපන් ගෞරව බහුමානයෙන් පිරී ඉක්මන් ඉක්මන් පාගමනින් භාග්‍යවතුන් වහන්සේ වෙත ගොස් භාග්‍යවතුන් වහන්සේගේ සිරිපා සිරසින් නැමද පසෙක හුන්නේ භාග්‍යවතුන් වහන්සේගේ උණ්හීසයෙහි පටන් සිරිපා තෙක් සිරිපාහි පටන් උණ්හීසය තෙක් සර්ව ලක්ෂණ පරිපූර්ණ අසමවර බුදුරුව බලමින් හුන්නේ ය.

ඉක්බිති බ්‍රහ්මදෙව භාග්‍යවතුන් වහන්සේ සිරිගුත්ත ත්‍රිවිධ කර්ම සමාදානයෙහි දැහැමි කථාවෙන් දැක්වූහ. සමාදන් කරවූහ. තෙද ගැන්වූහ. සතුටු කරවූහ. භාග්‍යවතුන් වහන්සේ විසින් දැහැමිකතාවෙන් දක්වන ලද සමාදන් කරවන ලද තෙද ගන්වන ලද සතුටු කරවන ලද හෙතෙම ලබන ලද ශ්‍රද්ධාවෙන් බුදුන් වැඳ

පැදකුණු කොට වහවහා යළි නගරයට පිවිස රජුගේ ප්‍රාසාදයට නැග සීමැදුරුකවුළුව ළඟ හුන් රජු කරා ගොස් "දෙවයිනි, ඔබට ලාභයකි. ඔබට හොඳම ලැබීමකි. දෙවයන් වහන්සේගේ උයනෙහි බ්‍රහ්මදෙව අර්හත් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ වැඩවසන සේකැ"යි කීය. බුද්ධ යන වචනය අසා රජ ආශ්චර්යයට අද්භූතයට පත්ව ඉපිළගිය සිතින් පහටුසිතින් නොතැතිගත් හිසින් ප්‍රීතියෙන් පිරුණු හදින් සිරිගුත්තට මෙසේ කීය. "සිරිගුත්ත, බුද්ධ කියා කියන්නෙහි ද?" "දේවයිනි, බුද්ධ කියා කියමි." තෙවරක්ම අසා ඔහුට මෙසේ කීය. "ඔබම බුදුන් දුටු යෙහි ද? නැත්නම් අසන ලද්දේ ද?" දෙවයිනි, මා විසින් ම දක්නා ලදි. මා විසින් බණත් අසන ලදි. මා විසින් සත්පුරුෂ සමාගමය ද ලබන ලදි. "අපොයි පින්වත, ඇත්තෙන්ම ආශ්චර්යයකි. අපොයි පින්වත, ඇත්තෙන්ම අද්භූතයකි. පින්වත් සිරිගුත්ත, ලොව යම් ඒ දුර්ලභ ශබ්දයක් වෙයි නම් ඒ මේ බුද්ධ යන ශබ්දයයි කීය."

එකල්හි භික්ෂූන් දහසක් පිරිවැරූ බ්‍රහ්මදෙව භාග්‍යවතුන් වහන්සේ අනුපම බුද්ධලීලාවෙන් ගැවසීගත් සිරුරින් නීල, පීත, ලොහිත, ඔදාත, මඤ්ජෙට්ඨ, පභස්සර යන සවනක් රැස් විහිදුවමින් නුවරට පිවිසි සේක. බුදුන් පිවිසි කෙණෙහිම ඒ සකල සවනස් රස් නගරයත් ජනතාවත් නහවන්නාක් මෙන් දිසානුදිසාවන්හි පැතිර ගියේ ය. නගරය ෂඩ්වර්ණ ධජපතාකායෙන් අලංකාර කරන ලද සේ බැබළී ගියේ ය. නුවරු ද උතුම් බුදුකිරණින් තැවරී පිනාගිය හදින් සතුටු සතුටුව උනුන් අමතමින් නොදුටුවිරූ අභිනව රූපයක් වූ සුගතරූප සිරි බලමින් විස්මය පත්වෙමින් පුදපිරිකර ගෙන වැඳ වැඳ භික්ෂුසඞ්ඝයා පිරිවර කොටගත් භාග්‍යවතුන් වහන්සේ පසුපස ගමන් කළහ.

බ්‍රහ්මදෙව භාග්‍යවතුන් වහන්සේ රාජාන්තෙපුරය ඉදිරිපස මගට පිළිපන්හ. එවිට සිරිගුත්ත හිස ඔසවා බලන්නේ සවනක් රුචිර කිරණ සමූහය තුළට වන් අසම වර රූසිරින් පිරි භාග්‍ය වතුන්වහන්සේ දැක දකුණත ගෙන අතිදෙව රජුට පෙන්වීය.

"දේවයිනි, මේ බ්‍රහ්මදෙව තථාගත අරහත් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ ශ්‍රාවක සංඝයා සමඟ රජමාවතට වැඩිසේක. උන්වහන්සේ වෙත යනු මැනව මහරජ, පෙරට යනු මැනව. පෙරට යනු මැනව.

ඇතුන් සියයක, අසුන් සියයක, අශ්වතරීන් සියයක, මිණිකාඩොල් පැළඳි කන්‍යාවන් දහසෙක යන මේ සියල්ල එකම පදවිති හාරයක වටිනාකමින් දහසයෙන් පංගුවකුත් නොවටී. එහෙයිනි.

ඉක්බිති අතිදෙව රජ අහිනව ජිනවරරූප දර්ශන මාත්‍රයෙන් සහනයෙන් පිරී යුහුව නැගිට ප්‍රාසාද දොරටු සොපාණය සොයා ගත නොහැකිව සීමැදුරු කවුළුවෙන් පැන්නේය. රජුගේ ශ්‍රද්ධානුභාවයෙන් බූමාටු දෙවියෝ රියසක් පමණ දහසක් පතින් හෙබි පියුම්මලින් රජුගේ පා පිළිගෙන බිම තැබූහ.

ඉක්බිති රජ භාග්‍යවතුන් වහන්සේ වෙත ගොස් සිරිපා වැඳ සුපිහිටි උතුම් සිරිපතුල්හි පටන් කෙසඟ තෙක් කෙසඟ පටන් සිරිපතුල් තෙක් දෙතිස් මහපුරිස් ලකුණින් හෙබි බුදුන් දැක ප්‍රීතිසොම්නසින් උපන් බලවත් ශ්‍රද්ධාවෙන් සත්රුවන් මුසු දෑසමන් මලින් පුද කළේය. ප්‍රණීත පිණ්ඩපාතය ද පිදීය. භාග්‍යවතුන් වහන්සේ යළිත් රජඋයන්හි විසූසේක. රජතුමා විහාර ලක්ෂයක් පිරිවර කොට උතුම් ගඳකිළියක් කරවා බුදුපාමොක් බික්සඟනට මහදන් දී සර්වරත්න මිශ්‍ර මලින් පුදා පසඟපිහිටුවා වඳිමින් සිතින් බුදුබව පැතීය. "ඔබ වහන්සේ යම්සේ එතෙරව ජනතාව එතෙර කළසේක්ද මම ද එසේ එතෙරව ජනතාව එතෙර කරන්නෙමි. යම් සේ ඔබ වහන්සේ දාන්තව ලොව දමනය කළ සේක් ද, මම ද එසේ දාන්තව ලොව දමනය කරවන්නෙමි. යම් සේ ඔබ වහන්සේ අසහනය පිරි ලොකය සැනසූ සේක් ද මම ද එසේ සැනසී ලොව සනසා ලන්නෙමි. යම් සේ ඔබ වහන්සේ ශාන්තව ලොව ශාන්ත කළ සේක් ද මම ද එසේ ශාන්තව ලොව ශාන්ත කරවන්නෙමි. යම්සේ ඔබ වහන්සේ බුදුවී ලොවට අවබෝධ කළ සේක් ද මම ද එසේ

බුදුව ලොවට අවබෝධ කරවන්නෙමි. යම් සේ ඔබ වහන්සේ මිදී ලොව මිදූ සේක් ද මම ද එසේ මිදී ලොව මුදවන්නෙමි. යම් සේ ඔබ වහන්සේ නිවී ලොව නිවූ සේක් ද මම ද එසේ නිවී ලොව නිවා ලන්නෙමි. ඒ අතිදෙවරජ මෙපමණකින් බුදුබව පතා සත් ධර්මයෙක්හි දැඩි සමාදානයෙන් යුතුව බුද්ධාංකුර වූයේ ය. හෙතෙම මරණින් මතු දෙව්ලොව උපන්නේය. සිරිගුත්ත මෙතේ බෝසතාණෝ ද ස්වර්ගයෙහි උපන්හ. බ්‍රහ්මදෙව භාග්‍යවතුන් වහන්සේ ද සියලු විනෙයජනකිස නිමවා පිරිනිවිසේක.

ඒ නැඳ අසංඛ්‍යයයෙහිම බ්‍රහ්මදෙවාදි අනෙකුත් පන්දහසක් බුදුවරු ලොව පහළවූහ. පන්දහසක් බෝසත්වරු ඒ පන්දහසක් බුදුවරුන් විෂයෙහි මහදන් දී මනඃප්‍රණිධාන කළහ. සුනඳ අසංඛ්‍ය-යෙහි නවදහසක් බෝසත්හු නවදහසක් බුදුවරුන් විෂයෙහි මහදන් දී මනඃප්‍රණිධාන කළහ. පඨවි අසංඛ්‍යයෙහි එකොළොස් දහසක් බෝසත්වරු එකොළොස් දහසක් බුදුවරුන්ගේ මහාදානයෙහි මනඃප්‍රණිධාන කළහ. මණ්ඩ අසංඛ්‍යයෙහි දසදහසක් බෝසත්වරු දසදහසක් බුදුරවැන්ගේ මහාදානයෙහි මනඃප්‍රණිධාන කළහ. ධරණි අසංඛ්‍යයෙහි විසිදහසක් බෝසත්හු විසිදහසක් බුදුවරුන්ගේ මහාදානයෙහි මනඃප්‍රණිධාන කළහ. සාගර අසංඛ්‍යයෙහි තිස්දහසක් බෝසත්වරු තිස්දහසක් බුදුවරුන්ගේ මහාදානයෙහි මනඃප්‍රණිධාන කළහ. පුණ්ඩරීක අසංඛ්‍යයෙහි සතලිස් දහසක් බෝසත්වරු සතලිස් දහසක් බුදුවරුන්ගේ මහාදානයෙහි මනඃප්‍රණිධාන කළහ.

> නැඳ සුනඳ පඨවි මණ්ඩ ධරණි සාගර පුණ්ඩරීක යන මේ සත් අසංඛ්‍යයෙහි සිතින් පැතුම් පැතුවන්ගේ ප්‍රමාණය පන්දහස නවදහස එකොළොස් දහස දස දහස විසි දහස තිස් දහස සතලිස් දහස බැගින් වන්නේ ය. බ්‍රහ්මදෙවාදි බුදුවරයන් වහන්සේලා විෂයෙහි අතිදෙවාදි ධීරයෝ මහදන් පැවැත්වූහ.

එයින් කප්ලක්ෂයක් අධික තෙලෙස් අසංඛ්‍යයකින් එපිට

චක්‍රවර්ති නම් රාජධානියක් විය .එහි සක්‍යමුනි නම් භාග්‍යවත් අර්හත් සම්මාසම්බුදුහු පහළ වූ සේක. උන්වහන්සේ මුල මැද අග කලණ අර්ථවත් ව්‍යඤ්ජනවත් හැමලෙසින් පිවිතුරු බඹසරදම් දෙසු සේක. නවාංග ශාස්තෘ ශාසනය දක්වා ලොකානුග්‍රහය පිණිස ගම් නියම්ගම් ජනපද රාජධානි චාරිකාවෙහි වැඩි සේක.

එකල ධඤ්ඤවතී නම් නගරය රාජධානි විය. එහි සාගර නම් රජ රාජ්‍යය කළේය .ඒ සක්විති රජ විද්‍යුත්පාදක මහත්බල මහත්සෘද්ධි මහානුභාව ඇති පිරිපුන් විපුල මහාභවභොග ඇති අනන්ත බලවාහන සහිත වූයේ විය. ඉක්බිති අප බෝසතාණෝ අසඞ්ඛ්‍යකල්ප සතක් පිරූ මනාප්‍රණිධාන ඇතිව දෙව්ලොවින් චුතව සාගර රජුගේ අගමෙහෙසි සුභද්දා දෙවිය කුස පිළිසිඳ උපන්හ. දෙවිය මහත් ගබ්පෙරහරින් දසමස් ගැබ්දරා මහපුරිස් ලකුණු ඇති රන්වන් පුතකු වැදූවාය. රජ උත්තමරූපධාරී මහාපුරුෂ ලක්ෂණ යුත් රන්වන් පුතු දැක සතුටුව එක්සිය අටක් කිරිමවුවරුන් දුන්නේ ය. කෙමෙන් වැඩුණු රජකුමරාට තම නමින්ම නම් තබමින් සාගර කියාම නම් කළේය. සාගර කුමරු සත්හැවිරිදි වන විට පුරාණ සක්‍යමුනි බුදුහු දහසක් භික්ෂූන් පිරිවරා ධඤ්ඤවතී නුවරට වැඩ රජඋයන්හි වසන සේක.

පසුදින පෙරවරු භාග්‍යවතුන් වහන්සේ පෙරවරු අඳනය හැඳ විදුලියක් වන් කායබන්ධනය බැඳ බඳුවදමල් පැහැති සුගතමහාචීවරය පෙරවා ඉඳුනිල්මිණි පැහැති පාත්‍රය ගෙන බික්සඟන පිරිවරා පිඬු පිණිස නුවරට පිවිසි සේක. පිවිසෙත්ම මහජනකාය සියලු දෙවියන්ට අතිදෙව වූ අග්‍රතරවූ සකල දිශාභාගයන් බබුළුවන හිසින් යුත් ඒ අසිරිමත් රුව දැක සොම්නසින් දෙපස සිට භාග්‍යවතුන් වහන්සේ වඳිමින් ස්තුති කරමින් පුදමින් පසුගමන් කළහ.

ඒ මහාජන කුහුල පවතිද්දී ඇමතිගණ පිරිවරා රජවාසලින් නික්ම ඇවිදින සාගර රජකුමර තෙම උදාගිරි මුදුනින් නැඟී බබළන ළහිරුමඬල වන් බබළන, රජමාවතට පිළිපන්, සන්සුන් ඉඳුරන්

සන්සුන් මනස් ඇති අතිශය මනෝහර සකල ජනනයන සුභවූ සුපිළිපන් සර්වඥයන් වහන්සේ දැක විස්මය පත්ව "සගයිනි, ළහිරුමඩලක් මෙන් රජමාතට පිවිස සිටින්නේ කවරෙක් දැ"යි ඇමතියන්ගෙන් විමසීය. එවිට ඇමතියෙක් අසා ඇති බැවින් "දේවයිනි, මේ පිවු පිණිස වඩින සක්‍යමුනි බුදුරජාණෝය" යි කීය. මෙසේ ඇසූ පමණින් රජකුමර තෙම යුහු යුහුව බුදුන් කරා පැමිණ සිරිපා සිරසින් නැමද ශ්‍රද්ධාවෙන් පුබුදු සිතින් සියලු රුවනින් මුසු දෑසමන්මල් අට කරඬුවකින් පුදා ප්‍රණීත උතුම් පිණ්ඩපාතය ද පුදා පසඟ පිහිටුව වැඳ පැදකුණු කොට ගියේ ය. භාග්‍යවතුන් වහන්සේ කැමති තාක් වැඩ සිට යළිත් චරිකාවෙහි වැඩිසේක.

කලක් ගතවීමෙන් පියා විසින් ක්ෂත්‍රිය අභිෂෙකයෙන් අභිෂෙක කරන ලද සාගර කුමරා රජබවට පැමිණ සාගරය හිම් කොට ඇති මහපොළොව දැහැමෙන් සෙමෙන් ඉසුරෙන් සමෘද්ධියෙන් සාමයෙන් අර්බුද රහිතව පාලනය කළේය. පුරාණ සක්‍යමුනි භාග්‍යවතුන් වහන්සේ, යළිත් මහබික්සඟන සමඟින් එනුවරට වැඩ රජඋයනෙහි වසන සේක. බුදුන් වැඩි පුවත අසා සොම්නසට පත් සාගර රජ ගඳමල්පහන් ආදී පුදසත්කාර ගෙන ඇමති ගණ සමඟින් පෙර ගමන් කෙළ්ය. අනතුරුව සිය පින්තෙද අනුභසින් දෙවියන් ලවා හිමවතින් රත්හඳුන් ගෙන්වා රජ උයනෙහිම බුදුරජාණන් වහන්සේට රත්හඳුන් හරයෙන් විහාර කරවා ලක්ෂයක් භික්ෂූන් උදෙසා කුටි - මණ්ඩප සක්මන් උපොසථාගාර දන්හල් ගිනිහල් රත්සඳුනින්ම නිමවා දොරටු පවුරු ආදිය සඳුනින් විසිතුරු රූකම් සහිතව මහාර්ඝ කොට පරිභෝජනීය පොකුණු ආදිය සහිතව සාදවා බුදුපාමොක් සඟනට පුදා නෑ-ඇමතියන් පිරිවරා විහාරපූජාව නිමවා දෙව්මිනිස් ගණ මැද බුදුසිරිපා මුල "නාථයන් වහන්ස, යම්සේ ඔබ සක්‍යමුනි නම් බුදුවූ සේක් ද මම ද එසේ මතු කල සක්‍යමුනි ගොතම නම් බුදු වන්නෙමි. ඔබවහන්සේ සසරින් එගොඩව සතුන් සසරින් එගොඩ කරවූ සේක් ද මම ද එසේ සසරින් එගොඩව ලෝ සතුන් සසරින් එගොඩ කරවන්නෙමි" කියා වාක් හෙදයෙන් බුදුබව පැතීය.

වැඳ පැතුම් පතා "මම ශාක්‍යපුත්‍ර ගෞතම නම් බුදු වෙමි"යි මෙවදන් පැවසීය.

රජුගේ අදහස් දැන භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළසේක.

"මහරජ, බුද්ධධර්මය සෙවීම අතිශයින් දුෂ්කරය. ඉදින් බුදුවන්නෙහි නම් වීර්යයෙන්ම හැකිවන්නේය. උණුහළු ඇඟුරු රත්වූ ශෛලපර්වත පැහෙනජලය වැලිකතර කටු සහිත හුණගොමු දස දහස් ගණනින් මධ්‍යමින් පරතෙර යාමටත් වඩා බෝධිය ලැබීම දුෂ්කරය."

රජ මෙබඳු අතිදුෂ්කරතා අසා මනඃප්‍රණිධාන පුරා ඇති බැවින් මහමෙර මෙන් නිශ්චල ප්‍රතිඥාවෙන් බුදුවදනින් නොසැලී දොහොත් මුදුන් තබා වැඳ "ස්වාමීනි, ලෝකනායකයන් වහන්ස,

අතිදුෂ්කර වෙර දරා සියලු දුෂ්කරතා ජය ගනිමි. උරසින් වැටෙමි. බොධියට පැමිණෙමි. බෝධිය පවත්නේ අවීචියෙහි නම් එහි ගිලෙන්නෙමි. මගේ සිත වජ්‍රයක් බඳුය"යි භාග්‍යවතුන් වහන්සේට සැලකළේය.

ඉක්බිති තථාගතයන් වහන්සේ ඔහුගේ දැඩි නිසල ආපසු නොයන නොපිරිහෙන ගති දැක ඔහු උත්සාහවත් කරමින්

"ඔබ ලොව ලෝ අගනායක බුදුවන්නෙහිය. මෙවක් පටන් දසබුදුකුරුදහම් සොයන්න. එසේම උත්සාහ සංඛ්‍යාත වීර්යය, භාවනා නම් ප්‍රඥාව, ආපසු නොයාම නම් අධිෂ්ඨානය සහ මෛත්‍රිය යන මේ සිවුවැදෑරුම් බුද්ධභූමි සොයන්න. මේ ධර්ම මහර්ෂීන්ට හිතූපචර්යා වන්නේය. මේ සතර භූමියෙහි සියල්ල දක්නා සියල්ල දන්නා තැනැත්තවුන් විසින් දාන සීල නෙක්ඛම්ම පඤ්ඤා විරිය ඛන්ති සච්ච අධිට්ඨාන මෙත්තා උපෙක්ඛාවෙන් සුසංයුත විය යුතු."

එතැන් පටන් සාගර රජ හෙතු සම්පත් ඇතිව සතර භූමියෙහි දසබුදුකුරුදහම් සොයමින් දැඩිතරව වාක්හෙද කොට මරණින් මතු

ස්වර්ගයෙහි උපන්නේ ය. ඒ පුරාණ සක්‍යමුනි බුදුහු ද සියලු බුදුකිස නිමවා පිරිනිවියහ. මෙසේ සබ්බභද්ද අසංඛ්‍යයෙහි පුරාණ සක්‍යමුනි බුදුන් විෂයෙහි සාගරරජ රත්සඳුන්හරමුවා ලක්‍ෂයක් ප්‍රාසාද පුදා වාක්හේද කළේ ය.

එම අසංඛෙය්‍යයෙහිම පනස්දහසක් ඉබ්සත්හු පනස්දහසක් බුදුවරුන් විෂයෙහි මහදන් දී වාක්හේද කළහ. ඉක්බිති සබ්බඵුල්ල අසංඛ්‍යයෙහි සීහ නම් බුදුහුය. සුනන්ද නම් සක්විති රජය. ඒ බෝසත්හු සත්දහසක් පිරිවර සහිත රුවන්මුවා පහයක් පුදා වාක්හේද කළහ. එම අසංඛ්‍යයෙහිම සැට දහසක් බෝසත්හු හැට දහසක් බුදුවරුන් විෂයෙහි මහදන් දී වාක්හේද කළහ. සබ්බරතන අසංඛ්‍ය-යෙහි සුරිය නම් බුදුහුය. සිද්ධත්ථ නම් සක්විති රජය. අනූදහසක් පිරිවර වෙහෙර සහිත ප්‍රාසාදයක් පුදා වාක්හේද කළේය. එම කල්පයෙහිම හැත්තෑ දහසක් බෝසත්හු සැත්තෑදහසක් බුදුවරුන් විෂයෙහි මහදන්දී වාක්හේද කළහ. උසභක්ඛන්ධ අසංඛ්‍යයෙහි අභිභූනම් බුදුහුය. සීහ නම් සක්විති රජය. අසූදහසක් පිරිවර වෙහෙර ඇති ප්‍රාසාද පූජාවෙහි වාක්හේද කළහ. එම අසංඛ්‍යයෙහි අසූදහසක් බෝසත්හු අසූදහසක් බුදුවරුන් විෂයෙහි මහදන්හි වාක් හේද කළහ. මාණිභද්ද අසංඛ්‍යයෙහි උප්පල නම් බුදුහය. සුදස්සන නම් සක්විති රජය. දහසක් පිරිවර වෙහෙර ඇති ප්‍රාසාද පුජාවෙහි වාක්හේද කළහ. එම අසංඛ්‍යයෙහි අනූදහසක් බෝසත්හු අනූ දහසක් බුදුවරුන් විෂයෙහි මහදන්හි වාක්හේද කළහ.

පදුම අසංඛ්‍යයෙහි පදුමුප්පල නම් බුදුහුය. අරින්දම නම් සක්විති රජය. ලක්‍ෂයක් පිරිවර බඩු ඇති මහාමණ්ඩප පූජාවෙහි වාක්හේද කළේය. එම අසංඛ්‍යයෙහි පනස් දහසක් බෝසත්හු පනස් දහසක් බුදුවරුන් විෂයෙහි මහදන්හි වාක්හේද කළහ. උසභ අසංඛ්‍යයෙහි නීලුප්පල නම් බුදුහුය. විජය නම් සක්විති රජය. අනූදහසදක් පිරිවර වෙහෙර සහිත ප්‍රාසාද පූජාවෙහි වාක්හේද කළේය. ඒ අසංඛ්‍යයෙහි සදහසක් බෝසත්හු සදහසක් බුදුවරුන් විෂයෙහි මහදන්හි වාක්හේද කළහ. බන්ධත්තම අසංඛ්‍යයෙහි පදුම

නම් බුදුහුය. ජොතිමා නම් සක්විති රජය. සැටදහසක් පිරිවර මඩුසහිත මණ්ඩප දානයෙහි වාක්හේද කළේය. එම අසංඛ්‍යයෙහි තිස්දහසක් බෝසත්හු තිස්දහසක් බුදුවරුන් විෂයෙහි වාක්හේද කළහ. සබ්බල අසංඛ්‍යයෙහි පදුමගබ්භනම් බුදුහුය. උප්පල නම් සක්විති රජය. සත් දහසක් පිරිවර වෙහෙර සහිත ප්‍රාසාද පූජාවෙහි වාක්හේද කළේය. එම අසංඛ්‍යයෙහිම ලක්ෂයක් බෝසත්හු ලක්ෂයක් බුදුවරුන් විෂයෙහි මහදන්හි වාක්හේද කළහ.

> මෙසේ සබ්බභද්ද සබ්බපුල්ල සබ්බරතන උසභක්ඛන්ධ මාණිභද්ද පදුම උසභ බන්ධත්තම සබ්බල යයි අසංඛ්‍යකල්ප නවයක් ප්‍රකාශිතය. බෝසතුන්ගේ වාක්හේද පැතුම් පැතීම නව අසංඛ්‍යයක් වන්නේය. පනස, සැට, සැත්තෑව, අසූව, අනූව, වශයෙන් ද පනහ, හය, තිහ, වශයෙන් දහසක් හා ලක්ෂයක් බෝසත්හු ද පැතුම් පැතූහ.

මේ අතිදූරෙ නිදාන නම්.

අවිදූරෙ නිදානය කෙසේ ද යත්, සාරාසංඛ්‍ය කල්ප ලක්ෂයකින් මතු සෙල නම් අසංඛ්‍යය විය .එම අසංඛ්‍යයෙහි වරමණ්ඩ කල්-පයෙක තණ්හංකර මෙධංකර සරණංකර දීපංකර නම් සිවු බුදු කෙනෙක් උපන්හ. එතැන් පටන් බෝසතුන්ගේ අභිනීහාරය විස්තර වශයෙන් කිවයුතුය. විස්තර විසින් එය තෙලෙස් ආකාරය. නම් වශයෙන්, කාලපරිච්ඡේද වශයෙන්, චර්යානුප්‍රධාන වශයෙන්, ප්‍රහාණ වශයෙන්, චාරිත්‍රවශයෙන්, සමාදාන වශයෙන්, බුද්ධිකරණ වශයෙන්, ප්‍රතිපදා වශයෙන්, චාරිත්‍ර වශයෙන්, අවීතික්‍රමණධර්ම වශයෙන්, මහා පුරුෂචිතර්ක වශයෙන්, බොධිප්‍රධාන වශයෙන්, පාරමී රැස්කිරීම් වශයෙනි.

එහි නම් වශයෙන් යනු, බෝසත් වරුන්ගේ නම් තුනකි. උද්ඝටිතඥ, විපචිතඥ, ඥෙය්‍ය යනුවෙනි. එහි උද්ඝටිතඥ බෝසත්හු තමන්ගේ උපනිශ්‍රයයෙන් ප්‍රාර්ථනාභිනීහාරය කරන්නේ එය බුදුන්

ඉදිරියෙහි සතර පද ගාථාවක් අසමින් තුන්වන පදයෙහිදීම අභිඥා සහ ප්‍රතිසම්භිදා සමග රහත්බව ලැබීමට සමත් හේතු සම්පත් ඇත්තෝය. එදිනම ලබන ලද නියත විවරණ ඇතිව පැරුම් පුරා සාරාසැකි කප් සුවහසකින් සම්මා සම්බුද්ධත්වයට පත් වෙති. විපචිතඥ බෝසත්හු සිය හේතු සම්පත් පරිදි සම්මා සම්බුදු කෙනෙකුන් ඉදිරියෙහි ගාථාවක් අසමින් සතරවන පදය අවසන් වීමට පළමුවම (ෂඩභිඥා, චතුපටිසම්භිදා සහිත) රහත්බව ලැබීමට හේතු සම්පත් ඇත්තෝය. එසේම නියත විවරණ ලබා පැරුම් පුරා අට අසැකිකප් සුවහසකින් සම්මා සම්බෝධියට පැමිණෙති. ඤෙය්‍ය බෝසත්හු සිය හේතු සම්පත් පරිදි බුදු කෙනෙකුන් ඉදිරියෙහි සිවුපද ගාථාවක් අසා අවසානයත් සමඟ ෂඩභිඥා ප්‍රතිසම්භිදා සහිත රහත් බව ලැබීමට යොග්‍ය වෙති. එහිදී විවරණ ලබා පැරුම්පුරා සොළ-සැකිකප් සුවහසකින් සර්වඥබවට පත්වෙති.

කාලපරිච්ඡේද වශයෙන් මෙසේය. අප බෝසතාණෝ උද්ඝටිතඥයහ. මහාප්‍රාඥයහ. මහත්වීර්ය ඇත්තෝය. වහා අවබෝධ කරන සුලුය. පාරමී පිරූහ. එහෙයින් සාරාසැකිකප් සුවහසකින් සම්මා සම්බෝධිය සාක්ෂාත් කළහ. චර්යා ප්‍රධාන වශයෙන් කෙසේ ද යත්, බෝසත් වරුන්ගේ චර්යා තුනකි. තමන්ගේ සම්පත් ඉතිරි නොකොට සියල්ල දෙති. මහජනයා සිල්හි යොදවති. දසකුශල කර්මය නොපිරිහෙළා මව්පිය උපස්ථාන කුලදෙටුවන් පිදීමාදිය කරති. චර්යා ප්‍රධාන වශයෙන් මෙසේය. ප්‍රහාණ වශයෙන් කෙසේ ද? බෝසත්වරුන්ගේ ප්‍රහාණ තුනකි. ලොභ ප්‍රහාණය ද්වේෂ ප්‍රහාණය මොහප්‍රහාණය කියායි. චාරිත්‍ර වශයෙන් කෙසේ ද? දානයෙන් ලොභය වළක්වති. ශීලයෙන් ද්වේෂය වළක්වති. ගුරුපදෙශයෙන් මෝහය වළක්වති. සමාදාන වශයෙන් කෙසේ ද? බෝසතුන්ගේ කරුණා, අනුද්දයා අනුකම්පායයි සමාදන්වීම් තුනකි. කරුණාව කෙසේ ද? සත්වයන් දුකින් මුදනු කැමැත්තයි. එක එකකු වෙනුවෙන් වෙන වෙනම කපක් නිරයෙහි පැසී එම උපායෙන් සතුන් මුදවා ලිය හැකි නම් එසේ කරනු පිණිස මෙබඳු කරුණා සමාදානයක්

බෝසතුන්ට ඇත්තේ ය. කරුණාවෙන් අනුද්දයාවයි. හැම සතුන්ම සිවුමහදිවයිනෙහි සක්විති රාජ්‍යයෙහි පිහිටුවන තරමේ අනුද්දයාවක් බෝසතුන්ට ඇත්තේය. අනුකම්පාව කෙසේ ද? කවර නම් උපායකින් සියලු සතුන් සියලු ආසාවන් නසා රහත් බවට පමුණුවා සියලු දුකින් මුදවන්නෙම් ද යන මෙබදු අනුකම්පාවක් බෝසතුන්ට ඇත්තේය.

බුද්ධිකරණ වශයෙන් කෙසේ ද? බෝසතුන්ගේ උත්සාහ උම්මග්ග අනිවත්තනා හිතුපචරියා යි බුද්ධිකරණතා සතරකි. එහි උත්සාහය නම් ධන අංග ජීවිත පරිත්‍යාගයෙන් සිය හෙතුසම්පත් අනුව සාරාසංඛ්‍ය කල්පලක්‍ෂයකින් අටාසංඛ්‍ය කල්ප ලක්‍ෂයකින් සොළසාසංඛ්‍යකල්ප ලක්‍ෂයකින් පාරමී සම්පූර්ණ නො කොට මැද නතර නොකරමි යන වීර්යපරිග්‍රහයයි, උත්සාහයයි. ඉදින් යම් කිසි පණ්ඩිතයෙක් ඔහු පරීක්‍ෂා කරනු පිණිස මෙසේ කියයි. "පින්වත් පුරුෂය, ඔබ බුදු බව ලැබීම පිණිස උත්සාහ කළෙහිය. උත්සාහ යෙන් පලක් නැත. යම් සේ දසදහසක් සක්වළ සක්වළක් ප්‍රමාණ සීමාව උණුහළුවලින් පිරී තිබේ. ඒ අළු සියුම්ය. අතිශයින් උණුසුම්ය. නාසා සිදුරකින් ඇතුළු වුවහොත් මුළු සිරුර දවන්නේය. කිසියම් වීර්යසම්පන්න බුද්ධපාරමී පුරන මිනිසෙක් ඒ මැදින් ගොස් අවසන් කරන්නට සමත් වෙයි. බෝධිය ලබනු කැමැත්තකු ඊටත් වැඩි වීර්ය සම්පන්නයකු විය යුතුය. ඇත්තෙන්ම එබඳු නවවිධ විර්යයක් කොයින් ලබන්න ද? ඒ ඔබ බොධියට පැමිණෙන්නෙහි නම් මෙලෙසිනුත් විනාශ විය හැකිය. එබඳුම ඉඩක් එබඳුම සීමාවක් පහවූ දුම් ඇති පහවූ ගිනිදැල් ඇති රත්වූ ලෝගුලි වැනි පහස ඇති කැලමල්වැනි පාට ඇති අඟුරින් පුරවන ල්දදේ ය. එවැනිම ප්‍රදේශයක් සැත්හුල් සමාන තියුණු අක් ඇති අතරක් නැති ව ගහණවූ මුවහත් ගල් කැටවලින් පිරී ඇත. එතරම්ම ප්‍රදේශයක් සිංහාදීන් හැර අඩයොදුන යොදුන දහසක් යොදුන් උස් දුර්ගම විසම දිය නැති සෙවණ නැති හෑරුණු වළවල් ඇති වැනසුණු පර්වත ඇත්තේ ය. එපමණම පෙදෙසක වෙතරණී නදී ජලය වැනි ජලය පිරී පවත්නේය.

එපමණක් ප්‍රදේශයක අවීචිගිනිදැල් සමාන ඇවිලෙන ගිනිජාලාවෙන් අතරක් නැත. එතරම්ම පෙදෙසක වරකධාන්‍ය වැනි වැලි පිරී පවතී. එපමණම පෙදෙසක හුණගොමු පිරී ඇත්තේය. එපමණම පෙදෙසක තියුණු අක් ඇති තුන්කොන් කටු පිරී ඇත්තේය. මිනිසෙක් ඒ සියල්ල මැඩගෙන ඉදිරියෙහි අනාථව හඬමින් සිටියකු කරතබා ගෙන කරුණා හරිතව උපස්ථාන ද කරන්නේය. බොධියට පත්වනු කැමැත්තෙකු ඊටත් වඩා දැඩිතර වීර්යයෙන් යුක්ත විය යුතුය. මෙකී වීර්යය රහිත ඔබ කෙසේ නම් බුදුවන්නෙහිද" කියායි.

එවිට බෝසතාණෝ ඔහුට "එහෙනම් දුක පිළිබඳ සිතන්-නෙකුට මෙසේ කියන්න. මෙහිලා මම බීජමාත්‍රවූත් දුක යන හැඟීමක් නැතිව තමා කෙරෙහිත් නිරපෙක්ෂව සත්ත්වහිතය පමණක්ම කරන්නෙමි" යි කියති. මෙවැනි උත්සාහ සම්පන්න බෝසතාණෝම සම්බුදුන් වෙතින් විවරණ ලබති. හළු මැඩීමාදි උත්සාහයෙන් පමණක් වීර්යවන්තයෙක් නොවන්නේය. එහෙයින් ක්‍රෝධහළු මසුරු අඟුරු මානපර්වත මොහ උණුදිය මකුවැලි සඨමඬ[1]ගෘහබන්ධනහුණගොමු මිසදිටුදැල් නින්දාබස් තියුණුමුවහත් කෙලෙස් කාන්තාර තරණයෙන් සත්ත්වහිතය කරන්නට උත්සාහ සම්පන්න විය යුතුය. බෝසතුන්ගේ උත්සාහය නම් මෙබදු වන්නේය. උම්මග්ග නම් ප්‍රඥාවයි. කල්පයක් නමුත් නොකඩ ධාරානිපාත වැසි වස්නා කල ධාරානිපාත දිය බිඳු ලක්ෂ කෝටිගණනින් පිරිසිඳ දැකීමට සමත් නුවණින් බෝසත්වරු සමන්නාගත වෙති.

නොනැවැත්ම නම් දෙවපුත්ත මාරයා බුද්ධරූපයක් මවා ගෙන සවනක්රස් විහිදුවමින් මෙසේ කියයි. "පින්වත් සත්පුරුෂය, අනෙක ලොකධාතුවල සත්ත්වයෝ දුක් විඳිති. ඉදින් ඔබ ඒ එක් එක් අයකු නිසා දුක් විඳින්නෙහිය. නමුත් බුදු වන්නෙහි හෝ නොවන්නෙහි හෝ වේවා. මාරයා දිවගොස් අභ්‍යන්තර ගිනිජාලාවෙන් නිතොර කියා නිම කළ නොහැකි දුක් ඇති පැහෙන සතුන් සහිත අවීචිය පෙන්වා මෙසේ කියයි. ඔබ සාරාසංඛ්‍ය කප් ලක්ෂයක් පැසී නැවත මිනිසත් බව ලබා දවස දවස උදේ හවස තුන් සියයක් සැතින් පහර

කමින් සාරාසංඛ්‍ය කප් ලක්‍ෂයක් දුක් විඳ නැවත පෙරුම්පුරා බුදුවන්නෙහිය. මම ඔබට සංග්‍රහ පිණිස උත්‍රාස නැති කිරීමට කීවෙමි. ඔබට බුද්ධත්වයෙන් කමක් නැත. එන්න, මා 'ළඟ මහණවී අදම ෂඩභිඥා ලාභීව මඟපලසුව ලබන්න" කියායි. බෝසත්හු ඔහුගේ කියමන ද ගණන් නොගෙන මෙසේ කියති. ඒ කියූ අන්දමේ දුක් තිබුණාවේ. මම එක එක සත්වයා සඳහා ඊට සතසහස්‍ර ගුණයෙන් වැඩි දුක් විඳිමින් පාරමිතා පුරන්නෙමි" කියා යි. බෝසතුන්ගේ නොනැවැත්ම මෙබඳුය.

හිතුපචරියා නම් සකල සත්ත්වයනට සැපසම්පත් සැදීම පිණිස පිළිපන් මහාසත්ත්වයෝ අනන්ත දුක් විඳීමෙන් අන් සතුන්හට සම්පත් උපදවන්නට ලැබේ නම්, එක සතෙකු උදෙසා කපක් අවීචියෙහි පැසී සියලු සතුන් ගොඩනගා ඔවුන්ට පංචාභිඥා අටසමවත් උපදවා සියල්ලන්ට වාසය පිණිස ප්‍රාසාදයන් මවා මෘදු සුව පහස් ඇති සොඳුරු ඇතිරිලි ඇතුරූ මාඇඟි උතුම් පර්යංකවල හිඳුවා ආහාර පාන වස්ත්‍රාභරණ අංගරාග කුසුමාභරණ ධූප පාවාසාදි උපකරණවලින් ද නැවීම් සුවඳ ගැල්වීම් සම්බාහනාදියෙන් ද උවටැන් කොට පෘථුවි පරිවර්තනයෙන් කුඩාමී සෙයින් මිහිරි රස ඇති පෘථුවිරස වළඳවා සදහම් අමා රසයෙනුත් ඔවුන් සනසවා නිවනෙහි පිහිටුවති.

ප්‍රතිපදා වශයෙන් කෙසේද? දළ්හසමාදානතා අකම්පියට්ඨිතිතා, අපච්චුදාවත්තනා, පුබ්බඞ්ගමනතා චිත්තුපධාරිතා යි ප්‍රතිපදාව පස් ආකාර වෙයි. ප්‍රතිපදාවශයෙන් මෙසේයි. චර්යා වශයෙන් කෙසේ ද? බෝසත් චර්යා සයෙක් වෙයි. අලොභ අදහසින් ලොභයෙහි දොස් දකිති. අදොස අදහසින් දොසයෙහි දොස් දකිති. අමොහ අදහසින් මොහයෙහි දොස් දකිති. නෛෂ්ක්‍රම්‍ය අදහස් ඇතිව කාමයන් විෂ මෙන් දකිති. විවේක අදහසින් ගණවාසය සිරගෙයක් මෙන් දකිති. නුමුලා අදහසින් තුන් භවයෙහි ඡන්දරාගය දුරු කරති. චර්යා විසින් මෙසේය.

අනතික්‍රමණධර්ම වශයෙන් කෙසේ ද? බෝසතුන්ගේ අවීතික්‍රමණධර්ම සත්වැදෑරුම්ය. ජීවිතය අත්හරිති, පාරමී සමාදානය අත් නොහරිති. අවීචිගිනිදැල් දැක දැක තැති ගනිමින්නුත් ප්‍රධන්වීර්යයෙන් නොවෙනස් වෙති. ජීවිතය විසිරී යද්දීත් අධිෂ්ඨානය අත්නොහරිති. යන්ත්‍රයෙන් උක්දඬු ඇඹරෙත්නාක් මෙන් අඟපසඟ ඇඹරෙද්දීත් සිල් බැහැර කිරීමට සිත් නූපදවති. කෙසේ නම් සිල් බිඳිත් ද? මහාරාජ්‍යය හැර දමති, සංවරය හැර නොදමති. කඩුවෙන් කපද්දීත් කෝප නූපදවති. හාත්පසින් චණ්ඩ සතුන් දසතින් බියගන්වද්දීත් තැති නොගනිති. අවීතික්‍රමණ ධර්ම වශයෙන් මෙසේ ය.

> ආයුෂය අත්හරිති. පාරමී අත් නොහරිති. අවීචිය දැක ප්‍රාණය නොහරිති. අඟපසඟ සිඳලූවත් පීඩා කළත් ශීලය නොහරිති. රාජ්‍යය හැර දමති. උතුම් සංවරය නොහරිනි. කඩුවෙන් කෙටුවත්, ආයුධයෙන් පහර දුන්නත් සත්කඩ කොට අඟපසඟ කැපුවත් කෝප නොකරති.

පුරුෂ විතර්ක වශයෙන් කෙසේ ද? මහාපුරුෂ විතර්ක අටකි. එයින් යුත් හෙයින් මහිච්ඡතාව දුරැර අල්පෙච්ඡ වෙති. ලොලුපතාව දිනා සන්තුෂ්ට වෙති. ප්‍රපංචතා දුරුකොට නිෂ්ප්‍රපංචයෝ වෙති. සංගණිකාරාමය හැර පවිවෙකීහු වෙති. කුසීතකම් හැර වීර්යාරබ්ධයෝ වෙති. සිහිමුළාව හැර සිහිමත්හු වෙති. අසමාහිත බව හැර සමාහිතයෝ වෙති.

බොධිපධාන වශයෙන් කෙසේ ද? බෝසත්වරුන්ගේ බොධිප්‍රධන් නවයකි. සීල සංවරප්‍රධානය, ඥාන අනුරක්ඛණ ප්‍රධානය, නීවරණවිගම පහාණ ප්‍රධානය, නීවරණ විලොකන භාවනා ප්‍රධානය, ගුරු සංවාසය, අසම්මොහ ප්‍රධානය, දානපයොග ප්‍රධානය, පරාක්‍රමය, අනිවත්තන ප්‍රධානය, ප්‍රධන්හි නොවෙනස් වන සිත පිහිටුවීමයි. පාරමී සංඛය වශයෙන් කෙසේ ද? මහාපුරුෂයන්ගේ පාරමී රැස් කිරීම දසවිධය. දාන, සීල. නෙක්ඛම්ම, පඤ්ඤා, විරිය, ඛන්ති, සච්ච. අධිට්ඨාන, මෙත්තා, උපෙක්ඛා යනුයි. පාරමී ගමන ලක්ෂණ

ඇත්තෝය. මෙහිලා ධන පරිත්‍යාගය පාරමිතාවයි. අංග පරිත්‍යාගය උපපාරමිතාවයි. ජීවිත පරිත්‍යාගය පරමාර්ථ පාරමිතාවයි. සෙස්සෙහි ද ධන, අංග, ජීවිත පරිත්‍යාග පාරමිතා උපපාරමිතා පරමාර්ථ පාරමිතායි දත යුතුය. මෙසේ සමතිස් පැරුම් දසපැරුම්හිම ඇතුළත් වෙයි.

දාන පාරමිතාව කෙසේ ද?

යම් කිසිවෙක් යටට හරවන ලද දිය පිරුණු කළයක දිය ඉතිරි නොවන්නා සේ දන් දෙත් නම් එයයි.

සීලපාරමිතාව නම්.

සෙමෙර දෙන දැවටුණු වලිගය නොකඩා රකින්නාක් මෙන් සංවර ශීලය නොවනසා රක්නේය

නෛෂ්ක්‍රම්‍ය පාරමිතාව නම්.

බන්ධනාගාරගත දුකට පත් මිනිසෙක් ඉන් මිදෙනු කැමති වන්නාක් මෙන් බෝසත්හු ද නික්ම යාමට ම අභිමුඛ වෙති.

පඤ්ඤා පාරමිතාව නම්.

පිඬු පිණිස හැසිරෙන භික්ෂුනම පහත් මැදහත් උසස් කුල අත නොහරනේ යම්සේ ද ප්‍රඥාපාරමිතාව ද එසේය.

විරිය පාරමිතාව නම්.

සැඟව සිටින කෙසරසිංහයා හැමදා ඩැහැගන්නා සිත් ඇත්තාක් මෙන් වීර්යවත්ම වෙයි. හීනමනසක් ඇත්තේ නොවෙයි.

ඛන්ති පාරමිතාව නම්.

ඇවිලෙන ගින්න හැමදා ඉවසන පොළව මෙන් ඉවසීමෙන් යුත් තැනැත්තේ දුක් දහම්හි ඉවසන්නේ වෙයි.

සත්‍ය පාරමිතාව නම්.

සූර්යොදයෙහි සමව පවත්නා ඔෂධි තරුව මෙන් හැමදා දෙවිමිනිසුන් අතර සත්‍යය සමව ආරක්ෂා කරයි.

අධිෂ්ඨාන පාරමිතාව නම්

නිසලව සුපිහිටි මෙර නොවෙව්ලන්නාක් මෙන් අධිෂ්ඨානය නොවෙව්ලයි. කම්පා නොවෙයි.

මෛත්‍රී පාරමිතාව නම්

ජලය නිරන්තරයෙන් සම සිසිල පතුරුවන්නේ යම්සේ ද මෛත්‍රිය ද එසේ සියලු අයුරින් සව්සතුන් වෙත පතුරුවයි.

උපෙක්ෂා පාරමිතාව නම්

මහපොළව මැදහත්ව සුවඳ දුගඳ ගන්නාක් මෙන් සැපෙහි දුකෙහි මැදහත් වන්නේ ය.

එහි ලා දානපාරමිතාව කෙසේ ද? ජීවිතය ප්‍රධාන මස් ලේ ආදි පරිත්‍යාගයයි. සිව්, මෙත්තාබල, සොම, අරින්දම, සිරි, සෙන, මහායස, දණ්ඩ, විරිය, බ්‍රහ්මඉසි, සුවණ්ණකච්ඡපාදි ජාතක පන්සිය පනස් ජාතකවල නොමැත්තේය. ධර්ම සංගීතියෙහි සංගායනා කරන ලද ද? ආයුෂ්මත් ආනන්ද තෙරුන් විසින් මෙසේ කියන ලදි.

අසූ දෙදහසක් බුදුරදුන් වෙතින් ගන්නා ලදි. දෙදහසක් භික්ෂූන් වෙතින් ගන්නා ලදි. ඒ මේ ධර්මයෝ පවත්නාහ.

කිම අවිරුද්ධයයි කියැවේ ද? නැතැයි නොකිව යුතුය. කුමක් හෙයින් ද? ආයුෂ්මත් අනඳ තෙරුන් විසින්ම පිරිනිවන් අවස්ථාවෙහි මට සියලු දිශාවන් මුළාවෙයි. ඇසූ දහම් පවා නොලැබෙයි කියා කියන ලද නොවේ ද? මෙසේ කී කල ගිලිහුණු දේ සංගායනා නොකරන ලදි. එහෙයින් මේ සිව් මෙත්තාබල සොමරාජ ජාතක ජාතකපිණ්ඩයෙහි නොදක්නා ලැබේ. දෙව් ලොවින් ද නොලැබේ. මෙහි පමණක් නොවේ.

දාන උපපාරමිතාව කෙසේ ද? බාහිර ධනාදියයි. රත්ආදියයි. චතුද්දිස, වෙස්සන්තර වෙලාම බ්‍රාහමණාදීන් මෙනි. දාන පරමාර්ථ පාරමිතාව කෙසේ ද? ශරීර හිස් හද අඹු දරු ආදීන් දීමය. සසක, සුවණ්ණකච්ඡප, බ්‍රහ්මඉසි, නිග්‍රොධ, චූළකවි, මහාකවි, පදුම, සිරි, සෙන, මහාදණ්ඩ, චන්දරාජාදීන් මෙනි. සීල පාරමිතාව කෙසේ ද? පන්සිල්හි පටන් කොට ඇති සිවුපිරිසුදු සීලයයි. සීල උපපාරමිතාව නම් අඟපසඟ සිදීම් බිඳීම් නිසා හෝ සීලය නොබිඳී. සීලව ඇතු මාතුපොසක ඇතු ආදීන් මෙනි. පරමාර්ථ පාරමිතාව කෙසේ ද? ජීවිත පරිත්‍යාගයෙහි වුවත් සීලය නොවනසයි. භූරිදත්ත, සංඛපාල, සීලව, රාජපුරොහිත, අඩ්ඪඋපොසථාදීන් මෙනි. නෙක්ඛම්ම පාරමිතාව කෙසේ ද? පරපරිගෘහිත ප්‍රව්‍රජ්‍යාවයි. කල්‍යාණධම්ම කුද්දාලාදීන් මෙනි. නෙක්ඛම්ම උපපාරමිතාව නම්, මහාජනපරිගෘහිත පැවිද්දයි. සුධඤ්ජය, අයොඝර, අසදිය, මහාජනකාදීන් මෙනි. නෙක්ඛම්මපරමත්ථ පාරමිතාව කෙසේ ද? ජීවිත විනාශය වුවත් නික්මී යනු කැමැත්තේමය, මූගපක්ඛ, සිද්ධාර්ථ කුමාරාදීන් මෙනි. ප්‍රඥා පාරමිතාව කෙසේ ද? සරභඞ්ග, ආදාසමුඛ, මහාබොධි, සූචිකාර, රථකාරාදීන් මෙනි, ප්‍රඥා උපපාරමිතාව නම්, අනුන්ගේ ජීවිත නිමිති කොටගත් ප්‍රඥාව යි. මහෞෂධ, විධුර, සේනකාදීන් මෙනි. ප්‍රඥා පරමාර්ථ පාරමිතාව නම් බුද්ධඥානය නිමිති කොට ජීවිතය පරිත්‍යාග කරයි. ධම්මරුචි, සුතසොමාදීන් මෙනි.

වීර්ය පාරමිතාව කෙසේ ද? අනුන් කෙරෙහි ඉපයීම නිමිති කොටගත් වීර්යයයි. අය්‍යකාළ, නන්දිවිසාල වෘෂභයන් මෙනි. විරිය උපපාරමිතාව නම්, අනුන්ගේ ජීවිතය හා බැඳුණු විර්යයයි. වාළඛ-ණක, සාර්ථවාහ, ධනුග්‍රාහකයන් මෙනි. වීර්ය පරමාර්ථ පාරමිතාව නම්, සියදිවි පිදීම නිමිති කොටත් වීර්යය අත් නොහරී. මහාජනක, ලඝුසොම, සීලවරාජාදීන් මෙනි. ක්ෂාන්ති පාරමිතාව කෙසේ ද? අනුන්ගෙන් එන දුක් ආදිය ඉවසීමයි. ක්ෂාන්තිරාජාදීන් මෙනි. ක්ෂාන්ති උපපාරමිතාව නම්, සමකයාට පිළියම් යෙදීමට ඇති ඉවසීමයි. දීඝායුකුමාර මහාසථාදීන් මෙනි. ක්ෂාන්ති පරමාර්ථ පාරමිතාව නම් අනුන්ගෙන් සියදිවි විනාශයේදීත් ක්ෂාන්තිය අත් නොහරී. ක්ෂාන්-

තිවාද, ඡද්දන්ත, චම්පෙය්‍ය, භූරිදත්ත, සංඛපාලාදීන් මෙනි. සත්‍ය-පාරමිතාව කෙසේද?සත්‍යය නොයික්මවයි. සුංසුමාර, වානර රාජාදීන් මෙනි. සත්‍ය උපපාරමිතාව නම්, තමන් ගේ අනුන්ගේ දිවි සුරැකීම පිණිස සත්‍යක්‍රියාවයි. සිවිරාජ, වට්ටකපොතක, මත්ස්‍ය- රාජාදීන් මෙනි. සත්‍ය පරමාර්ථ පාරමිතාව නම්, සත්‍යය පිණිස සියදිවි පුදයි. සුතසොම, චුල්ලසුතසෝමාදීන් මෙනි.

අධිෂ්ඨාන පාරමිතාව කෙසේ ද? යමක් අධිෂ්ඨිත නම් එය අත නොහරී. නන්දිවිසාල, නලකපානාදීන් මෙනි. අධිෂ්ඨාන උපපාරමිතාව නම්, අනුන්ගේ ජීවිත මුදාගැනීම පිණිස අධිෂ්ඨානයයි. උම්මග්ග, වාළඛණකාදීන් මෙනි. අධිෂ්ඨාන පරමාර්ථ පාරමිතාව නම් සියදිවි පිදීමේ යම් අධිෂ්ඨානයක් වෙයි නම් එය අත නොහරියි. මූගපක්ඛ, සුංසුමාර කපොටකාදීන් මෙනි. මෛත්‍රී පාරමිතාව කුමක් ද? අප්‍රමාණ්‍ය මෛත්‍රියයි. මහාසුදස්සන, මඛාදෙව පරම්පරාදිය මෙනි. මෛත්‍රී උපපාරමිතාව නම් සත් හැවිරිදි මෛත්‍රියයි. දළ්හනෙමි, සුතනෙමි, කුද්දාල, මූගපක්ඛාදීන් මෙනි. මෛත්‍රී පරමාර්ථ පාරමිතාව නම්, දිවිපිදීම් මෛත්‍රියයි. චූළකවි, මහාකවි, පරමනිග්‍රොධ, ස්වර්ණකච්ඡපාදීන් මෙනි. පරිත්‍යාග පර්යන්ත උපෙක්ෂා පාරමිතාව කෙසේ ද? අටලෝ දහම්හි උපෙක්ෂාවයි. චූළබෝධි ආදීන් මෙනි. උපෙක්ෂා උපපාරමිතාව නම්, අෂ්ට සමාපත්තියෙහි උපෙක්ෂාවයි. නෙවසඤ්ඤානාසඤ්ඤායතන ලාභයෙන් වන ප්‍රසාදයයි. උපෙක්ෂා පරමාර්ථ පාරමිතාව නම්, ජීවිත පරිත්‍යාගය අවසන් කොට ඇති උපෙක්ෂාවයි. අෂ්ටසමාපත්තිවලමය. ක්ෂාන්තිවාදී මාතඞ්ග බෝසත් ආදීන් මෙනි.

> සලක්ෂ එක්සැට දහසක්වූ ප්‍රාඥවූ බුදුවරුන් වහන්සේලාට මහදන් පැවැත්විය. එක්සිය පනස් කෙළ විස්සක් පසේබුදු වරයන් වහන්සේලාට ද අසංඛ්‍ය ශ්‍රාවකයන් වහන්සේලාට සහ මහණබමුණන්ට ද යන මේ පින්කෙත් විෂයෙහි ඔහු මහදන් පිදීය. සීලාදිය රකිමින් පාරමිතා පිරීය. පාරමී රැස් කිරීම් වශයෙන් මෙසේ ය.

මේ තෙලෙස් ආකාරයෙන් පිරිසිදු අදහස් ඇති සුවිසුද්ධ උතුම් දුෂ්කර දර්ශන ඇති පුද්ගල තෙම බෝධිකාරක ධර්මයන් සපුරාලීමට සමත් වෙයි. මේ ධර්ම සංචිතකුසල ඇත්තවුන්හට උපදී. මේවා පුරනු කැමැත්තවුන් විසින් පළමුවෙන්ම හිරි, ඔතප්, ආගම යන තුන්කරුණින් යුක්ත විය යුතුය. හිරියෙන් පරිපූර්ණ වන්නේ කෙසේ ද? මිනිස් ලොව ඉපිද පිරිමි අත්බැවිහි සිට කර්මවාදීව, ක්‍රියාවාදීව තාපස, පරිබ්‍රාජක, භික්ෂු පැවිද්දෙන් පැවිදිව ආත්මභාව පන්සියයක සීලසංවරය පුරා ඇත්තකුට එකල්හි බෝධිසම්භාර පිරීමට හේතු වන හිරියෙන් යුක්ත වෙයි. ඔත්තප්ප සම්පත්තිය වනාහි මේ ක්‍රමයෙන්ම ආත්මභාව දහසක් ආචාර්යවාදයෙහි සිටියහුට බුදුබැව් පැතීම සඳහා සම්පූර්ණ වෙයි. ආගම සම්පත්තිය පන්දහසක් අවුරුදු ලක්ෂණ ඉතිහාස නිඝණ්ඩු කෙටුභ අක්ෂරප්‍රභේද සහිත ලොකායත ශාස්ත්‍ර සහිත ත්‍රිවේදය ද දොළොස් දහසක් බුද්ධසෙත්‍ර ද ඉගෙන අනුන්ට ද උගන්වා බුදුබව පැතීම පිණිස සම්පූර්ණ වෙයි. මේ ත්‍රිවිධ සම්පත්තියෙන් යුක්ත පූර්ව හේතු සම්පත් ඇති බුදුබව පැතීම සඳහා උත්සාහවත් කුලපුත්‍රයා විසින් අට කරුණකින් සමන්නාගත විය යුතුය. කවර අටකරුණින් ද?

> මනුෂ්‍යත්වය, ලිංගසම්පත්තිය, හේතු, ශාසතෘන් දැකීම, පැවිද්ද, ගුණසම්පත්, අධිකාරය, ඡන්දතාව යන අටදහම එක් වීමෙන් ප්‍රාර්ථනාව සමෘද්ධ වෙයි.

මෙහි මනුෂ්‍යත්ව නම්, මනුෂ්‍ය ආත්මභාවයෙහි සිටියහුගේම පැතුම සඵලවෙයි. නාග, යක්ෂ, සුපර්ණ, දේව, බ්‍රහ්ම ආත්මභාවයක සිටියහුට සඵල නොවෙයි. මක්නිසා ද? නාගාදි ආත්මයක සිටියකුට සම්මා සම්බොධිය අවබෝධ කළ නොහැකිය. මිනිසත්බැව්හි සිටම සම්මාසම්බොධිය අවබොධ කරති. එබැවින් මිනිසත්බැව්හි සිටියහුගේ පැතුම සඵල වෙයි. ලිංගසම්පත්ති යනු, පුරුෂලිංගයෙහි සිටියහුගේ අභිනීහාරය සඵල වෙයි. ස්ත්‍රීලිංගයෙහි සිටියහුට සඵල නොවේ. නාග්‍යවතුන් වහන්සේ විසින් "මහණෙනි, ස්ත්‍රියක් අර්හත් සම්‍යක් සම්බුද්ධ වෙයි යන මෙය නොවිය හැක්කකි, ඉඩක් නැතැ"යි වදාරන

ලදි. එබැවින් පිරිමි අත්බැව්හි සිටියහුගේම පැතුම ඉටුවෙයි. එම අත්බැව්හි සිටියහුට අභිඥා සහිත පිළිසිඹියා සහිත රහත්බවට පත්වීමට ඇති නොවෙනස් එකම හේතුව ඇත් නම් මෙය හේතුසම්පන්න නම් වෙයි. ශාස්තෘ දර්ශන යනු, සත්ත්වයන්ට අනුශාසනා කරන බැවින් ශාස්තෘ නමි. අනුශාසනයෙන් උතුම්ම ප්‍රදානය කරන හෙයින් ශාස්තෘ නමි. උන්වහන්සේ ගේ දර්ශනයයි. එය සිතින් නොවේ. නිසඟ පහන් සිත් ඇත්තහුගේ දැකීමයි. ඒ ශාස්තෘන් වහන්සේ සතුන්ගේ භව්‍ය අභව්‍ය බව දැන කර්ම විපාක දන්නා ඥාණබල යුක්ත බැවින් ප්‍රකාශ කරන්නට සමත් වෙති. පසේබුදු, ශ්‍රාවකයෝ හෝ අනෙකෙක් සමත් නොවෙති. එහෙයින් ශාස්තෘන් දැකීම නියතයෙන් සෙවිය යුතුය. පබ්බජ්ජා යනු, කර්ම ක්‍රියාවාදී තවුසන්, භික්ෂූන් වෙත පැවිදිවූවෙකු විය යුතුය. ගුණ-සම්පත්ති යනු, පංචඅභිඥා අෂ්ටසමාපත්තීහුය. බෝසත් ගුණයෝ ය. එබැවින් බෝසත් ගුණසම්පන්නයකු විය යුතුය. අධිකාර යනු, දෙයාධර්මයෝ යි. හෙතෙම ලාමක ජීවිතය ඔහුට පරිත්‍යාග කරයි. එහෙයින් අධිකාරය යි කියැවේ. ඡන්දතා යනු, කරනු කැමතිබවයි. ඒ වනාහි කුසලධර්ම යි. ඡන්දය හෝ නමි. මහමෙර සහිත පොළව පෙරළී ගියත් බෝසතුන්ගේ කුශලධර්ම ඡන්දය නොපෙරළෙයි. මෙය ඡන්දතාවයි. මේ අට දහමින් යුත් තැනැත්තාගේ ප්‍රාර්ථනය ඉෂ්ට-වන්නේය.

මෙහිලා බෝසතුන් පළමු පැතුම හැර බෝසතුන්ගේ අභිනීහාර තුනකි. විස්සනා අභිනීහාර, මග්ගාභිනීහාර, සබ්බඤ්ඤුඅභිනීහාර කියායි. විපස්සනාභිනීහාර නම් එක්තරා පැවිද්දකින් පැවිදිව ආචාර්යවරයකු වෙත ගොස් ඔවුන්ට තමන් කැපකොට විදර්ශනා කියවා ගෙන කිසුණුපිරියම් කොට පංචාභිඥා අෂ්ට සමාපත්ති උපදවන්නට සමත් වන්තෙකුටම ඒ විපස්සනාභිනීහාරය වෙයි. එය ආත්මභාව ලක්ෂයක් විදර්ශනාපරිකර්ම කොට වහා වැටහෙන බිප්පාභිඤ්ඤයකුහට සතරමඟ ලබා ගැනීමට ප්‍රත්‍යය වන්නේ ය.

මග්ගාභිනීහාරය නම් බුදුසසුන්හි පැවිදිව ආචාර්ය උපාධ්‍යාය-

වරුන්ගේ අවවාදයෙහි පිහිටා අටතිස් කමටහනින් තමාගේ චර්යානුරූප කමටහනක් බුදුන් වෙතින් හෝ අසා ඉගෙන ගත-පච්චාගත වශයෙන් වීර්යය කොට සතරමඟ සතරඵල අවබෝධයට සමර්ථයකුටම ඒ මාර්ගාභිනීහාරය පරිපූර්ණ වෙයි. සමහරුන්ට එදිනම අවබෝධ වෙයි. සමහරුන්ට පළමු සිතෙහි අවබෝධය වෙයි. සමහරුන්ට අනතුරු අත්බැව්හි ප්‍රතිවෙධය වෙයි. සමහරුන්ට කල්ප ලක්ෂයකින් ප්‍රතිවෙධය වෙයි. දැගසව්වන්ට එකාසංඛ්‍ය කල්ප ලක්ෂයකින් ප්‍රතිවෙධයවෙයි. පසේ බුදුවරුන්ට දෙයාසංඛ්‍ය කල්ප ලක්ෂයකින් ප්‍රතිවෙධය වෙයි. සබ්බඤ්ඤුඅභිනීහාරය වනාහි අට දහම් පුරා සර්වඥභාවය පතා විවරණ ලබා තමන් ගේ හේතුසම්පත් අනුව සතර අට දොළස යන අසංඛ්‍ය කල්ප ලක්ෂයකින් සම්පූර්ණ කොට සම්මා සම්බෝධියට පැමිණෙන කෙනකුන්හට ඒ සබ්බඤ්ඤු අභිනීහාර නම්.

අපගේ ශාස්තෘන් වහන්සේ බෝසත්ව, එම කල්පයෙහි බුදුවීම පිණිස අභිනීහාර කළහ. එම කල්පයෙහිම සතර බුදු කෙනෙක් උපන්හ. කවර සතරනමක් ද? තණ්හඞ්කර, මෙධඞ්කර, සරණඞ්කර, දීපඞ්කර යනුයි. දිවකුරු බුදුන් වෙත බුදුබව පිණිස පැතුම් පැතුහ. එම කප උපන් පළමු තුන් බුදුවරුන් හමුවෙහි මනොභිනීහාර කළහ. කෙසේ දතයුතු ද? මෙයින් කප්සුවහසක් අධික සාරාසංඛ්‍යයකින් ආදි කප තණ්හඞ්කර නම් බෝසතාණෝ දසපාරමී දසඋපපාරමී දසපරමත්ථපාරමී පුරා ඤාතත්‍ථචර්යා, ලොකත්ථචර්යා බුද්ධත්ථ-චර්යා මුදුන් පමුණුවා පැරැම් පිරූ හෙයින් තුසීපුරෙහි ඉපිද ආයු ඇතිතාක් වැස දසදහසක් සක්වළ දෙවසමූහයා විසින් බුදුබව සඳහා ආයාචනා කරන ලදුව ඉන් චුතව නන්දවතී නුවර නන්දිසෙන රජුගේ අගමෙහෙසි සුනන්දා දෙවියගේ කුස උපදිනු කැමතිව දස දහසක් සක්වළ කම්පා ක්කොට නොඑක් පෙළහර දහස් ගණන් සහිතව පිළිසිඳ ගත්හ.

මහසත්හුගේ මව්කුස පිළිසිඳ ගැන්ම සමඟින්, දේවියට පැවිදිවනු කැමැත්තක් ඇතිවිය. ඈ එපුවත රජුට දන්වා එකැන්

පටන් අත්‍යන්තබඹසරින් දසමස් ගෙවා දෙතිස්මහපුරිස් ලකුණින් හෙබි පුතු බිහිකොට සත්වන දින චුතව තුසිපුර උපන්නා ය. තණ්හංකර බෝසත්හු අටවසරදහසක් ගිහිගෙයි වසමින් මහසැප විඳ මහලු ගිලන් මළ පැවිදි යන සිවු දෙවදූතයන් දැක ඇත්යානයෙන් මහබිනික්මන් කොට සප්තපර්ණි රුක්මුල්හි සම්මා සම්බෝධියට පත්වූහ.

එකල අප බෝසතාණෝ සුරින්දවතී නුවර සුදර්ශන නම් සක්විති රජවූහ. සරණංකර බුදුන් උපන් කල්හි චක්‍රරත්නය තැනින් සසලවනු දුටු සුදර්ශන රජුට "මේ චක්‍රරත්නය මාගේ පින්බෙලෙන් ජනිත විය. කුමක් නිසා අතුරුදන් වීමට මෙන් තැනින් සසලවීදැ"යි සිත් විය. අනතුරුව නිමිති දන්නා බමුණන් කැඳවා "භවත් බමුණනි, කුමක් හෙයින් සක්රුවන තැනින් සසල වීදැ"යි විමසීය. "මහරජ, බුදුන් උපන් පසු සක්රුවන අතුරුදහන් වෙයි. වෙනත් කිසි උවදුරක් නැත. චක්‍රානුභාවය පිරිහෙයි. සත් දිනකින් රජුගේ පැවිදි වීමෙන් සක්රුවන අතුරුදහන් වෙයි" කියා ඔවුහු රජුට දැන්වූහ. නැවත රජ "තොපගේ පැමිණීමෙන් මෙය දක්වන ලදි. සක්රුවනට කුමක් වේද කියා සිතන්නහුදැ"යි ඇසීය. ඔවුහු "රජතුමනි, ඔබගේ ආයු මඳ බවක් නොමැත. තණ්හංකර දසබලයන් වහන්සේ ලොව උපන්හ. එනිසා මෙය තැනින් සැලුණේය" යි කීහ.

එවිට රජ "බුදුගුණ මහිමය පුදුමයි" කියා සිතී ය. භාවාතිශය හෙතෙම "බුදුගුණ මෙතෙක් දන්නා මාගේ පින් මහිමය අතුරුදන් විය. දැන් මම දසබලයන් වහන්සේ හමුව සම්මාන දක්වා සක්විති රාජ්‍යය උන්වහන්සේට පුදා පැවිදි වන්නෙමියි සිතා සිවුරඟසෙන් සමඟ චක්‍ර රත්නය ළඟ අත්පා දිඟ හැර වැදහොත්තේය. "මාගේ පින්බෙලෙන් පැවති සක්රුවන බුදුන් පහළවූ විට දැන් අතුරුදහන් නොවේවා. සිය රජය සඟනට පුද කොට මා පැවිදිවන තුරු පවතීවා"යි යාඥා කොට තුබූ තැනම තබා අනූයොදුන් පිරිමඩුලු පිරිස් පිරිවරා පෙරගමන් කොට සක්ලකුණු සහිත සිරිපා වැඳ සෙට දිනට දානයෙන් ආරාධනා කොට දන් සරසා සතියක් ආරාධනායෙන්

ගිවිස්වා සක්රුවනෙහි අනුභාවයෙන් තුන්ගවු පමණ සත්රුවන් මඩුවක් කරවා උඩ රෙදි වියන් බැඳ රන්තරුවෙන් සරසා කිනිහිරිමල් බිම අතුරා දසබලයන් වහන්සේට අනර්ඝ වරපර්යඞ්කයක් අතුරාලීය. ආධාරකය කෝටියක් අගනේය. පාපුටුව ලක්ෂයක් අගනේය.

දැගසවුවන්ගේ එක් එක් පර්යංකය කෝටියක් අගනේය. ආධාරකය ලක්ෂයක් අගනේය. පාපුටුව ලක්ෂයක් අගනේය. සඞ්ඝනවකයන්ගේ පර්යංකය ලක්ෂයක් අගී. ආධාරකය ලක්ෂයක් අගී පාපුටුව පන්සියයක් අගී සාරදහසක් භික්ෂූන්ට සතියක් පුරා මහවැස්සක් වසින්නාක් මෙන් මහදන් දී සාගර පර්යන්ත සතර-මහාද්වීප සම්පත්තිය බුදුපාමොක් මහසඟනට සිවුපසය සඳහා ආදායම කොට පුදා දඹදිව සිසාරා සුවාසූදහසක් විහාර කරවා ක්ෂත්‍රියයන් සුවාසූදහසක් සමඟ සසුනෙහි පැවිදිව තුන්පිටකය ඉගෙන ගතපච්චාගත නයින් අප්‍රමාදීව සමථ විපස්සනානුයොගයෙහි යෙදී කලුරියකොට ස්වර්ගගාමී විය.

බුදුන් ලොව වැඩසිටිනා තාක් අපගේ සතරදිග ආර්ය ශ්‍රාවක ශ්‍රමණයන් වහන්සේලාට දන් පිණිස අය රැස්කොට භික්ෂුසඞ්ඝයාට සිවුපසයෙන් සංග්‍රහ කළේය. තණ්හංකර භාග්‍යවතුන් වහන්සේ අසූදහසක් ආයු ඇති මිනිසුන් අතර උපන්සේක. උන්වහන්සේ සිය ආයුසංස්කාරය පස් කොටසකට බෙදා එක් කොටසක් ශේෂව තිබියදීම පිරිනිවිසේක. සංස්කාරයෝ මෙසේ අනිත්‍යයහ. එහෙයින් නිවනම උතුම් වන්නේය.

> මේ භද්‍රකල්පයෙන් සාරාසැකිකප්සුවහසකට පෙර පසැස් යුත්
> තණ්හංකර නම් ජිනයන් වහන්සේ ලොව උපන් සේක.

තණ්හංකර සම්මාසම්බුදුන් පිරිනිවි සඳ උන්වහන්සේගේ සසුන අතුරුදහන් වූ කල එම කල්පයෙහිම රැස් කළ කුසල්මුල් ඇති මේරු කුසල්මුල් ඇති මේරුවූ බොධිඥාන ඇති මෙධංකර බෝසතාණෝ මෙඝපුරයෙහි සුමඞ්ගලරජු නිසා සුමහාදෙවිය කුස පිළිසිඳ දසමසින් මවුකුසින් බිහිව වසර ලක්ෂයක් ගිහිගෙයි වැස

මඟුල් ඇත්යානයෙන් මහබිනික්මන්කොට කෑලබෝරුක්මුල්හි පරමාභිසම්බොධිය ලබා දම්සක් පවත්වා ලොව අවිදූ අඳුරු නසා නැණ එළිය පතුරුවමින් මහජන සංග්‍රහ පිණිස සාරලක්ෂයක් සඟුන් පිරිවරා වැඩි සේක.

එකල අප බෝසත්හු උපන් තැනින් චුත්ව සොමනස්ස නුවර අපමණ සම්පත් ඇති එක්තරා මහාසාර බමුණකුගේ පරපුරට මංගලයක් වෙමින් අහස බබුළුවන දිවසකර මෙන් ඔහුට පුත්ව උපන්හ. මහජන සොම්නස ඇති කළ හෙයින් ඔහුට සොමනස්ස කියාම නම් තුබූහ. වියපත් හෙතෙම සකලකලා කුසලව සයුර බඳු ගැඹුරු නුවණින් වෙදාන්ත පාරගතව සියලු තීර්ථකවාද බිඳ ඉතිහාසය පස්වෙනි කොට ඇති ලොකායත ශාස්ත්‍රයෙහි හා බුද්ධවංස කුසලව පිවිතුරු නිර්මල බුද්ධියෙන් බොහෝ මාණවකයන්හට, මන්ත්‍ර හදාරවමින් දිසාපාමොක්ව සත්කාර සම්මාන ලබමින් දනන් දිනා කිසිවකු විසිනුත් දිනිය නොහැක්කේ විය.

ඉක්බිති එක් කලෙක මෙධඞ්කර භාග්‍යවතුන් වහන්සේ ඔහුගේ නිවාස නගරයට වැඩි සේක. මහජනයා කුහුලින් යුතුව බුදුන්ට පෙරගමන් කළහ. සොමනස්ස බමුණු තෙම බුදුන් වැඩිබව අසා පෙර පුරුද්දෙන් සොම්නස්ව කුහුලට පත් මිනිසුන් සමඟ ගොස් තථාගතයන් වහන්සේ දැක බුදුසිරුර දෙතිස්මහපුරිස් ලකුණින් පිරුණු බව දැක බුද්ධමන්ත්‍රයෙහි කුසල බැවින් නිසැකයෙන්ම මේ බුදුහුය යි දැන බහුලප්‍රසාද හටගත් හෙයින් බුදුසරණ ගොස් සෙට දිනට ආරාධනා කොට ගෙට ගොස් මවුපියන් සමඟ දන් සකසා හාරලක්ෂයක් භික්ෂූන් සමඟ භාග්‍යවතුන් වහන්සේ වළඳවා වස්විසීම පිණිස අයැද ගඟ ළඟ ගවුවක් පමණ සත්රුවන් මඩුවක් තනා තෙමසක් සිල් රකිමින් වස් දින පටන් මහාපවාරණය තෙක් අසම කැඳින් බුදුපාමොක් සඟන සැතැප්වූහ. ගෙයින් සත්රුවන් ගෙන ගොස් අතැවැසි තරුණයන්, රාජපුත්‍රයන්, ගෘහපති පුත්‍රයන්හට දී වෙහෙර තිස් දහසක් කරවූහ.

විහාර නිමවූ පසු පැවරීම පිණිස විහාරපූජාව පිළියෙළ කරමින් සිය ගෙයින් සෙසු සියලු සම්පත් ගෙන මහාපූජා සත්කාර සහිතව බුදුපාමොක් සඟනට පුදා බහුල ශ්‍රද්ධාවෙන් සංවෙගයට පත්ව වඩාත් වෙර දරා ගිහිගෙන් අනගාරිය පැවිද්ද ලබා ත්‍රිපිටකය ඉගෙන ගත පච්චාගත විසින් විදර්ශනාවශීභාවයට පත්ව ස්වර්ගයට පැමිණියහ. මෙධංකර බුදුහු අසූදහසක් අවුරුදු වැඩ සිට පස්වන ආයුසංස්කාර කොටස තිබියදීම පිරිනිවි සේක. මෙසේ සංස්කාරයෝ අනිත්‍යයහ. බුදුවරයන් වහන්සේලාටත් මාරයා ලජ්ජා නැත්තේය. උත්‍රාසයකුත් නැත්තේය. එහෙයින් සංස්කාරයන්හි අභිනන්දනය දුරුකොට සජ්ජනයන් විසින් නිවන් පැමිණීමට උත්සාහ කටයුතු. එය සත්ත්වයින්ගේ උප්පාද මරණ නැති කරනු කැමැත්තවුන් විසින් බුදුබව ලබනු සඳහා පරිණාමයට පත් කළ යුත්තේ ය.

තණ්හංකර බුදුරදුන්ට පසුව මෙධංකර නම් නායකයාණෝ
එම කල්පයෙහිම වෙනත් මහාමුනිවරයාණ කෙනෙක් වූහ.

නැවත එම කප සරණංකර නම් බෝසතාණෝ චර්යාප්‍රධන් සපුරා කුසිනාරාවේහි සුදර්ශන රජුගේ අගමෙහෙසි යසවති බිසෝකුස පිළිසිඳ උපන්හ. ඉක්බිති දසවසර දහසක් ගිහිගෙයි වැස සතර දෙවදූතයන් දැකීමෙන් හටගත් සංවෙගයෙන් ඇත්යානයෙන් මහිබිනික්මන්කොට පිප්ඵලි බෝරුක් මුල්හි සම්මාසම්බෝධිය ලබා දම්සක් පවත්වා සතර සෘද්ධිපාදයන්හි පිහිටුවා ධර්මකාය ඔසවා දහම්සොඬින් මෙත්දිය විසුරුවා විසම දෘෂ්ටිප්‍රපාත සමකොට ධ්‍යාන පර්යංකයෙහි විදර්ශනාධාරඵලකය නිමවා මහජනයා සිවුමඟ හිඳුවා සිවුඵලයෙන් සතප්වා නිවන් අමාරසයෙන් සනසවා බුදුමහඇත්බල දක්වමින් තීර්ථක දමන ගජමද විශාරදතාවෙන් උප්පාදවයඤාණ නම් නිමල විපුලනෙත් ඇති මග්ග - විකෙඛප නම් තියුණු දත් ඇති, සමථ-විපස්සනා නැමැති මහකුඹ ඇති සති-සම්පජඤ්ඤ නම් සොඳුරු කන් ඇති සර්වඥතාඥාන නම් අත් ඇති, සතිපට්ඨාන නම් සුපිහිටි සිවුපා ඇති විපුලවිවෙක වාලධි ඇති සරණංකර තථාගත වරගජෙන්ද්‍රයාණෝ කරුණා ජල විසුරුවමින් දඹදිව් තෙලෙහි හෙතු

සම්පත් ඇත්තවුන් සතස සතසා චාරිකා කළසේක.

එකල අප බෝසතාණෝ පළමු භවනයෙන් චුතව සුනන්දවතී බමුණුගම අපමණ කෙළ ගණන් සම්පත් ඇති සමිද්ධි බමුණු කුලයෙහි උපන්හ. යසමහත්වය නිසා යසවා නම් වූහ. විපුල කුලයෙහි උපන් බැවින් ද දැන උගත් කමින් යුක්ත බැවින් ද අග්‍රව ලොවට මඞ්ගලයක් වූහ. පසුකලෙක එතුමා සරණංකර බුදුරදුන් ශ්‍රාවකයන් සමඟ සිය ගමට වැඩිකල පන්සියයක් තරුණයන් පෙරටු කොට ගඟ අයින්හි සක්මන් කරද්දී මහබික්සඟන පෙරටු කොට ඉදිරියට වඩිනු දුටුවේය. හෙතෙම දැක ආශ්චර්ය අද්භූතව පුබුදු සිතින් බුදුන් කරා එළඹ යාම් ඊම් හැකිළීම් දිගහැරීම් ඉදිරි බැලීම් පසු බැලීම්හි පැහැද අතවැස්සන් සමඟ වැලිගොඩක් ගසා සිය උතුරු සළුව අතුරා "භාග්‍යවතුන් වහන්සේ මට අනුකම්පා කරන සේක්වා, මෙහිම වැඩ හිඳින සේක්වායි" එය පූජා කළේය.

හෙතෙම බුදුන් වඩා හිඳුවා සිය ගෙදොරින් තෙල්-මී-පැණි ආදිය ගෙන්වා ගෙන ඉන් බුද්ධප්‍රමුඛ භික්ෂූන් සතප්වා මඟවිඩා සන්සිඳුවා භාග්‍යවතුන් වහන්සේට සහ භික්ෂූන්ට වැඩවිසීම පිණිස රෙදි මඩුවක් කොට පිදීය. අනතුරුව ගෙට ගොස් කිරි-සහල්-මී-ගිතෙල්-හකුරු-පැණි ගෙනවුත් මිහිරි කිරිබතක් තනා බුද්ධප්‍රමුඛ හාරලක්ෂයක් භික්ෂූන්ට මාහැඟි අසුන් පනවා වඩා හිඳුවා කිරිබතින් සතප්පා "ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ මට අනුකම්පාවෙන් තෙමස මෙහි වස් වසනසේක්වා"යි ආරාධනා කළේය. ශාස්තෘන් වහන්සේ පිළිගත් සේක. ඉක්බිති ඒ බමුණු තෙම ගඟට නුදුරෙහි සත්රුවන් මඩුවක් කරවා තෙමස මහායඥයක් කළේය. මහා යඥය නම් අස්සමෙධ - පුරිසමෙධ - සම්මාපාස - වාජපෙය - නිරග්ගල යඥය නොවේ. එහි වධහිංසා බොහෝ ය. මහායඥය නම් අභිප්‍රා-යානුකූල වර්ණ ගන්ධ රස ඕජා සම්පන්න ආහාරපානයයි.

> මෙය පුදන්නහුට යහපත්කම වෙයි. පාපයක් නොවෙයි. පූජාව ද මහත් වෙයි. දෙවියෝත් පහදිති.

හෙතෙම මෙසේ වැල්මී දැහැටි උපචාර පුද කොට සත්රුවන් සැටකින් උතුම් ගඳකිළියක් කරවීය. එය පිරිවරා පිරිවෙන් සදහසක් ද තනවා සෙසු ධනය ද සසුන්හි පුදා ගිහිගෙහි නොඇලී අනගාරිය පැවිද්ද ලබා පංචාභිඥා අෂ්ටසමාපත්ති උපදවා ආයු කෙළවර බඹලොව උපන්නේය. සරණංකර භාග්‍යවතුන් වහන්සේ ලක්ෂයක් ආයු ඇති මිනිසුන් අතර ඉපිද සව්සතුන් වෙත මහාකරුණා පැතිරවූහ. එබැවින් සව්සත්හු බුදුන් පිරිනිවෙනතුරු උතුන් කෙරෙහි වෛර නොකළහ. භාග්‍යවතුන් වහන්සේ ආයුසංස්කාරය පස් කොටසක් කොට පස්වන කොටසට පෙරාතුවම අනුපාදිසෙස නිවනින් පිරිනිවිසේක. මෙසේ මේ සංස්කාරයන්හි සංවෙගවන කුල පුත්‍රයන් විසින් අප්‍රමාද විය යුතු.

සරණංකර සම්මාසම්බුදු පිරිනිවනින් එම කපම මිනිසුන්ගේ අවුරුදු ලක්ෂයක් වූ ආයු පිරිහී දසවස් වූ කල්හි අන්තර කල්පයක් විය. එය ගෙවුණු පසු ක්‍රමයෙන් වැඩී අසංඛ්‍යායුෂ්ක විය. එය නැවත පිරිහී වසර ලක්ෂයක් ආයු වූ කල දඹදිව අමරවතී නම් නුවරක් විය. .එහි අමර නම් මාළුවෝ ය. වතී යනු පවුරයි. ඒ නගරය සතුරන් වළකනු පිණිස තිස්රියන් උස මනොසිලාමය, රළුමුඛයෙන් තියුණු මස්කැස්බන් ගහන පවුරකින් වට කරන ලද්දේය. එහෙයින් අමරවතී කියා ලොව ප්‍රකට විය. පරම රමණීය දර්ශනීය වීථි, සිවුමංසන්ධි, මිදුල්, ගොපුර, අට්ටාල, කවුළු, තොරණ ආදිය ඇත්, ගව, මීන රූපාදියෙන් සුසොභිත පිවිතුරු කැටයමින් ද කිකිණි දැල් රුවන් ඉර හද කොඩි හංසපන්ති ආදියෙන් සරසන ලද හෙයින් ද දුටුමතින් මනොහිරාම විය. එහි දිවාරෑ ඇසෙන මධුර නිග්ඝොසයෙන්, කෙළි නළුයෙන්, බෙර, සක්, මෘදංග, වීණා, පටහ, නාදයෙන් තාල ගීත වාදිත හඬින් ඇත් අස් රථ මිනිස් ශබ්දයෙන් අතරක් නැත්තේ ය. සමෘද්ධිමත්ය. පිරුණේය. රන් රිදී පබළු මිණි මුතු නිල්මිණි රතුමිණි වෛරොඩි ඈ රුවනින් පිරුණේය. බහුවිධ ආහාර පාන ධනධාන්‍යාදියෙහි පමණ නැත්තේ ය. නානා ජාති ගොත්‍ර විනය ශිල්ප වෙසහුසාදියට අයත් ජනයාගෙන් ආකුලය. මිනිස් පරිභොගයට

අනුරූප උපකරණ යුත් ආලකමන්දා රාජධානිය මෙන් වූයේ ය.

එකල්හි අප බෝසතාණෝ සරණංකර සම්මා සම්බුදුන් ඉදිරියෙහි මග්ගාභිනීහාරය සපුරා එක් බුද්ධාන්තරයක් දෙව්මිනිසුන් අතර සැරිසරා දිවකුරු මුනිඳුන් ඉපදීමටත් පෙරාතුව උපන් ලොවින් චුතව අමරවතී නුවර නොඑක් කෙළ ගණන් සම්පතින් යුත් මහත් කීර්තියෙන් ප්‍රකට බමුණු මහාසාරකුලයක එකම පුත්ව උපන්හ. සුමෙධයයි එතුමාට නම් විය. එහි සුමෙධ යනු, මෙධා නම් ප්‍රඥාවයි. යම් ප්‍රඥාවක් පජානනා විචය පවිචය ධම්මවිචය සල්ලක්ඛණ උපලක්ඛණ පච්චූපලක්ඛණ, පණ්ඩිච්ච කොසල්ල නෙපුඤ්ඤ වෙභව්‍යාවින්තා උපපරික්ඛා භූරිමෙධා පරිණයතා විපස්සනා සම්පජඤ්ඤ පඩොද ප්‍රඥාඉන්ද්‍රිය ප්‍රඥාබල ප්‍රඥායුධ ප්‍රඥාප්‍රාසාද ප්‍රඥාආලෝක ප්‍රඥාරත්න අමොහ සම්‍යක්දෘෂ්ටි යයි කියනු ලැබේ නම් එයයි. මෙහි ලා ඒ ප්‍රඥාව ස්කන්ධ ධාතු ආයතන සත්‍ය ප්‍රතීත්‍යසමුත්පාදයන් අවබොධ කිරීමට සමත් වජ්‍රයක් මෙන් තියුණු ප්‍රඥාවයි. එ බැවින් එම සුන්දර ප්‍රඥාවෙන් යුක්ත බැවින් සුමෙධ යයි කියැවේ.

එතුමෝ මව්පිය දෙපසින් සුජාත වෙති. එතුමාගේ පියාණෝ සුදෙව රජුගේ පියමහරජහුගේ අග්‍රපුරෝහිත ආනන්ද නම් වෙති. බැමිණිය මෑණියෝය. මෙසේ දෙපසින් සුජාතය. ජාතිවාදයෙන් බැහැර නොකරන ලද්දේ ය. නින්දා නොකරන ලද්දේ ය. එහෙයින් සුමෙධ බ්‍රාහ්මණ යයි දන්නා ලද්දේ ය. මවුපියන් විසින් ශිල්ප හැදෑරීම පිණිස යවන ලද වියපත් හෙතෙම කහවනු දහසක් ගෙන තක්සිලාවට ගොස් දිසාපාමොක් ඇදුරන් පාමුල තබා ත්‍රිවේදය, හදාළේය. අභිනීහාර ඇති හෙයින් නොබෝ කලකින්ම ත්‍රිවේද පාරගත වූහ. නිඝණ්ඩු කෙටුභ ශාස්ත්‍රයන් සහිත ශික්ෂා නිරුක්ති අක්ෂර ප්‍රභෙද ඇතුළු ඉතිහාසය පස්වැනි කොටැතිව දත් පද පාඨ ව්‍යාකරණ දන්නා ලොකායත ශාස්ත්‍රයෙහි මෙන්ම මහාපුරුෂ ලක්ෂණයන්හි ද නොදෙවැනි ඇත් අස් රථ ආයුධ ශිල්පයන්හි ද චන්ද්‍ර සූර්ය නක්ෂත්‍ර සෘතු උල්කාපාත සිහින පුහුණුකිරීම මුද්‍රා

ගණනාදියෙහි සර්වපාරගතව අශ්ව ශිල්පකුසල දිසාපාමොක්ව ගුරුන් විමසා වැඳ පැදකුණු කොට සිය නුවරටම පෙරළා පැමිණ තමන් උගත් සිප්සතර දෙගුරුන්ට කීය. සොමිනසට පත් මවුපියෝ ඔහු පවුල් භාරයෙහි තැබූහ.

මවුපියන් විසින් පවුල්භාරයෙහි පිහිටවූ හෙතෙම බොහෝ සියගණන් තරුණයන් මන්ත්‍ර හදාරවමින් වාසය කළේය. පසුකලෙක ඔහුගේ මවුපියෝ කළුරිය කළහ. එතුමා ඔවුන්ගේ අවසන් කටයුතු නිමවා හිසෙහි නා සියලු ධනය භාරගත්තේ ය. ඉක්බිති රුවන් භාණ්ඩාගාරික තෙම එතුමන් වෙත පැමිණ "ස්වාමීනි, ඔබගේ මවුපියන් සතු භාණ්ඩාගාර බලනු මැනවැ"යි කීය. එතුමා මැනවැයි කියා පිරිසිදු සුවඳවත් හැඳ සොඳුරු සුවඳ විලෙවුන් ගැල්වූ සිරුරින් විචිත්‍රකුසුමමාලාධාරීව හිස්වෙළුම් වෙළා රන්මිරිවැඩි පයලා මකරමුහුණින් සරසන ලද විවිධ රන්කමින් විසිතුරු මුතුතල්වැට අතින් ගෙන රුවන් කොටුගුළු නැරඹීමට ගියේ ය. භාණ්ඩාගාරික තෙම රුවන් පිරි භාණ්ඩාගාර ගැබ්දොරටු විවර කොට මවුපිය පරපුරෙන් රැස් වූ භොගසම්පත් වර්ග කරමින් පෙන්වීය. සුමෙධ පණ්ඩිතයෝ ඒ බලා භාණ්ඩාගාරික අමතා "දරුව, මේ ධන සම්පත් කවුරුන් විසින් රැස් කරන ලද්දේ දැ"යි විමසූහ. "ස්වාමීනි, ඔබගේ පිය මුතුන් විසිනැ"යි මුල් ලියැවිලි කියවා "අසවලාට පෙර ඔබගේ මීමුතුන්ට මෙතෙක් ධන ලැබුණේ ය. අසවලා ඔහුගේ මුනුබුරාය" කියමින් වංසපරම්පරා පිළිවෙළින් කියවීය.

එවිට සුමෙධ පණ්ඩිතයෝ දරුව භාණ්ඩාගාරිකය, ධන සමෘද්ධිය නම් තමාගේ පරිභෝජනය සඳහා බව පෙනේ. මේ ධන සම්පත් සමූහය අතහැර හිමියෝ කොහි ගියාහුදැ?"යි විමසූහ. "ස්වාමීනි, තමන්ගේ ආයුෂ ගෙවීමෙන් සිය කර්මයට අනුව ගියහ. වෙනත් තන්හි උපන්හ." "සම්පත් නොගෙන කුමට ගියාහු ද?" ස්වාමීනි, කුමක් කියන්නහු ද? එය වැරදිය. ලොව අනිකක් කුමට කියමු ද? සම්පත් අතහැර යායුතුය. ඒ සමඟ යන දෙයක් නොවෙයි. මෙලොවින් ගෙන යන පාදයක් අඩමස්සක් මස්සක් තබා

තණකොළයක් ඉරටුවක් වත් පරලොව ගෙන යා නොහැකිය. අනික් සම්පතක් ගැන කුමක් කියන්ට ද? තමන්ගේ ශරීරය වත් ගෙන යා නොහැකිය. ස්වකීය කර්මය පමණක් මෙලොවින් යන්නවුන්ට සහාය වෙයි. එබැවින් ඔවුහු නොගෙන ගියහ"යි කීය.

භාණ්ඩාගාරිකගේ කතාව අසා සුමෙධ පණ්ඩිතයෝ සංවේගපත් හදවතින් "ඇයි දරුව, මාත් ඔවුන් ගිය මඟින්ම යා යුතු වෙයි ද?" කීහ. "ස්වාමීනි, මෙය මුළු ලොවටම සාධාරණ ධර්මතාවයි. පැවූ ඉර බැසයාම මෙන් උපන්නවුන් අවශ්‍යයෙන්ම මිය යා යුතුයි උපන්නවුන්ට මරණය නියතයි" එයසා සුමෙධ පණ්ඩිතයෝ ආදීනව දැන ආදීනව බොහෝ බැවින් මළානික මුවපියුමින් එතැනින් ආපසු ගොස් හිසෙහි නා පිවිතුරු නිර්මල පඬෙරවන් පිළී හැඳ සිහිල වළඳා මතුමහල් තලයෙහි විවෙකව තනිව පළඟෙහි හිඳ මෙසේ සිතීය.

> ලොව පුනර්භවය දුක් ය. සිරුර බිඳී යාම් නම් වූ මුළාමරණය දුකය. ජරාවෙන් මිරිකීම ද දුකය. මම ජාති ස්වභාව ඇත්තෙමි. ජරා ස්වභාව කොට ඇත්තෙමි. හැමදා මරණ ස්වභාව කොට ඇත්තෙමි. ජරා රහිත මරණ රහිත ක්ෂෙමවූ නිර්වාණය සොයන්නෙමි. නොඑක් කුණපයන්ගෙන් පිරුණු මේ කුණුශරීරය හැරදමා අනපෙක්ෂිතව අතර්ථික කොට සිතා යන්නෙමි නම් මැනව. යාම් ඊම් ඇසුරු කළ ජාති බියෙන් බොහෝ තැති ගැනීම් ඇති ජරා රොග කැළඹීම් යුත් මේ සක්කාය නගරය ලෙඩදුක්වලට වාසගෘහයකි. මර සතුරන් මඩිනු ලබයි. ශොක සන්තාප බහුලය. වැලපීම් උවදුරු බහුලය. දුක් සහිත කුටියකි. දොම්නස් බියෙන් ආකුලය. උපායාසයෙන් පීඩිතය, සිය දුක් දරන්නේය. රාග ඇතුන්ට වාසභූමියකි. ද්වේෂ සර්පයන්ගේ නිවාසයකි. මොහ භූතගණයාගෙන් ආකීර්ණය. ක්‍රොධ රකුසන් ඇසුරු කරන ලද්දේ ය. උපනාහ බාලයන් බහුලය. මකු කුම්භාණ්ඩයන්ගේ ඇසුර ඇත්තේය. පලාස සොරුන් හැසුරුණේය. ඊර්ෂ්‍යා සතුරන්ගෙන් පිරුණේය.

මසුරු ගිනිහල්ගෙයකි. මායා වෙළඳ පොළකි. ථම්භධූර්ත සමූහයෙන් පිරුණේය. අතිමාන යොධයන් පෙරටු කොට ඇත්තේ ය. මද ගාන්ධර්වයන් බහුලය. ප්‍රමාදීන්ගෙන් පිරුණේය. ලොභප්‍රාකාරායෙන් වටවීය. තෘෂ්ණාගංගාව දියුණු කරයි. වැගිරෙන නවදොරක් ඇත්තේය. මානඵලඔසවා ඇත. අතිශයින් බහුල ගඳ ඇත්තේ ය. විතර්ක මැස්සන්ගෙන් ගහණය. ප්‍රමාද ගොස ඇත්තේය. තැනූ විෂය ආපන ශාලාවකි. බොහෝ දෘෂ්ටි වගුරුවයි. අනුසය බමුණු නිවාසයකි. සංයොජන මහ ඇමතියාය. මිථ්‍යාධර්ම විනිස කරුය. දුසිරිත් පිරිවරය. විසමලොභය පෙරටු කොට ඇත්තේය. නන්දිරාග මහඇමතියා නගරය රකී. එහි අඥාන රජ ආධිපත්‍යය දරමින් රජකම් කරයි" කියා ය.

එතුමා මෙසේත් සිතීය. "අවිදු අඳුරු ඇති මරණබියෙහි ගිලුණු තෙවැදෑරුම් දුක් විඳින කෙලෙස් කටු පිරි තණ්හා අවුලින් වියවුල්වූ මසුරු කිළුටෙන් කිළිටිව පවිටුමිතුරන් අනුව යමින් සසර මහකතරෙහි මේ සත්ත්වයෝ විසම දුර්ගම කණුකටු ගහණ වනගත අඳුම්මුන් මෙන් තමන්ගේ නිස්සරණය නොසොයා හැසිරෙති. මම නම් අන්ධබාල ජනයා මෙන් හිතාහිතවිහරණ රහිතව සසර ඇලී වාසය නොකරමි. මම දැන් තම නිස්සරණය සොයමින් හැසිරෙමි"යි විදර්ශනානුගත සම්මර්ශනය ඇරඹී ය. තණ්හංකර, මෙධංකර, සරණංකර, සම්මා සම්බුදුවරුන්ගේ සසුනෙහි භාවනා වඩා මුහුකළ නුවණ ඇති එතුමාගේ සිත ගෘහවාසයෙහි නොඇලී ගියේ ය. නෛෂ්ක්‍රම්‍යාභිමුඛම විය. එහෙයින් එතුමා නිස්සරණයම සොයමින් මෙසේ සිතීය.

නිස්සරණයෙක් අවශ්‍යයෙන්ම ඇත්තේ ය. එය හේතු ඇතිවම විනා හේතුවකින් තොරව නොලැබිය හැක්කේ ය. සසරින් මිදීම පිණිස ඒ මඟ පර්යේෂණය කරමි. දුකක් ඇති කල සැපක් ද ඇත. එමෙන් භවය ඇති කල විභවයක් ද කැමති විය යුතුය. උෂ්ණය ඇති කල සීතලක් ද ඇත්තා සේ රාගාදි

තෙයාකාර ගිනි ඇති කල නිවනක් ද කැමති විය යුතුය. පව් ඇති විට කුසල් ද ඇත්තා සේ ජාති ඇති කල අජාතියක් ද කැමති විය යුතුය. අඟුළි වලින් තැවරුණු මිනිසෙක් පිරුණු පොකුණක් දැක ස්නානය නොකරයි නම් එය පොකුණෙහි දොසක් නො වන්නාක් මෙන් කෙලෙස් සේදීමක් තිබෙද්දී අමාවිල නොසොයයි නම් එය නිවන් මගෙහි දොසක් නොවේ. රොගියෙක් වෙදා සිටිද්දීත් පිළියම් නොකරවයි නම් එය වෙදහුගේ දොසක් නොවන්නාක් මෙන් කෙලෙස් ලෙඩින් දුක් පීඩාවට පත්වූවෙක් ඇදුරකු නොසොයයි නම් එය ගුරුවරයාගේ දොසක් නොවේ. ගෙල බැඳි කුණපයක් පිළිකුලින් මුදා දමා සුවපත්ව සෙඛරීව තමා කැමති පරිදි යන්නාක් මෙන් නානාකුණප එකතුවක් වූ මේ කුණුශරීරය අනපෙක්ෂව අනර්ථීව හැරදමා යමි. වැසිකිළියෙහි අසූචි අනපෙක්ෂව අනර්ථීව ගැහැනු මිනිසුන් යන්නාක් මෙන් නත් කුණු පිරි මේ සිරුර වර්චස් කොට කුටිෂ හැරයන්නාක් මෙන් හැරදමා යමි. දිරාපත් කැඩුණු දියකාන්දු වන නැව හිමියන් අනපෙක්ෂව අනර්ථීව හැර දමන්නාක් මෙන් නවසිදුරකින් නිතර වැහෙන්නාවූ දිරූ නැවක් වන් මේ ශරීරය හැර දමමි. සොරුන් විසින් ලුහුබඳිනු ලබන බඩු රැගෙන යන මිනිසෙක් බඩු හැරදමා යන්නාක් මෙන් මහසොරෙකු වන් මේ සිරුර කුසල් පැහැර ගන්නා බියෙන් හැරදමා යමි.

මේ සිරුර සතර මහාභූතයන්ගෙන් යුක්තය. මවුපියන්ගෙන් හටගත්තේය. බත් පිට්ටු ආදියෙන් වැඩුණේය. කාරණා විලෙපනයෙන් ඇති සැටි නොපෙනෙන්නේය. කය සමින් වැසී ගියේ ය. තමහට පරහට සුහනිමිත්තක් සේ ගන්වන හෙයින් නුනුවණින් මෙනෙහි කිරීමෙන් රවටාලන බොරු කහවනුවක් මෙන් හම පමණක් මනහරය, කුසල් සිදින බැවින් පසමිතුරකු බඳුය. මහාසොරෙකු බඳුය. චාතුර්භූමික කුසල්දහම් විලොප කොට අකුසල්දහම් මඟ ඇල්ම උපදවයි. මම වනාහි ධන පහරින

මහසොරකු බඳු කුසලට සතුරු සංසාරයට හෙතුභූතවූ කය හැර තමාගේ සුවමඟ සොයන්නෙමි. ඉදින් මේ කය හැර දමා කිංකුසලගවේසීව ආර්යමාර්ගය නොසොයා හැසිරෙමි නම් දෘෂ්ටි සොරු චතුභූමක කුසල් සිඳ අපායගාමී කොට අක්මුල් නැති සසර උඩයට ගන්වා සැපවෙදනා විරහිත කොට ඔබමොබ අදිමින් කැමැත්තක් කරති.

මම දැන් නොපමාව කවර උපායකින් සිත තමා වසඟයෙහි තබන්නෙම් දැයි විමසමින් මෙසේ සිතිය. "මේ ගිහිගෙයි වාසය මහාපළිබොධ සහිතය. යොදුනක් පළල මහදැලක් කටියෙහි බැඳ කටුවෙන් ගහණ හිඹුල් වනයක් මෙන් සසරවට පසුකිරීමට නොහැකිය. පළිබොධ පසිඳ පැවිදි වන්නකු විසින්ම සසරදුක් කෙළවර කළ හැකිය."

මෙබඳු නොඑක් උපමාවෙන් නෛෂ්ක්‍රම්‍යයෙහි යෙදීමේ අර්ථය සිතා සිය අපරිමිත භොගස්කන්ධය හැරදමා පැවිදිවනු කැමැති සුමෙධ පණ්ඩිතයන්ට මෙසේ සිත් විය. "මේ මහාධනය නම් ලොභය උපදවන හෙයින් දුප්පතුන්ට ද අන්තරායකරය, මාගේ මේ මහාසම්පත් රජුන්ට ද ආශා උපදවයි. අන්‍යයන් ගැන කවර කථා ද? දුප්පත් ශාක්‍යයන්ගේ සිත් ද දුබල නැත. මේ සම්පත් අනුන්ට නොදී වන වැදීම ද අන්තරායකරය. දැන් රජුට දන්වා අවශේෂ දෙය පොහොසතුන්ට දුප්පතුන්ට ප්‍රයෝජන ඇත්තවුන්ට දෙමි කියා." තීරණය කොට රජු වෙත ගොස් "මහරජ, මාගේ ගෙයි අනන්ත ධනය තිබේ. මුහුදු වෙරළෙහි වැලිමෙන් අවසන් කළ නොහැකිය. හැමදා මුහුද මෙන් සියලු භාණ්ඩාගාර පිරී පවතී. ඒ සියල්ල ඔබවහන්සේ පරිහරණය කළ මැනව. සිය පුරුෂයන් යවා ගෙන්වනු මැනව. විමසා බලා එහිම හෝ තබනු මැනවැ"යි කීය. එවිට රජ "පණ්ඩිතය, ඔබ කුමක් කරන්නෙහිදැ"යි ඇසීය. "මහරජ, මම කාමාදීනවත් නෛෂ්ක්‍රම්‍ය ආනිශංසත් දිටිමි. මම සියලු පළිබොධ සිඳ පැවිදි වන්නෙමි"යි කීය.

ඉක්බිති රජ "මම මොහුගේ පියා මිය ගිය පසු පිළිසඳරක් නොකෙළෙමි. එයින් මොහු කලකිරී සියල්ල දන්දී මහණවීමට සිතනවා විය හැකිය. දැන් මම සම්පතින් සනසවා ලමි"යි සිතා සුමෙධ පණ්ඩිතයන්හට "පණ්ඩිතයෙනි, පණ්ඩිතයෝ නම් වැරදි ඉවසති. එනිසා පණ්ඩිතයයි කියති. මම ඔබගේ පියා මළ පසු ඔබ සමඟ පිළිසඳරක් නොකෙළෙමි. එයින් කලකිරුණෙහි යයි සිතමි. ඔබ අපට අවැඩක් නො කැමැත්තෙහිය. එබැවින් ඔබ ගේ පියා මියගිය හෙයින් පියාසතු පුරෝහිත පදවිය දෙමි. වේලාව එනතුරු සිටියෙමි. මෙවක් පටන් පුරෝහිතකම සමඟ පියාසතු ධනදායාද පරිහරණය කරන්නැ"යි කීය. "මහරජ, මට ධනයෙන් හෝ යසසින් වැඩක් නැත. මම මේ සියල්ලට වඩා අනවරාග්‍ර සංසාරයෙහි නුදුටු විරූ ආස්වාද නොකළවිරූ නිරාමිස විමුක්ති සැපය දකිමි. එහෙයින් මාගේ අභිමතය පැවිද්දය" කීය.

එවිට රජ නොසතුටුව "සුමෙධ පණ්ඩිතයෙනි, ඔබ කැමති තැනකින් කුලානුරූප පැහැපත් සොඳුරු වූ ද බුහුටි ගැහැනුන් නළඟනන් සහ වෙනත් සම්පත් ද දෙමි. ඔබ මටත් අනුශාසනා කරමින් මේ ගැනත් බලන්න. මා අනාථ නොකරන්නැ"යි කීය. එවිට "මහරජ, මේ සතුන්ගේ ජීවිතය, අනියතය. ජලය මෙනි. මායාවකි. මිරිඟුවකි. ගාන්ධර්ව නගරයකි. පෙනපිඬුවකි. දියබුබුලකි. නියත වශයෙන්ම නැති වෙයි. ඔබට අනුශාසනා කිරීම මට නොහැකිය. දැන් මට කථා කරමින් සිටීමත් පමාවකැයි හැඟේ. කුකුසක් නැතිව ධනය ගෙන්වා ගත මැනැවැ"යි සුමෙධ පණ්ඩිතයෝ කීහ. රජ "පණ්ඩිතයෙනි, ඔබ සිය ධනය කෙළපිඬක් මෙන් නොතකා තැගි කොට පැවිදිවන්නෙහි නම් මෙය මට නොගැළපෙයි. ඔබම සිය සම්පත් සිත්වූ පරිද්දෙන් කැමැත්තවුන්ට දෙන්නැ"යි කීය. "මහරජ, ඔබටත් මටත් මේ ධනයෙන් පලක් නැත. කැමැත්තන්ට දෙමි. ඔබ වහන්සේ සුමෙධ පණ්ඩිතයෝ අනන්ත ධනය කැමත්ත-වුන්ට දෙති. අවශ්‍ය වන්නෝ පැමිණෙත්වා කියා නුවර අණබෙර ගස්වනු මැනවැ"යි රජුට කීහ. මැනවැයි රජ එසේ කළේ ය.

අණබෙරයෙන් මහජනයා රැස්වූහ. සුමෙධ පණ්ඩිතයාණෝ භාණ්ඩාගාර දොරටු හරවා ආ ආ මිනිසුන්ට ආ ආ ජනයාට ගෙනා ගෙනා භාජන පුරවා ගෙන යන්නවුන්ට සතියක් මහදන් දුන්හ. සතියකිනුත් එක් භාණ්ඩාගාරයක රුවන් පමණක් වත් අවසන් නොවීය. එවිට සුමෙධ පණ්ඩිතයෝ "සතියකින් එක් භාණ්ඩාගාරයකුත් හිස් නොවීය. මේ අඩතෙලෙස් දහසක් කොටුගුල් කෙසේ හිස් වෙයි ද? සියලු කොටුගුල්වල යතුරුමුදු නුවර මැද තබා සියලු සම්පත් දෙන ලදි. ප්‍රයෝජන ඇත්තෝ ගෙන යෙත්වා කියා අණබෙර ගස්වන්නේ නම් මැනවැයි සිතා එසේත් කොට රජු කරා ගොස් සියලු දාසිදාස ණයකරුවන් නිදහස් කොට ලියවිලි නසා නැයන්ට අවවාද දී ගිනිගත් ගෙයකින් පිටවන්නකු මෙන් නිරපෙක්ෂව ගෙදොරකඩ සිටවූ මහගසක් මෙන් එකචාරී මහඇතකු මෙන් තියුණු කඩුවක් අමෝරා ලුහුබැඳ එන සතුරකු දුටු බියගුලු පුරුෂයකු මෙන් වස්තුකාම කෙලශකාමයන් හැර දමා සුමෙධ පණ්ඩිතයෝ අමර නුවරින් නික්ම තමන් අභිමත තැනට, හිමවතට පිවිසියහ.

හිමවතට නුදුරුව ගවුවක් පමණ පෙදෙසෙහි ධම්මික නම් පර්වතයක් විය .නෛෂ්ක්‍රම්‍යය සොයන, සෘෂි පැවිද්දෙන් පැවිදි වූ කුසල්දහම් සොයන බෝසතුන්ට සුදුසු වූ හෙයින් ඒ පර්වතය ධම්මික නමින් දන්නා ලද්දේය. එම ධම්මිකපර්වත සමීපයෙහි ඡායා-ජල-මල්-පල-දලු-පැළ-තුරු-ලතා යුත් පර්වත ස්ථානයෙහි වන ගහණයෙන් වට පිවිතුරු සමතල බිම්කඩකට පැමිණියහ. එකල එතුමන්ගේ ගුණතෙදින් සක්දෙව් රජහුගේ පඬුඇඹුල් සලසුන හුණු විය. එවිට ශක්‍රයා ආවර්ජනායෙන් එකරුණ දැන විස්කම් දෙව්පුතු යවා අසපුවක් කරවීය. විස්කම් දෙව්පුත් මොහොතින් එතැනට පැමිණ සිය සෘද්ධි බලයෙන් ආශ්‍රමයක් මැවීය. මෙහි අස්සම නම්, විසම අදහස් සම කරන බැවින් අස්සම නම්. වීරතරුණයන්ගේ වාක් මනෝ කර්මයන් සම කරන හෙයින්, කෘෂිකර්මාදි පරිශ්‍රමකර්ම රහිත හෙයින් ද, තපසංඥා ඇතිකරන හෙයින්, අටගුණයක් ඇති නිසා මහණසුව අටක් ඇති බැවින් ද අස්සම නම් වන්නේය.

මහණසුව අට කුමක් ද? ධනධාන්‍ය පිළිගැනීමක් නැති බව. පිඬු සොයාගත යුතු බව, සිසිල්පිඬු බුදින බව, රට පෙළීමක් නැති බව, උපකරණ පිළිබඳ ආශාරහිත බව, සොරබියෙන් තොරබව, රජමහඇමතියන් හා නොමුසු බව, සිවුදිගින් ආරක්ෂිතබව යි. මේ අට වැදෑරුම් ශ්‍රමණ සැපයෙන් යුත් ආශ්‍රමය මවා එහි පන්සල මැවීය. එම පන්සල ද වළගොඩ රහිත සමතලා භූමිභාගයෙහි රිදීවන් වැලිතලයෙන් ද වාඩිවී සිටින සිංහාකාරවූ අට පා ඇති බිදලමඤ්ච පැනවූ ගර්භයෙන් හා බිසිබිම්බෝහනාදි විවිධ තවුස් පිරිකරින් ද රාත්‍රිස්ථාන දිවාස්ථානාදියෙන් ප්‍රධන් වැඩීමට සුවපහසු ඇත්තේ ය. මෙවැනි පන්සල මවා පස්දොස් රහිත සක්මන මැවීය. සක්මන නම් පයින් ගමන් කරන තැනකි. එහි සක්මන් කෙරේනුයි සක්මන යි. ඒ සක්මන පංච දෝස රහිතව මැවී ය. පස්දොස් කුමක් ද? වළ ගොඩැලි සහිත බව, බාධා සහිත බව, ගල් බොරළු බහුල බව, ගහණයෙන් සැඟවුණ බව, අතිවිශාල බව යන මේ දොස් පහ රහිත බවයි. විසමයෙහි සක්මන් කිරීමෙන් පා රිඳෙයි, ගඩු හටගනී, සිත එකඟ නොවෙයි. ඉන් කම්මට්ඨානවසිතාව නූපදී, ශරීරදුක් නිසා වීර්යය අත්හරී. විසම සක්මනෙහි දොස් මේ ය. සමතලා සියුම් වැලි ඇති තැන විවිධ මනොඥතා ඇති හෙයින් සිත එකඟ වෙයි. එනිසා අරමුණෙහි විශේෂඥයට පත්වෙයි. සම්බාධ සහිත සක්මනින් හැපීම් තැති ගැනීම් ආදි දොස් ඇතිවෙයි. එහෙයින් බාධා දුරු කළ යුතුය. ගල්බොරලු ඇති සක්මනෙන් පාවල වණ ඇතිවෙයි. පාවේදනාදියෙන් සිත එකඟ නොවෙයි. ගොමුවලින් සැඟවුණු අඳුරෙහි සක්මනින් ගෝනුසු පත්තෑ මුගටි බළල් ආදීන්ගෙන් උවදුරු වෙයි. අතිවිශාල සක්මනින් සිත හාත්පස දුවයි. එබැවින් අතිවිශාල නොව පළලින් රියන් දෙකක් ද දෙපස පරිවාර වූ අනුසක්මන ද සහිත දිගින් සැටරියන් වන සේ සක්මන විය යුතුය. විස්කම් දෙව්පුත් මේ පස්දොස් රහිත පස් අනුසස් සහිත සක්මන මවා දෙව්ලොවටම ගියේ ය. සුමෙධ පණ්ඩිතයාණෝ හිමවත් පියසෙහි වනගහණයෙහි ගිරිදුර්ග පර්වත වළගොඩැලි කඳුරැලි ආදිය බලමින් උඩුගං බලා යමින් ගඟ වක්ව ගිය තැනක ධම්මික පර්වතය ළඟ විශ්වකර්මයා

විසින් මවනලද අතිමනහර විවේකසුවයට සරිලන ආශ්‍රමපියෙසට පැමිණ එහි කිසිදු අශ්‍රමණයකු නොදැක අතින් පන්සල් දොරටුව හැර පිවිසියහ. ඉක්බිති වටපිට බලමින් බිත්තියෙහි අතින් ලියන ලද "යම් පැවිද්දෙකුට පැවිදිදම් පිරීමට අවශ්‍ය නම් එතුමාට දෙන ලද්දේය" යන අකුරු දැක සැක හැර මහණදම් පිරිය යුතුය යි ගිහිබව හඟවන නවදොසකින් යුත් සළුයුගලය බහාතැබූහ.

නවදොස් කවරහු ද? මහඟුබව, අනුන් අයත් බව, පරිභොගයෙන් විවර්ණවන බව, වරින් වර සේදීම් රැඳීම් පරිභොගයෙන් වහා දිරනබව, මැසීම් අණ්ඩැමීම් නැවත සෙවීම් නිසා ලැබීමට අපහසු බව, තවුස් වේශයට නොගැළපෙන බව, සතුරන් ට සාධාරණ බව, පරිභොග කරන්නාගේ අලංකාරයට හේතුවන බව, මහිච්ඡතාව යි. මේ සළුවෙහි නව දොසයි. එය බැහැර කොට පැවිද්දන්ට යොග්‍ය දොළොස් ගුණයකින් යුත් වැහැරි සිවුර හැන්දහ. දොළොස් ගුණයෝ කවරහු ද? සොඳුරු කැප අලපාර්ඝ බව, පරිභෝගයෙන් කිලිටිවීම නිසා සේදීම් ප්‍රපංච රහිත බව, දිරූ පසු මැසීමේ දුක් රහිත බව, නැවත පහසුවෙන් සොයාගත හැකි බව, තවුස් පැවිද්දට අනුරූප බව, සතුරන් ලොල් නොකරන බව. පරිභෝගයෙහි අලංකරණයක් නොවන බව, සැහැල්ලුවෙන් දැරිය හැකි බව, අල්පෙච්ඡ බව, නිරවද්‍ය බව, නිරපෙක්ෂ බව, මේ වැහැරි සිවුරෙහි දොළොස්ගුණයයි.

ඉක්බිති මහසත්හු රන්දැලක් වට කරන්නාක් මෙන් අනෝජා මල් පැහැති වැහැරි සිවුර පෙරවා දොඹමල් ඇතිරියක් බඳු සිනිඳු අඳුන් දිවිසම එකාංශ කොට පෙරවා පැවිද්දට ගැළපෙන සේ කෙහෙ බැඳ මුතුකලප් වැනි පසුම්බියක පබළුවන් කෙණ්ඩිය බහා තුන් වකක් ඇති පිරිකර කද කෙළවර බැඳ අනික් කෙළවරෙහි විසංකාරිභාජනය බැඳ කදු කර තබාගෙන කළුවරහරින් තැනූ සෘජු සිනිඳු දික් සැරයටිය දකුණතින් ගෙන පන්සලින් නික්ම සැටරියන් සක්මනෙහි සක්මන් කරමින් සිය තවුස් පැවිදි සමාදානය බලා තුටු පහටුව "අහෝ සැපයි, අහෝ පරම සැපයි" කියා උදන් ඇනූහ.

"පණ්ඩිතය, මා විසින් ශ්‍රමණ-පරිබ්‍රාජක-තාපස පැවිද්ද ලබන ලදි. අද මාගේ මනදොල පිරුණේය. මම ගෘහචාරිකාවෙන් මිදුණෙමි. නිවන්පල ලත් ජනසෙවිත විවේක සුවදායක වනවාසයට මම පැමිණියෙමි. දැන් මඟ පල ඉපදවීමට අකුසීතව උත්සාහ කරමි"යි පිරිකර කද පසෙක තබා සක්මන මැද මුංවන් ශිලාතලයෙහි සුනිපුණ ශිල්පියකු විසින් තැනූ රන්සිංහයකු මෙන් නිර්භයව වනමැද හුන්හ. සවස පන්සලට පිවිස බිදලමඤ්චයෙහි දකුණුඇලයෙන් සිංහසෙය්‍යා කොට සුවැති ගතින් අලුයම පිබිද තමාගේ පැමිණීම සිතා බලමින් මම ගිහිගෙයි විසීමේ පළිබොධ සිඳ විවෙකකාමීව වනගතවීමි. මෙහිද විවෙක රහිත මාගේ කාමවිතර්කාදි කළුමැස්සෝ ලුහුබැඳ සිත අවුල් කරති. මේ පන්සලෙහි කහ පිරිබඩ ගැන්වූ බිම ඉදුණු බෙලි ගෙඩි වැනිය. බිත්ති රිදී තහඩු වැනිය. වහල පරෙවි පියාපත් වැනිය. විසිතුරු ඇතිරි යෙදූ බිදලමඤ්චය සුවපහසුය. මේ වනවාසයත් දෙවන ගෘහවාසයක් බඳුය"යි සිතූහ.

"දැන් මම පන්සලෙහි පළිබෝධයත් දුරුකරමි"යි පන්සලෙහි ගුණාගුණ සිතන්නේ අටදොසක් දුටුවේය. පන්සලෙහි අටදොස කවරේ ද? බොහෝ උපකරණ ඇරබ නිෂ්පාදනීය බව, පලුදුවීමෙහි තණමැටි ආදියෙන් නිතර පිළිසකර කළයුතු බව, වැඩිමහල්ලන් විසින් නැගිටුවන කල්හි සිතේ එකඟතාව නැසෙන බව. ශීත උෂ්ණ වළකින හෙයින් සියුමැලි ශරීර ඇතිවන බව, ගර්හා සැඟවෙන බැවින් දුබලසිත් ඇතියහුගේ හිරිඔතප් නැති බව, ආත්මාධිපත්‍යය නැත්තහුගේ සංවරය සිඳීමට ඉඩ ඇති බව, මාගේය යන ග්‍රහණය ඇති වස්තු නිසා ගෙයි දෙවැන්නකු සමඟ වසන බව. උකුණු මකුණු සූහුනු මැසිමදුරු බළල් මුගටි මීයන්ට සාධාරණ බව යනුයි. මේ අටදොසින් යුත් පන්සල අතහැර සුමෙධ පණ්ඩිතයාණෝ පන්සලෙහි ආශාව දුරුකොට දසගුණ සම්පන්න රුක්මුලකට ගියහ.

කවර දසගුණයක් ද? එළඹීම් පමණකින් මද ආරම්භයක් ඇති බව, විසීම් පමණකින් පරිභොග පහසු බව. නොනැගිටිය යුතු බැවින් පැමිණි අනුන්ට මෙහි වසන්නැයි ඇමතීමක් නැති බව, ගර්හා

සැඟවීමක් නැති බව, අභ්‍යවකාශ වාසයෙහි කය දැඩි නොවීම, අරණ්‍යයෙහි සුහරුක්මුල් ඇති හෙයින් පරිග්‍රහ නැතිබව. ගෘහාලය ප්‍රතික්ෂෙපවන බව, අසාධාරණ බව නිසා දොම්නස් රහිත බව, වසන්නහුගේ ප්‍රීති සහගත බව, අනපෙක්ෂව පිටව යන බව යනුයි. මේ දසානිසංස දැක රුක්මුල්හි විසූහ. මෙසේ උන්වහන්සේ පන්සලෙහි දොස් දැක රුක් මුල්හි අනුසස් දැක දෙවන දින ගොදුරුගමට පිඬු පිණිස පිවිසියහ.

එහි මිනිස්සු පහන්සිතින් සොම්නස්ව පිණ්ඩපාතය පිදූහ. උන්වහන්සේ එහිම බත්කිස නිමවා යළි අසපුපියෙසට ගොස් රුක්මුල පර්යංකයෙන් හිද "මම අහර පිණිස පැවිදි නොවූයෙමි. සිනිදු අහර මාන දර්ප උපදවයි" සිතා සියලු ධාන්‍යාදි අහර අතහැර පවත්තඵලාහාරය පමණක්ම සමාදන්වූහ. මෙහිලා පැවිද්ද අටවැදෑරුම් ය. සපුත්තභරියා, උඤ්ඡාචරියා, ආමකභික්ඛාදාන, අනග්ගිපක්කභොජිතා, දත්තෝදකඛසතා, පවත්තඵලදායිකා, සාඛා පවත්තඵලපරිග්‍රහකාරිකා, පණ්ඩුපත්තපරිග්ගාහිකා යනුවෙනි. අඹුදුරුවන් සහිත පැවිද්දෙහි දාවල පැවිදිවෙස් දැරීම ද රාත්‍රි කාම පරිභොගය ද වෙයි. උඤ්ඡාචරියාව නම් උදලු කුඩා ගෙන වනයට ගොස් පලවැල අලමුල් සපයා ගෙන පරිභොග කිරීමයි. සාඛා පත්‍ර ඵල පරිහරණය කරන තවුසෝ තුමූම ගසට නැග කැමති පරිදි පරිහරණය කරති.

සුමෙධ තාපසයෝ මේ අට වැදෑරුම් පැවිද්දෙන් අතිශය අල්පෙච්ඡතාවෙන් හා උත්කෘෂ්ට වීර්යයෙන් යුත් බැවින් පවත්ත ඵලාහාරයම තෝරාගත්හ. අනිත්‍ය දුක්ඛ මනසිකාරයෙහි නිරන්තර යෙදීමෙන් සයනය අතහැර හිඳීම් සිටීම් සක්මන් කිරීම් යන තුන් ඉරියවුවෙන්ම කල් ගෙවා සතියක් තුළම පංචාභිඥා අෂ්ටසමාපත්ති ඉපදවූහ. හිරුරැස් ඇති වූවාක් මෙන් විකුර්වණ කරමින් කාන්තිධාරාවෙන් වට වූ නිර්මල සුනිල් ජලතලාවක් වන් නිල් අහස්හි මහජනයාට දෘශ්‍යමානව ගර්වයෙන් යුත් ගරුඩයකු මෙන් අහසින් ගොස් මහදඹගසින් ගෙඩි ගෙනවුත් මහජනයා මැද වළඳා උතුරුකුරු දිවයිනට ගොස් දිවාවිහාර කොට ඍද්ධිපාදයෙහි මෙන් හිරු

පර්යංක කොට වාඩිවූහ. එයින් බැස පොළාව කිමිද මහමෙර මත සිටගත්හ.

ලෝකයා ඒ දැක ඒ ප්‍රාතිහාර්යයෙන් පැහැද අර්හත් සම්‍යක් සම්බුද්ධ බ්‍රහ්මයා යි සිතූහ. උන්වහන්සේ ද මහජනකාය දැහැමි කතාවෙන් දැක්වූහ. සමාදන් කරවූහ. තෙදගැන්වූහ. සතුටු කරවූහ. එ සමයෙහි දිවකුරු බෝසතාණෝ සොළසැකි කප්සුවහසක් පැරැම් සපුරා මේරූ කුසල් මුලින් පිරූ බොධිඥානයෙන් වෙසතුරු අත්බැවුහි පැරැම් කුළුගන්වා තුසිපුර උපන්හ. ආයු තෙක් එහි වැස බ්‍රහ්මයන් සහිත මහෙන්ද්‍රාදි දෙව සමූහයා විසින් ආයාචනා කරන ලදුව ඇසළ පුන්පොහෝ දින උතුරුසල නැකතින් තුසිතයෙන් චුතව දඹදිව මකුටය වන් මධ්‍යදේශයෙහි රම්ම නගරයෙහි සුදෙව මහරජු නිසා සුමෙධා මහමෙහෙසි කුස පිළිසිඳ උපන්හ.

අසාහසයාණන්ගේ පිළිසිඳ සිතත් සමඟින් පොළෝතලය පටන් මහාඅවීචිය නාගභවනය සමඟින් ලොකධාතුව කම්පා විය. ඎණප්‍රභාවෙන් දිලිසුණු මහාආලොකය ලෝකාන්තරිකයන් ද බබුළුවාලීය. අවීචි ගිනිදැල් නිවී ගියේ ය. ලෝකුඹුව සිහිල් දියෙන් පිරුණේය. අංගාර පර්වතය නිවියේ ය. කටුඉඹුලෙහි කටු නැති විය. තියුණු අක් ඇති ගිනිගෙන දැල්වෙන යහුල් වැටුණේය. වෙතරණි කටු බිඳී ගියේ ය. කලහ සන්සිඳුණේ ය. වෑ පොරෝ දඩු රහිත විය. නිරය පාලයෝ ව්‍යාපාර රහිත වූහ. නිරාගත සත්ත්වයෝ සැනසුම් ලැබූහ. ප්‍රේතවිෂයෙහි උපත් සත්ත්වයෝ සාපවස් පහවුවෝ වූහ. අන්ධයෝ බැලූහ. බිහිරෝ ඇසූහ. ගොළුවෝ මිහිරිබස් බිණූහ. පිල්ලු අවිකල පයින් කැමති පරිදි ගමන් කළහ. විදෙස්ගත නැව් සුවසේ පටුන් පැමිණියේ ය. හාත්පස සාගර ජලයෙහි ද පොළවෙහි ද කඳුවල ද පස්වනක් පියුම් පිපුණේය. ගල්තලාවල සත්බුමු පියුම් පිපුණේ ය. මල්පල ගන්නා හැම ගස් හැම වැල් මල්පල බර විය. අකනිටාවෙහි පටන් පොළෝතලය තෙක් මෙදෑතුර අහසෙහි ධජ පතාකා චාමරාදි නොඑක් පූජා සත්කාරයෙන් නිරන්තර විය. නොඑක් අද්භූත පෙළහර දහස්ගණන් විය. මහපුරුෂයාණෝ මෙබඳු

මහයසසින් අපමණ සම්පතින් ලොකපාලයන්ගේ ආරක්ෂා ඇතිව මවුකුස මිණිමුවා කුළුගෙයක මෙන් කිසිත් අශුචියකින් නොතැවරී දසමස් වැස රජඋයන්හි සරත් සූර්යයා මෙන් මවුකුසින් බිහිවූහ.

උපන් කෙණෙහි පිළිසිඳීමෙහි මෙන් පෙළහර විය. පස්වන දින නෑයෝ එක්ව හිසෙහි නැහැවූ කුමරු නිමිතිදත් බමුණන්ට දක්වා විස්තර දක්වමින් "මේ කුමරා මුළුලොව එකලුකොට උපන්නේ ය. එබැවින් තම නම රැගෙනම ආයේය" යි නිමිති දත් බමුණන්ගේ අනුමැතියෙන් දීපංකර කියාම නම් කළහ. කුමරා වසර ලක්ෂයක් කුමරකෙළියෙහි යෙදුණේ ය. වසර ලක්ෂය ගෙවී යාමෙන් සිය පින්බෙලෙන් උපන් රම්ම සුරම්ම සුභ තුන්පායෙහි තුන්සෘතුවෙහි සැප විඳිමින් යසොධරා දෙවිය ප්‍රමුඛ සූසැට ලක්ෂයක් නළඟනන් සමඟ නව ලක්ෂ පන්සියයක් අවුරුදු දෙවියකු මෙන් සැප විඳ නුවණ මෙරෑ කල ගිහිසැප නොකැමතිව මහලු ගිලන් මළ පැවිදි දෙවදූතයන් දැක නැවත නැවත බිය ගෙන සංසාරාදීනව බොහෝ යයි පැවිදිවනු රිසි වූහ.

එකල යසොධරා දෙවියට උසහක්ඛත්ධ නම් රූමත් පුත්කුමරා උපන්නේය. වඩාත් සංවේගයට පත්ව මම එක් පුතකුගේ උපතින් ප්‍රීතිසොමනසට පැමිණියෙමි. පුතුන් සියයක් උපන් කල කෙසේ වෙම් ද? ස්නෙහවත්හුගේ සංසාර විමුක්තිය දුර්ලභය. එනිසා ස්නෙහබන්ධන වඩාත් දැඩිතර වීමට පෙර රසකිඳ වැලක් කඩන ඇතකු මෙන් ස්නේහබන්ධනය සිඳ දමා පැවිදිවෙමි සිතා මහසත්හු පස් දිනක් වූ උතුම් පුතු හැරදමා මහබිනික්මන් නික්මෙනු කැමතිව සියලු රම්මවති නගරය දෙව්නුවරක් මෙන් අලංකාර කරවා හස්ත්‍යාචාරීන් කැඳවා මම උයන් කෙළියට යනු කැමැත්තෙමි. ඇත්යානා සරසවයි කීය. ඔහු මැනවි දේවයන්වහන්සැ යි පිළිතුරු දී අසූහාරදහසක් ඇතුන් සැරසවීය. ඉක්බිති උතුම් නරාසභ දීපංකර මහසත්හු විස්කම් දිව්‍යපුත්‍රයා විසින් දිව්‍යාලංකාරයෙන් සරහන ලදුව ශක්‍රයා මෙන් බබළමින් ජය ඇතුමත නැගී අසූහාරදහසක් ඇතුන් පිරිවරා මහසෙනඟ පෙරටුව උයනට පිවිස ඇතුපිටින් බැස මගුල්

ගල්තලාවෙහි හිඳ පැවිදි වෙමියි සිතූහ. එකෙණෙහිම සුද්ධාවාස මහාබ්‍රහ්මයා අෂ්ට ශ්‍රමණ පරිෂ්කාර ගෙන උන්වහන්සේ හමුවෙහි පෙනී ගියේ ය. ඉක්බිති මහාපුරුෂයාණෝ සුද්ධාවාස බඹු දුන් අරහත්ධජ නම් කහසිවුරු වැළඳ පැවිදි වූහ. මහාපුරුෂයන් පැවිදි වීමේදී අනුව පැවිදි වූ කෝටියක් පමණ පිරිස පිරිවරා දසමසක් ප්‍රධන් වීර්යය වඩා වෙසක් පුන් පොහෝදා පිටිසර නගරයකට පිඬු පිණිස වැඩියහ. ඒ නුවර දෙවියන්ට බිලියම් පිණිස නුවරුන් විසින් සකසන ලද කිරිබත් සියලු භික්ෂූන්ට බත්කිස පිණිස ප්‍රමාණවත් විය. මහා පුරුෂයාණන්ට වනාහි දෙවිවරු දිව්‍ය ඔජස් බහාලූහ. එය වළඳා රමණීය වනළැහැබක දිවා විහාර කොට සවස විවේකය සඳහා සමූහයෙන් වෙන්ව තනිවම කේශර සිංහයෙකු මෙන් වැජඹෙමින් දෙවියන් විසින් සරසන ලද මාර්ගයට පිළිපන්හ. අතර මග සුනන්ද නම් ආජීවකයන් දෙන ලද අටතණමිට ගෙන පිප්ඵලී බෝධිය වෙත දකුණු දිශාවෙන් පැමිණ ඊසාන දිග සිට තෙපනස් රියන් තණ ඇතිරිය පනවා අනූරියන් බෝකඳට පිට ලා පයඞ්කයෙන් චතුරංගික වියඞ්ය අධිෂ්ඨානකොට හිඳ මාරබල නසා පළමු යාමයේ පුබේ- නිවාසය සිහිකොට මධ්‍යම සමයෙහි දිවකන දිවඇස පිරිසිදු කොට අලුයම්හි අනුලෝම ප්‍රතිලෝම වශයෙන් පටිච්ච සමුප්පාදය සිහි කොට තඹවන් අරුණෝදයෙහි සර්ඥතාඥානය ලබා බුද්ධ සිංහනාද කළ සේක.

දීපංකර සම්‍යක් සම්බුද්ධ ප්‍රදීපායමාන නරශ්‍රේෂ්ඨයාණෝ සත්සතියක් බෝධි සමීපයෙහි කල්ගෙවා මහබඹුගේ අදහස් පිළිගෙන සුනන්දාරාමයේදී දම්සක් පවත්වා සිය කෝටියක් දෙව් මිනිසුන් ධර්මාවබෝධයට පමුණුවා කෝටියක් භික්ෂූන් අර්හත්වයෙහි පිහිටුවා, ඒ සියල්ලන් එව මහණ පැවිද්දෙන් පැවිදිකරවා සතර මහාද්වීපයෙහි වස්නා මහාමේඝයක් මෙන් සද්ධර්ම නැමැති පිරිසිදු නිර්මල සීතල ජලයෙන් සියලු විනේය ජනයන් තොස්වමින් දැල්වූ ධර්මප්‍ර-දීපාලෝකයෙන් සියලු අවිද්‍යා අඳුකාරයන් නසා අමාපද දක්වමින් චාරිකා කළ සේක. එසමයෙහි සුමේධ පණ්ඩිත තාපසතුමා දීපංකර

තථාගතයන් මවුකුස පිළිසිඳ ගැනීමෙහි, මව්කුසින් නික්මීමෙහි, බුදුවීමෙහි, දම්සක් පැවැත්වීමෙහි යන සතර තැන දසදහසක් සක්වළ කම්පාවෙද්දී මහත් ආලෝකාදි අනේකප්‍රකාර ප්‍රාතිහාර්ය වෙද්දී ධ්‍යාන රතියෙහි යෙදීම නිසා නිමිති කිසිවක් නොදත්හ. ශබ්දය ද නො ඇසූහ. ඉක්බිති පසුකලෙක දිවකුරු බුදුරජාණන් වහන්සේ සාරලක්ෂයක් භික්ෂූන් පිරිවරා මහජනයාගේ මොහඳුර දුරලනු පිණිස මහාමණ්ඩලයෙහි චාරිකා කරන සේක් අනුපිළිවෙළින් රම්‍ය නම් ප්‍රත්‍යන්ත නගරයට පැමිණි සේක.

ඉක්බිති රඹගම් නුවර වාසී මිනිස්සු දිවකුරු මුනිඳුන්ගේ පැමිණීම අසා පෙරගමන් කොට සොම්නස්ව බික්සඟුන් සහිත භාග්‍යවතුන් වහන්සේට ආරාධනා කොට දානවස්තු සපයා නුවර මැද මහමඩුවක් කරවා නිලුපුලින් සෙවිලි කොට ලදපස්මල් විසුරුවා සළුවියන් බඳවා සුවඳදුම් එළවා මල්දම් ආදියෙන් සරසා වෙනත් සියලු පූජෝපකරණ සකසා උදලු කුඩා ගෙන මඟ සැරසීම පිණිස නික්ම කණු කටු ඉවත් කරති. විසම තැන් සම කරති. තොරණ බඳිති. පුන්කලස් තබති. ධජ පතාකා ඔසවති. මඟ වැලි විසුරුවති.

ඉක්බිති සුමේධ තාපසයාණෝ ලුණු ඇඹුල් සෙවීම සඳහා අසපු පියසින් අහසට නැග ගොදුරුගමට යන්නෝ තුටු පහටුව එසේ කරන මිනිසුන් දැක හේතුව කුමක් දැයි අහසින් බැස පසෙක සිට මිනිසුන්ගෙන් "භවත්නි, මේ මාර්ගය කවරකු සඳහා කරන්නහු ද? වෙනදා මා දැක මහබඹුමෙන් සිතමින් කටයුතු අමතක කොට මට වැඳීම උවටැන් කිරීම ඇදිලි බැඳීම සාමීචි කතා කිරීමාදියෙහි ව්‍යාවෘත වන්නාහුය. දැන් වනාහි මා පිඬු පිණිස යන මහණකු මෙන් බලන්නාහු ය. මීට හේතු කවරේදැ"යි විමසූහ. ඔවුහු එක රුණ කීහ. මහාතාපසයාණනි, දීපංකර නම් ලෝක නායකයාණන් වහන්සේ ලොව උපන් සේක. පහනකින් අඳුර මෙන් නැණ එලියෙන් අවිදු අඳුර නසන සේක. මේ මඟ උන්වහන්සේට සරසමු. බුද්ධ යන වචනය අසා සුමේධ පණ්ඩිතයන්ට ඔක්කමන, එරණ, පාමොජ්ජ, ඕභාස, උබ්බෙග යන පස්වනක් ප්‍රීතිය ඉපිද "අහෝ ආශ්චර්‍යයි.

අහෝ අද්භූතයි මේ බුද්ධ යන ශබ්දය නොයෙක් කප් ලක්ෂයන්හි ඇසීමට අතිශයින්ම දුර්ලභය. මා විසින් අද එය අසන ලදි. මට නියත වශයෙන්ම ලාභයකි" යැයි සිතා තුටු පහටුව පුබුදු සිතින් රන්බිත්තියක නිල්මිණි පියුමක ඔබ්බන ලද ඇත්දළ වැනි ලොමු දැහැගැනීම් ඇතිව "දැන් මම ආයෂ්‍ මෂ්ටාංගිකූ මාගී නැමැති කුඹුරෙහි සුපිරිසිදු බුදුසසුනෙහි සතර මඟ ඵල ලබා දෙන ශ්‍රද්ධා බීජය රෝපණය කරමී" සිතූහ.

උන් වහන්සේ මෙසේ සිතා ඒ මිනිසුන්ට "ඔබලා බුදුන්ට මග සරසන්නාහු නම් මට ද කොටසක් දුන මැනව. මම ද බුදුන්ට මග සරසමි"යි කීය .ඒ මිනිස්සු "මේ තාපසයෝ මහත් සෘද්ධි ඇත්තාහ. මහත් ආනුභාව ඇත්තාහ. සම විසමතා වහා සම කිරීමට සමත්හ. අපි අපට සැකසිය නොහැකි විසම දුෂ්කර තැනක් ඔහුට දෙමු" කියා ය. ඔවුහු උන්වහන්සේට දිය ගලා බසින මඩ ගොහොරුවක් දුන්හ. එවිට සුමේධ තාපසයාණෝ "මා අත උදැල්ලක් හෝ කුඩයක් නැත. සෘද්ධියෙන් කරතොත් පොළව සත්රුවන්මුවා කළ හැකි වෙමි. කායික වතාවත් කරන්නකුට එය නොගැළපේ. එයින් මට සතුටක් නූපදී. මම මාගේ උත්සාහයෙන් ම කරමි" සිතා පිරිකර කඳ පසෙක තබා කෙණ්ඩිය ඉවත් කොට කුඩය ගෙන මිනිසුන් කැපූ තැනින් පස්ගෙන දිය පහරට දැමූහ. දැමූ පස් දියෙහි පාවිය. රඹගම් නුවර වැස්සෝ අනේක ප්‍රකාර කැඳබත් බාද්‍ය භෝජ්‍ය ආදිය පිළියෙළ කොට පිවයුතු පරිභෝග කටයුතු පැන් තබා දිවකුරු බුදුන්ට කල් දැන්වූහ.

දීපංකර සම්මා සම්බුදුහු වේලාසනින් නැගිට සිරුර පිළිදැගුම් කොට හේමන්තයෙහි අලුයම සූයෂ්කාන්ත මල්දමක් බඳු අඳනය ඇඳ වැසි වලාවකින් නිකුත් විදුලියක් වැනි පටිය බැඳ සරත් සමයෙහි හටගත් හිරු සිරි පරදවන්නා වූ දිවකුරු බුදුහු සුගත් මහ සිවුර පොරවා රන්ලිය වන් පියුම්පෙති වන් සුරත් සක් ලකුණෙන් හෙබි මනාව බෙදූ ගැඹුරු රේඛාවෙන් සැදි අනුපූර්ව නිරන්තර තඹවන් නියපෙළින් බබළන විසිතුරු ඇඟිලි යුත් අත්තලයෙන් මාහැගි

සෙල්මුවා පාත්‍රය ගෙන ෂඩභිඥාලාභී සාර ලක්ෂයක් රහතුන් පිරිවරා අනුපම බුදුසිරින් රඹගම් නුවර බලා පිඬු පිණිස වැඩි සේක.

එකල වර ලකුණින් හෙබි උතුම් දසබල දේහයෙන් රුචිර සවනක් රැස් නිකුත් විය. සිත් ගනිමින් අතිශයින් බබළන ආශ්චර්‍ය්‍ය අද්භූත විස්මය දනවන අපර ප්‍රශංසාවෙන් ලීලෝපේත ඒ රැස් දහර නොසිදුරුව නොකඩව අසම්මිශ්‍රව තරංග තරංගව නීල පීත ලෝහිත ඕදාත මඤ්ජෙට්ඨ ප්‍රභාස්වර පැහැ එකිනෙක ගැටි ගැටී උස් පහත් වෙමින් අහස් කුස හොබවමින් සියලු දිසාවෙහි පැතිර ගියේය. එකෙණෙහි දසදහසක් සක්වළ දේව සමූහයා "අද සුමේධ පණ්ඩිතයෝ සම්මා සම්බෝධියට පැමිණීම පිණිස අවශ්‍යයෙන්ම ප්‍රාර්ථනා කරති. දීපංකර නායකයාණෝ උන්වහන්සේට විවරණ දෙති. යමු, නිදුක්වරුනි, උන්වහන්සේගේ විවරණයත් සෞම්‍ය දර්ශනයත් බුදුරුවත් බලමු. බෝධිසත්ත්වයන්ගේ ධීර භාවයත් සියැසින්ම දකිමු "කියා ඔවුනොවුන් අමතා කුහුලින් යුතුව ඇසිල්ලකින් සියල්ලෝම එකම සක්වළක රැස් වූහ. එකෙණෙහි බෝසතාණන්ගේ නිසල ප්‍රාර්ථනා හේතුවෙන් ද නියත විවරණ බලයෙන් ද ලෝකවිවරණ නම් පෙළහර සිදුවිය.

> "දෙවියෝ මිනිසුන් දකිති. මිනිස්සු දෙවියන් දකිති. ඇදිලි බැඳගත් ඒ සියල්ලෝ තථාගතයන් වහන්සේ අනුව යති. දෙවියෝ දිවතුරු ද, මනුෂ්‍යයෝ මිනිස් තුරු ද වයමින් දෙපසින් තථාගතයන් වහන්සේ අනුව යති. අහස්හි දෙවියෝ දිව්‍යමය මඳාරා පියුම් හා පරසතු මල් දිසානුදිසාවන්හි වගුරුවති. සපු හොර මිදෙල්ල නා දොඹ වැටකේ මල් බිම සිටි මිනිස්සු දිසානුදිසාවන්හි විසුරුවති.

ඉක්බිති සුමේධ පණ්ඩිතයෝ දුරදීම අසූරියන් උස අනන්ත වර්ණ කාන්ති රශ්මියකින් විලාසවත් සිරුරින් යුතු දෙතිස් මහපුරිස් ලකුණින් යුත් සුන්දර කේතුමාලාලංකාරයෙන් මග පෙදෙස ද තුන් යොදුන් පමණ බ්‍යාම ප්‍රභායෙන් මුළු ලොව ද බබුළුවමින් දෙව්මිනිස් සමූහයා විසින් සත්කාර කරනු ලබන ඉදිරියට වඩින දීපංකර

තථාගතයන් වහන්සේ දුටහ. දැක ආශ්චර්‍ය්‍ය අද්භූතව පුබුදු මනසින් සියලු කෙලෙස් මඩ සෝදා හළ භාග්‍යවතුන් වහන්සේ සැරසූ මගින් වඩින සේක. මා ගත් බිම්කඩ සරසා නැත. මඩ සහිතය. වළ ගොඩැලි සහිතය. මම දැන් කුමක් කරන්නෙම් ද? මේ ලෝකයෙහි බුද්ධෝත්පාදය අතිශයින් දුර්ලභය. දැන් මම මඩ ගොහොරුවෙහි හේදණ්ඩක්ව ශ්‍රාවක සංඝයා සහිත ලෝකනාථයන් වහන්සේට ජීවිතය පුද කරමියි සිතීය. සුමේධයන් වහන්සේ සියතින් ජටා මඩුලු ලිහා කළු කිලිටි මඩෙහි යටිකුරුව මා මැඩ දීපංකර ලොක නායකයන් වහන්සේ සපිරිවරින් මඩෙන් නොකිලිටිව එගොඩ වන සේක්වායි වැදහොත්හ.

එවිට බිම වැතිර ගත් සුමේධ පණ්ඩිතයන්ට නැණ බෙලෙන් මෙබදු සිතක් ඇතිවිය. ඉදින් මා මැඩලූවහොත් අදම මම සියලු කෙලෙසුන් දවා රහත් මග ඵල පසක් කොට බුදු පාමොක් බික් සඟුන් සමඟ රම්ම නුවරට පිවිස පිණ්ඩපාතය ගැනීමට සමත් වෙමි. නොඑසේ නම් මාගේ වීර්‍ය්‍ය නොයෙක් සිය ගණන් යුද්ධ දිනීමට සමත් යෝධයෙකුට සමානය. දැන් මම දැඩිවීර්‍ය්‍යයෙන් සම්මා සම්බුදුන් හමුවෙහි පැතුම් පතා පැරුම් පුරා මේ දීපංකර සම්මා සම්බුදුරජාණන් වහන්සේ මහාජනයා සසර බැම්මෙන් මුදා සසර සයුරෙන් එතෙර කොට දහම් අමාරයෙන් සනසා ලමින් බුද්ධ නම් වන සේක් ද, මම ද එසේ බුදුවන්නෙමි.

> “අප්‍රසිද්ධ වේශයෙන් තනිව ධර්‍මය සාක්ෂාත් කිරීමෙන් මට කවර ඵලයක් ද? සර්‍වඥත්වයට පැමිණ දෙවියන් සහිත ලෝකයෙහි බුදු වන්නෙමි. පුරිසථාමයෙන් යුත් මට තනිව එතෙර වීමෙන් කවර ප්‍රයෝජනයක් ද? බුදුව දෙවියන් සහිත ලෝකයා එතෙර කරවන්නෙමි. පුරුෂකාරයෙන් යුක්තව බුදුබවට පැමිණ බහුජනතාව එතර කරන්නෙමි. සසර සැඩ පහර සිඳ තුන්භවය නසා සද්ධර්‍ම නෞකාවට ගොඩවී දෙවියන් සහිත ලෝකය එතර කරවන්නෙමි.

උන්වහන්සේ මෙසේත් සිතූහ. "මම වනාහි මනුෂ්‍යත්වය ආදි අට ගුණ ඇත්තෙමි. මට බුදු බව කෙසේ නම් ඉටු නොවන්නේ ද? මම මෙහි පළමු පැතුම් පතා අනවරාග්‍ර සංසාරයෙහි රැස් කළ තණ්හා ශ්‍රෝතස සිඳ තුන් භවයෙහි නොහැසිර ආර්ය අෂ්ටාංගික මාර්ග නැමැති ධර්ම නෞකාවට දෙව් මිනිසුන් නංවා සතිපට්ඨාන රුවල දිගහැර වාතයෙහි පැහැර ප්‍රඥා කුඹය ඔසවා සීලරත්නය බැඳ වීර්‍ය නැමැති යොතින් වෙළා සමාධි පාසාණයන් ගෙන ධ්‍යාන බලයෙන් අයොනිසොමනසිකාර නැමැති ජලය පහකොට සසර ශ්‍රෝතස සිඳ සතර ඕඝයෙන් එතෙර කොට දෙව් මිනිසුන් නිවන් පරතෙර පිහිටු වන්නෙමි කියායි.

ඉදින් මම බුදුවන්නෙම් නම් භාග්‍යවතුන් වහන්සේ මා නොමැඩ සිටින සේක්වා. එසේ නම් මම බුදුවන්නෙමි. මා මඩින සේක්වා හෝ නොමඩින සේක්වා එයින් මගේ පැතුම සිදුවන සැටි දනිමි සිතමින් වැඳහොත්හ. එවිට දීපංකර සම්මා සම්බුදුහු මහත් වූ සුන්දර බුද්ධ වේශයෙන් ද මහා කරුණාවෙන් ද, දෙවියන්ගේ දැක්වීමෙන් ද දෙව්මිනිසුන් පිරිවරා සුමේධ පණ්ඩිතයන් සමීපයට වැඩ දැල් වූ විමල විශුද්ධ බුදු ඇසින් තාපසයන්ගේ හේතු වාසනා බලා "මේ සත්වයා තියුණු ප්‍රඥා ඇත්තේය. යහපත් අදහස් ඇත්තේය. දැඩි සමාදන්වීම් ඇත්තේය. මොහුගේ පැතුම ඉටුවන්නේ දෝ නොවන්නේ දෝ හෝයි" සිතූහ. එවිට චේතෝපරියඤාණයෙන් කඳ පිළිවෙළින් බලන්නේ එක් ආවර්ජනයෙන්ම සාරාසංඛ්‍ය කප් ලක්ෂයක් බැලූ සේක. මේ තාපසයන්ගේ පැතුම ඉටුවන්නේ යැයි දැන ලෝකවිදූ භාග්‍යවතුන් වහන්සේ දෙව්මිනිස් සමූහයා මැදම සුමේධ පණ්ඩිතයන්ට විවරණ දෙමින් අටඟකින් යුත් බ්‍රහ්මස්වරය විහිදුවමින් භික්ෂූන්ට මෙසේ වදාළ සේක.

> උග්‍ර තපස් ඇති ජටාධාරී මේ තාපසයා බලව්. මේ කපින් බොහෝ කලකට පසු ලොව බුදුවන්නේය. මොහුගේ වැදූ මව මායා නම් වන්නීය. පියාණෝ සුද්ධෝදන නම් වන්නාහ. මෙතෙම ගෝතම නම් වේ. ප්‍රධන් වඩා දුෂ්කර ක්‍රියා කොට

ඇසතු බොරුක් මුල්හි යසස් ඇති හෙතෙම සම්බෝධිය අවබෝධ කරන්නේය. කෝලිත උපතිස්ස දෙනම අග්‍රශ්‍රාවක වෙති. ආනන්ද නම් උපස්ථායක ඒ ජිනයන්හට උවටැන් කරන්නේ ය. ඛේමා උප්පලවණ්ණා යන දෙදෙන ආස්‍රව රහිත වීතරාගී ශාන්ත සිත් ඇති සමාහිත වූ අග්‍ර ශ්‍රාවිකාවෝ වෙති."

දීපංකර භාග්‍යවතුන් වහන්සේ සුමේධ තාපසයන්ට මෙසේ විවරණ දී එතුමන්ට පූජා කරනු කැමැතිව සාමණේරයන් දෙස බැලූහ. එවිට ඒ සාමණේරයෝ භාග්‍යවතුන් වහන්සේගේ අදහස් දැන මොහොතකින් හිමවතට ගොස් මනා සුවඳැති දියගොඩ කුසුම් ගෙනවුත් පිළි ගැන්වූහ. භාග්‍යවතුන් වහන්සේ දසනියරත්න ඇති දික් වූ නෙළුම් පෙතිවන් සියුමැලි බබළන අතින් මල්ගෙන අටමල් මිටක් තාපසයන් මත විසිරවූහ. ඒවා කුරුණු අටක් පමණ වේ. අනතුරුව භාග්‍යවතුන් වහන්සේ සුමේධ තාපසයන් ප්‍රදක්ෂිණාකිරීමට පටන් ගත්හ. එවිට සුමේධ පණ්ඩිතයන්ගේ ශ්‍රද්ධාබලයෙන් වැතිර සිටි බිම්කඩ කුඹල්සකක් මෙන් කැරකී හිස භාග්‍යවතුන් වහන්සේගේ සිරිපා අභියස පිහිටියේය. භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් සමඟ පැදකුණු කොට වැඩිසේක. දෙවියන් සහිත සෙසු ලෝකයා ද සධාතුක රන්සෑයක් මෙන් පැදකුණු කොට පසඟ පිහිටුවා වැඳ පහන් සිතින් උන්වහන්සේගේ ගුණ පසසමින් නැවත නැවත බල බලා ගියහ. සුමේධ පණ්ඩිත තාපසයෝ භාග්‍යවතුන් වහන්සේ දර්ශන පථයෙන් ඉක්මීමත් සමඟ හොත් තැනින් නැගිට පලක් බැඳ හිඳ ගත්හ. දස දහසක් ලෝක ධාතුවල සුද්ධාවාස කායික බ්‍රහ්මයෝ ද වැඩ සිටි තාපසයන් දෙස බල බලා නියත බෝසත් විවරණ ධර්මතා බලයෙන් උපදින නොයෙක් සිය ගණන් ප්‍රාතිහාර්‍යයන් දැක එක්ව බෝසතුන් දිරිගන්වමින් නියත බව දක්වමින් බුදු වදන් නොවෙනස් වන බව කියමින් පසසමින් මේ ගාථා ප්‍රකාශ කළහ.

වර පර්යංකයෙහි වැඩ හුන් පෙර බෝසත් වරුන්ට යම් නිමිති පහළ වී ද, ඒවා අදත් දක්නට ලැබේ. සීතල පහව යයි.

උෂ්ණය සමනය වෙයි. අද ඒවා දක්නට ලැබේ. ඒකාන්තයෙන් බුදු වන්නේය. මහසුළං නොහමයි. ගංගා ගලා නොබසී. ඒවා අදත් දක්නට ලැබේ. ඒකාන්තයෙන් බුදුවන්නේය. නිරයෙහි දස දහසක් ගිනි එවිට නිවෙයි. ඒ ගිනි අදත් නිවුණේය. ඒකාන්තයෙන් බුදුවන්නේය. එකල රාගය තුනී වෙයි. දෝස මෝහ වැනසේ. අද ඒ සියල්ල පහව ගියේ ය. ඒකාන්තයෙන් බුදුවන්නේය. එකෙණෙහි චුතියත් උපතත් සිදු නොවේ. අදත් ඒවා නොමැත. ඒකාන්තයෙන් බුදු වන්නේය. වීර්‍යය වඩනු මැනව. නොනවතිනු මැනව. ඉදිරියටම යනු මැනව. ඒකාන්තයෙන් බුදුවන්නේය යන මෙය අපි ද දනිමු.

එවිට සුමේධ තාපසයාණෝ බුදුවදනත්, සුද්ධාවාස වාසීන්ගේ වදනත් අසා හේතු දැන දැඩි වීර්‍යයෙන් යුතුව තුටු පහටුව මෙසේ සිතූහ.

බුදුවදන් නොසිඳිය හැක්කේය. බුදුවරු හිස් වචන නැත්තෝය. බුදු වදන්හි වෙනසක් නැත. මම ඒකාන්තයෙන් බුදු වෙමි. මම දැන් ඔබිනොබ උඩයට දස දිසාවෙහි ඇති තාක් ලෝක ධාතුවෙහි බුද්ධකාරක ධර්මයන් සොයමි.

උන්වහන්සේට "මම බුදුවෙමි. පැතුම් පැතුවෙමි. ඒකාන්තයෙන් බුදුවන්නේ යැයි දීපංකර සම්මා සම්බුදු රජාණන් වහන්සේ ද විවරණ දුන්සේක. සතුටට පත් දේව සමූහයා ද පැසසූහ. බොහෝ කරුණු වලින් බුදු වෙමියි මට ද සම්භාවනා ඇති විය. මෙවක් පටන් මා විසින් නොපමා විය යුතුය. ප්‍රපඤ්චයන් විසින් බෝධියට පත්විය නොහැකිය. අප්‍රමාදී වීර්‍යාරම්භයෙන් කුසල් රැස් කළවුන් විසින්ම පැමිණිය හැකිය. භාවිත බහුලිකෘත කවර ධර්මයකින් බෝධිය සාක්ෂාත් කිරීමට හැකි දැයි සොයා බලන්නාහු පළමුව එක් ධර්මයක් දුටහ. එක් ධර්මය කුමක් ද? ත්‍රෛභූමික සත්ත්වයන්ට ඒකාන්තයෙන්ම උපකාරක ජීවිත පාලක එකම ධර්මය ආහාරය මැයි. මේ සතුන්ට බොජුන් ඇදීම් ආවාස වලින් තොරව ජීවිත විනාශය වේ ය" යි සිතිණ.

එබැවින් සත්පුරුෂයන් විසින් පළමු කොටම දන් දීම සුදුසුය. ඉක්බිති සිල් රැකීමට, කාමයන් පහ කිරීමට, නුවණින් කරුණු පිරිසිඳීමට පටන්ගත් කටයුතු නොනිමි කල මඟ නොහැරීමට අනුන්ගේ අවමන් නොලබා සියල්ලන් සුවයෙහි පිහිටුවීමට සත්‍යයේ පිහිටීමට තීරණය නොකැඩීමට සත්ත්වයන්ගේ හිත පිණිස පැවතීමට මුළු ලොව මැදහත්ව පැවතීමට සුදුසු ය. මේ දස ධර්මයෙහි පිහිටි මට බෝධිය නියත යයි සිතා "ඉදින් බෝ මුලට ගොස් සම්බෝධියට පැමිණීමට කැමැත්තෙහි නම් පැමිණි යාචකයන්ට තමන්ට ඉතිරි නොකොට සියලු ධන සම්පත්, ජාත පුත්‍රයන්, භාර්යාවන් දන් දී පාරමිතා පුරව. අංග පරිත්‍යාග කොට උපපාරමිතා පුරව. ජීවිතය පරිත්‍යාග කොට පරමාර්ථ පාරමිතා පුරව"යි කියා තමාට මෙසේ අවවාද කළේය.

මත්තෙහි පරීක්ෂා කරන්නේ දානය නම් උපකරණ ලැබීම පමණකි. කුසල දහම්වලට පිහිටවන සීලයට සමාන දෙයක් නැත. සිල්හි පිහිටි යෝගාවචරයා කුසල් දහමින් නොපිරිහෙයි. සිල් ඇති කල්හි සතර මඟ සතර ඵල ත්‍රිවිද්‍යා ෂඩ්අභිඥා සවැදෑරුම් අසාධාරණ ඤාණ ලබයි. එබැවින් සීල පාරමිතාව පිරිය යුතුයි. එසේම එය ප්‍රාතිමෝක්ෂ, ඉන්ද්‍රිය සංවර, ප්‍රත්‍යසංනිශ්‍රිත, ආජීවපාරිශුද්ධ ශීලය ආදියෙහි නොකඩ, නො සිදුරු, නොසබල, නොකිලිටි ස්වභාවයෙන් පිරිය යුතු ය. සීල පාරමිතාව ද තෙවැදෑරුම්ය. හේතු නොයික්මවීම පාරමිතාවයි. අඟ පසඟ හේතුවෙන් නොයික්මවීම උපපාරමිතාවයි. ජීවිතය හේතුවෙන් නොයික්මවීම පරමාර්ථ පාරමිතාවයි.

මත්තෙහි නුවණ යොදා පරීක්ෂා කරන්නේ දානය නම් ලෝභය ප්‍රහාණය කිරීම පමණකි. සීලය අදහස් පිරිසිදු කිරීම පමණෙකි. කාමයන් ඉක්මවීමට නොහැකි වෙයි. නෛෂ්ක්‍රම්‍යය වනාහි ගෘහවාසයෙහි සම්බාධ සිඳ විවේක අදහස් ඇති කරයි. එහෙයින් නෛෂ්ක්‍රම්‍ය පාරමිතාව පිරිය යුතුයි. තෙපි වනාහි ගෘහාලය සිඳ දමා ධන අංග ජීවිත හේතුවෙන් හෝ එය නොයික්මවා පාරමී උපපාරමී පරමාර්ථ පාරමී පුරව. මහාසත්වයෝ මත්තෙහිත් තමන්ට

අවවාද දෙමින් "ඔබ බෝධි ඥානය ලැබීමට කැමැති නම් උපභෝග පරිභෝග ධන සොයන්නා වූ තෘෂ්ණාව සිඳ අඟ පසඟ රකින තණ්හාව දුරුකොට ජීවිතාශාව මුල් සිඳ කරුණු නුවණින් සලකා ප්‍රඥා පාරමිතාව පුරව"යි කීහ. වීර්‍ය්‍ය පාරමිතාව කෙසේ ද? සංවිභාග කෘත්‍යයෙන් දානය ද, සමාදානයෙන් සීලය ද ආලය පසිඳලීමෙන් නෛෂ්ක්‍රම්‍යය ද කටයුතු නොකටයුතු පසිඳලීමෙන් ප්‍රඥාව ද උපස්ථම්භයෙන් වීර්‍ය්‍යය ද ඉවසීම ක්ෂාන්තිබලයෙන් ද සපිරෙයි. ඔබ ධන ශරීර ජීවිත හානියෙහි පවා සිත විකල් නොකොට ක්ෂාන්ති පාරමී උපපාරමී පරමාර්ථ පාරමී ආචාර්යව දැඩිව සමාදන්ව පුරව. සත්‍ය පාරමිතාව නම් කියන ලද පරිදි දානාදිය ශක්තිය නිසා සමෘද්ධ වේ. වෙනත් අයුරකින් නොවේ. ධන අංග ජීවිත හේතුවෙන් හෝ සත්‍යය පැහැර නොහරිමින් ත්‍රිවිධ සත්‍ය පාරමිතාවට පැමිණෙන්-නෙහියයි තමාට අවවාද කළහ. කියන ලද දානාදිය අවිකල අධිෂ්ඨානයෙන්ම සපිරෙන්නේය.

මෙසේ ධන අංග ජීවිත විනාශයේ දී හෝ සිත් සසලතාව නසා සිතේ අචලතාව ඇතිව තෙවැදෑරුම් අධිෂ්ඨාන පාරමිතාව පුරව. හැම තන්හිම මෛත්‍රී සහගත වීමෙන්ම දානාදිය සිදු වේ. ඔබ ධන අංග ජීවිත හිංසාවෙහි දී පවා මෛත්‍රිය නොයික්මවා තෙවැදෑරුම් මෙත්තා පාරමිතාව පුරව. උපේක්ෂා පාරමිතාව නම් දාන සංවිභාගය සීල සමාදානය නෛෂ්ක්‍රම්‍ය ප්‍රඥා වීර්‍ය්‍ය ක්ෂාන්ති සත්‍ය අධිෂ්ඨානය මෛත්‍රිය යන සියල්ල සියලු සතුන් කෙරෙහි මැදිහත් බව ඇති කල්හිම සම්පූර්ණ වේ. ඔබ ද සියලු සතුන් කෙරෙහි සමසිත් ඇතිව උපේක්ෂා පාරමිතාව පුරව. ධන අංග ජීවිතවලට උපකාරයෙහි ද, අපකාරයෙහි ද, මැදහත්ව තෙවැදෑරුම් උපේක්ෂා පාරමිතාව පුරා සම්මා සම්බෝධියට පැමිණෙව යි අවවාද කළහ.

මෙසේ මහසත්හු මේ පාරමිතා සියලු බෝසතුන්ට සම සාධාරණයයි මෙනෙහි කොට පරිපූරණය සඳහා දැඩිව සමාදන්ව නොපසු බස්නා වීර්‍ය්‍යයෙහි පිහිටියහ. ඉක්බිති බෝධි කාරක ධර්මයන් සිහි කරන උන්වහන්සේට ස්වභාව - රස - ලක්ෂණ ධර්ම තේජසින්

මේ සත බොල් මහපොළොව කම්පා විය. මහා පෘථිවිය උදුරන්නාක් මෙන් සැලෙයි. රැව් දෙයි. තෙල් යන්ත්‍රයක චක්‍රය මෙන් මහ පොළොව කම්පා වෙයි.

නිපුණ ශිල්පියෙක් නූලෙන් නූල කුල කිලකාදියෙහි බහාලන දැවමුවා යන්ත්‍රයක් මෙන් අනේකාකාරයෙන් ජොළොව කම්පා වෙයි. නාද කරයි. කම්පාවෙන් බොල් පොළොව කැළඹෙයි. පස්වනක් මල් වැසි වසී. දෙව්මිනිස් තූර්‍ය වාදනය වෙයි. දසදහස් සක්වළ වැසි දෙවියෝ නානා ප්‍රකාර ස්තුති වචන සාධුකාර පවත්වති. දහසක් ප්‍රාතිහාර්‍ය පහළ විය. දෙවියන් විසින් ස්තුති කරන ලද බෝසත්හු මම දස පැරුම් පුරා බුදුවෙමි. සාරාසංඛ්‍ය කප් ලක්ෂයකින් මත්තෙහි ලබන බුදුබව හෙට ලැබෙන්නාක් මෙන් සිතමින් සතුටු සොම්නසින් අසුනින් නැගිට සෘද්ධියෙන් අහසට නැග හිමවතට ගියහ. උන්වහන්සේ ආයු ඇති තාක් එහි සිට බඹලොව ගියහ.

දීපංකර සම්මා සම්බුදුරජාණන් වහන්සේ ද වසර ලක්ෂයක් ආයු ඇති ලොව ඉපිද, සියලු බුදුකිස නිමවා

> සද්ධර්මය බබුළුවා මහජනයා සසරින් එතෙර කොට ගිනි කඳක් මෙන් දිලී ශ්‍රාවකයන් සහිතව පිරිනිවිසේක. දීපංකර බුදුන්ගෙන් පසුව කොණ්ඩඤ්ඤ නම් නායකයාණෝ පහළ වූහ. උන්වහන්සේලා අතර කාලය කප් ගණනින් අසංඛ්‍ය වේ.

දීපංකර සම්බුද්ධයන් වහන්සේ පිරිනිවීමෙන් පසු උන්වහන්සේගේ සසුනත් අතුරුදන් වූ කල්හි දිගුකලක් ගෙවීමෙන් ඒ කල්පය අතුරුදන් විය. එතැන් පටන් අසංඛ්‍ය කල්ප අනූවක් බුද්ධ සූර්‍යයා රහිත ඤාණාලෝකය පහ වූ අවිද්‍යා අන්ධකාරයෙන් වැසුණු කෙලෙස් කිලුටින් කෙලෙසුණු දෘෂ්ටිජාල විසිරුණු සේල නම් අසංඛ්‍යයක් විය. එය ගතවූ පසු එක් සාර කල්පයක කොණ්ඩඤ්ඤ නම් ලෝක නායකයාණෝ ලොව උපන්හ. උන්වහන්සේ ද, සෝළසාසංඛ්‍ය කප් ලක්ෂයක් පාරමී පුරා ත්‍රිවිධ අකුසල් නැසීම පිණිස බලවත් උත්සාහයෙන් බෝධිඤාණ සපුරා වෙසකුරු බැව්හි පාරමී

පරතෙර පත්ව තුසිත පුරයෙහි උපන්හ. එහි ආයු ඇති තාක් සිට බුද්ධෝත්පාදය කැමැති දෙවියන්ට ප්‍රතිඥා දී තෙවැදෑරුම් අධිෂ්ඨානයෙන් මනා සිහිනුවණින් තුසී පුරයෙන් චුතව රම්මවතී නම් රාජධානි නගරයෙහි සුනන්ද මහ රජු නිසා සුජාතා දේවියගේ කුස පිළිසිඳ ගත්හ.

එකෙණෙහි දස සහස්‍රීලෝක ධාතුව හාත්පසින් කම්පා වෙමින් අනේක ප්‍රකාර ප්‍රාතිහාර්‍ය්‍ය පහළ විය. උන්වහන්සේ දෙවියන් විසින් කරන ලද ආරක්ෂා සංවිධාන ඇතිව දස මස ඇවෑමෙන් සුනන්ද උයනෙහි මව්කුසින් නික්මුණහ. එදින ද පොළොව කම්පා වීම් ආදි විවිධ ප්‍රාතිහාර්‍ය්‍ය සිදුවිය. පස්වෙනි දින හිසෙහි නැහැවූ කුමාරයාට නම් තබන්නාහු ගෝත්‍ර වශයෙන් කොණ්ඩයයි නම් තැබූහ. උන්වහන්සේ දස දහසක් අවුරුදු ගිහිගෙයි විසූහ. සුචි, සුරුචි, සුභ යයි ප්‍රාසාද තුනක් විය .එහි තුන් ලක්ෂයක් නළඟනෝ උවටැන් කළහ. අගමෙහෙසිය රුචි දේවි නම් වූවාය. උන්වහන්සේ විජිත සේන නම් පුතු උපන් කල්හි ආජඤ්ඤ රථයකින් මහබිනික්මන් කොට පැවිදි වූහ. පැවිදි වූ කොණ්ඩඤ්ඤ නායකයාණන් සමඟ කෙළ දහසක් ජනයා පැවිදි වූහ. ඔවුන් පිරිවැරූ උන්වහන්සේ දසමසක් ප්‍රධන් චරියාවෙහි හැසිර වෙසක් පොහෝ දින සුරින්ද ගමෙහි යශෝධරා නම් සිටු දියණිය දුන් අල්පෝදක කිරිබත වළඳා දාවල සල් වෙනෙහි කල්ගෙවා සවස සමූහයා අත හැර සුචන්දක ආජීවක විසින් දෙන ලද අට තණමිට ගෙන බෝධිය තෙවරක් පැදකුණු කොට ඊසාන දික්හි සිට අටපනස් රියන් කොට විසුරුවා එහි පර්යංකයෙන් චතුරංගික වීර්‍ය්‍ය අධිෂ්ඨාන කොට මාරබල පරදවා තුන් යාමයෙහි ත්‍රිවිද්‍යාව උපදවා තඹවන් අරුණෝදයෙහි සතිස් කෝටි දහසක් මහා වජ්‍රඥාන ලබා සර්ව්ඥතාඥානය ප්‍රතිවේධ කළහ. එහෙයින් කීහ.

> දීපංකර බුදුන්ට අනතුරුව අනන්ත තෙද ඇති අපමණ යසස් ඇති දුරාසද වූ කොණ්ඩඤ්ඤ නම් නායකයාණෝ පහළ වූහ.

එහි අනන්ත තේජෝ යනු, ගුණ සීල තේජසින් යටින් අවීචිය උඩින් භවාග්‍රය සරසින් අනන්ත ලොව එක ද සත්වයෙක් සෘජුව බලා සිටීමට සමර්ථ නොවේ. එබැවින් අනන්ත තේජ යයි කියැවේ. අමිත යසො යනු, අපරිමිත පිරිවර ඇති බැවින් අමිත ගුණ සම්පතින් සපිරි හෙයින් ඒ භාග්‍යවතුන් වහන්සේගේ ගුණ වර්ණ ලක්ෂයක් පළමු සිතෙහි පටන් දිවිහිමියෙන් ගණනක් නැති පිරිස් දිවා රෑ ගුණ කීවද අපමණ වන හෙයින් අමිතයසයි කියැවේ. අප්පමෙය්‍යො යනු, ගුණයෙන් අපමණ වෙති. ඉදින් එම භාග්‍යවතුන් වහන්සේගේ ගුණ කීමට උත්සුකව, මේ දසසහස්‍රී ලෝක ධාතුවල කඳු පර්වත පහව එකම තලියක් මෙන්වී සහස්‍රී මහාසහස්‍රී ලෝක ධාතුවල සියලු සත්වයෝ එක්ව නොකඩවා වර්ණ ලක්ෂයක් කියත් නමුත් ඒ අමිත තථාගත ගුණ නොනිමෙයි. භගවත් ගුණ නිම කිරීමට නොහැකි වෙයි. එහෙයින් අප්පමෙය්‍යො කියා කියැවෙයි. දුරාසදො යනු, ලැගීමට හෝ ගැටීමට නොහැක්කේය.

> ඉවසීමෙන් පොළොව හා සමානය. සීලයෙන් සාගරය හා සමානය. සමාධියෙන් මහමෙර හා සමානය. ඤාණයෙන් අහස හා සමානය.

එහි ධරණූපමො ච බහමණෙන යනු, දෙලක්ෂ සතලිස් දහසක් යොදුන් ඝන පොළොව මෙන් අකම්පනීය වෙති. අකම්පනීයත්වයෙන් ධරණුපම වෙති. සීලෙන සාගරූපමො යනු, චතුපාරිශුද්ධි සීලයෙන් අසූහාරදහසක් යොදුන් ගැඹුරු මුහුදු හා සමානය. සමාධිනා මේරූපමෝ යනු, උපචාර අර්පණා සමාධි වශයෙන් යථා පරිදි විතර්කාදි සුළඟින් කම්පාවක් නොවන බැවින් අසූහාර දහස් අටසැට යොදුන් උසැති මහමෙර මෙන් ධීරත්වයෙන් යුක්තය. ඤාණෙන ගගනූපමෝ යනු, අසාධාරණ වෛශාරද්‍ය අපරිමිත ඤාණයෙන් අහස හා සමානය යන අර්ථයි. මෙසේ මහ ගුණ සම්පන්න කොණ්ඩඤ්ඤ භාග්‍යවතුන් වහන්සේ සකල ලෝකානුකම්පාවෙන් භික්ෂු සංඝයා සමඟ ගම් නියම්ගම් ජනපද රාජධානිවල චාරිකාවෙහි වැඩි සේක.

එසමයෙහි අප බෝසත්හු මධ්‍යම දේශයෙහි චන්දවතී නම් රාජධානී මහානගරයෙහි විජිතාවී නම් රජව වාසය කරති. සියලු දඹදිව රජවරු ඔහුම අනුගමනය කරන්නාහ. හෙතෙම ඔවුන් පිරිවරා මුහුද කෙළවර කොට ඇති සමතල සුන්දර මහාරාජ්‍යය පාලනය කරයි. කෝටි ලක්ෂයක් රහතන් පිරිවැරූ කොණ්ඩඤ්ඤ බුදුහු පිළිවෙළින් චාරිකා කරමින් චන්දවතී නගරයට පැමිණියහ. විජිතාවී රජ සැහැල්ලු සිතින් දීප ධූප ගන්ධ මාලාදිය ගෙන රජ පිරිස් පිරිවරා බුදුන්ට පෙර ගමන් කළේය. එවිට ඔහු දුරදීම උදාගිරි මුදුන් ගත ළහිරු මඩල මෙන් බබළන බුදුන් දුටුවේය. ඒ කොණ්ඩඤ්ඤ භාග්‍යවතුන් වහන්සේගේ රූපකාය අසූ අටරියන් උසය. දෙතිස් මහපුරිස් ලකුණු අසූවක් අනුව්‍යඤ්ජනයෙන් සැදුණේය. අසූරියන් බ්‍යාමප්‍රභාවෙන් බබළන උන්වහන්සේ දැක පෙර ඇසුර නිසා බුදුන් කෙරෙහි කුකුස් රහිතව සතුටුව බුදු සිරිපා මුල සිරසින් වැඳ අටමහා පානයෙන් භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් වහන්සේලා සහිතව සතප්වා දීප ධූප ගන්ධ මාලාදියෙන් පුදා පසෙක හුන්නේය.

ඉක්බිති කොණ්ඩඤ්ඤ ලෝක නායකයාණෝ ඔහුට පාන-කානිසංස යුත් දැහැමි කතා දැක්වූහ. දැහැමි කථා දැක්වීමෙන් වඩාත් වැඩුණු ශ්‍රද්ධාවෙන් "ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස, මාගේ හෙට දන් පිණිස භික්ෂු සංඝයා වහන්සේ සමඟ ඉවසන සේක්වායි සෙට දිනට ආරාධනා කළේය. භාග්‍යවතුන් වහන්සේ තූෂ්ණීම්භාවයෙන් ඉවසූ සේක. භාග්‍යවතුන් වහන්සේගේ පිළිගැනීම දත් හෙතෙම පසඟ පිහිටුවා වැඳ නුවරට ගියේ ය. පසු දින නානා ප්‍රකාර සූපව්‍යඤ්ජන සහිත ප්‍රණීත උතුම් බොජුන් පිළියෙළ කොට බුද්ධප්‍රමුඛ භික්ෂු සංඝයා දන් වළඳවා "ස්වාමීනි, ඔබවහන්සේ මට අනු-කම්පාවෙන් තෙමසක් මෙහිම වසන සේක්වායි ආරාධනා කළේය. බුදුහු ඔහුගේ ආරාධනය පිළිගත්හ. බුද්ධානුකම්පාව ලත් රජ තෙමසක් තමා මහත් උත්සාහයෙන් සම්පාදිත දන් පැන් නොකඩවා පිදීය. කොණ්ඩඤ්ඤ බුදුහු විජිතාවී රජුගේ හේතු සම්පත් දැක ඔහු උත්සාහවත් කරවමින් දෙව් මිනිසුන් මැද "මෙයින් තෙයා සංඛ්‍ය

කප් ලක්ෂයකින් මත්තෙහි මෙතෙම ගෝතම නම් බුදු වන්නේ ය"යි ප්‍රකාශ කළහ. රජ භාග්‍යවතුන් වහන්සේගේ විවරණය අසා හටගත් බලවත් සොම්නසින් මුළු දඹදිව රාජ්‍යය භාග්‍යවතුන් වහන්සේට පුදා පැවිදි විය.

පැවිදිව තුන් පිටකය ඉගෙන පඤ්ඤාභිඥා අෂ්ටසමාපත්ති උපදවා නොපිරිහුණු ධ්‍යානයෙන් මිය බඹලොව උපන්නේ ය. කොණ්ඩඤ්ඤ සම්මා සම්බුද්ධයන් වහන්සේ වස් ලක්ෂයක් වූ ලොව ඉපිද චන්දාරාමයෙහි දී පිරිනිවන් පෑහ. පිරිනිවි කල්හි ධාතු නොවිසුරුණේය. දෙව් මිනිස්හු රැස්ව සත් යොදුනක් සප්ත රත්නමය චෛත්‍යයක් කළහ.

කොණ්ඩඤ්ඤ බුදුන්ට අනතුරුව මංගල නම් නායකයන් වහන්සේ උපන්හ. උන්වහන්සේලා අතර කාලය අසංඛ්‍යය.

කොණ්ඩඤ්ඤ බුදුන් පිරිනිවි කල්හි උන්වහන්සේගේ සසුන වෂී දහසක් පැවැත්තේ ය. බුද්ධානුබුද්ධ ශ්‍රාවකයන්ගේ පිරිනිවීමෙන් සසුන අතුරුදන් වූ පසු කල් ගතවීමෙන් ඒ කල්පයත් අතුරුදහන් වූ පසු එතැන් සිට එක් අසංඛ්‍යයක් ලොව බුදුවරු නූපන්හ. එය හාස නම් විය. එම අසංඛ්‍යය ගිය කල අන්තර කල්පය පහළ විය. අන්තර කල්පය ගෙවුණු පසු ආයු පරිවර්තනානුක්‍රමයෙන් අසංඛ්‍ය ආයු පිරිහී හැට දහසක් අවුරුදු වූ කල්හි එක් වරකල්පයක මංගල, සුමන, රේවත, සෝභිත යයි සතර බුදු කෙනෙක් පහළ වූහ. එයින් මංගල බුදුහු සෝළසාසංඛ්‍ය කප් ලක්ෂයක් පෙරුම් පුරා තුසී පුර ඉපිද දෙවියන් විසින් බුදුබව සඳහා ආරාධනා කරන ලදුව පස් බැලුම් බලා තුසී පුරයෙන් සැව දඹදිව මධ්‍යම දේශයෙහි උත්තර නුවර උත්තර මහරජු නිසා උත්තරා දේවිය කුස පිළිසිඳ උපන්හ.

එකල්හි දසසහස්‍රී ලෝකධාතු කම්පනාදි නොයෙක් පෙළහර විය. මහාපුරුෂයන්ගේ පිළිසිඳ ගැනීමේ පටන් උත්තරා දේවියගේ ශරීරාලෝකය දිවාරෑ නිතොර අසූරියනක් පමණ සඳහිරු එලියෙන් වත් නොමැඩිය හැකි සේ ප්‍රසන්නව පැවැත්තේ ය. ඕ තොමෝ

වෙනත් ආලෝකයක් නැතිව තම ශරීරාලොකයෙන්ම අඳුර නසා අටසැටක් කිරි මව්වරුන් පිරිවරන ලදුව දේව සමූහයා විසින් කරන ලද ආරක්ෂා ඇතිව මහත් ගබ් පෙරහරින් යුතුව වාසය කළාය. දසමස් ඇවෑමෙන් උත්තරවන උයන්හි මහාපුරුෂයා වැදුවාය. මහාපුරුෂයන් උපන් කෙණෙහිම ලෝකයා විසින් පිළිගනු ලැබ රන්පත් මත සත්තපද වීතිහාරයෙන් ගොස් දස දෙස බලා තමා වැනි කිසිවෙකු නොදැක මම ජ්‍යෙෂ්ඨ වෙමි. මම ශ්‍රේෂ්ඨ වෙමි. මම අග්‍ර වෙමියි සිංහ නාද කළහ. එකෙණෙහි දඹදිව බූමාටු දෙවියෝ දෘශ්‍යමානකයින් සොඳුරු අලංකාරයෙන් සැරසී නුවර දොරටුවල ජයමංගල ස්තුති පැවැත්වූහ. නිමිතිදත් බමුණෝ මහාපුරුෂයාණන්ට නම් තබන්නාහු සප්ත මංගල සම්මුතියෙන් උපන් බැවින් මංගල කුමාරයයි නම් තැබූහ. උන්වහන්සේට යසවා, සුවිමා, සිරිමා නම් තුන් පහයක් විය. යසවතී දේවිය ප්‍රමුඛ තිස්දහසක් නළඟනෝ උවටැන් කළහ. උන්වහන්සේ එහි නවවස් දහසක් විෂය රස විඳිමින් යසවතී දේවිය සමඟ සීවක නම් පුතු උපදවා සතර නිමිති දැක සැරසී පණ්ඩර නුම් අසුපිට නැග මහපිරිවර සමඟ මහබිනික්මන් නික්ම පැවිදි වූහ.

පැවිදි වූ උන්වහන්සේ අනුව තිස්කෙළක් ජනයා පැවිදි වූහ. ඔවුන් පිරිවරන ලද මහාපුරුෂයාණෝ අටමසක් ප්‍රධන් වීර්‍යය වඩා වෙසක් පොහෝ දින උත්තර ගම උත්තරා සිටුදුව පිදූ දෙවියන් දිව ඔජස් බහාලූ කිරිබත වළඳා සල් වෙනෙහි දිවා විහාර කොට එතනින් නික්ම අතරමඟ උත්තරාජීවකයන් දුන් අට තණමිට ගෙන දකුණින් නා රුක් බෝධිය වෙත පැමිණ තෙවරක් පැදකුණු කොට ඊසාන දිග සිට අටපනස් රියන් තණ ඇතිරි අතුරා ත්‍රිසන්ධි පර්යංකය වැළඳ චතුරංග සමන්නාගත වීර්‍යය වඩා මාරබල නසා ප්‍රත්‍යයාකාරය ප්‍රතිවේධ කොට සර්වඥතාඥානය ලත් සේක.

> කොණ්ඩඤ්ඤ බුදුන්ට පසුව මංගල නම් නායකයාණෝ ලොව අවිදු අඳුර නසා දහම් පහන දැල්වූහ. උන්වහන්සේගේ ප්‍රභාව අනිකුත් ජිනයන් වහන්සේලාට වඩා වැඩිය. අසම ය.

ඉරහඳ එලිය යටපත් කොට දසසහස්‍රී ලෝකධාතුව බබළන්-නේය.

සෙසු සම්බුදුවරුන්ට වඩා අතිරේකතර ශරීර ප්‍රභාවක් මංගල සම්බුදුන් වහන්සේට විය. නිතොර රැ දාවල්හි දසදහසක් සක්වළ පැතිර සිටී. කවර කම් ඵලයකින් අතිරේකතර ප්‍රභාවක් ලබන ලද ද? පළමු භවයෙහි තමන් විසින්ම කරන ලද කුසල බලයෙනි. උන්වහන්සේ බෝසත් කල දීපංකර සම්මා සම්බුදුන්ගේ දොළොස් යොදුන් සත්රුවන් සහිත චෛත්‍යය නැමද මුහුදු අවසන් කොට ඇති දඹදිව ප්‍රදීපයෙන් නිතොර කොට තෙමේ තමා වස්ත්‍රයෙන් වෙළා තෙල් ඉස දැල්වීය. වැටි දහසක් තබා තෙලින් පුරවා රත් බඳුනෙහි දල්වා හිසෙහි තබා අරුණෝදය තෙක් මුළු රැය මහසෑය ප්‍රදක්ෂිණා කළේය. නමුත් ශ්‍රද්ධා බලයෙන් උන්වහන්සේට උණුසුමක් වත් නොවිය. දුක්ඛ වේදනාවක් කෙසේ නම් උපදීද? අමෘතාභිෂේක කළාක් මෙන් අලුයම් කල ශරීරය මෙන් සියුම් පිවිතුරු රෙදි පෙරවී සීත උෂ්ණ රහිත සුවපහසුව ඇති විය. අසම ශ්‍රද්ධා ප්‍රීතියෙන් සිහිල් දිය නිති යොදන්නාක් මෙන් හදවත සිසිල් විය. මේ කුසල කම් ඵලයෙන් මෙවන් ආලෝකයක් ලබන ලද්දේ ය.

තව ද පෙර පැතුම් වශයෙන් උන්වහන්සේ සියලු පෙරුම් පුරා වෙස්සන්තර සමාන අත් බැව්හි සිට වංක පර්වතය වැනි පර්වතයක අඹු දරුවන් සමඟ වාසය කළහ. එකල බමුණු වෙස් දැරූ කරදාඨික නම් යකෙක් උන්වහන්සේගෙන් දෙදරුවන් ඉල්ලීය. උන්වහන්සේ ඔහුගේ වචනයෙන් අනතුරුව පිළිවදන් දී අසුනින් නැගිට පැන් පිරූ කෙණ්ඩිය ගෙන දරු සෙනහසට අවිරුද්ධව පළමුව ස්නේහ අත සිඳ යාචකයාට සත්කාර කිරීම පිණිස කරුණා බහුලව දෙමී සිතා සතුටු සිතින් සයුරු කෙළවර කොට ඇති පොළොව කම්පා කරවමින් ආවර්ජනා කොට බමුණාගේ අතට දරුවන් පිදීය. කරදාඨික යක්ෂයා දරුවන් ලැබීමත් සමඟම බමුණු වෙස හැර ගිනිදැල් වැනි පිඟුවන් ඇස් අතිවම විසම විරූප කුරිරු දිග දත් ඇතිව තඹවන් කෙස් වැටි ඇතිව බිදුණු හනු ඇතිව එල්ලෙන

විසම කළු උදරයෙන් යුතුව විසම විරූප රූපයෙන් බොහෝ දිනක් බඩසයින් සිට දෙදරුවන් ගෙන මහාසත්ත්වයන් බල බලා සිටියදීම සක්මන කෙළවර ආලම්බන ඵලකය නිසා සිට වන මුල් කළඹක් කන්නා සේ ඇට කෙළවර කොට කා දැමීය. එවිට ඔහුගේ කටින් යන්ත්‍රයක අසුවුණාක් මෙන් රුධිරධාරා නික්මිණ. ඒ දැක බෝසතුන්ට දොම්නස් මාත්‍රයක් වත් නොවීය. කෙසේ නම් උන්වහන්සේට විපිළිසරක් වන්නේ ද? තමන් වහන්සේට ඒ දානය සිහි කරත් සිහි කරත් බලවත් ප්‍රීතියම හටගත්තේය.

එවිට උන්වහන්සේට "මේ යක්ෂයාගෙන් මේ ලේ දහරා නික්මෙන්නාක් මෙන් බුදු වූ මාගේ ශරීරයෙනුත් දසදහසක් සක්වළ පැතිර අතරක් නැතිව රැස් නික්මේවායි" සිත් විය .ඒ දාන, පූර්වංගම පැතුමින් මෙබඳු ආලෝකයක් විය. බුදු බව ලත් මංගල සම්මා සම්බුදුහු දම්සක් පවත්වා සියලු විනෙදනන්ට අනුකම්පා පිණිස කෝටි ලක්ෂයක් රහතුන් පිරිවරා ගමින් ගම පුරයෙන් පුරය චාරිකා කළ සේක. එකල අප බෝසත්හු සිරි නම් බමුණුගම සුරුචි නම් ආචාර්‍යවිව මන්ත්‍රධර නිඝණ්ඩු කේටුභ සහිත අක්ෂර ප්‍රභේදයන්හි ද ඉතිහාසය පස්වෙනි කොට ඇති ශාස්ත්‍ර පාරගත පද දත් වියරණ දත් ලෝකායත ශාස්ත්‍රයන්හි හා මහාපුරුෂ ලක්ෂණයන්හි අනින්දිතව අපමණ සම්පත් ඇති ත්‍රිවේද පාරගත බමුණුව වාසය කරති.

මහාමංගල සම්බුද්ධයන් වහන්සේ ඔහුගේ නිවාස ග්‍රාමයට වැඩි සේක. එවිට සුරුචි බ්‍රාහ්මණ තෙම බොහෝ තරුණයන් සිය ගණනක් පෙරටු කොට භාග්‍යවතුන් වහන්සේ වෙත ගොස් අසූඅට රියන් උස රශ්මියෙන් බබළන සකල ශරීරයෙහි විසිරුණු මහාපුරුෂ ලක්ෂණ ඇති භාග්‍යවතුන් වහන්සේ දුටුවේය. දැකීම් පමණකින්ම පැහැද සක් ලකුණු සැදි බුදුසිරිපා මුල සිරසින් වැඳ වැටුණේය. වැඳ පසෙක වාඩි විය. එවිට බුදුහු ඔහුට අනුරූප දහම් දෙසූහ. හෙතෙම බුදුන්ගේ මිහිරි බණ අසා ශ්‍රද්ධා උපදවා බුදුසරණ ගොස් දීප ධූප ගන්ධ මාලායෙන් පුදා සෙට දින දනට ආරාධනා කළේය. එවිට භාග්‍යවතුන් වහන්සේ බමුණ, ඔබට කෙතෙක් භික්ෂූන් අවශ්‍ය

දැයි විමසූහ. ස්වාමීනි, භික්ෂු පිරිවර කෙතෙක් ද? බමුණ, කෙළ ලක්ෂයකි. ස්වාමීනි, සියල්ලන් වහන්සේ සමගිනි. බුදුහු තුෂ්ණීම් භාවයෙන් ඉවසූහ.

හෙතෙම බික්සඟන සහිත භාග්‍යවතුන් වහන්සේට ආරාධනා කොට ගෙට යමින් අතර මඟ "මහ යසස ඉමිහත්ය, භාග්‍යවතුන් වහන්සේ මහාපිරිවර සහිත වෙති. කෙළ ලක්ෂයක් පිරිවරට ආරාධනා කළෙමි. මාගේ ගෙයි සහල් මුං මෑ ආදියෙහි ද කිරි, දී, ගිතෙල්, මී පැණි, හකුරු, ලුණු ආදියෙහි ද ප්‍රමාණයක් නැත. මේ බුද්ධ ප්‍රමුඛ භික්ෂු සංඝයාට හිදින තැන් නැත. කුමක් කරන්නෙම් දැ"යි සිතීය. චින්තාපරවස විය. සිතත් සමඟින් අසූහාරදහසක් යොදුන් උස සිනෙරු මුදුනෙහි වූ පරසතු රුක් මුල් හි පිහිටි බඳුවද අශෝක ආදි අතිරේක කුසුමින් යුත් පනස් නව යොදුන් දික් ශක්‍රාසනය වූ පණ්ඩුකම්බල සිලාසනය ගින්නෙන් තවන ලද්දාක් මෙන් උණුසුම් විය. එවිට ශක්‍රයා කවරෙක් නම් මා මෙතැනින් පහ කරනු කැමැත්තේ දැයි දිවැසින් බලන්නේ ඒ බෝසතුන් දුටුවේය. සුරුචි බ්‍රාහ්මණ බුද්ධප්‍රමුඛ භික්ෂුසංඝයාහට ආරාධනා කොට හිදිනා තැන් පිණිස සිතයි. මා එහි ගොස් පින් කොටසක් ලබාගත යුතු යැයි වඩු වෙස් ගෙන වෑ පොරෝ නියං ආදිය සහිතව සුරුචි බ්‍රාහ්මණ ඉදිරියේ පෙනී සිටියේ ය. කාට හෝ කළ යුතු බැලයක් ඇද්දැයි ඇසීය. තෝ කුමක් කිරීමට දන්නෙහි ද? මා නොදන්නා ශිල්පයක් නම් නැත. ඉදින් චේතන දිය හැකි නම් ඔබ කැමැති දෙයක් කළ හැකි වෙමියි කීය.

දරුව, එසේ නම් මා විසින් කෙළලක්ෂයක් පිරිවර ඇති භාග්‍යවතුන් වහන්සේට හෙට දනට ආරාධනා කරන ලදි. ඒ බුදු පිරිවර වැළඳවීම සඳහා මහාමණ්ඩපයක් අවශ්‍යය. තෝම කරවයි කීය. මහාබ්‍රාහ්මණය, මැනවැයි ඔහුගේ කීම පිළිගෙන ශක්‍රයා තෙලෙස් යොදුන් ප්‍රමාණ බිම් පෙදෙසක් බැලීය. බැලීමත් සමගම ඒ බිම්පෙදෙස බෙරතලයක් මෙන් සමතල විය. එකල ඔහු සිය සෘද්ධි බලයෙන් මෙහි සත්රුවන්මුවා මණ්ඩපයයි අධිෂ්ඨාන කළේය.

එවිටම පොළොව පළාගෙන සත්රුවන්මුවා මහමඩුව පහළ විය. ඒ මඩුව තෙලෙස් යොදුන් පමණය. සත් රුවන්මුවාය. ටැම් රන් මුවා ය. කිකිණි දැලින් වටකරන ලද්දේය. සුළඟින් ලෙලෙන දැලින් මිහිරි පසතුරුගොස උපදී. ඒ ඒ තැන භික්ෂූන්ට ආසනාදිය පනවා බෝසතුන් වෙත ගොස් "ආර්යය, බැලූව මැනැවැයි" කීය. ඔහු ගොස් බලා ආශ්චර්‍ය්‍ය අද්භූත විස්මයට පත් පස්වනක් ප්‍රීතියෙන් පිනා ගිය සිරුරින් මෙවැන්නක් මිනිසෙකුට නම් නොකළ හැකිය. නිසැකයෙන් මාගේ අදහස් බෙලෙන් ශක්‍රයාගේ පඬු ඇඹුල් සලසුන උණුවන්නට ඇත. ඒ බව දැන සක් දෙව්රද මට අනුග්‍රහ පිණිස කාය සාක්ෂි වශයෙන් ආයේ වන. ඔහු විසින් මේ මණ්ඩපය කරන ලද්දේ යැයි සිතීය.

මෙවැනි මණ්ඩපයක එක දවසක් පමණක් දන්දීම මට නොගැළපේ. දැන් මම සතියක් දෙමියි දෙවැනි දින පිරිවර ජනයා රැස් කොට නොයෙක් ලක්ෂ ගණන් මහමහ හැළි කිරෙන් පුරවා ළිප තබා පැසවූ හකුරු දියෙහි පැසවූ කිරි සහල් බහා පැසුණු හකුරු ගිතෙල්[1] යොදා මුසුකොට ඒ මඩුවෙහි බුද්ධ ප්‍රමුඛ භික්ෂු සංඝයා වඩා හිඳුවා ගවපාක නම් දානයක් පිදීය. එදින මිනිසුන්ට පමණක් වැළඳවිය නොහැකිවිය.

දෙවියෝ ද එකතුව වැළඳවූහ. සත්වන දින සියලු භික්ෂූන්ගේ පාත්‍ර සෝදා බෙහෙත් පිණිස ගිතෙල් මෝරු තෙල් මී පැණි පුදා තුන්සිවුරු ද පුද කළේය. මහාමංගල සම්මා සම්බුදුහු ඔහුට දානානුමෝදනා කරමින් "මේ පුද්ගලයා මෙබඳු දන් දී කවරෙක් නම් වන්නේ දැයි බලන්නේ අනාගතයෙහි දෙයාසංඛ්‍ය කප් ලක්ෂයක් කෙළවර ගෝතම නම් බුදුවන්නේ යැයි දැක දෙව් මිනිස් ගණ මැද සුරුචි බ්‍රාහ්මණයන් අමතා මහාබ්‍රාහ්මණය, ඔබ මෙයින් දෙයාසංඛ්‍ය කල්ප ලක්ෂයකින් මතු අනාගතයෙහි මෙපමණ කලක් ගෙවා ගෝතම නම් බුදුවන්නෙහියයි ප්‍රකාශ කළ සේක.

හෙතෙම විවරණය අසා හටගත් සොම්නසින් "මම බුදුවෙමි. මට ගෘහවාසයෙන් කවර අර්ථයක් ද ශාස්තෘන් වහන්සේගේ

සමීපයෙහිම පැවිදිවෙමි"යි සිතා එබඳු මහාසම්පත් කෙළ පිඩක් මෙන් අතහැර සසුන්හි පැවිදි විය. පැවිදිව ත්‍රිපිටක බුද්ධවචනය ඉගෙන සද්ධර්මරත්නයට පුදා පංචාභිඥා අෂ්ටසමාපත්ති උපදවා බඹලොව උපන්නේය.

> මහා මංගල සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ දහම් ප්‍රදීපය දල්වා මහජනයා සනසා ධූම කේතුවක් සේ දිලිසී ඒ මහා යසස්වීන් වහන්සේ පිරිනිවි සේක.

මංගල බුදුහු අනූලක්ෂයක් හවුරුදු ලොව සිට පිරිනිවි කල්හි දස දහසක් සක්වළ එසැණින් අඳුරු විය. උන්වහන්සේගේ සසුන පිරිහුණු කල්හි මිනිසුන්ගේ අනූලක්ෂයක් ආයු කෙමෙන් පිරිහී දසවස් ආයු වීමෙන් පසු අන්තර කල්පයක් ඇතිවිය. එය ද ගෙවී කෙමෙන් වැඩී අසංඛ්‍යායුෂ්ක විය. එය පිරිහී අනූදහසක් අවුරුදු වූ කල සුමන බුදුහු ලොව උපන්හ. උන්වහන්සේ සොළසාසංඛ්‍ය කප් ලක්ෂයක් පෙරුම්දම් පුරා මේබලා නුවර සුදත්ත මහරජු නිසා සිරිමා දේවිය කුස පිළිසිඳ ගත්හ.

එකල්හි ද කියන ලද ආකාරයේ නන් පෙළහර විය. දසමස් ඇවෑමෙන් උයන්හිදී මවු කුසින් බිහිවිය. එවේලෙහි සියලු සතුන් මත අහසින් සමන් මල් වැසි වැටුණේය. උන්වහන්සේට නම් තැබූ බමුණුවරු සුමන කුමාර කියාම නම් තැබූහ. සුමන බෝසත්හු නව දහසක් අවුරුදු ගිහිගෙයි වසූහ. චන්ද, සුවන්ද, වතංස නම් තුන් පහයක් උන්වහන්සේට විය. පතණ්ඩිකා නම් රජකුමරිය අග මෙහෙසි වූවාය. තෙසැට දහසක් නළඟනෝ උවටැන් කළාහ. උන්වහන්සේ ඔවුන් සමඟ විෂය රස විඳ පතණ්ඩිකා දේවිය සමඟ අනෝපම නම් පුතු උපදවා සතර නිමිති දැක උතුම් ඇත් යානයකින් මහබිනික්මන් කොට පැවිදි වූහ.

උන්වහන්සේ අනුව තිස්කෙළක් මිනිස්සු පැවිදි වූහ. උන්-වහන්සේ ඔවුන් පිරිවරා දසමසක් වීර්යය කොට වෙසක් පොහෝ දින ගණයා හැර අනෝපම නියම්ගම අනෝපම සිටු දියණිය දෙන

ලද දිව ඔජස් බහාලූ දිව කිරිබත් වළඳා සල් වෙනෙහි දිවා විහාර කොට සවස්හි අනුපම ආජීවකයා දුන් අට තණමිට ගෙන දකුණින් නාරුක් බෝධිය වෙත පැමිණ තෙවරක් පැදකුණු කොට ඊසාන දික්හිම සිට තිස්රියන් පුළුල් තණ ඇතිරිය අතුරා පලක් බැඳ චතුරංගික වීර්‍යය ඉටා මාරබල නසා බුදුබව ලැබූහ. එදින ද අසිරිමත් මහාසමන්මල්වැසි වැස්සේය. පිළිසිඳ ගැනීම, උපත, බුදුවීම, යන අවස්ථාවන්හිදී සමන්මල් වැසි වට හෙයින් සුමන නම් වූ සේක.

උන් වහන්සේ බ්‍රහ්මාරාධනය පිළිගෙන කාහට පළමු දම් දෙසන්නෙම් දැයි සලකා සිය සුළුමව පුත් සරණ කුමරු ද පුරෝහිත පුත් භාවිත කුමරු ද දැක පාසිවුරු ගෙන රාජහංස ලීලාවෙන් මොහොතකින් මේඛලා වනයට අහසින් බැස උයන්පල්ලා යවා දෙකුමරුන් කැඳවූහ. ඔවුන්ගේ පිරිස සතිස්කෙළකි. තමන්වහන්සේ සමඟ පැවිදිවූවෝ තිස්කෙළකි. වෙනත් දෙවි මිනිසුන් ද සහිත සමාගමයෙහි ආර්යාකර දම්සක් පවත්වමින් කෙළලක්ෂයක් මිනිසුන්ට ධර්මාවබෝධ කළ සේක.

> උන්වහන්සේ එදින ධර්මචක්‍රය සහිත නවාංග ශාස්තෘශාසන නැමති අමාබෙරය මේඛලා පුරයෙහි වැයූ සේක.

අමතහේරී නම් සමථ විදර්ශනා මහාකුස ඇති සතිපට්ඨාන සමින් වසන ලද සම්‍යග් ප්‍රධාන දණ්ඩෙන් ගසන ලද සතර මග ඵල නැමති මිහිරි මහාඝෝෂා ඇති චතුස්සත්‍ය රස ලක්ෂණ යුත් අමා බෙරයයි. සත්‍ය ධර්ම දේශනා සහිතව ශාස්තෘන් වහන්සේ නවාංග ශාස්තෘ ශාසන නැමති උතුම් අමාදහම් බෙරය වැයූහ. මාපෙසි නගරං සජ්ජා සද්ධම්මපුරමුත්තමං යනු, මෙහි සද්ධම්මපුර නම් නිකෙලෙස් මහරහත්හු පැමිණෙන නිර්වාණ නම් නගරයයි.

ඉක්බිති ලෝක නායකයන් වහන්සේ උපායාසයෙන් පිඩිත කෙලෙස් සොරුන් විසින් නිතර පිඩා කරනු ලබන සුන්වූ අදහස් ඇති දුකින් පීඩිත කුසල් රැස් කිරීමක් නොමැතිව තැවෙන සක්කායවත් ලෝකයාට ආර්යඅෂ්ටාංගික මාර්ග මහකන් ඇති සමාධි

නැමති අට්ටාලයෙහි කරන ලද විදර්‍ශනා නැමති ඉඳුබීලය ද, මෛත්‍රී දිය අගල ද කරුණා සීතල ජලය ද පිරුණු පොකුණින් සමන්විත මුදිතා මල් ගැවසීගත්, උපෙක්‍ෂා සැරසිලි ඇති සත්තිස් බොධි පාක්‍ෂික ධර්මකුසල සේනා සහිත සම්බොජ්ඣංග ජනාධිපති ඇති අමාපුරවරය මැවූහ.

යමෙක් අප්‍රමාද වූවාහු හිරි, වීර්යයෙන් යුක්තයෝ නම් ඔවුහු මේ උතුම් ගුණසම්පත් සුවසේ ලබා ගනිති.

යෙ අප්පමත්තා යනු, සිහියෙන් නොවෙන්වීමේ ගුණය වූ අප්‍රමාදයෙහි පිහිටියාහු. අඛිලා යනු, රාග, දෝස, මාන, දිට්ඨි හා කෙලශ දුශ්චරිත යන හුල් වලින් රහිතයෝ යි. හිරිවිරේහුපාගතා යනු, ආධ්‍යාත්මික වරද දක්නේ හිරියයි. බාහිර මාඟ දක්නේ ඔත්තප්පයයි. කායික චෛතසික උත්සාහය වීර්‍යයයි. එම හිරි ආදියෙන් යුක්ත කුල ගෝත්‍රයෝ මේ උතුම් ගුණ සුවසේ අත්පත් කර ගනිති.

එකල අප බෝසත්හු මහත් සෘද්ධි ඇති මහානුභාව ඇති අතුල නම් නා රජ විය. එතුමා බුදුන් ලොව උපන් බව අසා සතුටු සොම්නස්ව නෑ සමූහයා පිරිවරා සුමන භාග්‍යවතුන් වහන්සේ කරා ගොස් වැඳ ආරාධනා කොට කෙළලක්‍ෂයක් භික්‍ෂු පිරිවර සහිත භාග්‍යවතුන් වහන්සේට දිව්‍ය තූර්ය උපහාර දක්වා වර්ණ, ගන්ධ, රස, ඕජා, සහිත දිව්‍ය අන්නපාන සහිත මහදන් දී බුදුන් ප්‍රධාන එක් එක් භික්‍ෂූන් වහන්සේට දිවසළු සඟළ බැගින් පුදා තිසරණ පිහිටියේ ය. සුමන බුදුහු නා රජුගේ අදහස් බලා මෙතෙම මෙයින් දෙයාසංඛ්‍ය කල්ප ලක්‍ෂයකින් මත්තෙහි ගෝතම නම් බුදු වන්නේයයි දෙවි මිනිසුන් මැද ප්‍රකාශ කළහ. විවරණ අසා පහන් සිත් ඇති නා රජ දීප, ධූප, ගන්ධ මාලාදියෙන් බුදුන් පුදා වැඳ නාග භවනයට ආපසු ගොස් මරණින් මතු දෙව් ලොව උපන්නේය.

සුමන භාග්‍යවතුන් වහන්සේ අනූදහසක් ආයු ඇති ලොව ඉපිද සූයර්‍ය නගරයේ දී පිරිනිවී සේක. ඉන් පසු ආයු පිරිහී සැට

දහසක් ආයු වූ කල රෙවත නම් බුදුහු ලොව උපන්හ. රෙවත බෝසත්හු සාරාසංඛ්‍ය කල්ප ලක්‍ෂයක් පෙරුම් පුරා තුසිපුර උපන්හ. එහි දේවාරාධනය පිළිගෙන චුතව සුධම්මවතී නුවර විපුල රජු නිසා විපුලා දේවිය කුස පිළිසිඳ ගත්හ. එකල බොහෝ පෙළහර සිදුවිය. දසමස් ගෙවා ලෝක පාලයන්ගේ ආරක්‍ෂාව ඇතිව ධඤ්ඤවන උයන්හි දී මේකුළකිත් නික්මෙන හිරු මෙන් මව් කුසින් බිහි වූහ. උපදින කල ගෙවල වීථී, සතරමං සන්ධි, අංගණාදියෙහි සත්රුවන් අබරණ වැසි වැස්සේය. එහෙයින් රෙවත යයි නම් කළහ.

උන්වහන්සේ දස දහසක් අවුරුදු ගිහි ගෙහි විසූහ. සුදස්සන, රතනග්ගි, අචෙල නම් තුන් පහයක් විය. සුදස්සන දේවිය ප්‍රමුඛ තිස් දහසක් ස්ත්‍රීහු උවටැන් කළහ. ඔවුන් සමඟ විෂය රස විඳි උන්වහන්සේ සුදස්සන දේවියට වරුණ නම් පුතු උපන් කල්හි සතර නිමිති දැක සංවේගයට පැමිණ ආජඤ්ඤ රථයකින් මහබිනික්මන් නික්මුණහ. කෙළක් ජනයා උන්වහන්සේ අනුව පැවිදි වූහ. ඔවුන් පිරිවරා සත්මසක් ප්‍රධන් වීර්යය වඩා වෙසක් පොහෝ දින ධඤ්ඤවතී නියම්ගම සුධඤ්ඤ සිටුවුවු පිදූ දිව රසමුසු පැණි කිරිබත් වළඳා සල් වෙනෙහි දාවල් දවස් ගෙවා සවස ධරණීධර ආජීවකයා දුන් අට තණමිට ගෙන දකුණින් නාරුක් බෝධිය කරා පැමිණ තෙවරක් පැදකුණු කොට ඊසාන දිග සිට තෙපනස් රියන් තණ ඇතිරිය පනවා චතුරංග වීර්‍යයෙන් පර්යංකයෙන් හිඳ නෙළුම් හුයක් සිඳින ඇතෙකු මෙන් මාර බල දිනා තුන්යම ත්‍රිවිද්‍යා සාක්ෂාත් කොට බුදුබව ලැබූහ.

රෙවත භාග්‍යවතුන් වහන්සේ දම්සක් පවත්වා ලෝහිත පිණිස චාරිකා කරමින් රම්මවතී නගරයට වැඩි සේක. අප බෝසත්හු එහි අතිදේව නම් වේදපාරගත බමුණෙක් වූහ. දෙතිසක් වර ලකුණින් හෙබි බුදුරුව දුටු හෙතෙම නිසැකව සරණයෙහි පිහිටා ඇඳිලි බැඳ නමස්කාර කරමින් සිලෝදහසකින් බුදු ගුණ වනා දහසක් වටිනා තමාගේ උතුරු සළුව භාග්‍යවතුන් වහන්සේට පිදූහ. දෙයාසංඛ්‍ය කප් ලක්‍ෂයකින් මෙතෙම ගොතම නම් බුදු වන්නේයයි රෙවත

භාග්‍යවතුන් වහන්සේ විවරණ දුන් සේක.

විවරණ අසා දාන සීලාදියෙහි ආදර ඉපදැ වූ උන්වහන්සේ ආයු කෙළවර දෙව්ලොව උපන්හ. රෙවත ජිනවරයන් වහන්සේ සැට දහසක් අවුරුදු ආයු වළඳා ලොව ඉපිද සල් උයන්හි පිරිනිවියහ. අධිෂ්ඨාන වශයෙන් උන්වහන්සේගේ ධාතු නො විසුරුණේය. රෙවත සම්බුදුසසුන අතුරුදන් වූ පසු යළි මිනිසුන්ගේ ආයු පෙරළීමෙන් අනූදහසක් අවුරුදු වූ කල සෝභිත බෝසතාණෝ සාරාසැකි කප් සුවහසක් පැරුම් පුරා වෙස්සන්තර සමාන අත් බැවින් චුතව තුසී පුර උපන්හ. දේවතාරාධනයෙන් තුසී පුරෙන් සැව සුධම්ම නුවර සුධම්ම මහරජු නිසා සුධම්මා මහදේවිය කුස පිළිසිඳ ගත්හ.

එකල දසදහසක් ලෝකධාතු කම්පනාදි කියන ලද පෙළහර සිදුවිය. දසමස් ඇවෑමෙන් සුධම්ම උයන්හිදීම දසදහසක් සක්වළ හොබවමින් මව්කුසින් නික්මුණහ. සොළොස් දහසක් අවුරුදු ගිහි ගෙහි වසූහ. උන්වහන්සේට මුද, පදුම, නලින, නම් තුන් පහයක් විය. මඛිලා දේවිය අගමෙහෙසි කොට එක් එක් පහයෙහි සොළොස් සොළොස් දහසක් ස්ත්‍රීහු උවටැන් කළහ. මඛිලා දේවිය සිරි කුමාර නම් පුතු වැදූ කල උන්වහන්සේ සතර නිමිති දැක සංවේගයට පත්ව එම ප්‍රාසාදයෙහිම පැවිදිව එහිම ආනාපානසති සමාධිය වඩා සතර දැහැන් ලබා සතියක් ප්‍රධන් වීර්‍යය කොට මඛිලා දේවිය පිදූ දිව ඔජස් බහාලූ මධු පායාසය වළඳා දිවා විහාර කොට නික්මෙමියි සිතා මේ පහය අහසින් ගොස් බෝමැඩ බසීවා, මේ ස්ත්‍රීහු මා පර්යංකයෙහි හුන් කල නොකියාම ප්‍රාසාදයෙන් නික්මෙත්වායි අධිෂ්ඨාන කළහ.

සිතුවිල්ලත් සමඟින් පහය හිරු විමන මෙන් අහසට නැඟ ගමන් කළේය. නාටක ස්ත්‍රීහු උන්වහන්සේ පිරිවරා නානා තූර්ය වාදන සහිතව ගායනා කරමින් ගියහ. සිවුරඟ සෙනඟ සිටි සැටියෙන්ම පොළොවෙහි මෙන් අහසෙහි ගමන් කළහ. මහජනයා ද පිළිසිසෑරීම් සාධුකාර දීම් සහිතව පහය පිරිවරා ගියහ. ප්‍රාසාදය අහසින් ගොස් අට අසූරියන් උස දෙවියන් විසින් සරහන ලද සෘජු

මහත් රතු කඳින් යුත් නාරුක් බෝධිය මැදි කොට බැස බිම පිහිටියේය. කිසිවෙකු විසිනුත් නොකියන ලද නිළියෝ බැස නික්ම ගියහ. සෝභිත මහාපුරුෂයාණෝ මහජනයා පිරිවරාගෙනම තුන් යම්හි ත්‍රිවිද්‍යා උපදවා තඹවන් අරුණෝදයෙහි සර්ව්ඥතාඥානය ලැබූහ. ධර්මතාවශයෙන් පිරිස ආපරිද්දෙන්ම ගියහ. ප්‍රාසාදය එසේම පිහිටියේය. බුදුබව ලත් සෝභිත සම්මා සම්බුදුහු දම්සක් පවත්වා මහාජන සංග්‍රහ සඳහා චාරිකා කරමින් රම්ම නගරයට වැඩියහ.

එකල අප බෝසත්හු එනුවර සුජාත නම් අනන්ත භෝග සම්පත් ඇති බමුණෙක් වූහ. එතුමා බුදුරුව දැකීමෙන්ම සැදැහැ ලබා දිවි හිමියෙන් සරණ ගොස් යොදුන් සීයක් සීමාවෙහි නිවැසි සියලු ශ්‍රාවකයන් රැස් කරවා තෙමසක් මහදන් පැවැත්විය. දුන් දානයෙහි ප්‍රමාණයක් නම් නැත. සෝභිත ලෝක නායකයාණෝ "මෙතෙම දෙයාසංඛ්‍ය කප් ලක්ෂයකින් මතු අනාගතයෙහි ගෝතම නම් බුදුවන්නේය"යි විවරණ දුන්හ. සුජාත බමුණු සෝභිතබුදුවිවරණ ලබා කුසල් දහම්හි නොපමාව දෙව්ලොව උපන්නේය.

සෝභිත බුදුහු අනූ දහසක් අවුරුදු ආයු වූ ලොව ඉපිද විනය දනන්හට හිත සලසා අනුපාදා නිබ්බාන ධාතුවෙන් පිරිනිවි සේක. උන්වහන්සේගේ සසුන ද අතුරුදන්ව දිගු කල් ඇවැමෙන් එකප නැසිණ. එතැන් පටන් අසංඛ්‍ය කල්පයක් අවිදු අඳුරින් වැසුණු බුද්ධ සූර්‍යෝදය රහිත කාලයක් විය. ඒ ජය නම් අසංඛ්‍යයයි. ඒ කප ගෙවී එක් සාරමණ්ඩ කපෙක අනෝමදස්සි, පදුම, නාරද නම් තුන් බුදු කෙනෙක් උපන්හ.

උන්වහන්සේලාගෙන් අනෝමදස්සි භාග්‍යවතුන් වහන්සේ සොළසාසංඛ්‍ය කල්ප ලක්ෂයක් පැරැම් පුරා තුසිපුර ඉපිද දේවායාචනයෙන් චුතව චන්දවතී නුවර යසරජහුගේ අගබිසෝ යසෝධරා කුස පිළිසිඳ ගත්තේය. එකල්හි ද නොයෙක් පෙළහර පහළ විය. අනෝමදස්සී කුමරු කුස හුන් කල්හි ඒ අනුභසින් යසෝධරා දේවියගේ ශරීරාලෝකය අසූරියන් දුර අඳුර නිති දුරු කළේය. සඳ

හිරු එලියෙන් අනභිභවනීයව දිවා රෑ පැවැත්තේය. දසමස් ගෙවා සුවඳක උයන්හි බෝසතුන් වැදුවාය.

එකල්හි පෙළහර ඇතිවිය. පවුර හිමිකොට මුළු නුවර විසිතුරු වස්ත්‍රාභරණ අහසින් පතිත විය. නම් තබන දින නිමිති දත් පුරෝහිතයෝ උපතෙහි අනුපම දේ දැක්වූ බැවින් අනෝමදස්සි යයි නම් තැබූහ.

එතුමා දසවස් දහයක් ගිහිගෙහි විසීය. සිරි, උපසිරි, වාද නම් තුන් පහයක් විය. සිරිමා දේවිය ප්‍රමුඛ තෙවිසිදහසක් ස්ත්‍රීහු ප්‍රත්‍යුපස්ථාන කළහ. සිරිමා දේවිය උපධාන නම් පුතු වැදූ කල්හි සතර නිමිති දැක රන්සිවි ගෙයකින් මහභිනික්මන් කොට පැවිදිවිය. තිස් කෙළක් ජනයා අනුපැවිදි වූහ. උන්වහන්සේ ඔවුන් පිරිවරා දසමස් ප්‍රධන් වීර්‍යයෙන් වෙසක් පොහෝ දින අනුපම බමුණුගම අනුපම සිටුදියණිය දුන් දිව ඔජස් බහාලූ මී කිරි බත් වළඳා සල් උයන්හි දාවල් කල් යවා අනෝපම ආජීවක දුන් තණ අටමිට ගෙන අර්ජුන බෝරුක වෙත දකුණින් පැමිණ තෙවරක් පැදකුණු කොට ඊසාන දිග සිට අටතිස් රියන් පුළුල් තණ ඇතිරිය අතුරා චතුරංඟ වීර්‍යය ඉටා පර්යංකයෙන් ඉඳ තුන් යාමයෙහි ත්‍රිවිද්‍යා උපදවා බුදධත්වය ලැබූ සේක. බුදුව දම්සක් පවත්වා සකල සත්වානුග්‍රහය පිණිස කෙළක් භික්ෂූන් පිරිවරා ජනපද චාරිකාවෙහි වැඩි සේක. එකල අප බෝසතාණෝ නොයෙක් කෙළ ගණන් යකුන් පිරිවැරූ යක් රජෙක් වූහ. අනෝමදස්සී භාග්‍යවතුන් වහන්සේ භික්ෂු සංඝයා සමඟ යක්ෂ භවනයට වැඩි සේක. බික්සඟුන් සහිත බුදුන් දුටු යක්රජ සොම්නසින් පිරිවරින් පෙරගමන් කොට පසඟ පිහිටුවා වැඳ සිය භවන ළඟ දඹරන් මහමඩුවක් මවා සතියක් දිවඔජා සහිත මහදන් පිදීය. භාග්‍යවතුන් වහන්සේ භක්තානුමෝදනාවෙහි මේ යක්රජ ඒකාසංඛ්‍ය කප් ලක්ෂයකින් මතු ගෝතම නම් බුදු වන්නේයයි විවරණ දුන් සේක.

ව්‍යාකරණලාභීව තුටු පහටු යක්රජ පාරමී පිරීම සඳහා දැඩි

පැරකුම් ඇතිව ස්වගීපරායණ වීය. අනෝමදස්සී ශ්‍රීධරයාණෝ ලක්ෂයක් ආයු වූ ලොකයෙහි ඉපිද පිරිනිවියහ. උන්වහන්සේගේ සසුන ද අතුරුදන්ව අන්තර කල්පය ද ගෙවී ගිය පසු මිනිසුන්ගේ අසංඛ්‍ය ආයු පිරිහී යළි දහසක් වූ කල පදුම නම් බෝසතාණෝ සොළසාසංඛ්‍ය කප්ලක්ෂයක් පෙරුම් පුරා පෙර බෝසතුන් මෙන් තුසීපුරෙන් සැව චම්පා නුවර අසම මහරජු නිසා අසමා දේවිය කුස උපන්හ. එකල නොයෙක් පෙළහර ඇතිවිය. දසමස් ඇවෑමෙන් චම්පක උයන්හි මවු කුසින් බිහිවිය. කුමරු උපන් කල්හි මුහුද දක්වා දඹදිව දණක් පමණ පියුම් වැසි වැස්සේය. එහෙයින් මහා පදුම කුමාරයයි නම් තැබූහ. උන්වහන්සේ දසදහසක් අවුරුදු ගිහිගෙහි විසූහ. උත්තරා, වසුත්තරා, යසුත්තරා, නම් ප්‍රාසාද තුනක් විය. උත්තරා දේවිය ප්‍රමුඛ තිස්තුන්ලක්ෂයක් ස්ත්‍රීහු උවටැන් කළහ.

මහාපදුම බෝසතාණෝ උත්තරා දේවිය රම්ම කුමාර පුතු වැදූ කල්හි සතර නිමිති දැක ආජඤ්ඤ රථයකින් මහබිනික්මන් කොට පැවිදි වූහ. කෙළක් පුරුෂයෝ අනුපැවිදි වූහ. උන්වහන්සේ ඔවුන් සමඟ අට් මසක් ප්‍රධන් වීය්‍යය වඩා වෙසක් පොහෝ දින ධඤ්ඤවතී නියම්ගම සුධඤ්ඤ සිටුදුව පිදූ දිව ඔජස් බහාලූ මධු පායාස වළඳා අඹ වනයෙහි දිවා විහාර කොට සවස් වේලෙහි නන්දිකාජීවකයන් දුන් අට තණමිට ගෙන සොණක බෝධිය වෙත දකුණින් පැමිණ අටතිස් රියන් තණ ඇතිරිය අතුරා පර්යංකයෙන් චතුරංඟ වීය්‍යය ඉටා මාර බල නසා තුන්යමිහි ත්‍රිවිද්‍යා උපදවා බුදු බව ලැබූහ.

බුදුබව ලැබ දම්සක් පවත්වා පසු කලෙක අරණ්‍යවන ගහණයෙක වස් විසූ සේක. එකල අප බෝසතාණෝ සිංහ මෘග රාජයෙක් වූහ. ඔහු සතියක් නිරෝධ සමවතින් සිටි බුදුන් දැක පැහැද වැඳ පැදකුණු කොට සොම්නස් වේගයෙන් තෙවරක් බුදුන් ඉදිරියේ සිංහනාද කොට සතියක් බුද්ධාලම්බන ප්‍රීතියෙන් ගොදුරු සඳහා ද නොගොස් බුදුන් ඇසුරෙහිම සිටියේය. මහාපදුම භාග්‍යවතුන් වහන්සේ නිරෝධ සමවතින් නැගී සිට ඉදිරියෙහි සිටි

සිංහයා දැක මේ සිංහයා මහත් අදහස් ඇත්තෙකි. භික්ෂූන් විෂයෙහි සිත පහදවා නමස්කාර කරයි. භික්ෂු සංඝයා මෙහි පැමිණෙත්වායි සිතූහ. එවිටම උන්වහන්සේලා පැමිණ බුදුන් වැඳ වාඩි වූහ. සිංහයාද භික්ෂූන් දැක සිත පැහැදවීය. බුදුරජාණන් වහන්සේ ඔහුගේ සිත දැන භික්ෂුසංඝයා මධ්‍යයෙහි "මහණෙනි මේ මෘග රාජ සිංහයා භික්ෂූන් සහිත මා කෙරෙහි සිත පහදවා ඒකාසංඛ්‍ය කප්ලක්ෂයක් ඉක්මවා අනාගතයෙහි බුදු වන්නේය"යි ප්‍රකාශ කළ සේක. විවරණ ඇසූ සිංහයා "මම බුදු වන්නෙමි"යි මේ දුබල ජීවිතයෙන් මට කවර වැඩක් දැයි සිතා එහිම ජීවිත පරිත්‍යාග කොට දෙව්ලොව උපන්නේය. මහාපදුම තථාගතයන් වහන්සේ මොහඳුර දුරලමින් වෂී ලක්ෂයක් ආයු ඇති ලොව ඉපිද පිරිනිවි සේක. උන්වහන්සේගේ සසුන ද අතුරුදන්ව කල්යාමෙන් මිනිසුන්ට අනූදහසක් ආයු වූ කල භව බැඳුම් සිඳලන නාරද නම් භාග්‍යවතුන් වහන්සේ ලොව උපන්හ. උන්වහන්සේ සොළසාසංඛ්‍ය කප්ලක්ෂයක් පෙරුම්පුරා අන් බෝසතුන් මෙන් තුසී පුරයෙන් චුතව ධඤ්ඤවතී නුවර සුදේව මහ රජුගේ මහමෙහෙසි අනෝපමා දේවිය කුස උපන්හ. එකල දසසහස්‍රී ලෝක කම්පනාදි ප්‍රාතිහාර්‍ය්‍ය විය.

උපන් කෙණෙහි සියලු දඹදිව වැසි මිනිසුන්ගේ පරිභෝජනයට අනුරූප ආභරණ අහසින් පතිතවිය. එබැවින් නම් තැබීමේ දී මිනිසුන්ට උතුම් ශීර්ෂාභරණාදිය දෙන ලදැයි නාරද යයි නම් තැබූහ. උන්වහන්සේ නව දහසක් අවුරුදු ගිහි ගෙහි විසූහ. විජිත, විජිතාවී, ජිතාභිරාම නම් තුන් පහයක් විය. විජිතසේන මහමෙහෙසිය ප්‍රමුඛ විසිදහසක් ස්ත්‍රීහු උවටැන් කළහ. විජිතසේන මහදේවියට නෑ කුමාර නම් පුතු උපන් කල්හි සතර පෙර නිමිති දැක සිව්රඟසෙන් පිරිවරා පැළඳි මුතුමාලාදි සියලු ආභරණ සහිතව පාගමනින්ම උයනට ගොස් ආභරණ ගලවා භාණ්ඩාගාරිකයාට දී තමාම සියුම් කඩුවෙන් මහරුවනින් සැරසූ කෙස්කළඹ කපා අහසට දැමූහ. ශක්‍රයා එය පිළිගෙන තව්තිසාවෙහි තුන් යොදුන් උස සත්රුවන්මුවා සෑයක් කළේය. මහාසත්ත්වයෝ මහබඹහු විසින් දුන් කසාවත් හැඳ

එළයන්හිම පැවිදි වූහ. ලක්ෂයක් පිරිස උන්වහන්සේ අනුව පැවිදි වූහ. සතියක් එහිම ප්‍රධන් වීර්‍යය වඩා උන්වහන්සේ වෙසක්පොහෝ දින විජිතසේන මහමෙහෙසිය පිදූ දිව මිහිර යුත් කිරිබත් වළඳා උයන්හිම දාවල ගෙවා සවස්හි සුදස්සන උයන්පල්ලා විසින් දෙන ලද අට තණමිට ගෙන සෝණක බෝධිය වෙත දකුණින් පැමිණ තෙවරක් පැදකුණු කොට ඊසාන කොණ සිට අට පනස් රියන් තණ ඇතිරිය අතුරා පලක් බැඳ මාර බල බිඳ දමා ත්‍රිවිද්‍යා උපදවා බුදුවූ සේක.

එකල අපගේ බෝධි සත්ත්වයෝ පංචාභිඥාධර තවුසෙක්ව හිමවි පියසෙහි ආශ්‍රමයක් කොට විසූහ. එවිට මාරජන පරාජය කළ උදාර නාරද සම්මා සම්බුදුහු උතුම් දම්සක් පවත්වා තාපසයන්ට අනුකම්පා පිණිස අසූකෙළක් රහතන් ද අනාගාමී උපසකවරුන් දසදහසක් ද පිරිවරා ඒ අසපුවට වැඩි සේක. එවිට තාපසයෝ අපරිමිත සුචරිත කම් ඵලයෙන් සුන්දරව බබළන අට අසූරියන් බුදු බඳින් යුත් ශ්‍රාවක සංඝයා සහිත බුදුරජාණන් වහන්සේ දැක ආශ්චය්‍ය අද්භූත සිතින් උදම්ව සැහැල්ලු සිතින් පෙරගමන් කොට වැඳ සපිරිවරින් වැඩ විසීම පිණිස භාග්‍යවතුන් වහන්සේට ආශ්‍රමයක් මවා ආශ්‍රමය මැද මහමඩුවක් කරවා ආසන පනවා වඩා හිඳුවා මුළු රැය බුදු ගුණ සිතා දෙවන දින උතුරුකුරු දිවයිනට ගොස් බත් ගෙනවුත් වැළඳවූහ. මෙසේ සතියක් මහදන් පුදා හිමවතින් සතරඟුල් පමණ මාහැඟි හඳුන් ගැටයක් ගෙනවුත් බුදුන් පිදූහ. ඉක්බිති වෛශාරද්‍ය විශාරද නාරද සම්මා සම්බුදුහු දෙව් මිනිස් සමූහයා මැද මෙතෙමේ එකාසංඛ්‍ය කල්ප ලක්ෂයකින් මත්තෙහි ගෝතම නම් බුදු වන්නේයයි විවරණ දුන්සේක. විවරණ ලත් උන්වහන්සේ නොපමාව දැහැන් වඩා නොපිරිහුණු දැහැනින් එයින් චුතව බඹලොව උපන්හ. අනූ දහසක් අවුරුදු ආයු වූ ලොව උපන් නාරද බුදුහු සුදස්සන නුවර සුදස්සන උයන්හි පිරිනිවි සේක සියලු දඹදිව වැස්සෝ උන්වහන්සේට සිව් යොදුන් උස සත්රුවන්මුවා සෑයක් කරවූහ.

උන්වහන්සේ පිරිනිව් කල පස් අනූදහසක් අවුරුදු පැවති සසුන අතුරුදහන් විය. කල්පය ද නැසුණේය. ඉන්පසු රුචි නම් ශූන්‍ය කල්ප අසංඛ්‍යයෙහි බුදුවරු ලොව පහළ නොවූහ. ලෝකය පහවූ ධර්මාලෝක ඇත්තේ විය. එම අසංඛ්‍ය කල්පය ඉක්ම ගිය පසු එක් සාර කල්පයක පදුමුත්තර නම් එකම බුද්ධ වීරයාණෝ ලොව පහළ වූහ. උන්වහන්සේ ද සොළසාසංඛ්‍ය කප්ලක්ෂයක් පෙරුම් පුරා අන් බෝසතුන් මෙන් තුසී පුරෙන් සැව හංසවතී නුවර ආනන්ද රජුගේ අග මෙහෙසිය සුජාතා දේවිය කුස පිළිසිඳ ගත්හ. ප්‍රාතිහාර්‍ය කියන ලද පරිදිමය. බෝසතුන් කුස පිළිසිඳගත් පසු සක්මන් පිණිස පා දිගු කිරීමේ දී පින් තෙද බෙලෙන් මහකෙමි ඇති මොළොක් පෙති ඇති රියසක් පමණ මහපියුම් පහළ විය. දේවිය එහි සක්මන් කරමින් සතුටු සිතින් පහවූ වෙහෙසින් ලෝක පාලයන්ගේ රැක වරණින් දස මස් ගෙවා හංස උයනෙහි ළහිරුවන් පියුමතුරා කුමරු බිහි කළාය.

උපන් කෙණෙහි මුළු දඹදිව දණක් පමණ පියුම් වැසි වැස්සේය. එහෙයින් නම් තැබූ නිමිති දන්නෝ ද නැයෝ ද පදුමුත්තර කුමරුයයි නම් තැබූහ. උන්වහන්සේ දසවස් දහයක් ගිහි ගෙහි විසූහ. නාරි වාහන, යස වාහන, වසවත්ති යයි තුන් පහයෙක් විය. වසුදත්තා දේවිය ප්‍රමුඛ විසි එක් දහසක් ස්ත්‍රීහු උවටැන් කළහ. වසුදත්තා දේවියට උත්තර කුමාර නම් පුතු උපන් කල්හි නිමිති සතර දැක මහබිනික්මන් කරමියි සිතූහ. සිතත් සමඟ ප්‍රාසාදය අහසට නැඟී සරල බෝධිය මැදි කොට බැස්සේය.

මහාපුරුෂයාණෝ පහයෙන් බැස පොළොවෙහි සිට ගත්තේය. එහි දී අරහත්ධජ නම් කසාවත් පෙරවා පැවිදි වූහ. ප්‍රාසාදය නැවත අහසින් පැමිණ මුල් තැනම පිහිටියේය. එක්ව ගිය පිරිසෙන් ස්ත්‍රීන් හැර සියලු පුරුෂයෝ පැවිදි වූහ. මහසත්හු ඔවුන් පිරිවරා සතියක් ප්‍රධන් වීර්‍යයකොට වෙසක් පොහෝ දින සමූහයෙන් වෙන්ව උජ්ජේනි නියම් ගමෙහි රූපනන්දා සිටුදුව පිදූ දිව මිහිරි කිරිබත් වළඳා සල් වෙනෙහි දාවල් වැස සැදෑවෙහි සුචිණ්ණ ආජීවකයන්

දුන් අට තණ මිට ගෙන සලල බෝධිය වෙත දකුණින් පැමිණ තෙවරක් පැදකුණු කොට ඊසාන කොණෙහි සිට අටතිස් රියන් දිගු පුළුල් ඇති තණ ඇතිරිය අතුරා එහි පලක් බැඳ සිව්රඟ වෙර සිතා මරබල පරදවා සව් කෙලෙසුන් නසා අනාවරණඥානය ලැබ බුදුවූ සේක. එදා දසදහසක් සක්වළ කෙළවර කොට ඇති ලෝකය ප්‍රීතියෙන් පුරවමින් පියුම් වැගිරෙන මහපියුම් වැසි වැස්සේය. බුදුව නවාංගශාසනය ප්‍රකාශ කොට මහජනයා දැහැමි කථාවෙන් දැක්වූහ. සමාදන් කරවූහ. තෙද ගැන්වූහ. සතුටු කරවූහ. එකල සියලු දඹදිව වැසි මිනිස්සු පියුමතුරා බුදුන්ගේ සාසනෝවාද නොයික්ම වූහ. කිසිවෙකුත් මිථ්‍යාදෘෂ්ටික නොවූහ.

එකල අප බෝසත්හු ජටිල නම් මහරැටි වූහ. උන්වහන්සේ බුදු පාමොක් බික්සඟනට අහර පැන් මහදන් දී සිවුරුපිළි පිදූහ. පියුමතුරා සම්මා සම්බුදුහු "මෙතෙම කල්ප ලක්ෂයක් අවසන මතුකල ගෝතම නම් බුදු වන්නේය" කියා විවරණ කළහ. උන්වහන්සේ විවරණ ලබා බෝධි ධර්මයන්හි ඇරඹූ වෙර ඇතිව දෙව්ලොව ගියහ. පියුමතුරා බුදුහු එසර ලක්ෂයක් ආයු ඇති ලොව සිට උසහවතී නුවර නන්දාරාමයෙහි පිරිනිවියහ. උන්වහන්සේගේ ධාතූහු විදුරු කැටියක් මෙන් නොවිසුරුණහ. සියලු දඹදිව වැසි මිනිස්සු දොළොස් යොදුන් උස සත්රුවන්මුවා සෑයක් කරවූහ. උන්වහන්සේ පිරිනිවීමෙන් සසුන ද අතුරුදහන්ව දිගුකල් ඇවෑමෙන් කල්පයකින් පසු සැත්තෑ කප්දහසක් ලොව බුදුවරු නූපන්හ. එතැන් පටන් තිස්කප් දහසෙක්හි එක් මණ්ඩ කල්පයෙක සුමේධ, සුජාත නම් බුදුවරු දෙනමක් උපන්හ.

උන්වහන්සේලාගෙන් සුමේධ ලෝක නායකයාණෝ සොළසා සංඛ්‍ය කප් ලක්ෂයක් පාරමී පුරා අන් බෝසතුන් මෙන් තුසී පුරෙන් සැව සුදස්සන නුවර සුදන්ත රජුගේ අගමෙහෙසිය කුස පිළිසිඳ දසමස් ඇවෑමෙන් සුදස්සන උයන්හි මෙස කුටයකින් නිකුත් සූයෑයා මෙන් මව් කුසින් නික්මුණහ. උන්වහන්සේ සුමේධ නම් වූහ. වස් නව දහසක් ගිහි ගෙහි වසූහ. සුචන්දක, කොඤ්ඤා, සිරිවඩ්ඪ නම්

තුන් පහයක් විය. සුමනා මහදේවිය ප්‍රමුඛ අටසාලිස් දහසක් ස්ත්‍රීහු ප්‍රත්‍යුපස්ථාන කළහ. සුමේධ මහසත්හු සතර නිමිති දැක සුමනා දේවිය පුනබ්බසු නම් පුතු වැදූ කල්හි ඇත්යානයකින් මහබිනික්මන් කොට පැවිදි වූහ. කෙළක් මිනිස්සු අනුපැවිදි වූහ.

උන්වහන්සේ ඔවුන් පිරිවරා අඩමසක් ප්‍රධන් වඩා වෙසඟ පොහෝ දින නකුල නියම්ගම්හි නකුල සිටුදියණිය පිදූ මී කිරිබත් වළඳා සල් උයන්හි දිවා විහාර කොට සිරිවඩ්ඪ ආජීවකයන් දුන් අට තණ මිට ගෙන කොසඹ බෝමුල විසිරියන් තණ ඇතිරි අතුරා එහි පර්යංකයෙන් හිඳ මරබල දිනා සෙසු බුදුවරුන් මෙන් අභිසම්බෝධිය ලැබූහ. කෙලෙස් මල සෝදා භාග්‍යවතුන් වහන්සේ දම්සක් පවත්වා ලොවට අනුග්‍රහ කරනු කැමතිව මහබික්සඟන සමඟින් චාරිකා කරන සේක් නාරිවාහන නුවරට පැමිණියහ.

එකල අප බෝසතාණෝ එනුවර උත්තර නම් තරුණයෙක්ව සුමේධ භාග්‍යවතුන් වහන්සේ වෙත ගොස් බණ අසා සැදැහැයෙන් පැහැදී සරණයෙහි පිහිටා අසූකෙළක් ධන වියදම් කොට බුදු පාමොක් බික්සඟනට මහදන් දී නික්ම පැවිදි වූහ. ඒ සුමේධ භාග්‍යවතුන්වහන්සේ තිස්කප්ලක්ෂයකින් මතු අනාගතයෙහි මෙතෙම ගෝතම නම් බුදුවන්නේයයි ප්‍රකාශ කළහ. සුමේධ භාග්‍යවතුන් වහන්සේ තෙයාතූ වස්දහසක් ලොව සිට පිරිනිවි කල්හි පිළිවෙළින් අතූදහසක් අවුරුද්දට ආයු වූ කල සුජාත නම් ජාති ජරා ව්‍යාධි මරණ දුක් කෙළවර කරවන්නා වූ බුදුහු උපන්හ. උන්වහන්සේ සොළසාසංඛ්‍ය කප්ලක්ෂයක් පෙරුම්පුරා තුසිපුරෙන් චුතව සුමංගල නුවර උග්ගරජුගේ පබාවතී මහදේවිය කුස පිළිසිඳ දසමස් ගෙවා මුළු දඹදිව ගිලන් දිළිඳුන්ට සුව එළවමින් මව්කුසින් බිහිවූහ. එබැවින් උන්වහන්සේට සුජාතයි නම් තැබූහ. උන්වහන්සේ නවවස්දහසක් ගිහිගෙහි විසූහ. සිරි, උපසිරි, නන්දා යයි තුන් පහයක් වීය. සිරිනන්දා දේවිය ප්‍රමුඛ විසිතුන් දහසක් ස්ත්‍රීහු උවටැන් කළහ.

සතර නිමිති දැක සිරිනන්දා දේවිය උපසේන පුතු වැදූ කල උසභ නම් වරතුරඟු පිට නැග මහබිනික්මන් කොට පැවිදි වූහ.

කෙළක් මිනිස්සු අනුපැවිදි වූහ. ඔවුන් පිරිවරා නව මසක් ප්‍රධන් කොට වෙසක් දින පිරිස හැර සුරින්ද නුවර සුරින්ද සිටුදියණිය දුන් මධුපායාස වළඳා සාලවනයෙහි දාවල ගෙවා සැදෑ සමයෙහි සුනන්ද ආජීවකයන් දුන් අට තණමිට ගෙන දකුණින් හුණ බෝධිය කරා ගොස් ප්‍රදක්ෂිණා කොට ඊසාන දිශාවෙහි සිට තෙතිස් රියන් තණ ඇතිරි අතුරා එහි වැඩ හිඳ මර සතුරන් දිනා සෙසු බුදුවරුන් මෙන් අනුත්තර වරබෝධිය අවබෝධ කළ සේක.

එකල්හි අප බෝසත්හු සතර මහාදිවයින්හි සක්විති රජවූහ. උන්වහන්සේ බුදුහු ලොව උපන්හයි අසා සිවුරඟසෙන් සහිතව උන්වහන්සේ වෙත පැමිණ පසඟ පිහිටුවා වැඳ මිහිරි සාර දම් දෙසුම් අසා උපන් බලවත් ශ්‍රද්ධාවෙන් චාතුර්ද්වීපික මහාරාජ්‍යය බුදුපාමොක් සඟනට පුදා බුදුන් වෙත පැවිදි වූහ. රට වැසියා රාෂ්ට්‍රප්‍රධානියෙකු සමග ආරාම කෘත්‍යය සිදු කොට බුදුපාමොක් සඟනට නිති දන් දෙවූහ. සුජාත භාග්‍යවතුන් වහන්සේ මහ අදහස් සම්පන්න බව දැන පිරිස් මැද තිස් කප් දහසකින් මතු අනාගතයෙහි මෙතෙම ගෝතම නම් බුදුවන්නේ යයි විවරණ දුන්හ. උන්වහන්සේ විවරණ ලබා දිවිතෙක් කුසල කම් කොට ස්වර්ගයෙහි උපන්හ. සුජාත සම්‍යක් සම්බුදුන් වහන්සේ අනූවස්දහසක් වූ ලෝකයෙහි සිට චන්‍දවතී නුවර සීලාරාමයෙහි දී පිරිනිවි සේක.

සුජාත බුද්ධශාසනය ද එම කල්පය ද අතුරුදහන්වූ පසු විසිනව කල්පයක් සහ කප් සියයක් ජින සූර්‍යයින් පහළවීම් රහිතවිය. මෙයින් කප් අටසියයකින් පෙර එක් සාරමණ්ඩ කල්පයක පියදස්සී, අත්‍රථදස්සී, ධම්මදස්සී යැයි තුන් බුදු කෙනෙක් උපන්හ. පියදස්සී භාග්‍යවතුන් වහන්සේ සොළසාසංඛ්‍ය කල්ප ලක්ෂයක් පාරමී පුරා තුසිත භවනයෙන් චුතව සුධඤ්ඤ නුවර සුදත්ත මහරජුගේ අගමෙහෙසිය කුස පිළිසිඳ දසමස් ගෙවා වරණ උයන්හි මවුකුසින් බිහිවූහ. ප්‍රාතිහාර්‍ය කියන ලද පරිදිය. මුළු ලොව ප්‍රියදර්ශනීය විය. මුළු ලොවට ප්‍රිය පෙළහර දැක්වූ හෙයින් උන්වහන්සේ පියදස්සී නම් වූහ.

උන්වහන්සේ නවදහසක්වස් ගිහිගෙහි විසූහ. සුනිම්මල, විමල, ගිරිගුහා නම් තුන් පහයක් විය. විමලා මහදේවිය ප්‍රමුඛ තෙතිස්දහසක් ස්ත්‍රීහු උවටැන් කළහ. උන්වහන්සේ සතර නිමිති දැක විමලා දේවියගේ කඤ්චනවෙල නම් පුතු උපන් කල්හි ආජඤ්ඤ රථයකින් මහබිනික්මන් කොට පැවිදි වූහ. කෙළක් පුරුෂයෝ අනුපැවිදි වූහ. ඔවුන් පිරිවර කොට සමසක් ප්‍රධන් වීර්‍යය වඩා වෙසක් පොහෝ දින වරුණ බමුණු දියණිය පිදූ මධු පායාස වළඳා සල් උයන්හි දිවාවිහාර කොට සුජාත ආජීවකයා දුන් අට තණමිට ගෙන පකුධ බෝධිය වෙත දකුණින් පැමිණ තෙපනස් රියන් දික් තණ ඇතිරිය අතුරා එහි පලක් බැඳ මරසෙන් දිනා බුදු බවට පත් වූහ. පියදස්සී භාග්‍යවතුන් වහන්සේ බුදුව දම්සක් පවත්වා භික්ෂුසංඝයා සමඟ චාරිකා කරමින් සිරිවඩ්ඪ නුවරට සම්ප්‍රාප්ත වූහ. එකල අප බෝසතාණෝ එනුවර කස්සප නම් වේදත්‍රය පාරගත බමුණෙක් විය. උන්වහන්සේ පියදස්සී භාග්‍යවතුන් වහන්සේගේ බණ අසා ශ්‍රද්ධාව ලැබ සරණ සිල්හි පිහිටා කෙළ ලක්ෂයක් ධන පරිත්‍යාගයෙන් සංඝාරාමයක් කරවූහ.

පියදස්සී භාග්‍යවතුන් වහන්සේ මෙතෙම අටසියක් කපින් මතු අනාගතයෙහි ගෝතම නම් බුදු වන්නේයයි විවරණ දුන්හ. උන්වහන්සේ විවරණ අසා සුගති පරායණ වූහ. පියදස්සී සම්මා සම්බුදුහු අනූදහසක් අවුරුදු ලොව සිට අසල නම් නුවර අසල උයන්හි පිරිනිවි සේක. උන්වහන්සේ පිරිනිවි කල සසුන ද අතුරු දහන් වූ පසු පිළිවෙළින් වෂී ලක්ෂයක් ඇවෑමෙන් වෂී දහසක් ආයු ඇති කල නිපුණ අථී ප්‍රකාශක අත්‍ථදස්සී නම් බුදුහු ලොව උපන්හ.

උන්වහන්සේ සොළසාසංඛ්‍ය කප්ලක්ෂයක් පැරැම් පුරා තුසිතයෙන් චුතව සෝභන නුවර සාගර රජුගේ සුදස්සන මහ දේවියගේ කුස පිළිසිඳ දසමස් ගෙවා සුචින්දර උයන්හි මව් කුසින් බිහි වූහ. කියන ලද අයුරු පෙළහර විය. මව් කුසින් නික්මෙත්ම ඉපැරණි කුල පරම්පරාගතව එහි පැවති සුචරිත ධම්මථී ශාස්ත්‍රාත්‍රථී ද ධනවත්හු ද ආචාර්‍යයෝ ද ඇතිවූහ. එහෙයින් නිමිති දන්නෝද

නෑයෝ ද අසූදස්සි කියා නම් තැබූහ. උන් වහන්සේ දස දහසක් අවුරුදු ගිහි ගෙහි විසූහ. අමරගිරි, සුරගිරි, ගිරිවාහන නම් තුන් පහයක් විය. විශාඛා දේවිය ප්‍රමුඛ තිස්දහසක් ස්ත්‍රීහු ප්‍රත්‍යුපස්ථාන කළහ. උන්වහන්සේ සතර නිමිති දැක විශාඛා දේවිය සේල පුත් කුමරු වැදූ කල සුදස්සන අසුපිට නැගී මහබිනික්මන් කොට පැවිදි වූහ. නවකෙළක් ජනයා උන්වහන්සේ අනුව පැවිදි වූහ. උන්වහන්සේ ඔවුන් පිරිවරා අඩමසක් ප්‍රධන් වීය්‍යයෙහි හැසිර වෙසක් පුන් පොහෝදා සුචින්දර නාගිනියට උපහාර පිණිස ගෙන ආ මිහිරි කිරිබත් වළඳා නාඹර සල් වෙතෙහි දාවල ගෙවා මහාරුචි නා රජු පිදූ කුසකලප් ගෙන සපු බෝධිය වෙත දකුණු දෙසින් පැමිණ තෙපනස්රියන් දිගු පුළුල් කුස ඇතිරි අතුරා පර්යංකයෙන් එහි හිඳ සම්බෝධියට පැමිණියේක. එකල්හි අප බෝසතාණෝ සුසීම නම් මහාසාර බ්‍රාහ්මණයෙක්ව සියලු සම්පත් දන්දී තාපස පැවිද්දෙන් පැවිදිව පඤ්චඅභිඥා අෂ්ට සමාපත්ති උපදවා මහර්ධි ඇතිව මහානුභාව සම්පන්නව මහජනයාට කුසලාකුසල ධම් ලක්ෂණ දක්වමින් බුද්ධෝත්පාදය අපේක්ෂාවෙන් වාසය කළහ. අසූදස්සි සම්මා සම්බුද්ධයන් වහන්සේ ඉපිද සුදස්සන මහාවිහාරයේ අට පිරිසට දහම් දේශනා කරද්දී සුසීම තාපස බෝධිසත්වයෝ දිව්‍යමය මඳාරා පරසතු මල් ආදිය ගෙනවුත් තමන්ගේ ප්‍රභාව දැක්වීම සඳහා දෘශ්‍යමාන කයින් සිට පුරුෂයෙකුගේ නැබ පමණ වනතෙක් සතර දිග වසින මහ වැස්සක් සේ මල් වරුසා වස්වා හාත්පස ද මණ්ඩප තොරණ ආදිය රන්දම් මල්දම් ආදි නන් කුසුම්වලින් සරසා බුද්ධ සත්කාර කොට ඇදිලි බැඳ වැඳ බුදුගුණ වනමින් සිටියේය. එවිට අසූදස්සී භාග්‍යවතුන් වහන්සේ අටපිරිස් මැද අටකපකින් මතු අනාගතයේ මෙතෙම බුදුවන්නේ යයි විවරණ කළ සේක. උන්වහන්සේ පිරිනිවීමෙන් පසු කෙමෙන් වෂී ලක්ෂයක් ආයු ඇතිවූ පසු ධම්මදස්සී නම් ධම්රාජයාණෝ ලොව පහළ වූහ.

උන්වහන්සේ ද සොළසාසංඛ්‍ය කල්ප ලක්ෂයක් පෙරුම් පුරා තුසීපුරෙන් සැව සරණ නුවර සරණ මහරජුගේ මහමෙහෙසිය කුස

පිළිසිඳ දසමස් ගෙවා සරණ උයන්හි මව්කුසින් බිහිවූහ. බෝසතුන් මව් කුසින් නික්මෙද්දී අධිකරණ ව්‍යවහාර ලියූ පොත්වල අධාර්මික සටහන් ඉබේම අතුරුදහන් වීය. ධර්මව්‍යවහාර පමණක්ම ශේෂවීය. එහෙයින් උන්වහන්සේට නිමිති දන්නෝ ධම්මදස්සී කියා නම් කළහ. උන්වහන්සේ අටදහසක් අවුරුදු ගිහි ගෙහි විසූහ. අජර, විරජ, සුදස්සන නම් තුන් පහයක් විය. විචිකෝලි දේවිය ප්‍රමුඛ එක්ලක්ෂ විසිදහසක් ස්ත්‍රීහු උවටැන් කළහ. සතර පෙර නිමිති දුටු උන්වහන්සේ විචිකෝලි දේවිය සුදස්සන පුත් කුමරු වැදූ කල්හි අඩෑ වේලෙහි මහබිනික්මන් සඳහා සිත් ඉපද වූහ. සිතුවිල්ලට අනතුරුවම පදනම් සහිත සුදසුන් පහය අහසට නැග සිවුරඟසෙන් පිරිවරා දෙව්විමනක් සේ අහසින් ගොස් රත්තඬකුරවක බෝධි සමීපයෙහි බැස සිටියේය. කෙළලක්ෂයක් පුරුෂයෝ උන්වහන්සේ අනුව පැවිදි වූහ. ධම්මදස්සි මහසතාණෝ සතියක් ප්‍රධන් වීය්‍යය වඩා වෙසක් පෝදා විචිකෝලි දේවිය පිදූ මධුපායාස වළඳා මීඅඹ වනයෙහි දිවාවිහාර කොට සවස්හි සිරිවඩඬ යව පාලකයන් දුන් අට තණමිට ගෙන රත්තඬකුරවක බෝධිය වෙත දකුණින් පැමිණ තෙපනස් රියන් දිගු පුළුල් තණ ඇතිරිය අතුරා එහි පලක් බැඳ බුදුවූ සේක.

එකල අප බෝසත්හු සක්දෙව්රජ වූහ. දෙදෙව්ලොව දෙවියන් පිරිවරා දිවමාලාගෙන දෘශ්‍යමානව ඇදිලි බැඳි කයින් පැමිණ සතර දිගින් සපිරිවරව සිට මාලා මණ්ඩප, කූටාගාර තොරණ වියන් ඇගෑ ආදියෙහි එල්බෙන සේ විසුරුවා සියලු තාලයන්ගෙන් විසිතුරු මිහිරි නාද සෝෂා කරවමින් මහජන සිත් ඇද ගනිමින් ජිනවරොත්-තමයන් වහන්සේට සත්කාර කළේය. දෙව්පිරිස් මැද සිටි ධම්මදස්සි භාග්‍යවතුන් වහන්සේ මෙතෙම අටසියයක් කපින් මතු අනාගතයෙහි බුදු වෙයි කියා ප්‍රකාශ කළ සේක. වසර ලක්ෂයක් ආයු ඇති ලෝකයෙහි ලෝකහිතාර්ථය සැලසූ ධම්මදස්සී භාග්‍යවතුන් වහන්සේ සලලවතී නුවර කේශාරාමයේ පිරිනිවි සේක.

උන්වහන්සේගේ සසුන ද එම කල්පය ද අතුරුදහන් වීමෙන් කප් සත්සියසයක් සුගතසුයාීයන් පහළවීමක් නැතිව පැවැත්තේය.

මෙයින් කප් සිව් අනූවකින් පෙර එක් සාර කල්පයක ලෝකාර්ථසිද්ධි කාරක සිද්ධාර්ථ නම් එක් බුදු කෙනෙක් ලොව පහළ වූහ. උන්වහන්සේ සොළසාසංඛ්‍ය කල්පලක්‍ෂයක් පාරමිතා සම්පූර්ණ කොට තුසිත පුරයෙන් චුතව වේහාර නගරයෙහි උදේන මහරජුගේ අගමෙහෙසිය කුස පිළිසිඳ දසමස් ගෙවා විරිය උයන්හි මව් කුසින් නික්මුණහ. උන්වහන්සේ උපන් කල්හි සියලු කුසීතයන්ගේ දිළිඳුන්ගේ ආකුල ව්‍යාකුල වුවන්ගේ පටන් ගත් සම්මත සියලු කර්‍මාන්ත ද අපේක්‍ෂිත අර්‍ථයන් ද සමෘද්ධ විය. එබැවින් නිමිති දන්නෝ ද නෑයෝ ද උන්වහන්සේට සිද්ධාර්‍ථ යයි නම් කළහ.

උන්වහන්සේ දසදහසක් අවුරුදු ගිහිගෙහි විසූ සේක. කෝකා, උප්පල, පදුම, තුන් පහයක් විය. සෝමනස්ස දේවිය ප්‍රමුඛ අට සාලිස් දහසක් ස්ත්‍රීහු උවටැන් කළහ. උන්වහන්සේ ද සතරනිමිති දැක සොමනස්ස දේවියට අනුපම පුත් කුමරු උපන් කල්හි ඇසළ පොහෝ දින රන්සිවිගෙයකින් විරිය උයනට ගොස් පැවිදි වූහ. කෙළසියයක් මිනිස්සු අනුව පැවිදි වූහ. ඔවුන් සමඟ දසමස් ප්‍රධන් වීර්‍ය්‍ය වඩා වෙසක් පොහෝ දින අසදිය බමුණුගම සුනෙත්තා බමුණු කුමරිය පිදූ මී කිරිබත් වළඳා ඩෙබර වෙනෙහි දිවා විහාර කොට සවස වරුණ යවපාලක විසින් දුන් අට තණමිට ගෙන කිණිහිරි බෝධිය වෙත දකුණින් පැමිණ සතලිස් රියන් පුළුල් තණ ඇතිරිය අතුරා පර්යංකයෙන් හිඳ බුදුබව ලැබූහ. එකල අප බෝසත්හු සුරසේන නුවර මංගල නම් බමුණුව විවේකසුව කැමැත්තේ ධන රැස්කිරීම් හැරදමා තවුස් පැවිද්දෙන් පැවිදිව ධ්‍යානාභිඥා උපදවා තම සෘද්ධි බලයෙන් දඹදිව සාරයවූ මහදඹගසින් ඵල ගෙනවුත් අනූකෙළක් පිරිවර ඇති සිද්ධාර්‍ථ බුදුරදුන් සුරමහාවිහාරයේ වඩා හිඳුවා මිහිරි ඕජස් යුත් දඹ ඵලයක් පිදූහ. සිද්ධාර්‍ථ නායකයන් වහන්සේ මොහු අනාගතයෙහි සිව්අනූ කපකින් මතු බුදුවන්නේ යයි ප්‍රකාශ කළ සේක. උන්වහන්සේ වසර ලක්‍ෂයක් ලොව සිට පිරිනිවි කල්හි එම කල්පය අතුරුදන් වීමෙන් එක් මණ්ඩ කල්පයෙක් හි තිස්ස, ඵුස්ස නම් බුදුවරු දෙනමක් උපන්හ.

තිස්ස ලෝකනායකයාණෝ අටඅසංඛ්‍ය කප්ලක්ෂයක් පැරුම් පුරා තුසීපුරෙන් සැව බෙම නුවර ජනසංඛ රජුගේ මහමෙහෙසි පදුම දේවි කුස පිළිසිඳ දසමසින් අනෝපම උයනෙහි බිහි වූහ. ප්‍රාතිහාර්‍යය කියන ලද අයුරුමය.

උන්වහන්සේ සත් දහසක් අවුරුදු ගිහිගෙහි විසූහ. ගුහාසේල, නාරි, නිසභ, නම් තුන් පහයක් විය. සුචිභද්දා දේවිය ප්‍රමුඛ තෙතිස් දහසක් ස්ත්‍රීහු උවටැන් කළහ. සිව් නිමිති දැක සුචිභද්දා දේවිය ආනන්ද නම් පුතු වැදූ කල්හි සොලුත්තර නම් අසුපිටින් මහබිනික්මන් කොට පැවිදි වූහ. කෝටියක් ජනයා අනුව පැවිදි වූහ. උන්වහන්සේ අඩමසක් ප්‍රධන් වීර්‍යය කොට වෙසක් පොහෝ දින චිර නියම්ගම චිර සිටුදියණිය පිදූ මී කිරිබත් වළඳා සල්වෙනෙහි දිවාවිහාර කොට සවස් යාමයෙහි විජිතසංගාම යවපල්ලා විසින් දුන් අට තණමිට ගෙන (අසන) පියා බෝධිය වෙත දකුණින් එළඹ සකලිස් රියන් තණ ඇතිරිය අතුරා පර්යංකයෙන් සිට අනාවරණ ඤාණය ලැබූහ. එකල අප බෝසතාණෝ යසවතී නුවර සුජාත් නම් රජව කාමාදීනව දැක රජසැප හැර විවේකසුව කැමැත්තෙන් සෘෂි පැවිද්දෙන් පැවිදිව ධ්‍යානාභිඥා උපදවා තිස්ස භාග්‍යවතුන් වහන්සේ දම්සක් පැවැත්වූ බැව් ශබ්ද පරම්පරාවෙන් අසා පස්වනක් ප්‍රීතියෙන් පිනාගිය සිරුරු ඇතිව බුද්ධෝත්පාදය නම් ලොව දුර්ලභය. දැන් මම පරසතු ආදි මලින් බුදුන් පුදමි යි සිතා ගවුවක් පමණ රුවන් ගොටුවක් මවා චිත්‍රලතා වනයට ගොස් පරසතු ආදි මලින් ගොටුව පුරවා දැතින් ගෙන අඳුන් වන් නිලුපුල් වන් අහසින් අවුත් පිරිස් මැද දිවකුසුම් භාග්‍යවතුන් වහන්සේට විසිර වූහ. එක් මහත් දික් දණ්ඩක් ඇති රන්කෙමියෙන් යුත් මනා සුවඳැති කෙසුරු පතින් යුත් මහ පියුමක් කුඩයක් මෙන් භාග්‍යවතුන් වහන්සේ මත දරමින් සිටියහ. එවිට තිස්ස භාග්‍යවතුන්වහන්සේ මෙතෙම දෙයානු කපකින් මතු අනාගතයේ බුදුවන්නේයයි විවරණ දුන්හ. තිස්ස භාග්‍යවතුන් වහන්සේ වසර ලක්ෂයක් ලොව සිට පිරිනිවි කල්හි පිළිවෙළින් මිනිසුන්ගේ වයස අනූදහසක් වූ කල ඵුස්ස බෝසතාණෝ

සොළසාසංඛ්‍ය කල්පලක්‍ෂයක් පාරමී පුරා තුසිත පුරයෙන් චුතව කාසික නුවර ජයසේන මහරජුගේ මහමෙහෙසිය සිරිමා දේවිය කුස පිළිසිඳ දසමසින් සිරි උයනෙහි මව් කුසින් බිහි වූහ. ප්‍රාතිහාර්යය කී නියායෙනි. උන්වහන්සේ වසර දහසක් ගිහි ගෙහි විසූහ. කිසා ගෝතමී ප්‍රමුඛ ස්ත්‍රීහු විසිදහසක් උවටැන් කළහ. සතර නිමිති දැක කිසාගෝතමී දේවිය අනුපම කුමරු ප්‍රසූත කළ කල්හි සැරසූ ඇතකු පිටින් මහබිනික්මන් කොට පැවිදි වූහ. නවකෙළක් මිනිස්සු අනුව පැවිදි වූහ.

ඔවුන් පිරිවරා සමසක් ප්‍රධන් වඩා ගණයා අතහැර සතියක් ප්‍රධන් වීර්‍යයකොට වෙසක් පොහෝ දින එක්තරා නුවරෙක එක්තරා සිටු දියණියක දුන් මීකිරිබත් වළඳා ඇට්ටේරිය වනයෙහි දිවා විහාර කොට සවස සිරිවඩ්ඪන තාපසයන් දුන් අට තණමිට ගෙන නෙල්ලි බෝධිය වෙත දකුණින් පැමිණ අටතිස් රියන් තණ ඇතිරිය අතුරා පර්‍යංකයෙන් හිඳ සම්මා සම්බෝධිය ලැබූහ. එකල අප බෝස-තාණෝ අරින්දම නුවර විජිතාවි නම් රජව ථූස්ස බුදුරජාණන් වහන්සේගේ පිය මහරජු සෙසු මිනිසුන් වළකා තමා විසින්ම දන් දෙනු දැක ඔහු සමඟ යුද්ධ කොට පරදවා ථූස්ස බුදුරජාණන් වහන්සේට ආරාධනා කොට සිය නුවරට ගොස් අපමණ පිරිවර ඇති භාග්‍යවතුන් වහන්සේට තෙමසක් දන් පුදා බණ අසා මහා රාජ්‍යය හැර තථාගතයන් වහන්සේ වෙත පැවිදි වූහ. ථූස්ස බුදුහු මොහු මතු දෙයාතූකපකින් බුදු වෙතැයි විවරණ දුන්හ. උන්වහන්සේ අනූදහසක් ආයු ඇති ලොවට හිත සලසා පිරිනිවියහ. කල්පය ද අතුරුදහන්විය. අනතුරුව එක් සාර කල්පයක විපස්සී සම්මා සම්බුදුහු ලොව උපන්හ.

උන්වහන්සේ අටඅසංඛ්‍ය කල්පලක්‍ෂයක් පැරුම් පුරා තුසිත-යෙන් චුතව බන්ධුමතී නුවර බන්ධුමා මහරජ මෙහෙසි බන්ධුමතී දේවිය කුස පිළිසිඳ දසමසින් බෙම මිගදායෙහි මව් කුසින් බිහිවූහ. නොයෙක් පෙළහර ඇති විය. නිමිති දන්නෝ ද නෑයෝ ද උන්වහන්සේගේ දිවා රාත්‍රියෙහි පැවති විචිත්‍ර නිර්මලතා දැකීමෙන්

විපස්සී යයි නම් තැබූහ. උන්වහන්සේ අටදහසක් අවුරුදු ගිහි ගෙහි විසූහ. නන්දා, සුනන්දා, සිරිමා යයි තුන් පහයක් විය. සුතනු මහ දේවිය ප්‍රමුඛ එක්ලක්ෂ විසිදහසක් ස්ත්‍රීහු උවටැන් කළහ. වසර සියයකින් සතර නිමිති දැක සුතනු දේවිය අසමවත්තක්ඛන්ධ පුතු වැදූ කල්හි ආජඤ්ඤ රථයකින් මහබිනික්මන් කොට පැවිදි වූහ. අසූහාර දහසක් අනුපැවිද්දෝ වූහ. ඔවුන් පිරිවරා අඩමසක් ප්‍රධන් වෙරවඩා වෙසක් පොහෝ දින සුදස්සන සිටුදුව දුන් මීකිරිබත් වළඳා සල් වෙනෙහි දිවාවිහාර කොට සවස සුජාත යවපාලක දුන් අට තණමිට ගෙන පළොල් බෝධිය වෙත දකුණින් එළඹ තෙපනස් රියන් තණ ඇතිරිය අතුරා එහි පර්යංකයෙන් වැඩ හිඳ සම්මා සම්බෝධියට පත් වූහ.

එකල අප බෝසත්හු අතුල නම් නාරජව නොයෙක් කෙළගණන් නා පිරිවර සමඟින් භාග්‍යවතුන් වහන්සේට වාසය පිණිස සත් රුවන්මුවා මහමඩුවක් කරවා සතියක් සම්පතට අනුරූපව මහදන් දී මාහැඟි විචිත්‍ර මිණිරුවන් එබ්බූ රන් පුටුවක් ද පිදූහ. එහිදී විපස්සී භාග්‍යවතුන් වහන්සේ මොහු මෙයින් මතු එකානූවන කප බුදුවන්නේයයි විවරණ දුන්හ. උන්වහන්සේ අනූ දහසක් අවුරුදු ලොව සිට පිරිනිවි කල්හි එකුන්සැට කපක් බුදුවරු ලොව පහළ නොවූහ. මෙයින් එක්තිස් වන කප සිබී, වෙස්සභු බුදුවරු දෙනම එකම මණ්ඩ කල්පයක උපන්හ.

සිබී බොසත්හු අටඅසංඛ්‍ය කල්පලක්ෂයක් පැරුම් පුරා තුසිතයෙන් චුතව අරුණවතී නුවර අරුණ රජු අගමෙහෙසි පබාවතී දේවිය කුස පිළිසිඳ දසමස් ඇවෑමෙන් නිසඟ උයන්හි බිහිවූහ. ප්‍රාතිහාර්‍යය කියන ලද පරිද්දෙනි. නිමිති දන්නෝ නැයෝ උන්වහන්සේගේ උණ්හීසයෙන් උඩ නැගුණු සිබාව නිසා සිබී යයි නම් කළහ. උන්වහන්සේ සත්දහසක් අවුරුදු ගිහි ගෙහි විසූහ. සුචන්දක, ගිරිසිරිස, නාරිවසභ නම් තුන්පහයක් විය. සුචිත්ත දේවිය ප්‍රමුඛ ස්ත්‍රීහු සුවිසිදහසක් උවටැන් කළහ. උන්වහන්සේ සතර නිමිති දැක සුචිත්ත දේවියට සුප්පබුද්ධ නම් පුතු උපන් කල්හි ඇත්යානයෙන්

මහබිනික්මන් කොට පැවිදි වූහ. සත්තිස් දහසක් පුරුෂයෝ අනුපැවිදි වූහ. ඔවුන් පිරිවරා අඩමසක් ප්‍රධන් වීර්‍යය කොට වෙසක් පොහෝදා සමූහයෙන් වෙන්ව සුදස්සන නියම් ගම්හි පියදස්සී සිටුදියණිය පිදූ මධුපායාස වළඳා තරුණ ඩෙබර වෙනෙහි දිවා විහාරකොට සවස්හි අනෝමදස්සි තවුසන් දුන් අට තණ මිට ගෙන පුණ්ඩරීක බෝධිය වෙත දකුණින් එළඹ සූවිසි රියන් තණ ඇතිරි අතුරා පර්යංකයෙන් හිඳ අන් බෝසතුන් මෙන් සර්‍වඥතාඥානය ලැබූහ.

එකල අප බොසත්හු පරිභුත්ත නුවර අරින්දම නම් ජනාධිපතිව සිබී භාග්‍යවතුන් වහන්සේ සිය නුවරට සපිරිවරින් වැඩි කල්හි පෙරගමන් කොට ඇදිලි බැඳ ලොමු ඩැහැගැනීම් ඇතිව ප්‍රාසාදයෙන් වෙළණ හදවතින් සක්ලකුණු යුත් සිරිපාහි වැඳ වැටී සපිරිවර බුදුරදුන් ආරාධනා කොට සතියක් අහර පැන් මහදන් පුදා වස්ත්‍ර භාණ්ඩාගාර දොරටු හැර භාග්‍යවතුන් වහන්සේටත් භික්ෂූන්ටත් සුදුසු සිවුරු පිළී පිදූහ. තමන්ගේ සකලාලංකාර සම්පන්න මඟුලැතු ද දී සිවුපසයෙන් භික්ෂූන් සහිත භාග්‍යවතුන් වහන්සේට උපස්ථාන කළහ. සිබී ලෝක නායකයාණෝ මෙතෙම එක්තිස්වන කපෙහි බුදුවන්නේයයි ප්‍රකාශ කළහ.

සිබී බුදුරදුන් සැත්තෑදහසක් අවුරුදු ලොව විසූ කල එයම අනුක්‍රමයෙන් සැටදහස් වූ කල්හි වෙස්සභූ දිවාකරයාණෝ ලොව උපන්හ. උන්වහන්සේ සොළසාසංඛ්‍ය කල්පලක්ෂයක් පාරමී පුරා තුසිතයෙන් චුතව අනූපම නුවර සුප්පතිට්ඨිත මහරජුගේ අග මෙහෙසි යසවතී දේවිය කුස පිළිසිඳ දසමස් ඇවෑමෙන් මවු කුසින් බිහිවූහ. නොයෙක් පෙළහර ඇතිවිය. මහසතුන් බිහිවෙද්දී මහ ජනයා සතුටු කොට උසහනාද කළ හෙයින් නිමිති දන්නෝ ද නැයෝ ද උන්වහන්සේට වෙස්සභූ යයි නම් කළහ. උන්වහන්සේ සදහසක් අවුරුදු ගිහිගෙහි විසූහ. රුචි, රති, මණ්ඩන නම් තුන් පහයක් විය. සුචිත්ත දේවිය ප්‍රමුඛ ස්ත්‍රීහු තිස්දහසක් උවටැන් කළහ. උන්වහන්සේ සිව්නිමිති දැක සුචිත්ත දේවිය සුප්පබුද්ධ නම් පුතු වැදූ කල්හි රන්සිවි ගෙයකින් මහබිනික්මන් කොට උයනෙහි දී බ්‍රහ්මයා දුන්

සිවුරු පිළිගෙන පැවිදි විය. සත්තිස්දහසක් මිනිස්සු අනුපැවිදි වූහ. ඔවුන් පිරිවරා සමසක් ප්‍රධන් වඩා වෙසක් පොහෝ දින සුචිත්ත නියමිගමහි සිරිවඩිඬ නාගිනිය දෘශ්‍යමාන ශරීරයෙන් පිදූ මීකිරිබත් වළඳා සල්වෙනෙහි දාවල ගෙවා සවස්හි නරින්ද නාරද දුන් අටතණමිට ගෙන සල් බෝධිය වෙත දකුණින් එළඹී සතලිස් රියන් තණ ඇතිරිය අතුරා පර්යංකයෙන් හිඳ අනාවරණඥානය ලැබූහ.

එකල අප බෝසත්හු සුභවතී නුවර සුදස්සන නම් රජව වෙස්සභූ තථාගතයන් වහන්සේ සිය නුවරට වැඩි කල්හි ආදර බුහුමන් සහිතව පෙරගමන් කොට ආරාධනා කොට විහාර පූජාවෙහිදී පිරිවර ගඳකිළි කරවා තමන්ගේ ශ්‍රද්ධානුරූපව සපරිවාර ශාස්තෘන් වහන්සේට යෝග්‍ය බෙහෙත් අහර පැන් සහිත මහදන් දී දිවා රෑ පස්අයුරකින් බුදුගුණ ප්‍රකාශිත වදන් අසා ඉමහත් සංවේග ඇතිව සෙසු සම්පත් නිරවශේෂයෙන් බුදුසසුනට පුදා බුදුන් හමුවෙහි පැවිදිව සිල්වත් පැවතුම් ඇතිව තෙලෙස් ධුතගුණයෙහි නිරතව උපචාර අර්පණා සමාධි සම්පන්නව සවිඥකඥාන පර්යේෂණයෙහි නිරතව උතුම් බුදුසසුනෙහි ඇලී වාසය කළහ. එසේ වසන උන්වහන්සේ දැක වෙස්සභූ භාග්‍යවතුන් වහන්සේ සමතිස් අයුරකින් මෙයින් එක්තිස්වන කපෙහි මෙතෙම බුදු වන්නේයයි ප්‍රකාශ කළහ. උන්වහන්සේ පිරිනිවී කල්හි කල්පයද අතුරු දහන් වීමෙන් එක්තිස් කපක් බුදුවරු ලොව නූපන්හ.

මේ පස්බුදු කෙනෙකුන් දරන භද්ද කල්පයෙහි පළමු කොටම සත්වෝත්තම කකුසඳ නම් බුදුරජාණන් වහන්සේ ලොව උපන්හ. උන්වහන්සේ අටඅසංඛ්‍ය කල්පලක්ෂයක් පෙරුම් පුරා තුසිපුරෙන් චුතව ඛෙමවතී නුවර ඛෙමංකර රජුගේ අග්ගිදත්ත නම් අග්‍ර පුරෝහිතයන්ගේ අගමෙහෙසි විශාඛ බැමිණියගේ කුස පිළිසිඳ ගත්හ. යම් කලෙක ක්ෂත්‍රියයෝ බමුණන්ට සත්කාර ගරුකාර කරත් ද එකල බුදුවන බෝසත්හු බමුණු කුලයෙහි උපදිත්. යම් කලෙක බමුණෝ ක්ෂත්‍රියයන්ට සත්කාර ගරුකාර කරත් ද එකල ක්ෂත්‍රිය කුලයෙහි උපදිති. එබැවින් කකුසඳ බෝසත්හු බමුණු කුලයෙහි ඉපිද දසමසින්

ඛේම වනඋයන්හි මවු කුසින් බිහිවූහ. කියන ලද පරිදි නොයෙක් ප්‍රාතිහාර්ය විය. සාරදහසක් වස් ගිහිගෙහි විසූහ. සුචි, සුරුචි, රතිවද්ධන නම් තුන් පහයෙක් විය. විරෝචනා නම් බමුණු කන්‍යාව ප්‍රමුඛ තිස්දහසක් ස්ත්‍රීහු උවටැන් කළහ. සතර නිමිති දැක විරෝචනා බැමිණිය උත්තර නම් පුතු වැදූ කල්හි ආජඤ්ඤ රථයෙන් මහබිනික්මන් කොට පැවිදි වූහ.

සතලිස් දහසක් අනුපැවිද්දෝ වූහ. ඔවුන් පිරිවරා අඩමසක් ප්‍රධන් වඩා වෙසක් පොහෝ දින සුචින්දර නියම්ගම්හි වජිර බැමිණිය පිදූ මධුපායාස වළඳා ඩෙබර වෙනෙහි දිවා විහාරකොට සවස සුභද්ද යවපාලකයන් දුන් අට තණමිට ගෙන සිරිස බෝධියට දකුණින් පැමිණ සූතිස් රියන් තණඇතිරි අතුරා එහි පලක් බැඳ සම්බෝධියට පත්වූහ.

එකල අප බෝසත්හු ඛේම නම් රජව බුද්ධ ප්‍රමුඛ භික්ෂු සංඝයාට පාසිවුරු මහදන් පුදා සියලු බෙහෙත් ද අඳුන් ආදිය ද පුදා භාග්‍යවතුන් වහන්සේගේ ධර්මදේශනාව අසා රජසම්පත් හැර පැවිදි වූහ. එකල සේදූ කෙලෙස්මඬ ඇති කකුසඳ භාග්‍යවතුන් වහන්සේ මෙතෙම අනාගතයෙහි මේ භද්‍ර කල්පයෙහිම ගෝතම නම් බුදු වන්නේයයි ප්‍රකාශ කළ සේක. සතලිස් දහසක් වස් ලොව සිට පිරිනිවි කකුසඳ බුදුසසුන අතුරුදන්ව ක්‍රමයෙන් මිනිසුන් සතලිස් දහස් ආයු පිරිහී දසවස් වූ කල්හි අන්තර කල්පයක් පහළවිය. අන්තරකල්පය. සත්ථන්තර, රෝගාන්තර, දුබ්භික්ඛන්තර යයි ත්‍රිවිධය. මෙහි කකුසඳ, කෝනාගමන බුදුවරුන් අතර කල්පයෙහි ඒ සත්වයන්ගේ ලෝභාධික බැවින් සත්මසක් දුබ්භික්ඛන්තර කල්පයයි. එය ඉක්ම නැවත වැඩී අසංඛ්‍යායුෂ්ක මිනිසුන් පිරිහී තිස්වස්දහස් ආයු වූ කල කෝනාගමන නම් මහාවිසුද්ධ භාග්‍යවතුන් වහන්සේ ලොව උපන්හ.

උන්වහන්සේ අටාසංඛ්‍යකප්ලක්ෂයක් පෙරුම් පුරා තුසිතයෙන් සැව සොභනී නගරයෙහි යඤ්ඤදත්ත බ්‍රාහ්මණයන්ගේ අග්‍රභාර්‍යා උත්තර බ්‍රාහ්මණියගේ කුස පිළිසිඳ ගෙන දස මස් ඇවෑමෙන් සුභ

වන උයන්හි මවු කුසින් බිහිවූහ. ප්‍රාතිහාර්‍ය දක්වන ලදි. උපතෙහිදී මුළු දඹදිව රන්ආභරණ වැසි වැස්සේය. කනකාභරණ ගෙන ඒමට හේතු වූ බැවින් උන්වහන්සේට නිමිති දන්නෝ ද නෑයෝ ද කනකාගමන යයි නම් කළහ. එය ක්‍රමයෙන් කෝනාගමන නම් විය. තිස්වසරදහසක් ගිහි ගෙහි විසූහ. තුසිත, සන්තුසිත, සන්තුට්ඨ නම් තුන් පහයක් විය. චිත්තා බැමිණිය ප්‍රමුඛ සොළොස් දහසක් ස්ත්‍රීහු උවටැන් කළහ. සතර නිමිති දැක චිත්තා බැමිණිය අන්තවාන පුතු වැදූ කල ඇත්යානයෙන් මහබිනික්මන් කොට පැවිදි වූහ. තිස්කෙළදහසක් පුරුෂයෝ අනුපැවිදි වූහ. ඔවුන් පිරිවරා සමසක් ප්‍රධත් කොට වෙසක් පෝ දින අග්ගසේනා බැමිණි දියණිය දුන් මධුපායාස වළඳා දෙබර වෙනෙහි දාවල ගෙවා සවස්හි තින්දුක යවපාලකයා දුන් අට තණමිට ගෙන උදුම්බර බෝධිය වෙත දකුණින් එළඹ විසි රියන් තණ ඇතිරි අතුරා එහි පලක් බැඳ අනාවරණ ඤාණය ලැබූහ. එකල අප බෝසත්හු මිථිලා නුවර පඬිබත නම් රජ විය. කෝනාගමන තථාගතයන් වහන්සේ මිථිලා නුවරට වැඩි බව අසා සපිරිවරින් සතුටු සිතින් පෙරගමන් කොට සෙට දිනට ආරාධනා කොට බුද්ධ ප්‍රමුඛ භික්ෂුසංඝයාට මහදන් පුදා වස් විසීමට අයැද තෙමසක් උපස්ථාන කළහ. පත්තුන්න, චීන, පට්ටකම්බල, කොසෙ-ය්‍ය, දුහුල්, කපු, ආදි මාහැඟි සියුම් සළු ද පිදූහ. මුළු දඹදිව වැසිකිළි, කෙසිකිළි ආදිය රන් පාදුකාදිය යොදා පරිභෝගානුරූප සෙනසුන් බඩු ද සම්පත් ද සංවිධාන කළහ. ඉක්බිති කෝනාගමන භාග්‍යවතුන් වහන්සේ මේතෙම මේ භද්‍රකල්පයෙහිම ගෞතම නම් බුදුවන්නේ යයි උන්වහන්සේට විවරණ දුන්හ. විවරණ අසා මහාරාජ්‍යය හැර දමා ඒ බුදුන් වෙතම පැවිදි වූහ. කෝනාගමන බුදුන් පිරිනිවි පසු සසුන ද අතුරුදහන් වූ කල්හි මිනිසුන්ගේ තිස්වස්දහසක් ආයු පිරිහී දසවස් ආයු වූ කල සත්ත්වයන්ගේ ඔජාධික භාවයෙන් සත්ථන්තර කල්පය ඇති විය. එය ගෙවී ගිය පසු නැවත වැඩී අසංඛ්‍යායුෂ්ක වූහ. ඔවුන් පිරිහී විසිදහසක් අවුරුදු වූ කල කස්සප සම්බුදුහු ලොව උපන්හ.

උන්වහන්සේ ද අටඅසංඛ්‍ය කල්පලක්ෂයක් පෙරුම් පුරා තුසිතයෙන් චුතව බරණැස් නුවර බ්‍රහ්මදත්ත බමුණුහුගේ බිරිය වූ ධරවතී බැමිණිය කුස පිළිසිඳ ගෙන දසමස් ඇවෑමෙන් ඉසිපතන මිගදායේ මවු කුසින් බිහි වූහ. කී නියායෙන් දසසහස්‍රී ලෝකධාතු කම්පනාදි පෙළහර විය. කස්සප ගෝත්‍රයේ උපන් බැවින් නිමිති දන්නවුන් හා නෑයෝ කස්සප යයි නම් තැබූහ. උන් වහන්සේ වසර දෙදහසක් ගිහි ගෙහි වීසූහ. හංසවාහ, යසවාහ, සිරිනන්දා යයි තුන් පහයක් විය. සුනන්දා බැමිණිය ප්‍රමුඛ අටසාලිස්දහසක් සත්‍රීහු උවටැන් කළහ. සතර නිමිති දැක සුනන්දා දේවිය විජිතසේන පුතු වැදූ කල්හි මහබිනික්මන් කරමියි සිතනු සමඟම ප්‍රාසාදය කුඹල් සකක් මෙන් පෙරළී අහසට නැග නැකැත් පිරිවැරූ පුන්සඳ මෙන් සපිරිවරින් අහස සරසමින් නිග්‍රෝධ බෝධිය මැදිකොට පොළොවෙහි පිහිටියේය. කස්සප බෝසත්හු බිමට බැස අරහත්ධජය ගෙන පැවිදි වූහ. නළඟනෝ ප්‍රාසාදයෙන් බැස අඩගව්වක් පමණ ගොස් පිරිවර සෙන් සහිතව සිටියහ. ස්ත්‍රීන් හැර සමඟ ආ සියලු පිරිස පැවිදි වූහ. උන්වහන්සේ සතියක් ප්‍රධන් වඩා වෙසඟ මැදි පොහෝ දින සුනන්දා බ්‍රාහ්මණිය පිදූ මධුපායාස වළඳා ඩෙබර වෙනෙහි දිවා විහාර කොට සවස් සමයෙහි සෝම යවපාලකයන් පිදූ අට තණ මිට ගෙන නිග්‍රෝධ බෝධිය වෙත දකුණින් එළඹ පසළොස් රියන් දිග පුළුල් තණ ඇතිරිය අතුරා එහි පලක් බැඳ අභිසම්බෝධියට පත්වූහ. ලෝකානුකම්පා පිණිස වෙපුලිංග නම් නගර රාජධානියෙහි චාරිකාවෙහි යෙදෙමින් වැඩිසේක. දිරූ මහලු මාපියන්ට උපස්ථාන කරන කාශ්‍යප බුදුරජාණන් වහන්සේගේ අග්‍රඋපසථායක සථිකාර නම් කුඹල්කරු, ඕරම්භාගිය සංයෝජන පහ නැසීමෙන් එලොවින් මෙලොවට නොපැමිණෙන ඕපනයිකව එහිම පිරිනිවන්පාන ස්වභාවය ඇත්තේ වෙයි. කාශ්‍යප භාග්‍යවතුන් වහන්සේ ඔහු තුන්වන ඵලයෙහි හික්මවා යළි බරණැසට වැඩ එහි වසන සේක.

මේ අතර අප බෝසත්හු දෙව්ලොව වෙසෙමින් කසුප් බුදු උපත දැක එහි මහාබ්‍රාහ්මණ කුලයකට අනුකම්පා කටයුතුය. සථිකාර

නිසා මාගේ පැවිද්ද සිදුවන්නේ යයි සිතා මහාබඤ්ඣනයෙන් මිදී චුතව ඒ වේපුලිංග නියම් ගමෙහි මහාබ්‍රාහ්මණ කුලයක ඉපිද ත්‍රිවේදයෙහි පාරගත නිඝණ්ඩු කෙටුභ සහිත අක්ෂර ප්‍රභේද සහිතව ඉතිහාසය පස්වෙනි කොට ඇති ශාස්ත්‍රයන්හි පද දත් වියරණ දත් ලෝකායත මහාපුරිෂ ලක්ෂණයන්හි නොදෙවෙනිව හස්ති, අශ්ව, රථ, චක්‍ර ශිල්පයෙහි ද සඳ හිරු නැකැත් සෘතු ස්වප්න ලක්ෂණාදියෙහි ද, මුද්‍රා ගණනාදියෙහි ද පාරගතව ජෝතිපාල නම් මානවකව සියලු ශිල්පයන්හි නිපුණ දිසාපාමොක් ආචාර්යව පන්සියයක් තරුණයන්ට මන්ත්‍ර නානා ශාස්ත්‍ර උගන්වමින් වාසය කළහ. සටීකාර මිත්‍ර සංසර්ග කොටගත් හෙයින් සිය මිසදිටු බමුණුකුලය ඉක්මවීමට සටීකාර ඇසුර හේතුවිය. මේ අතර කාශ්‍යප භාග්‍යවතුන් වහන්සේ යළිත් වේපුලිංගයට පැමිණ උයනෙහි වසන සේක. සටීකාර නොයෙක් දිනවල කාශ්‍යප භාග්‍යවතුන් වහන්සේ විසින් පවත්වන ලද ත්‍රිවිධ කල්‍යාණ ධර්ම දේශනාව අසා සිය යහළුවා සිහි කළේය. අහෝ මාගේ යහළු ජෝතිපාල මෙබඳු බණක් නො අසයි. බුදුරජාණන් වහන්සේගේ සුධොත රන් කැඩපතක් හා සමාන මුවමඬල නොදකී. දෙතිස් මහාපුරිස්ලකුණින් හෙබි භාග්‍යවතුන් වහන්සේගේ රූපශ්‍රීයද නොබලයි. ඔහුට මහාඅනර්ථයකි. මහත් හානියකි. මනුෂ්‍යත්ව ලාභය නිරර්ථකය. මාගේ කල්‍යාණමිත්‍ර ඇසුර නිරර්ථකයයි සිතා ඔහු වෙත ගොස් මිත්‍ර ජෝතිපාලයෙනි. කාශ්‍යප භාග්‍යවතුන් වහන්සේ දැකීමට යමු. ඒ භාග්‍යවත්, අරහත් සම්‍යග් සම්බුද්ධයන් වහන්සේගේ දර්ශනය සාධු සම්මතය යි කීය.

මෙසේ කීකල ජෝතිපාල තරුණයා මිසදිටු බමුණු කුලයක උපන් බැවින් සටීකාර කුම්භකාරට මෙසේ කීය. "යහළු සටීකාර, කමක් නැහැ, මේ මුඩුමහණකු දැකීමෙන් කවර පලක් ද? තුන්වන වර තෙක් කියද්දීත් නො පිළිගත්තේය. සටීකාර ඔහු නොකැමති බව දැන උපායකින් ඔහු ගෙන යනු කැමතිව ජෝතිපාල මාණවකයාට මෙසේ කීය. එසේ නම් යහළු ජෝතිපාලයෙනි, මංගල නහන සුණුගෙන නහන්නට යමුයි කියායි. ඉක්බිති තරුණයා ඔහුගේ කීම

පිළිගෙන තහන මගුල් සුණු රැගෙන හිසෙහි නෑමට ගඟට ගියේය. සටීකාර පසෙක ආයෂ් උපහාරයෙන් පළමු කොට නහා ගොඩට විත් ඒ තරුණයාගේ ඓශ්වර්ය උපහාරයෙන් නෑම අවසන්වීම බලාපොරොත්තුවෙන් සිටියේ ය. ජෝතිපාල රෙදි හැඳ කෙස් බඳින-කල්හි මිත්‍ර ජෝතිපාලයිනි, කාශ්‍යප භාග්‍යවතුන් වහන්සේගේ ආරාමය මේ නොදුරෙහිය. යහළු ජෝතිපාලයිනි, කාශ්‍යප බුදුන් දැකීමට යමු. ගොස් ඒ භාග්‍යවත් අර්හත් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේගේ සාධු සම්මත දර්ශනය ලබමුයි කීය.

මෙසේ කීකල ජෝතිපාල මාණවක සටීකාරට මෙසේ කීය. මිත්‍ර සටීකාර, කමක් නැහැ. මේ මුඩුමහණකුගේ දැකීමෙන් කවර ප්‍රයෝජනයක් ද කීය. සටීකාර මෙසේ සිතීය. මේ ජෝතිපාල ප්‍රාඥයෙකි වරක් බුදුන් දුටහොත් පහදී, පැහැදී පහන් බව පෙන්වීමට ද හැකිවේ. මිත්‍රයෝ නම් මෙබඳු වැඩ සඳහා වෙති. මම මිත්‍ර ප්‍රතිරූපක අමිත්‍රයෙක් නොවෙමි. කුමක් කොට හෝ මගේ යාළුවා කැඳවාගෙන බුදුන් හමුවට යමියි සිතා ජෝතිපාලට මෙසේ කීය. යහළුව, ඊට නොකැමැත්තෙහි ද? එසේය, එසේ නම් මම ඔබ කැමති කරවන්නෙ-මියි කියා අතින් ඇද බෝසතුන් වේගයෙන් තල්ලු කළේය. ඉක්බිති කෙස් වැටියෙන් අල්වා ඇද්දේය. එවිට ජෝතිපාලට මෙසේ සිත් විය.

භවත්නි ආශ්චර්යය. භවත්නි අද්භූතය, සටීකාර අධිපතියෙකු මෙන් මගේ ඉසකෙස් වලින් අල්වා අදී. කියව දීනයෙක් ධීරයෙකු වන්නේ කෙසේ ද? පොඩි දෙයක් මහාවිශිෂ්ට දෙයක් වන්නේ කෙසේ ද? මොහු පෙර කවදාවත් මෙබන්දක් නොකෙළේයයි කරුණු පරීක්ෂා කරමින් එසේ නම් මා අත්හරිනු යමියි කීය. කිමෙක් ද ඇත්තම ද? යහළුව එසේයැ, ඔහු අත හැර මිත්‍ර ජෝතිපාල, එන්න යමුයි කීය. හොඳයි මිත්‍රය, ඔබ ඉදිරියෙන් යන්න. හෙතෙම සටීකාර ඉස්සර කොට ගෙන ගියේය. එවේලෙහි අතීත. වර්තමාන, අනාගත, සියලු කාරණා කාරණායන්හි කුසල වූ කාශ්‍යප ලෝකවිදූ භාග්‍යවතුන් වහන්සේ පිරිස් සමූහය මැද බබළන උතුම් ධර්මාසනයෙහි වැඩ හිඳ

අලාමක උතුම් ලක්ෂණ සහිත වූ දේහයෙන් සුන්දර සවනක් රැස් විහිදුවමින් ධර්මදේශනා කරන සේක. ඒ සියලු බුදුරැස් සියලු පොළොව්තලය හා අහස්තලය බබුළුවමින් දිසානුදිසාවන්හි දිවීය.

ඉක්බිති ජෝතිපාල මාණවක භාග්‍යවතුන් වහන්සේගේ රැස් ජාලා දැකීමෙන් ප්‍රීතිහරිත හදවතින් ආශ්චර්‍ය්‍ය අද්භූතව සාදර වචනයෙන් "මිත්‍රය, මේ කාන්ති ජාලාව කාගේදැ"යි සටීකාරගෙන් විමසීය. මිත්‍ර ජෝතිපාලයිනි, මේ කාශ්‍යප භාග්‍යවතුන් වහන්සේගේ රශ්මි ජාලාවයි. මේ උන්වහන්සේගේ ප්‍රභාවයි. මිත්‍රය, එසේ ද? අහෝ ඒකාන්තයෙන් ගමන සඵලය. මාගේ කෙස් ඇදීමෙන් ඔබ කළේ යුක්තියක්මයි. කියා වැඩුණු ප්‍රීති ප්‍රමෝදයෙන් ආරාමයට පිවිස උදයගිරි මුදුනෙහි නැගුණ ළහිරුමඬල මෙන් කාශ්‍යප භාග්‍යවතුන් වහන්සේ දුටුවේය. දැක පස්වනක් ප්‍රීතියෙන් උදම්වූ සිරුරෙන් බුදුන් වෙත පැමිණ උන්වහන්සේ සමඟ පිළිසඳර පවත්වා පන්සියයක් පිරිවර සමඟ පිරිවරෙහි සිටි භාග්‍යවතුන් වහන්සේගේ සුගත් මුව මඬල බලමින් පසෙක වාඩි විය.

ඉක්බිති කාශ්‍යප භාග්‍යවතුන් වහන්සේ ජෝතිපාල මාණවකයන් දැහැමි කතාවෙන් සමාදන් කරවූහ. තෙදගැන්වූහ. සතුටු කරවූහ. භාග්‍යවතුන් වහන්සේ විසින් දැහැමි කතාවෙන් දක්වන ලද සමාදන් කරවන ලද තෙදගන්වන ලද සතුටු කරවන ලද හෙතෙම ශ්‍රද්ධාවෙන් ප්‍රසාදයට පත්ව නැවතත් පිරිවරක් ගෙන භාග්‍යවතුන් වහන්සේ වෙත ගොස් පැවිදි විය. පැවිදිව තුන් පිටකය ඉගෙන වත් පිළිවෙතින් බුදුසසුන හෙබවීය. කාශ්‍යප භාග්‍යවතුන් වහන්සේ දෙව් මිනිසුන් මැද මෙතෙම මේ භද්‍රකල්පයේම ගෞතම නම් බුදුවන්නේ යයි ප්‍රකාශ කළ සේක. කසුප් බුදුහු විසිවස්දහස් ආයු ඇති ලොව ඉපිද ලෝහිත සලසා කෙලෙස් මළ වැකුණු බොහෝ සතුන් බලා ඒ බොහෝ සතුන්ට අනුකම්පාවෙන් දහම් තඩාගයක් මැවූ සේක. එම ධර්ම තඩාගය නව ලෝකෝත්තර ධර්ම නැමති නිර්මල උතුම් ජලයෙන් සම්පූර්ණ කොට ඒ සඳහා සීල විලේපනය ද දුන්හ. එයද, පන්සිල් දසසිල් සිව්පිරිසිදුසිල් ලෞකිකසිල් ලෝකෝත්තර සිල්

ආදියයි. එම විලේපනය දී ඉක්බිති උතුම් නිර්මල ධර්මඝට ද දුන්හ. එය ද හිරි ඔතප් නම් සාටක යුගලයයි. නැවත ධර්මාභරණ ද දුන්හ. එය නම් සත්තිස්බෝධිපාක්ෂික ධර්මයි. ධර්මාභරණයෙන් සරසා නිර්මල ධර්මාදාසය ද දුන්හ. එය ද සෝතාපත්ති ආදි සතර වැදෑරුම් ධර්මාදාසයයි. එය පීර වීර්‍ය නැමති මිට සහිතය. සැදැහැ අතින් ගෙන සාවද්‍ය නිරවද්‍ය කුසලාකුසල දහම් දැකීම සඳහා වේ. යමෙක් අත්‍යන්ත සැප ඇති නිර්වාණය ප්‍රාර්ථනා කරත් ද ඔවුහු අලංකරණය සඳහා මේ අලංකාරයෙන් දැකිය යුතුය.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ජාති, ජරා මරණ විපත්ති ආදියෙන් උපද්‍රැත ලොව දැක යුද සන්නාහයක් ද දුන් සේක. එම සන්නාහය චතුපාරිසුද්ධශීල කඤ්චුකයයි. ධ්‍යාන කවචයෙන් තිර කොට බැඳ චතුස්සත්‍යධර්මය පෙරවා උත්තම ධුතාංග සන්නාහය ගෙන උත්තම ආර්‍ය භූමියෙහි පිහිටා අයොනිසොමනස්කාර නැමති ඊතල සැත් තොමර ආදිය වළක්වනු පිණිස සතර සතිපට්ඨාන ඵලකය ද චතුස්සත්‍ය ප්‍රතිලාභයට සමර්ථ තියුණු විදර්ශනා ඥාන නැමති තුන්තය දරමින් සියලු කෙලෙසුන්ට නිග්‍රහ කිරීම පිණිස යෝගාවචර යෝධයාට දීමයි. එම යෝධයාගේ ස්ථිර වීර්‍යය නැමති තියුණු මුවහත් යුත් මාර්ගඥාන කඩුව ගෙන තෘෂ්ණා සංසර්ගය මර්දනය සඳහා උතුම් වූ භාග්‍යවතුන් වහන්සේ ත්‍රිවිද්‍යාවෙන් අලංකාර වූ ලෝකයාට ලබාදී, ආභරණ සඳහා.

> නිර්මල ධර්මය නැමති කැඩපත ද තුන්පිටකය නැමති අඳුන් ද නිර්වාණය ප්‍රාර්ථනා කරන ජනයා විසින් මේ අලංකාර දැකිය යුතුය. සීලය නැමති කඤ්චුකය ද තියුණුඤාණය නැමති තුන්තය ද තෘෂ්ණා සංසර්ගමර්දනය කරන්නාවූ උතුම් ධර්මය නැමති කඩුව ද දී ත්‍රිවිද්‍යා නැමති ආභරණ ද චතුර්විධ ඵලයන් නැමති සැරසිලි ද ෂඩභිඥා ආභරණ ද සද්ධර්මය නැමති පණ්ඩර ඡත්‍රය ද දී සත්වයන් සසරින් මුදා ඒ බුදුහු පිරිනිවියහ.

උන්වහන්සේගේ ධාතූහු රිදී පිළිමයක් මෙන් නොවිසුරුණහ. සියලු දඹදිව් වැසි මිනිස්සු යොදුනක් උස රන් සෑයක් කරවූහ.

මෙසේ අප බෝසත්හු දීපංකරාදී සූවිසි බුදුවරුන් හමුවෙහි පැතුම් පතමින් විවරණ ලැබූහ. යම් කල්පයක දීපංකර ශාස්තෘන් වහන්සේ පහළ වූ සේක් ද එම කල්පයෙහිම තණ්හංකරාදී තුන් බුදු කෙනෙක් වූහ. එනමුත් උන්වහන්සේලා හමුවෙහි අප බෝසතුන්ට විවරණයක් නොවීය. එහෙයින් මෙහි නොදක්වන ලදි. අටුවාවෙහි වනාහි තණ්හංකර බුදුරදුන්ගේ පටන් සියලු බුදුවරුන් වහන්සේලා දැක්වීමට මෙසේ කියන ලද්දේය.

> තණ්හංකර, මේධංකර, දීපංකර, කොණ්ඩඤ්ඤ, මංගල, සුමන, රෙවත, සොභිත, අනෝමදස්සි, පදුම, නාරද, පදුමුත්තර, සුමේධ, සුජාත, පියදස්සි, අත්‍ථදස්සි, ධම්මදස්සි, සිද්ධත්‍ථ, තිස්ස, ඵුස්ස, විපස්සී, සිඛී, වෙස්සභූ, කකුසන්ධ, කොනාගමන, කාශ්‍යප යන මේ වීතරාගී සමාහිත සම්‍යග් සම්බුදුහු මහා-මෝහාන්ධකාරය දුරු කරන සූයාීයන් මෙන් උපන්හ. ගිනි කඳන් මෙන් දිලිසී ශ්‍රාවක සංඝයා සහිතවූ උන්වහන්සේලා පිරිනිවි සේක.

කාශ්‍යප බුදුරජාණන් වහන්සේගෙන් එපිට මෙතෙක් වූ සම්මා සම්බුදුරජාණන් වහන්සේලා හැර වෙනත් බුදුවරු මේ පූර්ව බුදුවරයන් වහන්සේලා අතර නොමැත්තාහ. අප බෝසත්හු මෙතෙක් බුදුවරුන් හමුවෙහි අෂ්ටධර්ම සමෝදානයෙන් යුතුව පැතුම් පතා විවරණ ලැබූහ. මෙලෙස උන්වහන්සේ සාරාසංඛ්‍ය කප් ලක්ෂයක් පැරුම් පුරමින් පැමිණියහ. තවද පැතුම් පැතූ බෝසත් වරුන්ගේ ආනිසංසයෝ වෙති. ඒ කවරහු ද?

> මෙසේ සර්වාංග සම්පූර්ණව බෝධියට නියතවූ පුරුෂයෝ කල්ප කෝටි සියගණන් දිගුකල් සසර සැරිසරන නමුත් අවීචි-යෙහි නූපදිති. ලෝකාන්තරිකවල ද නූපදිති. නිප්ඣාමතණ්හික නොවෙති. සාපවසට නොපත්වෙති. කාලකඤ්ජික නොවෙති. ක්ෂුද්‍ර ප්‍රාණීහු නොවෙති. දුගතියෙහි නූපදිති. මිනිසුන් අතර උපදනාහු ජාතිඅන්ධයෝ නොවෙති. ඔවුන්ට විකල බවක් නොවෙයි. ස්ත්‍රී බවට නොයෙති. උභතොබ්‍යංජක පණ්ඩක

නොවෙති. බෝධියට නියත වූ ජනයා ආනන්තරික පාපයන්-ගෙන් මිදී හැම තන්හි සුද්ධගොචර ඇතිව කම්වාදීව, ක්‍රියාවාදීව මිථ්‍යාදෘෂ්ටි සේවනය නොකරති. ස්වර්ගයෙහි උපදනාහු අසඤ්ඤීව නූපදිති. සුද්ධාවාස දෙවියන් අතර ඉපදීමට හේතු නැත්තේය. නෛෂ්ක්‍රම්‍යයට නැඹුරු වූ සත්පුරුෂයෝ භවයේ නොඇලෙති. ලෝකාර්චය්‍යාවෙහි ද ඤාත්‍යර්ථචරියාවෙහි ද බුද්ධාර්චර්යාවෙහි ද හැසිරෙති. සියලු පාරමී පුරති.

මෙසේ අභිනීහාර කළ බෝසත්වරුන්ගේ ආනිසංස වර්ණනා කළේයයි දත යුතු. අප බෝසත්හු මෙසේ සර්වාංග සම්පූර්ණ දාන පාරමිතාදි බුද්ධකාරක ධර්මයන් පුරමින් කාශ්‍යප සම්බුදුන් සමීපයෙක් පැමිණියහ. කසුප් සම්මා සම්බුදුන් පිරිනිවී කල්හි උන්වහන්-සේගේ සසුන අතුරුදහන් වීමෙන් විසිදහසක් ආයුඇති මිනිසුන් පිරිහී දසදහසක් අවුරුදු වූ කල්හි සත්ත්වයන්ගේ මෝහාධිකතාව හේතුවෙන් අඩසිව්මසක් රෝගාන්තර කල්පයකි. එය ද ඉක්ම නැවත මිනිසුන් අපරිමිත ආයුෂයෙන් පිරිහී සිය වසක් ආයු වූ කල්හි අපගේ අසම නායක බෝසතාණෝ දිවකුරු පාමුල්හි පටන් සාරාසංඛ්‍ය කප්ලක්ෂයක් පැරුම් පුරා සියලු බෝධිඥාන මුහුකුරවා කුසල් මුල් වඩා ත්‍රිවිධ චර්යා විශෝධනයෙන් ජාතක ගළපා වෙස්සන්තරව පඤ්චමහාපරිත්‍යාග කොට තුසිපුරයෙහි උපන්හ.

දිවකුරුබුදුසිරිපා මුල පටන් තුසිපුර උපත තෙක් මෙය දූරෙනිදාන නම්.

අවිදූරෙ නිදානය කවරේද යත්, බෝසතුන් තුසි පුරයේ වසද්දීම බුද්ධ කෝලාහලය නම් කෝලාහලයක් උපන්නේය. මේ ලෝකයෙහි කෝලාහල තුනක් උපදී. කප්ප කෝලාහල, බුද්ධ කෝලාහල, චක්ක-වත්ති කෝලාහල කියායි. එහි වෂී ලක්ෂයක් ඇවෑමෙන් කප නැසීම වන්නේයයි ලොකබ්‍යූහක නම් කාමාවචර දෙවියෝ කෙස් මුදා ගෙන

කෙස් විසුරුවා දුර්මුඛව අතින් කඳුළු පිසිමින් රතු පිළි හැඳ අතිශයින් විරූප වෙස්ගෙන සැහැසි හැසිරීම් ඇතිව මිනිස් පියසෙහි හැසිරෙමින් මෙසේ දන්වති. "නිදුක්වරුනි, නිදුක්වරුනි, මෙයින් කප් ලක්ෂයක් ඇවෑමෙන් කල්ප විනාශය වෙයි. මේ ලෝකය නස්නේය. මහමුහුද ද වියැලෙයි. මේ පොළවත් මහමෙරත් උඩඟයි. විනාශවෙයි. බඹලොව දක්වා වැනසෙයි. නිදුක්වරුනි, මෛත්‍රිය වඩව් කරුණාව. මුදිතාව, උපෙක්ෂාව වඩව්. මව්පියන්ට උපස්ථාන කරව්, කුලදෙටුවන් පුදව්" කියායි. මෙය කල්ප කෝලාහලය නමි.

චක්කවත්ති කෝලාහලය නම් කෙසේ ද? කාමාවචර දෙවියෝම සියලු අබරණින් සැරසී මෙයින් වසර දහසක් ඇවෑමෙන් සක්විති රජෙක් ලොව පහළ වෙතැයි මිනිස් පියසෙහි හැසිර ඝෝෂා කරති. මේ චක්‍රවර්ති කෝලාහලය නමි.

බුද්ධ කෝලාහලය කෙසේ ද? සුද්ධාවාස දෙවියෝ බඹගණ සමඟ සැරසී හිසෙහි බඹවෙළුම් වෙළා ප්‍රීති සොම්නසින් බුදුගුණ භරිතව වසර දහසකින් පසු බුදුහු ලොව උපදිතියි මිනිස් පියසෙහි හැසිර ඝෝෂා කරති. මෙය බුද්ධ කෝලාහලය නමි. මේ තුන් කෝලාහලය වෙයි. එයින් බුද්ධ කෝලාහල ශබ්දය අසා දස දහසක් සක්වළ දෙවියෝ ද, බ්‍රහ්මයෝ ද එකට රැස්ව අසවල් නම් සත්වයා ලොව බුදුවන්නේයයි උපත් චුති නිමිති ඇති බෝසතුන් වෙත පැමිණ දීප, ධූප, සුවඳ මාලාදිය පුදා" නිදුකාණෙනි, ඔබ දසපැරුම් පුරමින් ශක්‍ර සම්පත් සඳහා නොපුරන ලදි. මාර සම්පත් පතමින් නොපුරණ ලදි. බඹ සැප පතා නොපුරන ලදි. සක්විති සැප සඳහා නොපුරන ලදි. සකල ලෝක තරණය සඳහාම සර්ව්ඥතාඥානය පතමින් දස පැරුම් පුරන ලදි. නිදුකාණෙනි, බුදුබව සඳහා දැන් කාලයයි. නිදුකාණෙනි, බුදුබව සඳහා ඔබ වහන්සේට දැන් කාලයයි කියා උන් වහන්සේට ආයාචනා කරති. ඉක්බිති බුද්ධෝත්පාදය කැමති සමසිත් සමසිරුරින් බඳැදිලි ඇති බබළන ආභරණයෙන් යුත් බ්‍රහ්මශක්‍රාදි දේවසමූහයා විසින් මැනවින් ආරාධනා කරන ලද මහසත්හු සැම බෝසතුන්ට ආවේර්ණ මහාවිලෝකන විලෝකනය කළහ.

කාලය දීපය ද දේශය ද කුලය ද මව ද යන මේ පහ බලා මව්කුසට පැමිණියහ.

උන්වහන්සේ දෙවියන්ට ප්‍රතිඥා දී පස් මහබැලුම් බලන්නේ පළමුව කල් බැලූහ. එහි වෂී ලක්ෂයකින් උඩ වැඩි ආයු කාලය අකාල නම් වේ. එකල සතුන්ට ජරා, මරණ නොපෙනේ. බුදුවරුන්ගේ ධර්මදේශනා ත්‍රිලක්ෂණයෙන් මුක්ත වූයේ නොවේ. අනිච්චං, දුක්ඛං, අනත්තා යයි කියන විට ඔවුන්ට මේ කුමක් කියන්නේ දැයි අහන්නට අදහන්නට නොසිතෙයි. එබැවින් නොවැටහෙයි. නොවැටහෙන කල බුදුසසුන අනෙයර්‍යාණික වෙයි. එහෙයින් එය අකාල නම් වෙයි. වසර සියයකින් අඩු ආයු කාලය ද අකාල නම් වෙයි. කුමක් නිසා ද, එකල කෙලෙස් උත්සන්න බැවින් සත්ත්වයෝ ශාස්තෘන් වහන්සේගේ අවවාදයෙහි නොපිහිටති. දියෙහි අඳින ඉරක් මෙන් ක්ෂය වෙයි. එබැවින් එය ද අකාලයයි. වෂී ලක්ෂයෙහි පටන් යට වෂී සියය තෙක් වූ කාලය කාල නම් වෙයි.

ඉක්බිති මහසත්හු මේ ඉපදිය යුතු කාලයයි සියවස් කාලය බලා අනතුරුව දීපය බලන්නාහු පිරිවර සහිත සතර දීපය බැලූහ. දීප තුනක බුදුවරු නූපදිති. දඹදිවම උපදිත්. දඹදිව නම් විශාලය. දස දහසක් යොදුන් ප්‍රමාණය. කවර පෙදෙසක උපදිත්දැයි දේශය බලන්නේ, මධ්‍යම දේශය දුටහ. මධ්‍යම දේශය නම් දිගින් තුන්සිය යොදුනකි. පුළුලින් යොදුන් දෙසිය පනසකි. වටින් නවසිය යොදුනකි. එහි පෙරදිගින් කජංගල නම් නියම්ගමයි. ඉන් මෙපිට මහාසාලයයි. ඉන් පසු ප්‍රත්‍යන්ත ජනපදය වෙයි. එයින් මධ්‍යයයි. ගිනිකොණින් සලලවතී නදියයි. ඉන්පසු ප්‍රත්‍යන්ත ජනපදයයි. එයින් මධ්‍යයෙහිය. දකුණින් සේතකර්ණි නියම්ගමයි. එයින් එපිට ප්‍රත්‍යන්ත ජනපදයි. ඉන් මධ්‍යයෙහිය. පැසුළු දෙසින් ථූන නම් බමුණුගමයි. ඉන්පසු ප්‍රත්‍යන්ත ජනපදයි. ඉන් මධ්‍යයයි. උතුරින් උසීරද්වාජ පර්වතයයි. ඉන්පසු ප්‍රත්‍යන්ත ජනපදයයි. ඉන් මධ්‍යයයි. මේ මධ්‍යම දේශය නම්.

මෙය දිගින් තුන්සියයක් යොදුනකි. පුළුලින් දෙසිය පනසකි. මධ්‍යම දේශ මණ්ඩලය යොදුන් නවසියයකි.

මේ පෙදෙසෙහි බුදු පසේබුදු අග්‍රශ්‍රාවක අසූමහාශ්‍රාවක සක්විති රජවරු සහ කළ පින් ඇති අන්‍යයෝ ද මහේශාක්‍ය ක්ෂත්‍රිය, බ්‍රාහ්මණ, ගෘහපති මහාසාරයෝ ද උපදිති. මේ කපිලවත්ථු නම් නගරයයි. එහි මා ඉපදිය යුතු යැයි බලා ඉක්බිති කුලය බැලූහ.

බුදුවරු නම් ලෝක සම්මත කැත්කුලයෙහි හෝ බමුණු කුලයෙහි උපදිති. කුලය බලන්නේ අසම්හින්න කැත්කුලය දුටහ. මම එහි උපදිමි. සුද්ධෝන මහරජ මාගේ පිය වෙයි කියා කුලය දැක ඉක්බිති මැණියන් බැලීය. බුද්ධමාතාව නම් ලෝලී සුරාධුර්ත නොවේ. කප් ලක්ෂයක් පැරුම්පුරා උපතෙහි පටන් නොකඩ පන්සිල් ඇත්තී වෙයි කියා මැණියන් බලන්නේ සුදොවුන් මහරජුගේ මහ මෙහෙසි මහා මායා දේවිය දුටහ. මැය මාගේ මව වන්නීය. ඇගේ ආයුෂ කෙතෙක් දැයි බලන්නේ දසමසින් මතු සත් දිනකැයි දුටහ. මේ පස් මහබැලුම් බලා නිදුක්වරුනි, බුදුබව සඳහා මට කාලයයි. දෙවියන්ට සංග්‍රහ කරමින් ප්‍රතිඥා දී තෙපි යව් කියා ඒ දෙවියන් පිටත් කොට තුසිත දෙවියන් පිරිවරා තුසිපුර නඳුනුයනට පිවිසියහ. සියලු දෙව්ලොව්හි නැඳන වනය ඇත්තේය. එහි ඒ දේවතාවෝ නිදුකාණෙනි, මෙයින් චුතව සුගතියට යනු මැනවි. මෙයින් චුතව සුගතියට යනු මැනවැයි පෙර කළ කුසල දහම් සිහිගන්වමින් හැසිරෙති. උන්වහන්සේ මෙලෙසින් කුසල් සිහිගන්වන්නා වූ දෙවියන් පිරිවරා එහි හැසිරෙමින් චුතව කිඹුල්වත්පුර සුදොවුන් මහ රජුගේ අගමෙහෙසි මහාමායා දේවිය කුස්හි පිළිසිඳ ගත්හ. එය ප්‍රකට කිරීම පිණිස මේ පිළිවෙළ කතාවයි.

එකල කිඹුල්වත් පුරයෙහි ඇසළ පුන් පොහොයෙහි ඇසළ නැකත් කෙළි සෝභා කරන ලද්දේය. මහජනයා නැකැත් කෙළි කෙළිති. මහාමායා දේවිය ඇසළ පුණු පොහොයට පළමුවම සත් දිනක පටන් සුරාපාන මාලාගන්ධ විලේපන, විභූෂණ සම්පත්වලින්

තොරව නැකැත් කෙළියෙහි යෙදෙන්නී සත්වන දින පාන්දරින්ම නැගිට ගඳදියෙන් නහා හාරලක්ෂයක් වියදම් කොට දන් දී සවිලංකාරයෙන් සැරසී වරබොජුන් වළඳා උපෝසථාංග ඉටා මනාව සැරසූ යහන් ගැබට පිවිස සිරි යහන්හි හෙව නිදන්නී මේ සිහිනය දුටුවාය. සිව්වරම් මහරජවරු සයනය සමඟින් ඇය ඔසවාගෙන හිමවතට ගොස් සැට යොදුන් මනොසිලා තලයක සත් යොදුන් මහසල්රුකක් යට තබා පසෙක සිටියහ. ඔවුන්ගේ දේවිවරු පැමිණ දේවිය අනෝතත් විලට ගෙන ගොස් මිනිස් කිළුටු දුරු කිරීමට නහවා දිවසළු අන්දවා දිවසුවඳ තවරා දිවමල් පළඳවා ඒ නුදුරෙහි රිදී පර්වතයක ඇතුළත රන් විමනක් වෙයි. එහි පිවිස දිව්‍ය සයනය පනවා දේවිය නිදි කරවූහ. එවිට බෝසත්හු සුදුඇත් වෙස් ගෙන ඉන් නුදුරෙහි රන් පර්වතයක ඇවිද ඉන් රිදී පර්වතයට බැස උතුරු දිගින් පැමිණ රිදීවන් සොඬින් සුදුපියුමක් ගෙන කුඤ්ච නාද කොට රන් විමනට පිවිස මැණියන්ගේ යහන තෙවරක් පැදකුණු කොට ඇගේ දකුණු පස පළාගෙන කුසට පිවිසෙන්නාක් මෙන් විය. මෙසේ මහසත්හු ඇසළ නැකතින් පිළිසිඳ ගත්හ.

දෙවන දින දේවිය පිබිද සිහිනය රජුට දැන්වූවාය. රජ සැටක් පමණ ප්‍රමුඛ බමුණන් ගෙන්වා කසාලේප කොට ජලාදියෙන් මංගල සත්කාර කළ භූමියෙහි මාහැඟි අසුන් පනවා එහි හුන් බමුණන්ට ගිතෙල් මී සකුරු ආදියෙන් සැකසූ මිකිරිබත් රන් බඳුන් පුරවා රන් බඳුනින්ම වසා මාහැඟි නොඉදුල් වස්ත්‍ර ද පොහොර දෙනුන් ආදි වෙනත් දෙයින් ද ඔවුන් සතුටු කළේය. ඉක්බිති කැමති සියලු දෙයින් සතුටු කරවූ ඔවුන්ට සිහිනය දන්වා කුමක් වන්නේ දැයි විමසීය. බමුණෝ මහරජ, නොසිතුව මැනව, දේවියගේ කුසෙහි දරු ගැබක් පිහිටියේය.

ඒ වනාහි මහාපුරුෂ ගර්භයකි. ඔබට පුතෙක් වන්නේය. ඉදින් ඔහු ගිහිගෙහි වාසය කළහොත් සක්විති රජ වන්නේය. පැවිදි වුවහොත් ලොව කෙලෙසුන් නැසූ සම්බුද්ධ වන්නේය. බෝසතුන්ගේ පිළිසිඳ ගැනීමත් සමඟ එකවරම මුළු දසසහස්‍රී ලෝකධාතුව කම්පා

විය. ප්‍රකම්පා විය. අපමණ මහත් ආලෝකය ලෝකාන්තරිකය පවා ආලෝක කරමින් උපන්නේය. අවීචි ගිනිදැල් නිවී ගියේ ය. ලොහොකුඹුව සිහිල් දියෙන් පිරීගියේය. සියලු බන්ධන කැඩී ගියේය. කාලසූත්‍රය සිඳුණේය. වෑ පොරෝ ආදි ආයුධ දඬු රහිත විය. අංගාර පර්වතය නිවුණේය. අසිපත්‍ර මුල් සිඳී වැටුණේය. කටුඉඹුලෙහි කටු සුන්විය. තියුණු මුවහත් කැඩී ගියේය. යහුල් නැතිවිය. වේතරණියෙහි ක්ෂාරොදක නිවී ගියේය. වේතරණි කටු අධෝමුඛව ගියේය. අසුචිනිරය වියලුණේය. හළු නිරය මනා කෙළවර ඇත්තේ විය. නිරය පාලයෝ ව්‍යාපාර රහිතව හුන්හ. නිරී සත්ත්වයෝ සැප ඇතිව සැනසිලි ලැබූහ. රියසක් නොපෙරලුණේය. නිදිගත් සතුන් මෙන් ක්ෂුද්‍රප්‍රාණීහු ගැටරහිත වූහ. සියලු සත්හු උනුන් හැඳින්නාහ. තිරිසන් ගත සත්තු උනුන් ව්‍යාපාද රහිත වූහ. ප්‍රේත විෂයෙහි සත්ත්වයෝ සාපවස් රහිත වූහ. කාලකන්ජික සඤ්ඤයෝ නො තැවුණහ. මහජනයා රෝග රහිතව කෙලෙස් ගිනි දාහ රහිතව සැනසුම් ලැබූහ. මූඪගර්භ සුවසේ ප්‍රසව විය. අන්ධයෝ දුටහ. බිහිරෝ ඇසූහ. ගොළුවෝ මිහිරි වදන් බිණූහ. පිල්ලු සෘජු පා ඇතිව කැමති සේ ගමන් කළහ.

විදෙස්ගත නැව් සිය නිවැරදි පටුන්වලට පැමිණියේය. පක්ෂීහු පියා සැලීම් රහිතව පොළොවෙහි මෙන් සිටියහ. තිරිසන්නු මිනිස් ඇසුර ලැබූහ. මහසුළං නොහැමීය. සයුර මිහිරිදිය ඇති නොකැළඹුණ පළිඟු ගල්තලාවක් මෙන් රළ රහිත විය. ගඟ දිය නොගැලීය. සියලු දිය පහරවල් ගලා නොබැස්සේය.

සියලු විල් උතුරා ගැලීය. මුහුදෙහි සීදන්ත සාගරයෙහි, ගංගාවන්හි, පොළොවෙහි, රුක් කඳ වෙළෙප්හි ලතාවන්හි අහස්හි පස්වනක් පියුම් පිපුණේය. සත ගල්තලාවල එක් දණ්ඩෙහි පැනනැඟී මල් ඡත්‍ර ත්‍රිඡත්‍ර මෙන් පහළවිය. සියලු මල්පල හටගන්නා රුක් මල් ඵල ඇතිවිය. අකනිටාවත් පොළොවත් අතර අහස වැසූ ධජ පතාක චාමර විය. දසදහසක් සක්වළ විවිධ පූජෝපකරණයෙන් සැරසුණේය. තුටු පහටු දෙවියෝ විවිධ වේසාලංකාරයෙන් ඇදිලි බැඳ නැමුණහ. බමුණු ගණයා තුති මඟුල් පුදා උදම් ඇනූහ. දේව මානුෂික තූර්ය

තනිවම වාදනය විය. සතුටු ආකාර සත්වයෝ සිනාසුණහ. ඇත්තු කුඤ්චනාද කළහ. මිනිසුන්ගේ අත්පාවල සියලු ආභරණ නාද විය. සියලු දිසා පැහැදිලිව බැබළුණේය. නොයෙක් පෙළහර පහළ විය.

මෙසේ පිළිසිඳගත් බෝසතුන්ගේ සහ මෑණියන්ගේ උවදුරු දුරු කිරීම පිණිස කඩුගත් අත් ඇති ලෝකපාලයෝ සතර දිග රැකවල් ගත්හ. බෝසත්හු අනන්ත යසසින් අපරිමිත සැපතින් මව් කුස පිළිසිඳ දොළොස්රියන් රන්මුවා පර්යංකයෙක්හි සිටියෙකු මෙන් මව් කුසෙහි සම්බාධ රහිතව මිණිවිමන්හි හුන් මහාබ්‍රහ්මයා මෙන් ගැබ්මළ නොතැවරී කිසිදු අසුචියකින් නොමුසුව හිඳ නොමුළා සිහියෙන් නොසිඳි කරුණාවෙන් සත්වානුග්‍රහ කරුණාවෙන් නිතොරව කාලය බලමින් දස මසක් මව් කුස විසූහ.

එකල බෝසත් මාතාවෝ සුවපත්ව ක්ලාන්ත නොවූ සිරුරින් යසලාභ අගපත්ව අනුමාත්‍ර වූ හෝ පුරුෂ රාගයක් නූපදවා තම කුසෙහි හුන් බෝසතුන් පැහැදිලි මිණි රුවනක ඇමුණූ පඬු නූයක් මෙන් දක්නාහ. බෝසතුන් විසූ කුස චේතිය ගර්භයක් හා සමානය. වෙනත් සතෙකු විසින් විසීම හෝ පරිභෝග කළ නොහැකිය. එහෙයින් බෝසත් මාතාව බෝසතුන් ඉපිද සත්දිනකින් කලුරිය කොට තුසී පුරයෙහි උපන්නාහ. අන් ස්ත්‍රීහු දසමස් නොපිරී හෝ ඉක්මවා හෝ ප්‍රසූත කරන්නාහ. බෝසත් මාතාව එසේ නොවන්නීය. ඕ තොමෝ දසමසක් බෝසතුන් කුසින් දරා සිටිවනම ප්‍රසූත කරන්නීය. මේ බෝසත් මෑණියන්ගේ ධර්මතාවයි. මහාමායා දේවිය ද තෙල් පාත්‍රයක් පරිහරණය කරන්නාක් මෙන් බෝසතුන් දස මසක් කුසින් දරා පිරිපුන් ගැබින් සිය ගැබ පෙරහැර දැන දෙව්දහ නුවර සිය පියාණන් වෙත යනු කැමැත්තී "දේවයන් වහන්ස, කුලසන්තක දෙව්දහනුවරට යනු කැමැත්තෙමි"යි සුදොවුන් රජුට දැන්වූවාය. රජ මැනවයි ඇගේ වචනය පිළිගෙන කපිලවස්තුවේ පටන් දෙව්දහ නුවර තෙක් මඟ සමකොට උක්, කෙසෙල්, පුන්කලස් ධජ පතාකාදියෙන් සරසවා වෙසක් පුන් පොහෝ දින පෙරවරු දේවිය රන්සිවි ගෙයක හිඳුවා දහසක් ඇමතියන් ලවා ඔසවා මහපෙරහරින්

යැවිය. දෙනුවර අතර ලුම්බිනි වන නම් මඟුල් සල්වනයක් ඇත. එසමයෙහි එය මුල පටන් අග තෙක් සියල්ල මලින් පිරුණේය. අතු මල් අතර පස්වනක් බමර සමූහයා පිරී සිටිති. කොවුලන් ආදි නානාවිධ සකුණ සමූහයා මිහිරි නදින් කුජනය කරමින් හැසිරෙති. සකල ලුම්බිනි වනය නන්දන වනය, චිත්‍රලතා වනය මෙන් රමණීය විය.

සල්වනය දුටු දේවියට එහි ක්‍රීඩා කරනු රිසිවිය. ඇමතියෝ දේවිය සල්වනයට ඇතුළු කොට මඟුල් සල්ගස මුල බැස්වූහ. දේවිය කිරි මවුවරුන් පිරිවරා මඟුල් සල් අත්තක් ගනු කැමති වූවාය. එවිට ශාල ශාඛාව තැවූ වෙයගක් මෙන් නැමී දේවියගේ අත පත්විය .ඈ අත දිගු කොට නැවුම් ශාඛාව අල්වා ගත්තාය. එකෙණෙහිම විලිරුදා ඇති විය. දේවිය ශාල ශාඛාවෙහි එල්බ සෝභමානව සිටිවනම සිටියාය. දසදහසක්සක්වළ දෙවියෝ එහි රැස්වූහ. බෝසත්හු ඒ වෙසක් පුන් පොහෝ දින විසා නැකතින් මහත් මේඝ පටලයකින් නිකුත් ළහිරු මෙන් මව්කුසින් සුවිසුද්ධව බිහිවූහ.

යම් සේ අන් සත්හු යොනිමඟ ගෑවෙමින් අසූචි කිළුටින් තැවරී බිහිවෙත් ද බෝසත්හු එසේ බිහි නොවෙති. යම් විටෙක බෝසත්හු මව් කුසින් නික්මෙත් ද යෝනිමඟ නොගෑවී සෙම් ලේ නොතැවරී කිසිදු අසූචියකින් නොගෑවි කසී සළුවක තබාලූ දැරඟ මිණක් මෙන් අත්‍යන්ත සුවිසුද්ධව බිහිවෙති. යම්සේ අන් සත්හු විලිරුදාවෙන් පා උඩුකුරුව හිස යටිකුරුව යෝනි මාර්ගයෙන් පුරුෂයන් සත් දෙනෙකු පමණැති ප්‍රපාතයකින් පෙරළෙන්නාක් මෙන් මහදුක් විඳීමින් බිහිවෙත් ද බෝසත්හු එසේ නොවෙති. උන්වහන්සේ වනාහි ධර්මාසනයෙන් බසින ධර්මකථිකයකු මෙන් පඩිපෙළකින් බසින පුරුෂයෙකු මෙන් දෙ අත් දෙපා දිග හැර හිටිවනම මවට දුක් නූපදවා බිහිවෙති. නික්මෙද්දී ද පොළොවට පා නොතැබියදීම සුදවැසි මහාබ්‍රහ්මයෝ සතර දෙනෙක් රන්දැලින් පිළිගෙන දේවිය ඉදිරියේ සිට "දේවීනි, සතුටු වුව මැනවි. ඔබට මහේශාක්‍ය පුතෙක් උපන්නේයයි" කීහ. එවිට අහසින් දෙදිය දහරක්

නික්ම බෝසතුන්ගේ හා බෝසත් මාතාවගේ ශරීරයට සත්කාර පිණිසත් සෘතු ගැන්වීම පිණිසත් වැගිර ගියේ ය.

ඉක්බිති මහාබ්‍රහ්මයන්ගේ අතින් ලෝකපාල සතර වරම් රජහු මංගල සම්මත සුව පහසු අඳුන් දිවි සමින් බෝසතුන් පිළිගත්හ. ඔවුන් අතින් කිරි මවුවරු දුහුල් සළුවකින් බෝසතුන් පිළිගත්හ. කිරි මවුවරුන් අතින් මිදී තමන් වහන්සේ එකෙණෙහිම ඉපිද සිය පයින්ම පොළොවෙහි සිට මහබඹු දිවසේසත් දරද්දී, සුයාම දෙවියන් සෙසු රාජ කකුධ භාණ්ඩ ගත් අත් ඇතිව අනුගමන් යද්දී මහසත්හු පූර්ව දිශාව බැලූහ. එවිට පෙරදිග දසදහසක් සක්වළ දිව්‍ය සමූහයා ද සියලු මිනිස්සු ද මල්වරුෂාදි පුජා කරමින් දොහොත් මුදුන් දී "මහා පුරුෂය, මෙහි ඔබට සමවුවෙක් නැත. උත්තරීතරයෙක් කොයින්දැයි" කීහ. මෙසේ පශ්චිම දිශාව, උතුරු දිශාව, දකුණු දිශාව, යන සතර දිශාව ද සතර අනුදිශාවද උඩ යට යන දිසා විදිසාවන් බලා තමාට සමවූවකු නොදැක මේ උතුරු දිශාව යයි සලකා උත්තර දිශාභිමුඛව සත් පියවරක් ගොස් පියුම් පිට පිහිටා අට අඟකින් යුත් අත්‍යන්ත කණීය රසායන සුබකර බඹසර විහිදුවමින් මෙවදන් පැවසූහ.

මම ලොවට අග්‍රවෙමි, මම ලොවට ජ්‍යෙෂ්ඨ වෙමි, මම ලොවට ශ්‍රේෂ්ඨ වෙමි, මේ අන්තිම ජාතියයි. දැන් පුනර්භවයක් නැත්තේය.

එකෙණෙහි දසසහස්‍රී ලෝකධාතුව හාත්පසින් කම්පා විය. වෙවුලා ගියේය. අපමණ මහත් ආලෝකය පහළවිය. අහසෙහි පොළොවෙහි තත් යෙදූ වීණා සම් යෙදූ බෙර කිසිවෙකුත් වාදනය නොකොට වාදනය විය. සඳ අතිශයින් බැබළුණේය. ඉරු අතිදීප්ත ද නොව අති සිසිල් ද නොව නිර්මල සෘතු සම්පන්න විය. සතර දීවයින්හි මහවැසි වැස්සේය. සියලු දිග් බැබළී ගියේය. උපන් මොහොතෙහි පිළිසිඳීමෙහි දී මෙන් මේ සියලු පෙළහර පෙර නිමිති පහළ විය.

එසේම දසසහස්‍රී ලෝකධාතු කම්පනය සර්වඥතාඥාන ලාභයට

පෙරනිමිති යයි දත යුතු. දෙවියන්ගේ එක් සක්වළ සන්නිපාතය දම්සක් පවත්වන වේලෙහි එකපැහැර රැස්ව දහම් පිළිගැනීමට පෙරනිමිත්තයි. පළමුව දෙවියන්ගේ පිළිගැනීම සිවු අරූ දැහැන් ලැබීමට පෙරනිමිත්තයි. පසුව මිනිසුන්ගේ පිළිගැනීම සිවුදැහැන් පිළිගැනීමට පෙරනිමිත්තයි. සිය පයින් පොළෝ පිහිටීම සතර ඍද්ධිපාද ලැබීමට පෙරනිමිත්තයි. උතුරු දිශාභිමුඛවීම මහජනයා මැඩ පැතිර ධර්මාභිසමය වීමට පෙරනිමිත්තයි. සත්පියවර තැබීම, සප්තබෝධ්‍යාංග ලැබීමට පෙරනිමිත්තයි. සේසත් දැරීම විමුක්ති සේනා ලැබීමට පෙරනිමිත්තයි. පඤ්ච රාජ කකුධ භාණ්ඩ පඤ්ච විමුක්තියෙන් විමුක්තවීමට පෙරනිමිත්තයි. දිසාවලෝකනය අනාවරණඥාන ලාභයට පෙරනිමිත්තයි. සිංහනාද කිරීම නොපැවැත්වූ දම්සක් පැවැත්වීමට පෙරනිමිත්තයි. "අයමන්තිමා ජාති" යන සිංහනාදය අනුපාදිශේෂ නිර්වාණ ධාතුවෙන් පිරිනිවීමට පෙරනිමිත්තයි. සියලු රත්නයන්ගේ බැබළීම ලෝකයේ උතුම් සද්ධර්මරත්නාලෝකය පැතිරීමට පෙරනිමිත්තයි. තත් බැඳි වීණා තෙමේම නාදවීම අනුපූර්ව විහාර සමාපත්ති ඥානයට පෙරනිමිත්තයි. සම්බෑදි බෙර තමාම වාදනය වීම මහත් දහම් බෙරය ඇස්වීමට පෙරනිමිත්තයි. අන්දු බැඳනාදිය සිඳියාම අස්මිමාන ඡේදයට පෙරනිමිත්තයි. මහජන රෝග දුරු වීම සිව්සස් ලැබීමට පෙරනිමිත්තයි. විදෙස්ගත නැව් සුපටුන් ගතවීම සිව්පිළිසිඹියා අධිගමයට පෙරනිමිත්තයි. එළමූගයන්ගේ සිහි එළඹීම සතර සීවටන් ලැබීමට පෙරනිමිත්තයි. වෛරීන්ගේ මෙත්සිත් ලැබීම සිව්බඹ විහරණ ලාභයට පෙරනිමිත්තයි. අවීචි ගිනි නිවීම එකොළොස් කෙලෙස් ගිනි නිවීමට පෙරනිමිත්තයි. ලෝඇඳිරි එළිවීම අවිදු අඳුර නසා ඤාණාලෝක දර්ශනයට පෙරනිමිත්තයි. මුහුදු දිය මිහිරි වීම ලොව නිවන් රසයෙන් ඒක රසවීමට පෙරනිමිත්තයි. සැඩ සුළං නොහැමීම දෙසැට මිසදිටු ගති බිඳීමට පෙරනිමිත්තයි. සකුණයන්ගේ පොළෝ- තල ගමන අවවාද අසා සරණ ගමනයට පෙරනිමිත්තයි. චන්ද්‍රයාගේ අතිවිරෝචනය බහුජනකාන්ත බවට පෙරනිමිත්තයි. සූර්‍යයාගේ උෂ්ණ ශීත විවර්ජනය සුවපත් කායික සුවයට පෙරනිමිත්තයි. දෙවියන්ගේ

විමන් දොරටුවල අත්පොළසන් ක්‍රීඩාදිය බුදුව උදන් අනන බවට පෙරනිමිත්තයි. සිවු මහ දිවයින්හි මහවැසි මහදහම්වැසිවලට පෙරනිමිත්තයි.

සාගිනි අභාවය කායගතා සති ලාභයට පෙරනිමිත්තයි. පිපාසා පීඩන අභාවය විමුක්ති සුවයෙන් සුවපත්වීමට පෙර නිමිත්තයි. දොර කවුළු තෙමේ ම විවරවීම අටඟමඟ දොරටු විවර වීමට පෙර-නිමිත්තයි. ගස් වැල් මල් ඵල හරිත වීම විමුක්ති මල් පිපී සාමඤ්ඤ ඵල බරින් බරවීමට පෙර නිමිත්තයි. හැම තැන පියුම් මල් ඉපදීම විතේය ජනයාට මඟ ඵල උපදනා බවට පෙරනිමිත්තයි. දසසහස්‍රී ලෝධාහි ධජමාලා මාලිකා ආදියෙන් පිරියාම අරිය ධජ මාලාවෙන් පිරියාමට පෙරනිමිතියයි. දත යුතුය.

යම් විටෙක මහාපුරුෂයාණෝ පොළොවෙහි පිහිටා උත්තරාභිමුඛව ගොස් ආසභ වචන ප්‍රකාශ කරන්නාහු ද එවිට කිම? පොළොවෙන් ගියාහු ද? නැතහොත් අහසින් ගියාහු ද? පෙනෙමින් ගියාහු ද? නැත හොත් නොපෙනෙමින් ගියාහු ද? අචෙලකව ගියාහු ද? නැතහොත් අලංකාර ලෙස සැරසී ගියාහු ද? තරුණව ගියාහු ද? මහලුව ගියාහු ද? එසේත් නැතිනම් ඒ සැටියෙන්ම ගියාහු ද? නැතහොත් තරුණයෙක් ද? එහිලා මෙසේ දත යුතුයි. මහපුරිස්හු පොළොවෙන් ගියහ. මහජනයාට අහසින් ගියාක් මෙන් හැඟෙයි. පෙනී පෙනී ගියහ. මහජනයාට නොපෙනෙන්නා සේ හැඟෙයි. අචේලකව ගියහ. මහජනයාට අලංකාරව ගියාක් මෙන් හැඟෙයි. ළදරුවම ගියහ. මහජනයාට සොළොස්වස් වුවකු මෙන් හැඟිණ. පසුව බාල දරුවෙක් විය. මෙසේ අර්ථකථාචාර්‍යවරු විස්තර කළහ. ඒ මහා පුරුෂයාණෝ උපන් දිනයෙහිම උන්වහන්සේ සමඟ සහජාතයෝ සත් දෙනෙක් වූහ. යසෝධරා දේවිය, සුළුපිය පුතු ආනන්ද, කාළුදායි ඇමති, ඡන්න, කන්ථක අස් රජ, මහබෝරුක, සතර මහා නිධානයයි. ඉන් එකක් ගවුවක් පමණය. එකක් අඩ යොදුනක් පමණය. එකක් තුන් ගවු පමණය. ගත් ගත් කළ පිරී යන්නේමය. මෙසේ මේ සහජාත සත්වස්තුවයි.

යසෝධරා ද ආනන්ද සහ කාළුදායි ද ඡන්න, කන්ථක, බෝරුක, නිධන් සැළිද යන සතයි.

එකල්හි දෙනුවර වැසි ශාක්‍යයෝ සතුටු සොම්නස්ව මහ පිරිවරින් තූර්ය තාලාවචර සෝෂාවෙන් මහසතුන් ගෙන කපිලවස්තු නගරයටම ගියහ .එදිනම තව්තිසාවෙහි දේව සමූහයා තුටු පහටුව කපිලවස්තු පුර සුදොවුන් මහරජුට පුතෙක් උපන්නේය. එතුමා බෝ මැඩ හිඳ බුදු වන්නේය. දම්සක් පවත්වන්නේය. අපි බුදුරුව දක්නටත් බණ අසන්නටත් ලබමුයි පිළී සිසෑරීම් සිය දහස් සාධුකාර දීම් පවත්වමින් සැණකෙළි කළහ. එවිට සුදොවුන් මහරජුගේ කුලුපග අටසමවත්ලාභී කාළදේවල නම් මහතවුස් තවුතිසාවෙහි දිවා විහාරයෙන් හුන්නේය. ඒ දෙවියන්ගේ කථා අසා සැහැල්ලු සිතින් නැගිට සවසම දෙව්ලොවින් බැස රජගෙට පිවිස තැනවූ අසුන්හි හිඳ මහරජ, ඔබට පුතෙක් උපන්නේ දැයි ඇසීය. මහාතවුසාණෙනි, එසේය. මහ රජ ඔහු දකිමි.

එවිට මහරජ පුත් කුමරු ගෙනවුත් තාපසයන් වැන්දවීමට සිතීය. එවිට බෝසතුන්ගේ පා කැරකී තාපස ජටාවෙහි පිහිටියේය. කුමක් හෙයින් ද? බෝසතුන්ගේ ඒ පශ්චිම ආත්ම භාවයෙහි වැඳිය යුතු අනිකෙක් නැත. ඉදින් නොදැන බෝසතුන්ගේ හිස තාපස-යන්ගේ පාමුල තැබී නම් ඔහුගේ හිස සත් කඩක්ව පැළෙයි. ඉක්බිති තාපස තෙම දැක උද්වෙගකර හදින් තැතිගත් සිතින් ආශ්චර්‍ය්‍ය අද්භූතව විසින් නසා ගැනීම නොමැනවියි සිතා අසුනින් නැගිට දණමඬල පොළොවෙහි තබා ඇඳිලි බැඳ බෝසතුන් පිළිගත්තේය. සුදොවුන් මහරජ ඒ අසිරිය දැක ප්‍රීති හරිත හදින් මහාබ්‍රහ්මයා මෙන් තම පුතු පා වැන්දේය. තාපස තෙම වනාහි පඤ්චාභිඥා අෂ්ටසමාපත්ති ලාභීය.

අතීතයෙහි සතලිස් කපක් ද අනාගතයෙහි සතලිස් කපක් දැයි අසූකපක් සිහිකරයි. එහෙයින් බෝසතුන්ගේ ලක්ෂණ සම්පත් දැක මොහු බුදුවන්නේ ද නැතහොත් නොවන්නේදැයි ආවර්ජනා කරන්නේ නිසැකව බුදු වෙයි දැන අහෝ මේ ආශ්චර්‍ය්‍ය මිනිසෙකැයි

සිතා පහළ කළේය. අනතුරුව මම බුදුවූ මෙතුමන් දක්නට ලබන්නෙම් ද නැතහොත් නොලබන්නෙම් දැයි සලකන්නේ නොලබම්. අතරදී කලුරිය කොට අරූප භවයෙහි උපදින්නෙමි. සියක් බුදුවරුන් දහසක් බුදුවරුන් ලක්ෂයක් බුදුවරුන් විසිනුදු මුදවා ලීමට නොහැකි ය. මෙබඳු ආශ්චර්‍යවත් මහාපුරිෂොත්තම බුදු කෙනෙකුන්ගේ බණ ඇසීමට නොලබම්. අහෝ ඒකාන්තයෙන්ම මට විශාල හානියකැයි සිතා හැඬීය.

මිනිස්සු එය දැක "ආර්‍යීයන් වහන්ස, කුමක් නිසා දැන් ඔබ සිනාසී නැවත හැඬුනුද, කිමෙක්ද ස්වාමීනි, අපගේ ආර්‍යී පුත්‍රයාහට කිසියම් අනතුරක් වන්නේ දැ"යි විමසූහ. "තාපසයෝ දරුවනි, එතුමාට අනතුරක් නැත. නිසැකයෙන්ම ලොව බුදුවන්නාහ." එසේ නම් හැඬුවේ මන්දයත් "බුදුවූ මෙ බඳු මහා පුරුෂයෙකු දක්නට නොලබම්. ඒකාන්තයෙන්ම මට විශාල හානියෙකැයි ශෝක කරමින් හැඬුවෙමි යි" කී ය. මෙසේ කියා නැවත කිමෙක් ද? මාගේ නෑයන්ගෙන් කිසි- වෙක් මෙතුමා දක්නට ලබන්නාහු දැයි පරීක්ෂා කරන්නේ තම බෑනණු නාලක දරුවා දුටුවේය. ඉක්බිති නැගිට බෑනාගේ ගෙට ගොස් නාලක කැඳවා "දරුව, සුදොවුන් මහරජ කුලයෙහි මහපිනැති මහ පුරිස් ලකුණින් හෙබි බුදුකුරු පුතෙක් උපන්නේය. පත්තිස් වසක් ගිය පසු බුදුවන්නේය. ඔබ ඔහු දැකීමට ලබන්නෙහිය. අදම මහණ වන්නැයි" කීය. මයිලණුවන්ගේ වචනය අසා දරුවා අසූහත්කෙළක් සම්පත් ඇති කුලයක උපන් නැණවත් හදු පුද්ගලයෙකු බැවින් මයිලණුවෝ මා අනර්‍ථයක නොයොදවන්නාහයි සිතා මැනවි ආර්‍යීයෙනි යි ඔහුගේ වදන් පිළිගෙන එවේලෙහිම කඩපිළෙන් කහවත් ද මැටි පාත්‍රයක් ද ගෙන්වා ගෙන කෙස් රැවුල් බහා කහවත් ඇඳ මහාසත්වයන් වහන්සේ සඳහා පැවිදිව බෝසතුන්ට අභිමුඛව පසඟ පිහිටුවා වැඳ පසුම්බියෙහි ලූ පාත්‍රය උරහිසෙහි එල්වාගෙන හිමවතට පිවිස මහණදම් පිරීය.

පස් වෙනි දින බෝසතුන් හිසෙහි නහවා නම් තබන්නෙමි'යි රජ රාජභවනය සිවු දෑ ගඳින් තවරා ලද පස් මල් විසුරුවා නොකඩ

කිරිබත් පිසවා ත්‍රිවේද පාරගත අටෝරාසියක් බමුණන් කැඳවා කිරිබත් වළඳවා සත්කාර කළේය. ඔවුන් අතරින් බමුණෝ අට දෙනෙක් තෝරා මහාසී අසුන්වල හිඳුවා විශේෂ සත්කාර කොට මනාව සැරසූ බෝසතුන් දුහුල් සළුවක හිඳුවා ලකුණු සැලකීමට ඔවුන් වෙත ගෙන්වීය. ඔවුන්ගෙන් බමුණෝ සත්දෙනෙක් උතුම්-ඔහපුරිස්ලකුණු සම්පත් දැක දැඟිල්ලක් ඔසවා මේ මහාපුරුෂලක්ෂණයන්ගෙන් යුක්ත මේ මහාපුරුෂයා ඉදින් ගිහිගෙහි වසන්නේ නම් සක්විති රජවෙයි. පැවිදි වන්නේ නම් බුදුවෙයි කියා දෙයාකාරයකින් ප්‍රකාශ කළහ. ඔවුන්ගෙන් හැමට බාල කොණ්ඩඤ්ඤ නම් වූ ත්‍රිවේද පාරගත නිඝණ්ඩු සහිත කේටුභ ශාස්ත්‍රද අක්ෂර ප්‍රභේද සහිත ඉතිහාසය පස්වනු කොට ඇති ශාස්ත්‍රදත් පදදත් වියරණ දත් ලෝකායත ශාස්ත්‍රයන්හි ද මහාපුරිෂලක්ෂණයන්හි ද නිපුණ තරුණ බමුණුතෙම මහාපුරුෂ ලක්ෂණ සම්පත් බලා මෙතුමාට ගිහිගෙහි විසීමට කරුණක් නැත. ඒකාන්තයෙන් සව් කෙලෙසුන් නසා ලොව බුදුවන්නේ යයි එකම ඇඟිල්ලක් ඔසවා එකම ප්‍රකාශයක් කළේය. එයින් නිමිති දන්නෝත් නැයෝත් සියලු ලෝකාථ සිද්ධිය කරන හෙයින් සිද්ධාත්‍රීයයි නම් කළහ.

ඉක්බිති ඒ සත්බමුණෝ තමන්ගේ ගෙවලට ගොස් පුතුන් අමතා "දරුවනි, අපි මහල්ලෝ වෙමු. බුදුබවට පත්වන සුදොවුන් මහරජුගේ පුතු දැකීමට අපි අසමත් වෙමු. තෙපි ඒ කුමරු බුදු බවට පත් කල උන්වහන්සේගේ සසුනෙහි පැවිදි වවු යැයි" කීහ. ඒ සියලු සත්බමුණෝ ආයු ඇති තෙක් සිට කර්මානුරූපව මියගියහ. කොණ්ඩඤ්ඤ තරුණයා ළපටි ද නිරෝගි ද විය. මහසතුන්ගේ වැඩීමෙන් මහබිනික්මන බලාපොරොත්තුවෙන් වාසය කළේය. එකල බෝසත් පියමහරජ කොණ්ඩඤ්ඤ බමුණාගේ ප්‍රකාශය අසා කුමක් දැක මාගේ පුත්‍රයා පැවිදි වන්නේදැයි ඇසීය. මහලු, ගිලන්, මළ, පැවිදි යන සතර පෙර නිමිති දැකීමෙනැයි අසා එතැන් පටන් එබඳු නිමිති මා පුතු සමීපයට පැමිණිමට ඉඩ නොතබමි. ම පුතුහට බුදු බවෙන් වැඩෙක් නැත. මම මපුතණුවන්ට දෙදහසක් කුඩා දිවයින් පිරිවර

කොටැති සතර මහාදිවයින්හි ඉසුරට අධිපති කරමි. සතිස් යොදුන් මණ්ඩල වූ අහස්හි සරනු දකිනු කැමැත්තෙමි යි කියා මේ සිවු කරුණ නැති කිරීමට ද කුමාරයාගේ ඇස් හමුවට පත්වීම වැළැක්වීමට ද සිවු දික්හි ගවුවක් ගවුවක් දුරට ආරක්ෂා තැබීය. එදින මඟුල් සඳහා රැස්වූ අසූ නෑ කුල දහසින් එක් එක් පුතු පාවා දුන්හ.

මොහු බුදු වුවත් හෝ රජවුවත් අපි එක එක පුතු දෙමු. ඉදින් බුදු වන්නේ නම් ක්ෂත්‍රිය ශ්‍රමණයෙකුම පෙරටු කොට හැසිරෙති කියායි. රජ බෝසතුන්ට උතුම් රූසපුවෙන් යුත් සියලු දොසින් තොර කිරිමවුවරුන් යෙදීය. බෝසත්හු අනන්ත පිරිවරින් මහත්සිරි සෝභාවෙන් පෙරපස සඳ මෙන් වැඩෙති. දිනක් රජුගේ වප් මඟුලක් විය. එදින මුළු නුවර දෙව්නුවරක් මෙන් සරසති. දාස කම්කරු ආදීහු නොඉඳුල් පිළිහැඳ ගඳින් මලින් සැරසී රජගෙට රැස්වෙති. රජුගේ කම්‍මාන්තයෙහි නඟුල් දහසක් යොදති. එදින එකකුදු අඩු නොවෙයි. අටසියයක් නඟුල් හරකුන් රැහැන් යොත් සමඟ රිදියෙන් සරසති. රජු ගන්නා නඟුල රන් ආලේපිතය. හරකුන්ගේ අං ආදිය සහ රැහැන් යොත් කෙවිටි ද රන් ආලේපිතය. රජ මහපිරිවරින් බෝසතුන් ගෙන නික්මියේය.

කම්‍මාන්තස්ථානයෙහි බොහෝ පත් ඇති ඡායා ගහණ දඹරුකෙක් වෙයි. සේවණෙහි බෝසතුන්ට අසුන් පනවා මත්තෙහි රන්තරුවෙන් සැරසූ වියන් බඳවා තිර පවුරින් වට කොට ආරක්ෂා තබා රජ සියලු අලංකාරයෙන් සැරසී ඇමතියන් පිරිවරා සී සානා තැනට ගියේය. රජ රන් නඟුල ගනී. ඇමතියෝ එකුන් අටසියයක් රිදී නඟුල් ගනිති. ගොවියෝ සෙසු නඟුල් ගෙන ඔබ මොබ සීසාති. රජ මොබින් ඔබට යයි. ඔබින් මොබට යයි මෙතැන්හි මහාසම්පත් ඇත්තේය. බෝසතුන් පිරිවරා හුන් කිරිමවුවරු රජසිරි බලමුයි තිරයෙන් බැහැරව ගියහ. බෝසත්හු වටපිට බලා කිසිවකු නොදැක වහා නැගිට පය්‍යංකයෙන් හිඳ ආනාපානසති වඩා ප්‍රථමධ්‍යානය ඉපදවූහ. කිරිමවුවරු කෑම් බීම් අතර හැසිරෙමින් මඳ වේලාවක් ගත කළහ. සෙසු ගස්වල සෙවණ ආපසු හැරී එම රුකට පිරි

මඩුළුව සිටියේය. කිරිමවුවරු ආයුෂ්‍ය පුත්‍රයා තනිවයයි වහා තිරය ඔසවා ඇතුළට පිවිසෙන්නාහු සයනයෙහි පර්යංකයෙන් හුන් බෝසතුන් දැක ආශ්චර්‍ය්‍ය අද්භූතයට පැමිණ රජු වෙත ගොස් දේවයන් වහන්ස, කුමරා මෙලෙසින් සිටිනේය. සෙසු ගස්වල සෙවණ ආපසු හැරී දඹරුක පිරිමඩුළු කොට පවතී යයි කීහ. රජ එයසා වේගයෙන් ගොස් පෙළහර දැක ප්‍රීතිහරිත හදවතින් තමා වාචාගත නොහැකිව මේ ඔබට දෙවන වැඳීමයයි කියමින් පුතු වැන්දේය. කෙමෙන් සොළොස් වියැති උතුම් බෝසත් පුතුට සුදොවුන් මහරජ තුන්පහයක් කරවීය.

ඉන් එකක් ගිම්හාන කාලවාසය සඳහා ය. රම්ම නම් ප්‍රාසාදය නව මහල් වූයේය, උසින් දිගින් මහත්ය. එකක් වැසි සමයෙහි වාසය සඳහාය. සුරම්ම නම් ප්‍රාසාදය සත්බුමුය. සන බිත්ති ඇත්තේය. පහසු ගබඩා සහිතය. එකක් හේමන්ත කාල වාසය සඳහායි. සුභ නම් ප්‍රාසාදය පස්බුමු ය. විසිතුරු සොඳුරු දැකුම් ඇති රමණීය ප්‍රාසාදයක් විය. යසෝධරා දේවිය ප්‍රමුඛ සතලිස් දහසක් නළඟනෝ උවැටැන් කළහ. බෝසත්හු දෙවඟනන් පිරිවැරූ දෙව්රජ මෙන් සැරසුණු නළඟනන් පිරිවරා මහසැප විඳිමින් සෘතු වාරයන්හි තුන් පහයෙහි වසති. මෙබඳු සම්පත් විඳින උන්වහන්සේ පිළිබඳව දිනක් නෑයන් අතර මෙබඳු කතාබහක් ඇති විය. "සිද්ධාර්ථ ක්‍රීඩාසක්තව වසයි. කිසි ශිල්පයක් නොහදාරයි. යුද්ධයක් ආ කල කුමක් කරන්නේ ද" කියායි. රජ බෝසතුන් කැඳවා දරුව, ඔබගේ නෑයෝ සිද්ධාර්ථ කිසි ශිල්පයක් නොහදාරා ක්‍රීඩාවෙහිම ඇලී වාසය කරන්නේ යයි කියති. දැන් කුමක් කටයුතු ද, කියා සිතන්නෙහි දැයි ඇසීය. දේවයිනි, මාගේ ශිල්ප හැදෑරීමත් මාගේ ශිල්ප දැක්වීමත් සඳහා නුවර බෙර ලවනු මැනව. මින් සත්වන දින නෑයන්ට ශිල්ප දක්වමියි කීය. රජ එසේ කළේය. සත්වන දින අසූදහසක් නෑ කුලයන් ප්‍රමුඛ මහා ජනකාය රැස්වූ පසු බෝසත්හු අක්ෂණ වේධී වාළවේධී ධනුග්‍රහයන් රැස් කොට කෙසුරු බරින් බර ජාතිසිංහයෙකු මෙන් නිර්භීතව සැක රහිතව සුවසේ සිනහබර මුහුණින් අනන්‍යසාධාරණ දොළොස්

වැදැරුම් ශිල්ප දැක්වූහ. එය සරභංග ජාතකයෙහි ආ පරිදි දත යුතුය.

ඉක්බිති නෑ සමූහයා නිසැක වූහ. දිනක් බෝසත්හු උයන්බිමට යනු කැමතිව රියැදුරු අමතා රිය සූදානම් කරව. උයනට යමියි කීය. හෙතෙම මැනව දේවයන් වහන්ස කියා මහාර්ඝ උතුම් රථය සියලු සැරසිල්ලෙන් සරසා කුමුදුවන් මඟුලසුන් සිව් දෙනෙකු යොදා බෝසතුන්ට දැන්වීය. බෝසත්හු දෙවියකු මෙන් සියලු අබරණින් සැරසී උතුම් රියට නැඟ මහබලකාය පිරිවරා උයන් බිමට ගියහ. එදින දේවතාවෝ සිදුහත් කුමරුට බුදුවීමේ කාලය ආසන්නය. පෙරනිමිති දක්වමුයි සාකච්ඡා කළහ. එක් දේවපුත්‍රයෙක් ජරාවෙන් දැ දුරුවූ පැසුණු කෙහෙ ඇති විසම විරල ලිහිල් කඩදකින් යුතු රැ ලි වැටුණු සමින් යුත් කාස ස්වාසයෙන් සුරු සුරු හඬ නගමින් වෙව්ලන ගතින් ගොනැස්සක් සේ වක ගැසී ගිය සිරුරින් අතින් ගත් දඬු ඇතිව තම යෞවනය සොයන්නාක් මෙන් බිම් බලාගෙන යන්නෙකු දැක්වූහ. එවිට බෝසත්හු ද රියැදුරා ද දකිති. අන්‍යයෝ නොදකිති. බෝසත්හු එය දැක යහළු රියදුර, මේ කවර පුරුෂයෙක් ද, ඔහුගේ කෙස් අන් අයගේ මෙන් නොවේ. ශරීරයත් අන් අයගේ මෙන් නොවේ යයි ඇසීය. ස්වාමිනි, මේ මහල්ලෙකි. තව බොහෝ කල් ජීවත් නොවෙයි. ඇයි යහළු රියදුර, මමත් ජරාව ඝභාව කොට ඇත්තෙම් ද? ජරාව නො ඉක්මවන ලදද? ස්වාමීනි, ඔබත් මමත් අපි සියලු දෙන ජරාඝභාව කොට ඇත්තෙමු. ජරාව නොඉක්ම වූවෝ වෙමු.

බෝසත්හු සංවේගයට පත් හදින් යහළු රියදුර, උයනින් කමක් නැත. මෙතනින් මාලිගයට ආපසු යමුයි, ආපසු ගියහ. මාලිගයට ගොස් දුකින් දොම්නසින් සිත සිතා ජාතියට නින්දාවේවා. උපන්නහුට ජරාව පෙනේයයි සිතමින් සිටියේය. ඉක්බිති බෝසත් පිය, සුදොවුන් මහරජ වහා ආපසු පැමිණි පුතු දැක කුහුල් සිතින් රියැදුරුගෙන් රියැදුර, කුමක් නිසා මාගේ පුත්‍රයා වහා ආපසු ආවේ දැයි විමසීය. දේවයන් වහන්ස, මහල්ලෙකු දැකීමෙනැයි කීය. එයසා රජ අපොයි

නැසුණෙමි. කුමක් නිසා මා නසන්නහු ද? වහා මාගේ පුතුට නාටක සරසව්. සැප විඳින විට පැවිද්දට සිහි නොයොදයි කියා ආරක්ෂා තරකොට නුවර සියලු දිසාවන්හි අඩයොදුන් ප්‍රමාණයෙහි මහලු, ගිලන්, මළ, පැවිද්දන්ගේ ගැවසීම නවතා දැමීය. දීර්ඝායුෂ්ක බෝසත්හු අවුරුදු සියයක් ගිය පසු මහල්ලන් ආදි එක් එක් නිමිති දුටහ. අප බොසත්හු මද ආයු කාලයේ උපත් බැවින් මාස සතරෙන් සතරට උයනට යද්දී ක්‍රමයෙන් දෙවියන් විසින් මැවූ එක් එක් පෙර නිමිති දුටහ.

බෝසත්හු දෙවන වර සිවුමසක් ගිය තැන එසේම උයනට යන විට දෙවියන් මැවූ ආබාධිත දුකට පත් දැඩි ගිලන් වූ තම අසූචි මුත්‍රවල ගැලුණ පුරුෂයෙකු දැක රියැදුරුගෙන් "යහළු රියැදුර මේ කුමක් කළ පුරුෂයෙක් ද? ඔහුගේ හිසත් අත් අයගේ මෙන් නොවෙයි කියා ඇසීය. දේවයිනි, මේ ලෙඩෙකි. කුමක් ද රියැදුර මොහු ලෙඩෙක් ද? දේවයනි එහෙමයි, මෙතෙම ගිලනෙකි. කිමෙක් ද රියැදුර, මමත් ව්‍යාධිය ස්වභාව කොට ඇත්තෙම් ද? ව්‍යාධිය නොඉක්ම වූයෙම් ද? ස්වාමිනි, ඔබත් මමත් සියල්ලෝම ව්‍යාධිය ස්වභාව කොට ඇත්තෝය. ව්‍යාධිය නොයික්ම වූවෝය. එහෙනම් රියැදුර දැන් උයනින් කමක් නැත. මෙතනින්ම මාලිගයට ආපසු යව, එසේය දේවයිනි, කියා මාලිගයට ආපසු ගියේය.

බෝසත්හු මාලිගයට නැග සිතුවිලි සිතමින් හුන්නේය. එපවත් ඇසූ රජ බෝසතුන් පස්කම් ගුණයෙන් සනසා හාත්පස තුන් ගව් පමණ ප්‍රදේශයේ ආරක්ෂාව තර කළේය. නැවත දිනක් ද බෝසත්හු එසේම උයනට යද්දී දෙවියන් විසින් මැවූ මහජනකාය රැස්වී නානා අයුරින් හඬන වැලපෙන මළ පුරුෂයෙකු දුටහ. දැක රියැදුර, මේ කවරෙක්දැයි ඇසීය. දේවයිනි, මේ මළ මිනියකි. එහෙයින් මා පිය නෑ ලේසහලේ නෑයෝ එක්ව දුක්වෙති. කිමෙක් ද? රියැදුර, මමත් මරණය ස්වභාව කොට ඇත්තෙම් ද? මරණය නොයික්ම වීම්දැයි ඇසීය. ස්වාමීනි, ඔබත් මමත් සියල්ලෝමත් මරණය ස්වභාව කොට ඇත්තෝය. මරණය නොයික්මවූවෝ යයි කීය. එසේ නම් යහළු

රියැදුර, දැන් උයනින් කම් නැත. නැවත ආපසු යන්නැයි, ආපසු ගොස් පහයට පිවිස නොසතුටු සිතින් හිඳ එම පිළිකුල් අරමුණම සිහි කරමින් ජාතියට නින්දා වේවා. උපන්නහුට ජරාව පැමිණේ, ව්‍යාධිය පැමිණේ. මරණය පැමිණේ, අහෝ සංස්කාර අනිත්‍යයයි විතර්කනය කරමින් හුන්හ.

එපවත් ඇසූ රජ නැවතත් බෝසතුන් කම්සැපතින් සනසා හාත්පස යොදුනක් පමණ පෙදෙස්හි ආරක්ෂාව තර කළේය. නැවත ද තවත් දිනක උයනට යන්නාහු අතර මඟ එපරිද්දෙන්ම සුද්ධාවාස දෙවියන් විසින් මැවූ මනාව හැඳ පෙරව ශාන්ත දාන්ත වේශධාරීව සිටි පැවිද්දකු දැක ආශ්චර්‍ය අද්භූතව රියැදුරුගෙන් යහළු රියැදුර මොහු කවරෙක් ද? ඔහුගේ හිසත් අන් අයගේ මෙන් නොවේ. වස්ත්‍ර ද අන්‍යයන්ගේ මෙන් නොවේයයි ඇසූහ. ඉක්බිති රියැදුරා බුද්ධෝත්පාදයක අභාවය නිසා කිසිදු පැවිදි ගුණයක් හෝ නොදන්නා නමුත් දේවතානුභාවයෙන් "දේවයන් වහන්ස, මෙතෙම පැවිද්දෙකි. සමචර්‍යාවෙන් යහපති. කුශල චර්‍යාවෙන් යහපති. පුණ්‍යක්‍රියාවෙන් යහපති. අහිංසාවෙන් යහපති. සියලු සතුන්ට අනුකම්පාවෙන් යහපති"යි කීය. කුමක් ද මෙතෙම පැවිද්දෙකි. එසේය දේවයිනි, මෙතෙම පැවිද්දෙකි. එසේ නම් යහළු රියදුර, පැවිද්දහු. වෙත රථය යවන්න. එසේය දෙවයිනි කියා පැවිදි වුවහු වෙත රථය පැදවීය. බෝසත්හු පැවිද්දහු වෙත පැමිණ විමසා මිත්‍රය, කිම ඇත්තක් කියන්නෙහි ද? ඔබගේ වස්ත්‍ර ද අන්‍යයන්ගේ මෙන් නොවේ. පැවිද්දෙක් ද? කියා විමසූහ. දේවයිනි, මම පැවිද්දෙක් වෙමි. ඔබ යහළුව, පැවිද්දෙක් වන්නෙහි ද? එසේය දෙවයිනි, මම පැවිද්දෙක් වෙමි. සම චර්‍යාවෙන් යහපත්ය, කුශල චර්‍යාවෙන් යහපත්ය, පුණ්‍ය ක්‍රියාවෙන් යහපත්ය, සියලු සතුන් වෙත අනුකම්පාවෙන් හා අහිංසාවෙන් යහපත්ය. එය අසා බෝසත්හු පැවිදිවනු කැමතිව සතුට පිරි හදින් මිත්‍රය, ඔබ පැවිද්දෙක් වන්නෙහිය. සමචර්‍යාවෙන් යහපත්ය. ආදි වශයෙන් පැවිදි ගුණ වනා රියදුරුට යහළුව, අද දින මම සුභ නිමිත්තක් දිටිමි. උයනට යවයි කීය. එසේය. දේවයිනි කියා සතුටු සොම්නසින් උයන් බිමට ගියේය.

එදවස් බෝසතාණෝ උයන් බිමට ගියහ. එහි දාවල් කාලය ක්‍රීඩා කොට මඟුල් පොකුණින් නහා ඉර අවරට ගිය පසු මඟුල් ගල් තෙලෙහි හිඳ තමන් සරසවනු කැමති වූහ. එවිට උන්වහන්සේගේ පිරිවර පුරුෂයෝ නන් පැහැති වස්ත්‍රාභරණ මල් ගඳ විලවුන් ආදිය ගෙන හාත්පසින් පිරිවරා සිට ගත්හ. එකෙණෙහි සක් දෙවිරජහුගේ අසුන උණුවිය. ඔහු කවරෙක් මා මෙතනින් පහ කරන්නට සිතන්නේදැයි විමසන්නේ තමන් සැරසෙනු කැමති බෝසතුන් දැක විස්කම් දෙවිපුතු අමතා "යහළු විශ්වකර්මය, සිද්ධාර්ථ කුමරා අදම අඩරැයෙහි මහබිනික්මන් නික්මෙයි. මේ එතුමන්ගේ අවසන් සැරසීමය. ඔබ උයනට ගොස් මහාපුරුෂයන් සරසාලවයි කීය. එවිට විශ්වකර්ම දෙවිපුත් කපුවෙස් ගෙන පැමිණ දිව්‍යමය සැරසීමෙන් සැරසීය. බෝසත්හු සවිලංකාරයෙන් සරසන ලදුව සහ පිරිවරින් නුවරට පිවිසියහ. එවිට රූපශ්‍රීයෙන් ගුණයෙන් අකෘශවූ කිසාගෝතමී නම් රජ කුමරිය පහයෙහි මතු මහලෙහි සිට බෝසතුන්ගේ රූපශ්‍රීය දැක හටගත් ප්‍රීති සොම්නස් ඇතිව

ඒ මැණියෝ ඒකාන්තයෙන් නිවුණාහ
ඒ පියාණෝ ඒකාන්තයෙන් නිවුණාහ
යමෙකුට මෙබඳු ස්වාමියෙකු ඇත්නම්
ඒකාන්තයෙන් ඒ කාන්තාව ද නිවුණාය.

යන මේ උදානය ප්‍රකාශ කළාය. එය අසා බෝසතුන්ට දිගුකල් අභිලාෂවත් වූ නිවන පිළිබඳව මෙබඳු අදහසෙක් විය. මාගේ රූසපුව දැක අජාතපුත්‍ර නොදන්නා මැය විසින් අර්ථයක්ම කියන ලද්දීය. මේ වනාහි මවු පිය භාර්යාවන්ගේ හද සොම්නස උපදවන හද නිවන්නක් වන්නේය කියායි. සිත වනාහි රාග, දෝස, මෝහ, මාන, දිට්ඨි, දුශ්චරිත, කෙලෙශ පරිදාහයන්ගෙන් උපසමනය වීම නිබ්බුත නම් වේ. මම ද සම්මා සම්බෝධියට පැමිණ මවු පිය භාර්යාවන්ගේ හා ලෝකයාගේ කෙලෙසුන් කෙරෙන් දුරුවූ සිත් මාගී ඥානයෙන් නිවාලන්නෙමි, එහෙයින් අදම මම ගෘහවාස බන්ධනය සිඳ නික්ම පැවිදිව නිර්වාණය සෙවීම වටනේයයි සිතා සතුටු සිතින් ලක්ෂයක්

වටනා රුසිරු මුතුහර මුදා මෙය මැයට ආචාර්‍ය සත්කාරයක් වේවායි කිසාගෝතමියට යැවූහ. එය ලැබ කිසාගෝතමිය සතුටු සිත් ඇත්තී විය. මහසත්හු සරදාකාශයෙහි සුදු වලාවෙන් නැග එන සඳ මෙන් උතුම් පහයට නැග මාඇඟි සිරිසයනනයෙහි හොත්හ. එවිට දිව්‍ය කන්‍යාවන් හා සමාන මිහිරි සිලිටි වචනැති නැටුම්, ගැයුම්, වැයුම් හි කුසලතා ඇති සෙතෙහසින් බැතිමත්වූ නළඟනෝ උන්වහන්සේට අභිරමණය ඉපදවීම සඳහා නොයෙක් නැටුම්, ගැයුම් වැයුම් පටන් ගත්හ. කම්සැප නොකැමති නොසැලෙන හදවතින් බෝසත්හු උද්‍යාන රමණයෙන් ක්ලාන්ත ඇති බැවින් සිරිසයනයට ගොස් මොහොතක් නිදන්නට වන්හ. එවිට ඒ නළඟනෝ අපි යමෙකු සඳහා ක්‍රීඩා කරන්නෝ නම් ඔහු එය නොකැමැත්තෙන් නිදතියි, තම තමන්ගේ තූර්‍යෝපකරණ වැළඳගෙනම වැදහොත්තාහුය. එවිට නිදිවර්ජිත බෝසතාණෝ මධ්‍යම රාත්‍රියෙහි සිරිසයනය මත පර්‍යංකයෙන් හිඳම ගඳතෙල් පිරූ දඬුවැට පහන් එලියෙන් ඒ ගැහැනු තූර්‍යභාණ්ඩ විසුරුවා වැතිර ගලන කෙළ තැවරුණු ගතින් විසංඥ බැවින් මුදා අවුල් වූ කෙහෙන් බොහෝ කොට ගුරු ගුරු යන ආස්වාස ප්‍රශ්වාස කරමින් දත් කමින් කහිමින් බහුල පෙරළීමෙන් පහවූ රෙදි ඇතිව සොහොන් රූප සම රූ දරමින් නිදන්නවුන් දුටහ.

උන්වහන්සේ ඔවුන්ගේ විප්‍රකාර දැක සංවේග පත් මනසින් වඩාත් කාම විරාගීව රකුසියන් මැදට වන්නාක් මෙන් නොඇල්මම ඇති විය. ශක්‍රභවනය මෙන් මනාව සැරසූ රාජභවනය විසිරුණු නානා කුණපහරිත අමුසොහොනක් මෙන් හැඟී ගියේය. තුන් භවය ගිනිගත් ගෙයක් මෙන් භව සන්ත්‍රාසයෙන් අනභිලාෂයෙන් වැටහී ගියේය. එවිට බෝසත්හට අහෝ "භවත්ති, ඒකාන්තයෙන් උපද්‍රවයකි. අහෝ අනතුරකි" යන උදානය වැටහිණ. සිත පැවිද්දට අභිමුඛ විය. අදම මහඛිනික්මන් නික්ම පැවිදිවීමට වටනේයයි කළ නිශ්චයෙන් සිරියහනින් නැගී දොර ළඟට ගොස් මෙහි කවරෙක්දැයි විචාළහ. එවිට පඩිකදෙහි හිස තබා නිදාසිටි ඡන්න "ආර්‍ය්‍ය පුත්‍රය, මම ඡන්න

වෙමි"යි කීය. මහසතාණෝ "ඡන්නය, මම අදම මහබිනික්මන් නික්මෙන්නට කැමැත්තෙමි. වහා මට සෙන්ඩවයා සරසව"යි කීහ. හෙතෙම හොඳයි දේවයිනි, කියා කටකලියාදී, අෂ්ට සන්නාහ උපකරණ ගෙන වහ වහා අස්හලට ගොස් නොනිවී දැල්වෙන ගඳපහන් ඇති සුවඳ මල් මණ්ඩපය මැද සොඳුරු සයනයෙහි සිටි කන්ථක අස්රජු දැක මම අද ආයෂී පුත්‍රයන්ට නික්මීම පිණිස මේ අධිකතර රූප ජව වීයෂී ලක්ෂණ යුත් මඟුලසු සරසමියි, කන්ථක සැරසීය. කන්ථක සරසද්දීම මේ සැරසීම උයන් ගමනට මෙන් ලිහිල් වූවක් නොවේ. නිසැකයෙන් ආයෂීයෝ අදම මහබිනික්මන් නික්මෙතියි දැන හටගත් සතුටින් මහාභේෂාරවයක් පැවැත්වීය. ර ශබ්දය මුළු නුවර පැතිරී යන තරම් ය. දෙවියෝ එය වළක්වා කිසිවෙකුටත් අසන්නට නොදුන්හ. එය ළඟම සිටි ඡන්න ද නෑසීය. ඉදින් දේවතාවෝ එය නොවැළැක්වූහු නම් මුළු නුවර නින්නාද වෙයි. ඒ හේතුවෙන් මහසත්හුගේ අභිනිෂ්ක්‍රමණයට අන්තරාය වෙතැයි දෙවියෝ එසේ කළහ.

මහසතාණෝ ඡන්න යවා පුතු බලමියි සිතා රාහුල මාතාදේවිය වසන තැනට ගොස් ගැබ් දොර විවර කළහ. එකල්හි රාහුලමාතා දේවිය ගඳ තෙල් පහන් දැල්වෙන කුරුණියක් පමණ සුවඳ මල් ඇතුරූ සයනයෙහි රාහුල කුමරු මත අත තබා නිදා සිටියාය. මහසත්හු පඩිකදෙහි පා තබා සිටගෙනම එදෙස බලමින් ඉදින් මම පුතු ගනිමි නම් දේවිය පිබිදෙයි. එයින් මාගේ ගමනට අන්තරාය වෙයි. බෝධියට පැමිණි පසුව බලන්නෙමියි සිතා ප්‍රාසාදයෙන් බැස අශ්වයා වෙත ගොස් දරුව කන්ථකය, තෝ අද මේ එකම රාත්‍රියෙහි මා එතෙර කරව. මම සම්මා සම්බුදුව සදේවක ලෝකයා තරණය කරවන්නෙමියි කීහ. ඉක්බිති උඩ පැන කන්ථකගේ පිටට නැගුණහ. කන්ථක වනාහි අටළොස් රියන් දිගය. ඊට සුදුසු උසය. ජව සම්පන්නය. සේදූ හක්ගෙඩියක් මෙන් සවීඥෙතය. ඉදින් මොහු පාද ශබ්දයක් කළහොත් ඒ හඬින් මුළු නුවර පිබිදෙයි කියා දෙවියෝ බෝසතුන්ට අන්තරාය වැළකීම සඳහා භේෂාරව වළක්වා පා

තැබීමෙහි දී පාදයට සිය අත්තල එළවූහ. බෝසත්හු තුරඟු පිට සිට ඡන්න වලගෙයි ගන්වා මධ්‍යම රාත්‍රියෙහි නගර දොර සමීපයට පැමිණියහ. සුදොවුන් මහරජ පෙරාතුවම බෝසතුන්ගේ නික්මයාම වැළකීම සඳහා රාත්‍රියෙහි විවරකොට නොනික්මිය යුතුයයි එක් එක් කවාටය පුරුෂයින් දහසකිනුත් නොඇදිය හැකි ලෙස ආරක්ෂා කොට බොහෝ පුරුෂයන් යෙදවීය. එහෙත් බෝධිසත්වයෝ ශක්තිමත්ය. ඇත් ගණනින් දහස් කෝටියක් ඇතුන්ගේ බල දරති. එබැවින් උන්වහන්සේ ඉදින් දොර නොහැරියහොත් මම කන්ථක පිට වැතිරීගෙනම කන්ථකගේ කලවයට සංඥාකොට අටළොස් රියන් උස පවුර පැන යන්නෙමියි සිතූහ. ඡන්න ද ඉදින් දොර නොහැරිය හොත් මම ආර්‍ය්‍ය පුත්‍රයන් ඇකයෙහි තබා කන්ථක දකුණතින් බඳවටා අත යවා කිහිලි ගන්වාගෙන ප්‍රාකාරය උඩින් පැන යන්නෙමියි සිතීය. කන්ථක ඉදින් දොර නොහැරිය හොත් මම ආර්‍ය්‍ය පුත්‍රයන් හිඳගෙන සිටිද්දීම වලිගයෙහි එල්ලී සිටින ඡන්න ද සමඟ උඩ පැන ප්‍රාකාරයෙන් එපිට පැත්තේ සිටිමියි සිතීය. සියල්ලෝ එකඟ්ඡන්ද වූහ. එවේලෙහි දොරටුවෙහි අධිගෘහිත දේවතාවා ඔවුන්ගේ අභිප්‍රාය දැන ඔවුන්ගේ අදහස් සමෘද්ධ වෙයි. මා දොර නොහැරිය හොත්, දොර නොඇරීමේ අපරාධයෙන් කුපිත දේව සමූහයා මට නිග්‍රහ කරන්නාහ. එහෙයින් මම දැන් දොර අරිමියි සිතා මහාසත්වයන්ගේ පින් තෙදින් තැති ගෙන වහ වහා දොර හැරියේය. එකෙණෙහිම පාපී මාරයා නික්මෙන බෝසතුන් දැක මේ ආර්‍ය්‍ය සිද්ධාර්‍ථ කුමරා මාගේ විෂය ඉක්මවනු කැමැත්තේ ය. දැන් මම මොහුට අන්තරාය කරමියි හිතවතෙකු මෙන් වහා පැමිණ උඩ අහස සිට මෙසේ කීය. “නිදුකාණෙනි, නොයනු මැනවි. මෙයින් සත් වන දින සක් රුවන පහළ වෙයි. දෙදහසක් කොදෙව් පිරිවර කොට ඇති සිව් මහදිවයින්හි අධිපති රාජ්‍යය කරන්නේය. ඔබගේ යාමෙන් කවර පලක් ද? නිදුකාණෙනි, නවතිනු මැනවැයි” කීය. එවිට බෝසත්හු තෝ කවරෙක්හිදැයි ඇසීය. මම වසවත්ති වෙමි. මාරය, තෝ කාමධාතුව වසඟයෙහි පවත්වන්නෙහිය. මම චිත්තබල වසඟ කොට සම්මා සම්බෝධියට පැමිණ දසසහස්‍රී ලෝකධාතුව

කම්පා කොට දහම්සක් පවත්වමින් මහජනයාට සත් සම්බෝධි අංග රත්නයන් බෙදා දෙමි. චක්‍රරත්නයෙන් මට වැඩක් නැතැයි මාරයා ප්‍රතික්ෂේප කොට නික්මුණ සේක.

මාරයා නොසතුටට පත්ව යම්දාක කාම විතර්කයක් හෝ ව්‍යාපාද විතර්කයක් හෝ විහිංසා විතර්කයක් හෝ විතර්කතතය කළ කල්හි දනිමියි එතැන් පටන් සිදුරු සොයන්නේ සෙවණැල්ලක් මෙන් ලුහු බැන්දේය. මහසතාණෝ ද අත පත් සක්විති රජය කෙළ පිඬක් මෙන් අනපේක්ෂිතව හැර දමා දෙවියන් කළ මහාපුද-සත්කාරයෙන් නුවරින් නික්ම ඇසළ පුන් පොහෝ දින උතුරුසල නැකත පවතිද්දී තරු ගණ සමූහයෙන් නිරන්තරාකීර්ණ විමල ගුවන්තල මැද සඳ මඬල නැගෙද්දී නුවරින් නික්ම නැවත නගරය බලනු කැමති වූහ. සිතට අනතුරුවම ඒ මහාපුරුෂයාණන්ට හැරී බැලීමක් ඔබ වහන්සේ නොකළ යුතුයයි කියන්නාක් මෙන් මහපොළොව කුඹල් සකක් මෙන් කැරකී ගියේ ය. බෝසත්හු සිටි ලෙසම නාගරාබිමුඛව පඤ්ච ප්‍රසාද සමන්නාගත දෑසින් නුවර බලා මම සම්මා සම්බෝධියට නොපැමිණ නැවත මේ කිඹුල්වත් පුරයට නොපැමිණෙමි යි කියා ඒ බිම් පෙදෙසෙහි කන්ථක නිවත්තන චෛත්‍යස්ථානය දක්වා යා යුතු මගට අභිමුඛව අසූ මෙහෙයවා මහත් වූ ශ්‍රීසෞභාග්‍යයෙන් ද මහත් පූජා සත්කාරයෙන් ද, නික්ම ගියහ. එදින දෙවියෝ උල්කා සැට දහසක් ඉදිරියෙන් දැරූහ. පසු පසින් සැට දහසක් ද දකුණින් සැට දහසක් ද උතුරින් සැට දහසක් ද දැරූහ. සැට දහසක් වෙනත් දෙවියෝ සක්වළ මුවවිට සිට අප්‍රමාණ උල්කා දැරූහ.

වෙනත් දේව නාග සුපර්ණ යක්ෂ ගාන්ධර්ව කින්නරාදීහු සඳුන් සුණු විලවුන් මල් වස්ත්‍රාභරණ ඡත්‍ර ධජ පතාකාදියෙන් පූජා කරමින් සත්කාර කරමින් ගමන් කරති. සිටි තරම් දෙවියෝ මදාරා පරසතු මලින් සතර මහාදිවයින්හි මහවැසි සෙයින් ඉසිමින් අහස මලින් පිරවූහ. නොයෙක් දහස් ලක්ෂ ගණන් තූර්‍ය්‍ය භාණ්ඩ වාදනය කළහ. ගොඩ ගමන්ගත් මහමුහුද සෙයින් මහතුරු ගොස විය. මෙබඳු

සිරි සැපතින් ගමන් කළ බෝසතාණෝ එක් රැයින්ම තුන් රජය පසුකර තිස් යොදුන් දික් මඟ ගෙවා ගංතෙරට පැමිණියහ. බෝසතාණෝ ගංතෙර සිට ඡන්නගෙන් "මේ ගඟ කුමක්දැයි විමසූහ. ස්වාමීනි, අනෝමා නම් ගඟයි. මෙය ආනෝමා නම් මෙහි අපගේ පැවිද්ද ද අනෝම වන්නේය කියා විලුඹින් අසුට සත් කළේය. අශ්වයා උඩ පැන නිසැකයෙන් මහසතුන්ට සතර ඕඝයෙන් පිරි සසර මහනදිය තරණය කිරීමේ නිමිති දක්වන්නාක් මෙන් අට ඉස්බක් පුළුල් අනෝමා නදියෙන් එතෙර සිටියේය. අසු පිටින් බට බෝසතාණෝ රිදී පටක් වන් වැලි තලයේ සිට "යහළු ඡන්නය, මාගේ අබරණ සහ කන්ථක ද ගෙන නැවත නගරයට යන්න. මම පැවිදි වෙමියි"කීහ. බෝසතුන්ට මහසෙනේ ඇති ඡන්න නොයනු කැමතිව "මම ද මහණ වෙමියි" කීය. බෝසත්හු ඔබට මහණ වීමට නොහැකිය. ඔබ යන්නැයි කීහ. දේවයිනි, ඔබ වහන්සේ සම්පත් හැර දමා පැවිදි වූ කල මා පැවිදි නොවන්නේ කෙසේ ද? "ඡන්න තුඹ ගිය කල වැඩිහිටි අධිපතීහු ඥාතීහු මා සිටින බව දැන ගනිති. ස්වාමීනි, මම ඔබ වහන්සේගේ සම්පම දාසයෙක්මි, එක්ව උපන්නෙමි. ඔබ වහන්සේ හැර ගිය කල යන යන තැන ඔබ වහන්සේට උපස්ථාන කරන්නේ කවරෙක් ද? එහෙයින් එක්වම මහණ වන්නෙමියි" කීය. දරුව ඡන්නය, මා සමඟ මහණ වන්නේ කුමකට ද? ස්වාමීනි, සෙනෙහස නිසාය. දරුව, එසේ මා කෙරෙහි සෙනෙහසක් තිබේ නම් නවතින්නැයි තෙවරක්ම ඡන්න වැළැක්වූහ. බෝසතුන්ගේ අණ නොසලකා නොසිටිය හැකි ඡන්න නිහඬව හුන්නේය.

එවිට බෝසතාණෝ සියලු ආභරණ මුදා ඡන්නට භාර දී පැවිදිවනු කැමතිව මාගේ කෙස් පැවිද්දට නොගැළපේයයි සිතීය. බෝසතුන්ගේ කෙස් සිඳීමට සුදුසු වෙනත් කිසිවෙක් නැත. එබැවින් තමන් වහන්සේම කඩුවෙන් කෙස් සිඳීමට සිතනු සමඟම ඉදිරියෙහි කඩුව පහළවිය. උන්වහන්සේ දකුණතින් කඩුවගෙන කොණ්ඩය මුලින් ගෙන කැපූහ. එවිට උන්වහන්සේගේ කෙස් දකුණට කුණ්ඩලාකාරව සිටියේය. දිවි හිමියෙන් එයම ප්‍රමාණය විය. රැවුලද

ඊට අනුරූපය. බෝසත්හු මෞලිය සමඟ අල්වා ඉඳින් මම බුදුවන්නෙම් නම් අහසෙහි රැඳේවා, නැත්නම් බිම වැටේවායි අහසට දැමූහ. එවිට ඒ සිළුමිණි වේයනය යොදුනක් උඩ ගොස් අහස සිටියේය. සක් දෙව් රජ ඒ දැක යොදුනක් පමණ රුවන් කරඬුවක් හිසින් දරා පිළිගෙන තව්තිසාවෙහි තිස් යොදුන් චූළාමණි චේතිය කරවීය.

> සුවඳ කැවූ උතුම් මෞලිය සිඳ අග්‍ර පුද්ගලයාණෝ අහසට දැමූහ. දහසක් නුවන් ඇති සක් දෙවිරජ උතුම් රන් කරඬුවකින් මුදුනින් පිළිගත්තේය.

නැවත බෝසත්හු මේ සළු මහාඝ්‍රය, මාගේ පැවිදි වෙසට නොගැළපෙතැයි සිතූහ. එවිට කසුප් බුදුන් සමයෙහි ප්‍රිය සහායව සිටි ඝටීකාර නම් මහ බඹහු පැවිදි වෙනු කැමති බෝසතුන්ට සිවුරු නොමැති බව දැන බුද්ධාන්තරයක් මුළුල්ලෙහි නොනැසී වූ මිතුරු සිතින් “මේ මිතුරාණෙනි මහබිනික්මන් කොට පැවිදිවනු කැමතිව සිවුරු නොලබති. දැන් මම එතුමන්ට සිවුරු ආදි කොට ඇති පැවිදි අටපිරිකර ගෙන යන්නෙමි”යි ගෙන ගොස් බෝසතුන්ට දුන්නේය. බෝසත්හු මහබඹහු විසින් දුන් සිවුරු හැඳ උතුම් පැවිදි වෙස් ගෙන යුඟදුරු මුදුන්හි හිරුගෙන් නිකුත් රශ්මියවන් ප්‍රභාවෙන් දිලෙන රන් පිළිමයක් මෙන් ඡන්නමාණව අමතා “ඡන්නය, මාගේ වචනයෙන් මවුපියන්ට නිරෝගි බව කියවයි පිටත් කළහ. බෝසත් වියෝ දුක ඉවසිය නොහැකි ඡන්න හඬ හඬා දෙපා සිරසින් වැඳ තෙවරක් පැදකුණු කොට නුවන් පිරි කඳුළින් පිටත්ව ගියේය.

මෙය අසා සිටි කන්ථක “අහෝ නැවත මට ස්වාමියාගේ දැක්මක් නැතැයි නොපෙනී යත්ම වියෝ සෝදුක් ඉවසිය නොහැකිව ළය පැළී කලුරිය කොට තව්තිසාවෙහි කන්ථක නම් දෙවිපුත්ව උපන්නේය. ඉක්බිති ඡන්න මියගිය කන්ථක දැක දෙගුණ වූ සෝගින්නෙන් දැවුණු හදින් යහළු කන්ථකය, ඔබ තිරිසනෙක්වම සිටිමි වියෝගයෙන් මළෙහිය. මම මිනිසෙක්ව ද නොමැරෙමි. මාගේ තද කමක තරම්යයි කියා හැඬීය. ඔහු අස්සැරසිලි ගෙන වනමලින්

පුදා තනිවම හඬ හඬා වැලපි වැලපී ගියේය. බෝසත්හු ඡන්න පිටත් කොට තනිවම රැඳී පැවිදි සුවයෙන් පිරුණු සිතින් ඒකචර ජාතිසිංහයෙකු මෙන් එ පියසෙහි අනුපිය නම් අඹ වනයට වැද සතියක් පැවිදි සුවයෙන් කල් ගෙවා පිටත්ව දවසකින්ම තිස් යොදුන් මඟ ගෙවා රජගහ නුවරට පැමිණියහ. දෙවන දවස් පෙරවරු රජගහනුවර ගෙපිළිවෙළින් පිණ්ඩපාතයෙහි හැසිරුණහ. නුවර වැසි සියලු මිනිස්සු බෝසතුන්ගේ රූසිරු දැකීමෙන් "කිමෙක් ද මේ සඳ කිරණ හකුළුවාගෙන මිනිස්සුන්ට දැක්වීම සඳහා ලෝක නම් දේශයෙන් මෙහි පැමිණියෙක් ද? බමුණන්ගේ වදනින් පමා වූවන් දැක උත්සාහ දනවනු පිණිස පැමිණියෙක් ද? නැතිනම් වෙස් වලාගත් කාමදේව අප රජුගේත් නුවරුන්ගේත් ක්‍රීඩාවිභූති බැලීමට පැමිණියේදෝ"යි සිත සිතා කුහුලින් හාත්පසින් බෝසතුන් පිරිවරා ගත්හ.

රාජ පුරුෂයෝ එපුවත රජුට දැන්වූහ. "දේවයිනි, නාග සුපණ්ණ. යක්ෂ බ්‍රහ්ම සූය්‍ය චන්ද්‍ර ආදීන්ගෙන් කිසිවෙක් නුවර පිඬු පිණිස හැසිරෙති"යි කියායි. රජ එයසා මතු මහලෙහි සිටම මහා පුරුෂයාණන් දැක ආශ්චය්‍ය අද්භූතව "දරුවනි, යව්, විමසව්, නොමිනිසෙක් නම් නුවරින් පිටව අතුරුදහන් වේ. දෙවියෙක් නම් අහසින් යයි. නාගයෙක් නම් පොළොව කිමිදෙයි. මිනිසෙක් නම් ලත් අහර ගෙන වළඳයි" කියා අණ කළේය. රාජපුරුෂයෝ රාජවචනයෙන් මහාපුරුෂයා ලුහු බැන්දහ. මහාපුරුෂයාණෝ ද මුසුබත් ලැබ මෙතෙක් පමණයයි දැන පිවිසි දොරින්ම නුවරින් නික්ම පාණ්ඩව පර්වත සෙවණෙහි නැගෙනහිරට මුහුණ ලා හිඳ අහර වැළඳීමට පටන් ගත්හ. එවිට උන්වහන්සේගේ අතුණු පෙරළී කටින් නික්මෙන ආකාරයක් මෙන් විය. එම ජීවිතයෙහි එවැනි අහරක් මසැසින් දැක නැති බැවින් ඒ පිළිකුල් අහරින් පිළිකුල්ව තමන් වහන්සේ තමන්ට මෙසේ අවවාද කරමින් "සිද්ධාර්ථය, ඔබ රස අහර පැන් ඇති කුලයක වසමින් සුවඳ හැල්බත් හා නානා අගරසින් වළඳන තැනක ඉපිද එකම පිණ්ඩපාතිකයකු දැක කවදා නම් මම මෙවන් පිණ්ඩපාතයක

හැසිර වළඳන්නෙමි ද? කවදා නම් මට එබඳු කාලයක් ඇති වන්-නේදැයි සිතා නික්මුණහුය. මේ දැන් කුමක් කරන්නෙහිදැ"යි අවවාද කළහ.

මෙසේ තමහට ඔවදන් දී නිර්විකාරව අහර වැළඳූහ. රාජ පුරුෂයෝ එපවත් රජුට කීහ. රජ ඔවුන් බස් අසා එහා නුවරින් පිටත්ව බෝසතුන් වෙත ගොස් ඉරියව්වෙන්ම පැහැද බෝසතුන්ට සවිඉසුරු හාර කළේය. එවිට බෝසතාණෝ "මහරජ, මට වස්තු කාමයෙන් හෝ කෙලඟ කාමයෙන් වැඩක් නැත. මම පරමාභි සම්බෝධිය පතා නික්මියෙමි'යි ඔහුට කීය. රජ තන් අයුරින් ඉල්ලා සිටත් පොළඹවා ගත නොහැකිව ඔබ වහන්සේ එසේ බුදුවන සේක් නම් බුදුව පළමුවෙන් මාගේ රටට පැමිණිය මැනවයි ඉල්වීය. බෝසත්හු රජුට ප්‍රතිඥා දී පිළිවෙළින් චාරිකා කරමින් ආළාර කාලාම, උද්දකරාමපුත්ත වෙත ගියහ. සමාපත්ති උපදවා මේ මඟ බෝධිය සඳහා නොවෙතැයි ඒ සමාපත්ති භාවනාත් නොමෙනෙහි කොට දෙවියන් සහිත ලෝකයාට සිය ශක්තිය වියැසිය, දක්වනු සඳහා මහාප්‍රධන් වියැසිය වඩනු පිණිස උරුවේලාවට ගොස් රමණීය බිම් පියසකට පැමිණ මහාප්‍රධන් වැඩූහ.

කොණ්ඩඤ්ඤ මාණවක තෙම මහාපුරුෂයාණන් පැවිදිවූ බව අසා සත් බමුණන්ගේ පුතුන් වෙත ගොස් "දරුවනි, සිදුහත් කුමරා පැවිදි විය. නිසැකයෙන් බුදු වෙයි. ඔබලාගේ පියවරු නිරෝගිව සිටියාහු නම් අදම ගොස් පැවිදි වන්නාහුය. ඔබලා කැමති නම් එව්. මම ඒ මහාපුරුෂයාණන් අනුව පැවිදි වන්නෙමි"යි කීය. ඒ සියල්ලෝ එකඟවීමට අසමත් වූහ. සතර දෙනෙක් පමණක් කොණ්ඩඤ්ඤ බ්‍රාහ්මණ දෙටු කොට ගෙන පැවිදි වූහ. පස් දෙන පඤ්චවග්ගිය නම් වෙති. පස්වග පුත්තු නම් කොණ්ඩඤ්ඤ, වප්ප, භද්දජී, මහානාම, අස්සජී නම් වෙති. කොණ්ඩඤ්ඤ බමුණහුගේ ප්‍රධානත්වයෙන් පැවිදි වූ ඒ සියලු දෙනා ගම් නියම්ගම් රාජධානිවල පිණ්ඩපාත කරමින් බෝසතුන් වෙත පැමිණියහ. සවසක් මහා ප්‍රධන් වඩන උන්වහන්සේ දැන් බුදු වෙති දැන් බුදු වෙතියි සිත සිතා

හැමදීම් ආදි වතින් පිළිවෙතින් උවටැන් කරමින් සන්තිකාවචරයෝ වූහ. බෝසතාණෝ ද කෝටිප්‍රාප්ත දුෂ්කරක්‍රියාව එකම තල ඇටය, සහල් ඇටය, මෑ, මුං ආදියෙන් කල් පසු කොට මුළුමනින් ආහාර ප්‍රතික්ෂේප කළහ. දෙවියන් විසින් ලෝම කූපයෙන් ඕජා බහාලීම ද ප්‍රතික්ෂේප කළහ. නිරාහාරව පරමකෘශබවට පත් සිරුරෙහි රන්වන් බව කලු පැහැවිය. දෙතිස් මහාපුරුෂලක්ෂණ නොපෙනී ගියේය. සමහර දා අප්‍රාණක ධ්‍යානය වඩමින් මහ වේදනාවෙන් මැඩී සිහිසුන්ව සක්මන් කෙළවර වැටුණහ. එවේලෙහි සමහර දෙවියෝ ශ්‍රමණ ගෞතමයෝ කලුරිය කළහයි කීහ. සමහරු මේ තථාගතවරුන්ගේ පැවැත්මයයි සිතූහ. මළහයි කීවාහු අවුත් සුදොවුන් රජුට ඔබ පුත් කලුරිය කළේයයි දැන්වූහ. මාගේ පුත් බුදුව කලුරිය කළේ ද? නොබුදුව කලුරිය කළේදැයි විමසීය. නොබුදුව ප්‍රධන් භූමියෙහිම වැටී මළේ යයි කීහ. මෙයසා රජ නො පිළිගනිමි. නො බුදුව කලුරිය කිරීමක් ම පුතුට නොවේ යයි කියා ප්‍රතික්ෂේප කළේය.

කුමක් හෙයින් රජ නො අදහයි ද? කාළදේවල තවුසාගේ වචනය ඇසීමෙන් හා දඹරුක් මුල පෙළහර දැකීමෙනි. සිහි ලත් බෝසතාණෝ නැගී සිටියහ. වෙනත් දෙවිවරු අවුත් රාජපුත්‍රයා නිරෝගියයි දැන්වූහ. රජ මාගේ පුත් නොමැරෙයි කීය. සවසක් දුෂ්කරක්‍රියා කරන මහසතුන්ට අහස ගැට ගසන්නාක් මෙන් විය. එහෙයින් ඒ දුෂ්කරක්‍රියාව බුදු බවට මඟ නොවෙතැයි දැන බෝසත්හු ඕළාරික අහර ගනු කැමතිව ගම් නියම්ගම්හි පිණ්ඩපාතයෙහි හැසිර ඕළාරික අහර වැළඳූහ. දෙතිස් මහාපුරුෂලක්ෂණ ප්‍රකෘතිමත් විය. කය රන්වන්විය. එවිට පංචවර්ගීය භික්ෂූහු මෙතෙම සවසක් දුෂ්කරක්‍රියා කොටත් බුදුබව ලබන්ට අසමත් විය. ගම් නියම්ගම්හි හැසිර මේ ඕළාරික අහර ගැනීමෙන් කෙසේ හැකි වෙයි ද? මෙතෙම බාහුලික විය. ප්‍රධන් අතහැර දැමීය. හිසෙහි තානු කැමැත්තෙකුට පිනිබිඳු ගැනීමක් මෙනි. මොහු වෙතින් අපට විශේෂත්වයක් කෙසේ ලැබිය හැකි ද? මොහුගෙන් වැඩක් නැතැයි සිතා මහාපුරුෂයන් අතහැර තම පාසිවුරු ගෙන අටළොස් යොදුන් මඟ ගෙවා ඉසිපතනයට ගියහ.

එසමයෙහි උරුවේලාවෙහි සේනානිගමයෙහි සේන කුටුම්බික නිවසෙහි උපන් සුජාතා නම් දැරිය වියපත්ව එක් නුග රුකක් වෙත ප්‍රාර්ථනාවක් කළාය. මහසම්පත් ඇති සම ජාතික සැමියෙකු ලැබ පළමු ගැබෙහිම පුතකු ලදොත් අඩවසක් පාසා ඔබට ලක්ෂයක් වටනා උපහාර දක්වමියි කියායි. ඇගේ පැතුම සඵලවිය. ඕ තොමෝ මහසතුන්ගේ දුෂ්කර ක්‍රියාවට සවසක් පිරි කල වෙසක් පොහොයට කලින්ම දෙනුන් දහසක් මී වතයෙහි කවා ඔවුන්ගේ කිරි පන්සියයක් දෙනුන්ට පොවා ඔවුන්ගේ කිරි දෙසිය පනසකට දැයි මෙසේ දෙනුන් සොළස දෙනුන් අට දක්වා පොවා කිරි බරත් ඔජස් වී බවත් පතා ක්ෂීර පරිවර්තනය කළාය. වෙසක් පොහෝ දින බිලියම් කරමියි පාන්දරින්ම අවදිව අට දෙනුන් දෙවීමට වස්සන් මුදාලීය. වස්සෝ බුරුලු මුලට නොගියහ. බුරුලුවලට නැවුම් බඳුන් යොමු කිරීමත් සමඟම සඟාභාවිකව කිරි දහරා වැගිරුණේය. ඒ අසිරිය දැක සුජාතාව සියතින්ම කිරිගෙන නැවුම් බඳුනෙහි වත්කොට සියතින්ම ගිනිකොට පැසවන්නට පටන් ගත්තා ය. කිරි පැසෙද්දී ලොකු ලොකු බුබුළු නැග දකුණටම කැරකෙන්නට විය. බින්දුවකුත් පිට නොයයි. ළිපෙන් පොඩි දුමක්වත් නොනැග්ගේය.

එවේලෙහි ලෝකපාලයෝ සතර දෙන අවුත් රැකවල් ලා සිටියහ. මහබඹු කුඩ දැරිය, ශක්‍රයා ගිනි පෙනෙලි හසුරුවමින් ගිනි දැමීය. දෙදහසක් කොදෙව් පිරිවර ඇති සිව්මහාදිවයින්හි දෙවියෝ දිව්‍යවූත් මානුෂිකවූත් ඕජා නන් කුසුම් රොන් ගෙන මිවද නිපදවා සියලු මිහිර ලබා දෙන මීමැස්සන් මෙන් එහි බහාලූහ. වෙනදා දෙවියෝ පිඬු පිඬුව බහාලති. එවිට සුජාතාව එදිනම ඒ බොහෝ අසිරි දැක පුණ්ණා නම් දැස්ස අමතා "අම්මේ පුණ්ණාවෙනි, අද අපගේ දෙවියෝ බෙහෙවින් පැහැදුණහ. මෙතෙක් කල් මා මෙවෙනි අසිරියක් දැක නැත. වහා ගොස් දෙවොල පිරිසිදු කරන්නැයි කීවාය. ඕ තොමෝ ආඃවෙනි, මැනවැයි වහ වහා නුගරුක් මුලට ගියාය. බෝසතාණෝ ද එම රාත්‍රිකාලයෙහි සිහින පසක් දුටහ. මේ ඒ විස්තරයයි. මහපොළොව සයනය විය. හිමවත් පව්ව කොට්ටය

විය. නැගෙනහිර මුහුදෙහි වම් අත විය. දකුණු මුහුදෙහි දෙපා විය. මේ පළමු සිහිනයයි. එහි තිරිත්ත නම් තෘණ ජාතිය නාභියෙන් උඩ නැග අහස ගැටී සිටියේය. මේ දෙවෙනි මහසිහිනයයි. කළු හිස ඇති සුදු පණුවෝ දෙපසින් මතුවී දණමඬල තෙක් වසාගත්හ. මේ තුන්වන මහ සිහිනයයි. නන් පැහැති පක්ෂීහු සතර දෙනෙක් සතර දෙසින් අවුත් පාමුල වැටී මුළුමනින් සුදුවූහ. මේ සතරවන මහ සිහිනයයි. අසුචි පර්වතයක් මත අසුචියෙන් නොතැවරී සක්මන් කරයි. මේ පස්වන මහ සිහිනයයි.

යම් මේ මහපොළව සයනයක් වී ද එය අනුත්තර සම්මා සම්බෝධිය අවබෝධ කිරීම පිණිසයි. මෙය පළමු සිහින ඵලයයි. තිරිත්ත තණ නාභියෙන් උඩ නැගී අහස හැපී සිටීමක් වී ද එයින් අරිඅටඟිමඟ අවබෝධ කොට සම්බුදු බවට පත්ව දෙව් මිනිසුන් විෂයෙහි සුප්‍රකාසිත වීමයි. මේ දෙවන සිහින ඵලයයි. කළුහිස් ඇති සුදුපණුවන් දෙපයින් මතුවී දණමඬල තෙක් වසා ගත්තාහු ද එය බොහෝ ගිහිවත් දරන්නෝ දිවි හිමියෙන් තථාගත සරණගත වීමයි. මේ තුන්වන සිහින ඵලයයි. නන් පැහැති පක්ෂීහු සතර දෙන සතර දෙසින් පැමිණ පාමුල වැටී සුදු වුවාහු ද එය චතුර්වර්ණ ක්ෂත්‍රිය, බ්‍රාහ්මණ, වෛශ්‍ය, ශූද්‍රයෝ තථාගත ප්‍රවිදිත ධර්මවිනයෙහි ශ්‍රද්ධාවෙන් ගිහිගෙන් නික්ම සසුන්හි පැවිදිව අනුත්තර විමුක්තිය ප්‍රත්‍යක්ෂ කරතියි එයින් කියවේ. මේ හතර වන සිහින ඵලයයි. මහ අසුචි කඳු මත අසුචියෙන් නොතැවරී සක්මන් කළේය. එයින් තථාගතයන් වහන්සේ සිවුරු, අහර, සෙනසුන්, බෙහෙත් පිරිකරෙහි නොගිජුව නොගැලී නොමුසපත්ව ආදීනව දකිමින් නිස්සරණ ප්‍රඥාවෙන් පරිභෝග කරති යනු කියැවේ. මේ පස්වන සිහින ඵලයයි. මෙසේ බෝසත්හු ඒ රෑ යාමයෙහි මහාසිහින දැක සලකා බලන්නාහු නිසැකයෙන් අද මම බුදු වෙමි කියා නිශ්චය කොට ඒ රෑය පහන් වීමෙන් සිරුරු පිළිදැගුම් කොට උදැසනින්ම එහි වැඩ ඒ නුග රුක මුල වර පර්යංකයෙන් ස්වකීය ශරීර ප්‍රභායෙන් මුල පටන් සකල වෘක්ෂය බබළුවමින් හුන්හ. එවිට පුණ්ණා එහි ගොස් නැගෙනහිර දෙස බලා සිය ශරීරාලෝ-

කයෙන් මුළු ගස රන්වන් කරමින් ගස මුල වැඩහුන් ඒ බෝසතුන් දුටුවාය. දැක අද අපගේ දේවතාවාණෝ ගසින් බැස සියතින්ම බලි පිළිගැනීමට හුන්හයි සිතා ආශ්චර්‍ය්‍ය අද්භූත විස්මය ඇතිව උදම්ව වේගයෙන් ආපසු ගොස් ඒ බව සුජාතාවට දැන්වූවාය. සුජාතාව ඇගේ කීම අසා පුණ්ණාවෙනි, අද පටන් ඔබ මගේ දෙටු දූ තනතුරෙහි සිටින්නීයයි කීවාය. දුවකට ගැළපෙන සියලු ආභරණ ඇයට දුන්නාය. රන් පාත්‍රයෙහි කිරිබත් බහා ලමියි ප්‍රීති උපදවා ලක්ෂයක් වටිනා රන් පාත්‍රය ගෙන්වා ගෙන කිරිබත් එහි බහා ලීමට පිසූ භාජනය නැමීය.

එවිට සියලු කිරිබත් නෙළුම් පතක දිය බිඳු මෙන් පෙරළී පාත්‍රයෙහි පිහිටියේය. පාත්‍රය සම්පූර්ණවම පැවැත්තේය. ඕ තොමෝ එය වෙනත් රන්පාත්‍රයකින් වසා සුදුසළුවකින් වෙළා සියලු අබරණින් සැරසී පාත්‍රය හිසෙහි තබාගෙන මහත් අනුභාවයෙන් නුග රුක් මුලට ගොස් දුරදීම ගස මුල පිඟුවන් පැහැයෙන් බබළන බෝසතුන් දැක බලවත් සතුටු සොම්නසින් වෘක්ෂ දේවතාවාණෝය යන හැඟීමෙන් දුටු තැන් පටන් නැමී නැමී ගොස් හිසින් පාත්‍රය බහා රන්කෙණ්ඩියෙන් ගඳමල් සුවඳ කැවූ ගඳදිය ගෙන බෝසතුන් වෙත ගොස් සිටියාය. ඒ වන විට ඝටීකාර මහබඹු බෝසතුන්ට දුන් මැටි පාත්‍රය අතුරුදන් වූයේ වෙයි. බෝසතුන් එම පාත්‍රය නැති හෙයින් දකුණුඅත දිගු කොට පැන් පිළිගත්හ. සුජාතාව පාත්‍රය සමඟින්ම කිරිබත් බෝසතුන්ට පිදීය. එවිට බෝසත්හු සුජාතාව දෙස බැලූහ. ඕ තොමෝ ඒ ආකාරය සලකා ආශ්චර්‍යයෙනි, අපගේ පූජාව පිළිගෙන රුචි පරිදි වඩිනු මැනවයි කියා බෝසතුන් වැඳ ඇදිලි බැඳ යම් සේ මාගේ මනෝරථය සිදුවී ද එසේම සිදුවේවායි කියා පැරණි වළඳක මෙන් ලක්ෂයක් වටනා රන් පාත්‍රයෙහි අපේක්ෂා රහිතව නික්ම ගියාය.

බෝසත්හු ද හුනස්නෙන් නැගී රුක පැදකුණු කොට පායාස පිරි පාත්‍රය ගෙන නේරඤ්ජනා තීරයට ගොස් පෙර බෝසත්වරු බුදුවනදා නහන තැන සුපිහිටි තොටෙහි නහා ගොඩ නැගී පෙරදිග බලා හිඳ එක් ඇට ඇති තල්පල පමණ එකුන් පනස් පිඬක් කොට

සියලු කිරිබත් වැළඳූහ. බුදුව සත්සතියක් බෝමැඩෙහි වැඩ හුන් උන්වහන්සේට එකුත්පනස් දිනක ආහරය එයම විය. එතෙක් කල් වෙනත් ආහාරයක් නොවීය. නෑම් මුව දෙවීම් සිරුරු කිස සැපයීම් ආදි වේලාවෙහි ද දැහැන් සුව මඟ සුව ඵල සුවෙන් කල් ගෙවූහ. මහා පුරුෂයාණෙනි කිරිබත් වළඳා ඉදින් අද මම බුදුවන්නෙමි නම් මේ පාත්‍රය උඩුගං බලා යේවා. නැතිනම් යටිගං බලා යේවායි කියා දැමූහ. එවිට පාත්‍රය සැඩ පහර බිඳ ගෙන ගඟ මැදට ගොස් ජව සම්පන්න රනහංසයෙකු මෙන් මැදින්ම අසූරියනක් පමණ උඩුගං බලා ගොස් එක් සුළියක ගිලී කාළරාජ නාග භවනයට පැමිණ තුන් බුදුවරුන් පරිභෝග කළ පාත්‍රවල හැපී කිලි කිලි ශබ්ද නගමින් ඒ සියල්ලට යටින් පිහිටියේය. කාළ නාරජ ඒ ශබ්දය අසා ඊයේ එක් බුදු කෙනෙක් උපන්හ. අද එක්කෙනෙක් උපන්හයි සතුටු සොමනසින් පද සිය ගණනින් ස්තුති කරමින් සිටියේය. ඔහුට වනාහි මහපොළොව සත් ගව්වක් උඩට වැඩුණු කල එක් රැයක් ගෙවී ගියාක් මෙන් වේ.

බෝසත්හු ගං තෙර සුපිපි සල් වෙනෙහි දාවල ගෙවා සැන්දෑ යාමයෙහි ගම් කෙළවර පෙර දිගට කඳු සෙවණැලි වැටුණු පසු මඳ පවන් හමන විට ගස් මුදුන්හි නටුවෙන් ගිලිහී වැටුණු කුසුමින් ආකීර්ණ වූ සල් උයනින් නික්මුණු ඇත් රජෙකු මෙන් බබළ බබළා දිවා විහාරයෙන් නික්ම ගමන් කළහ. එකල්හි නාග, යක්ෂ, සුපණ්ණ ආදි දෙවියෝ දිව ගඳමලින් පිදූහ. දසසහස්‍රී ලෝක ධාතුව බලා ඡත්‍ර ධජ පතාකා සත්කාර වලින් නිරන්තර විය. දෙවියන් විසින් නානා වණ්ණ ධජ පතාකයෙන් සහ නන් කුසුමින් අලංකාර කළ අට ඉස්බක් පමණ පුළුල් මගින් සිංහයෙකු මෙන් නිසැකව බෝරුකට අභිමුඛව ගමන් කළහ. එකල්හි සොත්‍ථිය නම් තණහාරක තෙම තණ රැගෙන ඉදිරි මගින් එන්නේ මහා පුරුෂයන්ගේ ආකාර දැක අට තණ මිටක් දුන්නේය. මහසත්හු තණ පිළිගෙන ඊසාන දිග මගින් ගොස් සුපිරිසිදු උස් කඳ වෙළෙප් අතු කොළ දළු පැළයෙන් පිරිපුන් අනේකවිධ පැහැයෙන් යුත් සළු අබරණින් භරිත රුචිර සොභා

ඇති දෙවියන් විසින් සරසන ලද ඇසතු වෘක්ෂ රාජයා දුරදීම දුටහ.

මහාපුරුෂයාණෝ එතැනට පැමිණ මෙතැන අභිරූපවත්ය. රමණීයය. මෙතැන සර්ව්ඥතාඥානාවබෝධයට සුදුසුයයි සිතා බෝ මැඩට ගොස් තෙවරක් පැදකුණු කොට දකුණු පැත්තෙහි උතුර බලා සිටගත්හ. එකෙණෙහි මහපොළොව දකුණු සක්වළ නැබෙහි චක්‍රයක් මෙන් පිහිටියේය. නෙමිය මධ්‍යමින් දකුණින් නැමී ගියේය. උතුරින් නැමී ගියේය. මෙසේ බටහිරින් ද උතුරින් ද ඇක්මී කෙණෙහිම නැමී ගිය කල්හි බෝසතුන්ට මෙය පෙර බුදුවරුන්ගේ අචලස්ථානය නොවෙයි කියා සිතිණ. අනතුරුව නැගෙනහිරට ගොස් පශ්චිම දිසාභිමුඛව සිට ගත්හ. එතන වනාහි අන්‍යසත්ත්වයන්ට අසාධාරණ පෙර බෝසතුන්ගේ අභිසම්බෝධි සමයෙහි මාරබල පරාජයෙහි වජ්‍රඥානොත්පාද සමයෙහි දරා සිටීමට සමත් අසමස්ථානය විය. එවිට බෝසත්හු මේ සියලු බුදුවරුන්ගේ මාර බල පරදන කෙලෙස් කඳු සුණු විසුණු කරන අචලස්ථානය යයි දැන ඒ තණ අගින් අල්වා එහි විසිර වූහ. එම තණ බෝසතුන්ගේ පින් මහිමයෙන් මානුෂික ශිල්ප විෂය ඉක්මවා නිපන් තුදුස් රියන් ප්‍රමාණව සමාකාරව වැගුරුණේය.

එවිට මහසතණෝ තුදුස් රියන් තණ ඇතිරියෙහි පනස් රියන් රිදී කඳක් වන් බෝකඳ පිටුපසින් කොට පෙරදික් බලා "මම මෙහි බෝධියට පැමිණම මිස සෙණහඬ ගසන්නාක් වැනි බිහිසුණු ඝෝෂාවෙන් හෝ ධාරානිපාත වර්ෂාවක් වැනි ආවුධ වර්ෂාවකින් හෝ ගිනිජාලා මතු වෙද්දී හෝ නොනැගිටිමි" කියා චතුරංගවීර්ය අධිෂ්ඨාන කොට විසිඅසංඛ්‍ය කල්පයක් මුළුල්ලෙහි රැස් කරන ලද කුසල් ඵල අනුභසින් පහළ වූ සුන්දර වර වජ්‍රාසනයෙහි පර්යංකයෙන් වැඩහුන්හ. එදින උන්වහන්සේට සහම්පති මහබඹු තුන් යොදුන් පුළුල් බඹ නිපැයුමකට අනුරූප දිව සේසත ගෙන සිටියේය. සුයාම දෙව්රජ තුන්ගව් පමණ සඳකිරණ වන් දිව සෙමර ගෙන මඳ මඳ පවන් සලමින් සිටියේය. සක් දෙව්රජ විසි රියන් විජයතුරා නම් සක පිඹිමින් පූජා කළේය. පඤ්චසිඛ දෙව්පුත් තුන්

ගව් පමණ බෙළුව වීණාව වයමින් තුති මඟුල් ගී ගය ගයා උපහාර කළේය. මහකෙළ නාරජ අසූලක්ෂයක් නයින් පිරිවරා සිය ගණන් තුති ගී පවත්වමින් නමස්කාර කරමින් සිටියේය. දසදහසක් සක්වළ දෙවියෝ නන් තුරු කුසුම් ගඳ විලවුන් සෙමෙර අබරණින් පුජා කරමින් සාධුකාර පැවැත්වූහ. එකල්හි සත්වොත්තම මහාපුරුෂයාණෝ අවලාසනයෙහි පර්යංකයෙන් හිඳ ආත්මභාවය දෙතිස් ආකාර කොට බෙදා අටතිස් කමටහන් බලන සේක් සියලු බුදුවරුන් විසින් නිසේවිත ආනාපානසති කමටහන දුටුසේක. දැකීමත් සමඟම ආස්වාස ප්‍රශ්වාසයන්ගේ ගණන, සන්දස්සන, සම්මසන උපලක්ඛණ, විපස්සන, සමෝදාන වශයෙන් නාසිකා වාතයන්ගේ පිවිසීම, නික්මීම ද ආදි මධ්‍ය අවසාන නිමිති ද සලකා අනිත්‍ය වශයෙන් මෙනෙහි කොට සතරවන ධ්‍යානය උපදවා එය පාදක කොට සංස්කාර මෙනෙහි කිරීමෙන් කෙලඟ විශ්කම්භනය කොට රූප, සත්ව, භව වශයෙන් බලමින් ඉරියව් පැවැත්වූහ.

එවිට පාපී වසවත් මර දසදහසක් සක්වළ දේව සමූහයා අතර කලබල දැක මේ සිදුහත් කුමරා බෝමුල හිඳ මාගේ විෂය ඉක්මවීමට සූදානම් වෙයි. මම දැන් ඔහුට අනතුරු කරමියි සිතා මරගොස නගා අපමණ මරබලසෙන් ගෙන නික්මුණේය. ඒ මරසෙනඟ අකාරුණික හදවතින් ලෝභ, දෝෂ, මෝහ අදහසින් ක්ෂාන්තිමාර්ගයට ප්‍රතිවිරුද්ධව උද්ධච්ච වශයෙන් උපන් බිල ඇතිව අපමණ අවිදූ අඳුරෙන් ආවරණයව අවගුණයෙන් යුතුව නොයෙදිය යුත්තෙහි යෙදෙමින් කුසල පක්ෂ විනාශයෙහි නිතර යෙදෙමින් මරහුගේ වචනය ඇසූ පමණින් ලාභයක් ලැබුණාක් මෙන් තුටු පහටු වෙමින් දහසක් හඬින් අනුන් නැසීමෙහි අභියෝග කරමින් චතුර්යෝග මුක්තව සැතින් අනුන් නැසීමෙහි අභියෝග කරමින් සතිස් යොදුන් වන සේ ඉදිරියෙන් ද දෙපසින් ද පසුපසින් ද දොළොස් යොදුන් පුළුලින් ද චක්‍රවාට පර්යන්තය තෙක් උඩින් නව යොදුනක් නිරන්තරව සිටියාහ.

ඒ සෙනගෙහි උන්නාදය අතිශයින් දරුණුය. සෙණ මෙන්

මුහුදු සෝෂාව මෙන් හාත්පසින් ලක්ෂයක් යොදුන් පැතිර සිටී. පාපී මාරයා එකසිය පනස් යොදුන් ගිරිමේඛලා නම් ඇතු නැගී දහසක් බාහු මවාගෙන එක් බාහුවක් එය දැක්වීම පිණිස යොදා සෙසු බාහුයෙන් හී, සැත්, තොමර, දුනු, කලප්, කඩු, මුගුරු ආදි නානාවුධ ගෙන සක්වළවල පැතිර වීය. මාරයා වැනි කරමුඛ නම් වූවහු කොඩිය ගෙන ඉදිරියෙන් පිටත් කළේය. එම කුන්තයෙහි ධ්වජ පත්‍රය චාතුර්මහාරාජික, දෙව් විමන් ද ආකුල කළේය. සෙසු මර සෙනගෙහි දෙදෙනෙක් එක් ආයුධය දරන්නෝ නොවූහ. සියල්ලෝම නානා ප්‍රකාර ආයුධ ඇත්තෝය. සමහරු ඇත්, මී, සජී, වෘෂභ, මුගටි, බළල්, හූරු, අශ්ව, සෙමර, සිංහ, ව්‍යාඝ්‍ර, වලස්, සර්ප, ගිජුලිහිණි සමාන මුහුණු ඇතිව මිනිස් සිරුරු ඇතිව ගර්ජනා කළහ. සමහරු මුලිනුදුරා වැටුණු ගස් බෙනවලින් නිකුත් සජීයන් එල්වාගෙන නැගී සිටියහ. සමහරු පතාකාකාරවූ විලම්බිත දිව පිටතට දමාගෙන බිඳුණු හනු ඇතිව පිඟුවන් ඇසින් ගිනිගත් කෙසින් සජීයන් එල්වා ගත් කනින් ඇවිලෙන ගිරිකුළු අතින් දරමින් තුටු පහටුව් සෝර නාද කරමින් නික්මුණහ. ඔවුන් පිරිවරාගත් මාරයා සයුර කළඹන්නාක් මෙන් සකල සක්වළ ගැබ කෝලාහල උපදවමින් ගනිව්, බඳිව්, ගසව්, පහර දෙව් ආදි කටුක පරුෂ බිහිසුණු ලක්ෂගණන් වචනයෙන් තර්ජනය කරමින් බෝධි සමීපයට පැමිණියේය.

එවිට ශක්‍රාදි සියලු දෙවියෝ පාපී මාරයාගේ වේගය නොඉවසිය හැකිව මෙන් කුනාටුවකින් ගසාගෙන යන වියලි පරඬලා මෙන් හාත්පසින් පලාගොස් සක්වළ මුවවිටෙහි සිටියෝය. එකල මහා පුරුෂයාණෝ ශූන්‍ය විමානයක මහබඹු මෙන් මහසල් මුලක මතැකකු මෙන් ගිරිගුහාවක තරුණ කේසර සිංහයෙකු මෙන් නොබියව හුන්නාහු. හාත්පසින් දෙවියන් පැන යාමෙන් හිස් වූ බව දැක උතුරු පසින් මරසෙනඟ පැතිරෙනු දැක "මේ මාරයා තනි මා සඳහා මහත් වෑයමෙන් පරාක්‍රම දක්වයි. මෙතැන මට මව හෝ පියා හෝ අනෙක් නෑයෙක් හෝ නැත. මට දසපැරුම් පිරිවර ඇත්තේය"යි සිත සිතා දස පාරමිතා ආවර්ජනා කරමින් වැඩ හුන්හ.

එවිට මාරයා වාත වේගයෙන් සිදධාර්ථයන් පලවා හරින්නෙමි යි සිතා මහාවාතයක් හටගැන්වීය. ගම් නියම්ගම් රාජධානි, තරු වන-ගහණ පර්වත කූටයන් විසුරුවා විධ්වංසනයකිරීමට තරම් සමත් නමුත් මහාපුරුෂයාණන්ගේ පින් තෙදින් නැති කිරීමට තබා සිවුරු කොණක් සෙලවීමට බෝරුක්හි දළුවක් සෙලවීමට වත් නොහැකිවිය.

ඉන් කම්පිත වූ මාරයා ජලයෙන් පා කොට ඔහු මරමියි දහරා වේගයෙන් පොළෝ බිඳින්නාක් මෙන් මහවැස්සක් වැස්සවීය. ගස්වැල් වනගහණ ඉගිලී යද්දීත් මහාසත්ත්වයන්ගේ කයට හෝ සිවුරට වැසි බිඳක් තරම් වත් නොපැමිණියේය. එවිට ගල් වරුෂාවක් වැස්සවීය. පාෂාණ, පර්වත කූට නෙලුඹු දැලි බවට පත්ව අහසින් අවුත් බෝධි සමීපයෙහි මාලාගුල මෙන් වී බිම වැටුණේය. නැවත පොරෝ, මුගුරු, ඊතල, සැත්, තොමර, කූටකලාප, භෙණ්ඩිවාල, මොහොල්, උදළු, කඩු, දුනු ආදි අයුධ වැස්සක් වැස්සවීය. ඒ සියල්ල ගිනිදැල් රහිතව ගොරව ගොරවා අහසින් අවුත් සුවඳ රුසිරු දියගොඩ මල්ව බිම වැටී ගියේය. ඉක්බිති අඟුරු වැස්සක් වැස්සවීය. ඒවා අහසින් අවුත් දැසමන් බදුවද අශෝක මල් බවට පත්ව බෝධි සමීපයෙහි බිම අලංකාර කළේය. ඉක්බිති හළු වැස්සක් වැස්සවීය. අති උණුසුම් සුදු සියුම් හළු පැතිරෙමින් අවුත් බෝසතුන්ගේ පාමුල සඳුන් සුණු බවට පත්ව වැටී ගියේය. ඉක්බිති වැලි වැස්සක් වැස්සවීය. දුම් සහිත හිම මෙන් පොළෝතලය අඳුරු කරමින් අවුත් බෝරුක හාත් පස සින්දූර කුසුම් මුතු මිණි මෙන් වැටී ගියේය. එවිට මඩ වැස්සක් වැස්සවීය. ගිනි දැල් දැල්වෙමින් දුමින් ආකුලව පැමිණි එය කොකුම් සඳුන් ගෝරෝචන මනෝසීල සිරියෙල් දිව්‍ය විලේපනා-කාරයෙන් බෝධි සමීප ධරණී තලය සරසමින් වැටී ගියේය.

ඉක්බිති සතරඟින් යුත්, ඝන අඳුරක් මැවිය. චතුරංගය කුමක් ද? අව තෙලෙස්වක, කළුවර රාත්‍රිය, ඝන වනය, ඝන වැහිවලා යයි මේ සතරඟින්යුත් ඝනාන්ධකාරයයි. චතුරංග සමන්නාගත වුව ද සුයෙහිදයෙහි අන්ධකාරය මෙන් බෝසතුන්ගේ පින් බෙලෙන් පහව ගියේය. මෙසේ වාත, වර්ෂා, පාෂාණ, අඟුරු, හළු, වැලි, මඩ, අන්ධකාර,

ආයුධ, යන නවවිධ වර්ෂායෙන් මහාසත්වයන් වහන්සේ කම්පා කළ නොහැකිව මාරයා සිදුහත් කුමරු ගනිව්, ඝාතනය කරව්, අත් නොහරිව් කියා සිය සෙනඟට අණ කළේය. ඔවුහු ඒ ශබ්දයෙන් සිය බලයෙන් මොහොතින් විරූප වේස ආයුධ ගෙන මහාපුරුෂයන් බියගැන්වූහ. මාරයා ද නොතැතිගත් කේශර සිංහයෙකු මෙන් එතැනම සිටි බෝසතුන් දැක අහෝ ඇත්තෙන්ම මොහු අසම්භීතයයි කිපී දැන් මම කිසිවෙකු විසිනුත් නොදිනිය හැකි චක්‍රායුධය දමා ගසමියි එය කරකවා ගැසීය. ඒ චක්‍රායුධය මෙතෙක් මහානුභාවයයි දත යුතුය. චක්‍රායුධය, වජ්‍රසාරමය යි, අතිශයින් තියුණුය. තෙජසින් අධිකය, මුළු ලොව දවයි. මාරයා කිපී දමා ගැසූ කෙණෙහිම මහා මේරුව ද කිලිල් කඩක් මෙන් කැපී යයි. එවැනි ආනුභාව සම්පන්නය. මාරයා විසින් දමා ගසන චක්‍රායුධය අහසට නැගෙත්ම දැල්වෙමින් දුම් දමමින් උල්කා ලක්ෂ ගණනින් එක් රැස් වූ කලෙක මෙන් ගොර බිරම් සෝෂා ඇතිව මහාපුරුෂයාණන්ගේ උපරිභාගයට පැමිණි කෙණෙහිම දිග හැරී මල් වියනක් මෙන් පිහිටියේය. මාරයා චක්‍රායුධය දමා ගැසූ කෙණෙහිම මාර පිරිස දැන් මොහු පලඟින් නැඟී පලායතැයි හඟිමින් මහ මහ ගල්කුළු නානාභරණාදිය දමා ගැසූහ. ඒවා ද උන්වහන්සේගේ පින් තෙදින් කැරකී වැටී මල් ගුළි බවට පත්විය.

මෙසේ පිරිවර සහිත මාරයා මහපුරුෂයාණන්ට බිය සන්ත්‍රාස උපදවනු නොහැකිව තෙමේම ගිරිමේඛලා ඇතු පිට නැඟී බෝසතුන් වෙත පැමිණ "භවත් සිද්ධාර්ථය, මම කාමධාතු වසවත්ති නම් වෙමි. මට සමවන්නේ කෙසේ ද? මාගේ පර්යංකයෙන් නැඟී සිටුව"යි කීය. එවිට මහසත්හු පාපී මාරයාගේ කථාව පියෙකුගේ මෙන් සිතා "මේ මාරයා මෙතෙක් බිහිසුණු රූප මට අතතුරු සඳහාම කළේය. පැරැම් පිරූ බෝසත්වරු බුදුවන දවස්හි ලබන පර්යංකය මට අයත් වන්නේ කෙසේ ද? පෙර බෝසත්වරු මරසෙන් සමඟ යුද්ධයෙහි ගත් ලෙසින් සන්නාහ වෙස් ගන්වමි. මේ දසපාරමී ධර්ම මට බොහෝ කල් යුද්ධ යෝධයන් හා සමානය. ඔවුන් අතට යුද්ධ සන්නාහ

ආයුධ දී සන්නාහයෙන් සදා මහාවේරම්භවාතය වියැලි කැලෑ කොළ පරඬැල් වන් මාරයාත් මාරසේනාවත් පරදවමියි සිතා සුපිරිසිදු සිල් දියෙන් නා සමාධි වීර්‍ය්‍ය විලේපන ගල්වා නානාප්‍රකාර ජන රත්නයෙන් බබළන උතුම් ප්‍රඥා මෞලිය පැළඳ හිරි ඔතප් සළු සඟළ හැඳ සමථ අන්තරවාසය කොට, විපස්සනා නැමති මහා චර්මය බැඳ ස්මෘති ඵලකය ගෙන බෝධි ඥාන නම් තියුණු කඩුව ගෙන සියලු බුද්ධරාජ කුලයනට අභිමංගල වූ පවර වර ධර්ම වාරණාරූඪව ඒ ඇතු ද සතර සතිපට්ඨාන චතුස්සත්‍යය නම් සුපිහිටි සිව්පා ඇත්තේය. සම්‍යග් ප්‍රධන් නැමති සොඬ වලග කණ්ණ වික්ෂෙප විලාශයෙන් යුක්තය. ඍද්ධිපාද නැමති හිදීම්, සිටීම්, සයන සොහන ඇත්තේය. ශ්‍රද්ධාඉන්ද්‍රිය ආදි ඉන්ද්‍රිය ප්‍රසාදයෙන් යුක්තය. පඤ්ච බල නැමැති මඟුල් ලකුණෙන් බබළන කුම්භස්තල ඇත්තේය. සත් සම්බෝධ්‍යංග නම් සුන්දර දළ ඇත්තේය. ආර්‍ය්‍ය අෂ්ටාංගික වර ලකුණින් සැදූ දේහ ඇත්තේය. සත්තිස් බෝධිපාක්ෂික ධර්ම නැමැති සුරභි සුගන්ධ ඇත්තේය. ඒ ඇතු පිට නැගී මාර බල සහිතව ගිරිමේඛලා ඇතු පිට නැගී සිටි මරු පරදවා මහා විජය ග්‍රහණය කළහ.

උන්වහන්සේ ඒ ඇතුපිට නැගී මහ සක්විති රජකු මෙන් පාරමී යෝධයන් අමතා පින්වතුනි, එව්. මෙහි දාන, සීල, නෙක්ඛම්ම, පඤ්ඤා, විරිය, ඛන්ති, සච්ච, අධිට්ඨාන, මෙත්තා, උපෙක්ඛා යොධයිනි, තෙපි යුද පිණිස ආයුධ ගනිව් යි කීහ. එවිට දසපාරමී මහායෝධයෝ බෝසතුන්ගේ වචනයට පිළිතුරු දෙන්නාක් මෙන් සාමිනි, අද අපගේ වීර්‍යය දක්වන්නෙමු. ඔබට වීරවිජය ලබා දෙන්නෙමු. ඔබට යහපතක්ම වේවායි කියන්නවුන් මෙන් ශක්තියක් බලයත් පෙන්වමින් බෝසතුන් පිරිවැරූහ. ඔවුන් පිරිවැරූ ධර්මාධිපති බෝසතාණෝ සේනා පිරිවැරූ සක්විත්තෙකු මෙන් දෙව්ගණ පිරිවැරූ සක්දෙවිඳු මෙන් තමන් වහන්සේගේ දහම් තෙදින් පින් තෙදින් අසම ඤාණාලෝකයෙන් තමන් හා සම කිසිවෙකුත් නොදැක කේශර සිංහයෙකු මෙන් නිර්භීතව උත්සාහවත් වෘෂභ රාජයෙකු මෙන්

ඡද්දන්ත මහඇතෙකු මෙන් ඒකාන්ත ශූරව රන්පිළිමයක් මෙන් අචලාසනයෙහි වර පර්යංකයෙහි හිඳිමින්ම "මාරය, තට දන් දුන් බවට කවර සාක්ෂියක් ඇද්දැ"යි වදාළහ.

මාරයා ද මාගේ මේ මෙතෙක් බලමුළු එයට සාක්ෂියයි, මාර බලාභිමුඛව අත දික් කළේය. එකෙණෙහි මරපිරිස මම සාක්ෂ්‍යය වෙමි. මම සාක්ෂ්‍යය වෙමියි පැවැත්වූ ශබ්දය පොළොව ඉදිරී යන්නාක් මෙන් විය. එවිට මාරයා බෝසතුන්ට "සිද්ධාර්ථය, ඔබ දන් දුන් බවට කුමක් සාක්ෂ්‍යදැයි ඇසීය. බෝසතාණෝ තා දන් දුන් බවට සිත් ඇත්තෝම සාක්ෂ්‍ය වෙති. ඔට මෙහි කිසි සවේතනයෙක් නැත. අවේතන මහපොළොවම සාක්ෂ්‍යය වෙයි. සෙසු අත්බැව්හි දුන් දන් තිබේවා. වෙසතුරු අත්බැව්හි සිට සත්තසතක මහදන් දුන් බවට මහපොළොව සාක්ෂ්‍ය වෙති යි සිවුරු ගැබින් දකුණත මෑත් කොට පොළොවට අභිමුඛ කරමින් දිග හරිත්ම දෙලක්ෂ සතලිස් දහසක් යොදුන් බහල මහපොළොව සවේතනව කියන්නාක් මෙන් වෙස්සන්තර ආත්ම භාවයෙහි දුන් දනට සාක්ෂ්‍ය දක්වන්නාක් මෙන් විරාව සියයෙන්, විරාව දහසින්, විරාව ලක්ෂයෙන් මාර සේනාවට කියන්නාක් මෙන් නාද කළේය. ඒ ශබ්ද වේගයෙන් පවිත සහිත නගර කම්පාවිය. එවිට ගිරිමේඛලා ඇත් රජ සිටිය නොහැකිව උද්වේගයට පත්ව සතර දණින් බිම වැටී මරපිරිස් මඩිමින් ගුගුරමින් පලා ගියේය. බියපත් සිතින් මාරයා ද වැටුණු මාන ධජ ඇතිව දහසක් අත් හිස තබාගෙන

පුරිසොත්තමය, ඔබට නමස්කාර වේවා
පුරිසාජඤ්ඤය, ඔබට නමස්කාර වේවා
දෙවියන් සහිත ලෝකයෙහි ඔබට
සමවූයෙක් නැත්තේමය.

කියා ප්‍රණාම කොට නොපෙනී ගියේය. එවිට සක්වළ මුවවිට සිටි දෙව් සමූහයා මහ කුනාටුවකින් කැළඹුණ සාගර ජල ගොස වන් මාර පරාජය හඬ අසා කිමෙක් ද "සිදධාර්ථයන් වහන්සේගේ තතු කෙසේදැ'යි බෙල්ල ඔසවා බලන්නාහු පලා යන මර පිරිස් දැක

"නිදුකාණෙනි, මරබල පිරිහුණේය. නිදුකාණෙනි, මහා පුරිෂයාණෝ දිනූහ. මර බළ සෙන් පලා ගියහ. නිදුකාණෙනි, මහාපුරුෂයාණෝ සිටිති. නිදුකාණෙනි, මාරයා පැරදුණේය. මහාපුරුෂයාණන්ට ජය අත්විය. මහාපුරුෂයාණන්ට ජය පූජා කරමු යි" පිනා ගොස් හඬ නගා ශබ්ද කරති. දෙවිවරුනි, යමු. බය පත් ලෝකායට පූජනීය වූ ඒකචාරී උන්වහන්සේට, නරෝත්තමයන් වහන්සේට, නරසිංහයාණන්ට නමස්කාර කරමු. ඉක්බිති ඒ නාග සුපණ්ණ යක්ෂ ගාන්ධර්ව කින්නර අසුර දිව්‍යබ්‍රහ්මයෝ මල් ගඳ විලවුන් සුණු ඡත්‍ර ධජ පතාකාදි පුජා සත්කාර ගෙන බෝමුල වැඩහුන් මහාපුරුෂයාණන් වෙත පැමිණ පූජා කොට තුතිගී ගය ගයා සිටියහ.

එකල්හි මහාපුරුෂයාණෝ ඉර අවරට යද්දීම තෙයාකාරයකින් මාරපරාජය කළහ. කවර තෙයාකාරයෙන් ද? හුදෙකලාවම දොළොස් යොදුන්හි පැතිරි විවිධ සපිරිවර මාරබල පරාජය කළහ. නවවිධ යුද්ධය ද පරාජය කළසේක. මහාදානයෙන් ද පරාජය කළ සේක. මේ තුන් ආකාරයෙන් ප්‍රබල සමාර මාරබල වනපවනින් වියලි පරඩලාපත් සෙඹින් විධිවංසනය කොට රන් පුටුවක තුබූ රිදී කඳක් වන් විජයදෘමස්කන්ධය නිසා සුපිරිසිදු රන් පිළිමයක් මෙන් වැඩහිඳ මත්තෙහි මිණිසේසත් දරන්නාක් මෙන් බෝධිශාඛා පවතිද්දී වැඩෙන රන්වන් බෝඅංකුර රතුපුල්පෙතිවලින් මෙන් පුදද්දී පෙරයම පෙරවිසීම් සිහිකරන සේක. මෙසේ බෝසත්හු ආනාපාන සතියෙන් අනුප්‍රත්‍යාධිගත චතුර්ථධ්‍යාන පාදක ද වූහ. අභිඥාපාදකම වීය.

නිරොධ පාදක ද සියලු කෘත්‍ය සාධනය ද ලොවුතුරා ගුණ දායක ද වෙති. සියලු බෝසතුන්ට සුපුරුදු මහාවිදර්ශනාඥානය වඩා බෝමැඩ පටන් ප්‍රතිසන්ධිය දක්වා සිහි කළහ. මෙපමණ උන්වහන්සේගේ අතීතංසඥාණය විය. එම අතීතංසඥාණයෙන් කොයින් අවුත් මෙහි පිළිසිඳ ගතිම්දැයි සිතන්නාහු තුසී පුරයෙන් චුතිය දුටහ. එයින් දෙවාරාධනය, එහි ආයු ඇති තෙක් උපත, ඉක්බිති වෙස්සන්තරාත්ම භාවයෙන් චුතිය, අනතුරුව, නගර ප්‍රවේශය, ක්ෂත්‍රිය සමාගමය, මහාරාජ පර්වය, ශක්‍ර පර්වය, මද්‍රීපර්වය, කුමාර පර්වය

මෙනෙහි කරන්නාහු සත්තසතක මහාදානය තෙක් සිහි කළහ. වෙස්සන්තර ප්‍රතිසන්ධිය බලන්නාහු නම් ගොත් වර්ණ ආහාර සැප දුක් අවසානයෙහි චුති ප්‍රතිසන්ධි ආදි නොඑක් සුගති වශයෙන් ස්කන්ධ පටිපාටිය ප්‍රත්‍යවෙක්ෂා කරන්නාහු දිවකුරු බුදුසිරිපා මුල තමන්ගේ අභිනීහාරය සිහි කළහ.ජාති එකක් ජාතිදෙකක් ජාති තුනක් ජාති හතරක් ජාති පහක් ජාති දහයක් විස්සක් තිහක් හතලිහක් පනහක් සීයක් දහසක් නොඑක් සංවර්ත කල්ප විවර්ත කල්ප සංවර්තවිවර්ත කල්පවල අසවල් තැන වීමි. මෙවැනි නම් ගොත් වර්ණ අහර ඇතිව මෙවැනි සැපදුක් ඇතිව සිටියෙමි. මෙසේ ආයු කෙළවර විය. එයින් චුතව ඒ මම අසවල් තැන උපන්මි. එතැන ද මෙනමින් සැපදුක් වින්දෙමි. මෙසේ ආයු කෙළවර එතැනින් චුතව මෙහි උපන්මි කියා ආකාර සහිතව උද්දෙස සහිතව නානාවිධ පෙර විසීම් සිහිකළහ.

දෙවන යාමයෙහි දිවැස පහළවිය. ඒ දිවැස අතිපරිසුද්ධය. මිනිස් ශක්තිය ඉක්ම සිටියේය. ප්‍රාකාර පර්වත වනාන්තරවලින් ආවරණය නොකළ හැක්කේය. උන්වහන්සේ ඒ දිවැසින් මැරෙන උපදින පහත් උසස් පැහැපත් නොපැහැපත් සුගති දුගති ඇති කර්මානුරූප වූ සත්ත්වයන් දකිති. දිවැස පැහැදූ බෝසතුන්ට මෙසේ සිතිණ. මේ චුති උපත්වල විපාක සහිත කර්ම පහක්ම ලැබෙයි. කරන්නෝ නම් නොලැබෙති. කර්ම පහ කුමක් ද? අවිජ්ජා, සඞ්ඛාර, තණ්හා, උපාදාන, භවයි. විපාක කුමක් ද? විඤ්ඤාණ, නාමරූප, සළායතන, ඵස්ස, වෙදනායි. චුති උපත්වල විපාක සහිත මේ කර්ම පහ ලැබෙයි. කාරක කියා ආත්මයක් චුති උපත්වල නොලැබෙයි. කුමක් ඇති විට ජරාමරණය වෙයි ද? මෙය ඇති කල්හි ජරාමරණය පිළියෙළ වෙයි. උපත් ස්කන්ධ දිරයි. දිරූ දේ බිඳෙයි. එහෙයින් ජාතිය ඇති විට ජරාමරණ වෙයි කියා දුටහ.

ප්‍රතිලෝම වශයෙන් ද පටිච්ච සමුප්පාදය මෙනෙහි කළහ. මෙසේත් මෙනෙහි කළහ. ජාතිය කුමක් නිදාන කොට ඇත්තේ දැයි මෙනෙහි කරන්නාහු කාම-රූප-අරූප භවවල උපන් කර්මභවය

ඇති විට ජාතිය වෙයි කියා දුටහ. භවය වනාහි කාම-දිට්ඨි-සීලබ්බත-අත්තවාද උපාදාන ඇති කල්හි වෙයි. උපාදානය නම් රූප-ශබ්ද-ගන්ධ-රස-ඵොට්ඨබ්බ-ධම්මයන් පිළිබඳ තෘෂ්ණාව ඇති විට වෙයි. තණ්හාව වනාහි ෂඩ්ආරික අරමුණු විඳින රසයන්වූ සැප-දුක්-මධ්‍යස්ථතාකාර තෙවැදැරුම් වේදනා හටගැනීම වෙයි. වෙදනාව වනාහි ෂඩ්ද්වාරාරම්මණ ස්පර්ශයෙන් වෙයි. ස්පර්ශය වනාහි ඇස-කන-නාසය-දිව-හරිරය-මනස යන සවැදැරුම්අරමුණු ග්‍රහණය කරන ආයතන ඇති කල්හි වෙයි. ෂඩායතන වනාහි සතර මහා භූත, පස් විසි උපාදාන ද වේදනා - සඤ්ඤා-සංඛාර-විඤ්ඤාණ යන සහජාත ස්කන්ධ ද නමන ලක්ෂණත් නාමරූප ලක්ෂණත් ඇති කල්හි වෙයි. නාම රූප වනාහි ප්‍රතිසන්ධි ග්‍රාහක විපාකවිඤ්ඤාණය ඇතිකල්හි පටිසන්ධිවිඤ්ඤාණය බැස ගනී. නාම රූප ඇති කල්හි වෙයි කියා දුටහ.

ඉක්බිති උන්වහන්සේට මෙසේ සිත්විය. මේ විඤ්ඤාණය නාමරූපයට ප්‍රත්‍යයි. නාමරූපය විඤ්ඤාණයට ප්‍රත්‍යයි. මේ විඤ්ඤාණය ප්‍රත්‍යුදාවර්තනය වෙයි. ආපසු හැරී නාමරූපයට ප්‍රත්‍යවෙයි. පටිසන්ධිවිඤ්ඤාණය ඉක්මවා රූප සය උපදවයි. රූප සහජාත ස්පර්ශය වේදනා උපදවයි. වේදනා තුනකි. සැප-දුක-මැදහත්බව යනුයි. වෙදනා හැදිනීම් ලක්ෂණ ඇති සඤ්ඤාව උපදවයි. සඤ්ඤාසහජාත ඵස්ස වෙදනා සංඛාර උපදවයි. ප්‍රතිසන්ධිය සමග උපදනා රූප රූපස්කන්ධයයි. අරූප හතර ද ස්කන්ධ නමි. මෙසේ විඤ්ඤාණය නාමරූපයට ප්‍රත්‍යයි. රූපය විඤ්ඤාණයට ප්‍රත්‍යයයි. දෙදෙන උනුන්ට ප්‍රත්‍යයව ෂඩායතන උපදවති. ෂඩායතන සංඥානන ලක්ෂණ ස්පර්ශය උපදවයි. ස්පර්ශය සැප දුක මැදහත්බව අනුභවන ලක්ෂණ ඇති වෙදනාව උපදවිය. තණ්හාව උපාදාන හතර උපදවයි. ඒවා භවය උපදවයි. භවය ජාති ජරාමරණ උපදවයි.

මේ දස අංගය උනුන්ට ප්‍රත්‍යව අක්මුල් නැති සසර චුති උත්පත්තීන්හි අවිනාභාවයෙන් ස්කන්ධ උත්පත්තිය වෙයි කියා දුටහ. මේ දස අංග අනුලොම ප්‍රතිලෝම වශයෙන් මෙනෙහි කරන්නාහු

වර්තමාන භවය මෙනෙහිකරන්නාහු ජරාමරණයෙහි මුල දුටහ. එවිට උන්වහන්සේට මෙසේ සිතිණ. මේ පටිච්ච සමුප්පන්න ධර්මයන්ගේ වර්තමාන පැවැත්ම භවයෙහිම පෙර කර්ම රැස්කිරීම් වශයෙන් විය යුතුය. යම් හෙයකින් පටිසන්ධි විඤ්ඤාණය නාමරූප සළායතන ඵස්ස වෙදනා තණ්හා උපාදාන භව ජාති ජරාමරණ පුවත්වයි. භවයෙහි පූර්ව කර්ම මොහ අවිජ්ජා ආයූහන සංඛාර ද පටිසන්ධිවිඤ්ඤාණය පිහිටුවයි. නාමරූපය සහජාති වෙයි. ආයතන ස්පර්ශ කිරීම ස්පර්ශය යි. විඳීම වේදනාවයි. නිකන්තිය තණ්හාවයි. උපගමනය උපාදානයයි. චෙතනා භව නිබ්බත්තියයි. ජාති පරිපාකය ජරාවයි, බිඳීම මරණයයි. මේ සත්ත්වයෝ පෙර භවයෙහි සිට පෙර භවයෙහි ආස්වාද කොට ත්‍රිවිධ වෙදනානුභවය පිණිස චුති උත්පත්ති රස ලක්ඛණ සහිත ප්‍රත්‍යානුප්‍රත්‍යප්‍රදානයන් වන පංචකයෙහි සමණ්හනයව සංස්කාර රැස් කරති.

සංගහජාත නාමරූප සළායතනය ස්පර්ශය උපදවයි. ස්පර්ශය වෙදනාව උපදවයි. වෙදනාව තණ්හාව උපදවයි. තණ්හාව උපාදානය උපදවයි. උපාදානය භවය උපදවයි. භවය ජාතිය උපදවයි. ජාතිය ජරාමරණ උපදවයි. මෙසේ මේ පූර්ව අවිඤ්ඤාණක අවිද්‍යාවෙන් කර්ම රැස්කිරීම් ප්‍රත්‍යයෙන් පටිසන්ධිවිඤ්ඤාණය බැසගනී. නාමරූපයෙන් සළායතනය සළායතනයෙන් ස්පර්ශය සපර්ශයෙන් අනුභවනය වෙදනාවෙන් තණ්හාව තණ්හාවෙන් උපාදානය ග්‍රහණයෙන් චෙතනාව, භවයෙන් නිබ්බත්තිය, ජාතිපරිපාකයෙන් ජරාව ජරාවෙන් භෙදය මරණයෙන් අනවරාග්‍ර සංසාරයෙහි ප්‍රත්‍යසන්තතිය පවතී, කියා ප්‍රත්‍යවෙක්ෂා කරන්නාහු අවිද්‍යාව මුල් කොට මරණයෙන් අවසන් වන අනුලොම ප්‍රතිලොම පටිච්චසමුප්පාදය මෙනෙහි කළහ. වර්තමාන භව වශයෙන් අවිද්‍යාව ආදි කොට ඇති ජරාමරණ කෙළවර කොටඇති පටිච්චසමුප්පාදය මෙනෙහි කරන උන්වහන්සේගේ විදර්ශනාව තහවුරු විය. ඤාණ විපුලත්වය විය.

එවිට උන්වහන්සේට මෙසේ සිතිණ. මේ විඤ්ඤාණය ආපසු

හැරෙයි. නාම රූපයෙන් ඔබ්බට නොයයි. මෙපමණකින් හටගනී. දිරයි මැරෙයි. උපදී කියා වෙයි. මෙපමණකින් උදයබ්බයඤාණ පර්යවසානයට පැමිණියහ. මේ ප්‍රත්‍යයානුප්‍රබන්ධයාගේ ඇති වීම නැතිවීම ප්‍රත්‍යවෙක්ෂා කරන බෝසතුන්ගේ දර්ශනකෘත්‍යය සිද්ධකරන නුවණැස පහළ විය. කාරණාකාරණව බොධ්‍යඞ්ග ප්‍රත්‍ය ප්‍රත්‍ය ප්‍රතිග්‍රහ ප්‍රඥාව උපන්නේය. දත් අරුත් ප්‍රකට කරන උදයබ්බය ඤාණය උපන්නේය. මොවුන්ගේ යම් මේ උප්පාද පවත්ති නිමිත්ත සංයොග පරිළාහ ආබාධ ආයූහන නිදාන ප්‍රත්‍යය වේය කියා ප්‍රත්‍යභවය ප්‍රතිවෙධ කරන ඤාණවිද්‍යාව උපන්නේය. ප්‍රත්‍යයන්ගේ ස්වභාව සංසාර ලොක දක්වන්නාවූ ඤාණාලොකය උපන්නේය.

ඉක්බිති බෝසතාණෝ මෙසේ සිතූහ. මේ ප්‍රත්‍යයන්ගේ අනුබන්ධයෙන් සමුදය පැනෙයි. නියමයෙන් නිරෝධයකුත් විය යුතුය. ඉදින් ජාතිය නොවෙයි නම් මේ සකන්ධයන්ගේ ජරාවක් නොවන්නේය. බිඳීමක් ද නොවන්නේය. එහෙයින් ජාති ප්‍රත්‍යයෙන් ජරාමරණ වෙයි. ජාති නිරෝධයෙන් ජරාමරණ නිරෝධය වෙයි. කියා දුටහ. මෙසේ අනුපිළිවෙළින් භවනිරෝධයෙන් ජාතිනිරෝධය උපාදානනිරෝධයෙන් භවනිරෝධය තණ්හානිරෝධයෙන් උපාදාන නිරෝධය වෙදනා නිරෝධයෙන් තණ්හා නිරෝධය ඵස්ස නිරෝධයෙන් වෙදනා නිරෝධය සළායතන නිරෝධයෙන් ඵස්ස නිරෝධය නාමරූප නිරෝධයෙන් සළායතන නිරෝධය විඤ්ඤාණ නිරෝධයෙන් නාමරූප නිරෝධය නාමරූප නිරෝධයෙන් සළායතන ඵස්ස වෙදනා තණ්හා උපාදාන භව ජාති ජරාමරණ දුක්ඛ දොමනස්ස උපායාස යන මුළුමහත් දුක් රාශියෙහි නිරෝධය වෙයි කියා දුටහ.

මෙසේ මේ අත්බැව්හි මේ දශාඞ්ගයන්ගේ අනුලොම ප්‍රතිලොම නිරෝධය ප්‍රත්‍යවෙක්ෂා කරන උන්වහන්සේගේ භඞ්ගානුපස්සනා ඤාණය ස්ථාවර විය. එවිට උන්වහන්සේට මෙසේ සිතිණ. සම්බෝධය පිණිස මා විසින් මේ මාර්ගය සාක්ෂාත් කරන ලදි. යම් මේ නාමරූප නිරෝධයෙන් විඤ්ඤාණ නිරෝධය වෙයි. විඤ්ඤාණ නිරෝධයෙන් නාමරූප සළායතන ඵස්ස වෙදනා තණ්හා උපාදාන

භව ජාති ජරාමරණ නිරෝධය වෙයි යන මෙයයි කියා මෙනෙහි කරන්නාහු මේ ආත්මභාවය කර්ම විපාක ප්‍රත්‍යයෙන් පවතී. කම්මාභිසංඛාර නිරෝධයෙන් විපාකයක් නොපවත්නා හෙයින් නිරුද්ධ වේයයි අවබොධ කරන කල්හි භඞ්ගානුපස්සනා පර්යවසානය වූ නිරෝධය අනුලොම ප්‍රතිලොම වශයෙන් මෙනෙහි කරන බෝසතුන්ට මෙසේ සිතිණ. මේ අත් බැව්හි ප්‍රත්‍ය ප්‍රවෘත්තියෙහි ද නිරොධයෙහි ද වෙනත් සත්ත්වයෙක් නැත්තේය කියායි. එයින් උන්වහන්සේගේ සඞ්ගානුපස්සනා ඤාණය පරිපූර්ණ විය. උපන් සංස්කාරයෝ ප්‍රත්‍ය විකලතාවෙන් නිරුද්ධ වෙති. ලොකයෙන් විමුක්තියම ශාන්තියයි කියා මෙනෙහි කරන්නාහු නිබ්බිදානුපස්සනාඤාණ පර්යවසානයට පැමිණියහ. ප්‍රත්‍යසංස්කාර පැවැත්ම පවතී. ප්‍රත්‍ය විකලකාවෙන් නිරුද්ධ වෙයි. ලොව වෙනත් පිළිසරණක් නැත. උපධි රහිත භාවයම ශාන්තිය යි කියා මෙනෙහි කරන්නාහු ආදීනවානුපස්සනාඤාණයත් පමුඤ්චිතුකාමතා ඤාණයත් යන දෙක්හි අවසානයට පැමිණියහ. සියලු සංස්කාරයන්ගේ විනයනය ධර්මතා සමභාව ඇතිව විසංඛාරාධිගමය ශාන්තිය යි සියලු සංස්කාර ග්‍රහණයෙහි මධ්‍යස්ථතාවෙහි සිට සංඛාර උපෙක්ඛාඤාණයට යොමු කළහ.

සංඛාර උපෙක්ඛාඤාණයෙහි සිට ඤාණපටිපාටිය මෙනෙහි කරන්නාහු පෙර කර්මභවයෙහි අවිද්‍යාව රැස් කරන සංස්කාරවලට නව ආකාරයකින් ප්‍රත්‍යය වෙයි. කවර නව ආකාරයකින් ද? උප්පාද පවත්ත නිමිත්ත ආයූහන යොග පළිබොධ නිදාන හෙතු පච්චයප්පරොද යන නවයෙනි. මේ නව ආකාරයෙන් ප්‍රත්‍යය වෙයි. සංස්කාර වර්තමාන භව විපාක පටිසන්ධිවිඤ්ඤාණයට නව ආකාරයකින් ප්‍රත්‍යය වෙයි. විඤ්ඤාණය නව ආකාරයකින් නාමරූපයට ප්‍රත්‍යය වෙයි. නාමරූපය නව ආකාරයකින් සළායතනයට ප්‍රත්‍යය වෙයි. සළායතනය ඵස්සයට ඵස්සය වෙදනාවට වෙදනාව තණ්හාවට තණ්හාව උපාදානයට උපාදානය භවයට භවය ජාතියට ජරාමරණයට නව ආකාරයකින් ප්‍රත්‍යය වෙයි. මෙසෙයින්

එකක් එකක් නව නව ආකාරයෙන් ප්‍රත්‍යය වෙයි. මෙසේ මේ දොළොස් අංගයෙන් නවවිධ ප්‍රත්‍යානුබන්ධයෙන් උස් පහත් දුක් ජලධාරායෙන් මඩිමින් ගෙනයන සංසාර මහානදිය පවත්වන අවිද්‍යාව නිරුද්ධ කිරීමෙන් සංස්කාර නිරෝධය වෙයි. සංස්කාර නිරෝධයෙන් පටිසන්ධිවිඤ්ඤාණ නිරෝධය වෙයි. පටිසන්ධි-විඤ්ඤාණ නිරෝධයෙන් නාමරූප නිරොධය වෙයි. නාමරූප නිරොධයෙන් සළායතන ඵස්ස වෙදනා තණ්හා උපාදාන භව ජාතිජරාමරණ සොක පරිදෙව දුක්ඛ දොමනස්ස උපායාස ලක්ෂණ අසේස දුක් නිරොධය වෙයි කියා මෙනෙහි කරන බෝසතුන්ට ප්‍රතිවේධ දර්ශන කෘත්‍යය සාධනය කරන ඤාණචක්ෂුස උපන්නේය. මාර්ග ප්‍රතිවෙධය ප්‍රකට කරන උන්වහන්සේට මාර්ගඥානය උපන්නේය. ඉතිරි කෙලෙසුන් දක්වන්නාවූ ප්‍රඥාව උපන්නේය. ඉතිරි කෙලෙස්වල කලකිරීමට විද්‍යාව පහළවිය.

සර්වධර්ම ලක්ෂණ සාමාන්‍ය ලක්ෂණ වශයෙන් ප්‍රකට කරමින් ඥානාලෝකය පහළවිය. මේ අයුරින් ද්වාදශාඞ්ගය අනුලොම ප්‍රතිලොම වශයෙන් මෙනෙහි කරන්නේ පශ්චිමයාමය ඉක්ම ගියේය. එවිට උන්වහන්සේගේ සකල කෙලශයන් ප්‍රහීණ විය. සතරමඟ එකල්හිම ප්‍රතිවෙධ විය. සත්ත්වෝත්තමයන් වහන්සේට ද මාර්ගයට අනතුරුව ඵලය උපන්නේමය. චෙතොපරියඤාණපාදක ඉන්ද්‍රිය-පරොපරියත්ති ඤාණය එනම් සියලු සත්ත්වයන්ට පූර්වංගම තික්ඛින්ද්‍රිය මුදින්ද්‍රිය සුවාකාර දුවාකාර මාර්ගඵල භව්‍ය අභව්‍යතාව සුවිඥාපන දුවිඥාපන බව දැනගන්නා ඤාණය උපන්නේය. දිබ්බචක්ඛුපාදක සත්ත්වයන්ගේ අදහස් අනුසයිත අනුප්‍රබන්ධ ඡන්ද ආකාර පරියාය ප්‍රභෙද හීන ප්‍රණීත බව අධිමුක්ති කෙලෙස්රජස් මද බොල්බවට වැදගැනීමේ ආසය අනුසය පිරිසිඳ දන්නා නුවණ උපන්නේය.

සතර බ්‍රහ්මවිහාරපාදක සත්ත්වහිත සම්පාදක ආස්‍රවජාලයෙහි වැටුණු මහාප්‍රපාතයෙහි හුණු මහාදුර්ගයෙහි පෙරළෙන මහාදා-හයෙන් දැවෙන්නාවූ මහාසන්තාපයෙන් තැවෙන්නාවූ දණ්ඩන්

පහරදුන් ගිතෙල් සැළක් මෙන් තමන් නසන්නාවූ තණ්හාපාසයෙන් හිරවූ අස්වකීයවූ අප්‍රතිශරණවූ අවිද්‍යාන්ධකාරයෙන් වැසුණු කෙලෙස් කූඩුවෙහි හිරවූ පක්ෂීන් වැන්නවුන්ට සියලු ආකාර දුක් දුරලීමට හිතකාමයෙන් සංස්කාරානුගත අනිත්‍යතාව මෙන් සියලු සතුන් වෙත පවත්නා මහාකරුණා ඥාණය උපදී. චතුර්ථධ්‍යාන පාදක විකුර්වණඍද්ධි සහිත එකෙකුව බොහෝව මුවහව ප්‍රකටව තද පවුරු පර්වතයන්හි බාධා රහිත යාම් අහස්හි සඳහිරු පිරිමැදීම වශීප්‍රාප්ත ඍද්ධිබලයෙන් අන්‍ය සත්ත්වයනට අසාධාරණ ජලගිනිධාරා එක්විට පැවැත්වීමට සමත් යමකපාටිහීරඥාණය උපන්නේය. චතුධාතුව්‍යවස්ථානය ද සමාධි පාදක දිබ්බචක්ඛු පර්යවසාන සියුම් නිපුණ තියුණු පර්වතකුට සහිත කිසි තැනෙක නොපැකිළෙන ශක්‍රවජ්‍රය බඳු සකලඥෙය ධර්මයන්හි නොපැකිළ පැවතීමට සමත් අන්‍ය සත්ත්වයන්ට අසාධාරණ අනාවරණඥානය උපන්නේය. රහත් ඵලයට පත් අවස්ථාවෙහි මේ ෂඩ් අසාධාරණ ඥාන ද සතිස් කෙළ ලක්ෂයක් මහාවජ්‍රඥාන ද උපන්නේය.

එකල්හි ධර්ම තේජසින් උඩින් භවාග්‍රය ද යටින් පොළොව තලය ද හිමිකොට දසසහස්‍රි ලෝක ධාතුව මම ඔබ වහන්සේ දනිමියි ප්‍රත්‍ය සර්වලක්ෂණ ප්‍රතිවේධ කරන්නාවූ ඥාණයට සාක්ෂ්‍ය දක්වන්නාක් මෙන් පියුම් පතක් මෙන් සයා කාරයකින් දොළොස් වරක් කම්පා විය. හස්තාකාර, රුදිතාකාර, උම්මත්තකාකාර, භූතවේශාකාර, ගීතා කාර, නච්චාකාර යන සයාකාරයෙන් කම්පා වෙයි. හාත්පසින් කම්පා වෙයි, සෙලවෙයි. හාත්පසින් සෙලවෙයි. නාදකරයි. වෙව්ලයි. තවත් සයා කාරයකින් සැලෙයි. පෙරපසින් පහත් වෙයි. අපර පසින් උස් වෙයි. මැදින් පහත් වෙයි. පෙර දිගින් උස්වෙයි දකුණු පසින් පහත් වෙයි. උතුරින් උස් වෙයි. දකුණින් පහත් වෙයි. දකුණින් උස්වෙයි. මැදින් පහත් වෙයි. පර්යංකයෙන් උස්වෙයි. පර්යංකයෙන් පහත් වෙයි. මැදින් පෙරළා උස් වෙයි යන සයාකාරයෙන් ද මහා ඝන බොල් පොළොව කම්පා විය.

එකල්හිම දසසහස්‍රි ලෝකධාතුව අතරක් නැතිව සමලංකෘත

විය. නැගෙනහිර සක්වළ මුවවිට එස වූ නන් ධජ පතාකා බටහිර සක්වළ මුවවිට එස වූ ධජ පතාකාවල ගැටෙයි. උතුරු සක්වළ මුව විට එසවූ ධජ පතාකා දකුණු සක්වළ එසවූ ධජ පතාකාවල ගැටෙයි. නාග භවනයෙහි නාගරාජයෝ ද සමුද්‍ර ජාතස්සර ගංගාදියෙහි වැසි නාගයෝ ද ඔබමොබින් රැස්ව නොයෙක් ධජ පතාකා එසවූහ. නොයෙක් රන්දම් මල්දම් ආදි පූජා සක්කාර කරමින් සිටියහ. ගාන්ධර්වයෝ සැණකෙළි වෙස් ගෙන ඔවුනොවුන් සෝෂා කරමින් නටමින් ගයමින් අපොළමින් පිළී හිස සිසාරමින් ස්තුති කරමින් නොයෙක් මංගල ප්‍රතිසංයුක්ත සාධුකාර පැවැත්වූහ. මෙසේ නාග භවනය ආදි කොට පොළොවැසි දෙවියෝ ද අහස් වැසි දෙවියෝ ද සියලු යක්ෂ කින්නර අසුරයෝ ද කාමාවචර දෙවියෝ ද ඒකකොලාහල කරමින් පූජාසත්කාර සම්මාන ගත් අත් ඇත්තෝ වූහ.

දසදහසක් සක්වළ මල්පලගන්නා ගස් මලින් පිරුණේය. පල ගන්නා ගස් ඵල පොකුරින් ගහණ විය. කඳවල කඳ පියුම් පිපුණේය. අතුවල අතු පියුම් පිපුණේය. ලියවල ලියමල් අහස එලෙන මල් ගල්තල බිඳගෙන මතු මත්තෙහි සත්බුමුව දඬුපියුම් පිපුණේය. සියලු දසසහස්‍රී ලෝකධාතුව විසිරවූ මල් ගුලක් මෙන් ද සැරසූ මලස්නක් මෙන් ද විය. සක්වළ අතර, අටදහසක් යොදුන් සඳ හිරු එළියෙන් කිසිදා එළිය නොවූ ලෝකාන්තරික එකාලෝක විය. සුවාසූදහසක් ගැඹුරු මහමුහුද මිහිරිපැන් ඇති විය. පුළුල් පළිඟු තලාවක් මෙන් නොකැළඹී රළ රහිත විය. ගංගා ගලා නොබැස්සේය. සාගරයෙහි ද පස්මහ නදියෙහි ද හැමතැන පස්වනක් පියුම් නැගී පිපුණේය. විදෙස් ගත නැව් සුවසේ පටුන්වලට පැමිණියේය.

ජාත්‍යන්ධයෝ රූප දුටහ. බිහිරෝ ශබ්ද ඇසූහ. ගොළුවෝ මනාව තෙපලූහ. පිල්ලු සුවසේ ගමන් කළහ. බැමි ආදිය කඩා වැටුණේය. අවීචි ආදි නිරයවල ගිනිදැල් නිවී ගියේය. ලෝකුඹුව සිහිල් දියෙන් පිරුණේය. සියලු නිරී සත්ත්වයෝ නිදුක්ව සුවපත්ව සැනසුම් ලැබූහ. නිරය පාලයෝ සියලු ආයුධ ඉවත ලා හුන්හ.

ප්‍රේතයෝ සාපවස් නැත්තෝ වූහ. බොහෝ කල් පරම්පරාගත වෛරී සත්ත්වයෝ මෙත් සිත් ලැබූහ. මේ ආදි නොයෙක් ප්‍රාතිහාර්‍ය්‍ය පහළ විය. ඉක්බිති මහාපුරුෂයන් වහන්සේ අනේකාකාර අද්භූත ප්‍රාතිහාර්‍ය්‍ය පහළ වෙද්දී අරුණෝදය වේලෙහි විසිඅසංඛ්‍ය කල්ප ලක්ෂයක් පතන ලද උතුම් වූ සර්වඥතාඥානය ලැබූ සේක.

එකල්හි වැලි පරයන පෙර බුදුවරුන් වෙත උපන් සකලවිධ ලොවී ලොවිතුරා ගුණ භාග්‍යවතුන් වහන්සේ වෙත පිහිටියේය. එක් රැස් වූයේය. පොළොවෙහි ඝන බව සාගර යෙහි ගැඹුර මහා මේරුවෙහි උස සක්වළෙහි විශාලත්වය ගුවන්කුස අනන්ත බව හිරුගේ තේජස සඳුගේ සෞම්‍යය පියුමෙහි ශ්‍රියාව ගින්නෙහි සෝභාව කේශර සිංහයාගේ වික්‍රමය ඡද්දන්ත ඇතුගේ සූරබව යන සියලු ගුණ යමක් ඇද්ද රාගාදි සකල ක්ලෙශයන් මර්ථනය කළ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ වෙත රැස් වූ යේය. මෙසේ අපමණ ගුණ සම්පතින් සිරි ශෝභාවෙන් බබළමින් සර්වඥතාඥානය ප්‍රතිවේධ කොට වැඩහුන් සේක් තමන් වහන්සේගේ මාර්ග ඵල ලාභය ප්‍රත්‍යවේක්ෂා කොට සියලු බුදුවරයන් වහන්සේලා විසින් අත් නොහරින ලද මේ උදානය ප්‍රකාශ කළ සේක.

> පුන පුනා දුක් දෙන ආත්මභාව සංඛ්‍යාත ගෙය සදන වඩුවා
> සොයමින් නොදැක නොයෙක් ජාතිවල සැරිසරමින් දිවිමි.
> ගෙය තනන වඩුවා දක්නා ලද්දේ වෙමි. නැවත ගෙය තැනිය
> නොහැක්කේය. තාගේ සියලු කෙලෙස් පරාළ බිඳ දැමීමි.
> කැණිමඬල කඩාදැමීමි. සිත නිවනට පැමිණියේය. තෘෂ්ණාක්ෂය
> ප්‍රත්‍යක්ෂ කෙළෙමි.

මෙසේ තුසිතයෙහි පටන් බෝමැඩ සර්වඥතාඥානලාභය තෙක් මේදෑතුර අවිදුරේ නිදානයයි දත යුතු.

සන්තිකේ නිදානය කෙසේ ද? අභිසම්බෝධියෙහි පටන් පරිනිර්වාණය තෙක් යම් යම් තැනක භාග්‍යවතුන් වහන්සේ වැඩ

සිටිසේක් ද මෙය සන්තිකේ නිදාන නම් වෙයි. මුල පටන් පිළිවෙළ කතාව මෙසේය. සර්වඥයන් වහන්සේ උදන් අනා මෙසේ සිතූ සේක. මා විසින් දිගු කල් මස් ලේ ජීවිත ධන අඹුදරු පරිත්‍යාගයෙන් උතුම් පර්යංකය සඳහා අධිකතර වීර්‍ය්‍ය යොදමින් වෙහෙස වීමි. මෙහි හුන් මාගේ අදහස් සම්පූර්ණ විය. මෙතැනින් නැගිටිමියි සිතා නොයෙක් කෙළලක්‍ෂ ගණන් සමවත් සමවදිමින් සතියක් විමුක්ති සැපයෙන් එම බෝධි පර්යංකයෙහිම හුන්සේක .එවිට ඇතැම් දෙවිවරුන්ට "ඒකාන්තයෙන් අදත් සිද්ධාර්ථයන්ට කළ යුතු කිස ඇත්තේය. එහෙයින් පර්‍ය්‍යංකයෙහි ආලය අත් නොහරිතැයි යන මේ හැඟීම ඇතිවිය. ශාස්තෘන් වහන්සේ දෙවියන්ගේ විතර්කය දැන එය දුරු කිරීම පිණිස බෝපළඟින් නැගී ඊසාන දිග්හි සතියක් අනිමිස ලෝචනයෙන් මහාබෝධිය පුදමින් සිටියහ.

නැවත දෙවියන්ගේ ඒ සැකය දුරු කිරීමට මහා බෝධියෙන් උතුරු පස දසදහසක් සක්වළ දිගු පුළුල් සක්මනක් මවා යමාමහ පෙළහර ආදි අනේකවිධ පෙළහර දක්වමින් සතියක් සක්මන් කළහ. ඉන් බැස බෝමැඩින් නික්ම බෝධියෙන් වයඹ දිග දෙවියන් විසින් මවන ලද රුවන් ගෙයි ඉඳ තුන්පිටකය නවාංග ශාසනය සුවාසු දහසක් දහම්කඳ සම්මර්ශනය කළහ. බෝධිපර්යංකය ආදි කොට ඛන්ධ පරිවාර සහිත උභතෝ විනය පිටකය මෙනෙහි කළහ. උරුවේලාව ආදි කොට පරිනිර්වාණය තෙක් මෙදැතුර තථාගතයන් වහන්සේ විසින් දෙසූ අටළොස් දහස් පන්සිය විසිහතරක් සූත්‍ර ද දෙසිය හැට පහක් වූ විමානවස්තු ද සැටපහක් ප්‍රේත වස්තු ද අසූවක් තෙරවරුන්ගේ සිංහනාද ද සූවිසි බුදුන්ගේ වංශය ද පන්සිය හතලිස් හතක් වූ ජාතක ද මහානිද්දේස පටිසම්භිදා අවසන් කොට ඇති සූත්‍රපිටකය මෙනෙහි කළහ.

ඉක්බිති ධම්මසංගණී, විභංග, ධාතුකථා, පුග්ගලපඤ්ඤත්ති, කථාවත්‍ථු, යමක, පට්ඨාන යන සප්ත ප්‍රකරණ යුත් අභිධර්මය මෙනෙහි කළහ. එහි ධම්මසංගණී ප්‍රකරණය චිත්ත, රූප, නික්ඛෙපරාසි, අඤ්ඤවාර යයි විභක්ති සතරකි. චිත්ත විභක්තිය

නම් එක්විසි කුසල් සිත්ය. දොළොස් අකුසල් සිත්ය. සතිස් විපාක සිත්ය. විසි ක්‍රියා සිත්ය. මෙසේ සංක්ෂෙප වශයෙන් එකුන් අනූවක් සිත් වේ. චිත්ත විභක්තිය චිත්තුප්පාදඛණ්ඩ යනු ඊටම නමයි. එය වාචනා මාර්ගයෙන් අතිරේකයක් සහිත බණවර සයකි. විස්තර වශයෙන් අනන්ත අප්‍රමාණ වේ. අනතුරුව එක් ආකාරයෙන් දෙයාකාරයෙන් ආදි වශයෙන් මාතෘකා කියා විස්තර වශයෙන් බෙදා රූප විභක්තිය දක්වන ලදි. රූපඛණ්ඩ යනු ඊටම නම් වේ. වාචානා මාර්ගයෙන් එය දෙබණවරකි. විස්තර වශයෙන් අනන්ත අප්‍රමාණ වේ. අනතුරුව මූල වශයෙන්, ඛණ්ඩ වශයෙන්, ද්වාර, භූමි, ධම්ම, නාම ලිංග වශයෙනි, මෙසේ මූලාදිය නික්ෂෙප කොට නික්ෂෙපරාශිය දක්වන ලදි. නික්ඛෙප ඛණ්ඩයනු එයටම නම් වේ. එය වාචානා මාර්ගයෙන් මග්ග භාණවාරයයි, විස්තර වශයෙන් වනාහි අනන්ත අපරිමාණ වෙයි. අනතුරුව ත්‍රිපිටක බුද්ධ වචනයට අර්ථවාර වූ අට්ඨකථා ඛණඩයයි එය වාචානා මාර්ගයෙන් අතිරේකයක් සහිත දෙබණවරකි. විස්තර වශයෙන් වනාහි අනන්ත අප්‍රමාණ වෙයි. මෙසේ සියලු ධම්මසංගණී ප්‍රකරණය වාචනා මාර්ගයෙන් අතිරෙකයක් සහිත තෙලෙස් බණවරකි. විස්තර වීසින් අනන්ත අප්‍රමාණ වේ.

අනතුරුව විභංගප්‍රකරණය අටළොස් අයුරින් බෙදා මෙනෙහි කළහ. ඛන්ධ විභංග, ධාතු, ආයතන, සච්ච, ඉන්ද්‍රිය, පච්චයාකාර, සතිපට්ඨාන, සම්‍යක්ප්‍රධාන, ඉද්ධිපාද, බොජ්ඣංග, මග්ග, ඣාන, අප්පමඤ්ඤා, සික්ඛාපද, පටිසම්භිදා, ඤාණ, ඛන්ධක, ධම්මහදයවිභංග වශයෙනි. එය වාචනා මාර්ගයෙන් සමන්නහාර වාර පන්තිසකි. විස්තර වශයෙන් අනන්ත අපරිමාණයි. අනතුරුව තුදුස් අයුරින් බෙදන ලද ධාතු කථා ප්‍රකරණය මෙනෙහි කළහ. එය සංගහ අසංගහ, සංගහිතෙන අසංගහිත, සංගහිතෙනසංගහික, අසංගතිත්තේන අසංගහිත, සම්පයෝග, විප්පයෝග සම්පයුත්තේ නවිපපයුක්ත, විප්පයුත්තෙන සම්පයුත්ත, සම්පයුත්තෙන සම්පයුත්ත, විප්පයුත්තේන විප්පයුත්ත සංගහිත අසංගහිතෙන සම්පයුත්ත විප්පයුත්ත

විප්පයුත්තෙන සංගහිත අසංගහිත කියායි. එය වාචානා මාර්ගයෙන් අතිරෙකයක් සහිත බණවර සයකි. විස්තර වශයෙන් අනන්ත අප්‍රමාණ වේ.

අනතුරුව සය ආකාරයකින් බෙදන ලද පුග්ගලපඤ්ඤත්ති ප්‍රකරණය මෙනෙහි කළහ. එය ඛන්ධ පඤ්ඤත්ති, ධාතු, ආයතන, සච්ච, ඉන්ද්‍රිය, පුග්ගල පඤ්ඤත්ති, යනුයි. වාචානා මාගයෙන් එය බණවර පසකි. විස්තර වශයෙන් අනන්ත අප්‍රමාණ වේ. අනතුරුව කථාවත්‍ථු ප්‍රකරණය මෙනෙහි කළහ. සච්ඡිකාර්ථ පරමාත්‍ථ වශයෙන් පුද්ගලයෙක් ලැබෙන්නේ ද ආදි ක්‍රමයෙන් සකවාදයෙහි සූත්‍ර පන්සියයක් ද පරවාදයෙහි සූත්‍ර පන්සියක් දැයි සූත්‍ර දහසක් ගළපා සංගීතියට නැගූ අයුරින් දීඝනිකාය තරම් වේ. අනතුරුව මූලයමක ඛන්ධ, ආයතන, ධාතු, සච්ච. සංඛාර, අනුසය, චිත්ත, ධම්ම, ඉන්ද්‍රිය යමක වශයෙන් දස වැදෑරුම් වූ යමක ප්‍රකරණය මෙනෙහි කළහ. එය වාචාන මාර්ගයෙන් බණවර දෙසීයකි. විස්තර වශයෙන් අනන්ත අප්‍රමාණ වේ.

අනතුරුව සූවිසි ආකාරයකින් බෙදන ලද පට්ඨාන නම් මහා ප්‍රකරණය මෙනෙහි කළහ. එය හෙතු පච්චය, ආරම්මණ, අධිපති, අනන්තර, සමනන්තර, සහජාත අඤ්ඤමඤ්ඤ, නිස්සය, උපනිස්සය, පුරේජාත, පච්ඡාජාත, ආසේවන, කම්ම, විපාක, ආහාර, ඉන්ද්‍රිය, ඣාන, මග්ග, සම්පයුත්ත, විප්පයුත්ත, අත්ථි, නත්ථි, විගත, අවිගත පච්චය වශයෙනි. මෙසේ පච්චය වශයෙන් සූවිසි ආකාර වේ. මෙය අනුලෝම පට්ඨානයෙහි සයක් ද පච්චණික පට්ඨානයෙහි සයක් ද අනනුලෝම පට්ඨානයෙහි සයක්ද අනුලෝම පච්චණිකයෙහි සයකැයි මෙසේ සූවිස්සකැයි සමන්තපට්ඨාන අනන්තනය ඇති මහාප්‍රකරණය පච්චය, හේතු, පච්චණිකානුලෝම, පට්ඨාන, සමුට්ඨාන, සමොදාන, සංසට්ඨ, සම්පයුත්ත, ගණන, පච්චුද්ධාර, විපාක භාග, රාශි වශයෙන්, සම්පිණ්ඩනය කොට මෙනෙහි කරන භාග්‍යවතුන් වහන්සේට ඒකාන්ත වශයෙන්ම මහාප්‍රකරණයෙහි ම ලා ඉඩ ලැබේ. ඤාණ පාරිසුද්ධිය වෙයි.

යම් සේ තිමිර තිමිංගල මහාමත්ස්‍ය සුවාසූ දහසක් යොදුන් ගැඹුරැති මහාසමුද්‍රයෙහිම අවකාශ ලබන්නේ ද සර්වඥතාඥානය ඒකාන්තයෙන්ම මහාප්‍රකරණයෙහි ඉඩ ලබයි. සකල ශරීරයෙන් රස් විහිදුණේය. ඒ භාග්‍යවතුන් වහන්සේගේ පර්යංක ඒ අනිමිස ලෝචන රුවන් සක්මන්හි ගත කළ සතිවල ශරීර රශ්මි නොවීය. භාග්‍යවතුන් වහන්සේ ජලතලගත ඉරු මඬල හා සමාන වූහ. රුවන් ගෙයි විනය පිටක, සූත්‍ර පිටක, අභිධර්මයේ ෂට් ප්‍රකරණය මෙනෙහි කරද්දී රස් නූපන්නේය. සූවිසි සමන්ත පට්ඨාන සමන්තනය මහා-ප්‍රකරණය මෙනෙහි කළ උන්වහන්සේගේ ධම්මානුනපස්සනා ඤාණය සමඟ පැවති සිත සියුම් විය. හෘදය වස්තුව විහිදී ලේ පිරිසිදු විය. හම පැහැදිලි විය. එකල්හි එකඟ සිත් ඇති භාග්‍යවතුන් වහන්සේගේ සකල ශරීරයෙහි ආලෝකය බැබළුණේය. දෙයා-කාරයෙන් රැස් උපන්නේය. ප්‍රභාස්වරාලෝකය හාත්පස දොළොස් රියන් පමණ රත්දියරක ප්‍රභාව මෙන් ආලෝකය නොසිඳී නොකැඩී සකල ශරීරය පිරිවරා සිටියේය. එය පැතිරුණ ප්‍රදේශය ඉර හඳ තාරකා, මිණි ආලෝකය පිවිසීමට අසමත් විය. නීල, පීත, ලෝහිත, ඕදාත මාංජෙට්ඨ, පහස්සර බවට පත්වී නිකුත් විය.

ඉක්බිති නීල රශ්මිය ඉඳුනිල් දිය මෙන් දිය බෙරලිය මල් මෙන් තෙලින් දෙවූ නිලුපුල් පෙති කාන්තිය මෙන් වී නික්මුණේය. පීත රශ්මිය හුණු කළ රන් කිණිහිරි මල් සිරියල් විදුලිය ආකාර පැහැයෙන් විහිදුණේය. රක්ත රශ්මිය ජයකුසුම බන්ධුජීව ඝන ලාරස මෙන් වී නික්මුණේය. සුදු රස් සක් කොඳ මුතුහර කිරි ඕසධී තාරකා පැහැයෙන් යුක්තව විහිදුණේය. මදට රස් කනේරු ආනෝජා මල් දම් මෙන් වී විහිදුණේය. පබසර රස් පැසුණු වෛදූර්යාදී බොහෝ මැණික් ආලෝක මෙන් වී විහිදුණේය. මේ සවනක් රැස් නන් අයුරින් සාර නහුත දෙදහස් යොදුන් ගණ මහ පොළොවට විහිදුණේය. පොළොව විනිවිද යට අට නහුත සාර ලක්ෂ යොදුන් ඝන පොළොව ධරා සිටි ජල කඳට වැදුණේය. ජල කඳ විනිවිද නව ලක්ෂයක් යොදුන් ඝන ජලසන්ධාරක වායු ස්කන්ධයට පිවිසියේය.

වායු ස්කන්ධය ද විනිවිද යට අජටාකාශයට පැන යළි පරාවර්ත විය. එය උඩට නැග භවාග්‍රය තෙක් විහිදුණේය.

එකල්හි ඉරහඳ සිතුවම් රූමෙන් ආලෝක රහිත විය. චන්ද්‍ර ප්‍රභාව නැත. තාරකාවන්හි තාරකා ප්‍රභා නැත්තේය. දේවතා උයන් විමන් කප්රුක් ආභරණ මිණි රුවන් සමූහ නිෂ්ප්‍රභා විය. සරසට විහිදුණ ආලෝකය දසලක්ෂයක් සක්වළ පැතිර යළි පරාවර්තව දස බලයන් වහන්සේ කරාම පැමිණියේය.

> අඳුර නැසූ විසිතුරු රශ්මිය විය. මුනීන්ද්‍රයන් වහන්සේ එබඳු රසින් යුතුව අප්‍රතිමව තුන් පිටකය මෙනෙහි කරමින් රුවන්ගෙය අලංකාර කළ සේක.

රතනඝරය නම් රතනමය නිසා රතනඝර නම් වෙයි. ඉක්බිති උන්වහන්සේ සතිපට්ඨාන භූමි තලයේ ඉඳුරු පාද ටැම් ඔසවා ඣාන සංඝාට යොදා විනය බිත්ති ඔසවා සූත්‍රාන්ත ගොනැස් නංවා අභිධම්ම වහලින් සෙවිලි කොට පිටකත්‍රය රුවනින් විසිතුරු කරන ලද්දේ රතනඝර නමැයි දත යුතුයි. භාග්‍යවතුන් වහන්සේ එහි සතියක් ධර්මප්‍රීති සුවයෙන් කල් යවා එයින් නික්ම අජපාල නුග රුක්මුලට ගොස් එම නුග රුක් මුල්හිම උතුම් පර්යංකයෙන් වැඩ හුන් සේක.

එවිට තනිව විවේකව එලසමවතින් සිටි භාග්‍යවතුන් වහන්සේට මෙවැනි අදහසක් ඇතිවිය. ගුරුවරයෙකු නැතිව වාසය කිරීම දුකකි. නොමැනවි. මම කවර නම් ශ්‍රමණයකු හෝ බ්‍රාහ්ම-ණයෙකු සත්කාර කොට ගරුකාර කොට ඇසුරු කොට වාසය කරන්නෙම් ද කියායි. එවිට භාග්‍යවතුන් වහන්සේට මෙබඳු අදහසක් ඇතිවිය නොපිරිපුන් ශීලස්කන්ධයක් පරිපූරණයට සමාධි ස්කන්ධයක් පරිපූරණයට ප්‍රඥාස්කන්ධයක් පරිපූරණයට විමුත්ති ස්කන්ධයක් පරිපූරණයට විමුක්තිඥාන දර්ශන ස්කන්ධයක් පරිපූරණයට වෙනත් ශ්‍රමණයෙකු බ්‍රාහ්මණයෙකු සත්කාර කොට ගරුකාර කොට ඇසුරු කළ යුතු නම් තමන් වහන්සේට වඩා සීල සමාධි පඤ්ඤා විමුක්ති විමුක්තිඥානදර්ශනයෙන් වැඩි වෙනත් ශ්‍රමණයෙකු හෝ

බ්‍රාහ්මණයකු දෙවියන් සහිත ලෝකයේ මාරයන් සහිත ලෝකයෙහි ශ්‍රමණ බ්‍රාහ්මණ දෙව් මිනිසුන් අතර මම නොදකිමි. එබැවින් යම් මේ ධර්මයක් මා විසින් සාක්ෂාත් කරන ලදද එම ධර්මයම සත්කාර කොට ගරුකාර කොට ඇසුරු කොට වාසය කරමි කියායි.

එවිට සහම්පතී මහබඹ තෙම භාග්‍යවතුන් වහන්සේගේ සිත් හසර දැන බලවත් පුරුෂයෙක් හැකුළු අතක් දික් කරන්නේ ද දික්කළ අතක් හකුළන්නේ ද එමෙන් බඹ ලොවින් අතුරු දහන්ව භාග්‍යවතුන් වහන්සේ ඉදිරියේ පහළ විය. ඉක්බිති සහම්පතී මහබඹු උතුරු සළුව එකස් කොට දකුණු දණමඬල පොළොවෙහි තබා බුදුන් දිශාවට ඇදිලි බැඳ භාග්‍යවතුන් වහන්ස, එය එසේය. සුගතයන් වහන්ස, එය එසේය. යම් පෙර බුදුවරු වූවාහු නම් උන්වහන්සේලා ද ධර්මයට සත්කාර ගරුකාර කොට ඇසුරු කොට වාසය කළ සේක. ස්වාමීනි, මෙකල අර්හත් සම්‍යග් සම්බුද්ධ භාග්‍යවතුන් වහන්සේ ද ධර්මයට සත්කාර ගරුකාර කොට ඇසුරු කොට වාසය කරන සේකැයි ප්‍රකාශ කළේය. සහම්පතී මහාබ්‍රහ්ම තෙම මෙසේක් කීය.

> යම් අතීත බුදුවරයන් වහන්සේලා විසූ සේක් ද යම් අනාගත බුදුවරයන් වහන්සේලා වෙත් ද ලෝක නායක වූ යම් සම්බුදු කෙනෙක් මෙකල වෙත් ද සියල්ලෝම ධර්මය ගුරු කොට වාසය කරන සේක. මතු වාසය කරන්නාහ. මේ බුදුවරුන් වහන්සේලාගේ ධර්මතාවයි. එබැවින් අර්ථකාමී මහත්වය කැමති බුදුරජාණන් වහන්සේ ද ප්‍රවර බුද්ධානුශාසනය වූ සද්ධර්මයම ගරුකළ යුතු වන සේක.

මෙසේ කියා සහම්පතී බ්‍රහ්ම බුදුන් වැඳ බඹ ලොවට ගියේය. භාග්‍යවතුන් වහන්සේ එහිම සතියක් ධර්මය සිතමින් විමුක්ති සුව විඳිමින් හුන්හ. එසමයෙහි මාර දිව්‍ය පුත්‍ර පස්වන සතියෙහි අජපාල නුගරුක මුල හුන් බුදුන් දැක මෙසේ සිතීය. මම මෙතෙක් කල් මොහු ලුහුබඳිමින් සිදුරක් අපේක්ෂා කළෙමි. මොහුගේ කිසි දොසක් නොදිටිමි. මොහු දැන් මාගේ විෂය ඉක්මවන ලදි කියා දොම්නස්ව මහමඟ හිඳ සොළොස් කරුණක් සිතීය. සොළොස් ඉරක් ඇන්දේය.

මම මොහු මෙන් දාන පාරමිතාව නොපිරුවෙමි. එහෙයින් මොහු මෙන් නොවෙමි කියා එක් ඉරක් ඇන්දේය. එසේම මොහු මෙන් සීල, නෙක්ඛම්ම, පඤ්ඤා, විරිය, ඛන්ති, සච්ච, අධිට්ඨාන, මෙත්තා, උපෙක්ඛා, පාරමී නොපිරුවෙමි. එහෙයින් මොහුට සම නොවීමි. කියා දස වෙනි ඉර ඇන්දේයය. එසේම මොහු මෙන් ඉන්ද්‍රිය පරොපරියත්ති, ආසයානුසය, මහාකරුණා සමාපත්ති, යමක පාටිහීර, අනාවරණ, සබ්බඤ්ඤුත ඤාණ යන අසාධාරණ ඤාණ ලැබීමට හේතුවන දසපාරමී නොපිරුවෙමි. එබැවින් මොහුට සමවිය නොහැකි වීමි කියා සොළොස්වන ඉර ඇන්දේය. මෙසේ මහමඟ ඉරි අඳිමින් සිටිද්දී තණ්හා, අරති, රගා තුන් මර දූවරු අපගේ පියා පෙනෙන්නට නැත. ඔහු කොහේදැයි බලන්නාහු දොම්නස්ව බිම ඉරි අඳින ඔහු දැක පියා වෙත ගොස් කුමකට දුක් දොම්නස් වූයෙහි දැයි විමසූහ. දූවරුනි, මේ මහාශ්‍රමණ තෙම මාගේ විෂය ඉක්මවීය. මෙතෙක් කල් බලා සිටත් ඔහුගේ අඩුවක් දැකීමටත් නොහැකිවීමි. එයින් දුකට පැමිණියෙමියි කීය.

එසේ නම් පියාණෙනි, නොසිතනු මැනවි. අපි අපගේ බල යොදා රැගෙන එන්නෙමුයි කීහ. දරුවනි, කිසිවෙකු විසිනුත් මොහු වසඟ කළ නොහැකිය. අචල ශ්‍රද්ධාවෙහි පිහිටියේය. මොහු මහාපුරුෂයෙකැයි කීය. "පියාණෙනි, අපි ගැහැනු වෙමු. දැන්ම ඔහු රාග පාස, තණ්හා පාස ආදියෙන් බැඳ ගෙන එන්නෙමු. ඔබ නොසිතනු මැනවැයි කියා සියලු දෙනම බුදුන් වෙත ගොස් "මහාශ්‍රමණය, ඔබට උවටැන් කරන්නෙමු." යි කීහ. භාග්‍යවතුන් වහන්සේ ඔවුන්ගේ වදන් සිතට නො ගත්හ. ඇස් හැර නොබැලූහ. සියලු උපධීන්ගෙන් විමුක්ත අනුත්තර මනසින් විවේක සුව විඳිමින්ම වැඩහුන් සේක. නැවත මර දූවරු "මහා පුරුෂයන්ගේ අදහස් නම් උස්පහත්ය. සමහරුන්ට කුමාරිකාවෝය. සමහරුන්ට පළමු වයස්හි සිටින්නෝය. අපි නන් වැදෑරුම් රූපයෙන් පොළඹවන්නෙමු"යි සිතූහ. ඔවුහු වෙන් වෙන්ව කුමාරිකා වෙස් මවාගෙන තම තමන්ගේ නොවැලූ කුමරි වෙසින්, වරක් දෙවරක් වැලූ මැදිවියෙහි සිටියවුන් මෙන් සවරක්ම බුදුන් වෙත

පැමිණ මහාශ්‍රමණය, ඔබ වෙත උවටැන් කරන්නෙමුයි කීවාහුය. භාග්‍යවතුන් වහන්සේ ඔවුන් ද ගණන් නොගත්හ. ඒ දැක එකියක් කුමක් සඳහා තෙපි මෙසේ උත්සාහ කරන්නහු ද? මෙවැනි දේ අවීතරාගීන් ඉදිරියෙහි කළයුතු වෙයි. තථාගතයන්ට වනාහී රාග, දෝස, මෝහ, මාන ප්‍රහීණයයි කීය. තමන් වහන්සේගේ කෙලෂ-ප්‍රහාණය අරභයා බුදුහු මේ ගාථාව දේශනා කළ සේක.

> යමෙකුගේ ජයග්‍රහණය නොපැරද විය හැකි ද ඔහුගේ ජය-ග්‍රහණය ලොව කිසිසේත් නොපැරදේ. එබඳු අනන්ත ගෝචර ඇති අපද වූ බුදුරජාණන් වහන්සේ කවර පියවරකින් ගෙනයන්නහු ද යමකුට ජාලිනී නම් වූ විසත්තිකා නම් වූ තෘෂ්ණාව ලොව කොතැනක වත් නැද්ද ඒ අනන්ත ගෝචර ඇති අපද වූ බුදුරජාණන් වහන්සේ කවර ලෙසින් ගෙනයන්නහු ද?

එයසා අපගේ පියා ඇත්තක්ම කීය. වීතරාගී අරහත් සම්මා සම්බුදුරජාණන් වහන්සේ ගෙන යා නොහැකි යයි මේ ආදිය කියමින් පියා වෙතම ගියහ. භාග්‍යවතුන් වහන්සේ ද සතියක් ගෙවා එතැනින් මුචලින්ද මූලයට වැඩිසේක. එහිදී සත්තාහවද්දලිකා නම් වැසි උපන් හෙයින් සීතල වැළකීම පිණිස මුචලින්ද නාගරාජයා විසින් සත් දරණ පොටකින් හා පෙණයෙන් වට කරනු ලැබූ උත්වහන්සේ සම්බාධ රහිත ගඳකිළියක මෙන් විමුක්ති සුව විඳිමින් සතියක් ගෙවා එතැනින් රාජායතන මූලයට වැඩ විමුක්ති සුවයෙන්ම සතිය ගෙවූ සේක. මෙ පමණකින් සත්සතිය පරිපූර්ණ විය.

මේ අතර මූණ සේදීම් ආදි සිරුරු කිසක් නොවිය. ධ්‍යාන මාඟීඵල සුවයෙන් සත්සති ගෙවා එකුන් පනස් වන දින එහි වැඩහුන් උත්වහන්සේට මුව දොවන්නෙමියි සිත් විය. එවිට සක්දෙව් රජ අනෝතත් විලින් අරළු ගෙනවුත් පිදීය. එය වැළඳීමෙන් උත්වහන්-සේට සිරුරු කිස සිදුවිය. අනතුරුව සක් දෙවිදුම හිමවතින් නාගලතා දැහැටි ද අනෝතත් විලින් මුව දෝනා පැන් ද පිළිගැන්විය. බුදුහු

දැහැටි වළඳා අනෝතත් දියෙන් මුහුණ සෝදා රාජායතන මුල්හිම වැඩ සිටියහ.

එසමයෙහි තපස්සු භල්ලුක නම් වෙළෙඳුන් දෙදෙන පන්සියයක් ගැලින් උක්කට්ඨා ජනපදයේ මධ්‍යම දේශයට යන්නාහු සිය නෑ සහලේ දෙවියන් විසින් ගැල් නැවැත්වීමෙන් එතැනට පැමිණියහ. ඔවුහු බුදුන් දැක පහන් සිතින් ආදර බුහුමන් ඇතිව දෙවියන් විසින් ශාස්තෘන් වහන්සේට අහර සම්පාදනය කිරීම සඳහා උත්සාහවත් කරන ලදුව මී සහ මී පිඬු ගෙන භාග්‍යවතුන් වහන්සේ මේ අහර අපට අනුකම්පා පිණිස පිළිගන්නා සේක්වායි පිළිගැන්වූහ. භාග්‍යවතුන් වහන්සේ කිරිපිඬු පිළිගත් දිනයෙහිම පාත්‍රය අතුරුදන් වූ බැවින් තථාගතයන් වහන්සේලා පාත්‍රයක් නොමැතිව නොපිළිගනිති. කුමකින් පිළිගන්නෙම් දැයි සිතූ සිත දැන ලෝක පාල රජවරු සතරදෙන සිවුදෙසින් ඉඳුනිල් මිණිමුවා පාත්‍ර සතරක් ගෙනවුත් පිළිගැන්වූහ. භාග්‍යවතුන් වහන්සේ ප්‍රතික්ෂේප කළහ. ඒ සිවුවරම් රජවරු ඔවුන්ගේ පාත්‍ර බුදුන්ට අකැපබව දැන නැවත මුං වන් සෙල්මුවා පාත්‍ර සතරක් පිළිගැන්වූහ. උන්වහන්සේ ඔවුන්ට අනුකම්පාවෙන් පිළිගෙන මතු මත්තෙහි තබා එකක් වේවායි ඉටූ සේක. උන්වහන්සේගේ අදිටන් බෙලෙන් සතර මුවවිට පෙනෙමින් රේඛා බවට පත්ව මධ්‍යම ප්‍රමාණ එක් පාත්‍රයක් බවට පත්විය. භාග්‍යවතුන් වහන්සේ ඒ චටිනා ශෛලමය පාත්‍රයෙන් අහර පිළිගෙන වළඳා අනුමෝදනා කළහ.

සහෝදර වෙළෙඳුන් දෙදෙනා බුදුන් ද ධර්මය ද සරණ ගොස් උපාසක බවට පැමිණ "ස්වාමීනි, ලෝක නායකයන් වහන්ස, අපට පුද කළ යුතු යමක් දුන මැනව"යි කීහ. එවිට උන් වහන්සේ දකුණතින් හිස පිරිමැද ජීවමාන කේශ ධාතු ඔවුන්ට දුන්හ. ඔවුහු සිය නුවර ධාතු ඇතුළත් චෛත්‍යයක් කළහ. සම්මා සම්බුදුහු රාජායතන මුලින් අටවන සතියෙහි නැවතත් අජපල් මුලට වැඩ එහි තනිව එල සමවතින් හුන්හ. තනිව විවේක වාසයෙහි සිටි උන්වහන්සේට තමන් අවබෝධ කළ ධර්මයෙහි ගැඹුරු සියුම් බව මෙනෙහි කරත්ම සියලු

බුදුවරුන්ට ආවේණික වූ මේ අදහස ඇති විය. මා විසින් අවබෝධ කළ ධර්මය ගැඹුරුය. දුර්දසය. දුරනුබෝධය. ශාන්තය. ප්‍රණීතය. තර්කයෙන් නොගත හැකිය. නිපුණය. පණ්ඩිත වේදනීය ද වේ. මේ ප්‍රජාව ආලයෙහි ඇලුණේය. ආලයෙන් නැගී සිටින්නෝය. මේ ඉදප්පච්චයතා පටිච්ච සමුප්පාදය දැකීම අපහසුය. සියලු සංස්කාරයන්ගේ සමනය සියලු උපධි නැසීම නම් වූ තණ්හාක්ෂය කිරීම විරාගය නිරෝධය නිබ්බානය යන යමක් ඇත් ද එය ද දක්නට අපහසුය. මම ධර්මය දේශනා කරන්නෙම් නම් මගේ දහම අනුන් නොදන්නාහු නම් එය මට වෙහෙසකි. එය මට අපහසුවකි. භාග්‍යවතුන් වහන්සේට පෙර අසා නැති මේ අසිරිමත් ගාථා වැටහී ගියේය.

> මා විසින් දුකසේ අවබෝධ කළ ධර්මය දැන් ප්‍රකාශ කිරීමට සුදුසුය. රාග දෝෂයන්ගෙන් පිරුණුවුන් විසින් මේ ධර්මය අවබෝධ කිරීම අපහසුය. පටිසෝතයට ගමන් කරන නිපුණ ගැඹුරු දැකීමට අපහසු සියුම් ඒ ධර්මය අඳුරින් වැටුණු රාගයෙන් රත්වූවාහු නොදකිත්.

මෙසේ ප්‍රත්‍යවේක්ෂා කරන භාග්‍යවතුන් වහන්සේගේ සිත මන්දෝත්සාහි බවට නැමේ. ධර්මදේශනයට නොනැමේ. කුමක් හෙයින් උන්වහන්සේගේ සිත මෙසේ නැමේ ද? උන්වහන්සේ පෙර දීපංකර බුදු පාමුල්හි මිදී මුදවන්නෙමි. තරණය වී තරණය කරවන්නෙමි යි කියා ප්‍රාර්ථනා කළ සේක් නොවේ ද?

> අප්‍රකට වේශයෙන් ධර්මය සාක්ෂාත් කිරීමෙන් මෙහි මට කවර ප්‍රයෝජනයක් ද? සවිඥ බවට පැමිණ දෙවියන් සහිත ලෝකයා එගොඩ කරවන්නෙමි.

කියා පතා පැරුම් පුරා සවිඥ බවට පත්වූ සේක. ප්‍රත්‍යවේක්ෂා බලයෙන් වනාහි උන්වහන්සේගේ සිත මෙසේ නැමේ. බුදධත්වයට පත්ව සත්ත්වයන්ගේ කෙලෙස් ගහණ බවත් ධර්මයෙහි ගැඹුරත් ප්‍රත්‍යවේක්ෂා කළ උන්වහන්සේට මෙසේ සිත් විය. මේ සත්ත්වයෝ

කැඳ පිරවූ ලබු මෙන් ගිතෙල් පිරවූ සැළි මෙන් වසා තෙල් තැවරූ රෙදි කැබලි මෙන් අඳුන් තැවරුණු අත් මෙන් කෙලෙස් හරිතව අතිශයින් කිලිටිව රාගයෙන් රත්ව ද්වේෂයෙන් දුෂ්ටව මෝහයෙන් මුළාව සිටිති. ඔවුහු කුමක් නම් අවබෝධ කරත්දැයි සිතද්දී කෙලෙස් ගහණ බව ප්‍රත්‍යවේක්ෂා කිරීමේ බලයෙන් සිත මෙසේ නැමී ගියේය. මේ ධර්මය පොළොව දරා සිටින දිය කඳ මෙන් ගැඹුරුය. කන්දක සඟවා තැබූ අබැටක් මෙන් දැකීමට අපහසුය. සතට පැළෑ අස්-ලොමක් මෙන් දුරනුබෝධය. දුකසේ අවබෝධ කළ යුතුය. සුවසේ අවබෝධ කළ නොහැකිය. මා විසින් මේ ධර්මය අවබෝධ කිරීමට වෑයම් කරමින් නොදෙන ලද දනක් නම් නැත. නොරැකි සීලයක් නම් නැත. නොවැඩූ භාවනාවක් නම් නැත. නොපිරූ පාරමිතාවක් නම් නැත. ඒ මට සවස නිරුත්සාහයෙන් මෙන් මාර පරාජය කරද්දී මහ පොළොව කම්පා නොවීය. පළමුයම පෙර විසීම් සිහි කරත්දීත් කම්පා නොවීය. මැදියම දිවැස පිරිසිදු කරද්දීත් කම්පා නොවීය. අලුයම දොළොස් අංග ඇති. අර්ධ තුනක් ඇති, සන්ධි තුනක් ඇති සංඛෙප සතරක් ඇති, ආකාර විස්සක් ඇති, පටිච්ච සමුප්පාදය අවබෝධ කරද්දීම මේ දසසහස්‍රී ලෝකධාතුව කම්පා විය. මෙසේ මා වැන්නකු විසිනුත් තියුණු නුවණින් දුකසේ මේ ධර්මය අවබෝධ කරන ලදි. එය කෙසේ ලෞකික මහජනයා අවබෝධ කරත් ද?

මෙසේ ධර්ම ගම්භීරතාව ප්‍රත්‍යවේක්ෂා කිරීමේ ආනුභාවයෙන් ද සිත නැමී ගියේය. තවත් කාරණයෙකි. මේ ධර්ම ගෞරවය කරනු කැමති මහබඹු විසින් ආයාචනා කළ කල දේශනා කරනු කැමතිවීම නිසා ද මෙසේ සිත නැමී ගියේය. මේ අයුරින් භාග්‍යවතුන් වහන්සේ බුද්ධඥානයෙන් මාගේ සිත මන්දෝත්සාහි බවට පත් වූ පසු ධර්ම දේශනා කිරීම පිණිස මහාබ්‍රහ්මතෙම මට ආයාචනා කරන්නේය. මේ සත්ත්වයෝ බ්‍රහ්මයා ගුරු කොට ඇත්තෝය. ශාස්තෘන් වහන්සේ දම් දෙසනු කැමති වෙති. එවිට උන් වහන්සේට මහාබ්‍රහ්ම අයැද දේශනා කරවයි. භවත්නි, ධර්මය ඒකාන්තයෙන් ශාන්තය. ධර්මය ඒකාන්තයෙන් ප්‍රණීතය කියා සිතමින් අසනු කැමති වෙති. මේ

කාරණය නිසාත් මන්දෝත්සාහයට සිත නැමී ගියේය. දහම් නොදෙසීමට සිත නැමී ගියේයයි දත යුතුය.

එකල්හි සහම්පතී මහාබ්‍රහ්මතෙම භාග්‍යවතුන් වහන්සේගේ සිත් හසර සිතින් දැන මෙසේ අදහස් කළේ ය. "භවත්නි, ලෝකය නැසෙයි. භවත්නි, ඒකාන්තයෙන් ලෝකය වැනසෙයි. යම් හෙයකින් තථාගත අර්හත් සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ සිත මන්දෝත්සාහයට නැමෙයි. ධර්මදේශනාවට නොනැමෙයි. මහහඬින් කීය. එකෙණෙහිම දසසහස්‍රී ලෝකධාතුවෙහි බ්‍රහ්මයෝ ද ශක්‍රාදි දෙවියෝ ද සහම්පතී බ්‍රහ්මයාගේ ශබ්දය අසා රැස් වූහ. ඉක්බිති මහාබ්‍රහ්මතෙම යම් සේ බලවත් පුරුෂයෙක් වත්කළ අතක් දිග හරින්නේ ද දික් කළ අතක් හකුළන්නේ ද එමෙන් බඹලොවින් අතුරදන්ව දසසහස්‍රී ලෝකධාතුවෙහි බ්‍රහ්ම සමූහයා ද ශක්‍ර සුයාම, සන්තුසිත, පරනිම්මිත වසවත්ති දේව සමූහයා ද සමඟ භාග්‍යවතුන් වහන්සේ ඉදිරියේ පෙනී සිටියේය.

එවිට සහම්පතී බ්‍රහ්මතෙම උතුරු සළුව සකස් කොට දකුණු දණමඬල බිම තබා භාග්‍යවතුන් වහන්සේ දෙසට ඇදිලි බැඳ භාග්‍යවතුන් වහන්සේ ධර්ම දේශනා කරන සේක්වා සුගතයන් වහන්ස, දහම් දෙසන සේක්වා. ස්වාමීනි, අල්ප රජස්ක සත්ත්වයෝ සිටිති. ධර්මය නො ඇසීමෙන් පිරිහෙති. ධර්මය දැනගන්නෝ සිටිති. ස්වාමීනි, ලෝකානුකම්පාවෙන් පෙර බුදුවරුන් වෙත දසපුණ්‍යක්‍රියා වස්තු වශයෙන් කළ පැතුම් ඇති, මේරූ නෙළුම් හිරු එළියේ ස්පර්ශය බලාපොරොත්තු වන්නාක් මෙන් ධර්ම දේශනාව බලාපොරොත්තු වෙමින් සතර පද ගාථාවක් හෝ ඇසීමෙන් ආර්‍ය භූමියට බැස ගැනීමට සුදුස්සෝ සිටිති. එකෙක් නොවේ. දෙදෙනෙක් නොවෙති. නොයෙක් සිය දහස් ගණන් ධර්මය දැන ගන්නෝ සිටිති. ඔබ වහන්සේ බොහෝ කල්පවල අනන්ත දුක් විඳ මුළු ලෝකයා ගොඩලීම සඳහා පැරුම්පුරා බුදුබවට පැමිණි සේක. ලෝකය අනාථය. ධර්ම දේශනා කරනු මැනවි. සහම්පතී මහාබ්‍රහ්මතෙම මෙය කීය. මෙසේ ද කීය.

කෙලෙස් මලින් යුතුව සිතන ලද අසුද්ධ ධර්මය පෙර මගධයෙහි පහළ විය. අමාදොර විවෘත කරනු මැනව. නිර්මලයන් වහන්සේ විසින් අවබෝධ කළ ධර්මය අසති. කඳු මුදුනක සිටි සිංහයෙක් සුවසේ අවට සිටි ජනතාව දකී ද සුමේධයන් වහන්සේ එබඳු උපමා ඇති ධර්මප්‍රාසාදයට නැග ජාති ජරාවෙන් මැඩුණවුන් බලන සේක්වා. සමතැස් ඇත්තවුන් වහන්සේ ශෝකාවතීණී ජනතාවගේ සෝ දුක් දුරු කරන සේක්වා.

එවිට භාග්‍යවතුන් වහන්සේ බඹහුගේ අදහස් දැන සතුන්ට කරුණාවෙන් බුදුඇසින් ලොව බැලූ සේක. භාග්‍යවත් බුදුරදුන්ට පස් ඇසක් ඇත්තේය. කුමක් ද? බුද්ධචක්ඛු, සමන්තචක්ඛු, ධම්ම-චක්ඛු, පඤ්ඤාචක්ඛු, දිබ්බචක්ඛු යනුයි. බුදු ඇස කුමක් ද? ඉන්ද්‍රියපරොපරියත්ති ඤාණය සහ ආසයානුසය ඤාණය යි.

මේ දෙනුවණ බුද්ධචක්ඛු නම් වේ. සබ්බඤ්ඤුත ඤාණයම වනාහි සමන්තචක්ඛු නම් වේ. එම ඤාණ තුන ධම්මචක්ඛු නමි. පඤ්ඤා පජානනා ආදියෙහි කී යම් නුවණක් ඇත් ද එය පඤ්ඤා චක්ඛු නමි. මානුෂික ශක්තිය ඉක්මවූ අත්‍යන්ත විශුද්ධ මුළු ලොව දැකීමට සමත් යම් ඥානයක් වෙයි ද එය දිබ්බචක්ඛු නමි.

මෙහි වනාහි මෙයින් කවර ඇසකින් භාග්‍යවතුන් වහන්සේ බලන සේක් ද? ඉන්ද්‍රියපරොපරියත්ති ඤාණයෙන් සහ ආසයානුසය ඤාණයෙනි. බුදු ඇසින් ලොව බලද්දී භාග්‍යවතුන් වහන්සේ අල්ප රජස්ක මහාරජස්ක තික්ඛ ඉන්ද්‍රිය, මුදුඉන්ද්‍රිය සුවාකාර, දුවාකාර, පහසුවෙන් වටහා දිය හැකි පහසුවෙන් වටහා දිය නොහැකි භව්‍ය අභව්‍ය පරලොව වරද බිය දකිමින් වාසය කරන සමහර සතුන් ද පරලොව වරද බිය නොදකිමින් වාසය කරන සමහර සත්ත්වයන් ද දුටු සේක. යම් සේ වනාහි උපුල් විලක හෝ පියුම් විලක හෝ රතු පියුම් විලක උපුල් හෝ පියුම් හෝ රතු පියුම් දියෙහි හටගත් දියෙහි වැඩුණු දියෙන් උඩට නොපැමිණි ඇතුළෙහි ගිලී පෝෂණය වන සමහර උපුල් ද පියුම් ද රතු පියුම් ද, දියෙහි හටගෙන දියෙහි වැඩී දිය හා සමව පවත්නා සමහර උපුල් පියුම් රතු පියුම් ද, දියෙහි

හටගෙන දියෙහි වැඩී දියෙන් උඩට නැගී දියෙහි නොතැවරී තිබෙන සමහර උපුල් පියුම් රතු පියුම් ද මෙනි.

එහිදී යම් මල් දිය ඉක්මවා සූයර්රශ්මි ස්පර්ශය බලාපොරොත්තුවන අද පිපෙන මල් තිබේ ද යමක් හෙට පිපෙන මල් ද යමක් දියෙන් නොනැගී කිමිදී වැඩෙන තුන් වන දින පිපෙන මල් ද වේ. යමක් නොපිපීම මස් කැසුබන්ගේ ආහාරම බවට පත්වෙයි ද ඒ සතර වැදෑරුම් මල් මෙන් පුද්ගලයෝ සතර දෙනෙක් උද්ඝටිතඥ, විපචිතඥ, ඤෙය්‍ය, පදපරම යයි වෙති. යම් පුද්ගලයෙකුට උදාහරණ දක්වන වේලෙහිම ධර්මාවබෝධය වෙයි ද හෙතෙම උද්ඝටිතඥ නම් වෙයි. යම් පුද්ගලයෙකුට කෙටියෙන් කී දෙයෙහි අර්ථය විස්තර දැක්වීමෙහි දී ධර්මාවබෝධ වෙයි නම් හෙතෙම විපචිතඥ නම් වෙයි. යම් පුද්ගලයෙකුට උද්දේශ, පරිපුච්ඡනා, යොනිසෝමනසිකාර, කල්‍යාණමිත්‍ර සේවන භජන පය්‍යුපාසනයෙන් ධර්මාවබෝධ වෙයි නම් ඒ පුද්ගලයා ඤෙය්‍ය නම්. යම් පුද්ගලයෙකුට බොහෝ අසා බොහෝ ධරාත් ධර්මාවබෝධ නොවෙයි නම් ඒ පුද්ගලයා පදපරම නම්.

එහිදී භාග්‍යවතුන් වහන්සේ උපුල් වනයක් සමාන දසසහස්‍රී ලෝක ධාතුව බලා උද්ඝටිතඥයෝ අද පිපෙන මල් මෙන්ද විපචිතඥයෝ හෙට පිපෙන මල් මෙන් ද ඤෙය්‍යයෝ තෙවන දින පිපෙන මල් මෙන් ද පදපරමයා මස් කැසුබන්ට අහරව නොපිපෙන මල් මෙනැයි ද මෙසේ සියලු අයුරින් ලොව දුටහ. එහි පුද්ගලයන් තිදෙනෙකුට මේ ජීවිතයෙහිම භාග්‍යවතුන් වහන්සේගේ ධර්ම දේශනය අර්ථ සාදයි. පද පරමයන්ට අනාගත වාසනාව සඳහා හේතු වෙයි. උන්වහන්සේ මේ සිවු පුද්ගලයන්ට ධර්ම දේශනය වැඩ සිදු කරන්නේයයි දැන දෙසනු කැමති බව උපදවා නැවත තුන් භවයෙහි සත්ත්වයන් භව්‍ය, අභව්‍ය වශයෙන් දෙකොටසක් කළහ. එහි අභව්‍ය සත්ත්වයෝ කවරහු ද? කම්මාවරණ විපාකාවරණ ක්ලෙශාවරණවලින් යුත් ශ්‍රද්ධාව නැති කත්තුකම්‍යතාඡ්ඤය නැති දුෂ්ප්‍රාඥ සත්ත්වයෝ අභව්‍යයෝ වෙති. කුසල් දහම් මාර්ගයෙහි බැස ගැනීමට

නොහැකි වූවෝ වෙති. කර්මාවරණ විපාකාවරණ ක්ලෙශාවරණ රහිත වූ ශ්‍රද්ධා සම්පන්න ප්‍රඥා සම්පන්න යම් සත්ත්වයෝ වෙත් ද ඔව්හු අරි අටඟිමග සහ කුසල් දහම්හි බැස ගැනීමට භව්‍ය වෙති. මේ සත්ත්වයෝ භව්‍යයෝය.

ඉක්බිති සර්ව්ඥයන් වහන්සේ සියලු අභව්‍ය පුද්ගලයන් හැර භව්‍ය පුද්ගලයන් නුවණින් ගෙන ලෝකයෙහි අවබෝධ කරවිය හැකි බුදුන් විසින් හික්මවිය හැකි පෙර බුදු වරුන් විෂයෙහි ප්‍රාර්ථනා තැබුවන් බලමින් පස් අයුරකින් සලකා බැලූහ. මාගේ ප්‍රථම බෝධියෙහි මධ්‍යම බෝධියෙහි පශ්චිම බෝධියෙහි හා පිරිනිවන් නො පෑ කල බුද්ධ වෙනෙය්‍ය වූ ද මා පිරිනිවි කල ශ්‍රාවක වෙනෙය්‍ය වූ මෙපමණ සත්ත්වයෝ ද සසර සයුරෙන් මිදෙත්. ඔවුහු වනාහි අභිසම්බෝධියෙහි පටන් පිරිනිවීම දක්වා බුද්ධ වෙනෙය්‍යයෝ විසිඅසංඛ්‍ය සතිස්කෝටි ලක්ෂ, හැත්තෑහත්කෝටි දහසක් ද අසූ කෝටියක් ද වෙති. ශ්‍රාවක වේනෙය්‍යයෝ වනාහි සාරාසංඛ්‍ය දෙසාලිස් කෝටි ලක්ෂ, කෝටි පනස් දහස් සිය කෝටියකි. සියල්ලන් එක්ව සංග්‍රහ කිරීමෙන් සූවිසි අසංඛ්‍ය කෝටි ලක්ෂ හැත්තෑ හතක් ද, කෝටි විසි හත් දහසක් ද සියක් කෝටි හතලිස් හතක් ද කෝටි සියයක් ද වෙයි.

මොහු සියල්ලෝම පෙර බුදුවරුන් වෙත කරන ලද පැතුම් ඇත්තාහු නිපුණ වෙදෙකුගේ ශල්‍ය කර්මය සඳහා යෙදිය යුතු සැතක එක්වීම බලාපොරොත්තුවන මේරූ පැරණි ගඩුවක් මෙන් මවිසින් යොදනු ලබන ධර්මදේශනා නැමති සැතෙහි එක්වීම බලාපොරොත්තු වෙති. මේරූ නෙළුමක් හිරුරැස් එක්වීම බලාපොරොත්තු වන්නාක් මෙනි. මාගේ දේශනා රශ්මියෙහි එක්වීම බලාපොරොත්තුවෙති. මහ බඹු වීසින් අයදනා ලද කරුණු මාගේ බුදු අසැට ද ප්‍රකටමය. මම ඔහුගේ අදහස් බලා සත්ත්වයන්ගේ ක්ලෙශ දරථ සන්සිඳුවීම සඳහා උතුම් දහම් වැසි වස්වන්නෙමි. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ සහම්පතී බඹුහට ප්‍රතිඥා කරමින් ගාථාවකින් වදාළ සේක.

ඔවුන්ට අමාදොර විවර කළෙමි. අසනු කැමැත්තෝ ශ්‍රද්ධාව

පෙරදැරි කර ගනිත්වා. බ්‍රහ්මය, හිංසාවකැයි යන හැඟීමෙන් අවබෝධ කළ ප්‍රණීත ධර්මය මිනිසුන් අතර ප්‍රකාශ නොකෙළෙමි.

එවිට සහම්පතී බ්‍රහ්ම තෙම භාග්‍යවතුන් වහන්සේ විසින් ධර්ම දේශනාව සඳහා ඉඩ සැලසූ සේකැයි දැන අතිශයින් සතුටු සිත් ඇතිව බුදුන් පසසමින් මෙසේ කීය. කෙලෙස හග්න කළ සවාමීනි, සත්ත්වයන් හික්මවන සවාමීනි, ඤාණ ඇති සවාමීනි, මහා කාරුණික සවාමීනි, මහජනයාට සංග්‍රහ පිණිස ආයෘ අෂ්ටාංගික මාර්ග නැමති යතුරෙන් නිවන් පුර දොර විවර කරමින් අදාන්තයන් දමනය කොට අමුක්තයන් මුදා තරණය නොකළවුන් තරණය කරවා නොසැනසුණුවුන් සනසා නොනිවුණුවුන් නිවා තුන් භවයෙහි අවබෝධ කටයුතු බුදුන් සතිපට්ඨාන පොළෝතලයෙහි හොවා සතර සෘද්ධිපාදයෙන් මැඩ ශ්‍රද්ධා හස්තයෙන් ධර්මදේශනා සැත ගෙන අවිද්‍යා ගඩුව පළා සවි කෙලෙස් සැරව ඇද විදර්ශනා ක්ෂාරයෙන් දොවා මෙත් දියෙන් සෝදා සිවුසස් ආලේපය දී සිල් සුළඟින් සිඳුවා විමුක්ති රස පොවා දිට්ඨධම්මසුඛවිහාර බෙහෙත් කවා සියලු උපධික්ෂය නම් සිහිල් බව උපදවා සතුටු කරනු මැනවැයි ආරාධනා කළේය. මෙසේ සහම්පතී බ්‍රහ්මතෙම භාග්‍යවතුන් වහන්සේට පහන් දුම් ගඳමල් ආදියෙන් පුදා පසඟ පිහිටුවීමෙන් වැඳ හුනස්නෙන් නැගී තෙවරක් පැදකුණු කොට පිරිවර සහිතව අතුරුදන්ව බඹ ලොවටම ගියේය. එවිට සක් දෙව්රජ බුදුන් වැඳ "භාග්‍යවතුන් වහන්සේ ධර්මදේශනා කරන සේක්වා. සුගතයන් වහන්සේ ධර්ම දේශනා කරන සේක්වා. ඔබ වහන්සේගේ අණෙහි නොපවත්නා කල්හි මම පවත්වන්නෙමි. ඔබ වහන්සේගේ ධර්ම චක්‍රය වේවා. අපගේ ආඥා චක්‍රයයි" කියා ප්‍රතිඥා දී පිරිවර සහිතව දෙව්ලොවට ගියේය.

ලෝක නායකයාණන් වහන්සේ අට වන සතියෙහි ඇසළ මස පෙර පස තුදුස්වක දින බ්‍රහ්මායාචනය පිළිගෙන මෙසේ සිතූහ. මම පළමුව කාහට දහම් දෙසන්නෙම් ද? කවරෙක් මේ ධර්මය

අවබෝධ කරන්නේ ද? කියා යි. එවිට උන්වහන්සේට "මේ ආළාර කාලාම පණ්ඩිතය, ව්‍යක්තය, ප්‍රාඥය, බොහෝ කල් මඳ කෙලෙස් රජස් ඇත්තෙකි. මම පළමුව ආළාරකාලාමහට ධර්ම දේශනා කරන්නෙම් නම් මැනවි. ඔහු මේ දහම වහා අවබෝධ කර ගනී" කියා සිත්විය. එවිට නොපෙනී සිටි දෙවියෙකු භාග්‍යවතුන් වහන්සේට "ස්වාමීනි, ආළාර කාලාම මියගොස් සතියකැ"යි සැලකළේය. බුදුරජාණන් වහන්සේට ද ආළාර කාලාම මියගොස් සතියෙකැයි ඤාණය ඇති විය. ආළාර කාලාමයන්ට මහත් හානියකි. ඉදින් ඔහු මේ ධර්මය ඇසුවේ නම් වහා අවබෝධ කරන්නේය කියා සිත් විය. කවරකු හට මම පළමුව දහම් දෙසන්නෙම් ද? කවරෙක් මේ ධර්මය වහා අවබෝධ කරන්නේ ද? මේ උද්දකරාමපුත්ත පණ්ඩිතය, ව්‍යක්තය, ප්‍රාඥය, දිගු කල් මඳ කෙලෙස් ධූලි ඇත්තේය. මම උද්දකරාමපුත්තයන්ට පළමුව දහම් දෙසන්නෙම් නම් මැනවි. හෙතෙම වහා මේ දහම අවබෝධ කර ගනී. එවිට ද උන්වහන්සේට නොපෙනී සිටි දෙවියෙක් ස්වාමීනි, උද්දකරාමපුත්ත පාන්දර මිය ගියේයැයි සැල කළේය. උන්වහන්සේ ද බුද්ධඤාණයෙන් ඔහු පාන්දර මිය ගිය බව දැන උද්දකරාමපුත්තයන්ට මහඅලාභයකි. ඉදින් හෙතෙම මේ දහම ඇසුවේ නම් වහා වටහා ගනී. කවරෙකුහට මම පළමුව දහම් දෙසන්නෙම් ද? කවරෙක් මේ දහම වහා වටහා ගනීදැ"යි ආවර්ජනා කරන්නාහු කොණ්ඩඤ්ඤ ප්‍රමුඛ පස්වග තවුසන් සිහි කළහ. මේ පස්වග භික්ෂූහු මට බහූපකාරය. ප්‍රධන් වැඩීමේ දී මට උපස්ථාන කළහ. මම පස්වග භික්ෂූන්ට පළමුව දහම් දෙසන්නෙම් නම් මැනවි කියා සිතූහ.

මේ කොණ්ඩඤ්ඤ බ්‍රාහ්මණ තෙමේ ඒ සඳහාම පියුමතුරා බුදුන් හමුයෙහි පටන් කප් ලක්ෂයක් පෙරුම් පිරීය. විපස්සී බුදුන් කල ද බුද්ධප්‍රමුඛ අටසැට ලක්ෂයක් භික්ෂූන්ට තව වරෙක අග සස්දන් පිරිනැමීය. කොණ්ඩඤ්ඤ බ්‍රාහ්මණයන් හැර මේ අග්‍රධර්මය අවබෝධ කර ගැනීමට සමර්ථ අන් කිසිවෙක් නැත. පස්වග භික්ෂූහු දැන් කොහි වෙසෙත් දැයි විමසූහ. භාග්‍යවතුන් වහන්සේ අතිමානුෂික

විශුද්ධ දිවැසින් බරණැස ඉසිපතන මිගදායෙහි පඤ්චවර්ගීය භික්ෂූන් දුටහ. දැක දෙවන දින ඇසළ පොහෝ දිනයෙහිම අජපල් නුගරුක් මුලින් නැගී පා සිවුරු ගෙන උරුවේලාවෙහි සේනානිගමයෙහි පිඬු පිණිස හැසිර දන් වළඳා බරණැසට යමියි නික්ම චක්‍රාදි නොයෙක් වර ලකුණින් හෙබි සුප්‍රතිෂ්ඨිත සම පාකමලින් පොළොතලය ඇක්මවමින් අටළොස් යොදුන් මඟට වැඩියහ. උපක ආජීවක මහබෝධියටත් ගයා ගමටත් අතර දික් මඟට පිළිපන් අතිශය මනහර සකල සත්ව නයන රසායන හාත්පස විසිරෙන මනහර වර්ණ ඇති බුදු බවට පත් සුදාන්ත සුරත් රන්පිළිමයක් වැනි හාත්පස දොළොස්රියන්හි සුචිර පිඤ්ජරප්‍රභාවෙන් බබළන භාග්‍යවතුන් වහන්සේ දුටුවේය. උන්වහන්සේ දුටු උපක ආජීවක අසිරි අද්භූත විස්මයට පත්ව කවර නම් ආශ්චර්ය අද්භූත රූපයක් ද රූමතුන්ටත් රූමත්යයි බුදුන් කරා පැමිණ "ඇවැත්නි, ඉන්ද්‍රියයන් පැහැදිලිය, පිරිසිදුය, ඡවි වර්ණය පැහැපත්ය, කවරකු උදෙසා පැවිදි වූයෙහි ද? ඔබගේ ශාස්තෘවරයා කවරෙක් ද? කවරක්හුගේ ධර්මය රුචිකරන්නහු දැයි ඇසූහ. මෙසේ කී කල පාදඋරී භාග්‍යවතුන් වහන්සේ තමන් සර්වඥ බැවින් අනාචාර්ය බව දන්වමින් උපක ආජීවකට ගාථාවෙන් මෙසේ වදාළ සේක.

> සියල්ල මැඩලීමි. සියල්ල දනිමි. සියලු දහම්හි නොඇලුණෙමි. සියල්ල හැර තෘෂ්ණාක්ෂයෙන් මිදුණෙමි. තමන්ම දැන කවරෙකු උදෙසම් ද? මට ආචර්ය වරයෙක් නැත. මට සමවූවෙක් ද නැත්තේය. දෙවියන් සහිත ලෝකයෙහි මට සමවූවෙක් නැත. මම ලොව අර්හත් වෙමි. මම ලෝකයෙහි අනුත්තර සම්මා සම්බුද්ධ වෙමි. සිහිල් වූයෙමි. නිවුණෙමි. ධර්මචක්‍රය පැවැත්වීමට කසී පුරයට යමි. අන්ධභූත ලෝකයෙහි අමා බෙරය වයන්නෙමි.

ඇවැත්නි, ඔබ ප්‍රතිඥා කරන අන්දමට අනන්තජින යයි කීමට සුදුසු වන්නෙහිය.

මා වැනි ජිනවරු වෙත් ද ඔවුහු ආශ්‍රවක්ෂයට පත්වුවෝ වෙති. මා විසින් ලාමක දහම් පරාජය කරන ලදි. උපක, එබැවින් මම ජිනවෙමි.

මෙසේ වදාළ කල උපක ආජීවක භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි උපන් ගෞරවය ඇතිව ඇවැත්නි, විය හැකිය කියා හිස සලා කුඩා මඟකින් ගියේය. එවිට උත්තම සුගතයන් වහන්සේ උපකාජීවකට තම නම කියා අටළොස් යොදුන් මඟින් බරණැසට ගොස් සවස ඉසිපතනයට වැඩි සේක. එවිට ඒ පස්වග තවුසෝ ඒකාචාරී කේසර සිංහයකු මෙන් වඩින බුදුරජාණන් වහන්සේ දුරදීම දැක උනුන්ට මෙසේ කතිකාකර ගත්හ. ඇවැත්නි, මේ ශ්‍රමණ ගෞතමයෝ බාහුලිකව ප්‍රධන් වීර්‍යය අතහැර බාහුලික බවට පත්ව එති. ඔහුට නොවැඳිය යුතුය. පා සිවුරු නොපිළිගත යුතුය. නමුත් අසුනක් පමණක් පැනවිය යුතුය. කැමති නම් වාඩිවෙයි කියා යි. භාග්‍යවතුන් වහන්සේ ඔවුන් ළඟට පැමිණෙත්ම ඒ පස්වග තවුසෝ ස්වකීය කතාවෙහි නොපිහිටා නැගිට පෙරගමන් කොට එක් නමක් උන්වහන්සේගේ පාසිවුරු පිළිගත්තේය. එක් නමක් අසුනක් පැනවීය. එක් නමක් පා දෝනා පැන් තැබීය. එක් නමක් පාපුටුව තැබීය. එක් නමක් පා සේදීය. පැනවූ අස්නෙහි උන්වහන්සේ වාඩි වූහ. නමුත් භාග්‍යවතුන් වහන්සේට නමින් ද ආවුසෝ වාදයෙන් ද කතා කරති. එවිට භාග්‍යවතුන් වහන්සේ බුදු බල දක්වමින් ඔවුන්ට මහණෙනි, තථාගතයන් වහන්සේට නමින් සහ ආවුසෝ වාදයෙන් කථා නොකරව්. මහණෙනි, මම තථාගත අරහත් සම්බුද්ධ වෙමි. මහණෙනි, ඇහුම් කන් දෙව්. අමෘතය අවබෝධ කළෙමි. මම අනුශාසනා කරමි. මම දහම් දෙසමි. දක්වන ලද පරිදි පිළිපදිනවුන්ට නොබෝ කලකින්ම යමක් සඳහා කුල පුත්‍රයෝ මනාව ගිහිගෙන් නික්ම අනගාරික සසුන්හි පැවිදි වෙත් ද, ඒ උතුම් බඹසර කෙළවර ඉහාත්මයෙහිම තමන්ම මනාතුවණින් පසක් කොට ලබා වාසය කරන්නාහයි වදාළ සේක.

මෙසේ වදාළ කල්හි පස්වග භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට

"ඇවැත්නි ගෞතමයෙනි, එවැනි ආයුෂ ප්‍රතිප්‍රදාවකිනුත් එවැනි දුෂ්කර ක්‍රියාවකිනුත් මිනිස් දහමින් වඩා වැඩි ආයුෂ ඤාණ දර්ශන විශේෂයක් සාක්ෂාත් නොකෙළෙහිය. කිමෙක් ද ඔබ දැන් බාහුලිකව ප්‍රධන් අතහැර බහුලත්වයට වැටී මිනිස් දහමට වඩා වැඩි ආයුෂ ඤාණ දර්ශන විශේෂයක් කෙසේ අවබෝධ කරන්නෙහි ද කියා බුදුරජාණන් වහන්සේට කීහ. මෙසේ කී කල භාග්‍යවතුන් වහන්සේ පඤ්ච-වර්ගීයයන්ට "මහණෙනි, තථාගතයෝ බාහුලික නොවෙති. ප්‍රධන් වීර්‍යය අතහැර දැමුවෝ නොවෙති. බහුලත්වයට වැටුණාහු නොවෙති. මහණෙනි, මම තථාගත අර්හත් සම්‍යක් සම්බුද්ධ වෙමි. මහණෙනි, කන් යොමු කරව්. නිවන අවබෝධ කළෙමි. මම අනුශාසනා කරමි. මම දහම් දෙසමි. අනුශාසනා පරිදි පිළිපදනාහු නොබෝ කලෙකින් යමක් සඳහා කුලපුත්‍රයෝ මනාව ගිහිගෙන් නික්ම අනගාරික ශාසනයෙහි පැවිදි වෙත් නම් ඒ උතුම් බ්‍රහ්මචරියාවසානය ඉහාත්මයෙහිම තෙමේම විශිෂ්ටඥානයෙන් දැන පැමිණ වාසය කරති කියා වදාළ සේක. දෙවනුවත් ඒ පඤ්ච වර්ගීය භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීහ. - පෙ - තෙවනුව ද කීහ.

මෙසේ කීකල භාග්‍යවතුන් වහන්සේ "මහණෙනි, මාවිසින් ඔබලාට මින් පෙර මෙවැන්නක් ප්‍රකාශ කොට ඇද්දැයි විමසූහ. ස්වාමීනි, නැත. මහණෙනි, මම තථාගත අර්හත් සම්‍යක් සම්බුද්ධ වෙමි. මහණෙනි, කන් යොමව්. මම අනුශාසනා කරමි. අනුශාසනා පරිදි පිළිපදිනාහු - පෙ - ලබා වාසය කරතියි වදාළ සේක. භාග්‍ය-වතුන් වහන්සේ පස්වග තවුසන්ට ඒත්තු ගැන්වීමට පොහොසත් වූහ. අනතුරුව ඒ භික්ෂූහු ඇහුම්කන් දුන්හ. කන් යොමු කළහ. දැන ගැනීමේ සිත පෙරදැරි කර ගත්හ.

එවිට මහණෙනි, කන් යොමව්. නිවන් අවබෝධ කළෙමි. මම අනුශාසනා කරමි. මම ධර්ම දේශනා කරමි යන භාග්‍යවතුන් වහන්සේගේ ව්‍යවහාර ශබ්දය අසා පොළෝ වැසි දෙවියෝ ශබ්ද ඇස්වූහ. "නිදුකාණෙනි, යමු. අද භාග්‍යවතුන් වහන්සේ ඉසිපතන මිගදායෙහි ලොව ශ්‍රමණයෙකු විසින් හෝ බ්‍රාහ්මණයෙකු විසින්

හෝ දෙවියෙකු විසින් හෝ මාරයෙකු විසින් හෝ බ්‍රහ්මයකු විසින් හෝ ලොව කිසි කලෙක නොපවත්වන ලද අනුත්තර ධම් චක්‍රය පවත්වන සේක. අපි දැන් ඒ බණ අසමු. බුදු උපත දුර්ලභය. දහම් ඇසීම දුර්ලභය. ක්ෂණ සම්පත් දුර්ලභය. සත්පුරුෂ සමාගමය දුර්ලභය කියා"යි. එවිට පොළොව්වැසි දෙවියන්ගේ ශබ්දය අසා අහස්හි දෙවියෝ එසේම ශබ්ද ඇස්වූහ. අහස වැසි දෙවියන් ගේ ශබ්දය අසා චාතුම්මහාරාජික දෙවියෝ ශබ්ද ඇස්වූහ. චාතුම්මහරාජික දෙවියන්ගේ ශබ්දය අසා තාවතිංස දෙවියෝ ශබ්ද කළහ. තාවතිංස දෙවියන්ගේ ශබ්දය අසා යාම දෙවියෝ ශබ්ද කළහ. යාම දෙවියන්ගේ ශබ්ද අසා තුසිත දෙවියෝ ශබ්ද කළහ. තුසිත දෙවියන්ගේ ශබ්ද අසා නිම්මාණරතී දෙවියෝ ශබ්ද කළහ. නිම්මාණරති දෙවියන්ගේ ශබ්ද අසා පරනිම්මිත වසවත්ති දෙවියෝ ශබ්ද කළහ.

මේ අයුරින් ඒ ඇසිල්ලෙන් ඒ මොහොතින් බඹලොව දක්වා ශබ්දය පැතිර ගියේය. බ්‍රහ්මපාරිසජ්ජ, බ්‍රහ්මපුරෝහිත, මහාබ්‍රහ්ම, පරිත්තාභා, අප්පමාණාභා, ආභස්සර, සුභකිණ්හ, වේහප්ඵල, අසඤ්ඤී සත්ත්වයන් හැර අකනිටාව දක්වා උඩ නැගී පරම්පරා සොඹාවෙන් දසසහස්‍රී ලෝක ධාතුවෙහි දෙවියෝ ද බ්‍රහ්මයෝ ද ඒ අසා ඔවුනොවුන් කැඳවමින් මේ සක්වළ ගැබට පිවිස, එකම නලයක බහාලූ රන්සුණු මෙන් ඉසිපතන මිගදායයෙහි රැස් වූහ. එසමයෙහි අස්තයට ගිය සැඳෑ පව්වමත දිලෙන හිරු ඇති කල්හි බුද්ධෝත්පාදයෙන් සැරසුණ කාලයෙහි ලෝක රමණීයත්වය බැලීමට මෙන් උදාගිරි මුදුන්හි සඳමඬල බබළන කල්හි හිර සඳ නැමැති කොඩාලින් බැබළෙන කිරණ අංගරාග ඇති නිර්මල අහස නැමැති දුහුල් සළුව ඇඳ දිදුලන දිසාංගනාව සිටි කල්හි චතුර් වෛශාරද්‍ය විශාරද ජිනවර සිංහයාණෝ අනෙකජන සන්තාන සතුටු කරවමින් පවිත්‍රාසනයෙහි රහස්‍යාසනයෙහි දානාදි නොයෙක් කුසල ඵලානුභාවයෙන් උපන් වරසිංහාසනාරූඪව බබළන උතුම් වරලක්ෂණ සහිත දසබල දේහයෙන් නිකුත් සවනක් රසින් මුළු මහත් අහස පොළොව ආලෝකවත්

කරමින් අචින්ත්‍ය වූ අනුපම වූ වණ්ණ කාන්ති සම්පත්තියෙන් සියලු දෙව්සිරි පරදවා බැබළිසේක.

මෙසේ බබළමින් අනුපමවණ්ණවත් තථාගතයන් වහන්සේ අන්තද්වය, ත්‍රිපරිවෘත, ද්වාදසාකාර, ෂඩ් අසාධාරණ ඤාණ විජෘම්භනයට යෝග්‍ය ආර්යාකරයෙහි හටගත් අනුත්තර ධම්මචක්‍ර ප්‍රවර්තනය කරමින් සමසතලිස් දන්ත කිරණයෙන් බබළන සිහිල් සුවඳ යුත් තඹවන් මුවකමල විවර කරමින් කරවීක නාදයෙන් යුතු අෂ්ටාංග සමන්නාගත ශ්‍රවණීය මධුරතර ඝොෂය විහිදුවා පස්වග භික්ෂූන් ඇමතු සේක. "මහණෙනි, මේ අන්ත දෙක පැවිද්දෙකු විසින් සේවනය නොකළ යුතුය. භජනය නොකළ යුතුය. ඇසුරු නොකළ යුතුය. කවර අන්ත දෙක ද? හීන වූ ග්‍රාම්‍ය වූ පුහුදුන්ට අයත් අනාර්ය වූ අනර්ථවත් වූ යම් මේ කාමයන්හි කාමසුඛල්ලිකානුයෝගයෙක් ඇද්ද මෙය කලකිරීම පිණිස විරගය පිණිස නිරෝධය පිණිස උපසමය පිණිස, අභිඥාව පිණිස සම්බෝධය පිණිස නිවන් පිණිස නොපවත්තේය. දුක් සහිතවූ අනාර්ය වූ අනර්ථවත් වූ යම් මේ අත්තකිලමථානුයෝගයක් වෙයිද මෙය කලකිරීම පිණිස - පෙ - නිවන් පිණිස නොපවත්නේය.

මේ අන්ත දෙකට නොපැමිණ ඇස පාදන නැණ පාදන උපසමයට හේතු වන අභිඥාවට සම්බෝධයට නිවනට හේතුවන, මධ්‍යම ප්‍රතිපදාව තථාගතයන් වහන්සේ විසින් අවබෝධ කරන ලදි. මහණෙනි, තථාගතයන් වහන්සේ විසින් අවබෝධ කරන ලද ඒ මධ්‍යම ප්‍රතිපදාව කුමක් ද? මේ අරිඅටඟි මඟමය. එය මෙසේය. සම්මාදිට්ඨි, සම්මාසංකප්ප, සම්මාවාචා, සම්මාකම්මන්ත, සම්මා ආජීව, සම්මාවායාම, සම්මාසති, සම්මාසමාධියයි. මහණෙනි, තථාගතයන් වහන්සේ විසින් අවබෝධ කළ ඇස ඇති කරන නැණ ඇති කරන මේ මධ්‍යම ප්‍රතිපදාව උපසමය පිණිස - පෙ - නිවන පිණිස පවතී."

මේ අන්ත ද්වය බැහැර කරන මධ්‍යම ප්‍රතිපදාව දේශනා කොට සත්‍ය කෘත්‍ය කෘත ඤාණ වශයෙන් තුන් පරිවෘත්තයක් ඇති

දොළොස් ආකාරයක් ඇති චතුස්සත්‍යය දේශනා කරමින් මේ දුක්ඛ ආර්ය සත්‍යය කියා මහණෙනි, මට පෙර කිසිදා අසා නැති ධර්මයන්හි ඇස පහළ විය. නැණ පහළ විය. ප්‍රඥාව පහළ විය. විද්‍යාව පහළ විය. ආලෝකය පහළ විය. ඒ මේ දුක්ඛ ආර්ය සත්‍යය, පිරිසිඳ දත යුතුය කියා පෙර නොඇසූ ධර්මයන්හි ඇස පහළ විය. - පෙ - ආලෝකය පහළ විය.

ඒ මේ දුක්ඛ ආර්ය සත්‍යය පිරිසිඳ දතිමි කියා මට පෙර නො ඇසූ ධර්මයන්හි ඇස පහළවිය -පෙ- ආලෝකය පහළ විය. මහණෙනි, මට මෙය දුක්ඛසමුදය ආර්ය සත්‍යය කියා පෙර නොඇසූ ධර්මයන්හි -පෙ- ඒ මේ දුක්ඛසමුදය ආර්ය සත්‍යය, ප්‍රහාණය කළ යුතුය කියා පෙර නො ඇසූ ධර්මයන්හි -පෙ- ඒ දුක්ඛසමුදය ආර්ය සත්‍යය ප්‍රහීණයයි කියා පෙර නොඇසූ ධර්මයන්හි ඇස පහළ විය. -පෙ- අලෝකය පහළවිය. මහණෙනි, මෙය දුක්ඛනිරෝධ ආර්ය සත්‍යයයි කියා මට පෙර නොඇසූ දහම්හි -පෙ- ඒ දුක්ඛනිරෝධ ආර්‍ය්‍ය සත්‍යය ප්‍රත්‍යක්ෂ කටයුතුයි කියා පෙර නොඇසූ දහමිහි -පෙ- ඒ දුක්ඛනිරෝධ ආර්‍ය්‍ය සත්‍යය ප්‍රත්‍යක්ෂ කරන ලදි කියා පෙර නොඇසූ දහම්හි මට ඇස පහළ විය. - පෙ - ආලෝකය පහළ විය. මහණෙනි, මෙය දුක්ඛනිරෝධ ගාමිනීපටිපදා ආර්‍ය්‍ය සත්‍යය කියා මට පෙර නොඇසූ දහම්හි -පෙ- මේ දුක්ඛනිරෝධ ගාමිනීපටිපදා ආර්‍ය්‍ය සත්‍යය වැඩිය යුතු යයි කියා පෙර නො ඇසූ දහම්හි -පෙ- මේ දුක්ඛ නිරෝධ ගාමිනීපටිපදා ආර්‍ය්‍ය සත්‍යය වඩන ලදි කියා පෙර නොඇසූ දහම්හි මට ඇස පහළ විය -පෙ- ආලෝකය පහළ විය.

මෙසේ පරිවෘත්ත තුන සතරක් කොට පැවැත්වීම ද්වාදසාකාර නම්. ඉක්බිති සිව්සස් බෙදීමෙහි දක්ෂ වූ විදූන්ට විදූවූ භාග්‍යවතුන්ව හන්සේ ආර්‍ය්‍ය සත්‍ය දේශනා කරන කල්හි පෙර රශ්මියටත් පෙර තේජසටත් වඩා සොඳුරු නිමල ඡවිවර්ණයෙන් අතිශයින් බබළන්නාහු දහසක් කළයෙන් පරිෂේක කළ යඳ මයූරයෙකු මෙන් බැබළි සේක. ආර්‍ය්‍යසත්‍ය දේශනාව සකල මහසමුදුරට හෙයක් සේ සියලු සම්මා සම්බුදුරජාණන් වහන්සේලාගේ උතුම් සාමුක්කංසික දේශනා

නම් වන්නේය. සෝර පිණ්ඩයක් මෙන් දැටි පිණ්ඩයක් මෙන් ප්‍රාසාද කූටයක් මෙන් ආර්‍යසත්‍ය දේශනාවම ලෝකනාථයන් වහන්සේලාගේ උතුම් දේශනයයි. සතර ආර්‍ය සත්‍යයම සවිඥකඥාන විකුර්වණය කරන එම ඤාණයටම සමාන්තර වූ ඤාණයයි. එබැවින් බුදුරජාණන් වහන්සේ අනල්ප කල්ප කෝටිවල රැස් කරන ලද සුචරිතයන්හි වරකුසල ඵලයෙන් නිපන් උතුම් බුද්ධාසනයෙහි වැඩහිඳ සමුදුරු ගොස, අසඳිං ගොස පරයමින් මධුරස්වරයෙන් පස්වග භික්ෂූන් ඇමැතූ සේක.

මහණෙනි, මෙ ත්‍රිපරිවෘත්ත ද්වාදසාකාර වූ චතුරාර්‍ය සත්‍යයෙහි යථාභූත ඤාණ දර්ශනයෙන් යම්තාක් සුපිරිසිදු නොවී ද මහණෙනි, ඒතාක් මරුන් සහිත බඹුන් සහිත මහණ බමුණන් සහිත ප්‍රජාවෙහි දෙවියන් සහිත ලෝකයෙහි අනුත්තර සම්මා සම්බෝධිය අවබෝධ කළෙමි කියා ප්‍රතිඥා නොකළෙමි. යම්දාක මහණෙනි, මේ චතුරාර්‍ය සත්‍ය ධර්මයන්හි මෙබඳු පරිවෘත්ත තුනක් ඇති ආකාර දොළොසක් ඇති යථාභූත ඤාණ දර්ශනය සුපිරිසිදු වී ද මහණෙනි එවිටම දෙවියන් සහිත ලෝකයෙහි -පෙ- අනුත්තර සම්මාසම්බෝධිය අවබෝධ කළෙමි කියා ප්‍රතිඥා කළෙමි. මට ඤාණ දර්ශනය පහළවිය. මේ අන්තිම ජාතියයි. දැන් පුනර්භවයක් නැත" භාග්‍ය වතුන් වහන්සේ මෙසේ ආර්‍ය සත්‍යයන් කුළඟන්වා නිමවූ සේක. කෙසේ නම් තථාගතයන් වහන්සේ විසින් අවබෝධ කරන ලද මධ්‍යම ප්‍රතිපදාව ධම්මචක්ක ෂඩ්ඥාන විජෘම්භන ඇත්තේ ද? ඇස ඇති කරයි. නැණ ඇති කරයි. උපසමය අභිඥාව සම්බෝධය නිර්වාණය සඳහා පවතී. මෙය ෂඩ්ඥාන විජෘම්භනයයි.

අරියාකර සම්භූත නම් වන්නේ කෙසේ ද? අතීත දීපංකර ආදි සම්බුදුවරුන්ට ආර්‍යාකර වූ බැවිනි. එසේ නැත්නම් බුද්ධ ශ්‍රාවක වූ ආර්‍ය වූ සැරියුත් මුගලන් ආදි සව්වන්ට ආර්‍යාකර වූ බැවිනි. මහණකු විසින් හෝ බමුණකු විසින් හෝ දෙවියෙකු මරෙකු බඹෙකු විසින් හෝ ලොව කිසිවෙකු විසිනුත් නොපවත්වන ලද ධම්චක්‍රය ධම්රාජ භාග්‍යවතුන් වහන්සේ විසින් පවත්වන ලදි. මෙහි

ධම් චක්‍රය දෙපරිදි වේ. පටිවේධඤාණ ධම්මචක්කය. දේශනා ධම්මචක්කය කියායි. එහි ප්‍රඥාවෙන් ප්‍රභාවිත වූ තමනට ආර්ය ඵල ගෙන දෙනු ලබන්නේ පටිවේධධම්මචක්ක නමි. ශ්‍රාවකයන්හට ආර්ය ඵල ගෙන දෙනු ලබන තරණය ප්‍රභාවිත කොට ඇත්තේ දේසනාඤාණ ධම්මචක්ක නමි. ධම්මචක්කය මෙසේ දෙවැදෑරුම්ය.

එයද සතිපට්ඨාන මහානේමිය ඇත්තේය. සත් සම්බෝධි අංග අරයන්ගෙන් ද ධම් මහානාභියෙන් ද ආසවක්ඛයඤාණ අක්ෂයෙන් ද ස්ථිර වූ ඉද්ධිපාදඤාණ නැමැති අඹරාවෙන් ද සමථ විපස්සනාඤාණ වියගසින් ද මනෝමයඤාණ යොතින් ස්ථිරව බැඳ සම්‍යක්ප්‍රධාන තුරඟුන් යොදා සසර සාගර ඔසයෙහි ගිලි සතුන් ගොඩ ගෙන ධම්චක්‍ර ඇති මහාරථයෙහි තබා මහාසාරථී වූ සම්මා සම්බුදුරජාණන් වහන්සේ ශ්‍රද්ධා හස්තයෙන් ප්‍රඥා කෙවිට ගෙන කාමසුඛල්ලිකානුයෝග නැමැති බහල මඩ වගුර ද සන අත්තකිලමථානුයෝග නැමැති උග්‍ර විසම භූමිය ද යන අන්තයන් මැඩ නැණ ඇති කරන මධ්‍යම ප්‍රතිපදා මාර්ගයට පැමිණ එම ඒකායන අරි අටඟ මඟින් ධම්චක්‍ර යොදන ලද පවර මහරිය පදවන සේක.

> ඒ මාර්ගය උජුක නම් වේ. දිසාව අභය නම් වේ. ධම්චක්‍ර යුතු රථය අකුජන නම් වන්නේය.

ඒ ශාස්තෘන් වහන්සේ මේ ධම්චක්‍රය ගෙන ඊම පිණිස දීපංකර නායකයන් වහන්සේ ඉදිරියෙහි ඔඬ මත වැතිර කාය පරිත්‍යාගය කළහ. එතැන් පටන් සාරාසංඛ්‍ය කප් ලක්ෂයක් පුරා සූවිසි බුදුවරුන් හමුවෙහි ප්‍රාර්ථනා කළහ. ඉක්බිති බුදු බවට පත්ව උරුවේලාවෙහි හැසිරීමෙන් පසු අනුපිළිවෙළින් උරුවේලාචරණයට ප්‍රථම සවීඥ බුදුවරයන් වහන්සේලාට ආවේණි ධර්ම චක්‍රය ඉසිපතනයෙහි පැවැත් වූ සේක. දහම්සක් පැවැත්වූ කල්හි දසසහස්‍රී ලෝක ධාතුව ධරා සිටි මහ පොළොව සද්ධම්වේගය උසුලනු නොහැකිව උස් පහත් වෙමින් කම්පාවෙමින් සෙලවෙයි. වෙව්ලයි. අපමණ මහාආලෝකය පහළ විය. පොළොතලයෙහි පටන් භවාග්‍රය දක්වා ඒක කොලාහල විය.

දහම්සක පැවැත්වූ කල්හි ශාස්තෘන් වහන්සේගේ ධර්ම තේජසින් පොළොව පටන් බඹලොව දක්වා දස සහස්‍රී ලෝක ධාතුව කම්පා විය. ඤාණාලෝකය දැල්විණ. ආලෝකය මහත් විය. එදා විපුල ආලෝකය ලෝකාන්තරිකයන්හි ද විය. අවීචි ගිනිදැල් හාත්පසින් නිවී ගියේ ය. මහාලෝකධාතුනිරය සිසිල් දියෙන් යුක්ත විය. බන්ධන කැඩී ගියේය. කාලසූත්‍රය සිදී ගියේය. කුට මුවහත් යහුල් ඇද වැටුණේය. වෑ පොරෝ ආදි සියලු ආයුධ දඬු රහිත විය. අඟුරු පව්ත ය නිවුණේය. අසිපත්‍ර සව්ප්‍රකාරයෙන් සුන්මුල්ව වැටුණේය. කටුඉඹුල් කටු එදා පහ විය. වේතරණී කටු අධොමුඛ විය. ඒ ඇසිල්ලෙහි නදී දිය දහර සුන් විය. කුක්කුල නිරය ගල්විය. නිරායුධ නිරයපාලයෝ අවෙරිව හුන්හ. නිරය සත්ත්වයෝ සුව ඇත්තෝ වූහ. කාලකඤ්ජික සත්ත්වයෝ සැනසිලි ලබා සතුටු වූහ. එකෙණෙහි සියලු රියසක් නොපෙරළුණේය. එකල සියලු පක්ෂීහු නිසලව නිදිගත්තවුන් මෙන් වූහ. ආත්පස සියලු සත්ත්වයෝ උනුන් හැඳින්නාහ. අවෙරී සියලු තිරිසන්හු මෙත් කළහ. එහි නාගයෝ ගුරුළන් සමඟ එක් වූහ. ව්‍යාඝ්‍රයෝ මුවන් සමග ද මහිෂයෝ අසුන් සමග ද මුසු වූහ. කවුඩු බකමුණෝ ද සර්ප මුගටීහු ද එක්වූහ. සදා වෛරී සියලු සත්ත්වයෝ පහන් සිතැත්තෝ වූහ. ගර්භමූඪ ස්ත්‍රීහු සුවසේ ප්‍රසව කළහ. ජාත්‍යන්ධයෝ බැලූහ. බිහිරෝ ඇසූහ. ගොළුවෝ එකෙණෙහි මිහිරි වදන් කථා කළහ. පිල්ලූ කැමැති සේ මනාව ගමන් කළහ. විදෙස්ගත නැවී, පටුන්වලට පැමිණියේය. එකෙණෙහි මහජනයා මිහිරි අස්වස් ලැබූහ. සියලු පක්ෂීහු පියැඹීම් හැර පොළෝතලයෙහි සිටියහ. තිරිසන්හු එකෙණෙහි මිනිස්බස් තෙපෙලූහ. මහසුළං නොහැමීය. ගංගා නොගැලීය. මහසමුදුර ද රළ රහිත විය. පස් මහාගංගාවල මුහුදුවල ද යන සෑම තැනම එකෙණෙහි පස්වනක් පියුම් පිපුණේය. පොළෝ තෙලෙහි ගස්වල වැල්වල ගල්තලාවල පියුම් සත්බුමු පියුම් පැන නැංගේය. මල්ඵල ගන්නා රුක් සුපිපි මල් පල

ඇති විය. දම්සක් පැවැත්වූ කල හැමතැන අසිරි පහළවිය.

මෙසේ නොයෙක් අසිරි අද්භූත පහළ වෙද්දී අනුත්තර ධම්රාජ භාග්‍යවතුන් වහන්සේ අනුත්තර ධම්මචක්කප්පවත්තනය පැවැත්වූහ. දම්සක් පැවැතුම් අවසන කොණ්ඩඤ්ඤයෝ මුහුකළ ඤාණ සම්පත් ඇති බැවින් ශාස්තෘ ධම්දේශනානුසාරයෙන් නුවණ යොමුකොට එම ආසනයෙහිම අටලොස්කෙළක් බඹුන් සමඟ සොවාන් පෙලෙහි පිහිටියහ. ඒ සමගම ශාස්තෘන් වහන්සේ මේ මහාදුෂ්කර ධම්ය පළමු කොටම දැන ගත්තේය. මොහු අඤ්ඤාත කොණ්ඩඤ්ඤ යයි දෙවිගණ මැදම උන් වහන්සේ අමතා භවත්නි, ඒකාන්තයෙන්ම කොණ්ඩඤ්ඤ දැන ගත්තේය. භවත්නි, ඒකාන්තයෙන් කොණ්ඩඤ්ඤ දැන ගත්තේ යයි වදාළ සේක. මෙසේ කොණ්ඩඤ්ඤ තෙරුන් වහන්සේට අඤ්ඤාත කොණ්ඩඤ්ඤ යයි කියාම නම් විය. මෙසේ මෙතැන් පටන් ආයුෂ්මත් කොණ්ඩඤ්ඤයන්ට අඤ්ඤාත කොණ්ඩඤ්ඤ කියාම නම් විය.

ඉක්බිති දුටු දහම් ඇති පත් දහම් ඇති දත් දහම් ඇති බැසගත් දහම් ඇති විචිකිච්ඡා තරණය කළ කෙසේද? කෙසේද? යන කල්පනා පහ කළ මාන රහිත ශාස්තෘ ශාසනය හැර අන් පිහිටක් නොපැතූ නොසෙල්වෙන සැදැහැ ඇති අඤ්ඤාත කොණ්ඩඤ්ඤ තෙරණුවෝ හුනස්නෙන් නැගී බුදු සිරිපාමුල හිස තබා දොහොත් මුදුන් දී ලෝකනාථ භාග්‍යවතුන් වහන්සේගෙන් සුගතයන් වහන්සේ මා පැවිදි කරන සේක්වා. ලෝකවිදූ ස්වාමීනි, මා පැවැදිකරන සේක්වා යි පැවිද්ද අයැදියහ. ඉක්බිති ලෝකනායකයාණෝ රැසිරු සිවුරු ගැබින් දකුණත දිගු කෙට "මහණ එව. මැනවින් දුක් කෙළවර කිරීම පිණිස බඹසර හැසිරෙව"යි වදාළ සේක. එවිට උන් වහන්සේගේ තවුස් ලකුණු අතුරුදන්ව සෘද්ධිමය පා සිවුරු ආදී මහණ අටපිරිකර ධාරීව ඉරියව් සම්පන්න භික්ෂු භාවය පහළ විය. කවර අනුහසකින් මේ එහිභික්ෂු පැවිදි උපසම්පදා ලබන්නේ ද? පෙර ශ්‍රමණ අටපිරිකර පිදීම් අනුහසිනි. ඒ අටපිරිකර කුමක් ද? සඟළසිවුර උත්තරාසංඝය, අඳනය, පටිය, පාත්‍රය, දැලිපිහිය, ඉදිකටුව සහ පෙරහනයි.

තුන් සිවුරු, පාත්‍රය ද, දැලිපිහිය, ඉදිකටුව, කායබන්ධනය, පෙරහන ද යන මේ අට යුක්තයෝග භික්ෂුවට යොගය වේ.

මේ අටපිරිකර නම් අටපිරිකර පිදූ පුද්ගලයා සිවුරු ආදි පිරිකර සුලභ, එහිභික්ෂු පැවිද්දෙන් පැවිදි උපසම්පදා සුලභ වුවෙක් වෙයි. අටපිරිකර පිදීමේ අනුභසින් උන් වහන්සේ ඒහිභික්ඛු පැවිදි උපසම්පදාවෙන් පැවිදි උපසම්පදා ලබන්නේ වෙයි. බුදුහු එහිම වස් එළඹ දෙවන දින වප්ප තෙරුන්ට ඔවදන් දෙමින් විහාරයෙහිම හුන්හ. සෙසු සිවුනම පිඩු පිණිස ගියහ. ශාස්තෘන් වහන්සේ විසින් දැහැමි කථාවෙන් අවවාද කරන ලද වප්ප තෙර පූර්වභාගයෙහි සෝවාන් ඵලයට පැමිණ භාග්‍යවතුන් වහන්සේගෙන් පැවිද්ද ඉල්වීය. භාග්‍යවතුන් වහන්සේ උන් වහන්සේත් ඒහි භික්ඛු පැවිද්දෙන් පැවිදි කරවූහ. මේ ක්‍රමයෙන් දෙවනි දින භද්දිය තෙරුන් ඊළඟ දින මහානාම තෙරුන් ඊළඟ දින අස්සජි තෙරුන් දැයි සියලු දෙන එක් එක් දිනයෙහි සෝවාන් පෙලෙහි පිහිටුවා ඒහි භික්ඛු පබ්බජ්ජාවෙන් පැවිදි කොට, පස්වන දින භික්ෂු පස්නම රැස් කොට අනත්ත ලක්ඛණ සූත්‍රය දේශනා කළ සේක.

"මහණෙනි, රූපය ආනාත්මය. මහණෙනි. රූපය ආත්ම නම් මේ රූපය අබාධ පිණිස නොපවතී. රූපයෙහි මාගේ මේ රූපය මෙසේ වේවා, මාගේ මේ රූපය මෙසේ වේවායි ලබාගත හැකිය. මහණෙනි, රූපය අනාත්ම වන හෙයින් රූපය ආබාධ පිණිස පවතී. රූපයෙහි මාගේ රූපය මෙසේ වේවා මෙසේ නොවේවායි නොලබයි. වේදනා සඤ්ඤා සංඛාර විඤ්ඤාණ අනාත්මයි. වේදනා සඤ්ඤා සංඛාර, විඤ්ඤාණ ආත්ම නම් ඒවා ආබාධ පිණිස නොපවත්නේය. මාගේ වේදනා සඤ්ඤා සංඛාර විඤ්ඤාණ මෙසේ වේවායි මෙසේ නොවේවායි ලබන්නේය. අනාත්ම හෙයින් එසේ නොලබන්නේය, කියායි.

මෙසේ වදාරා නැවත භාග්‍යවතුන් වහන්සේ ධම්ම අනුධම්ම ප්‍රාප්තිය පිණිස ප්‍රශ්න කිරීම් වශයෙන් පස් නමගෙන් ප්‍රශ්න කරමින් මෙසේ වදාළ සේක. "මහණෙනි කුමක් සිතන්නහු ද රූපය, නිත්‍ය

ද, අනිත්‍ය ද, ස්වාමීනි අනිත්‍යයයි. යමක් අනිත්‍ය නම් දුක් ද සැප ද ස්වාමීනි දුකයි. මහණෙනි, යමක් අනිත්‍ය නම් දුක් නම් විපරිණාමය ස්වභාව කොට ඇත්නම් මෙය මාගේය මේ මම වෙමි. මේ මාගේ ආත්මයයි කියා දැකීමට සුදුසු ද? ස්වාමීනි, එසේ දැකීමට සුදුසු නොවන්නේමය. මහණෙනි, කුමක් සිතනන්හු ද? වේදනා සංඥා සංඛාර විඤ්ඤාණ මේ මාගේය යි මේ මාගේ ආත්මයයි කියා සැලකීමට සුදුසු ද? ස්වාමීනි, සුදුසු නොවන්නේ මය. මහණෙනි, එබැවින් මෙහිලා අතීත අනාගත වර්තමාන ආධ්‍යාත්මික බාහිර ඕළාරික සුඛුම හීන ප්‍රණීත. දුර ළඟ රූප වේදනා සංඥා සංඛාර විඤ්ඤාණ මෙය මාගේ නොවෙයි. මෙය මම නොවෙමි. මෙය මාගේ ආත්මය නොවෙයි කියා මේ කරුණු තත්වූ පරිද්දෙන් සම්‍යග් ප්‍රඥාවෙන් දැකිය යුතුය. මහණෙනි, මෙය අසා ආර්‍ය්‍ය ශ්‍රාවක තෙම රූප වේදනා සඤ්ඤා සංඛාර විඤ්ඤාණවල කලකිරෙයි. කලකිරෙමින් නො ඇලෙයි. නොඇලී මිදෙයි. මිදුණු කල මිදුණෙමියි කියා. ඤාණය වෙයි. ජාතිය ක්ෂය විය. බඹසර වැස නිමවිය. කළ යුතු දෙය කරන ලදි. මේ සඳහා අනිකක් නැතැයි දැනගනී. මේ දේශනය දේශනා කරද්දී පඤ්චවර්ගීය භික්ෂූන්ගේ සිත් උපාදාන රහිතව ආස්‍රවයන්ගෙන් මිදුණේය. එකල ලොව රහතන් වහන්සේලා සයනමක් වෙති.

එසමයෙහි බරණැස යස නම් මහසිටු පුතෙක් විය. ඔහුට තුන් පහයක් වෙයි. එකක් හේමන්තයටය. එකක් ගිම්හානයටය, එකක් වස්සානය සඳහා ය. හෙතෙම වැසි පහයෙහි පිරිමින් රහිතව තූර්යයෙන් උවැටැන් ලබමින් සිව් මසක් යටපහයට නොබසී. යස කුලපුත්‍ර පස්කම් ගුණයෙන් යුතුව දෙවියෙකු මෙන් රූ සපුයෙන් යුත් නළඟනන් විසින් උවටැන් කරන ලදුව නිදා පාන්දරම පිබිද මුළු රැයෙහි දඬුවැට පහන් දැල්වෙන එළියෙන් නිදිගත් ඒ තරුණියන්ගේ විප්‍රකාර දැක ආදීනව දැක අසුභසංඥා ද ඇතිවිය. සිත කලකිරුණේය. අහෝ සැබැවින් උවදුරකි. අහෝ සැබැවින් අනතුරකැයි උදම් අනා යහනින් නැගී රන් මිරිවැඩි හැඳ නිවෙස්

දොරටුවට පැමිණියේය. දෙවියෝ දොර විවර කළහ. යසකුල පුතුගේ ගිහිගෙන් නික්ම අනගාරික පැවිද්දට අනතුරු නොකළහ. යසකුලපුත් පහයෙන් බැස දැඩි බැමීමෙන් මිදූ මතැතකු මෙන් පස්කම් ගුණෙහි පහවූ ආශාවෙන් පැවිද්දට නැමුණු බැඳුණු සිතින් නුවර දොරටුවට පැමිණියේය. අමනුෂ්‍යයෝ දොර ඇරියහ. යස නුවරින් නික්ම ඉසිපතන මිගදායට ගියේය.

එකල තුන්කල් දත් භාග්‍යවතුන් වහන්සේ රෑ අලුයම නැගිට මිනිස් ශක්තිය ඉක්ම වූ සුපිරිසිදු දිවැසින් මුළු ලොව බලන්නාහු පැවිද්දට නික්මී ඒ කුලපුතු දැක අසුනින් නැගී ඔහුගේ ඊම බලාපොරොත්තුවෙන් එලිමහනෙහි සක්මන් කරන සේක. දූරින් එන ඔහු දැක උන් වහන්සේ සක්මනින් බැස පැනවූ අස්නෙහි වැඩ සිටියහ. යස කුලපුත් ඉසිපතනයට වැද දුර සිට උදාගිරි මුදුන්හි ළහිරු මෙන් බබළන බුදුන් දැක සතුටු සෙමනසින් ඉක්මන් ගමනින් පැමිණ බුදුන් ඉදිරියෙහි හඬත්නි, ඇත්තෙන්ම උපද්‍රවයෙකි. හඬත්නි, ඇත්තෙන්ම අනතුරකියි උදන් ඇනීය. එවිට බුදුහු යස කුල පුතු අමතා "යස කුලපුත්‍රය, මෙය නම් අනුපද්‍රැතය, අනතුරු රහිතය. යස, එව වාඩිවෙව. දහම් දෙසමියි කීහ. යස කුලපුත් බුදුවදන් අසා මෙය අනුපද්‍රැතය. මෙය අනතුරු රහිතයයි තුටු පහටුව උදම් උදම්ව රන්මිරිවැඩි ගළවා බුදුන් වෙත පැමිණ පසඟ පිහිටුවා වැඳ ඉදිරියෙහි පසෙක වාඩි විය. පසෙක හුන් යස කුලපුතුට භාග්‍යවතුන් වහන්සේ අනුපිළිවෙළ කතාව වදාළහ.

එය මෙසේය. දානකථාව, සීලකථාව, ස්වර්ගකථාව, කාමයන්ගේ ආදීනව පහත් බව කෙලෙසෙන බව, නෛෂ්ක්‍රම්‍යයෙහි ආනිසංස දේශනා කළහ. යම් අවස්ථාවක භාග්‍යවතුන් වහන්සේ යසකුල පුත් යෝග්‍ය සිත් ඇතිබව දැනගත් සේක් ද එවිට යෝග්‍ය සිත් මෘදු සිත් නීවරණ රහිත සිත් ඔදවැඩි සිත් පිහිටි සිත් ඇති බව දැන බුදුවරුන්ගේ සාමුක්කංසික ධර්මදේශනා නම් දුක්ඛ, සමුදය, නිරෝධ, මාර්ග යන සිව්සස් දහම් දෙසූ සේක. යම් සේ කිලුටු රහිත, සුදුවතක් රැඳීම් පිළිගන්නේ ද එමෙන් යස කුලපුතුට හුනස්නෙහිම රජස් රහිත මල

රහිත ධර්මචක්ෂුස පහළ විය. යම් කිසි සමුදය ධර්මයක් ඇද්ද ඒ සියල්ල නිරෝධ ධර්ම වෙයි කියායි. එකල යස කුලපුතුගේ මෑණියෝ පහයට නැග යස නොදැක යස කොහිදැයි පිරිවර ගැහැනුන්ගෙන් විමසූහ. ආර්‍යාවෙනි, නොදනිමුයි කීහ. එවිට මෑණියෝ සමණයන් වෙත ගොස් ගෘහපතියනි, අපගේ පුත්‍ර යස නැතැයි කීහ. හෙතෙම සතර දිගට අසුන් පිටත් කොට තෙමේ ඉසිපතනයට ගොස් යසගේ ගැළවූ රන් මිරිවැඩි දැක ඔහු වෙත නොයා දීම කාරුණික භාග්‍යවතුන් වහන්සේ දුරින් එන ඔහු දැක, සිටු ගෘහපතිට එහි හුන් යස කුලපුතු නොපෙනෙන පරිද්දෙන් සංර්ධියක් කළ හොත් මැනවැයි සිතූ සේක. සිතා එවන් සෘර්ධියක් කළහ.

සිටුතෙම දුරදීම බුදුසිරින් බබළන බුදුන් දැක පුදුමව උන් වහන්සේ වෙත ගොස් වැඳ ස්වාමීනි, යස කුලපුතු දුටු සේක් දැයි ඇසීය. ගෘහපතිය, මෙහි වාඩි වෙන්න. මෙහි හිඳ මෙහිම සිටින යස කුල පුතු දකින්නැයි වදාළහ. එවිට ගෘහපති මෙහිම හිඳ මෙහිම හිඳින යස දකිමියි සිතා තුටු පහටුව පසෙක හිඳ ගත්තේය. පසෙක හුන් සිටුවරයාට උන්වහන්සේ පිළිවෙළ කථාව වදළහ. කථාව අවසානයෙහි ගෘහපති තෙම එම අසුන්හිම තුන් කෙලෙස් අනුසය පළා දහසක් නයින් යුත් සෝවාන් පෙලෙහි පිහිටියේය. දුටු දහම් ඇති, පත් දහම් ඇති, දත් දහම් ඇති බැසගත් දහම් ඇති විචිකිච්ඡා තරණය කළ කෙසේ ද? කෙසේද? යන සැක නැසූ පහවූ මුළා ඇති අන් පිහිටක් නොතැකූ බුදුසසුනෙහි අචල ප්‍රසාදයට පත් හෙතෙම භාග්‍යවතුන් වහන්සේට ස්වාමීනි, ඉතා මැනවි. ස්වාමීනි, ඉතා මැනවි. ස්වාමීනි, යටිකුරු කළ දෙයක් උඩුකුරු කළාක් මෙන් සැඟ වූ දෙයක් විවර කළාක් මෙන් මංමුළා වූවකුට මඟ කියන්නාක් මෙන් ඇස් ඇත්තෝ රූප බලත්වායි අඳුරෙහි තෙල් පහනක් දල්වන්නාක් මෙන් භාග්‍යවතුන් වහන්සේ නන් අයුරින් ධර්මදේශනා කළ සේක. ඒ මම ධර්මයත් භික්ෂුසංඝයාත් සහිත භාග්‍යවතුන් වහන්සේ සරණ යමි. භාග්‍යවතුන් වහන්සේ අද පටන් දිවි හිමි කොට සරණගත උපාසකයෙකු මෙන් මා දරන සේක්වායි" කීය. ඔහු ලොව ප්‍රථම උපාසක විය.

පියාට භාග්‍යවතුන් වහන්සේ දහම් දෙසද්දී දුටු පරිදි දත් පරිදි භූමිය ප්‍රත්‍යවේක්ෂා කරන යස කුල පුතුගේ සිත උපාදා රහිතව ආස්‍රවයන්ගෙන් මිදුණේය. එවිට භාග්‍යවතුන් වහන්සේට මෙසේ අදහස් විය. පියාට දහම් දෙසීමෙන් දත් භූමිය ප්‍රත්‍යවේක්ෂා කළ යසගේ සිත ආස්‍රවයන්ගෙන් මිදුණේය. පෙර ගිහි කල මෙන් නැවත හීන බවට කැරකී කාම පරිභොගයට නොසුදුසු වෙතියි කියායි. එහෙයින් භාග්‍යවතුන් වහන්සේ සෘද්ධිය වැළැක්වූ සේක. එවිට ගෘහපති තෙම වාඩි වී හුන් යස දැක විස්මය පත්ව පුත්‍රස්නේහයෙන් කම්පා වූ සිතින් මෑණියන්ගේ හද සෝදුක් දන්වමින් මෙසේ කීය. දරුව යස, ඔබගේ මව සෝක විලාප දුකට පැමිණියාය. ඔබ නැතිව ඇගේ මරණය සිදුවේ. දරුව, ආපසු යන්න. මවගේ ජීවිතය දෙන්නැයි කියායි. යස කුලපුත් බුදුන් දෙස බැලීය. එවිට භාග්‍යවතුන් වහන්සේ සිටාණන්ට "ගෘහපතිය, කුමක් සිතන්නෙහි ද? අසේඛ ඤාණයෙන් අසේඛ ඤාණදර්ශනයෙන් දහම් දුටු, ඔබ අවබෝධ කළ භූමිය ප්‍රත්‍යවේක්ෂා කළ යස කුලපුතුගේ සිත ආස්‍රවයන්ගෙන් මිදුණේය. පෙර ගිහිගෙයි වසද්දී මෙන් ගිහිව කම් සැප විඳීමට ඔහු සමත් වෙයි ද කියා කීහ. ස්වාමීනි, මෙය නොවන්නේමය.

"ගෘහපතිය, අසේඛ ඤාණයෙන් අසෙඛ ඤාණදර්ශනයෙන් දහම් දුටු යසකුල පුත්‍රයාගේ සිත ආස්‍රවයන්ගෙන් මිදුණ බැවින් පෙර ගිහියෙකු මෙන් ගිහිබවට පත්ව කම්සැප විඳීමට සුදුසු නොවේ. ස්වාමීනි, යස කුලපුතුගේ සිත ආස්‍රවයන්ගෙන් මිදුණේය. ස්වාමීනි, යස කුලපුතු සමඟ අද දන් පිළිගන්නා සේක්වයි ආරාධනා කළේය. නිහඬව භාග්‍යවතුන් වහන්සේ ආරාධනය පිළිගත් සේක. සිටු ගෘහපති භාග්‍යවතුන් වහන්සේගේ ආරාධනය පිළිගැනීම දැන නැගී වැඳ පැදකුණු කොට ගියේය. සිටුපුත් ගොස් නො බෝ වේලාවකින් යස භාග්‍යවතුන් වහන්සේට ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ වෙත මහණ උපසම්පදා ලබමියි සැලකළේය. එවිට උන් වහන්සේ භික්ෂුව එන්න. ධර්මය ස්වාක්ඛාතය. මැනවින් දුක් කෙළවර කිරීමට බඹසර හැසිරෙවයි වදාළහ. එයම ඒ ආයුෂ්මතුන්ගේ මහණ උපසම්පදාව විය. එකල ලොව සත් රහත් නමක් වෙති.

භාග්‍යවතුන් වහන්සේ පෙරවරු හැඳ පෙරව පාසිවුරු ගෙන යස පසු ශ්‍රමණ කොට සිටුගෙට වැඩ පැනවූ අසුන්හි හුන්හ. යස තෙරුන්ගේ මව ද පැරණි දෙවැන්නියෝ ද භාග්‍යවතුන් වහන්සේ වෙත පැමිණ පසෙක හුන්හ. උන්වහන්සේ පිළිවෙළ කථාව වදාළහ. දේශනා කෙළවර ඔවුහු සෝවාන් වූහ. දහම් දත් ඔවුහු ස්වාමීනි, ඉතා මැනවි, නොයෙක් ආකාරයෙන් ධම් දේශනා කළ සේක. අද පටන් දිවි හිමිකොට තෙසරණ ගත උපාසිකාවන් ලෙස දරන සේක්වායි සැලකළහ. ඔවුහු ලොවෙහි ප්‍රථම උපාසිකාවෝ වූහ. යස තෙරුන්ගේ මවුපියෝ ද පැරණි දෙවැන්නියෝ ද බුදුරජාණන් වහන්සේ යස තෙරුන් සමඟ ප්‍රණීත අහර පැනින් සියතින් සතප් වා වැළඳූ පසු වැඳ පසෙක හුන්හ. උන්වහන්සේ ඔවුන්ට දහම් දෙසා සතුටු කොට වැඩි සේක.

එකල යස තෙරුන්ගේ බරණැස විමල සුබාහු පුණ්ණජි ගවම්පති යයි ගිහි යහළුවෝ සිවුදෙනෙක් යස පැවිදි වූ බව අසා මෙසේ සිතූහ. යස කුලපුත් මහණ වූයේ නම් ඇත්තෙන්ම ඉන් එහා ධම් විනයක් හෝ පැවිද්දක් නැත. එබැවින් යස කුලපුතු වෙත ගියහ. වැඳ එකත් පස්ව සිටියහ. උන් වහන්සේ සිව් යහළුවන් ගෙන බුදුන් කරා ගොස් ස්වාමීනි, මේ මාගේ ගිහි යහළුවෝ සතර දෙනාය. භාග්‍යවතුන් වහන්සේ ඔවුන්ට අවවාද අනුශාසනා කරන සේක්වායි කීහ. උන් වහන්සේ ඔවුන්ට පිළිවෙළ කථාව දේශනා කළහ. මෘදු සිත් ඇතිවූ බැව් දැන සාමුක්කංසික දේශනාව පැවැත්වූහ. දේශනාව අවසානයෙහි ඒ අසුන්වලම දහම්ඇස පහළ විය. ශාස්තෘ ශාසනයෙහි අචල ශ්‍රද්ධාව ඇති කොට ගත් ඔවුහු බුදුන් වෙත මහණ උපසම්පදා ලබන්නෙමුයි ආරාධනා කළහ. උන්වහන්සේ චක්‍ර ලක්ෂණ යුත් දකුණත දිගු කොට මහණෙනි, එව්. ධම්ය ස්වාක්ඛාතය. මනාව දුක් කෙළවර කිරීමට බඹසර හැසිරෙව් කියා වදාළහ. වචනයට අනතුරුවම සෘද්ධිමය පාසිවුරු දරා සියවස්ගත තෙරවරුන් මෙන් පිරිසිදු ඉරියව් ඇත්තෝ වූහ. එයම උන්වහන්සේලාට උපසම්පදාව විය.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ඒ භික්ෂූන්ට දැහැමි කථාවෙන් අවවාද අනුශාසනා කළ සේක. අනුශාසනාකරද්දි උන් වහන්සේලාගේ සිත් උපාදා රහිතව ආස්‍රවයන්ගෙන් මිදුණේය. ඒ වන විට ලොව රහත්හු එකොළසක් වෙති. තවත් යස තෙරුන් වහන්සේගේ පනසක් පමණ ජාතපදික පෙරටු පෙරටු කුලවල ගිහි යහළුවෝ යස කුල පුත් පැවිදි වූයේ යයි අසා උන්වහන්සේ වෙත ගියහ. යස තෙරුන් වහන්සේ ඔවුන් කැඳවා ගෙන බුදුන් කරා ගොස් වැඳ ස්වාමීනි, මේ මාගේ පනහක් පමණ වූ ගිහි යහළුවෝය. ඔවුන්ට අවවාද අනුශාසනා කළ මැනවැයි ඉල්ලූහ. වැඳ හුන් ඔවුන්ට පිළිවෙළ කතාව දේශනා කළහ. ධර්ම කථාව අවසානයෙහි හුනස්- නෙහිම ඔවුන්ට රජස් රහිත මල රහිත ධර්මචක්ෂුස පහළ විය. පැවිද්ද ඉල්වා සිටි ඔවුන් ඒහි භික්ඛු පැවිද්දෙන් පැවිදි කරවා රහත් බැව්හි පිහිටවූහ. එ සමයෙහි ඇතුළු වස එක් සැටනමක් රහත්හු වෙති.

ඉක්බිති තථාගතයන් වහන්සේ ඒ භික්ෂූන්ට "මහණෙනි, මම දිව්‍යමය වූත් මානුසික වූත්, පාසයන් ගෙන් මිදුණෙමි. ඔබලා ද දිව්‍ය මානුසික සියලු කෙලෙස් පාසයන්ගෙන් මිදුණහුයයි වදාළහ. උන් වහන්සේ වස් පවරා රැස්වූ භික්ෂූන්ට "මහණෙනි, බොහෝ දෙනාට හිත පිණිස බොහෝ දෙනාට සැප පිණිස ලොවට අනුකම්පා පිණිස දෙව් මිනිසුන්ට හිත සැප පිණිස චාරිකාවෙහි හැසිරේව්. දෙදෙනෙක් එක මඟ නොයව්. මුල කලණ මැද කලණ අග කලණ -පෙ- බඹසර ප්‍රකාශ කරව්. මහණෙනි, අල්ප වූ කෙලෙස් රජස් ඇති මනුෂ්‍යයෝ සිටිති. ධර්මය නො ඇසීමෙන් පිරිහෙති. ධර්මාවබෝධ කරන්නාහු සිටිති. මහණෙනි, මම දම් දෙසීම පිණිස උරුවේලාවෙහි සේනානිගමයට යන්නෙමි"යි වදාරා ඒ භික්ෂූන් පිටත් කොට තිසරණයෙන් උපසම්පදාව අනුදැන පිටත් කළහ. බුදුහු බරණැස කැමැති තාක් වැස තමන් වහන්සේම පාසිවුරු ගෙන උරුවේලාවට යනු කැමැතිව චාරිකාවෙහි වැඩියහ. අතර මඟ තිසක් පමණ භද්දිය රජ කුමරුන්ගේ හේතු සම්පත් දැක ඔවුන්ට අනුකම්පාවෙන් මගින් ඉවත්ව කපුවනයෙහි එක්තරා රුක් මුලක වැඩ හුන්හ. එකල මහ

කොසොල් රජුගේ තිහක් පමණ රජකුමරවරු පසේනදී කොසොල් රජුගේ සුළුමෑණිවරුන්ගේ පුත්වරුන් හා රූපයෙන් මිත්‍රත්වයෙන් යහපත් වූවාහු සමාන වූවාහු බෙහෙවින් එක්වම හැසිරෙති. සිටිති. හිඳිති. කති. බොති. එහෙයින් තිසක් හද්‍රවර්ගීයෝයි ප්‍රකට වූවාහු වෙති.

ඔවුහු එක් ජන දිනයක බොහෝ කෑම් බීම් මල් ගද විලවුන් වස්ත්‍රාභරණ හා පිරිවර ජනයා ද ගෙන උයනෙහි බිරින්දන් සමඟ ක්‍රීඩා කරති. ඉන් බිරිඳ නැති එකෙකු සඳහා එක් වේසියක ධනයෙන් පොළඹවා ඔහුට දුන්හ. ඔහු ද ඇය සමඟ උයන් කෙළියෙහි යෙදුණේය. වේසිය ඔහුගේ පමා බව දැක අබරණ බඩු ගෙන පලාගියාය. රජ කුමරවරු ඔහුගේ චතාවත් කරන ස්ත්‍රිය සොයන්නාහු, කප්පාසිය වන ළැහැබෙහි ඔබ මොබ සොයන්නාහු ගස් මුලක වැඩහුන් අභිරූපවත් දැකුම්කළු ප්‍රසාද දනවන පරම වර්ණ සෞන්දර්යයෙන් යුත් පුන්සඳ සේ සශ්‍රීක මුව ඇති හිර බඳු තෙද ඇති මහසල්ගසක් යට සිටි ඇතෙකු වන් මුළු වන ළැහැබ බබුළුවන ඒ භාග්‍යවතුන් වහන්සේ දුටහ්. දැක ඔවුහු පුදුමයට පත්ව දුරසිට වඳිමින් නැමූ හිසින් උන් වහන්සේගේ රංසි ජාලයෙහි ගැලෙමින් වෙත පැමිණ වැඳ පසෙක සිට ස්වාමීනි, එක් සත්‍රියක දුටු සේක්දැයි ඇසූහ.

කුමාරවරුනි,, ඔබලාට ස්ත්‍රියක කුමට ද? ස්වාමීනි, අපි මෙහි යහළු ස්ත්‍රීන් සමඟ වන ළැහැබෙහි හැසිරෙමිහ. මොහුට බිරිඳක් නැත. ඒ සඳහා වේසියක ගෙන ආවෙමු. විනෝදයෙන් පසු වෙද්දී ආභරණ බඩු ද රැගෙන පලාගියාය. අපි යහළුවාට චතාවත් කරමින් ඒ ස්ත්‍රිය සොයමින් මේ වන ළැහැබෙහි හැසිරෙමු කියා සැලකළහ. කුමාරයෙනි, කුමක් සිතන්නහු ද? ඔබලා කුමට ස්ත්‍රියක සොයන්නහු ද? ඔබලා තමුන්ම සොයව් ද?. එසේය ස්වාමීනි, තමන් සෙවීම අපගේ පර්යේෂණය විය යුතුය. එසේ නම් කුමාරවරුනි, හිඳ ගනිව්. දහම් දෙසන්නෙමියි වදාළහ. එසේය ස්වාමීනියි පිළිතුරු දී වැඳ පසෙක වාඩි වූහ. ඔවුන්ට භාග්‍යවතුන් වහන්සේ අනුපූර්ව ධර්ම කථාව දේශනා කළහ. අවසන සමහරු සෝවාන් ඵලයට පැමිණියහ.

සමහරු සකදාගාමී ඵලයට ද සමහරු අනාගාමී ඵලයට ද පැමිණියහ. ඔවුන් අතර කිසි පුහුදුන් කෙනෙක් හෝ රහත් කෙනෙක් නොවූහ. දහම් දුටු දහම් දත් රාජ කුමාරවරු අපි භාග්‍යවතුන් වහන්සේ වෙත මහණ උපසම්පදා ලබන්නෙමුයි සැලකළහ. උන්වහන්සේ සුන්දර සිවුරු ගැබින් එරාවණ ඇත්සොඬ බඳු දකුණත දිගු කොට මහණෙනි, එව්. ධර්මය ස්වාක්ඛාතය. මැනවින් දුක් නැසීමට බඹසර හැසිරෙව් කියා ඇමතූහ. එකෙණෙහි පා සිවුරු ආදී අටපිරිකර ධරව සියවස් ගත තෙරවරුන් මෙන් ඉරියව් සම්පන්න වූහ. ඉක්බිති මහණෙනි, බොහෝ දෙනාට හිත පිණිස චාරිකාවෙහි හැසිරෙව් කියා වදාළහ. ඒ සියල්ලෝ බුදුන් හමුයෙහි තෙලෙස් දූහඟ සමාදන්ව වැඳ පැදකුණු කොට නික්ම ගියහ.

භාග්‍යවතුන් වහන්සේ භද්‍ර වර්ගීයයන් පශ්චිම දිසාවට පිටත්කොට උරුවේල කස්සප ජටිලයාගේ අසපුවට පැමිණියේක. එදින ඉර බැස තිබුණේය. භාග්‍යවතුන් වහන්සේ උරුවේල කාශ්‍යපයන් වෙත ගොස් නොවේලෙහි පැමිණි අප වැනි පැවිද්දන්ට වසන තැන් කියවයි වදාළහ. එවිට උරුවේල කස්සප "පන්සියයක් ජටිලයන්ට එකිනෙකාට එක පන්සල බැගින්ම වේ. දෙවෙනි කිසිවකුට කිව නොහැකිය. දැන් කුමක් කළ හැකිදැයි කිවුය. භාග්‍යවතුන් වහන්සේ ඔහුට මෙසේ වදාළහ. කස්සප, මේ පන්සල හිස් නේ ද? මහාශ්‍රමණය, මේ අපගේ ගිනිහලයි. දෙවියන් පුදන තැනයි. ඊටත් වඩා මෙහි සොර විසැති නාගයෙක් සිටී. මෙය බලන්නටත් බැරිය. ඔහු ඔබට හිංසාවක් නොකෙරේවා යි කීය. කස්සප, ඔහුට අපකාරවත් ප්‍රතික්‍රියා මට භාරය, ඔබ අනුදැනීම් පමණක් කරන්න. ඔබට බරක් නොවේ නම් වාසය කරමියි කීහ. මම නොවළ කම්. ඔබට අනුමතත් නොකරමියි කියා බයත් ත්‍රාසයත් අඟවමින් සිය පන්සලටම ගියේය. භාග්‍යවතුන් වහන්සේ ද ගිනිහල් ගෙට වැද නා රජුගේ සයනය මත තණ අතුරා පර්යංකයෙන් හුන්හ. එවිට නා රජ තමාගේ සයනය මත හුන් බුදුන් දැක කිපී, මේ මුඩු මහණ තෙම මට නිගාකොට තමාගේ මෙන් මාගේ ශ්‍රීසයනයෙහි

හුන්නේය. මම ඔහුට ප්‍රතිකාර දනිමියි ගිනි තැබූ තෙත පිදුරු මෙන් දුම් දමමින් මුළු පන්සල දුමින් පිරවීය.

භාග්‍යවතුන් වහන්සේ එවිට "මේ නාරජ තමාගේ බලය බලයයි සිතයි. දසබලයන් වහන්සේ නොහඳුනයි. දැන් ඔහු තෙදින් තෙද වැළඳ ගන්වමි"යි තෙජොකසිණයට සමවැද වඩා බලවත් දුමක් මැවූහ. නාරජ දුන් රොටුවෙන් වටව පැසෙන තෙලක් මෙන් පැසෙමින් දුකින් පිරීගෙනම මකු බව ඉවසිය නොහී දිලිසුණේය. භාග්‍යවතුන් වහන්සේ ද යුගාන්ත සූයස්‍යියාමෙන් පන්සලත් සමඟම ඇවිල ගත්හ. දඩු වැට පහන් පෙළක් මෙන් විය. භාග්‍යවතුන් වහන්සේගේ අදිටන් බෙලෙන් තණ කටුවලට හෝ මැසි මදුරු මී සතුන්ට හෝ සන්තාප මාත්‍රයකුත් නොවීය. නාරජුගේ ශරීරය උදුනක දැමූ ලෝ පිඬක් මෙන් හාත්පසින් රතු විය. එවිට නා රජු සිතීය. අහෝ මම බලවත් දසබල අනුභස නොදනිමි. තියුණු මුවහත් කඩුවකින් කෙසෙල් බඩක් කපන්නා සේ කියත්දකින් පුප්ඵාවලික ක්‍රීඩාව කරන්නාසේ. තමාගේ බාල බව දැක්වීමි. දැන් මට වෙනත් පිළිසරණක් නැත. බුදුන් සරණයාම මට ශ්‍රේෂ්ඨය යි සිතා පහත දැමූ මානධජ ඇතිව සිය මානය ප්‍රතික්ෂේප කොට භාග්‍යවතුන් වහන්සේගේ පා මුල වැටී ස්වාමීනි, ඔබගේ තෙජෝබල නොදන්නා මා විසින් මහා අපරාධයක් කරන ලදි. මාගේ ඒ වරද සමාකරනු මැනවයි අයැදියේය.

එවිට සකල සත්ත්වහිත තථාගතයාණෝ නාග රාජය, ඔබට සමා කරමි. පුහුදුන් බව නිසා ඔබ විසින් එය කරන ලදැයි කීහ. පහන් නා රජ "මම අද පටන් ජීවිත පරිත්‍යාගයෙන් හෝ රත්නත්‍රය අත නොහරිමි කියා තෙසරණ ගියේය. භාග්‍යවතුන් වහන්සේ ලෙලෙන කුණ්ඩලයක් මෙන් දරණගත්වා මුළු රැය සමවත් සුවයෙන් ගත කළහ. උරුවෙල් කසුප් තවුස් තෙම බුදුන් පන්සලට පිවිසි තැන් පටන් නාරජ මහාශ්‍රමණයන්ට කුමක් කරයි දැයි සිත සිතා නිදි නොලැබීය. පන්සල දැල්වුණු කල්හි උද්වේග සිතින් මෙසේ සිතීය. "අපොයි ඇත්තෙන්ම මහාශ්‍රමණයෝ අභිරූප වත්හ. නාගයා

විසින් අලු කරන්නට ඇතැයි තමාගේ පන්සලින් නික්ම ගිනිහල්ගෙය වටා සිට හිරු උදාවන තුරු සිත සිතා සිටියේය. දසබලයන් වහන්සේ ඉර උදා වූ පසු නාරද සෙල්මුවා පාත්‍රයෙහි බහා බබළමින් පන්සලින් නික්මී සේක. රන්ගිරි ගුහාවකින් නික්මෙන කේසර සිංහයෙකු සේ නික්මෙන බුදුන් දැක ජටිලයෝ පරම විස්මය පත්ව, බුදුන් පිරිවරා ගත්හ.

එවේලෙහි සමාධි සුවයෙන් සැනසූ සිරුරු ඇති භාග්‍යවතුන් වහන්සේ දෙතිස් මහපුරිස් ලකුණින්, අසූ අනුව්‍යඤ්ජනයෙන්, බ්‍යාමප්‍රභාවෙන්, සවනක් රසින් සරාහිරු සේ බැබළි සේක. උරුවෙල් කසුප් ජටිල තෙම හිරු රැස් කළඹක් සේ බබළන බුදුන් දැක පහන් සිතින් "භවත්නි ආශ්චය්‍යයි, භවත්නි අද්භූතයි. මහාශ්‍රමණයන්ගේ මහාඍද්ධිමත් බව මහානුභාවතාව පුදුමයි. එතුමන් විසින් උග්‍ර තේජස් ඇති සෝර විෂ ඇති ඒ නාගයා දියබරියකු මෙන් නිර්මද කරන ලදි. දැන් මම මෙතුමන් සරණ යමියි සිතීය. එවිට භාග්‍යවතුන් වහන්සේ ඔහුට "කාශ්‍යපය, නාරජ ඉතා චණ්ඩය. ඉව්සිය නොහැකි යයි ඔබ වර්ණනා කළෙහිය. මා විසින් ඔහු පණුවකු මෙන් නිර්විෂ බවට පත් කරන ලදැයි කීහ. එවිට නාරජ පෙණ හකුළුවා භාග්‍යවතුන් වහන්සේගේ පා මුල හිස තබා දිවෙන් සිරිපා ලෙවමින් සිටියේය. ඒ දැක පන්සියයක් ජටිලයෝ පැහැදුණහ. මහණ වීමට සිතුහ.

ඔවුන් පහන්බව දැන උරුවෙල කස්සප මෙසේ සිතීය. මා බුදුන් සරණ ගියහොත් මේ සියලු ජටිලයෝ මහණ වෙති. එයින් මාගේ යසස් පිරිහේ. දැන් මොවුන් රවටමියි නොපහන් අයෙකු මෙන් මෙසේ කීය. මහාශ්‍රමණයෝ මහත් ඍද්ධි මහානුභාව ඇත්තාහ. මා වැනි රහතෙක් නොවෙතැයි කියායි. එදවස පිණ්ඩපාත දී බුදුන්ට මෙසේ ආරාධනා කළේය. මහාශ්‍රමණය, මෙහිම වසනු මැනව. මම ඔබට සඳා දන් දෙමි. භාග්‍යවතුන් වහන්සේ නිහඬව ඔහුගේ ඇරයුම පිළිගෙන ඒ ආශ්‍රමයට නොදුරු වන ළැහැබෙක වැසූහ. එකල්හි සිවුවරම් රජවරු රැය ඉක්ම ගිය පසු සොඳුරු වර්ණයෙන් මුළු මහත් වන ළැහැබ බබුළුවා බුදුන් කරා පැමිණ වැඳ මහ ගිනිකඳන් මෙන්

දිලෙමින් සිටගත්හ. උරුවේල කස්සප ජටිලයා ඒ දැක පෙර නොදුටු බැවින් ආශ්චර්‍ය්‍ය අද්භූතව රැය පහන් වූ කල භාග්‍යවතුන් වහන්සේට දන් පිළිවෙළ කොට බුදුන් කරා ගොස් මහාශ්‍රමණය, කාලයයි, දන් නිම වීයයි භාග්‍යවතුන් වහන්සේට කල් දැන් වී ය. මහාශ්‍රමණය, රැයෙහි සුන්දර වර්‍ණයෙන් මුළු වන ළැහැබ බබුළුවා ඔබ වහන්සේ වෙත පැමිණ ඔබ වහන්සේට වැඳ සිව් දිගින් මහගිනිකඳන් මෙන් සිටියාහු කවරහුදැයි විමසීය.

කාශ්‍යපය, ඒ වනාහි වරම් රජවරු බණ ඇසීමට මා වෙත පැමිණියාහුයි වදාළහ. එවිට උරුවේල කස්සපට භවත්නි, මහාශ්‍රමණ මහර්ධිමත් ය. මහානුභාව ඇත්තාහ. වරම් රජහු ද බණ ඇසීමට පැමිණෙති. මා මෙත් රහතෙක් නොවෙතියි අදහස් විය. භාග්‍යවතුන් වහන්සේ දන් වළඳා ඒ වන ළැහැබෙහිම වාසය කළහ. සක් දෙවිඳු ද එසේම රාත්‍රියෙහි භාග්‍යවතුන් වහන්සේගේ බණ ඇසීමට පැමිණ සොඳුරු පැහැති වස්ත්‍රාභරණාලෝකයෙන් මුළු වන ළැහැබ බබුළුවා බුදුන් වෙත පැමිණ මහගිනිකඳක් මෙන් පසෙක සිටියේය. කස්සප ජටිල ඔහු දැක රැය ගෙවීමෙන් පසු බුදුන් වෙත පැමිණ දන් වේලාව සැලකොට මහාශ්‍රමණයෙනි, සුන්දර වර්‍ණයෙන් වන ළැහැබ බබුළුවමින් ඔබ වෙත පැමිණ පෙර වර්‍ණ කාන්තියට වඩා කාන්ති තරව ප්‍රණීතතරව මහ ගිනිකඳක් මෙන් එකත් පසෙක සිටියේ කවුරු දැයි ඇසීය. කාශ්‍යප, ඒ බණ ඇසීමට මා වෙත පැමිණි සක් දෙවිඳු යයි වදාළහ.

ඔහුට මෙසේ සිතිණ. මහා ශ්‍රමණයෝ මහාර්ද්ධික මහානුභාව වෙති. බණ ඇසීමට සක්දෙවිඳු ද එයි. මා මෙන් රහතෙක් නම් නොවෙයි කියායි. නැවත ද රැ කල සහම්පති මහාබ්‍රහ්ම බණ ඇසීමට බුදුන් වෙත පැමිණ තමන්ගේ මනහර වර්‍ණ ප්‍රභාවෙන් වන ළැහැබ බබුළුවා මහගිනිකඳක් මෙන් සිටියේය. එය දුටු කස්සප ජටිල පරම විස්මයට පත්ව භාග්‍යවතුන් වහන්සේ කරා ගොස් දන් වේලාව සැලකොට පෙර පරිදිම ඇසීය. භාග්‍යවතුන් වහන්සේ ද කාශ්‍යපය, බණ ඇසීමට මා වෙත පැමිණි සහම්පති බ්‍රහ්මයායි වදාළහ. ඔහුට

මෙසේ සිත්විය. මහාශ්‍රමණයෝ මහර්ද්ධිමත් මහානුභාව ද වෙති. බණ ඇසීමට මහබඹු ද පැමිණෙයි. මා මෙන් රහතෙක් නම් නොවෙයි කියාය.

එසමයෙහි සටීකාර බ්‍රහ්මයා විසින් පුදන ලද අඳනය හා සිවුර ප්‍රධන් වියෂියෙහි නියුතු සය වස්හි පරිභොගයෙන් දිරා ගියේ වෙයි. භාග්‍යවතුන් වහන්සේ මෙසේ සිතූහ. පරමාභිසම්බෝධියට පත් සියලු බුදුවරයන්ට පාංසුකුල ගැනීම ආචිණ්ණය. මම ද පාංසු කුල චීවරයක් සොයන්නෙමියි සිතූහ. විතර්කයට අනතුරුව සතර නහුතයක් අධික දෙලක්ෂයක් යොදුන් ඝන මහ පොළොව කම්පා විය. එකල ගයාගම බොහෝ හිරි ඔතප් ඇති රාධ නම් බමුණාගේ පුණ්ණා නම් දාසියක් වූවාය. ඇය ද සොහොනට නුදුරෙහි කුඹුරක් රක්නීය. ගමින් කෙතට යද්දීත් කෙතින් ආපසු එද්දීත් සොහොනෙහි නිර්වස්ත්‍ර කුණපයක් දැක පිළිකුල් කරමින් මෙසේ සිතූවාය. අනාථ වූ මා ද මෙසේ හැර දමනු ඇත. මාගම් ශරීරය ද අතිශය පිළිකුල්ය. දිගු පුළුල් ඝන වස්ත්‍රයක් වියවන්නේ නම් මැනවි. මා මළ පසු ශරීර වස්ත්‍රයක් වෙයි කියා සොහොනෙහි නූල් කැට එහි චේතනය ස්වාමියාගෙන් ඉල්වා දිගින් දෙතිස් රියන් පුළුලින් සය රියන් ඝන වාටි ඇති වස්ත්‍රයක් වියවා ස්වාමීනි, මා මළ පසු නොදවනු මැනවි. මේ වස්ත්‍රයෙන් ඔතා සොහොනට දමන්නැයි ස්වාමියාගේ අතට දුන්නාය. රාධ බ්‍රාහ්මණ තෙම සිය දාසිය කෙරෙහි ගෞරවයෙන් ජීවත්වන තුරු සියලු ප්‍රත්‍යයෙන් උවැටැන් කොට මළ පසු මහසත්-කාර කොට කී පරිදි ඒ වස්ත්‍රයෙන් වෙළා අමුසොහොනෙහි දැම්මවීය.

ඒ දැස්සගේ සිරුර තුන්වෙනි දවස ඉදිමී සැරව ගලන වනතුඔසක් මෙන් විය. නව වණ මුඛයෙන් සැරව ගලයි. මුළු සිරුර සිදුරු සිදුරුව මී වදයක් මෙන් විය. කිලිටි සිරුරෙහි අට නැලියක් පමණ පණුවෝ හටගත්හ. වස්ත්‍රය ශරීරයෙහි ඕජාවෙන් පිරුණු පැසක් බඳු විය. එකල භාග්‍යවතුන් වහන්සේ පාංශුකූලය ගැනීමට සොහොනට වැඩියහ. එවිට ද පොළොව කම්පා විය. භාග්‍යවතුන් වහන්සේ කුණපයෙහි පාපස සිට පාංශුකූලයෙහි කොණ අල්ලා

එසවූහ. සියලු කෘමීහු ශරීරයෙහිම වැටුණහ. එසේම පහත් නොකොට මොහොලක් මෙන් ගෙන තමන් වසන තැනට අවුත් මෙසේ සිතූහ. මේ ගඟෙහි දිය මඩ සහිතය. මේ පාංශුකූලය කොතනක සොදන්නෙමි ද කියායි. එවිට සක් දෙවිරජ මහාකුබුක්ගස් සෙවණක ගල්තලාවක රළ ගැවසෙන පහන්දිය පිරි පොකුණක් මවා භාග්‍යවතුන් වහන්සේට ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ මෙහි පාංශුකූලය ධොවනය කරන සේක්වායි කීය.නැවත භාග්‍යවතුන් වහන්සේ මේ බිම ධූලි පිරී ඇත. මෙහි පාංශුකූලය ඇතිල්ලිය නොහැකිය. පාංශුකූලය කොහි අපුල්ලන්නෙම්දැයි කියායි. එවිට ශක්‍රයා පාංශුකූලය මැඩීමට සිව් කොන් මනහර මකර මුඛයෙන් සැරසූ කළඟල් දෙවුම් දෙණක් මැවීය. භාග්‍යවතුන් වහන්සේ එය දෙණෙහි බහා සක් ලකුණෙන් සුසැදි සුරත් මොළොක් අත්ලෙන් අනුපූර්ව දික් ඇඟිලිවලින් යුත් අත්වලින් පිරිමැදිසේක. එහිදී ද පොළොව කම්පා විය.

භාග්‍යවතුන් වහන්සේ පාංසුකූලය මඩිද්දීම කුණුගඳ සංසිදිණ. එතෙක් පොකුණින් දියදහරා මතු වී තෙමේම දොණියෙහි වැටිණ. සිවුර මඩින භාග්‍යවතුන් වහන්සේගේ ශරීර බලය සාවුරුදු දුෂ්කරක්‍රියාවෙන් පිරිහි සිනිඳුබොජුන් වැළඳීමෙන් පසුත් ප්‍රමාණවත් තරම් නොපිරුණ හෙයින් පිට රිදෙන්නට විය. එවිට භාග්‍යවතුන් වහන්සේගේ අදහස දත් කුබුක් ගසෙහි අධිපති දේවතාවා භාග්‍යවතුන් වහන්සේ මේ අත්ත අල්වාගෙන ගොඩ එන සේක්වායි අත්තක් නමාලීය. උන්වහන්සේ එය අල්වා ගෙන ගොඩ නැඟී මෙසේ සිතූහ. "සියුම් දූවිල්ලෙන් පාංශුකූලය කිලිටි වෙයි. එය කොහි දිග හරින්නෙම් ද කියා"යි. එය දත් සක්දෙවිරජ මොහොතකින් හිමවතින් කළඟලක් ගෙනැවිත් ස්වාමීනි, පාංශුකූලය මෙහි වනන සේක්වායි ඉදිරියෙහි තැබීය. උන්වහන්සේ පාංශුකූලය එහි වැනූහ. එවිට සක් දෙවිරජ නොයෙක් රුක් කසට ගෙන දෙණෙහි පිරවීය. භාග්‍යවතුන් වහන්සේ පාංශුකූලයෙහි වාටි කැපූහ. එවිට ද පොළොව කම්පා විය. උන් වහන්සේ එය පාට ගත්වා සවස් යාමයෙහි සන්ධ්‍යා වලා සමාන සොඳුරු පවුල්සිවුරින් රන් වන් බුදුබඳ වසා පෙරවූහ. පෙරවූ එම පවුල්සිවුර පාංශුකූල සංඝාටිය විය. පැරණි සංඝාටිය උත්තරා සංගය

විය. පැරණි උත්තරා සංගය අඳනය විය. පැරණි අඳනය නැතිව ගියේය. එසේම මිහිකත සම්මර්ශනයෙහි, ගමනෙහි, ප්‍රවේශයෙහි, ගැනීමෙහි, දෙවීමෙහි, සිඳීමෙහි, මැඩීමෙහි, රැඳීමෙහි, ධාරණයෙහි යන නව වාරයෙක කම්පා විය.

> ඔක්කාක කුලයෙහි උපත ලබා සතර මහාදිවයින හැරදමා පාංශුකූලයෙන් සතුටු වූහ. බුදුරජාණන් වහන්සේගේ උදාරතාව ආශ්චර්යයි. කසීසළු කොමුපිළි කොටුම්බදේශ පිළි දරා සියලු බුදුවරුන්ගේ සිරිතට අනුව හන රෙදි හැඳගත් සේක.

භාග්‍යවතුන් වහන්සේ දෙවන දින තමන් වහන්සේ වෙසෙන තැනට පැමිණ උරුවෙල් කසුප්හට පාංශුකූලයක් සෙවීමේ චිතර්කය, යාම, ඒ සඳහා සොහොනට පිවිසීම, ගැනීම, දෙවීම, වාටි සිඳීම, මැසීම, රැඳවීම, පෙරවීම යන නවකැන පොළොව කම්පාවීමත් සක්දෙව්රජුගේ වත්පිළිවෙත් කිරීමත් වදාළහ. කාශ්‍යප ජටිල මහා ශ්‍රමණයෝ මහර්ධිමත් මහානුභාව ඇත්තෝය. මා මෙන් රහත් නොවෙතැයි සිතිය.

දිනක් අඟු මගද වැස්සෝ දුරුතු පසළොස්වක් දින නාගරාජයාට බිලියම් පිණිස ද ශස්‍ය විනාශ බියෙන් ද දෙලක්ෂයක් වටිනා උපහාර රැගෙන ආහ. එවිට කාශ්‍යපට මෙසේ සිතිණ. දැන් මාගේ මේ මහායාගය ද සූදානම්ය. මුළු මහත් අඟු මගධ වැස්සෝ බොහෝ කෑම් පීම් ගෙන පැමිණෙති. මේ මහසෙනඟ මෙහි ශ්‍රමණ ගෞතමයන් දුට හොත් කිසිදා මා දෙස නොබලති. මාගේ ලාභ සත්කාර පිරිහේ. ශ්‍රමණ ගෞතමයන්ගේ ලාභ සත්කාර වැඩිවේ. ඇත්තෙන්ම මහාශ්‍රමණයන් මෙහි නාවොත් යෙහකි කියායි.

පරසිත් දන්නා භාග්‍යවතුන් වහන්සේ ඔහුගේ සිත දැන පාසිවුරු ගෙන උතුරුකුරු දිවයිනට වැඩ එහි පිණ්ඩපාත කොට ගෙන හිමවත මනෝසිලා තලාවක හිඳ වළඳා අනෝතත් විලෙන් පැන් කිස නිම කොට එහි දාවල් දවස ගෙවා සවස රන හංසයෙකු මෙන් අහසට නැග ලක්දිව නාගවන උයන්හි යක්ෂ සමාගමයෙහි

මධුකඛාණ චෛත්‍යස්ථානයෙහි චෛත්‍යයෙහි ප්‍රථම ඡත්‍රය පිහිටන තැන කළයක පහනක් සෙයින් රෑසිරින් බබළමින්, බොහෝ සිය ගණන් පෙළහර දක්වා ප්‍රථම චෛත්‍යස්ථානයෙහි හිඳින සම්කඩ පනවා වැඩ හුන්හ. ඉක්බිති අනුක්‍රමයෙන් ධම් පය්‍යංකය වඩා මුළු දිවයින එකම පය්‍යංකයක් මෙන් උපුටා යකුන් නෙරපා වඩිද්දී සුමන කූටයෙහි සුමන දෙවියන්ට කේශ ධාතු දී මහියංගණයෙහි රුවන් වැලිමුවා ථූපයක් කරවා උරුවේලාවට වැඩී සේක.

දෙවන දින උරුවේල කස්සප බුදුන් වෙත පැමිණ මහා ශ්‍රමණය, ඊයේ කුමක් නිසා නො ආයෙහි ද? නමුත් අපි කෑම් බීම් ද තබා සිහි කළෙමුයි කීය. එවිට සර්ඥයන් වහන්සේ තමන් වහන්සේගේ තොරතුරු කීහ. උරුවේල කාශ්‍යප ඒ බව අසාත් සෘද්ධිමත් බව පිළිගනී. රහත් බව නම් ප්‍රතික්ෂේප කරයි. දෙවෙනි දින දන් වේලාව දැන්වීමට පැමිණි කාශ්‍යප මහාශ්‍රමණය, දන් වේලාවයි කියා සැලකළේය. උන්වහන්සේ කාශ්‍යප, ඔබ යන්න. මම එමියි පළමුව පිටත් කොට මොහොතකින් සෘද්ධි බලයෙන් මහදඹරුකින් මිහිරි ඕජා ඇති දඹ ඵල ගෙනවුත් ගිනිහල් ගෙයි වැඩහුන්හ. උරුවේල කාශ්‍යප ගිනිහල් ගෙයි වැඩහුන් බුදුන් දැක "මහාශ්‍රමණය, ඔබ කුමන මඟකින් පැමිණියහු ද? මම ඔබට පළමුවෙන් පිටත් වීමි. ඔබ මටත් පළමුවෙන් පැමිණ ගිනිහල් ගෙයි සිටින්නාහයි" කීය. කාශ්‍යපය, ඔබ පිටත් කොට මම යම් දඹ ගසකින් දඹදිව ප්‍රසිද්ධ ද, ඒ දඹගසින් ගෙඩි ගෙන ඔබටත් කලින් පැමිණ ගිනිහල් ගෙට ආයෙමි. කාශ්‍යපය, මේ දඹ වණ්ණ ගන්ධ රස සම්පන්නය, කැමැති නම් වළඳවයි වදාළහ. මහාශ්‍රමණය, කමක් නැත. ඒ සුදුසු ඔබටමය. ඔබම වළඳන්නැයි කාශ්‍යප කීය. එහිදී ද මහාශ්‍රමණයෝ මහානුභාව වෙති. මා මෙන් රහත් නම් නොවෙති කියා ඔහුට සිතිණ.

නැවත ද දඹදිව ඔජොභූත වූ මහදඹ රුක ළඟ අඹ ද බෙහෙත් නෙල්ලි ද බෙහෙත් අරළු ද ගෙන එමින් තව්තිසාවෙහි පරසතු මල් ගෙන එමින් කල් දැන්වීමට පැමිණි කාශ්‍යපයන් පළමුව පිටත් කොට ඔහු ගිනිහල් ගෙට පැමිණීමටත් පෙර වැඩම කොට ගිනිහල් ගෙයි

වැඩහුන් සේක. මකු කම නිසා හැම තන්හිම උරුවේල කස්සප මහානුභාව බව පිළිගනියි. රහත් බව නොපිළිගනී.

එසමයෙහි ඒ ජටිලයෝ ගිනි දෙවියන් පිදීමට දර පළන්නට පටන් ගත්හ. පන්සියයක් ජටිලයන් දර පළද්දී බුදුහු දර නොපැළෙන සේ අධිෂ්ඨාන කළහ. දරුපැළිය නොහැකිව "නිසැකවම මහා ශ්‍රමණයන්ගේ සෘද්ධ්‍යානුභාවයෙකි, අපට දර පැළිය නොහැකි යයි සිතූහ. එවිට භාග්‍යවතුන් වහන්සේ කාශ්‍යපට කාශ්‍යපය, දර පළ වන්නෙමිදැයි වදාළහ. මහාශ්‍රමණය, පළවනු මැනවි. භාග්‍යවතුන් වහන්සේ එක්වරම සියල්ල පැළෙන සේ අධිෂ්ඨාන කළහ. පන් සියයක් දර කොට එකෙණෙහිම පැළී ගියේ ය. මෙහි නොපැළීම් පැළීම් භේදයෙන් ප්‍රාතිහාර්‍ය දහසක් දත යුතුය. එකල්හි ඒ ජටිලයෝ ගිනි පුදනු කැමැත්තාහු ගිනි නො ඇවිලෙන සේ භාග්‍යවතුන් වහන්සේ අධිෂ්ඨාන කළහ. ඔවුහු ගිනි දැල්වීමට නොහැකි වූහ. භාග්‍යවතුන් වහන්සේ කාශ්‍යපය, ගිනි අවුලුවන්නෙමිදැයි වදාළ සේක. මහා ශ්‍රමණය, ගිනි අවුලවනු මැනවි. එක්වරම ගිනි පන්සියයම ඇවිලීයේය. නො දැල්වීම් දැල්වීම් භේදයෙන් ප්‍රාතිහාර්‍ය දහසකි. ගිනි නිවනු කැමැති කල්හි බුදුහු ගිනි නොනිවෙන සේ අධිෂ්ඨාන කළහ. ඔවුහු ගිනි නිවීමට අපොහොසත් වූහ. බුදුහු කාශ්‍යපය, ගිනි නිවන්නෙම් ද? මහාශ්‍රමණය, නිවනු මැනව. සැණෙකින් පන්සියක් ගිනි නිවී ගියේය. මෙහි නොනිවීම් නිවීම් වශයෙන් ද දහසකි.

එක් කලෙක නවම් මැදින් දෙමස අතර අන්තරට්ඨක හිමපාත සමයෙහි සියලු ජටිලයන් තේරඤ්ජරා නදී දියට බැස සීත වේගයෙන් වෙව්ලන්නවුන් දැක එක් එක් පංසලෙහි එක් එක් ගිනි කබල මැවූ කල්හි නිසැකයෙන් මේ ගිනි කබල් මැවීම මහාශ්‍රමණයන්ගේ සෘද්ධ්‍යානුභාවයකැයි සිතූහ. මෙහි ප්‍රාතිහාර්‍ය පන්සියයකැයි දත යුතුයි. ඒ සියලුම තුන් දහස් පන්සියයක් ප්‍රාතිහාර්‍යයෝය. මෙතෙක් පෙළහරවලදී ද උරුවේල කස්සප මහානුභාව බව පිළිගත්තේය. නමුත් මකු බව නිසා අර්හත්වය නොපිළිගත්තේ ය.

එකල අකල් මහවැස්සක් වැස්සේය. මහාසැඩපහර ඇති විය. බියට පත් ජටිලයෝ උස් තැන්වලට නැගුණහ. බුදුහු තල් කඳක් පමණ උස සැඩ පහර මැද ධූලි රහිත පොළොවෙහි සක්මන් කළහ. එවිට උරුවේල කස්සප අහෝ සොඳුරු මහාශ්‍රමණයන් සැඩ පහරින් ගසාගෙන යන්නට ඇතැයි කරුණාවෙන් බොහෝ ජටිලයන් සමඟ ඔරුවක නැගී බුදුන් වසන තැනට ගියේ ය. උරුවේල කාශ්‍යප සැඩ පහරින් ගොඩ නොවන නොතෙත් ගත් හා පාසිවුරු ඇති සීතලක් කම්පාවක් නැති ධූලි රහිත පොළොවෙහි සක්මන් කරන බුදුන් දුටුවේය. දැක අර්හත්වය නොපිළිගනිමින් ම "මහාශ්‍රමණය, ඔබ මෙහි දැයි ඇසීය. කාශ්‍යපය, මම මෙහි වෙමියි වදාළහ. මහාශ්‍රමණය, එන්න. ඔරුවට නගින්නැයි කීය. භාග්‍යවතුන් වහන්සේ ඔහුගේ වචනය ගණන් නොගෙනම රන්හසකු මෙන් අහසට නැඟ ඔරු තැල්ලෙහි සිට ගත්හ. එදාත් කාශ්‍යප අර්හත්වය නොපිළිගත්තේ මය.

ඔහුගේ නුවණ මුහුකුරා යාම දත් භාග්‍යවතුන් වහන්සේ ඔහු සංවේගයට පත් කරනු කැමැතිව රහත්මදය පහ කරනු කැමැතිව අනුකම්පාවෙන් මෙසේ වදාළහ. "කාශ්‍යප, ඔබ මා විසින් නොයෙක් දහස්ගණන් ප්‍රාතිහාර්‍ය්‍ය කරද්දීත් ඔබගේ රහත් බවම ප්‍රකාශ කරන්නෙහිය. ඉදින් ඔබට රහත් බවක් තිබේ නම් දැන් ඍද්ධි බලයක් හෝ ඤාණ බලයක් දක්වන්නැයි කියා ඔරුව යටිකුරු කළහ. එවිට කාශ්‍යප දිය හැළියක තෙත බරිත මීයෙකු මෙන් පිහිටක් නොලබා පිහිට පැතීය. බුදුසරණම ගියේය. එවිට බුදුහු ඔරුව ගොඩ බිමිහි වන සේ ඍද්ධියක් කළහ. හෙතෙම බුදුසිරිපා සිරසින් වැඳ පැවිද්ද යදිමින් ස්වාමීනි, මම භාග්‍යවතුන් වහන්සේ සමීපයේ පැවිද්ද ලබමි. උපසම්පදාව ලබමියි කීය.

භාග්‍යවතුන් වහන්සේ ඔහුට කාශ්‍යපය, ඔබ පන්සියයක් ජටිලයන්ට නායක ද ප්‍රමුඛ ද වන්නෙහිය. ඔවුන් ගැන බලා ඔබ සිතන සැටියෙක් කරන්නැයි වදාළහ. උරුවේල කස්සප පන්සියයක් ජටිලයන් කැඳවා "මම මහාශ්‍රමණයන් වෙත පැවිදිවෙමි. ඔබලා

තමන්ගේ නිශ්චය කියව්. ඔබලා සිතන පරිදි ක්‍රියා කරව් යි" කීය. ගුරුතුමනි, බොහෝ කලක සිට සැක කළෙමු. මහාශ්‍රමණයන්ට පැහැදුණෙමු. පළමු පෙළහර දැකීමෙන්ම මහාශ්‍රමණයන් වෙත මහණ වීමට අදහස් කළෙමු. ඔබතුමා මහාශ්‍රමණයන් වෙත පැවිදි වන්නෙහි නම් අපි හැම දෙනම බලවත් කැමැත්තෙන් මහණ වූත්තෙමු. එවිට උරුවේල කස්සප ශිෂ්‍යයන් සමඟ කෙස් ජටා මුසු පිරිකර බර ද ගිනිකබල් ද ගඟෙහි පා කොට බුදුන් වෙත පැමිණ පා වැඳ පැවිද්ද ඉල්ලූහ.

එවිට ලෝක නාථයන් වහන්සේ සරත් සෑදෑවලා වන් රත් පවුල් සිවුරින් සක් ලකුණු හෙබි ගැඹුරු රේඛා සහිත අත්තල ඇති රන්වන් දිගැඟිලිවලින් බබළන දකුණත දික් කොට පුන්සඳ වන් සුනිල් නුවනින් බබළන සුපිහිටි උන්නත නාසා ඇති අවිරල දසනින් යුත් බිඹුපල වන් රතුතොල් යුත් පුළුල්දිවු සහිත මුවපියුම විවර කොට බඹගොස් විහිදුවා ජටිලයන් අමතා මහණෙනි, එව්. ධර්මය ස්වාක්ඛාතය. මනාව දුක් කෙළවර පිණිස බඹසර හැසිරෙව් කියා වදාළහ. බුදුන් වදාළ වචනයට අනතුරුවම ඔවුහු සෘද්ධිමත් පා සිවුරු ධරව සියවස් ගත තෙරවරුන් මෙන් ඉරියව් සපිරි පැවිදිවෙස් ඇතිව භාග්‍යවතුන් වහන්සේට නමස්කාර කරමින් හුන්හ.

එකල උරුවේල කාශ්‍යපයන්ගේ සොහොයුරු නදීකාශ්‍යප ජටිලයන් තුන්සියයකට නායක වුයේ වෙයි. හෙතෙම තුන්සියයක් ජටිලයන් සමඟ නේරන්ඤරා ගඟ වක්කලමක වසයි. ගඟ දියෙහි පාවෙන ජටා පිරිකර දුටු නදී කාශ්‍යප "මාගේ සහෝදරයාට මෙබඳු උවදුරක් නොවේවා"යි සිතා ජටිලයන් පිටත් කොට හැරියේය. යව් මාගේ සොහොයුරා ගැන තොරතුරු දනිව් කියායි. ඔවුහු ගොස් බලා එපවත් දැනුම් දුන්හ. තෙමේ ද තුන්සියයක් ජටිලයන් සමඟ උරුවේල කාශ්‍යපයන් වෙත ගොස් ශාන්ත දාන්ත වේසධාරී ඉරියා-පථ සම්පන්න කාශ්‍යපයන් දැක කාශ්‍යපය, මෙය ශ්‍රේෂ්ඨදැයි ඇසීය. ඇවැත්නි එසේය. මෙයම ශ්‍රේෂ්ඨය. එවිට නදී කාශ්‍යප ප්‍රමුඛ ඒ ජටිලයෝ ජටා පිරිකර දියෙහි පාකොට බුදුන් කරා ගොස් පා වැඳ

පැවිද්ද ඉල්ලූහ. භාග්‍යවතුන් වහන්සේ "ඒහි භික්ඛු" කියා පැවිදි කළ සේක. එවිට උන් හැමට බාල සොහොයුරු ගයා කස්සප දෙසියයක් තරුණයන්ට ප්‍රමුඛව ගයා හිස විසීය. ඔහු ද ගඟේ පාවන ජටා පිරිකර දැක මාගේ සහෝදරයන්ට අනතුරක් නො වේවා. මාගේ සහෝදරයන් ගැන සොයමියි කියා ජටිලයන් පිටත් කොට එපවත් අසා දෙසීයක් ජටිලයන් සමඟ සොහොවුරන් වෙත ගොස් කී පරිද්දෙන් විමසා සියල්ලෝම බුදුන් වෙත පැවිද්ද පැතූහ. උන්වහන්සේ ඔවුන් ද "ඒහි භික්ඛු" කියාම පැවිදි කළ සේක.

දෙවන දිනයෙහි බික්සගුන් පිරිවරා ගමෙහි පිණ්ඩපාත කොට දන් වළඳා භාග්‍යවතුන් වහන්සේ ගයාහිස වසන සේක. එහි මහ ගල්තලාවක වැඩහුන් භාග්‍යවතුන් වහන්සේ දහසක් පමණ භික්ෂූන්ට ආදිත්තපරියාය සූත්‍රය දේශනා කරමින් අටඟ බඹසරින් මුළු වනපියස සොඟා කරමින් භික්ෂූන් ඇමැතූ සේක. මහණෙනි, සියල්ල ඇවිල ගත්තේය. මහණෙනි සියල්ල කෙසේ ඇවිල ගත්තේ ද? මහණෙනි, ඇස අවිල ගත්තේ ය. රූපය ඇවිල ගත්තේ ය. චක්ඛු විඤ්ඤාණය ඇවිල ගත්තේ ය. චක්ඛු සම්ඵස්සය ඇවිල ගත්තේ ය. චක්ඛු සම්ඵස්සය හේතුවෙන් සැප හෝ දුක් හෝ නොදුක් නොසුව හෝ යම් වේදයිතයක් ඇද්ද එය ද ඇවිල ගත්තේය. කුමකින් ඇවිල ගත්තේ ද? රාග ගින්නෙන් ඇවිල ගත්තේ ය. දෝස ගින්නෙන් ඇවිල ගත්තේය. මොහ ගින්නෙන් ඇවිල ගත්තේය. ජාතියෙන් ජරා මරණයෙන් සෝක පරිදේවයෙන් දුකින් දෙමනසින් ඇවිල ගත්තේය කියමි. කන ඇවිලගත්තේය. ශබ්දය ඇවිල ගත්තේය. සෝත විඤ්ඤාණය ඇවිල ගත්තේය. සෝත සම්ඵස්සය ඇවිල ගත්තේය. -පෙ - නාසය ඇවිල ගත්තේය. ගන්ධය ඇවිල ගත්තේය. - පෙ - දිව ඇවිල ගත්තේය. රස ඇවිල ගත්තේය - පෙ - කය ඇවිල ගත්තේය. ඵොට්ඨබ්බය ඇවිල ගත්තේය. - පෙ - සිත ඇවිල ගත්තේය. ධම් ඇවිල ගත්තේය - පෙ - මනො සම්ඵස්ස හේතුවෙන් සුවදුක් නොදුක් නොසුව යන යම් වේදයිතයක් වෙයි ද එය ද ඇවිල ගත්තේ ය. කුමකින් ඇවිල ගත්තේ ද? රාග දෝස මෝහ ගින්නෙන්, ජාති ජරා

මරණ සෝක පරිදේව දුක්ඛ දොමනස්ස උපායාසයෙන් ඇවිල ගත්තේ යයි කියමි.

මහණෙනි, මෙසේ දක්නා ශ්‍රැතවත් ආර්‍ය්‍ය ශ්‍රාවක තෙම ඇසෙහි ද කලකිරෙයි. රූපයන්හි ද කලකිරෙයි. චක්ඛු විඤ්ඤාණයන්හි ද කලකිරෙයි. චක්ඛු සම්ඵස්සයන්හි ද කලකිරෙයි. චක්ඛු සම්ඵස්සය හේතුවෙන් යම් සැප හෝ දුක් හෝ නොදුක් නොසැප හෝ වේදයිත යක් ඇද්ද එහි ද කලකිරෙයි. කනෙහි ද ශබ්දයෙහි ද - පෙ - නාසයෙහි ද ගන්ධයෙහිද - පෙ - දිවෙහි ද රසෙහිද - පෙ - කයෙහි ද ඵොට්ඨබ්බයෙහි ද - පෙ - මනසෙහි ද ධර්‍මයන්හි ද කලකිරෙයි. කල කිරී නො ඇලෙයි. නො ඇලී මිදෙයි - මිදුණු කල්හි මිදුණෙමි යන ඤාණය ඇති වෙයි. ජාතිය ක්‍ෂය විය. බඹසර වැස නිමාවිය. කළ යුතු කාක් දේ කරන ලදි. මේ සඳහා අනෙකක් නැත කියා දැන ගනී. මේ ප්‍රකාශය කරත්ම ඒ දහසක් භික්‍ෂූන්ගේ සිත් උපාදා රහිතව ආස්‍රවයන්ගෙන් මිදුණේය.

යම් පමා බවක් නිසා රාගය ජාති මද ගොත්‍ර මද ආරෝග්‍ය මද යෞවන මද ජීවිත මද ලාභ මද සත්කාර මද ගරුකාර මද පුරස්කාර මද පිරිවර මද භෝග මද වණ්ණ මද ශ්‍රැත මද ප්‍රතිභාණ මද රාත්‍රැඳ මද පිණ්ඩපාත මද අනාවඤ්ඤත්ති මද ඉරියව් මද සෘද්ධි මද යස මද සීල මද ධ්‍යාන මද ශිල්ප මද ආරෝහ මද පරිණාහ මද සණ්ඨාන මද පරිපූර මද ප්‍රමාද ඵමිහ සාරම්භ අත්‍රිච්ඡතා, පාපිච්ඡතා, අසභාගවුත්ති අරති තන්දි විජම්භිකා හත්තමද චිත්තලීනතා කුහනා ලපනා නෙමිත්තිකතා නිප්පෙසිකතා ලාබයෙන් ලාබය දිනනබව, ගුණ ගායනා හා බැඳුණු විතර්ක අනුප්‍රඥප්ති ප්‍රතිසංයුත්ත විතර්ක ක්‍රෝධ උපනාහ මක්ඛ පලාස ඊර්ෂ්‍යා මාත්සර්‍ය්‍ය මායා සඨබව අවිද්‍යාව භවතෘෂ්ණා විභවතෘෂ්ණා භවදෘෂ්ටිවිභවදෘෂ්ටි ශාස්වතදෘෂ්ටි උච්ඡේදදෘෂ්ටි අන්තවත්දෘෂ්ටි පූර්වාන්ත අනුදෘෂ්ටි අපරාන්තානු-දෘෂ්ටි ද අහිරිකය අනොත්තප්පය දුර්වචබව පාපමිත්‍රතාව අප්ජවය අක්‍ෂාන්තිය අසුරත බව අසාකල්‍යතාව අප්පටිසන්ථාරය ඉන්ද්‍රියයන්හි නොවසන ලද දොරටු ඇති බව බොජුනෙහි පමණ නොදන්නා

බව මුළා සිහිය සමාග ප්‍රඥා නැති බව සීල විපත්තිය දෘෂ්ටි විපත්තිය ආධ්‍යාත්මික සංයෝජන බාහිර සංයෝජනද.

ත්‍රිවිධ අකුසල් මුල් තුන් දුසිරිත් තුන් සංයෝජන තුන් බිය තුන් කම් තුන් තීර්ථායතන තුන් අංග ත්‍රිවිධ විසම ත්‍රිවිධ අකුසල විතර්ක ත්‍රිවිධ ආසව ත්‍රිවිධ කිඤ්චන ත්‍රිවිධ ගිනි ත්‍රිවිධ කසට ත්‍රිවිධ අකුසල සංඥා ත්‍රිවිධ අකුසල ධාතු ත්‍රිවිධ තෘෂ්ණා ත්‍රිවිධ ඒසනා ත්‍රිවිධ අවිද්‍යා ත්‍රිවිධ දුක් චතුර්විධ ආසව චතුර්විධ ග්‍රන්ථ ඕඝ, යොග, තණ්හුප්පාද, අනරියවොහාර, විපරියාස, අගතිගමන, දුශ්චරිත, භය දෘෂ්ටි ද පස් ඔරම්භාගිය සංයෝජන, උද්ධම්භාගිය සංයොජන, මසුරු කම්, සංග, සල්ල, චේතොඛීල, චේතවිනිබද්ධ, නීවරණ, ආනන්තරිය කර්ම, දෘෂ්ටි, වෛර, වාසන, අක්ෂාන්ති ආදීනව, පඤ්චභය, පඤ්චදිට්ඨධම්මනිබ්බාන වාද යෝ ද,

සවැදැරුම් විවාදමූල, ඡන්දරාග, දොසිත ධම්, විරොධ වස්තු, තණ්හා කාය, අගාරව, පරිහානීය ධම්, සෝමනස්ස විචාර, දොමනස්ස, උපෙක්ඛුපවිචාර, ගෘහ නිශ්‍රිත සොම්නස්, ගෘහ නිශ්‍රිත දොම්නස්, ගෘහනිශ්‍රිත උපේක්ෂා සහ සවැදැරම් දෘෂ්ටි ද සත් අනුසය, සත් පරියුට්ඨාන, සංයෝජන, දුච්චරිත, අසද්ධම්, සම, සත් දෘෂ්ටි ද අට්ඨ කිලෙස වස්තු, ලෝක ධම්ම, අනරිය වොහාර, මිච්ඡත්ත, පුරිෂ දෝෂ, සඤ්ඤුප්පාද, නෙවසඤ්ඤී නාසඤ්ඤී වාද ද නව අඝාත වස්තු නව පුරුෂමූල, මාන, තෘෂ්ණා මූලික ධම්, ඉඤ්ජිත, මඤ්ඤිත, එණ්හිත, පපඤ්චිත නව සංඛත ද දස ක්ලෙශවස්තු, සංයෝජන, අකුසල කම්මපථ, මිච්ඡත්ත, මිථ්‍යා දෘෂ්ටි, අත්තගාහිකදිට්ඨි ද අටළොස් තෘෂ්ණාව ද, එක් දහස් පන්සියයක් කෙලෙස් දැයි මෙසේ කෙලෙසුන් අතර කෙලෙස් විෂ පත් විවිධ අපමණ සතුරන්ගෙන් ගහණ චතුරෝඝ යුත් මුහුදෙහි අර්හත් ඵල ඤාණය ලබා රහත් බවට පත් වූහ.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ගයාහිස අභිමත පරිදි වැඩ සිට බිම්බිසාර රජුගේ ප්‍රතිඥාව සිහිකරමින් ඒ රහතන් දහස පිරිවරා රජගහ නුවරට වැඩි සේක. පිළිවෙළින් රජගහ නුවරට වැඩ නගරුසන්නයෙහි ලට්ඨිවන උයන්හි සුපිහිටි නුගරුකක් මුල සොඳුරු

රස් විහිදුවමින් වැඩ හුන්හ. භික්ෂූහු ද උන්වහන්සේ පෙරටු කොට හුන්හ. එවිට උයන්පල් තෙම වහා ගොස් දේවයිනි, භික්ෂු සංඝයා සහිත ශාස්තෘන් වහන්සේ උයනට වැඩි සේකැයි රජුට දැන්වීය. රජ අසා සතුටු සෙමිනසින් මහජනයා රැස් කරවා දොළොස් නහුතයක් බ්‍රාහ්මණ ගෘහපතීන් පිරිවරා බුදුන් කරා එළඹ විහිදවූ රන් වියනක් තුළට පිවිසෙන්නාක් මෙන් බුද්ධ රශ්මි ජාලාවට පිවිස පා සිරසින් වැඳ පිරිස් සමඟ පසෙක වාඩිවිය.

එවිට දොළොස් නහුතයක් පමණ වූ ඒ බමුණු ගැහැවියන්ට "කිමෙක් ද මහාශ්‍රමණයන් වෙත උරුවේල කාශ්‍යප බඹසර හැසිරෙයි ද? නැත්තම්, මහාශ්‍රමණයෝ උරුවේල කාශ්‍යපයන් වෙත බඹසර හැසිරෙත් ද? කියා සිත් විය. භාග්‍යවතුන් වහන්සේ ඔවුන්ගේ චිත්ත පරිවිතර්කය දැන උරුවේල කාශ්‍යපයන්ට මෙසේ ගාථාවකින් වදාළහ.

> කුමක් දැක උරුවෙල් වැසි කාශ්‍යප ගිනි දෙවිඟන් පිදීම ගිනි පිදීම අත් හැරියෙහි ද? කාශ්‍යපය. ඔබගේ ගිනි දෙවියන් පිදීම කෙසේ ප්‍රහීණ වී දැයි අසමි.

එවිට තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේගේ අදහස් දැන

> රූප ශබ්ද එසේම රසයන් කාමී ස්ත්‍රීන් ද යඥයෙන් වර්ණනා කරනු ලැබේ. උපධිවල මෙය කිළිටකැයි දැන යඥයෙහි ගිනි දෙවියන් පිදීමෙහි නොඇලෙමියි කීහ.

කාශ්‍යපය, මෙහි ඔබගේ සිත නො ඇලුණේ යයි භාග්‍යවතුන් වහන්සේ වදාළහ.

> රූප ශබ්දයන්හි හා රසයන්හි දිව්‍ය මනුෂ්‍ය ලෝකයෙහි කවරෙකුගේ නම් සිත ඇලෙන්නේ ද යන මෙය කාශ්‍යපය ප්‍රකාශ කරන්න. උපධි රහිත ශාන්ත පදය දැක කිඤ්චන රහිතව කාමභවයෙහි නො ඇලී හෙයින් යඥ නොකෙළෙමි. ගිනි දෙවියන් නොපිදුවෙමි.

මේ ගාථාව කියා උරුවේල කාශ්‍යප තමන් විසින් ලබන ලද ශ්‍රාවක බව පළකිරීමට සිවුර එකාංශ කොට බුදුසිරිපා සිරසින් වැඳ මෙසේ සැලකළේය. භාග්‍යවතුන් වහන්සේ මාගේ ශාස්තෘන් වහන්සේය. මම ශ්‍රාවක වෙමියි තුන් වරක් කියා නැගී තල්ගසක් පමණ අහසට නැග බැස බුදුන් වැඳ මේ ක්‍රමයෙන් සත් තල් ගසක් පමණ අහසට නගිමින් බසිමින් බුදුන් වැඳ පසෙක හුන්හ. ඒ පෙළහර දැක විස්මය පත් මහජනතාව අහෝ මහත් සෘද්ධියක තරම, මහානු භාවයෙක තරම. මෙසේ තහවුරු වූ දෘෂ්ටි ඇතිව තමා අර්හත්යයි හඟිමින් සිටි උරුවෙල කාශ්‍යපයන්ගේ දෘෂ්ටි ජාලය බිඳ දමා දමනය කළ සේකැයි බුදු ගුණ කථාම කීවාහුය.

එවිට භාග්‍යවතුන් වහන්සේ රජු ප්‍රමුඛ දොළොස් නහුතයක් බ්‍රාහ්මණ ගෘහපතීන්ට ධර්ම දේශනා කරමින් මෙසේ වදාළ සේක. බුදු බවට පැමිණ මා විසින් මොහු දමනය කිරීම අසිරියක් නොවේ. පෙරත් මොහුගේ දිටුදැල් බිඳ දමනය කරන ලද්දේ යයි වදාරා පිරිස විසින් ආයාචනා කරන ලදුව මහානාරද කස්සප ජාතකය දේශනා කළ සේක. අවසානයෙහි සිව්සස් දහම් ප්‍රකාශ කළ සේක. බිම්සර රජ එකොළොස් නහුතයක් බමුණු ගෘහපතියන් සමඟ සෝවාන් පෙලෙහි පිහිටියේය. එක් නහුතයක් උපාසක බව ප්‍රකාශ කළහ. දුටු දහම් ඇති පත් දහම් ඇති දත් දහම් ඇති පිවිසි දහම් ඇති සැක මද පහකළ ශාස්තෘ ශාසනය හැර අන් පිහිටක් නොපැතූ රජ බුදුන් හමුවෙහි හිඳම බලාපොරොත්තු පහක් සැලකරමින් ස්වාමීනි, පෙර කුමාරයෙකු වූ මට පස් අදහසක් විය. දැන් එය සමෘද්ධ වූයේ යයි කීය.

ස්වාමීනි, පෙර මට අහෝ මට රජවීමට ඇත්නම් කියා අදහස් විය. ස්වාමීනි, මෙය මගේ ප්‍රථම ආශාවයි. දැන් එය සම්පූර්ණය. මට බුදුරජාණන් වහන්සේ වෙත පැමිණීමට ලැබේවා යනු මාගේ මේ දෙවෙනි ආශාවයි. දැන් එය සපිරුණේය. ඒ මම භාග්‍යවතුන් වහන්සේ ඇසුරු කරමි යනු මාගේ තුන් වෙනි ආශාව විය. දැන් එය සම්පූර්ණය. ඒ භාග්‍යවතුන් වහන්සේ මට දේශනා කරන සේක්වා යන මෙය සිව් වන ආශාව විය. දැන් එය සම්පූර්ණය. මම ඒ

භාග්‍යවතුන් වහන්සේගේ ධර්මය අවබෝධ කරමි යන මෙය මාගේ පස්වන ආශාව විය. එය දැන් සම්පූර්ණය. ස්වාමීනි, පෙර කුමාර වූ මට මේ පස් ආශාව විය. දැන් ඒවා සමෘද්ධය. ස්වාමීනි, ඉතා සොඳුරුය. යටිකුරු වූවක් උඩුකුරු කරන්නාක් මෙන් ද සැඟවූවක් විවර කරන්නාක් මෙන් ද මුළාවූවකුට මඟ කියන්නාක් මෙන් ද ඇස් ඇත්තෝ රූප දකිත්වා කියා අඳුරෙහි තෙල් පහනක් අල්වන්නාක් මෙන් ද නන් අයුරින් භාග්‍යවතුන් වහන්සේ දහම් දෙසූහ. ඒ මම භාග්‍යවතුන් වහන්සේ ධර්මය සහ සංඝයා සරණ යමි. ස්වාමීනි, අද පටන් දිවි හිමි කොට මා සරණගත උපාසකයෙකු කොට දරන සේක්වා. ස්වාමීනි, භික්ෂු සංඝයා සමඟ සෙට දවසට දන් පිළිගන්නා සේක්වා. භාග්‍යවතුන් වහන්සේ නිහඬව පිළිගත් සේක. භාග්‍යවතුන් වහන්සේගේ පිළිගැනීම දැන අසුනින් නැගී සිටි රජ බුදුන් වැඳ පැදකුණු කොට ගියේ ය.

දෙවෙනි දින රජ උදැසනින්ම ප්‍රණීත ඛාද්‍ය භෝජ්‍ය පිළියෙළ කොට භාග්‍යවතුන් වහන්සේට කල් දැන්වීය. උන්වහන්සේ පෙරවරු හැඳ විදුලිය වන් පටිය බැඳ සුරත් සොඳුරු සැඳෑ අරුණ වන් මහ පවුල් සිවුර පොරවා රන්කොඩොල් වැනි අනුපූර්ව ඇඟිල්ලෙන් බබළන සුරත් කොමල අත් තලයෙන් මුං වන් සෙල්මුවා පය ගෙන උරුවෙල කස්සප නදීකස්සප ගයාකස්සප ආදි දහසක් රහතුන් සමඟ රජගහ නුවරට පිවිසෙනු කැමැතිව නික්මුණු සේක. එකල රජගහ නුවර වැසි ඒ සියලු ඇටළොස් කෙළක් පමණ මිනිස්සු අහිනව රූප වූ බුද්ධ රූපය දකිනු කැමැතිව පාන්දරින්ම ලට්ඨිවන උයනට ගියහ. තුන්ගව් පමණ ඉඩ නොසෑහෙයි. මුළු වේළුවනය අතුරු සිදුරු නැතිව පිරී ගියේය. මහජනයා පරම රූප ශොභාවෙන් අග්‍රප්‍රාප්ත බුදුසිරුර දැක දැක මහජනයාට ඇතිවීමක් නොවීය. ඒ බුදුරජාණන් වහන්සේගේ බුද්ධ ශරීරය දෙතිස්මහපුරිස් ලකුණින් අසූවක් අනුව්‍යඤ්ජනයෙන් යුක්තය. කේතුමාලාවෙන් බබළන උණ්හීසප්‍රදේශ ඇත්තේය. බ්‍යාමප්‍රභායෙන් බබළන්නේය. සියොලඟ සවනක් රසින් යුත්තය. කාන්ති හැම දිසාවන්හි බබළයි. අභිරූපවත්

ප්‍රසාදජනක දර්ශනීය උතුම් වණ්ණ සෞන්දර්යයෙන් යුත් උන් වහන්සේ දැකීම පිණිස අතෘප්තිකර වූහ. සියක් පින්ලකුණින් යුත් ඒ භාග්‍යවතුන් වහන්සේගේ සකල ශරීරය දානාදි දස පාරමිතා සත්‍යයෙන් ශතාකාරයෙන් නිපන්නේයයි දත යුතු. එබැවින් ඒ භාග්‍යවතුන් වහන්සේම ලෝකයෙහි සතපුඤ්ඤ ලක්ඛණධර වූහ. අත්‍යන්ත පරම වණ්ණ කාන්ති ශ්‍රීතෙජසින් සියලු සුර නරන්ගේ රූ සිරි ඉක්මවා බැබළි සේක.

මෙබඳු පරම රූප සොභාවෙන් අග්‍රප්‍රාප්ත භාග්‍යවතුන් වහන්සේගේ සිරුර බලමින් අතරක් නැතිව පිරී ගිය මාර්ගයෙහි ද උයනෙහි ද එක භික්ෂු නමකටවත් නික්මෙන ඉඩක් නැති විය. යාමක් ඊමක් නොවීය. ලෝක නායකයන් වහන්සේ මහාජනයා මැදම සිටි සේක. එදා උන් වහන්සේට සුන්බත් වීම වන්නේ ය. එහෙත් උන්වහන්සේගේ පින් තෙදින් සක්දෙව් රජුගේ පඬු ඇඹුල් සලසුන හුණුවිය. සක් දෙව්රජ ආවර්ජනයෙන් එකරුණ දැක තරුණ වෙසක් මවාගෙන බුද්ධ ප්‍රමුඛ භික්ෂු සංඝයාට ඉඩ ලබා දීම සඳහා ඉදිරියෙන් බැස බුද්ධ ධම්ම සංඝ ගුණ ප්‍රතිසංයුක්ත තුතිගී කියමින් ගමන් කළේය.

> රන්නිකක් සේ රන්වන් දාන්ත වූ භාග්‍යවතුන් වහන්සේ දාන්ත වූ විප්‍රමුක්ත වූ පුරාණ ජටිලයන් සමඟ රජගහ නුවරට පිවිසි සේක. රන් නිකක් සේ රන් වන් මිදුණා වූ භාග්‍යවතුන් වහන්සේ මිදුණාවූ විප්‍රමුක්ත වූ පුරාණ ජටිලයන් සමඟ රජගහ නුවරට පිවිසි සේක. රන් නිකක් සේ රන්වන් තරණය කළ භාග්‍යවතුන් වහන්සේ තරණය කළ විප්‍රමුක්ත වූ පුරාණ ජටිලයන් සමඟ රජගහ නුවරට පිවිසි සේක. දස වාසයක් ඇති දසබල ඇති දසදහම් දත් දසදහමින් යුත් සියදහසක් පිරිවැරූ ඒ භාග්‍යවතුන් වහන්සේ රජගහ නුවරට පිවිසි සේක.

මේ ශාස්තෘ වර්ණනා කියමින් ම ඉදිරියෙන්ම ගමන් කළේය. එවිට මහජනයා ශක්‍රානුභාවයෙන් දෙකඩ වී මග දෙපස සිට සක්දෙවිඳුහුගේ රූපවත් රන්වන් සිරුර දැක අපොයි මේ තරුණයා

අතිශයින්ම දර්ශනීයයි. අපි කිසිදා නොදුටුවෙමු. මේ තරුණයා කොයින්දැයි කීහ. මහජන කතා අසා සක් දෙවිරජ ඒ මිනිසුන්ට ගාථාවකින් මෙසේ කීය.

> සම්‌ප්‍රකාරයෙන් දාන්ත වූ සැදැහැ දනවන අසම පුද්ගල වූ අර්හත් වූ සුගත වූ යම් ධීර කෙනෙක් ලොව වෙසෙත් ද මම උන්වහන්සේගේ සේවකයෙක් වෙමි.

භාග්‍යවතුන් වහන්සේ ශක්‍රයා විසින් ඉඩ සැලසූ මාගියට බැස දහසක් භික්ෂූන් සමඟ රජගහ නුවරට පිවිස බික්සඟන සමඟින් රජ මැදුරෙහි පනවන ලද අසුන්හි වැඩ සිටි සේක. ප්‍රණීත බාද්‍ය භෝජ්‍යයෙන් බුද්ධ ප්‍රමුඛ භික්ෂූන් සියතින් වළඳවා නිමවීමෙන් පසු රජ නමස්කාර කොට පසෙක හුන්නේය. ඔහුට මෙසේ සිත් විය. රත්නත්‍රය නැතිව මට විසිය නො හැකිය. වේලාවෙහි හෝ අවේලාවෙහි හෝ බුදුන් වෙත යමි. මේ ලට්ඨිවන උයන ඉතා දුරය. කෙසේ නම් භාග්‍යවතුන් වහන්සේ එහි වසන සේක් ද? ගමට ඉතා දුර නැතිව ආසන්න ද නොවී ගමනාගමන පහසුව[1] යුත් යම් තැනක් ඇත්නම් මැනවැයි සිතූ ඔහුට මේ අදහස ඇති විය. අපගේ මේ වේළුවන උයන ගමට ඉතා දුරත් නැත. ළඟත් නැත. ගමනාගමනය පහසුය. විවේක වාසයට සුදුසුය. වේළුවන උයන බුදුන්ට පුදමියි කියා බුදුන්ගේ ශ්‍රී හස්තයෙහි පැන් වැකීය. භාග්‍යවතුන් වහන්සේ ආරාමය පිළිගත්සේක.

ආරාමය පිළිගනිත්ම බුද්ධ ශාසනය මුල් බැස ගත්තේ යයි තුටුපහටු වූවාක් මෙන් මහපොළොව කම්පා විය. වේළුවනාරාමය හැර පොළොව කම්පා කරවා බුදුන් පිළිගත් වෙනත් සෙනසුනක් දඹදිව නැත. උන් වහන්සේ භික්ෂු සංඝයාට සෙනසුන් සඳහා වේළුවනාරාමය පිළිගෙන රජුට අනුමෝදනා කොට බික්සඟන පිරිවරා වේළුවනාරාමයට වැඩ එහි විසූහ. එකල ඒ රජගහ නුවර සාරිපුත්ත මොග්ගල්ලාන නම් පරිබ්‍රාජකයෝ දෙදෙනෙක් ගිහි කල පටන් උනුන් යහළුව මොක්ෂධර්ම ගවේෂණය සඳහා තරුණයන් පන්සියයක් සමඟ සංජය ළඟ පැවිදිව ක්‍රියා කළහ. එතැන් පටන්

සංජය, ලාභ සත්කාරයෙන් අගතැන් පැමිණියේය. ඔවුහු කීප දිනකින් සංජය දහම ඉගෙන "ගුරු තුමනි, ඔබ දන්නා විශේෂ මෙතෙක්ම ද නැත්නම් තවත් ඇද්දැ"යි ඇසූහ. සංජය, මෙපමණකි. සියල්ල තොප විසින් දන්නා ලදැයි යි කීය. එයසා ඔවුහු එහෙම නම් මොහු වෙත බඹසර වාසය නිරර්ථකය. අපි මොක්ෂධර්ම්ය සෙවීමට නික්මුණෙමු. මොහු වෙත මොක් දහම් ඉපදවිය නොහැකිය. මේ දඹදිව අති විශාලය. ගම් නියම්ගම් ජනපද රාජධානිවල ඇවිද මොක් දහම් දෙසන ගුරුවරයෙකු සොයමුයි සිතූහ. එවක් පටන් ඔවුහු යම් තැනක පණ්ඩිත මහණ බමුණෝ වසතියි අසත්ද එහි ගොස් ප්‍රශ්න සාකච්ඡා කරති. ඔවුන් ඇසූ ප්‍රශ්න විසඳා කීමට දක්ෂ අන් කිසිවෙක් නොවෙති. ඔවුහු ඔවුන්ගේ පැන විසඳති. ඔවුහු මුළු දඹදිව ඇවිද ආපසු පැමිණ තමන් වසන තැනටම ගොස් උන්ගෙන් යමෙක් පළමුව නිවන අවබෝධ කරත් ද ඔහු අනිකාට දැන්විය යුතු යයි කතිකා කර ගත්හ.

එකල පස්වග භික්ෂූන් අතර වූ අස්සජි නම් තෙරුන් වහන්සේ පාසිවුරුගෙන බිම් බැලූ ඇසින් පිරුණු ඉරියව්වෙන් රජගහ නුවර පිඬු පිණිස වැඩියහ. සාරිපුත්ත පරිබ්‍රාජක තෙම උදැසනින් බත් කිස කොට පිරිවැජි අරමට යන්නේ පිරුණු ඉරියව්වෙන් බිම බැලූ ඇසින් රජගහ නුවර පිණ්ඩපාතයෙහි යෙදෙන ආයුෂ්මත් අස්සජි තෙරුන් දුටුවේය. දැක "මම පෙර මෙවන් පැවිද්දෙකු නොදුටිමි. ලොව රහත් හෝ රහත්මඟට පිළිපන් අය වෙත් නම් මේ භික්ෂුව ඉන් කෙනෙකි. මම උන්වහන්සේ වෙත ගොස් කවරකු උදෙසා පැවිදී වූවහු දැයි අසන්නෙම් නම් මැනවැයි" සිතීය. උන්වහන්සේගෙන් ප්‍රශ්න ඇසීමට සුදුසු වේලාව නොවේ. ගමෙහි පිඬු පිණිස හැසිරෙයි. මම පිටුපසින් යන්නෙම් නම් මැනවැයි තෙරුන් ලුහු බැන්දේය. තෙරණුවෝ පිණ්ඩපාතය ගෙන වැඩියහ.

කිසි තැනක හිඳගනු කැමැති තෙරුන් දැක හෙතම සිය පිරිවැජි පුටුව පනවා දුන්නේය. වළඳා අවසානයෙහි ද සිය කෙණ්ඩියෙන් පැන් පිරිනැමීය. මෙවෙනි ඇදුරු වත් කොට මිහිරි පිළිසඳරත් කොට

අස්සජි තෙරුන්ට මෙසේ කීය. ඇවැත්නි, ඔබගේ ඉන්ද්‍රියයන් ප්‍රසන්නය. පිරිසිදුය. ඡවි වර්ණය පැහැපත් ය. කවරකු උදෙසා පැවිදි වූයෙහි ද? ඔබගේ ශාස්තෘන් වහන්සේ කවරෙක් ද? කවරකුගේ ධර්මය රුචි කරන්නෙහි ද? කියායි. තෙරුන් වහන්සේ "ඇවැත්නි, ශාක්‍ය කුලයෙන් පැවිදි වූ ශාක්‍යපුත්‍ර වූ මහාශ්‍රමණයෝ සිටිති. ඒ භාග්‍යවතුන් වහන්සේ මාගේ ශාස්තෘවරයාණෝය. මම උන්වහන්සේගේ ධර්මය රුචි කරමියි කීය. ආයුෂ්මතුන්ගේ ශාස්තෘවරයාණෝ කුමන වාදී ද? කුමක් කියත් ද? තෙරුන් වහන්සේ මම විස්තර විසින් දහම් දෙසීමට නොහැක්කෙමි. නමුත් කෙටියෙන් අර්ථය ප්‍රකාශ කරමියි කීහ. එවිට පරිබ්‍රාජක තෙම ඇවැත්නි, මම සාරිපුත්ත නම් වෙමි. දඹදිව ප්‍රසිද්ධය, ප්‍රකටය. ඔබට හැකි පමණින්

> ස්වල්පයක් හෝ බොහොමයක් හෝ කියනු මැනවි. අර්ථයම මට කියනු මැනවි. අර්ථයෙන්ම පමණක් මට වැඩ ඇත්තේය. ව්‍යඤ්ජන බොහෝ වීමෙන් කවර පලයෙක්දැයි කීය.

එවිට ආයුෂ්මත් අස්සජි තෙරණුවෝ සාරිපුත්ත පරිබ්‍රාජක හට මේ ධර්මපර්‍යාය ප්‍රකාශ කළහ.

> හේතුව ප්‍රභව කොට ඇති යම් ධර්මයක් ඇත්නම් ඔවුන්ගේ හේතුව තථාගතයන් වහන්සේ වදාළහ. ඔවුන්ගේ යම් නිරෝධයෙක් ඇද්ද එය ද වදාළහ. මහාශ්‍රමණයෝ මෙබඳු වාද ඇත්තෝය.

එකල සාරිපුත්ත පරිබ්‍රාජක පිරිපුන් නැණ ඇති බැවින් ධර්ම පද දෙකක් අසමින් ම දහසක් නයින් සැදී සෝවාන් ඵලයෙහි පිහිටියේ ය. ඉතිරි දෙපදය සෝවාන් වූ පසු නිමාවිය. සෝවාන් වූ සාරිපුත්ත දුටු දහම් ඇතිව පත් දහම් ඇති ව ශාස්තෘ ශාසනයෙහි අපරප්‍රත්‍යයව අස්සජි තෙරුන් නැමද "ස්වාමීනි, මත්තෙහි ධර්මදේශනය නොවඩනු මැනව. මෙපමණක්ම සෑහෙයි. අපගේ ශාස්තෘන් වහන්සේ කොහි වසන සේක්දැයි කීය. පරිබ්‍රාජකය, වේළුවනයෙහිය. ස්වාමීනි, එසේ නම් පෙරටුව වඩිනු මැනවි. මාගේ යහළුවෙක් සිටී. ඔහු කැඳවාගෙන ඔබ වැඩි මගින් ම ළඟට එමියි

තෙරුන් වැඳ පැදකුණු කොට පිරිවැජී අරම බලා ගියේ ය. මොග්ගල්ලාන පරිබ්‍රාජක ප්‍රසන්නව දුරින්ම එන සාරිපුත්ත පරිබ්‍රාජකයන් දැක අද මාගේ යාළුවාගේ මුහුණ වෙනදා මෙන් නොවේ. බෙහෙවින් ප්‍රසන්නය. තිසැකයෙන් ඔහු නිවන් අවබෝධ කරන ලදැයි සිතමින් අවබෝධ කළ අමෘතය විමසීය. අසන ලද පරිදිම එසේම ගාථාව කීය. ගාථා කෙළවර මොග්ගල්ලාන සෝවාන් පෙලෙහි පිහිටා ශ්‍රමණ ශාස්තෘන් වහන්සේ කොහි වෙසෙත්දැයි ඇසීය. මිත්‍රය, වේළුවනයෙහිය කියා අපගේ ආචාර්‍ය්‍ය අස්සජි තෙරුන් විසින් කියන ලදැයි ඒ සියලු තොරතුරු කීය.

එසේ නම් යහළුව, යමු. ශාස්තෘන් වහන්සේ දකිමු. යහළු කෝලිතයෙනි, අප අවබෝධ කළ අමෘතය බොහෝකල් මුවා වී සිටින අපගේ ආචාර්‍ය්‍ය පරිබ්‍රාජකයන්ට ද කියමු. හෙතෙම මේ ධර්මය අවබෝධ කරයි නම් අවබෝධ කරන්නේය. අවබෝධ නොකරන්නේ නම් නොකෙරේවා. ඔහු බුදුන් දෙසූ දහම් අසා මඟපල අවබෝධ කරනු ඇත. අප නොහදහයි නම් අපි ඔහු ගැන නොබලා ශාස්තෘන් වහන්සේ වෙත යමු. ඉක්බිති පරිබ්‍රාජකයෝ දෙදෙන සංජය වෙත ගොස් ගුරුතුමනි, බුදුහු ලොව උපන්හ. ධර්මය ස්වාක්ඛාතය. ආර්‍ය්‍යසංඝයා සුපටිපන්නය. මේ රත්නත්‍රය ලොව උපන්නේය. දැන් කුමක් කරන්නෙහි ද? යමු. පරම ශාස්තෘවූ භාග්‍යවතුන් වහන්සේ දකිමුයි කීහ. එයසා සංජය දරුවෙනි, කම් නැත. ඔබලා යන්න. මම නොයමි. ඔබලාගේ ශාස්තෘන් වහන්සේ වෙත යෑමට මම එකඟ නොවෙමි. මහජනයාගේ ආචාර්‍ය්‍ය වෙමි. අතවැස්සකු වීමට නොහැක්කෙමියි කීය. ඔවුහු නත් අයුරින් කියාත් සංජය නම්වා ගැනීමට අසමත් වෙති. ඉක්බිති සිය ඔවදන් ඇසූ පරිබ්‍රාජකයන් කැඳවාගෙන වේළුවනයට ගියහ. ඔවුන් යද්දී සංජයගේ පිරිස් බිඳුණේය. පරිබ්‍රාජකාරාමය හිස් විය. ඔහු හිස් ආරාමය දැක දාහයෙන් උණු ලේ දැමීය. සැරියුත් මුගලන් දෙනම සමඟ යන පරිබ්‍රාජකයෝ පන් සියයක් වෙති. එයින් දෙසිය පනහක් නැවතියහ. දෙසිය පනහක් සමඟ ඔවුහු වේළුවනයෙහි භාග්‍යවතුන් වහන්සේ වෙත ගියහ.

එකල්හි සකල ලෝකානුකම්පක වූ කෝටි ප්‍රාප්ත වූ භාග්‍ය වතුන් වහන්සේ පිරිස් මැද උතුම් ධර්මාසනය මත හිඳ දුරින් එන සැරියුත්මුගලනුන් දැක අටඟ බඹ ගොසින් භික්ෂූන් අමතා "මහණෙනි, මේ කෝලිත උපතිස්ස නම් යහළුවෝ දෙදෙන එති. මේ මාගේ අග්‍ර වූ භද්‍රයුග වූ අග්‍රශ්‍රාවක දෙනම වෙතියි වදාරා උන් වහන්සේලාට පෙර ගමන් පිණිස. රිවිකිරණ වැනි සවනක් රස් විහිදවූසේක. ඒ රැස් දැල් පහසින් ප්‍රීති හරිතව සතුටු සිතින් හිස් නම නමා ඉක්මන් ඉක්මන් පියවර තබා බුදුන් කරා පැමිණ සිරිපා සිරසින් වැඳ සනරාමර ලෝකගුරු භාග්‍යවතුන් වහන්සේට "ස්වාමීනි, අපි භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි පැවිද්ද ලබමු. උපසම්පදාව ලබමුයි සැලකළහ. භාග්‍යවතුන් වහන්සේ දකුණු අත දිගු කොට මහණෙනි, එව්, ධර්මය ස්වාක්ඛාතය. මැනවින් දුක් කෙළවර කිරීමට බඹ සර හැසිරෙව් කියා වදාළහ.

වචනයත් සමඟම සාරිපුත්ත මොග්ගල්ලාන ප්‍රමුඛ දෙසිය පනහක් සියලු පරිබ්‍රාජකයෝ සෘද්ධිමය පාසිවුරු ධරව සියවස් ගත තෙරවරුන් මෙන් ඉරියව් පිරුණු භික්ෂූන්ව බුදුන් වැඳ හුන්හ. උන්වහන්සේ ධර්මදේශනා කළහ. අගසව්වන් හැර දෙසිය පනසක් සියලු භික්ෂූහු බණ අසා රහත්වූහ. දැගසව්වන්ගේ ශ්‍රාවක පාරමී ඤාණ මහත්වය නිසා සෙසු තුන්මඟ කටයුතු නොසිදුවිය. ආයුෂ්මත් මුගලන් තෙරහු පැවිද්දෙන් සත් වන දවස මගධ රට කිසියම් ගමක් ඇසුරෙහි මහණදම් පුරමින් ථීනමිද්ධයට බැසගන්නා ලදුව ශාස්තෘන් වහන්සේ විසින් සංවේගයට පත් කරන ලද්දාහු ථීනමිද්ධය දුරු කොට භාග්‍යවතුන් වහන්සේ දුන් ධාතු කමටහන් අසමින් මතු තුන්මඟ කටයුතු නිමවා රහත් වූහ. සැරියුත් තෙරුණුවෝ පැවිද්දෙන් අඩමසක් ගෙවා ශාස්තෘන් වහන්සේ සමඟ ඒ රජගහ නුවර ඇසුරෙහිම සූකරඛාදක ලෙනෙහි වසන්නාහු සිය බෑනණු දීඝනඛ පරිබ්‍රාජකයන්ට වේදනාපරිළාහ සූත්‍රය දෙසද්දී සූත්‍රානුසාරයෙන් නැණ යොදා අනුන්ට බෙදූ බතක් වළඳන්නාක් මෙන් ශ්‍රාවකපාරමී ඤාණයෙහි පරතෙර පැමිණියහ. භාග්‍යවතුන් වහන්සේ ඒ දෙනමම අග්‍රශ්‍රාවක ස්ථානයෙහි තැබූහ.

අනුත්තර ධම්මරාජ භාග්‍යවතුන් වහන්සේ සැරියුත් තෙරුන් වහන්සේගේ රහත් බවට පත් දිනය වූ මැදින් පුණු පොහෝදා ශ්‍රාවකයන් රැස් කොට එක් දහස් තුන්සිය පනසක් වූ චතුරංග සමන්නාගත ශ්‍රාවක සන්නිපාතයෙහි දස දහසක් සක්වළ දෙව සමූහයා මැද වැඩ හිඳ බන්තී පරමං තපොතිතික්ඛා නිබ්බානං පරමං වදන්ති බුද්ධා යනුවෙන් පාමොක් උදෙසූහ. බුදුන් වේළුවනාරාමයෙහි වසද්දී බුදුපිය සුදොවුන් මහරජ මපුත් සිදුහත් කුමරා සාවුරුදු දුෂ්කර ක්‍රියා කොට පරමාභිසම්බෝධියට පත්ව දම්සක් පවත්වා රජගහ නුවර වේළුවනයෙහි වාසය කරයි. මෙපමණ කලක් මා වෙත නොපැමිණියේය. වෙනත් සංග්‍රහකාරක උපකාරකයෙක් ද මට සංග්‍රහ නොකරන්නේ යයි සිතා ඇමැතියෙකු කැඳවා "දරුව, එන්න. ඔබ පුරුෂයන් දහසක් පිරිවරා රජගහ නුවරට ගොස් බුදුන් වෙත පැමිණ මාගේ වචනයෙන් ඔබ වහන්සේගේ පිය සුදොවුන් මහරජ දකිනු කැමැත්තේ යයි මාගේ මහලු බවත් පුත්‍ර වියෝග සෝදුකත් දන්වා වහා මපුතු කැඳවා ගෙන එවයි කීය.

හෙතෙම් මැනවයි රජුගේ කීම සිරසින් පිළිගෙන පුරුෂයන් දහසක් පිරිවර කොට ගෙන වහා සැටයොදුන් මඟ ගෙවා බුදුන් පිරිස මැද දහම් දෙසන වෙලෙහි වෙළුවනාරාමයට පිවිසියේය. පිවිසෙද්දීම සත්රුවන් පිරුණක් විසුරුවන්නාක් මෙන් බුදුන්ගේ රශ්මි කදම්බයෙන් බබළන වත ළැහැබ දැක විස්මය පත්ව තුටු පහටුව පෙරටුව ගොස් දෙවිදුනු කලප් පිරිවැරූ ළහිරු මඬලක් වන් බුදුන් දැක දම්සභාවට පිවිස රජුගේ පනිවුඩය තිබේවායි පිරිස් කෙළවර හිඳ බණ අසා සිටිවනම දහසක් පුරුෂයන් සමඟ රහත් විය. බණ නිමවීමෙන් පසු සියලු දෙන භාග්‍යවතුන් වහන්සේ ගෙන් වැඳ පැවිද්ද ඉල්ලූහ. භාග්‍යවතුන් වහන්සේ එව මහණෙනියි අත දිගු කොට පැවිදු කෙණෙහිම පාසිවුරු ධර සියවස් ගත තෙරවරුන් මෙන් භික්ෂුත්වයට පත් වූහ. රහත් වූ පසු ඔහු මධ්‍යස්ථ වූහ. රජුගේ පනිවුඩය දසබලයන් වහන්සේට නොකීය. රජ ද භාග්‍යවතුන් වහන්සේ නොඑන්නාහ. පනිවිඩයකුත් නැත. දරුව, එන්න. ඔබ

යන්නැයි සපිරිවරින් තවත් ඇමැතියෙකු යැවීය. ඔහු ද ගොස් පෙර පරිදි පිරිස් සහිතව රහත්ව නිහඬ විය. රජ මේ ක්‍රමයෙන් නවදහසක් පුරුෂයන් පිරිවැරූ ඇමැතියන් නව දෙනෙකු යැවීය. ඒ හැම සිය කටයුතු නිමවා එසේම නිහඬව සිටියහ. රජ පනිවිඩ මාත්‍රයක් ගෙන එන තරම්වත් කෙනෙකු නොලැබ "මෙතෙක් දෙන මට සෙනෙහසක් නැති බැවින් පනිවිඩයක් වත් නොගෙනාහ. මාගේ වචනය කවරෙක් කෙරෙත්දැයි සියලු රාජබලය බලන්නේ බෝසතුන් සමඟ සහජාත සත් වස්තුවට ඇතුළත් කාළදායි දුටුවේය. හෙතෙම රජුගේ සියලු අර්ථසිද්ධි කරන ආභ්‍යන්තරික අතිශයින් විශ්වසනීය ප්‍රිය මනාප ඇමැතියෙකි. රජ ඔහු අමතා දරුව කාළදායි, මම මපුතු දකිනු කැමැතිව නව දහසක් පුරුෂයන් සමඟ ඇමතියන් නව දෙනෙකු යැවීමි. පනිවිඩයක් තරම් හෝ අවුත් දන්වන එක් පුරුෂයෙක් වත් නැත. මාගේ ජීවිත අන්තරාය ගැන නොදනිමි. මා ජීවත් වෙද්දී පුතු දකිනු කැමැත්තෙමි. ඔබ මපුතු සමග එකදා උන්නෙහිය. වැලි කෙළියෙහි පටන් යහළු ය. පුතු පෙන්විය හැකිදැයි ඇසීය. ස්වාමීනි, මට පැවිදි වීමට ලැබෙයි නම් පුළුවනැයි කීය. දරුව පැවිදි වී හෝ පැවිදි නොවී හෝ මට පුතු පෙන්වවයි කීහ.

හෙතෙම යහපතැයි රජුගේ පනිවිඩය ගෙන මිනිසුන් දහසක් සමඟ වහා රජගහ නුවරට ගොස් බුදුන් බණ දෙසන වේලෙහි පිරිස් කෙළවර සිට බණ අසා සපිරිවරින් රහත්ව භාග්‍යවතුන් වහන්සේගෙන් පැවිද්ද ඉල්වීය. බුදුහු ඔවුන්ට මහණ උපසම්පදාව දුන්හ. කළුදායි තෙරුන් පැමිණ සත් අට දවසක් ගත විය. උන්වහන්සේ මැදින් පුන් පොහෝදින මෙසේ සිතූහ. හේමන්තය ගෙවී ගියේ ය. වැසි සමය නොපැමිණියේ ය. මිනිස්සු අස්වනු නෙළා රැස් කළහ. පාරවල් අසබඩ නිල්වන් තණ වැඩුණ පොළොවය. වන ළැහැබ සුපිපී ඇත. මඟ ගමන් කළ හැකිය. දසබලයන් වහන්සේට ඤාතිසංග්‍රහ කිරීමට සුදුසු කාලයයි සිතා උන්වහන්සේ වෙත ගොස් පසඟ පිහිටුවා වැඳ බුදුන් ඉදිරියෙහි බ්‍රහ්මයා මෙන් බිම දණින් සිට ඇදිලි බැඳ ගමන් වර්ණනා කරමින් මේ ගාථා ප්‍රකාශ කළහ.

ස්වාමීනි, එල කැමැති ගස්, අතු වල කොළ හැලී දැල්සහිත ගිනි ජාලා මෙන් බබළ බබළා මල් පිපී ඇත. මහාවීරයන් වහන්ස, ඤාතීන්ට සංග්‍රහ පිණිස වැඩම වීමට කාලයයි. බොහෝ සීතලත් නැත. බොහෝ උණුසුමත් නැත. සාදුක් දුබ්බික් දුකක් ද නැත්තේ ය. තෙත් වන් පොළොව නිල්වන්ය. මහාමුනීන්ද්‍රයන් වහන්ස, මේ සුදුසු කාලයයි.

මේ ආදි සැටක් ගාථාවලින් දසබලයන් වහන්සේට උපන් නුවරට වැඩමවීමට ගමන් වණිනා කළහ. එවිට භාග්‍යවතුන් වහන්සේ කිමෙක් ද උදායි මිහිරි හඬින් මාගේ ගමන වණිනා කිරීමට මේ ගාථා කීයෙහිදැයි වදාළහ. එසේය ස්වාමීනි, කුමක් හෙයින් ද? ඔබ වහන්සේගේ පියාණෝ සුදොවුන් මහරජාණෝ වෘද්ධය, ජීර්ණය, මහලුය. ඔබ වහන්සේගේ වියෝග ශෝකයෙන් මැඩී දුබල ලිහිල් සිරුරු ඇත්තෝ ය. ඔබ වහන්සේ දකිනු කැමැත්තෝ වෙති. ඤාතීන්ට සංග්‍රහ කරනු මැනවයි කීහ. එවිට භාග්‍යවතුන් වහන්සේ උදායි, ඔබ කුමක් කියන්නෙහි ද? ඤාතිසංග්‍රහ කරමි. භික්ෂුසංඝයාට දන්වන්න. ගමිකවත් සපුරන්නාහයි වදාළහ. උන්වහන්සේ මැනවි ස්වාමීනි, කියා භික්ෂුසංඝයාට දැන්වූහ.

ඉක්බිති ඒ විසිදහසක් සියලු රහත් භික්ෂූහු පාසිවුරු ගෙන වුත් බුදුන් පිරිවැරූහ. එවිට මෝහය නැසූ රාගාදි සියලු කෙලෙසුන් නැසූ සුගතෝත්තම භාග්‍යවතුන් වහ්තසේ අඟු මගද වැසි දසදහසක් කුල පුතුන් දසදහසක් කිඹුල්වත්පුර වාසීන් සඳහා රහතන්ම වූ විසිදහසක් භික්ෂූන් පිරිවරා රජගහ නුවරින් නික්ම කිඹුල් වත් පුර මඟට පිළිපන්හ. එකල්හි ඒ භාග්‍යවතුන් වහන්සේ තමන් වහන්සේ වීතරාග වූවාහු වීතරාගී සැරියුත් මුගලන් ආදි භික්ෂූන් විසින් අනුගත වූ සේක් තමන් වීතදොසව, වීතදොසීන් විසින් අනුයාතව තමන් වීතමෝහව වීතමෝහීන් විසින් පෙරටු කරන ලදුව තමන් නිෂ්තෘෂ්ණව, නිෂ්තෘෂ්ණිකයන් විසින් පිරිවරන ලදුව තමන් වහන්සේ නිකෙලඟව නිකෙලඟීන් විසින් පෙරටු කරන ලදුව තමන් වහන්සේ සම්බුද්ධව, අනුබුද්ධයන් විසින් පිරිවරන ලදුව සියපතින් පිරුවැරූ

කේශර මෙන් ද කෙසුරු පිරුවැරූ කෙමියක් මෙන් ද අපරිමිත කාලයෙහි රැස් කරන ලද පින් බෙලෙන් නිපන් අචින්තනීය වූ අනුපම වූ බුද්ධ ලීලාවෙන් අනුපම බුද්ධ විලාසයෙන් මහත් වූ බුදුසිරින් අහස්හි තරු ගණ පිරිවැරූ පුන්සඳ මෙන් සැටයොදුන් මඟට පිළිපන්සේක් අනුචාරිකාවෙහි ද වැඩි සේක. භාග්‍යවතුන් වහන්සේ යොදුනක් මඟ ගමන් කොට නතර වූහ. කාළුදායි තෙර කලින්ම නැගිට බුදුන් පිටත් වූ බව රජුට දන්වමියි ශාස්තෘන් වහන්සේට සැලකොට, අහසට නැගී මොහොතකින් රජ මාලිගයෙහි පෙනී ගියේ ය.

ඒ වේලෙහි සුදොවුන් මහරජ නැගෙනහිර සීමැදුරු කවුළුව හැර හුන්නේ ශාන්ත දාන්ත ගෝපිත දිනූ ඉඳුරන් ඇති උතුම් දම සමථයෙන් පත් ගත් අත් ඇති සතුටු මුවමඬලින් හෙබි ඒ උදායි තෙරුන් වහන්සේ දුටුවේය. දැක හැඳින නියතයෙන්ම මපුතුන්ගේ පැමිණීම යයි සතුටු සිතින් උදායි තෙරුන්ට පෙරගමන් කොට තෙරුන්ගේ අතින් පාත්‍රය ගෙන උතුම් අසුනක හිඳුවා මපුතුන් විසින් ඔබගේ ආරාධනය පිළිගන්නා ලදැයි විචාළේය. මහරජ, එසේය. කිමෙක් ද මපුතුන්ගේ වේශයත් ඔබගේ මේ වේශය වැනි දැයි ඇසීය. එසේය මහරජ එහෙත් පැවිදි සලකුණු වශයෙන් පමණක් මාගේ වේශය ශාස්තෘන් වහන්සේගේ වේශය මෙනි. මහත් වූ බුද්ධ ලීලාවෙන් සිය ගුණයෙන් දහස් ගුණයෙන් විශිෂ්ටතරයයි කීහ. බුද්ධ ලීලාව කෙබඳු ද? මහරජ, අනුපම බුද්ධ ලීලායෙන් මානුෂික වූත් දිව්‍යමය වූත් ලීලාව යටපත් වෙයි. ඒ භාග්‍යවතුන් වහන්සේ දෙතිස් මහපුරිස් ලකුණින් යුත් අසීති අනුව්‍යඤ්ජනයෙන් රැඳි රූපකාය ඇත්තාහ. සුන්දර කේතුමාලායෙන් වට වූ හිස් ඇත්තාහ. දොළොස් රියනක් පමණ වූ බ්‍යාමප්‍රභාවෙන් බබළන සිරුරු ඇත්තාහ. නීල පීත, ඔදාත, මංජෙට්ඨ, පහස්සර යන සවනක් රසින් බබළන සව්කාර සම්පන්න බුද්ධ වේශය සොභමාන යයි කීහ.

එයසා රජ සතුටු සොම්නස් විය. ඒකාන්තයෙන්ම බුද්ධ වේශය විරාජිතය. දැන් කොහිදැයි ඇසීය. මහරජ, විසිදහසක් රහතන් පිරිවරා

ඔබ දැකීම සඳහා චාරිකාවට නික්මුණ සේක. කවදා එත්ද? මහරජ, ඊයේ රජගහ නුවරින් පිටත් වූහ. යොදුනක් වැඩිසේක. එ අසා රජ සතුටු සැහැල්ලු කොට ගත් වියෝග ශෝක සන්තාප ඇතිව තමන්ට පිළියෙළ කළ නන්රස අගබොජුනින් පාත්‍රය පුරවා තෙරුන්ට පිදීය. තෙරුන් වහන්සේ පාත්‍රය ගෙන මහරජ, යන්නෙමියි රජුට දන්වා නැගිට වඩින බව දැක්වූහ. එවිට රජ තෙරුන් වහන්සේට ඔබ මෙහිදීම වළඳා මපුතුන්ටත් දානය ගෙන යනු මැනවැයි කීය. තෙරණුවෝ එහිදීම වැළඳූහ. රජ තෙරුන් වළඳවා පාත්‍රය සුවඳ දියෙන් සෝදා සුවඳ සුණින් උළා අගබොජුන් පුරවා මෙය තථාගතයන් වහන්සේට දුන මැනවයි තෙරුන් අත තබා මපුතනුවන් මෙනුවරට වඩින තුරු මෙහින්ම දානය ගෙන යනු මැනවැයි කීය. තෙරුන් වහන්සේ පිළිගෙන සියල්ලන් බල බලා සිටිද්දී පාත්‍රය අහසට දමා තමන් වහන්සේ ද අහසට නැග පිණ්ඩපාතය ගෙනවුත් භාග්‍යවතුන් වහන්සේ අත තැබූහ. උන්වහන්සේ එය පිළිගෙන වැළඳූහ. තෙරණුවෝ මේ ක්‍රමයෙන් දිනපතා රජු වෙතින් දානය ගෙනවුත් බුදුන්ට පිදූහ. භාග්‍යවතුන් වහන්සේ අතර මගදීම රජුගෙන් එක් සැටක් පිණ්ඩපාත වැළඳූහ. භාග්‍යවතුන් වහන්සේ කිඹුල්වතට වැඩි කල්හි කාළුදායි තෙරණුවෝ දිනපතා රජමාලිගයට ගොස් අද භාග්‍යවතුන් වහන්සේ මෙතෙක් වැඩිසේක. අද මෙතෙක් වැඩි සේකැයි බුදුගුණ මුසු දැහැමි කතාවෙන් සකල රාජකුලය උන්වහන්සේ කෙරෙහි පැහැදීම් ඇත්තක් බවට පත් කළහ.

ඒ භාග්‍යවතුන් වහන්සේ සදේවක ලෝකයෙහි ජ්‍යෙෂ්ඨ වෙති. ශ්‍රේෂ්ඨවෙති. උත්තම වෙති. ඒකවීර වෙති. විජිතමාර වෙති. අවබෝධ කළ බෝධිඤාණ ඇත්තාහු සකලවිධ අවිද්‍යා අන්ධකාර විධිවංසනය කළාහු වෙති. ලෝකාලෝකකරවූ දහම් පහන දල්වන්නාහු වෙති. බව බැමි සිඳිනාහු වෙති. ජාති ජරා ව්‍යාධි මරණ අවසන් කළාහු වෙති. පාරගත සේක. නාථ සේක. නායකසේක. සමාහිතයහ. සත්ව-සාරයහ. ශාන්ත සිත් ඇත්තාහ. කෙලෙස් බර බහා තැබූහ. සදර්ථ ප්‍රාප්තයහ. භව සංයෝජන ප්‍රහීණ කළ සේක. වීතරාගී සේක.

වීතදෝසසේක. වීතමෝහ සේක. තෘෂ්ණා රහිතයහ. නිකෙලෙස් සේක. ලාභාදි අටලෝ දහම්හි අකම්පිත සිත් ඇති සේක. අනිමා මහිමාදි ප්‍රමුඛ අට ගුණයෙන් යුක්තයහ. දසබල ඇත්තාහ. චතුර්වෛශාරද්‍ය ප්‍රාප්තයහ. බුද්ධ සම්බුද්ධ ඤාණයෙන් සමුපේතයහ. පුරිසෝත්තම සේක. සියලු ගුණ සමූහ ඇත්තාහ. ගුණාධික වූහ. සීලයෙන් අසම සේක. සමාධියෙන් අද්විතීය සේක. ප්‍රඥාවෙන් අසදෘශයහ. විමුක්තියෙන් විමුක්ති ඤාණ දර්ශයෙන් අග්‍රසේක. අප්‍රති පුද්ගලයහ. ශක්‍රයා විසින් ද පුදන ලද්දාහ. ලෝක පාලක දෙවියන් විසින් ද ගරු කරන ලදහ. අමනුෂ්‍ය මනුෂ්‍යයන් පුදන ලද්දාහ. තිරිසනුන් විසින් ද පුදන ලද්දාහ. අභිරූප වෙති. දර්ශනීය වෙති. පාසාදික සේක. උතුම් වණ් සෞන්දර්යයෙන් යුක්ත සේක. සොඳුරු ඉඳුරන් ඇත්තාහ. සමන්ත භද්‍රයහ. දෙතිස් මහපුරිස්ලකුණින් හා අසීති අනුව්‍යඤ්ජනයෙන් විසිතුරු රූපකාය ඇත්තාහ. සර්වාකාරයෙන් සුපිරිසිදු සීල සමාධි ප්‍රඥාදි ගුණගණ රුවනින් සමෘද්ධිමත් ධර්මකාය ඇත්තාහ. අනන්ත තෙජස් ඇත්තා හ. අමිත යසස් ඇත්තාහ. අප්‍රාමාණිකයෝය, දුරාසදයහ. ක්ෂමාවෙන් අනුපම සේක. සීලයෙන් සාගරය බඳුය. සමාධියෙන් මහමෙර බඳුය. නුවණින් අහස බඳුය. මෙබඳු යසස්වී මහගුණ මහශක්ති මහාඍද්ධි මහනුවණින් මහත් වූවන්ට අග්‍ර සේක. අසම සේක. අසමසම සේක. අප්‍රතිපුද්ගල සේක.

ඒ භාග්‍යවතුන් වහන්සේගේ මෙබඳු යහපත් යශොඝෝෂයක් පැතිර ඇත්තේය. ඒ භාග්‍යවතුන් වහන්සේ මෙසේත් අර්හත් සේක. සම්මා සම්බුද්ධ සේක. විද්‍යාවෙන් හා චරණයෙන් සම්පන්න සේක. සුගත සේක. ලෝකවිදූ සේක. උතුම් පුරිසදම්මසාරථී සේක. දෙවි මිනිසුන්ට ශාස්තෘ සේක. බුද්ධ සේක. භගවත් සේක. උන්වහන්සේ දෙවියන් සහිත බඹුන් සහිත මහණ බමුණන් සහිත ප්‍රජාව ද දෙවියන් සහිත මිනිසුන් ද තමන් වහන්සේම මනා නුවණින් පසක් කොට දන්නා සේක. උන්වහන්සේ මුල කලණ මැද කලණ අග කලණ අර්ථවත් ව්‍යඤ්ජනවත් සාකල්‍යයෙන් පිරිපුන් පිරිසිදු බඹසර ප්‍රකාශ කරන සේක. මෙසේ තෙරණුවෝ බුදු ගුණ කථාවෙන් රජ කුලය

පහදවති. සය නගරයක මිනිසුන් බුදු සසුනෙහි අතිශයින් පැහැදියවුන් කළහ. එහෙයින්ම භාග්‍යවතුන් වහන්සේ මහණෙනි, මාගේ ශ්‍රාවක භික්ෂූන් අතර යම් මේ කාළුදායි නම් තෙර කෙනෙක් ඇද්ද හෙතෙම කුල ප්‍රසාදකයන් අතර අග්‍රයයි උන් වහන්සේ අග තැන තැබූහ.

ඒ ශාක්‍යයෝ අපගේ ඥාතිශ්‍රේෂ්ඨයා දකිමුයි රැස්ව සාකච්ඡා කළහ. භාග්‍යවතුන් වහන්සේ මහ පිරිවර ඇත්තාහ. විසි දහසක් බික්සඟුන් සහිත තථාගතයන් වහන්සේට කවර නම් තැනක වාසය පිණිස, විවෙකස්ථාන වන්නේද? නිග්‍රොධ ශාක්‍යයාගේ ආරාමය විවේකය. රමණීයයයි සලකා පිළිදැගුම් කටයුතු විධාන කළහ. ශාක්‍යයෝ නැවත මෙසේ ද සාකච්ඡා කළහ. සිද්ධාර්ථ කුමාරයා අපට වඩා ළා බාලය. අපගේ පුතකු මෙනි. අපගේ බාල මලණුවෝය. අපගේ බෑනණුවෝය. වෙනත් මහලු රජවරු ද උන්වහන්සේට වඳිති. අපට අපවාද ලැබිය හැකිය. මෙහිදී කෙසේ පිළිපැදිය යුතුද කියායි. එවිට ඇතැම් නිපුණ ශාක්‍යයෝ මෙසේ කීහ. අපි එක් උපායක් යොදමු. සියලු බාල දරුවන් ඉදිරියෙන් තබා ඔවුන් අතර අපි වඳින්නවුන් මෙන් පිටුපසින් රහසිගතව ඉඳගනිමු. එසේ කළ විට අප අතර කිසිවෙකුත් නොඳනිති. සුදුස්ස කළාහු වන්නෙමු. එය යහපතැයි සියල්ලෝම යොදුනක් පමණ මඟ සරසා ගිතෙල් මීපැණි ශර්කරා පාන ආදිය ද නොයෙක් ධජ පතාකා සහ දඬුවැට පහන් ආදිය ගෙන්වාගෙන යොදුනක් මඟට යැවූහ. ඔබලා බුදුන් පිරිවරා ගංතෙරට පැමිණෙව් කියායි. තුමූ නිග්‍රොධයන්ගේ උයනට ගොස් විසම තැන් සමකොට සියලු ප්‍රාසාද කුළුගෙවල් මණ්ඩප ශාලාදිය සරසා චතුජාති සුගන්ධ මිශ්‍ර නිල්ගොම ආලේප කොට ලඳපස්මල් විසුරුවා රෙදිවියන් බැඳ රත්තරුවලින් සරසා ගඳදාම කුසුමදාමයන් එල්වා රන්රිදීමුවා නන් වෙස් ධජ පහන් දරන්නවුන් සිටුවා හාත්පස පියුම් උපුල් මලින් පිරී පුන් කලස් තබා තොරණ ඔසවා ඇඟෑද නන් මලින් සරසා ගස්වල කඳ වෙළෙප් ද නන්වන් වතින් වෙළා උයන නඳුනුයන මෙන් කළහ.

උයන් සැරසිලි නිමවූ පසු සියල්ලෝ ම තම තමන්ගේ සම්පතට

අනුරූප අලංකාරයෙන් සැරසී බුදුන්ට පෙරගමන් කළහ. භාග්‍යවතුන් වහන්සේ ඤාති ශාක්‍ය දරුවන් පිරිවරා බබළමින් රෝහිණි ගංතෙරට පැමිණි සේක. ශාක්‍යයෝ භාග්‍යවතුන් වහන්සේටත් භික්ෂූන්ටත් එගොඩ වීමට නැව්සමූහයක් ගැට ගසා ගංතෙර තබා ගඟ මැද රුවන් මඩුවක් කරවා හාත්පසින් මල්දම් රන්දැල් ආදියෙන් වටකොට ධජ පතාකා ඔසවා සියල්ල තල්පතින් වට කොට මැද මහවටිනා රුවන් පයස්සංකයක් පැනවූහ. භාග්‍යවතුන් වහන්සේ මණ්ඩපය මැද රුවන් පලගෙයි වැඩ හුන්හ. භික්ෂුසංඝයා ද නැව් පහුරට ගොඩව හුන්හ. එවිට භාග්‍යවතුන් වහන්සේ උදයගිරි මුදුනෙහි හිරු මෙන් සවනක් රැස් විහිදුවමින් සියලු දන මන ඇදගනිමින් වඩා බැබළි සේක. මෙසේ උන්වහන්සේගේ නෑ සමූහයා ද කපිලවස්තු, දේවදහ, කෝලිය, සක්ඛර, සුප්පවාස, නේරඤ්ජර තුවරවල වැසි දෙයාසූ දහසක් රජවරු විවිධ වස්ත්‍රාභරණ ගන්ධ මාලාදියෙන් සැරසී ගන්නා ලද ඡත්‍ර ධජ පතාකා පුන්කලස් පහන් සෙමෙර ඇතිව බබළ බබළා බුදුන් දෙස බල බලා සිටියහ. එවිට භාග්‍යවතුන් වහන්සේ නැවෙන් බැස ගංතෙර උයනින් පිටත භික්ෂුසංඝයා සහිතව සිටි සේක. එම උයන බුදුන්ගේ රුසිරු සවනක් රසින් අතිශයින්ම සෝභමාන විය.

එකල්හි සුදොවුන් රජ නෑගණ පිරිවරා සියලු අලංකාරයෙන් සැරසුණු රූසිරිධර දහර දහර රාජ කුමාරවරුන් ඉදිරියෙන් තබා උන්වහන්සේ නිග්‍රොධාරාමයට වැඩම කරවූහ. ඉක්බිති තථාගතයන් වහන්සේ ඤාතිසමූහයාට තමන් වහන්සේගේ සියපින් ලකුණින් පිරි රූසිරි දක්වමින් මරකතමණි ගුහාවක් තුළට පිවිසෙන කේශර සිංහයෙකු මෙන් සෝභමානව නිග්‍රොධාරාමයට පිවිස විසි දහසක් රහතන් පිරිවරා පැනවූ උතුම් බුදු අසුනෙහි වැඩ හුන්හ. සුදොවුන් රජ ප්‍රමුඛ ශාක්‍ය රජවරු මානයෙන් තදව ඒ ශාක්‍ය රාජකුමාරවැන්න වදිද්දී බුදුන් නොවැඳම හිඳගත්හ. එවිට සර්ව්ඥයන් වහන්සේ පසැස් යොමා නෑ සමූහයා බලන සේක් චේතොපරිය ඤාණයෙන් ඔවුන් සිත් දත්හ. මේ මාගේ නෑයෝ තමන්ගේ මහලුකම සිතා ගෙන මට නොවඳිති. තමන්ගේ මෝඩ මහලුබව නොදනිති. දැන් ඔවුන්ට බුද්ධ බලය දක්වා සියල්ලන් ලවා මට වන්දවමි සිතූහ.

අනතුරුව දසබලයන් වහන්සේ අභිඥාපාදක සතර වන දැහැනට සමවැද එයින් නැගී අහස සිට දසදහසක් සක්වළ රුවනින් විසිතුරු කරන ලද රුවන් සක්මනක් මවා සියලු රජුන්ගේ හිස් මත සිරිපා දූලි වගුරුවන්නාක් මෙන් සක්මන් කළහ. එකෙණෙහිම ඔදාතකසිණ පාදක ධ්‍යානයට සමවැද දසදහසක් සක්වළ පතුරු වන්නාක් මෙන් මහත් නිර්මල ආලොක රැස් දහරාවක් මැවූහ. ඒ ආලොකයෙන් පොළොව පටන් අකනිටාව දක්වා ඒකාලෝක විය. දස දහසක් ලෝකාන්තරිකවල උපන් සත්තු උනුන් දුටහ. සියලු ලෝකවල දෙවිමිනිස් අසුර නාග සුපණ්ණ ගාන්ධර්ව කුම්භාණ්ඩ යක්ෂ පිසාචාදීන් සියල්ලන්ට නිර්මල සාර ආලෝකය ප්‍රත්‍යක්ෂ විය. එවිට දසදහසක් සක්වළ දෙවිගණා තුටු පහටුව උන් ඇමතූහ. නිදුක් වරුනි, එන්න, රැස් වන්න. අද තථාගතයාණෝ සිය ඥාතීන්ට අනුකම්පාවෙන් ලොකවිවරණ නම් පෙළහර සියයක් කරන්නාහ. අපිත් ඒ බුදුන් බලමුයි සතර අරූපසංඥී සත්ත්වයන් හැර සියලු දෙවියෝ ඔවුනොවුන්ගේ වදන් පිළිගෙන මේ සක්වළ ගැබට රැස්ව ලෝක නායකයාණන්ට සාධුකාර දුන්හ.

වශී ප්‍රාප්ත භාග්‍යවතුන් වහන්සේ චතුර්ථධ්‍යාන පාදක විකුර්වණ ඍද්ධියෙන් යුතුව එකෙක්ව බොහෝ වෙති. සැඟවෙති. ප්‍රකට වෙති. කාෂ්ට ප්‍රාකාර ශෛලයන්හි බාධා රහිතව ගමන් කරමින් චන්ද්‍ර සූර්‍යයන් පිරිමදිමින් ඍද්ධි වශයෙන් අනන්‍යසාධාරණව ගිනිදිය පැතිර වීමට සමත් යමකප්‍රාතිහාර්‍ය ඤාණයෙහි සිට ශාක්‍ය දමනය සඳහා යමාමහපෙළහර දැක්වූහ.

> යටිකයින් බොහෝ ජලය ද උඩු කයින් බොහෝ ගිනි ද බුදු බඳින් නැගී යුගල යුගල වේ. නිල් කහ, රතු, සුදු මදටිය පබසර රැස් දහරා අවට බොහෝසෙයින් දුවයි. ඔබ මොබ පැතිරෙයි. බොහේ වූ සවනක් රස් සියලු දිසාවන් බබළවයි.

භාග්‍යවතුන්වහන්සේ දසසහස්‍රී ලෝක ධාතුව පතුරුවා තැබූ රුවන් සක්මනෙහි සක්මන් කරමින් අතරක් නොදක්වති. සතර රියන් සක්මනක මෙන් සක්මන් කරති. සක්මන් කරන භාග්‍යවතුන්

වහන්සේ දෙකෙළවරට පත් කල්හි අතර තැනක් නැත්තේය. දුර සිටියත් ළංවී පැනෙති. සක්මනෙහි මුල මැද අග හැම තැන නිරන්තරව පැතිර සක්මන් කරන කල්හි එක් කෙනෙක්වම පැනෙති. යම්සේ ජව බල ඇති නිරොගි තරුණ උට්ඨානවීර්‍යය සම්පන්න ලබන ලද යෝග ඇති භික්‍ෂු නමක් සිව්රියන් සක්මනෙහි සක්මන් කරමින්ම වහ වහා හිඳිමින් නැගෙමින් සක්මන් කරන්නේ ද එමෙනි. බ්‍රහ්ම සමූහයා ද මනුෂ්‍යයෝ ද භාග්‍යවතුන් වහන්සේ සක්මන් කෙළවරින් සක්මන් කෙළවරට පැමිණෙනු දුටහ.

එවිට මහාප්‍රාඥ සිව්පිළිසිඹියාපත් සොළොස් වැදෑරුම් ප්‍රඥාවෙන් යුත් දම්සෙනෙවි සැරියුත් මහතෙරණුවෝ දිවැසින් සියලු පිරිස් බලා "මේ ඤාති සමාගමයෙහි උළාර ධම්දේශනාවක් සුදුසුය. බුදුගුණ වනාහි ගැඹුරු ද උදාර ද වෙයි. මම මෙතැනින් පන්සියයක් භික්‍ෂූන් ගෙන නොපැනී සැට යොදුන් රජගහ නුවරට ගොස් ගිජුකුළු පව්වෙහි සිට විකුර්වණ සෘද්ධි දක්වා භාග්‍යවතුන් වහන්සේ සක්මන් කරන තැනට අවුත් උන් වහන්සේගෙන් පාරමී ප්‍රශ්න විමසන්නෙමි නම් මැනවි. එවිට මහජනයාගේ ප්‍රසාදය මහත් වන්නේයයි සිතා නීලකසිණ පාදක චතුර්ත්‍ථ ධ්‍යානයට සමවැද ආදෘශ්‍යමාන කයින් භික්‍ෂූන් පන්සියයක් සමඟ ගිජුගුළු පව්වෙහි සිටියහ. එයින් කියන ලදි.

> මහාප්‍රඥා ඇති සමාධි ධ්‍යානයන්හි නිපුණ ශාරිපුත්‍රයන් වහන්සේ ගිජ්ඣකූටයෙහි සිටිමින්ම ලෝක නායකයන් වහන්සේ දකිති. සුපිපි ශාලරාජයෙකු මෙන් ද අහස්හි චන්ද්‍රයා මෙන් ද මධ්‍යාහ්න සූර්‍යයා මෙන් ද වූ නරොත්තමයන් වහන්සේ දකිති. ලොක නායකයන් වහන්ස, මහාවීරයන් වහන්ස. ඔබ වහන්සේගේ දසපාරමිතා කෙබඳු ද? එසේ විමසූ උන් වහන්සේට කරවීක නාද පතුරුවමින් විස්තර කළ සේක.

අතීත අනාගත වර්තමාන සියලු දහම් දන්නා ජනගණ පූජිත දිව්‍ය බ්‍රහ්ම සමූහයා පිරිවැරූ මහබඹහු විසින් පසස්නා ලද භාග්‍යවතුන් වහන්සේ පන්සියයක් භික්‍ෂූන් පිරුවැරූ පැනවතුන්ට

අග්‍ර බැවින් අග්‍රස්ථානයෙහි සිටිති, දම්සෙනෙවි සැරියුත් මහතෙරුන් වහන්සේ වීසින් විමසන ලද භාග්‍යවතුන් වහන්සේ

> ඒ ශාස්තෘන් වහන්සේගේ ශරීරය බ්‍රහ්මයාට බඳු සෘජුගාත්‍ර සටහන් ඇත්තේය. පිරුණු පිටුතලය සෝභමාන රන් පුවරුවක ආකාරයෙන් සම්පූර්ණය. පබළුවන් උතුම් ඇඟිලි පැහැපත්ය. මෘදු අත්තල තළුණ ද චක්‍ර ලක්ෂණ යුක්ත ද වෙයි. ග්‍රීවය වැළඳගත් රේඛා රන්රේඛා බඳුය. ඒ මහසෘෂීන් වහන්සේගේ හනු සලකුණු සිංහ රාජයෙකුගේ බඳුය. එල්බෙන කණීපාස මහාකතුරක් මෙනි. දෙකොපුල පිරිසිදු රන් කැඩපතක් මෙනි. ශාස්තෘන් වහන්සේගේ සොඳුරු දෙතොල ඉදුණු කෝවක්කා ගෙඩි බඳුය. උන් වහන්සේගේ සමසතලිස් දත් විදුරු පෙළක් බඳුය. උන්වහන්සේගේ දිව පබළුදලු වැනිය. පුළුල්ය. ශ්‍රීමත් සම්බුද්ධයන් වහන්සේගේ මෘදු නාසය මනාව පිහිටියේය. මුනිනයන නිළුපුල් පෙති මෙනි. මුනීන්ද්‍රයන් වහන්සේගේ දෙබැම නීල ධජ යුග්මයක් මෙනි. බැම අතරෙහි කාන්තිමත් ඌර්ණරෝමය ඔසටී තරුව මෙන් සුදුය. උන් වහන්සේගේ ලලාටය රන් තලාවක් බඳුය. කේස දක්ෂිණාවර්තය. සුනීලය, කුඤ්චිතය සෝභනය. ශාස්තෘන් වහන්සේගේ උණ්හීසය දිය බුබුලක් මෙන් බබළයි. හිස් පෙදෙස කේතු මාලාවෙන් වෙළී ඇත. කසාවත් පෙරවූ සුගන්ධවත් සිරුර රන් පර්වතයක් මෙනි. බ්‍යාමප්‍රභාවෙන් වට වූ ඒ උත්තමයන් වහන්සේ සෝභමාන සේක.

බෙබඳු රූසිරින් හොබනා භාග්‍යවතුන් වහන්සේ පිඬු පිණිස නගරයට පිවිසි බව දුටු මහජනයා ආශ්චර්‍ය්‍ය අද්භූත විස්මය පිරි සතුටට පත්වූහ. කිසිවෙක් ගොස් ආරාධනා නොකළහ. උන්-වහන්සේගේ අතින් පාත්‍රය නොගත්හ. භාග්‍යවතුන් වහන්සේ ඉන්‍ද්‍රකීලයෙහිම සිට "කිමෙක්ද පෙරබුදුවරු කුඩා නගරවල පිඬු පිණිස හැසිරෙමින් පිළිවෙළ කඩා අධිපති මිනිසුන්ගේ ගෙවලට වැඩියාහු ද? නැත්නම්. පිළිවෙළින් පිඬුසිඟා වැඩියහුදැයි සිතූහ. එක් බුදු

කෙනෙකුන්ගේවත් අපිළිවෙළ ගමනක් නොදැක දැන් මා විසිනුත් මේ ප්‍රවේණි ධර්මය ගත යුතුය. මත්තෙහි ද මාගේ ශ්‍රාවකයෝත් මා අනුව හික්මෙන්නාහු පිණ්ඩචර්‍යාව පුරන්නාහයි සිතා කෙළවරින් පිවිසි ගෙය පටන් සපදාන පිණ්ඩපාතයෙහි යෙදුණ සේක.

එවිට මහජනයා ආර්‍ය්‍ය සිද්ධාර්ථ කුමාරයෝ පිණ්ඩපාතයෙහි හැසිරෙති කියා මහල් ගෙවල සීමැදුරු කවුළු අරවා බැලීමෙහි නිරත වූහ. එවිට රාහුලමාතා දේවිය ආර්‍ය්‍ය පුත්‍රයෝ කෙස් රැවුළු බහා කසාවත් හැඳගෙනම පාත්‍රයක් අතින් ගෙන පිණ්ඩපාතයෙහි හැසිරෙති. ඇත්තෙන්ම ගැළපෙයි ද? නොගැළපෙයිදැයි සී මැදුරු-කවුළුව හැර බලන්නී සිංහවික්‍රාන්ත ගති ධිති විලාස සම්පන්නව සිංහයෙකු මෙන් විසිදහසක් භික්ෂූන් පිරුවැරූ අනෝපම ලීලාවෙන් යුතු සවනක් රසින් බබළන උන්වහන්සේ දුටුවාය. දැක හිස පටන් පාද තල තෙක් භාග්‍යවතුන් වහන්සේ පැසසුවාය. සිනිඳු සුනිල් මෘදු වක් කෙස් ඇති සූර්‍යාභා බඳු නිර්මල නළල්තල ඇති යුක්ත තුඟු මුදු දික් නාසයක් ඇති රන්සිජාලා පතුරුවන නරසිංහයන් වහන්සේ මෙආදි නරසීහ ගාථාවලින් ස්තුතිකොට වහා රජු වෙත ගොස් ඔබගේ පුතා පිඬු පිණිස හැසිරෙතැයි දැන්වූවාය.

එවිට රජ කලකිරීමට පත් සිතින් අතින් සළුව ඇඳ ඇඳ වහ වහා නික්ම වේගයෙන් ගොස් බුදුන් ළඟ සිට "ස්වාමීනි, අපට ලජ්ජා කරන්නේ කුමට ද? කුමක් සඳහා පිඬු පිණිස වඩින සේක් ද? ඇයි මට මෙතෙක් භික්ෂූන්ට දන් දිය නොහැකි ද? වංසයට නිදා නොකළ මැනවැයි කීය. මහරජ, මේ අපගේ චාරිත්‍රයයි. "ස්වාමීනි, අපගේ මහාසම්මත ක්ෂත්‍රිය වංශයයි. එහි එක ක්ෂත්‍රියයෙක් වත් සිඟා කෑවෙක් නම් නැත. මහරජ, ඔය වංශය අපගේ නම් වංශයක් නොවේ. අපගේ නම් දීපංකර, කොණ්ඩඤ්ඤ, සුමංගල, සුමන, රේවත, සොභිත, අනෝමදස්සි, පදුම, නාරද, පදුමුත්තර, සුමන, සුජාත, පියදස්සි, අත්‍ථදස්සි, ධම්මදස්සි, සිද්ධත්‍ථ, තිස්ස, ඵුස්ස. වෙස්සභූ, කකුසන්ධ, කොණාගමන, කස්සප බුදුවරු ද වෙනත් නොයෙක් ලක්ෂ ගණන්

බුදුවරු ද පිණ්ඩපාතයෙන් ජීවිකා කළහ. මේ බුදුවරුන්ගේ වංශයයි කියා ඇතුළු වීදියෙහි සිටම මේ ගාථාව වදාළ සේක.

> නැගී සිටුව, පමා නොවන්නේය. සුචරිත ධර්මයෙහි හැසිරෙන්නේය. ධර්මයෙහි හැසිරෙන තැනැත්තේ මෙලොවත් පරලොවත් සුවසේ සයනය කරන්නේය.

ගාථා අවසානයෙහි රජ සොවාන් ඵලයෙහි පිහිටියේය. ඉක්බිති දුටු දහම් ඇති පත් දහම් ඇති දත් දහම් ඇති කිමිදි දහම් ඇති කෙසේද කෙසේද යන විචිකිච්ඡා නැසූ පහවූ මද ඇති බුදු සසුනෙහි අපර ප්‍රත්‍යයවූ රජ භාග්‍යවතුන් වහන්සේගේ පාත්‍රය ගෙන බික් සඟුන් සහිත බුදුන් මහපහයට වැඩමවා ප්‍රණීත ආහාර පානයෙන් වැළඳවීය. වළඳා අවසානයෙහි අවුත් වැඳ සිටී පජාපති ගොතමී ප්‍රමුඛ මුළු අන්තඃපුරයට ධර්ම දේශනා කරමින් භාග්‍යවතුන් වහන්සේ

> සුචරිත ධර්මයෙහි හැසිරෙන්නේය. දුසිරිතෙහි නොහැසිරෙන්නේය. ධර්මයෙහි හැසිරෙන තැනැත්තේ මෙලොවත් පරලොවත් සුවසේ සයනය කරයි යනුවෙන් දම් දෙසූහ.

මහා පජාපතී ගෝතමිය සෝවාන් පෙලෙහි පිහිටියාය. රජ සකදාගාමී පෙලෙහි පිහිටියේය. ඉක්බිති රජ අන්තඃපුරස්ත්‍රීන් අතර රහල්මව නොදැක මාගේ ලේලිය රහල්මව දක්නට නැතැයි පනිවිඩකාර ගැහැනියක පිටත් කළේය. තෝ යව, මාගේ ලේලිය රහල්මවට බුදුන් මෙහි සිටන බව දැනුම් දෙව. ඒ ස්ත්‍රිය ඈ සමීපයට ගොස් ආයාචනා කෙනි, ඔබගේ මයිලණු මහරජ ඔබ කැඳවන්නාහයි සැල කළාය. අදම එහි වැඩහුන් භාග්‍යවතුන් වහන්සේ වදිනු මැනව. එයසා රහල්මව කම්පමාන හදින් කදුළු පිරි මුහුණින් මෙසේ කීවාය. ඉදින් මාගේ ගුණයක් ඇත්නම් ආර්‍ය්‍ය පුත්‍රයන් වහන්සේම මා වෙත වඩින සේක. වැඩි කලම වඳිමි කියා නොගියාය. පනිවිඩ කාරිය ගොස් රජුට එය සැලකළාය. එවිට භාග්‍යවතුන් වහන්සේට මෙසේ සිත්විය. යසෝධරා මට බොහෝ උපකාරවත්ය. මෙම සර්වඥතා ඥානය ඇය විසින් දෙන ලදැයි සිතා අසුනෙන් නැගිට පාත්‍රය රජු

අත තබා දැගසව්වන් සමඟ රහල් මවගේ මාලිගයට පිවිසෙන සේක් සැරියුත් මුගලන් දෙනමට මෙසේ වදාළහ. "රජදුව කැමති පරිදි වඳිද්දී කිසිවක් නොකියවයි වදාරා ඇගේ යහන් ගැබට පිවිස පැනවූ අස්නෙහි හුන්සේක. ඇය සැණින් පැමිණ භාග්‍යවතුන් වහන්සේගේ ගොප්මස අල්වා ගෙන සිරිපා මත හිස පෙරළ පෙරළා හඬ හඬා සිත් වූ පරිදි වැඳ වාඩි වූවාය.

එවිට රජ ලෙහෙලියගේ භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි ඇති සෙනෙහෙ බුහුමන් ආදි ගුණ සම්පත්තිය කීවේය. ස්වාමීනි, මේ මාගේ දියණිය ඔබ වහන්සේ කසාවත් හැඳි බැව් අසා එතැන් පටන් කහවත් හැඳීමට පටන් ගත්තාය. ඔබ වහන්සේ එක් වේලක් වළඳන බැව් අසා එක් වේලක ආහාර ගත්තාය. ඔබ වහන්සේ මහ යහන් හළ බව අසා මැටි ඇඳෙහි නිදාගත්තාය. මලින් ගඳින් වෙන් වූ බව අසා මලින් ගඳින් වැළකුණාය. සිය නෑයෝ අපි ඔබ පෝෂණය කරන්නෙමුයි පනිවිඩ එවූ කල්හි බෙහෙවින් ශෝක වී එක නෑයෙකු දෙසත් නොබැලුවාය. මාගේ දියණිය මෙසේ ගුණ සම්පන්න යයි කීවේය. එවිට තුන් කල් පවත් දන්නා භාග්‍යවතුන් වහන්සේ ඇගේ ශෝකදාහ ධම් දේශනා නැමැති සුපිරිසිදු දහම් ජලයෙන් නිවමින් මහරජ පුදුමයක් නොවේ. දැන් ඔබ විසින් රකිනු ලබන මුහු කළ නුවණ ඇති රජ දුව තමන් ආරක්ෂා වන්නීය. ඕතොමෝ පෙර ආරක්ෂාවක් නැතිව පර්වත ප්‍රාන්තවල හැසිරෙමින් නොමේරූ නුවණ ඇතිවත් ආරක්ෂා වීයයි චන්දකින්නර ජාතකය දේශනා කළහ. දේශනාවසානයෙහි රාහුලමාතා දේවිය සෝවාන් වූවාය. හද සෝ නිවී ගියේය. භාග්‍යවතුන් වහන්සේ යසොධරා දේවියගේ සෝදුක් දුරුකර භික්ෂූන් සමඟ නිග්‍රොධාරාමයට වැඩි සේක.

තුන් වන දින නඳ කුමරුගේ අභිෂේක, ගෘහ ප්‍රවේශ, විවාහ මංගල තිබෙද්දී ඔහුගේ ගෙට වැඩ කුමරු පැවිදි කරනු කැමැතිව පාත්‍රය අතට දී ආසිරි පවසා වැඩි සේක. එවිට කුමරුගේ පත්නි ජනපද කල්‍යාණි බුදුන් අනුව යන කුමරු දැක වහා එන්නැයි කියා ගෙල දිගු කොට බැලුවාය. ඔහු ද පාත්‍රය ගනු මැනවයි බුදුන්ට කිව

නොහැකිව විහාරයටම ගියේය. ඔහුගේ කැමැත්තක් නැතිවම භාග්‍ය වතුන් වහන්සේ ඔහු පැවිදි කළහ. උන් වහන්සේ මෙසේ කිඹුල්වත් පුරයට පැමිණි තෙවන දිනයෙහිම නන්ද පැවිදි කරවූහ. සත්වනදා රාහුලමාතා දේවිය රාහුල කුමරු සරසා විවෘත සීමැදුරු කවුළුව ළඟ සිටියාය. එකල ලෝක හිතදායක නිකෙලෙස් බුදුහු පිණ්ඩපාත වේලාවෙහි විසිදහසක් භික්ෂූන් පිරිවරා අනුපම බුදුසිරින් කිඹුල්වත පිඬු පිණිස වැඩියහ. දේවිය අනුපමරූසිරින් බබළන උන්වහන්සේ දුරදීම දැක රාහුල ප්‍රියපුතුට දරුව, බලන්න. විසිදහසක් පිරිවැරූ රන්වන් බඹහු වන් මහාශ්‍රමණයන් බලන්න. ඒ ඔබගේ පියාණෙන්ය. උන් වහන්සේට මහානිධන්සැළි තිබුණේය. ගිය තැන් පටන් කිසිවක් දක්නට නැත. පුත, යන්න. දායාද ඉල්ලන්න. දායාද ධනය ලැබ සක්විති රජ වන්නැයි කීවාය. කුමරා මම දායාද ලබා අභිෂේකයට පත්ව සක්විති වෙමි සිතා මවට වැඳ සපිරිවරින් පහයෙන් බැස බුදුන් කරා ගොස් රැස්දැල් සමූහයෙන් පැතුරුණු සිරුරින් මහාශ්‍රමණය, ඔබගේ සෙවණැල්ල සිසිල්ය. ඔබගේ සෙවණැල්ල සුවදායකයයි කියා තවත් තමාගේ ළඳරු කමට යුතු වදන් තෙපලමින් බුදුන් පසු පස ගියේය. රජමැදුරෙහි දන් වැළඳූ භාග්‍යවතුන් වහන්සේ අනුමෝදනා කොට වැඩියේක. බුදුන් පසුපස ගමන් කළ කුමරා ද මහාශ්‍රමණයිනි, මට දායාද දුන මැනව. මට ධනයෙන් වැඩ තිබේ. මට ධනය දුන මැනව. පියා සතු ධනයෙහි ස්වාමියා පුත්‍රයායි කිය කියා ගියේය.

උන් වහන්සේ කුමරු නොවැළක්වූහ. සමඟ යන ඔහු නැවැත්වීමට පිරිවර ජනයාට ද නොහැකි විය. ඔහු තථාගතයන් වහන්සේ සමඟ ආරාමයටම ගියේය. භාග්‍යවතුන් වහන්සේ මෙසේ සිතූහ. මේ රාහුල පියා සතු ධනයම ඉල්වයි. ඒ ධනය බාලයන් විසින් අනුමත වූවකි. උවදුරු සහිතය. නිවන් පිණිස විරාගය පිණිස නිරෝධය උපසමය අභිඥාව සම්බෝධය පිණිස හේතු නොවේ. එය රජවරු ද ගනිති. සොරු සොරකම් කරති. ගින්න දවයි. ජලය පා කරයි. අප්‍රියයෝ ගනිති. ඒ ධනය නිසාම කයින් දුසිරිත් කරති. ඒ ධනය නිසාම තණ්හාව වැඩේ. තණ්හාව නිසා සොයයි. සෙවීම

නිසා රැස් කරයි. රැස්කිරීම නිසා ඡන්දරාගය ඇතිවේ. ඡන්දරාගය නිසා එහි ගිලෙයි. ගිලීම නිසා වැළඳගනී. වැළඳ ගැනීම නිසා මසුරු වෙයි. මසුරුකම නිසා ආරක්ෂා කරයි. ආරක්ෂා හේතුවෙන් දණ්ඩන සථිටන කලහ විවාද විග්‍රහ තෝ තෝ යනු ද කේලාම් ආදි නොයෙක් අකුසලධම් පහළ වෙයි. මම දැන් මොහුට බෝමැඩදී ලබන ලද සද්ධාධන, සීල, හිරි, ඔත්තප්ප, සුත, චාග, පඤ්ඤා යන සත්විධ ආය්‍ය ධන දෙමියි කියායි.

ශ්‍රද්ධා ධනයෙන් වනාහි අශ්‍රද්ධා දිළිඳුකම දුරුකරයි. සීල ධනයෙන් දුශ්චරිත දිළිඳුකම දුරලයි. හිරි ධනයෙන් අහිරික දිළිඳුකම දුරු කරයි. ඔත්තප්ප ධනයෙන් අනොත්තප්ප දිළිඳුකම දුරු කරයි. සුත ධනයෙන් විචිකිච්ඡා දිළිඳුකම දුරු කරයි. චාග ධනයෙන් මසුරු දිළිඳුකම දුරු කරයි. ප්‍රඥා ධනයෙන් මෝහ දිළිඳුකම දුරුක රයි. රජවරු නොගනිති. සොරු සොරකම් නොකරති. ගින්න නොදවයි. ජලය නොපාකරයි. අප්‍රියයෝ නොගනිති. ඒකාන්ත කලකිරීම විරාගය නිරොධය උපසමය අභිඥාව සම්බෝධය නිර්වාණය සඳහා පවතියි. සියලු බුදුවරුන් විසින් සමධිගත සප්තාය්‍ය ධනය රාහුලට දී ලෝකෝත්තර දායාදයට ස්වාමියෙකු කරමියි සිතා සැරියුත් තෙරුන් අමතා සාරිපුත්‍රය, ඔබ රාහුල කුමරු පැවිදි කරන්න. තථාගතයන්ගේ දායාද දෙන්නැයි වදාළහ. සැරියුත් තෙරුන් වහන්සේ බුදුන් හමුයෙහිම රහල් කුමරු පැවිදි කරවූහ. උන් වහන්සේ පැවිදි කරවූ කල මුළු නුවර කැළඹුණේය. රාහුලමාතා දේවිය එපවත් අසා හද බිඳුණාක් මෙන් දැඩිතර සොවින් මහහඬින් හැඬුවාය. මුළු රජ මාලිගය මහ කුනාටුවකින් කැළඹී සමුදුරු ගොස මෙන් ඒකරාව විය. එවිට සුදොවුන් රජ පුත් මුණුබුරු වියෝ සෝදුක් දරා ගත නොහැකිව වහ වහා භාග්‍යවතුන් වහන්සේ වෙත ගොස් පසඟ පිහිටුවා වැඳ ඇදිලි බැඳ මෙසේ කීය. ස්වාමීනි, එක් වරයක් ඉල්ලා සිටිමි. රජතුමනි, තථාගතයන් වහන්සේලා ඉක්මවූ වර ඇත්තෝ වෙති. යම් කැප වූවක් ස්වාමීනි, යම් නිරවද්‍යයක් මට කියනු මැනව. භාග්‍යවතුන් වහන්සේ පැවිදිවූ කල්හි මට අනල්ප දුකක් ඇති විය.

නන්ද පැවිදි වූ කල ඊට වැඩි දුක් ඇති විය. ස්වාමීනි, රාහුල කෙරෙහි ඇති පුත්‍ර ප්‍රේමය සිවිය ද ඇට ද සිඳ ඇටමිදුලුවල හැපී සිටියේය. ස්වාමීනි, මම යම්තාක් බුද්ධ මාමක ධම්ම මාමක සංඝ මාමක වෙම් ද එහෙත් සිය පියා විසින් පුතුන් පැවිදි කරනු ලබද්දී ඥාති වියෝග දුක ඉවසිය නොහැක්කෙමි. අන්‍ය ජනයා පුත් මුනුබුරන් පැවිදි කරන කල්හි කෙසේ දුක ඉවසත්ද? ස්වාමීනි, මවුපියන් විසින් නොඅනුදන්නා ලද දූ පුතුන් පැවිදි නොකළ හොත් මැනවි කියායි.

බුදුහු රජුට ඒ වරය දී දැහැමිකතා කොට පිටත් කළහ. ඔහු ගිය පසු භික්ෂූන් රැස් කරවා මවුපියන් විසින් නොඅනුදත් දූ පුතුන් පැවිදි නොකළ යුතුයයි ශික්ෂාපද පැනවූහ. නැවත දිනක් භාග්‍යවත් බුදුහු පෙරවරු හැඳ පෙරව පාසිවුරු ගෙන බික්සඟුන් සමඟ රජ මාලිගයෙහි දානයට වැඩ පැනවූ අසුන්හි හුන්හ. සිහිල ගත් රජ පසෙක හිඳ භාග්‍යවතුන් වහන්සේ සමඟ පිළිසඳරෙහි යෙදෙමින් ඔබ වහන්සේ ප්‍රධන් වියර්‍යය වඩන කල්හි මා වෙත ආ දෙවියෙක් මහරජ, ඔබගේ පුත් කලුරිය කළේ යයි කීය. එවිට මම ඔහුගෙන් මපුත් බුදුවී මළේ ද නැද්දැයි ඇසීමි. බුදු වීමට නොහැකි විය. ප්‍රධන් භූමියෙහි වැටී මළේ යයි කීය. මම ඔහුගේ බස් නො අදහමින් ම පුත් නොබුදුව නොමැරෙයි කියා එය ප්‍රතික්ෂේප කළෙමි. මෙසේ කී කල තථාගතයන් වහන්සේ මහරජ, දැන් ඔබ කෙසේ අදහන්නෙහි ද? නො බුදු කල්හි ද එක් ඇටයක් පෙන්වා ඔබ පුත් මළේයයි කී කල්හි නො ඇදහීයයි මේ කරුණ මුල් කොට මහාධම්පාල ජාතකය වදාළහ. ගාථාවසානයෙහි රජ, කාමරාග ව්‍යාපාද කෙලෙස් රැශිය නසා අනාගාමී ඵලයෙහි පිහිටියේය. මෙසේ සුදොවුන් රජ තුන් ඵලයෙහි පිහිටුවා භික්ෂූන් පිරිවැරූ බුදුහු යළිත් රජගහ නුවරට වැඩ එහි වස් වීසූහ.

උන්වහන්සේ පළමු වස බරණැස ද දෙවැනි වස රජගහ නුවර ද, වස් වීසූහ. තුන් වෙනි සතර වෙනි වස් ද රජගහ නුවර වසා පස් වැන්න වේසාලියෙහි ද සවැන්න මකුල පර්වතයෙහි ද සත් වැන්න තව්තිසාවෙහි ද අට වැන්න භේසකලා වනයෙහි ද නව

වැන්න කොසම්බියෙහි ද දස වැන්න පාරිලෙය්‍ය වනයෙහි ද එකොළොස් වැන්න චෙතිය පර්වතයෙහි ද දොළොස් වැන්න වේරඤ්ජාවෙහි ද විසූහ. තෙලෙස් වැන්න නැවතත් භේසකලා වනයෙහිමය. තුදුස් වැන්න සැවතෙහිය. පසළොස් වැන්න කපිලවස්තුවෙහිය. සොළොස් වැන්න ආලවියෙහි ද සතලොස් වැන්න අටළොස් වැන්න එකුන්විසි වැන්න සහ විසි වැන්න රජගහ නුවරමය. එක්විසි වන වස නැවත චාලිය පර්වතයෙහිය. දෙවිසි වැන්න හෙසකලා වනයෙහිය. තෙවිසි සූවිසි පස්විසි වස් භාග්‍යවතුන් වහන්සේ සැවැතෙහි විසූහ. සවිසි වැන්න චේතිය පර්වතයෙහිය. සත්විසි අටවිසි වස් කිඹුල්වත නිග්‍රොධාරාමයෙහිය. එකුන් තිස්වන වර්ෂයෙහි ද පශ්චිම වස බේලුව ගාමයෙහි විසූහ. සියලු පන්සාලිස් වස සදහම් සක්විති රාජ්‍යය කොට ධර්මරාජ භාග්‍යවතුන් වහන්සේ කුසිනාරාවෙහි යමක සල්ගස් අතර අනුපධිශෙෂ නිර්වාණ ධාතුවෙන් පිරිනිවියහ.

එහි මේ පිරිනිවන් කථාවයි. භාග්‍යවතුන් වහන්සේ වේශාලියට නොදුරු බෙළුව ගම වසද්දී වැසි සමය ආසන්න වූයෙන් භික්ෂූන් අමතා "මහණෙනි, ඔබලා විශාලාව අවට පහසු පරිදි මිතුරන් හිතවතුන් ඇසුරෙහි වස් සමාදන් වව්. මම මේ බෙළුව ගම්හි වස් වසමියි වදාළහ. කුමක් හෙයින් භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළහු ද? භික්ෂූන්ගේ පහසු විහරණය සඳහාය. උන්වහන්සේලාට බේළුව ගමෙහි සෙනසුන් ප්‍රමාණවත් නොවේ. භික්ෂා කඩවීම් ද විය හැකිය. විශාලාව අවට බොහෝ සෙනසුන් ඇත. දානය ද සුලභය. එහෙයින් බුදුහු මෙසේ වදාළහ. එසේ නම් කුමක් හෙයින් උන් වහන්සේ පහසු පරිදි යන්නැයි පිටත් කළ සේක් ද? ඒ භික්ෂූන්ට අනුකම්පාව නිසාය. උන් වහන්සේට මෙසේ සිතිණ. මම දසමසක් පමණ සිට පිරිනිවෙමි. ඉදින් මොවුන් දුර ගිය හොත් පිරිනිවන් සමයෙහි මා දැකීමට නොලබනු ඇත. වේශාලිය අවට වාසය කළ හොත් මසකට අට වරක් පැමිණ බණ අසති. එබැවින් දුරට පිටත් නොකළහ. භික්ෂූහු ද බුද්ධ වචනයට අනුව විශාලාව අවට වස් විසූහ. බුදුහු විශාලාවෙහි වස් විසූහ. වස් විසූ භාග්‍යවතුන් වහන්සේට දරුණු

ආබාධයක් ඇතිවිය. විශාල විශාල වශයෙන් වේදනා පහළවෙයි. මාරාන්තික වේදනා උපදී. භාග්‍යවතුන් වහන්සේ සිහියෙන් නුවණින් නොපෙළෙමින් ඉවසාගත් සේක. ඒත් උන්වහන්සේට මෙසේ සිතිණ. ඉදින් මම භික්ෂූන්ට කථා නොකොට උපස්ථායකයන්ට නොදන්වා පිරිනිවෙම් නම් එය මට නොගැළපෙයි. ඉදින් මම මේ ආබාධය වීර්‍යයෙන් මැඩ ගෙන ජීවිත සංස්කාරය අධිෂ්ඨාන කොට වාසය කළෙම් නම් මැනවි කියායි. උන්වහන්සේ වීර්‍යයෙන් ආබාධය යටපත් කොටගෙන ජීවිත සංස්කාර අදිටන් කොට ගෙන වැසූහ. උන්වහන්සේගේ ආබාධය සන්සිඳිණ.

ලෙඩින් නැගි සිටි භාග්‍යවතුන් වහන්සේ නැගී සිටි කීප දවසකින් විහාර සෙවණැල්ලෙහි පැනවූ අසුනෙහි වැඩ හුන් සේක. එවිට ආනන්ද තෙරණුවෝ උන්වහන්සේ වෙත පැමිණ වැඳ පසෙක හිඳ "ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේගේ ඉවසීම දුටුවෙමි. ස්වාමීනි, මාගේ ශරීරය ගල් වුණාක් වගේ පැත්ත පෙනුනේත් නැහැ. ධර්මය ද අමතකයි. භාග්‍යවතුන් වහන්සේගේ ගිලන්බව නිසා එසේ වුවත් එක් සැනසීමක් විය. භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් අරභයා තවම කිසිවක් වදාළේ නැත. එහෙයින් දැන්ම පිරිනිවන් නොපාන සේකැ"යි සිතීමි කියා පැවසූහ. ආනන්ද, තථාගතයන් වහන්සේ භික්ෂූන් අරභයා කුමක් කියන සේක් ද? ආනන්ද, මා දැන් මහලුයි. වෘද්ධයි. වයස්ගතයි, මම දැන් අසූවස් වෙමි. උණ පතුරුවලින් පිළිරයම් කළ දිරාපත් කරත්තයක් පවත්වන්නාක් මෙන් පවත්වන්නෙමි කියා වදාළ සේක. උන්වහන්සේ වස් පවරා බේළුව ගමෙන් පිටත්ව සැවතට යමුයි මහත් භික්ෂු සංඝයා සමඟ සැවතට වැඩ දෙව්රම්හි වසන සේක.

එහි දී දම්සෙනවි සැරියුත් තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට වතාවත් කොට දිවා ස්ථානයට ගොස් හැමද පා සෝදා සම්කඩ අතුරා එල සමවතට සමවන්හ. එල සමවතින් නැගිටි උන්වහන්සේට, පළමුව තථාගතයන් වහන්සේ පිරිනිවෙන සේක් ද නැතහොත් අග්‍ර ශ්‍රාවකයන් දැයි යන විතර්කය ඇතිවිය. එවිට පළමුව අග්‍රශ්‍රාවකයන් බව දැන සිය ආයු සංස්කාරය බලන්නේ මින් පසු සත් දිනක්ම

පමණක් සිය ආයු සංස්කාරය පවතීයයි දැන රාහුල තෙරහු තව්තිසා වෙහි පිරිනිවියහ. අඤ්ඤාකොණ්ඩඤ්ඤ තෙරහු ඡද්දන්ත විලෙහි පිරිනිවියහ. මම කොහි පිරිනිවෙම්දැයි නැවත නැවත සිතන්නේ මෑණියන් සිහි විය. මාගේ මෑණි ශාරි බ්‍රාහ්මණිය රහතන්ම සත් නමකගේ මෑණියෝය. මාගේ ද සෝණ, රේවත, උප්පසේන, පාලා, උපපාලා, තිස්සූපපාලා සොහොයුරියන් තිදෙනාගේ ද මෑණියෝය. මෙසේ රහත්ම සත්නමකගේ මෑණි වූ අප මෑණියෝ බුද්ධ ධම්ම සංඝ රත්නත්‍රයෙහි නොපහන්ව මිථ්‍යාදෘෂ්ටි රියෙන් සසර තරණය කරනු කැමැත්තීය. ඇගේ උපනිශ්‍රය සම්පත්තියක් ඇද්දැයි බලන්නාහු කළයක් තුළ දැල්වෙන පහන් සිලක් මෙන් හද තුළ පවත්නා සෝවාන් ඵලයට හේතු වාසනා දැක කාගේ දේශනාවකින් ධර්මය අවබෝධ වේදැයි බලන සේක් තමන් වහන්සේගේ දේශනාවෙන් බව දැක ඉඳින් මා පමා වුවහොත් සැරියුත් තෙරහු සෙසු බොහෝ දෙනාට අවශ්‍ය වෙති. එසේම සමචිත්ත සූත්‍ර දේශනාවෙහි කෙළලක්ෂයක් දෙවියෝ රහත් වූහ. තුන් මඟට පිළිපන්නවුන්ගේ ගණනක් නැත. වෙනත් තැන් වල බොහෝ දෙනා ධර්මය අවබෝධ කළහ. අසූ කුල දහසක් උන්වහන්සේ කෙරහි සිත පහදවා ස්වර්ගයෙහි උපන්හ. තුන් වෙනි ආත්ම භාවයෙහි මවු බවට පත්වූවන් ප්‍රේත භාවයෙන් මිදවූහ. එහෙත් දැන් උන්වහන්සේ මේ ආත්ම භාවයෙහි මෑණියන් මිථ්‍යා දෘෂ්ටි මාත්‍රයෙන් වත් අත්හරවන්නට අසමත් වූහයි කියන්නෝ වෙති.

එහෙයින් මම මෑණියන් මිසදිටුවෙන් මුදා සෝවාන් බවට පමුණුවා සිය උපන් කුටියහිදීම පිරිනිවෙම් කියා සනිටුහන් කොට අදම භාග්‍යවතුන් වහන්සේගෙන් අනුදැන පිටත් වෙමියි චුන්ද තෙරුන් ඇමතූහ. චුන්ද ආයුෂ්මතුනි, අපගේ පන්සියයක් පිරිවර භික්ෂූන්ට ඇවැත්නි, පාසිවුරු ගනු මැනව. සැරියුත් තෙරණුවෝ නාලක ගමට වඩිනු කැමැති වෙති කියා දැනුම් දෙන්නැයි කීහ. චුන්ද තෙර එසේ කළේය. භික්ෂූහු සෙනසුන් අසුරා පාසිවුරු ගෙන තෙරුන් වෙත ආහ. තෙරණුවෝ පිරිවරින් බුදුන් වෙත පැමිණ පසඟ පිහිටුවා වැඳ ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ මට අනුදැන

වදාරන සේක්වා. සුගතයන් වහන්සේ මට අනුදැන වදාරන සේක්වා. මට පිරිනිවීමට කාලයයි. මාගේ ආයුසංස්කාරය අවසන් කළෙමි කියා සැලකළහ. සාරිපුත්ත, එසේ නම් පිරිනිවෙනුයේ කොහිදැයි විමසූහ. ස්වාමීනි, මගධයෙහි නාලක ගම උපන් ගෙය තිබේ. මම එහි පිරිනිවෙමියි කීහ. සාරිපුත්ත, කල් දනුවයි වදාළහ. දැන් මෙතැන් පටන් සාරිපුත්ත, ඔබගේ බාල සොහොයුරන්ට ඔබ වැන්නකුගේ දර්ශනය නොලැබෙනු ඇත. ඔවුන්ට දහම් දෙසන්නැයි වදාළහ. තෙරණුවෝ ශාස්තෘන් වහන්සේ මාගේ සෘද්ධි විකුර්වණ පෙරටු කොට දැන් ධර්මදේශනා කැමැති වෙතියි දැන බුදුන් වැඳ තල් ගසක් පමණ අහසට පැන නැගී නැවත බැස බුදුන් වැඳ මේ ක්‍රමයෙන් සත්තල් ගසක් පමණ උඩ අහසෙහි සිට විකුර්වණ සෘද්ධි දක්වා අනිත්‍යතා ප්‍රතිසංයුක්ත දහම් දෙසූහ. දේශනාවසානයෙහි අහසින් බැස බුදුන් වැඳ ස්වාමීනි, මට යාමට වේලාවයයි සැලකළහ. භාග්‍යවතුන් වහන්සේ ධර්මාසනයෙන් නැගිට ගඳකිළියට වැඩ මිණිපලඟෙහි වැඩහුන්හ. තෙරණුවෝ තෙවරක් පැදකුණු කොට සතර තැනක වැඳ "ස්වාමීනී, මෙයින් එකාසංඛ්‍ය කප් ලක්ෂයකට මතු අනෝමදස්සි බුදුසිරිපා මූල වැතිර ඔබ වහන්සේ දැකීමට ප්‍රාර්ථනා කළෙමි. මාගේ ඒ ප්‍රාර්ථනය සමෘද්ධ විය. මේ අවසන් දැකීමයි කියා සැලකළහ.

> මහාමුනි ලෝක නායකයන් වහන්ස, ඇසුර දැන් සිඳී ගියේය.
> මින් මතු ගමනාගමනයක් නැත. මේ අන්තිම වන්දනාවයි.
> ස්වාමීනි, මාගේ ජීවිතය ස්වල්පය. සතියක් ඇවෑමෙන් බර
> බහා තබන්නාක් මෙන් මේ සසරින් නික්ම යමි.

නැවත ඔබ වහන්සේගේ දැකීමත් නැතැයි කියා දසනඛ සමෝධාන අංජලියෙන් පෙනෙන තාක් දුර බුදුන් දෙස බලාගෙනම ගොස් මෙතැන් පටන් ඔබ වහන්සේගේ පිහිට පතා කිසිම තැනක ගමනාගමනයක් නැතැයි කියා වැඳ පිටත්ව ගියහ. එකෙණෙහි ජලපොළොව කෙළවර කොට ඇති මහපොළොව කම්පා විය. භාග්‍යවතුන් වහන්සේ තෙරුන් පිටත් කොට යවද්දීම පිරිවරා සිටි භික්ෂූන්ට මහණෙනි, වැඩිමහල් සොහොයුරන්ට පසුගමන් කරන්නැයි

වදාළහ. භික්ෂූහු ගම් දොරටුව තෙක් පසුගමන් කළහ. එහිදී තෙරුන් වහන්සේ ඇවැත්නි, ඔබලා නවතින්න. භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි නොපමාවනු මැනවයි භික්ෂූ සංඝයා ආපසු යවා සිය පිරිස සමඟ පිටත් වූහ. උන්වහන්සේ අතර මඟ මහජනයාට සතියක් අනුග්‍රහ කරමින් සවස නාලක ගමට පැමිණ ගම් දොර නුග රුකක් මුල සිටියහ.

එවිට උපරේවත නම් වූ තෙරුන්ගේ බෑනතෙම ගමෙන් පිටත යන්නේ තෙරුන් දැක වැඳ සිටියේය. තෙරුන් වහන්සේ ඔහුගෙන් මෑණියන් ගෙදර දැයි ඇසූහ. එසේය ස්වාමීනි. එසේ නම් ඔබ ගොස් අප ආ බව දන්වන්න. කුමට අවාහුදැයි ඇසුව හොත් අද එක රාත්‍රියට ඇතුළු ගමෙහි වසති. උපන් කුටිය පිළියෙළ කරන්න. පන්සියයක් භික්ෂූන්ට ද වසන තැන් දෙන්නැයි කියන්න. ඔහු වහා ගොස් ආර්යාවෙනි, මයිලණුවෝ පැමිණියහයි කීය. දැන් කොහි ද? ගම් දොරටුවෙහිය. තනියම ද තවත් කවුරු හෝ ඇද්ද? පන්සියයක් භික්ෂූහු සිටිති. කුමකට ආවහු ද? ඔහු එපවත් දැන්වීය. මෑණියෝ "කිමෙක් ද? කුමකට එතරම් වසන තැන් පිළියෙළ කරවන්නාහු ද උපැවිදිවනු කැමැතිව ද? බාලකාලයෙහි පැවිදිව මහලු කාලයෙහි ගිහිවනු කැමැති වීදැයි සිතා වසන තැන් පිළියෙළ කරවා දඬුවැට පහන් දල්වා තෙරුන්ට යැව්වාය.

තෙරණුවෝ භික්ෂූන් සමඟ ගෙට වැඩ උපන් කුටියට පිවිස හිඳගත්හ. හිඳ භික්ෂූන් වසන තැන්වලට පිටත් කරවූහ. උන්වහන්සේලා ගිය පසු තෙරුන්ට දරුණු ආබාධයක් ඇතිවිය. ලෝහිත පක්ඛන්දිකා රෝගයෙන් මාරාන්තික වේදනා ඇතිවිය. එක් භාජනයක් බැහැර කරයි. එක් භාජනයක් ඇතුල් කරයි. එවිට මපුතුන්ගේ තත්ත්වය මාගේ සිත් නොගනීයයි මව දොරකඩට වී සිටියාය. එවේලෙහි ලෝක පාලයෝ සතර දෙන සැරියුත් තෙරණුවෝ නාලක ගම උපන් කුටියෙහි පිරිනිවන් ඇඳෙහි සිටිති. පශ්චිම දර්ශනයට යමු කියා රාත්‍රියෙහිම ගොස් තෙරුන් වැඳ මුළු ගෘහය බබුළුවමින් සිටියාහ. තෙරුන් වහන්සේ ඔබලා කවරහු ද? කුමට ආවහුදැයි ඇසූහ.

ස්වාමීනි, අපි ලෝක පාලයෝ සතරදෙන වෙමු. ගිලන් උවටැනට ආවෙමුයි කීහ. වේවා, මට උපසථායකයෝ සිටති. තෙපි යව් කියා පිටත් කළහ. ඔවුන් ගිය පසු සක් දෙව් රජ පැමිණියේය. ඔහු ගිය පසු මහබඹු පැමිණියේ ය. තෙරුන් වහන්සේ එසේම ඔවුන් පිටත් කළහ. එකල්හි සාරි බැමිණිය ඔවුන්ගේ පැමිණීම දැක විස්මය පත්ව මපුතුන් වෙත පැමිණි මොවුහු කවරහුදැයි තෙරුන්ගේ දොර ළඟට ගොස් චුන්ද පුත්‍රයෙනි, තොරතුරු කෙසේදැයි විමසුවාය.

උන්වහන්සේ එපවත් පවසා ස්වාමීනි, මහාඋපාසිකාව පැමිණියායයි තෙරුන්ට සැලකළහ. එසේ නම් ඇතුළට කැඳවන්න. ඕතොමෝ කාමරයට ඇතුල්ව උන්වහන්සේ ළඟ සිටගත්තාය. තෙරුන් වහන්සේ මහෝපාසිකාවෙනි, කුමට අවේලාවෙහි පැමිණියෙහි දැයි ඇසූහ. පුතේ, ඔබ බලන්නට යැයි කියා දරුව, පළමුවෙන් කවරෙක් ආවාහු දැයි විමසුවාය. උපාසිකාවෙනි, සතරවරම් රජහුයයි තෙරුන් වහන්සේ කීහ. ඒ සතරවරම් රජවරුන්ටත් වඩා ඔබ මහත් දැයි ඇසුවාය. උපාසිකාවෙනි, ආරාමිකයන් මෙන් ඔවුහු ශාස්තෘන් වහන්සේගේ ප්‍රතිසත්ථියෙහි පටන් කඩුගත් අත් ඇතිව උන්වහන්සේට රැකවරණ සැලසුවාහුය. දරුව, ඔවුන් ගිය පසු කවරෙක් පැමිණියෙහි ද? සක් දෙව් රජය. සක්දෙව් රජුටත් වඩා ඔබලා මහත් ද? උපාසිකාවෙනි, මොහු බඩුගත් සාමණේර කෙනෙකු මෙන් අපගේ ශාස්තෘන් වහන්සේ තව්තිසාවෙන් බස්නාවේලෙහි පාසිවුරු ගෙන බැස්සේය. දරුව, ඔහු ගිය පසු බබළන පැහැයෙන් පෙදෙස බබුළුවාගෙන කවරෙක් ආවහු ද? උපාසිකාවෙනි, ඒ ඔබගේ ශාස්තෘ වූ මහාබ්‍රහ්මයායි. අපගේ ශාස්තෘ මහාබ්‍රහ්මයාටත් වඩා ඔබ මහත් ද? එසේය උපාසිකාවෙනි, අපගේ ශාස්තෘන් වහන්සේ උපන් දවසෙහි මේ මහාබ්‍රහ්මතෙම දෙව් සේසත් දැරීය කීහ.

එවිට බැමිණිය "මපුතුන්ගේ ආනුභාවය මෙසේ නම් ම පුතුන්ගේ ශාස්තෘන් වහන්සේගේ ආනුභාවය කොපමණ දැයි සිතත් සිතත් පස්වනක් ප්‍රීතිය ඉපිද සකල ශරීරයෙහි පැතිර ගියේය. තෙරුන් වහන්සේ "මාගේ මැණියන්ට සතුටු සොම්නස් උපන්නේය. මෙය

ධර්මදේශනාවට සුදුසු කාලයයි" සිතා මහඋපාසිකාවෙනි, කුමක් සිතන් නෙහිදැයි ඇසීය. දරුව, පුතුගේ අනුහස මෙසේ නම් ඔහුගේ ශාස්තෘන් වහන්සේගේ ගුණානුභාවය කොපමණ ද කියා සිතමියි කීවාය. මහඋපාසිකාවනි, මාගේ ශාස්තෘන් වහන්සේ උපන් කෙණෙහිද මහබිනික්මනයෙහි ද සම්බෝධියෙහි ද දම්සක් පැවැත්වීමෙහි ද දසසහස්‍රී ලෝකධාතුව කම්පා විය. ඒ භාග්‍යවතුන් වහන්ස්ගේ මෙබඳු යහපත් යශෝ සෝෂයක් පැතිර ඇත්තේය. ඒ භාග්‍යවතුන් වහන්සේ මෙසේත් අර්හත් සේක. - පෙ - දෙව් මිනිසුන්ට ශාස්තෘ සේක. බුද්ධ සේක. භගවත් සේක කියා මැණියන්ට බුදුගුණ මුසු දහම් දෙසූහ. දේශනාවසානයෙහි සාරි බැමිණිය කෙලෙස් අනුසය තුන නසා දහසක් නයින් සැදි සොවාන් ඵලයෙහි පිහිටියාය.

දත් දහම් ඇති ඕතොමෝ විනීතව විශාරදව අහෝ මම බොහෝ කල් මිසදිටු වස සහිත වූයෙමි කියා, තෙරුන්ට මෙසේ කීවාය. දරුව උපතිස්සයෙනි, කුමක් නිසා මෙතෙක් කල් මෙවැනි අමා මඟක් නුදුන්නෙහිදැයි කීවාය. තෙරුන් වහන්ෂස් මම දැන් මාගේ මැණියන්ට කිරි මිලත් පෝෂණය කිරීමේ මිලත් මෙපමණකින් දිනිමි කියා සිතා මහ උපාසිකාවනි, යන්නැයි පිටත් කොට චූන්දයෙනි, වේලාව කුමක්දැයි ඇසූහ. ස්වාමීනි, බෙහෙවින් පාන්දරය. එසේ නම් භික්ෂුසංඝයා රැස් කරන්න. උන්වහන්සේ එසේ කොට ස්වාමීනි, භික්ෂූහු රැස් වූහයි සැලකළහ. මා ඔසවා වාඩිකරවන්න. තෙරුන් වහන්සේ භික්ෂූන් අමතා ඇවැත්නි, සිව්සාලිස් වසක් මා සමඟ හැසිරෙමින් ඔබලා මාගේ යම් කාය කර්මයක් හෝ වාක් කර්මයක් හෝ රුචි නොකළාහු නම් එය ක්ෂමා කරන්නැයි කීහ. ස්වාමීනි, මෙපමණ කල් හෙවණැල්ලක් මෙන් අනුගමනය කරමින් පසුගමන් කළ අපට අරුචි වූවක් නම් නොවීය. ස්වාමීනි, ඔබ වහන්සේ අපට ක්ෂමා කළ මැනවැයි ආයාචනා කළහ. තෙරුන් වහන්සේ අනිත්‍යතා ප්‍රතිසංයුක්ත ධර්මකථා කොට භික්ෂුසංඝයාට දන්වා අරුණු රැස් පෙනි පෙනී මහපොළොව කම්පා කරවමින් අනුපධිශේෂ නිර්වාණ ධාතුවෙන් පිරිනිවියහ.

බොහෝ දෙවි මිනිසුන් තෙර පිරිනිවනෙහි මහපුද සත්කාර කළහ. ආයුෂ්මත් චුන්ද තෙරුන් වහන්සේ තෙරුන්ගේ පාසිවුරු සහ තෙරුන්ගේ ධාතු පෙරහන ද ගෙන භික්ෂුසංඝයා සමඟ දෙව්රමට ගොස් අනඳ තෙරුන් වෙත පැමිණියහ. අනඳ තෙරුන් වහන්සේ ධාතු හිස තබාගෙන හැඬූහ. චුන්ද තෙර අනඳ තෙරුන් සමඟ ධාතු වඩාගෙන භාග්‍යවතුන් වහන්සේ වෙත ගියහ. උන්වහන්සේ ධාතු පෙරහන ගෙන පන්සියයක් ගාථාවෙන් තෙර ගුණ වනා දෙව්රම් දොරටුවෙහි ධාතු චෛත්‍යයක් කරවා රජගහ නුවරට වැඩීම සඳහා අනඳ තෙරුන්ට සංඥා කළහ. උන්වහන්සේ භික්ෂූන්ට දැන්වූහ. ඉක්බිති බික්සඟන පිරිවැරූ බුදුහු රජ ගහනුවරට වැඩියහ. එකල්හි මුගලන් තෙරණුවෝ කාලසිලාවෙහි පිරිනිවියහ. එම පිරිනිවීමෙහි ද බොහෝ දෙව් මිනිස්සු මහසත්කාර කළහ. අහසින් මල් වැසි වැස්සේය. බුදුහු ධාතු ගෙන සෑයක් පිහිටුවා භික්ෂුසංඝයා සමඟ රජගහ නුවරින් ගංගාභිමුඛව උක්කවේලාවට වැඩියහ. බික්සඟන සමගින් ගංතෙර වැඩහිඳ සැරියුත් මුගලන් දෙනමගේ පිරිනිවන පිළිබඳ දහම් දෙසා උක්කවේලාවෙන් වෛශාලියට වැඩිසේක.

භාග්‍යවතුන් වහන්සේ පෙරවරු වේශාලියෙහි පිණ්ඩපාත කොට පස්වරු අනඳ තෙරුන් ඇමතූහ. ආනන්ද, නිසීදනය ගන්න. දිවාවිහාරය සඳහා චාපාලචේතියට යමුයි කියායි. එසේ යයි නිසීදනය ගත් උන්වහන්සේ බුදුන් පසු පසින් චාපාලචේතිය වෙත පැමිණ පැනවූ අසුනෙහි භාග්‍යවතුන් වහන්සේ වැඩ හුන්හ. වැඳ පසෙක හුන් අනඳ තෙරුන්ට භාග්‍යවතුන් වහන්සේ ආනන්ද, වේශාලිය රමණීයයි. ආනන්ද, උදේන චේතිය රමණීයයි, ගෝතමක චේතිය රමණීයයි සබ්බඤ්ඤුදබ්බ චේතිය රමණීයයි. බහුපුත්තක චේතිය සාරන්දද චේතිය පාවාල චේතිය රමණීයයි. යම් කිසිවෙකුට ආනන්ද සතර සෘද්ධිපාද භාවිත බහුලීකෘත වෙයි ද ඔහුට කැමැති නම් අයුෂ්කල්පයම හෝ ඊටත් ටිකක් වැඩියෙන් සිටිය හැකිය. තථාගතයන් වහන්සේ මැනවින් සෘද්ධිපාද සම්පූර්ණ කළ සේක. ඉතින් කැමැති නම් තථාගතයන් වහන්සේ ආයුඃකල්පයම හෝ වැඩ සිටිය හැකි

වෙති කියා වදාළ සේක. මෙවැනි ඕළාරික තිමිති පෙන්වද්දීත් ඕළාරික ආලෝක කරද්දීත් අවබෝධ කිරීමට අනඳ තෙරුන් වහන්සේ අසමත් වූහ. මාරාවේශ වූවකු මෙන් කල්පයක් සිටින සේ භාග්‍යවතුන් වහන්සේට ආරාධනා නොකළහ. දෙවෙනි තුන් වෙනි වත් එසේම විය.

එවිට භාග්‍යවතුන් වහන්සේ අනඳ තෙරුන්ට ආනන්ද, යන්න. ආනන්ද, දිවාවිහාරයට කල් දනුවයි වදාළහ. උන් වහන්සේ නැගිට වැඳ පැදකුණු කොට බුදුන් නුදුරෙහි ගසක් මුල වාඩිවූහ. අනඳ තෙරුන් වැඩි නොබෝ වේලාවකින් පාපී මාරයා බුදුන් කරා පැමිණ පසෙක සිට ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ පිරිනිවෙන සේක්වා, සුගතයන් වහන්සේ පිරිනිවෙන සේක්වා, භාග්‍යවතුන් වහන්සේට පිරිනිවීමට කාලයයි. මම භාග්‍යවතුන් වහන්සේගේ අටවන සතියෙහි අජපල් නුගරුක මුලට පැමිණ භාග්‍යවතුන් වහන්ස, යම් අර්ථයක් සඳහා ඔබ වහන්සේ පාරමිතා පිරුසේක් ද ඒ අර්ථයට දැන් පැමිණියෙහිය. සර්ඥතාඥානය අවබෝධ කරන ලදි. ලොව හැසිරීමෙන් කවර පලක් ද? දැන් පිරිනිවෙනු මැනවැයි ඉල්ලා සිටියෙමි. එවේලෙහි ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ පාපී මාරය, මාගේ ශ්‍රාවක භික්ෂූහු යම්තාක් ව්‍යක්ත විනීත විශාරද නොවෙත්ද බහුශ්‍රැත ධම්ධර ධම්ානුධම්ප්‍රතිපන්නයෝ නොවෙත් ද සිය ආචාර්යවාද ගෙන නොකියත් ද නොදෙසත් ද නොපනවත් ද නොපිහිටුවත් ද විවරණය නොකරත් ද බෙදා නොදක්වත් ද ප්‍රකට නොකරත් ද උපන් පරප්‍රවාද ධාර්මිකව නිග්‍රහ කොට ධම් දේශනා නොකරත් ද යම් තාක් මාගේ ශ්‍රාවක භික්ෂුණීහු - පෙ - ශ්‍රාවක උපාසකයෝ - පෙ - ශ්‍රාවක උපාසිකාවෝ - පෙ - ප්‍රකාශ නොකරත් ද ඒතාක් පිරිනිවන් නොපාමියි වදාළහ.

ස්වාමීනි, දැන් භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක භික්ෂූහු භික්ෂුණීහු උපසකයෝ උපාසිකාවෝ එසේ දැන ප්‍රකාශ කරති. ධම්ය සුප්‍රකාශිතය. දැන් පිරිනිවෙන සේක්වා. දැන් පිරිනිවීමට කාලයයි කියා ආයාචනා කළේය. එසේ කී කල භාග්‍යවතුන් වහන්සේ "මාරය

මන්දොත්සාහි නොවව. නොබෝ කලකින් තථාගත පරිනිර්වාණය වෙයි. මෙයින් තුන් මසක් ගෙවීමෙන් තථාගතයන් වහන්සේ පිරිනිවෙති කියා පාපී මාරයාට වදාළහ. එවිට මාරයා ලාභ ලද්දෙකු මෙන් එහිම අතුරුදහන් විය. භාග්‍යවතුන් වහන්සේ චාපාල චෛත්‍යයෙහි සිහියෙන් මනා නුවණින් ආයුසංස්කාර අත්හළ සේක. ආයුසංස්කාර හැරීමත් සමඟම බිහිසුණු ලොමු ඩැහැගන්වන මහා භූමිකම්පාවක් විය. දෙව්බෙර ද වාදනය විය. ඒ වේලහි අනඳ තෙරුන්ට "භවත්නි, ඇත්තෙන්ම ආශ්චර්‍යයකි. ඇත්තෙන්ම පුදුමයකි. බිහිසුණු ලොමු ඩැහැගන්වන මේ භූමි කම්පාව විශාලයයි" සිතුණේය. මේ කරුණ භාග්‍යවතුන් වහන්සේගෙන් විමසමියි ද සිතිණ.

අනඳ තෙර නැගිට බුදුන් කරා ගොස් වැඳ පසෙක හිඳ "ස්වාමීනි ආශ්චර්‍යයි. ස්වාමීනි පුදුමයි. බිහිසුණු ලොමු දැහැ ගන්වන මහාභූමි කම්පාවකි. දෙව්බෙර ද පැළී ගියේය. ස්වාමීනි, මෙවන් භූමි කම්පාවක් ඇති වීමට හේතුව කුමක් ද. ප්‍රත්‍යය කුමක් දැයි විමසූහ. එවිට බුදුහු අටකරුණකින් පොළොව කම්පාවෙතැයි වදාළහ. අට කුමක් ද? මේ මහපොළොව ජලයෙහි පිහිටියේය. ජලය වායුවෙහි පිහිටියේය. වාතය ආකාශයෙහි පිහිටියේය. වාතය කුපිත වූ කල ජලය කම්පා වෙයි. ජලය කම්පා වූ කල මහ පොළොව කම්පා වෙයි. මෙසේ ධාතු කැළඹීමෙන් මහපොළොව කම්පාවෙයි. මහණ බමුණන්ගේ දෙවියන්ගේ අනුභසින් කම්පා වෙයි. බෝසතකු මව්කුස පිළිසිඳ කල්හි මව් කුසින් නික්මෙන කල්හි යන දෙතැන පින් තෙදින් කම්පා වෙයි. යම් විටක තථාගතයෝ අනුත්තර සම්මා සම්බෝධිය අවබෝධ කරත් ද එදින ද ඤාණ තේජසින් පොළොව කම්පා වෙයි. යම්දාක තථාගතයෝ අනුත්තර ධම්මචක්කය පවත්වත් ද එකල ධර්ම තේජසින් කම්පා වෙයි. යම්දාක තථාගතයෝ ආයු සංස්කාර අත්හරින් ද එදා ද චිත්ත සංක්ෂෝභය නොයිවසිය හැකිව කම්පා වෙයි. යම්දාක තථාගතයෝ පිරිනිවෙත් ද එදින අනිත්‍ය ධර්මතා බලයෙන් කම්පා වෙයි. මේ අට කරුණින් පොළෝ කම්පාවට

නිමිති දෙසා ආනන්දය, අද දැන් චාපාල චෛත්‍යස්ථානයහි සිහියෙන් නුවණින් තථාගතයන් වහන්සේ ආයු සංස්කාර හළ සේකැයි ප්‍රකාශ කළ සේක.

මෙසේ වදාළ කල්හි උද්වේගයට පත් හදින් අනඳ තෙර "භාග්‍යවතුන් වහන්සේ කල්පයක් සිටින සේක්වා. සුගතයන් වහන්සේ බහුජන හිත පිණිස බහුජන සැප පිණිස ලෝකානුකම්පාවෙන් දෙව් මිනිසුන්ට අර්ථය පිණිස හිත පිණිස සැප පිණිස කල්පයක් සිටින සේක්වායි ආයාචනා කළේය. ආනන්දය, තථාගතයන්ට ආයාචනා කිරීමෙන් කම් නැත. ආනන්ද තථාගතයන් වහන්සේට ආයාචනා කිරීමට දැන් අකාලයයි. ඔබ තථාගතයන් වහන්සේ විසින් ඕළාරික නිමිති දක්වද්දී ඕළාරික ආලෝක දක්වද්දී තේරුම් ගැනීමට අපොහොසත් වූයෙහිය. භාග්‍යවතුන් වහන්සේට කල්පයක් සිටින සේ ආයචනා නොකෙළෙහිය. ඔබම වරදවා ගත්තෙහිය. එබැවින් ආනන්ද, ඔබම වරදවා කරන ලද්දකි කියා වදාළ සේක. අනඳ තෙරුන් වහන්සේ තුන්වර දක්වා ආයාචනා කොටත් භාග්‍යවතුන් වහන්සේ විසින් ප්‍රතික්ෂේප කරන ලදුව හීයෙන් විදින ලද හදවත ඇත්තෙකු මෙන් විසංඥ වූ ඇත් රජකු මෙන් කිසිත් නොවැටහී හුන්හ. එවිට භාග්‍යවතුන් වහන්සේ උන්වහන්සේ අස්වසමින් "ආනන්ද, සියලු ප්‍රියමනාප දෙයින් ඉවත් වීම වෙන් වීම වෙනසට පත් වීම කල්තියාම ඔබලාට මා විසින් ප්‍රකාශ කළා නොවේ ද? උපන් හටගත් පළුදුවන දෙයින් පළුදු නොවේවා යන්න කෙසේ නම් ලබන්න ද? එය නොසිදුවන්නකි. ආනන්දය, තථාගතයන් වහන්සේ විසින් ආයු සංස්කාරය අත්හරින ලදි. නොබෝ දිනකින් පිරිනිවීම වෙයි. මෙයින් තෙමසක් ගත වීමෙන් තථාගතයන් වහන්සේ පිරිනිවෙති. එය තථාගතයන් වහන්සේ ජීවිත හේතුවෙන් වත් නැවත වෙනස් නොකරති. එය නොසිදුවන්නකැයි වදාළහ.

මෙසේ තථාගතයන් වහන්සේ චාපාල චෛත්‍යස්ථානයෙහි නවම් පෝදින ආයු සංස්කාරය අත්හැර අනඳ තෙරුන් අමතා ආනන්දය, මහාවන කූටාගාර ශාලාවට යමුයි වදාළහ. ඉක්බිති එසේය

ස්වාමීනියි කියා පිළිතුරු දුන් කල්හි අනඳ තෙරුන් සමඟ කූටාගාර ශාලාවට වැඩ වේශාලියෙහි විසූ තාක් භික්ෂූන් උපස්ථාන ශාලාවට කැඳවා පැනවූ අසුන්හි වැඩ හිඳ භික්ෂූන් ඇමතූහ. "මහණෙනි, දැන් ඔබලා අමතමි. මහණෙනි, සියලු ම සංස්කාර ධර්මයෝ නැසෙන සුලුයි. නොපමාව සම්පාදනය කරව්. නොබෝ දිනකින් තථාගත පරිනිර්වාණය වෙයි. මෙයින් තුන් මසකින් තථාගතයන් වහන්සේ පිරිනිවෙතියි කියා වදාළහ. එවිට පුහුදුන් භික්ෂූන් වහන්සේලා කඳුළු දරා ගත නොහැකි වූහ. රහතන් වහන්සේලාට ධර්ම සංවේගය ඇති විය. භාග්‍යවතුන් වහන්සේ පෙරවරු හැඳ පෙරව පාසිවුරු ගෙන වේශාලියෙහි පිණ්ඩපාත කොට පස්වරු නගරද්වාරය ඉදිරිපිට සිට වේශාලිය බලමියි සිත් ඉපද වූහ. සිත උපන් කෙණෙහිම ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ නොයෙක් කල්පලක්ෂ කෝටි ගණන් පාරමිතා පුරන්නාහු. ගෙල හරවා බැලීමේ ධර්මයක් කරන ලදැයි කියන්නාක් මෙන් මහපොළොව කැරකී වේශාලි නගරාභිමුඛ කළේය. භාග්‍යවතුන් වහන්සේ නාගාවලෝකනයෙන් බලා ආනන්ද, මේ තථාගතයන් වහන්සේගේ[1] අවසන් වේශාලි දර්ශනයයි වදාළහ. කුමක් නිසා භාග්‍යවතුන් වහන්සේ විශාලාව බැලූ සේක් ද? එහි ලිච්ඡවීන්ට අනුකම්පාවෙනි. ඔවුහු විනාශකාරී දහම්හි යෙදීමෙන් තුන් වසකින් මත්තෙහි වැනසෙති. ඔවුහු නගරද්වාරයෙහි නාගාවලෝකිත නම් චෛත්‍යයක් කොට ගඳ මල් ආදියෙන් පුදති. එය ඔවුන්ට බොහෝ කල්හි අර්ථහිත පිණිස පවතී. මෙසේ ඔවුන්ට අනුකම්පාවෙන් බලා භික්ෂු සංඝයා සහිත භාග්‍යවතුන් වහන්සේ ගඩ ගාමයට වැඩි සේක.

එහි වසමින් බොහෝ භික්ෂූන්ට සීලය මෙසේය. සමාධිය මෙසේය. ප්‍රඥාව මෙසේයයි ධර්ම දේශනා කරති. සීලයෙන් දියුණු වූ සමාධිය මහත් ඵල මහානිසංස වෙයි. සමාධියෙන් දියුණු කළ ප්‍රඥාව මහත් ඵල මහානිසංස වෙයි. ප්‍රඥාවෙන් දියුණු කළ සිත මනාව ආස්‍රවයන්ගෙන් මිදෙයි කියායි. ගඩගාමයෙහි කැමතිතාක් විසූ බුදුහු භික්ෂුසංඝයා සමඟ හත්ථිගාම අම්බගාම ජම්බුගාමවලට ද භෝග නගරයට ද වැඩි සේක. භෝග නුවර ආනන්ද චේතියෙහි රුචි තාක්

වැඩ හිඳ ආනන්ද පාවා නුවරට යමුයි බික්සඟන සමඟින් පාවානුවරට වැඩියහ.

උන්වහන්සේ පවානුවර චුන්දකම්මාර පුත්‍රගේ අඹවනයෙහි වාසය කරති. චුන්ද පාවානුවරට වැඩි භාග්‍යවතුන් වහන්සේ සිය අඹ උයනෙහි වසතියි දැන ගත්තේය. ඔහු ගොස් වැඳ පසෙක හුන්නේය. එහිදී දැහැම් කතාවෙන් සතුටු වූ චුන්ද සෝවාන් බවට පත්ව සෙට දිනට භාග්‍යවතුන් වහන්සේටත් භික්ෂු සංඝයාටත් ආරාධනා කොට වැඳ පැදකුණු කොට ගියේය. චුන්ද කම්මාර පුත්‍ර තෙම රැය පහන් වූ පසු සිය නිවසෙහි බාද්‍ය භෝජ්‍ය පිළියෙළ කොට ප්‍රණීත මෘදු ඕදන සහිත පස්ගෝරසයෙන් පිසන ලද සූකරමද්දව සම්පාදනය කරවීය. දොළොස් දහස් කොදෙව් පිරිවර ඇති සතර මහාදිවයින්හි දේවතාවෝ පෘථිවි ඕජස් සහ දිව්‍යඕජස් ගෙන එහි බහාලූහ. භාග්‍යවතුන් වහන්සේ පෙරවරු හැඳ පෙරව පාසිවුරු ගෙන භික්ෂු සංඝයා සමඟ චුන්ද කම්මාර පුත්‍රයන්ගේ ගෙට ගොස් පැනවූ අස්නෙහි හිඳ චුන්ද කම්මාර පුත්‍ර අමතා චුන්ද, ඔබ පිළියෙළ කළ සූකරමද්දවයෙන් මා වළඳවන්න. සෙසු බාද්‍ය භෝජ්‍යයෙන් භික්ෂු සංඝයා වළඳවන්නැයි වදාළහ. ඔහු එසේය ස්වාමීනියි කියා සූකරමද්දවයෙන් බුදුන් වැළඳ වීය. සෙසු අහරින් සඟුන් වැළඳ වීය.

භාග්‍යවතුන් වහන්සේ සූකරමද්දව වළඳා චුන්ද අමතා චුන්ද, ඉතිරිවූ සූකරමද්දව වළලන්න. චුන්ද, දෙවියන් සහිත ලෝකයේ දෙව් මිනිසුන් අතර තථාගතයන් වහන්සේ හැර එය වළඳා දිරවිය හැකි අනිකෙකු මම නොදකිමි කියා වදාළහ. එසේය ස්වාමීනි, කියා ඉතිරි සූකරමද්දව වළලා බුදුන් වෙත පැමිණ පසෙක හිඳගත්තේය. උන්වහන්සේ චුන්දකම්මාර පුත්‍රයන්ට ධම් දේශනා කොට වැඩි සේක. චුන්දකම්මාරපුත්‍රගේ දන් වැළඳූ බුදුරජාණන් වහන්සේට දරුණු ආබාධයක් ඇතිවිය. ලෝහිතපක්ඛන්දිකා රෝගයෙන් මාරාන්තික දැඩි වේදනා හටගත්තේය. භාග්‍යවතුන් වහන්සේ පීඩා නොගනිමින් සිහියෙන් මනා නුවණින් ඉවසූ සේක. උන්වහන්සේ අනඳ තෙරුන් අමතා ආනන්ද, කුසිනාරාවට යමුයි වදාළහ. එසේය

ස්වාමීනි යි කීය. භාග්‍යවතුන් වහන්සේ මහත් භික්ෂු සංඝයා සමඟ චම්පාවටත් කුසිනාරාවටත් අතර දික් මගට බැස අතර මඟ මගින් බැහැරව ගස් මුලක් වෙත පැමිණ අනඳ තෙරුන් අමතා ආනන්ද, සඟළ සතර පට කොට පනවන්න. ක්ලාන්ත වෙමි. ආනන්ද වාඩි වෙමියි කීහ.

එසේය ස්වාමීනි, කියා සතර පට කොට සඟළ පැනවීය. භාග්‍යවතුන් වහන්සේ අසුනෙහි වාඩි වූහ. හිඳ අනඳ තෙරුන් අමතා ආනන්ද, පැන් ගෙන එන්න. පිපාසිත වෙමි. බොමියි කීහ. එවිට අනඳ තෙර ස්වාමීනි, කරත්ත පන්සියයක් දැන් ගඟින් ගියේය. රෝදවලින් කැළඹුණු වතුර ටික බොරවී ගලාබසී. ස්වාමීනි, පිරිසිදු පැහැදිලි දිය ඇති සිසිල් දිය ඇති මනා තොට ඇති රමණීය කුකුත්ථානදිය මේ නුදුරෙහිය. එහි භාග්‍යවතුන් වහන්සේට පැන් පානය කළ හැකි ය. ඇඟපත සැනසිය හැකිය. කුමක් කරන්නෙම්දැයි ඇසීය. දෙවනුව තෙවනුවත් භාග්‍යවතුන් වහන්සේ ආනන්ද, දැන් පැන් ටිකක් ගෙන එන්න. පිපාසයි. පැන් වළඳම්යි වදාළහ. අණ නොයික්ම විය හැකි අනඳ තෙර එසේය ස්වාමීනියි කියා පාත්‍රය ගෙන ගඟට ගියේ ය. රෝදවලින් කැළඹී බොරවූ යම්තම් වතුර ගලා බහින ඒ කුඩා නදිය උන්වහන්සේ එහි යද්දී භාග්‍යවතුන් වහන්සේගේ පින් බෙලෙන් පිරිසිදුව පැහැදිලිව නොබොරව ගලාබසී. එවිට අනඳ තෙරුන්ට මෙසේ සිතිණ. භවත්නි, ඇත්තෙන්ම ආශ්චර්‍යයකි. භාග්‍යවතුන් වහන්සේගේ මහර්ධිමත්බව මහානුභාවතාව ඇත්තෙන්ම පුදුමයි. රෝදවලින් කැළඹී බොරවී ගලාබැසි මේ ගඟ මා එද්දීම පිරිසිදුව පැහැදිලිව නොබොරොව ගලා බසීයයි විස්මය පත්ව පැන් ගෙන බුදුන් කරා ගොස් මෙසේ කීය. ස්වාමීනි, තථාගතයන්ගේ මහර්ධිමත්බව මහානුභාවතාව ආශ්චර්‍යයි. පුදුමයි. රෝදවලින් කැළඹී බොරවී ගලා බැසි ගඟ මා යද්දී පැහැදිලිව පිරිසිදුව නොබොරොව ගලා බැස්සාය. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ පැන් බොන සේක්වා. සුගතයන් වහන්සේ පැන් බොන සේක්වායි කීය.

භාග්‍යවතුන් වහන්සේ පැන් වැළඳූ සේක. එවේලෙහි ආළාර කාලාමයන්ගේ ශ්‍රාවක පුක්කුස නම් මල්ලපුත්‍ර කුසිනාරා මහමඟට පිවිසියේ වෙයි. හෙතෙම ගසක් මුල වැඩ හුන් භාග්‍යවතුන් වහන්සේ දුටුවේය. දැක ළඟට පැමිණ වැඳ උන්වහන්සේ සමඟ සතුටු සාමිචි පවත්වා, පසෙක හිඳ ගත්තේ ය. උන්වහන්සේ ඔහුට බණ දෙසූහ. බණින් පැහැදී හෙතෙම මෙසේ කීය. ස්වාමීනි, ආළාර කාලාම කෙරෙහි මාගේ යම් ප්‍රසාදයක් වී ද එය මහසුළඟේ පා කරමි. නදී සැඩපහරෙහි පාකොට හරිමි. භාග්‍යවතුන් වහන්සේ අද පටන් දිවි හිමියෙන් සරණගත උපාසකයෙකු කොට මා දරනසේක්වා. අනතුරුව පුක්කුස රන්වන් සළු සඟළක් ගෙන බුදුන් වැඳ මාගේ මේ සළු යුගලය අනුකම්පාවෙන් පිළිගන්නාසේක්වායි භාග්‍යවතුන් වහන්සේට ආරාධනා කළේය. එසේ නම් පුක්කුස, එකකින් මා හඳවයි වදාළහ. එසේය ස්වාමීනියි කියා හෙතෙම එකකින් බුදුන් හැන්දවීය. එකකින් අනඳ තෙර ඇන්දවීය. අනතුරුව පුක්කුස මල්ලපුත්‍ර බුදුන් වැඳ පැදකුණු කොට ගියේ ය.

පුක්කුස මල්ලපුත්‍ර ගිය නොබෝ වේලාවකින් අනඳ තෙර ඒ රන්වන් සළුවත් බුදු සිරුරට යොමුකළේය. භාග්‍යවතුන් වහන්සේ ද නැගිට එකක් හැඳ ගත්හ. එකක් පෙරවා ගත්හ. එවිට භග්‍යවතුන් වහන්ස්ගේ ශරීරය රන්වන් චීවරය එළවන ලදුව නොසුන් ආලෝකයෙන් බබළන්නට විය. එවිට අනඳ තෙරුන් වහන්සේ සිළු රහිත අඟුරු මෙන් අතිපරිශුද්ධ පුණ්‍යප්‍රභා යුක්ත උතුම් දේහයෙන් බබළන භාග්‍යවතුන් වහන්සේ දැක ආශ්චර්‍ය අද්භූතයට පත්ව ස්වාමීනි, බුදුරජාණන් වහන්සේගේ ශරීරය කෙතරම් පිරිසිදු ද යත් ඡවිවර්ණය කෙතරම් පැහැපත් ද යත් මේ වස්ත්‍ර යුග්මය යොමු කිරීමෙන් පසු සිරුර ගිනිදැල් රහිත වහ්නිස්කන්ධයක් සේ හැඟේයයි සැලකළහ. ආනන්ද, මෙසේ අවස්ථා දෙකක තථාගත ශරීරය පිරිසිදු වෙයි. ඡවිවර්ණය සුපිරිසිදු වෙයි. කවර අවස්ථා දෙකක ද? ආනන්ද, යම් රාත්‍රියක තථාගතයන් වහන්සේ අනුත්තර සම්මා සම්බෝධියට පත් වන්නාහු ද ආනන්ද, යම් රාත්‍රියක අනුපාදිශේෂව පිරිනිවෙන්නාහු

ද මේ අවස්ථා දෙක්හි තථාගත ශරීරය පිරිසිදු වේ. ඡවි වර්ණය පැහැපත් වේ. ආනන්ද අද රාත්‍රි පශ්චිම යාමයෙහි කුසිනාරාවෙහි උපවර්තන නම් මල්ලයන්ගේ සල්වනයේ සල්ගස් යුගලය අතර තථාගතයන් වහන්සේගේ පිරිනිවීම වන්නේය කියා වදාළහ. කුමක් නිසා උන්වහන්සේ මේ අවස්ථා දෙක්හි මෙසේ වන සේක් ද? ආහාර විශේෂයෙන් සහ බලවත් සොම්නසින් ද වේ. මේ අවස්ථා දෙක්හි සියලු සක්වළ දෙවියෝ ආහාරයෙහි ඕජස් බහාලති. ඒ භෝජනය කුසට පිවිස ප්‍රසන්න රූප උපදවයි.

ආහාරයෙන් හටගත් රූපය ප්‍රසන්න බැවින් මනොඥ ස්ථාන ඉන්ද්‍රිය අතිශයින් බබළයි. සම්බෝධි දිනයෙහි ද උන්වහන්සේට නොයෙක් කෙළ දහසක් සක්වළ දෙවියන් විසින් ඕජස් බහාලූ අහර වළඳා අදම ඒකාන්තයෙන් මාගේ කෙලෙස් රැඟිය ප්‍රහීණ වෙයි කියා මෙනෙහි කිරීමෙන් බලවත් සතුටු සොම්නස් උපදී. සිත පැහැදෙයි. සිත පහන් කල ලේ පිරිසිදු වෙයි. ලේ පිරිසිදු වූ කල මනොඥස්ථාන ඉන්ද්‍රිය අතිශයින් බබළයි. පිරිනිවන් දිනයෙහි උන්වහන්සේට් අද මම නොයෙක් දහසක් බුදුවරුන් පිවිසි අමාමහ නගරයට පිවිසෙමියි ආවර්ජනා කරමින් බලවත් සතුටු සොම්නස් ඉපිද සිත පහදවති. සිත පහන් කල්හි ලේ පිරිසිදු වේ. ලේ පිරිසිදු වූ කල්හි මනොඥ- ස්ථාන ඉන්ද්‍රිය එවේලෙහි අතිශයින් බබළයි. මෙසේ ආහාර විශේෂයෙන් සහ බලවත් සොම්නසින් මේ අවස්ථා දෙක්හි මෙසේ වේයයි දත යුතු. එයින් කියන ලදි.

> පුක්කුස රන්වන් සළු සඟළක් පුදකළේය. එයින් හඳින ලද ශාස්තෘන් වහන්සේ ස්වර්ණ වර්ණව බැබළි සේක.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ අනඳ තෙරුන් අමතා ආනන්ද, කුක්කුට නදිය- වෙත යමුයි වදාළහ. එසේය ස්වාමීනියි කී කල මහත් භික්ෂු සංඝයා සහිතව කුක්කුට නදිය වෙත ගොස් නහන කඩ හැඳ ගඟට බැස ස්නානය කළ සේක. භාග්‍යවතුන් වහන්සේ එහි නහන කල ගඟෙහි මස් කැසුබුවෝ ගං දෙතෙරට කැටිව රන් වන්ව අහස පොළොව අවුනන්නාක් මෙන් සිටියහ. භාග්‍යවතුන් වහන්සේ

පැන් සනහා ගොඩ නැග මනාව හැඳ පෙරව ගංතෙර වූ අඹ වනයට වැඩි සේක. එවේලෙහි අනඳ තෙර නහනකඩ සෝදමින් සිටියේය. අඹ වනයට වැඩි තථාගතයන් වහන්සේ අනඳ තෙරුන් නොදැක ළඟ සිටි චුන්දතෙරුන් අමතා චුන්ද සඟළ සතරපට කොට පනවන්න. ක්ලාන්ත වූයෙමි. සයනය කරමියි වදාළහ. චුන්ද තෙර එසේයයි සඟළ සතරපට කොට පැනවීය. භාග්‍යවතුන් වහන්සේ දකුණුලයෙන් පයින් පය ඉක්මවා සිහි ඇතිව මහානුවණින් නැගිටීමි යන සංඥා මෙනෙහි කොට සිංහශය්‍යා කළහ. චුන්ද තෙර එතනම බුදුන් ඉදිරියෙහි හුන්නේය. බුදුන් පෙරටුකොට ගත් භික්ෂූහු ද හුන්හ.

ඉක්බිති අනඳ තෙර බුදුන් කරා අවුත් වැඳ පා අසල ඉඳ ගත්තේ ය. භාග්‍යවතුන් වහන්සේ අනඳ තෙරුන් අමතා ආනන්ද, චුන්ද කම්මාරපුත්‍ර හට කිසියම් විපිළිසරක් උපනහොත් එය චුන්දට අලාභයකි. ඔහුට අයහපත් ලැබීමකි. යමෙකුගේ ඒ අවසන් පිණ්ඩපාතය වළඳා තථාගතයන් වහන්සේ පිරිනිවි සේක කියායි. ආනන්ද, චුන්ද කම්මාර පුත්‍රයන්ගේ මේ විපිළිසර දුරු කළ යුතුය. යමෙකුගේ පිණ්ඩපාතය වළඳා තථාගතයන් වහන්සේ පිරිනිවි සේක් ද චුන්ද එය ඔබට මහත් ලාභයකි. එය ඔබට දුර්ලභ ලැබීමකි. චුන්ද මෙය භාග්‍යවතුන් වහන්සේ වෙතින්ම අසන ලද්දකි. උන් වහන්සේ වෙතින් ම පිළිගන්නා ලද්දකි කියායි. අනික් පිණ්ඩපාතවලට වඩා අතිශයින් මහත්ඵල අතිශයින් ආනිසංස ඇති සමසම ඵල ඇති සමසම විපාක ඇති දන් දෙකකි. දෙක කුමක් ද? යම් පිණ්ඩ-පාතයක් වළඳා තථාගතයන් වහන්සේ අනුත්තර සම්මා සම්බෝධිය අවබෝධ කරන සේක් ද. යම් පිණ්ඩපාතයක් වළඳා තථාගතයන් වහන්සේ අනුපාදිශේෂ පරිනිර්වාණ ධාතුවෙන් පිරිනිවෙන සේක් ද සමසම ඵල ඇති සමසම විපාක ඇති මේ පිණ්ඩපාත දෙක අතිශයින් අනික් පිණ්ඩපාතවලට වඩා මහත්ඵලතරත් මහානිසංසතරත් වෙයි. ආයු ඇතිතාක් චුන්ද කම්මාර පුත්‍ර විසින් රැස්කරන ලද ස්වර්ගීයට හේතුවන -පෙ- අධිපතිත්වය සඳහා හේතුවන කර්මයක් කරන ලදැයි මෙසේ චුන්දගේ විපිළිසර දුරු කළ යුතුය.

කුමක් හෙයින් පිණ්ඩපාත දෙක සමසමඵල සමසම විපාක ඇත්තේයයි කියන ලද ද? සුජාතව දෙන ලද පිණ්ඩපාතය වළඳා තථාගතයන් වහන්සේ බුදුවූහ. උන්වහන්සේ රාග සහිත දෝෂ සහිත මෝහ සහිත කාලයෙහිම ඒ දානය වළඳන ලදි. මේ චුන්ද කම්මාර පුත්‍රයා විසින් දෙන ලද දානය වීතරාගව වීතදෝසව වීත මෝහව වළඳන ලදි. කෙසේ නම් ඒ දෙක සමසම ඵල සමසම විපාක ඇත්තේ ද? පරිනිබ්බාන සමතාවෙන් සහ සමාපත්ති සමතාවෙනි. භාග්‍යවතුන් වහන්සේ සුජාතාව විසින් දෙන ලද පිණ්ඩපාත දානය වළඳා සඋපධිශේෂ නිර්වාණ ධාතුවෙන් පිරිනිවි සේක. චුන්ද දුන් දානය වළඳා අනුපධිශේෂ නිර්වාණ ධාතුවෙන් පිරිනිවි සේක. මෙසේ පිරිනිවන් සමතාවෙන් සම ඵල සම විපාක ඇත්තේයි. බුදු වන දවස්හි සූවිසි දහසක් පමණ සමවත්වලට සමවැදුණහ. පිරිනිවන් පානා දිනයෙහි ද ඒ සියලු සමවත්වලට සමවැදුණහ. මෙසේ සමවත් සමතාවෙන් ද සමඵල සමවිපාක ඇත්තේය. සුජාතා ද පසු කාලයෙහි ඒ රුක්දෙවියෙක් නොවේ. බෝසතාණෝය. උන්වහන්සේ ඒ පිණ්ඩපාතය වළඳා අනුත්තර සම්‍යක් සම්බෝධිය අවබෝධ කළ සේක. සත් සතියක්ම එයින් යැපීම වියයි අසන ලදි. මෙයසා සුජාතව මට මහත් ලාභයකැයි සිහිකරමින් බලවත් සතුටු සොම්නසට පත් වූවාය. චුන්දට ද පසු කාලයෙහි මා විසින් අවසන් දානය දෙන ලදි. මා විසින් ධම්ඡීර්ෂය ගන්නා ලදි. මාගේ දානය වළඳා ශාස්තෘන් වහන්සේ අනුපාදිශේෂ නිර්වාණ ධාතුවෙන් පිරිනිවි සේකැයි අසා මට මහත් ලාභයැකැයි සිතන්නේ බලවත් සතුටු සොම්නස් ඇතිවිය. මෙසේ මෙනෙහි කිරීම් සමතාවෙන් ද සමඵල සමවිපාක ඇත්තේයයි දත යුතුය.

භාග්‍යවතුන් වහන්සේ අනඳ තෙරුන් අමතා ආනන්ද, හිරඤ්ඤවතී නදියෙන් එගොඩ කුසිනාරාවෙහි මල්ලයන්ගේ උපවත්තන සාලවනයට යමුයි වදාළහ. එසේය ස්වාමීනියි කී පසු සිංහශය්‍යාවෙන් නැගිට භික්ෂු සංඝයා සමඟ හිරඤ්ඤවතී නදියෙන් එතෙරව උපවත්තන සල්වනයට වැඩියහ. භාග්‍යවතුන් වහන්සේ

ප්‍රත්‍යන්ත නගරයෙන් පිටත්ව තුන් ගව්වක් කුසිනාරාවට වඩින සේක් මෙදෑතුර විසිපස් තැනෙක්හි හිඳ මහත් ආයාසයෙන් වඩින සේක් හිර අවරට යන සවස් වේලේ සල්වනයට පිවිසි සේක. තථාගත කායබලය නම් මහඇත්කුලවල අනුසාරයෙන් දත යුතුය.

කාලාවක, ගංගෙය්‍ය, පණ්ඩර, තම්බ, පිංගල, ගන්ධ, මංගල, හේම, උපොසථ, ඡද්දන්ත ද යන මේ දස ඇත් කුලයයි.

මෙහි කාලාවක නම් ප්‍රකෘති ඇත් කුලය දත යුතු. පුරුෂයන් දස දෙනෙකුගේ බලය එක ඇතෙකුගේ බලයයි. ඒ ඇතුන් දස දෙනෙකුගේ බලය කාලාවකයෙකුගේ බලයයි. කාලාවක දස ඇතෙකුගේ බලය ගංගෙය්‍යයකුගේ ද ඔවුන් දස දෙනෙකුගේ බලය පණ්ඩරයෙකු ගේ ද පණ්ඩර ඇතුන් දස දෙනෙකුගේ බලය තම්බ යෙකුගේ ද තම්බයන් දස දෙනෙකුගේ බලය පිංගලයෙකුගේ ද පිංගලයන් දස දෙනෙකුගේ බලය ගන්ධයකුගේ ද ගන්ධයන් දස දෙනෙකුගේ බලය මංගලයෙකුගේ ද මංගලයන් දස දෙනෙකුගේ බලය හේමයෙකුගේ ද හේමයන් දස දෙනෙකුගේ බලය උපොසථ-යෙකුගේ ද උපොසථයන් දස දෙනෙකුගේ බලය ඡද්දන්තයෙකුගේ ද ඡද්දන්ත ඇතුන් දස දෙනෙකුගේ බලය එක තථාගතයන් වහන්සේ නමකගේ නාරායන සංඝාට බලයයි. එය ප්‍රකෘති හස්ති ගණනින් ඇතුන් කෝටි දහසක බලයයි. පුරුෂ ගණනායෙන් පුරුෂ කෝටි දස දහසක බලය වේ. සියලු දසබල කායබලය චුන්ද කම්මාරයන් ගේ දානය වැළඳූ තැන් පටන් අළුපද්දක කැරකෙන ජලය මෙන් පිරිහී ගියේය. මෙසේ රෝගය සියලු නිරෝගිකම් මඩිමින් පැමිණේ.

මේ කරුණ දක්වමින් භාග්‍යවතුන් වහන්සේ මුළු ලෝකයටම සංවේගකර වදන් දක්වමින් අනඳ තෙරුන් අමතා ආනන්ද, සල් ගස් යුගලය අතර උතුරට හිස කොට ඇඳ පනවන්න. ආනන්ද, ක්ලාන්ත යෙමි. වැද හොවිමියි වදාළ සේක. එසේය ස්වාමීනියි පිළිතුරු දුන් අනඳ තෙර ඒ උයනෙහි රජ කුලයට සයන මඤ්චයක් ඇත. එය ගෙන යමක සල්ගස් අතර උතුරට හිස කොට පැනවීය.

භාග්‍යවතුන් වහන්සේ සල්ගස් යුගලය අතර උතුරට හිසලා ඇදෙහි නොනැගිටීමි යන සංඥාව මෙනෙහි කොට පයින් පය බාධා නොවන සේ තබා සිහියෙන් නුවණින් දකුණුඇලයෙන් සිංහ ශය්‍යා කළ සේක. එකල යමක සල්ගස් නොකල් මලින් මුළුමණින් පිරී ගියේය. ඒවා තථාගත ශරීරයෙහි වැගිරේ. වැතිරේ. හාත්පසින් විසිරේ. සල්ගස් පමණක් මුළුමනින් පිපුණේ නො වේ. සියලු රුක් මලින් පිරී ගියේය. ඒ උයනෙහිම පමණක් නොවේ. සියලු දස දහසක් සක්වළ මල් පිපෙන ගස් මලින් පිරී ගියේය. ගෙඩි ගන්නා ගස් ගෙඩිවලින් පිරී ගියේය. සියලු ගස් කඳවල කඳ පියුම් ද ශාඛාවල ශාඛාපියුම් ද වැල්වල වැල් පියුම් ද පිපුණේය. අහස අහස් පියුම් එල්ලුණේය. පොළෝ තලය බිඳගෙන එක් දණ්ඩක් ඇති සත්බුමු පියුම් පිපුණේය. මුළු මහසයුර පස්වනක් පියුමින් ගැවසී ගත්තේය. තිස් දහසක් යොදුන් දිග පුළුලැති හිමවත නිරන්තර ඝන බත්ධිත මොනරපිල් කළප් මෙන් ද මලින් පිරූ සුමුගක් මෙන් ද මලින් කළ පර්යංකයක් මෙන් ද රමණීය විය. දිව්‍ය ලෝකයෙහි නන්දන වන පොකුණින් රන්වන් රේණු යුත් මඳාරාමල් අහසින් වැටෙයි. හුදෙක් මඳාරාමල් පමණක් ද නොවෙයි. අනෙකුත් පරසතු කෝවිලාරාදි මල් ද රුවන් කරඬුවල පුරවා සක්වළ මුවවිටින් ද තිදසපුරයෙන් ද බඹලොවින් ද වැගිරෙයි. අහසින් නාගයෝ ද අවුත් පත් කැකුළු රේණු ආදිය පිරි කරඬුවලින් තථාගත ශරීරයෙහි වගුරවති.

දිව්‍යමය සඳුන් සුණු අහසින් වැටෙයි. එපමණක් ද නොවෙයි. සියලු කළුඅගිල් ආදි සුගන්ධ ජාති ද වැගිරෙයි. දෙවියෝ එකම සක්වළට රැස්ව අහස්හි දෙව්තුරු වයති. දිව සංගීත ද අහසෙහි පවත්වති. දීර්ඝායුෂ්ක දෙවියෝ මහාපුරුෂයන් වහන්සේ මිනිස් පියසෙහි ඉපිද බුදුවන්නේයයි අසා පිළිසිඳගන්නා දවසෙහි යමුයි මාලා ගොත්තන්නට පටන් ගත්හ. ගොතන ඔවුහු මවුකුස පිළිසිඳ ගත්හ. තෙපි කාට ගොතන්නහුදැයි අසන ලදුව තව අවසන් නැත. මවු කුසින් නික්මෙන දවසෙහි ගොතාගෙන යමුයි කීහ. බිහිවීයයි අසා මහබ්‍රහ්මයන් දවසෙහි යමුයි එකුන්තිස් වසක් ගිහිගෙයි වැස

අද මහබිනික්මන් කළහයි අසා බුදුවන දවසෙහි යමුයි සාවුරුද්දක් ප්‍රධන්වීයත්‍රය වඩා අද බුදු වූහයි අසා දම්සක් පැවැතුම් දිනයෙහි යමුයි අට සතියක් බෝමැඩ ගෙවා ඉසිපතනයෙහි දම්සක් පැවැත්වූහයි අසා යමාමහපෙළහර දවසෙහි යමුයි කියා බුදුවීමෙන් සත්වන අවුරුද්දෙහි ගණ්ඩ අඹරුක් මුල්හි තීර්ථක දමනය සඳහා යමක ප්‍රාතිහාර්‍යය පැවැත්වූහයි අසා දේවෝරෝහණයෙහි යමුයි කියා තව්තිසාවෙහි තුන් මසක් වස් වැස අද දේවෝරෝහණය කළ සේකැයි අසා ආයුසංස්කාර අත් හැරීමෙහි යමුයි කියා අසූවිය ඇති භාග්‍යවතුන් වහන්සේ අද චාපාල චේතියෙහි ආයුසංස්කාර හළ සේකැයි අසා පිරිනිවන් දිනයෙහි යමුයි කියා අද භාග්‍යවතුන් වහන්සේ යමක සල්ගස් අතර දකුණැලයෙන් සිහියෙන් මනා නුවණින් සිංහශය්‍යාවට පැමිණ උදැසනම පිරිනිවෙති. තෙපි කාට ගොතන්නහු දැයි අසා නොනිමිය දීම ගෙනවුත් ඇතුළු සක්වළ ඉඩක් නොලැබ සක්වළ මුවවිටෙහි එල්වා වටේ සිට අතින් අත ගෙලෙන් ගෙල ගෙන රත්නත්‍රය අරභයා දෙතිස් මහාපුරුෂ ලක්‍ෂණ ද සවනක් රස් ද දස පාරමිතා ද පන්සිය පනහක් බුද්ධ සම්බුද්ධ ඤාණ ගුණ ද ගායනා කළහ. සංගීතගත ඒවා ගුවන්කුස පවතී.

භාග්‍යවතුන් වහන්සේ යමක සල්ගස් අතර දකුණැලයෙන් හෙව පොළෝ තලයෙහි පටන් සක්වළ පර්යන්තය දක්වා සක්වළ මුවවිට පටන් බඹලොව දක්වා රැස් වූ පිරිසේ මහත් උත්සාහ දැක අනඳ තෙරුන් ඇමැතුහ. ආනන්ද, යමකසාලයෝ මුලපටන් අගට පිපුණාහ. ඔවුහු නොකල් මලින් තථාගත ශරීරයට වගුරුවති. විසුරුවති. හාත්පසින් විසුරුවති. තථාගත ශරීර පූජා පිණිස දෙව් මදාරා මල් අහසෙහි පවතී. දෙව්සඳුන්සුණු පවතී. දිවතුරු පවතී. දෙව් සංගීත පවතී. ආනන්ද, මෙපමණකින් තථාගතයන් වහන්සේට සත්කාර කරන ලද්දේ නොවෙයි. ගරු කරන ලද්දේ හෝ මානනය කරන ලද්දේ හෝ පූජා කරන ල්දදේ හෝ නොවේ. ආනන්ද, ලෝකයෙහි යම් භික්‍ෂුවක් හෝ භික්‍ෂුණියක් හෝ උපාසකයෙක් හෝ උපාසිකාවක් ධම්මානුධම්ප්‍රතිපත්ති ඇතිව අනුධම්මචාරීව වාසය

කරයි ද ඔහු තථාගතයන් වහන්සේට සත්කාර කරති. ගරුකාර කරති. මානනය කරති. පරම පූජාවෙන් පූජා කරති. එබැවින් ආනන්ද මෙහිලා ධම්මානුධම්මප්‍රතිපන්නයෝ වෙමු. අනුධම්චාරී වෙමු කියා මෙසේ හික්මිය යුතුය. ආනන්ද මෙසේම ඔබ හික්මිය යුතුයයි වදාළ සේක.

කුමක් හෙයින් භාග්‍යවතුන් වහන්සේ එක් කුඩාමලක් පමණ හෝ ගෙන කළ බුද්ධ පූජාවෙහි විපාකය බුදුනුවණින් මුත් පිරිසිඳ නොදැක්විය හැකියයි වෙන තන්හි ප්‍රකාශ කොට මෙහි මේසා මහත් පූජා ප්‍රතික්ෂේප කරන සේක් ද? පිරිසට අනුකම්පාවෙන් සහ සසුනෙහි චිරස්ථිතිය කැමැත්තෙනි. ඉදින් භාග්‍යවතුන් වහන්සේත් මෙසේ ප්‍රතික්ෂේප නොකළ හොත් අනාගතයෙහි භික්ෂූහු සීලය ආ තැන සීල ප්‍රතිපත්තිය නොපුරති. සමාධිය ආ තැන සමාධිය නොපුරති. විදර්ශනාව ආ තැන විදර්ශනාව නොපුරති. උපස්ථායක යන් සමාදන් කොට ආමිස පූජාව කරමින් වාසය කරති. මේ ආමිස පූජාවත් මහත් ඵලම වෙයි. ස්වාමීනි, අපි කෙසේ නම් තථාගත ශරීරයෙහි පිළිපදිනෙමු ද? ආනන්ද, ඔබලා එහි ව්‍යාවෘත නොවව්. දැන් ඔබලා සදර්ථයෙහි යෙදෙව්. සදර්ථයෙහි අප්‍රමාදව කෙලෙස් තවන වෙර ඇතිව වියහීවත් වව්. ආනන්ද, ක්ෂත්‍රිය පණ්ඩිතයෝත් බ්‍රාහ්මණ පණ්ඩිතයෝත් ගෘහපති පණ්ඩිතයෝත් සිටිති. ඔවුහු ද තථාගතයන් වහන්සේ කෙරෙහි පැහැදුණාහුය. ඔවුහු තථාගතයන් වහන්සේගේ ශරීරයෙහි පූජා පවත්වති.

ස්වාමීනි, කෙසේ නම් තථාගත දේහයෙහි පිළිපැදිය යුතු ද? ආනන්ද, සක්විති රජකුගේ සිරුරෙහි යම්සේ පිළිපදිත් ද තථාගත දේහයෙහි ද එසේ පිළිපැදිය යුතුය. ස්වාමීනි, සක්විති රජකුගේ ශරීරයෙහි කෙසේ පිළිපැදිය යුතු ද? ආනන්ද, සක්විති රජුගේ ශරීරය නොයිදුල් පිළියෙන් වෙළති. නොයිදුල් පිළියෙන් වෙළා පිරිසිදු කළ කපු පුළුනින් වෙළති. සුපිරිසිදු කපු පුළුනින් වෙළා නොයිදුල් පිළියෙන් වෙළති. මේ ක්‍රමයෙන් පන්සියයක් යුගල සළුවෙන් සක්විති සිරුර වෙළා ලොහ තෙල් දෙණක බහා වෙනත් දෙණකින් වසා

සියලු සුවඳ දරින් චිතකයක් කොට සක්විති රජුගේ සිරුර දවන්නේය. මෙසේ ආනන්ද සක්විති රජුගේ සිරුරෙහි පිළිපදිති.

තථාගත දේහයෙහි ද මෙසේ පිළිපැදිය යුතුය. සතර මං සන්ධියක තථාගතයන් වහන්සේගේ ස්තූපය කළ යුතුය. යමෙක් එහි මල් හෝ සුවඳ හෝ විලවුන් හෝ පුදත් ද ඡත්‍රයක් හෝ කොඩියක් හෝ පතාකයක් හෝ නගත් ද වඳිත් ද සිත හෝ පහදවත් ද එය ඔවුන්ට හිතසුව පිණිස බොහෝ කල් පවත්නේය. ආනන්ද, මේ ථූපාර්හයෝ සිව්දෙනෙකි. කවරහු ද? අර්හත් සම්‍යක් සම්බුද්ධ තථාගතයන් වහන්සේ ථූපාර්හ වෙති. පසේබුදුරජාණන් වහන්සේ ථූපාර්හ වෙති. තථාගත ශ්‍රාවක තෙම ථූපාර්හ වෙයි, සක්විති රජ ථූපාර්හ වෙයි. කවර අර්ථයක් නිසා ආනන්ද තථාගතයන් වහන්සේ ථූපාර්හ වෙත් ද? මේ ඒ අර්හත් සම්‍යක් සම්බුද්ධ භාග්‍යවතුන් වහන්සේගේ ථූපයයි කියා බොහෝ දෙන සිත් පහදවති. ඔවුහු එහි සිත් පහදවා කය බිඳී මරණයෙන් පසු සුගති ස්වර්ග ලොකයෙහි උපදිති. ආනන්ද, මේ කරුණින් තථාගතයන් වහන්සේ ථූපාර්හ වෙති. කවර කරුණින් ආනන්ද පසේ බුදුහු ථූපාර්හ වෙත් ද? මේ ඒ පසේ-බුදුන්ගේ ථූපයයි කියා බොහෝ දෙනා සිත් පහදවති. ඔවුහු එහි සිත් පහදවා මරණින් මතු දෙව් ලොව උපදිති. මේ නිසා පසේ බුදුහු ථූපාර්හ වෙති. කවර කරුණක් නිසා ආනන්ද තථාගත ශ්‍රාවක ථූපාර්හ වෙයි ද? මේ ඒ අර්හත් සම්‍යක් සම්බුද්ධ තථාගත ශ්‍රාවකයන්ගේ ථූපයයි කියා සිත් පහදවති. ඔවුහු එහි සිත් පහදවා මරණින් මතු දෙව්ලොව උපදිති. මේ කරුණින් තථාගත ශ්‍රාවක ථූපාර්හ වෙයි. ආනන්ද කවර කරුණක් නිසා සක්විති රජ ථූපාර්හ වෙයි ද? මේ ඒ ධාර්මික ධර්මරාජයන්ගේ ස්තූපයයි කියා බොහෝ දෙනා සිත් පහදවති. ඔවුහු එහි සිත් පහදවා මරණින් මතු දෙව් ලොව උපදිති. මෙ කරුණින් සක්විති රජ ථූපාර්හ වෙයි, ආනන්ද මේ සතර දෙන ථූපාර්හයෝයි.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ අනඳ තෙරුන් වහන්සේට වසන තැන් දෙසූහ. චෛත්‍ය චාරිකාව, ශාස්තෘ භාවය දෙසූහ.

මාගමුන් කෙරෙහි පිළිපැදිය යුතු ආකාරය පිළිබඳව විසඳූහ. තමන් වහන්සේගේ දේහයෙහි පිළිපැදිය යුතු ආකාරය දෙසූහ. සතර ථූපාර්හයින් දෙසූහ. ඉක්බිති ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ අහෝ ඒකාන්තයෙන් අද භාග්‍යවතුන් වහන්සේ පිරිනිවෙන සේකැයි එයම සිතන්නාහු බලවත් දොම්නසට පත් වූහ. උන්වහන්සේට මෙසේ සිත්විය. බුදුන් ඉදිරියෙහි ඇඬීම අපහසුය. පැත්තකට ගොස් ශෝකය තුනීකර ගනිමි. උන්වහන්සේ එතනින් පිටත්ව විහාරයට වැදී අගුළු දණ්ඩයෙහි එල්ලී අඬ අඬා සිටියහ. මම සේඛ වෙමි. කළයුතු දේ ඇත්තෙමි. මට අනුකම්පා දක්වන ශාස්තෘන් වහන්සේගේ පිරිනිවීම ද වෙයි. දැන් හෙට පටන් කාහට මුවදෝනා පැන් දෙන්නෙම් ද? කාහට සෙනසුන් පිළියෙළ කරන්නෙම් ද? කාගේ පා දොවන්නෙම් ද? කාගේ පාසිවුරු ගෙන පසුපස යන්නෙම්දැයි මේ ආදිය කිය කියා බොහෝ සෙයින් වැලපුණේය.

එවිට භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් අතර අනඳ තෙරුන් නොදැක මූහණෙනි, ආනන්ද කොහිදැයි භික්ෂූන්ගෙන් විමසූහ. ස්වාමීනි, ආනන්ද ආයුෂ්මතුන් වහන්සේ වෙහෙරට වැද අගුළු දණ්ඩෙහි එල්ලී අඬ අඬා සිටිතියි සැලකළහ. එවිට භාග්‍යවතුන් වහන්සේ භික්ෂුනමකට අමතා මාගේ වචනයෙන් ආනන්ද කැඳවන්නැයි වදාළහ. එසේය ස්වාමීනියි ඒ භික්ෂුනම අනඳ තෙරුන් වෙත ගොස් ආනන්දයෙනි, භාග්‍යවතුන් වහන්සේ ඔබ කැඳවන සේකැයි කීහ. එසේය ඇවැත්නි කියා අනඳ තෙර බුදුන් කරා ගොස් වැඳ පසෙක හිඳ ගත්තේය. පසෙක හුන් අනඳ තෙරුන්ට භාග්‍යවතුන් වහන්සේ "ආනන්ද ශෝක නොකරව. නොවැලපෙව. ආනන්ද සියලුම ප්‍රිය දෙයින් මනාප දෙයින් ඈත් වීම වෙන්වීම වෙනසට පත්වීම පළමුවෙන් ම මා විසින් කියන ලද්දේ නොවේ ද? හටගත් උපන් රැස්කළ වෙනස්වනසුලු ලෝදහම් ඇති කල එය එසේ නොවේවායි යන්නක් කොයින් ලබන්න ද? එය නොවන් නේමය.

ආනන්දය, ඔබ විසින් මෛත්‍රී සහගත කායකර්මයෙන් මෛත්‍රී සහගත වාක්කර්මයෙන් මෛත්‍රී සහගත මනඃකර්මයෙන් හිතවත්ව

සුවයෙන් අර්ථයෙන් අප්‍රමාදයෙන් තථාගතයන් වහන්සේට දිගු කලක් උපස්ථාන කරන ලද්දේය. ආනන්ද, ඔබ කළ පින් ඇති කෙනෙකි. ප්‍රධන් වීර්‍යයෙහි යෙදෙන්න. වහා රහත් වන්නේය. ධම් සංගීති කාලයෙහි රහත් වන්නේය. මා වැන්නකුට කරන ලද වතාවත් නිෂ්ඵල නොවන්නේයයි භාග්‍යවතුන් වහන්සේ මෙසේත් වදාරා පොළොව පතුරු වන්නාක් මෙන් අහස දිග හරින්නාක් මෙන් තන් අයුරින් තෙරගුණ වදාළ සේක. මෙසේ වදාළ කල්හි අනඳ තෙරණුවෝ "ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ මේ කුඩා නගරයෙහි මේ අප්‍රකට නගරයෙහි මේ ශාඛා නගරයෙහි පිරිනිවන් නොපාන සේක්වා. මේ වෙනත් චම්පා, රාජගහ, සාකේත, කෝසම්බි, බාරාණසී වැනි මහා නගර ඇත්තේය. භාග්‍යවතුන් වහන්සේ එවැනි මහනුවරක පිරිනිවෙන සේක්වා. එහි බොහෝ මහාසාර ක්ෂත්‍රියයෝත් මහාසාර බ්‍රාහ්මණයෝත් මහාසාර ගෘහපතියෝත් සිටිති. තථාගතයන් වහන්සේ කෙරෙහි අතිශයින් පැහැදුණු ඔවුහු තථාගත ශරීර පූජා කරතියි සැලකළහ.

එවිට භාග්‍යවතුන් වහන්සේ ආනන්ද කුඩා නගරය අප්‍රකට නගරය ශාඛා නගරයයි මෙසේ නොකියන්න. ආනන්ද, පෙර මහා සුදස්සන නම් සතර දිවයින් දිනූ සත්රුවණින් සමන්නාගත ධම්රාජ වූ සක්විති රජෙක් විය. ඒ මහාසුදස්සන රජුට මේ කුසිනාරාවම කුසාවතී නම් රාජධානිය විය. පෙරදිගින් හා බටහිරින් දොළොස් යොදුන් පමණ දික් විය. උතුරින් දකුණින් සත්යොදුන් පුළුල් විය. ආනන්ද, සමෘද්ධිමත් සපිරුණු කුසාවතිය මිනිසුන්ගෙන් ආකීර්ණ විය. සුභික්ෂ ද විය ආදි වශයෙන් මුළු මහත් සුදස්සන සූත්‍රය දේශනා කළහ. දේශනා කොට අනඳ තෙරුන් වහන්සේට "ආනන්ද, යන්න, ඔබ කුසිනාරාවට ගොස් කුසිනාරාවේ මල්ලයන්ට වාසෙට්ඨයිනි, ඉදිරියට යන්න. අද රෑ පාන්දර තථාගතයන් වහන්සේගේ පරිනිර්-වාණය සිදුවෙයි. වාසෙට්ඨයිනි, අපගේ ගම්කෙතෙහි තථාගතයන් වහන්සේගේ පිරිනිවන සිදුවිය. අපි තථාගතයන් වහන්සේ ගේ පශ්චිම දර්ශනය ලැබීමට නොහැකිවීමු කියා පසුව පසුතැවිලි නොවව් කියා දන්වන්නැයි වදාළහ.

එසේය ස්වාමීනි, කියා අනඳ තෙරුණුවෝ හැඳ පෙරව පාසිවුරු ගෙන තනිවම කුසිනාරාවට පිවිසියහ. එවේලෙහි කුසිනාරාවෙහි මල්ලයෝ කිසියම් වැඩකට සන්ථාගාරයෙහි රැස්ව සිටියහ. අනඳ තෙරණුවෝ සන්ථාගාරයට ගොස් පිරිනිවන් පුවත දන්වා නික්ම ගියහ. එපවත් අසා සියලු මල්ලයෝ ද මල්ල ලෙහෙලියෝ ද මල්ල භාර්යාවෝ ද දුකට පත්ව දොම්නස් සිතින් දුක් පෙරදැරිව සමහරු කෙස් විසුරුවාගෙන හඬති. හිස අත බදාගෙන අඬති. ප්‍රපාතයෙහි මෙන් පෙරළෙති. වැටෙති. හාත්පසින් වැටෙති. අහෝ ඉක්මනින්ම භාග්‍යවතුන් වහන්සේ පිරිනිවෙති. සුගතයන් වහන්සේ ඉක්මනින් ම පිරිනිවෙති. ලෝකයෙහි ඇස වහා අතුරුදහන් වෙයි කියා හඬා වැලප ඒ සියල්ලෝම දීප ධූප ගන්ධ මාලාදි පූජා සත්කාර ගෙන සල්වනයට ගොස් අනඳ තෙරුන් හමුවූහ.

අනඳ තෙරණුවෝ පෙරයමම අඹුදරුවන් සහිත මල්ලයන් ලවා බුදුන් වැන්දවූහ. භාග්‍යවතුන් වහන්සේ මල්ලයන්ට අනිත්‍යතා ප්‍රතිසංයුක්ත දහම් දෙසා පිටත් කළහ. එවේලෙහි සුප්‍රකට මහාසාර බමුණු කුලයකින් පැවිදිවූ සුභද්ද නම් පරිබ්‍රාජකයෙක් වාසය කරයි. හෙතෙම අද රාත්‍රි අලුයම යමක සාලයන් අතර භාග්‍යවතුන් වහන්සේගේ පරිනිර්වාණය වෙතැයි අසා තුවණ මුහුකුරා ගිය බැවින් බුද්ධෝත්පාදය දුර්ලභයයි සලකා බුදුන්ගේ පශ්චිම දර්ශනය සඳහා ද ප්‍රශ්නයක් දැන ගැනීම සඳහා ද තමහට ඉඩක් ලබා ගැනීම පිණිස අනඳ තෙරුන්ට මෙසේ කීය. "ආනන්දයෙනි, වැඩිමහල් මහලු පරිබ්‍රාජක ආචාර්‍යවරුන්ගෙන් ලෝකයෙහි අර්හත් සම්‍යක් සම්බුද්ධ තථාගතයන් වහන්සේ උපදින සේකැයි අසා ඇත්තෙමි. අද රාත්‍රි පශ්චිම යාමයෙහි ශ්‍රමණ ගෞතමයන් වහන්සේගේ පරිනිර්වාණය සිදුවෙතැයි අසා ඇත්තෙමි. මට උපන් මේ සැකයෙක් ද ඇත්තේය. භවත් ආනන්දය, ශ්‍රමණ ගෞතමයන් වහන්සේ මාගේ සැකය දුරු කිරීමට සමත් වෙතැයි මාගේ පැහැදීමක් ද ඇත්තේය. භාග්‍යවතුන් වහන්සේ මාගේ මේ සැකය දුරුකර ගැනීමට ධම් දේශනා කරන

සේක. ආනන්දයෙනි, මට උත්වහන්සේ දැකීමට ඉඩක් ලැබෙන්නේ නම් මැනව කියායි. එසේ කී කල අනඳ තෙරණුවෝ සුභද්ද, කම් නැත. තථාගතයන් වහන්සේට වෙහෙස නොකරන්න. භාග්‍යවතුන් වහන්සේ ක්ලාන්තයයි කීහ. දෙවනු තෙවනුවත් සුභද්ද, පරිබ්‍රාජක අනඳ තෙරුන්ගෙන් අවසර පැතීය. දෙවනු තෙවනුවත් අනඳ තෙරණුවෝ සුභද්ද පරිබ්‍රාජකගේ ඉල්ලීම ප්‍රතික්ෂේප කළහ.

එවිට විනේයජනයන් වෙත අනුකම්පා ඇති භාග්‍යවතුන් වහන්සේ සුභද්ද පරිබ්‍රාජක සහ අනඳ තෙරුන් අතර කතා සල්ලාපය අසා කරුණා හරිත මිහිරි වදනින් අනඳ තෙරුන් අමතා ආනන්දය, කමක් නැහැ. සුභද්ද නොවළකන්න. සුභද්දට තථාගතයන් වහන්සේ දැකීමට ඉඩ දෙන්න. සුභද්ද යමක් අසයි නම් එය දැන ගැනීම පිණිසම අසයි. වෙහෙස කිරීමේ අදහසක් නැත. ඔහු අසන දේ විසඳා දෙමි. වහා එය ඔහු දැනගනී යයි වදාළහ. එවිට අනඳ තෙරණුවෝ සුභද්දට "සුභද්දයෙනි, යන්න. ඔබට භාග්‍යවතුන් වහන්සේ අවසර දෙතියි කීහ. අවසර ලත් සුභද්ද භාග්‍යවතුන් වහන්සේ වෙත ගොස් පිළිසඳර නිමවා "භවත් ගෞතමයන් වහන්ස, මේ පූරණ කස්සප, මක්ඛලි ගෝසාල, අජිත කේසකම්බල, පකුධ කච්චායන, සංජය බෙල්ලට්ඨපුත්ත, නිගණ්ඨනාත පුත්ත යන සමූහ ඇති ගණ ඇති ගණාචාර්ය ප්‍රකට කීර්තිමත් තීර්ථංකර බොහෝ ජනයාට සාධුසම්මත මහණ බමුණෝ වෙති. ඒ සියලු දෙන ස්වකීය ප්‍රතිඥා ප්‍රතිවේධ කළාහු ද නැත්නම් සමහරු ප්‍රතිවේධ කළාහුදැයි විචාළේය.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ඔවුන්ගේ අනෛර්යානික බව කීමෙන් වැඩක් නැති නිසාත් ඉඩ නැති නිසාත් සුභද්ද කම් නැත, එය තිබේවා යි ප්‍රතික්ෂේප කොට ඔහුට අනුරූප ධර්මයක් දේශනා කරමින් සුභද්ද ඔබට ධර්ම දේශනා කරමි. එය අසන්න. මනාව සිහිකරන්න කියා වදාළහ. එසේ යයි සුභද්ද පිළිතුරු දුන්නේය. භාග්‍යවතුන් වහන්සේ අටඟින් යුත් බඹගොස විහිදුවා සුභද්ද, යම් ධර්ම විනයක අරි අටඟි මඟ නොලැබේ ද එහි සෝතාපන්න ප්‍රථම

ශ්‍රමණයා ද නොලැබෙයි. දෙවෙනි ශ්‍රමණයා ද නොලැබෙයි. තුන්වෙනි සතරවෙනි ශ්‍රමණයා ද නොලැබෙයි. යම් ධර්ම විනයක අරි අටඟ මඟ ලැබෙයි ද එහිම ප්‍රථම දෙවන තුන්වන සතරවන ශ්‍රමණයෝ ලැබෙති. පරප්‍රවාද ශූන්‍යය. සුභද්ද මෙහිම භික්ෂූහු මනාව වාසය කරන්නාහ. ලෝකය රහතන්ගෙන් අශූන්‍ය වන්නේය.

> සුභද්ද, එකුන් විසිවන වියෙහි කිං කුසල ගවේසීව යම් පැවිද්දක් ලැබුයෙම් ද එතැන් පටන් පනස් වසකට වඩා ගෙවී ගියේය. න්‍යාය ධර්මයෙහි පිහිටීම් ඇත්තාවූ මේ සසුනින් බැහැර ව ශ්‍රමණයයි කිසිවෙක් නැත්තේය.

මෙසේ වදාළ කල්හි භාග්‍යවතුන් වහන්සේ විසින් දැහැමි කථාවෙන් දක්වන ලද සමාදන් කරවන ලද තෙදගන්වන ලද සතුටු කරවන ලද සුභද්ද ශ්‍රද්ධා ඇත්තෙක්ව බුදු සිරිපා සිරසින් වැඳ නැගිට බිම තබන ලද දණ මඬලින් යුතුව භවත් ගෞතමයන් වහන්සේ යටිකුරු වූවක් උඩුකුරු කරන්නාක් මෙන් -පෙ- නොයෙක් අයුරින් දහම් දෙසූ සේක. ඒ මම ධර්මයත් සංඝයාත් සහිතව භාග්‍යවතුන් වහන්සේ සරණ යමි. භාග්‍යවතුන් වහන්සේ වෙත මහණ උපසම්පදා ලබමියි සැලකළේය. සුභද්ද, පළමුව තීර්ථක වූ යමෙක් මේ සස්නෙහි මහණ උපසම්පදා අපේක්ෂා කරත් නම් සිව්මසක් පරිවාස රැකිය යුතුය. සිව්මස ගෙවීමෙන් සතුටු සිත් ඇති භික්ෂූහු භික්ෂුත්වය සඳහා මහණ උපසම්පදා කරති කියා වදාළහ. ස්වාමීනි, එසේ නම් මම සිව්මසක් වෙනුවට සිව් වසක්ම පරිවාස පුරමි. සිව්වස් අග සතුටු සිත් ඇති භික්ෂූහු මා මහණ උපසම්පදා කරත්වායි සැලකළේය. භාග්‍යවතුන් වහන්සේ අනඳ තෙරුන් අමතා සුභද්ද පැවිදි කරන්නැයි වදාළහ. එසේය ස්වාමීනියි කියා අනඳ තෙරණුවෝ සුභද්ද පසෙකුට කැඳවා ගෙන ගොස් පැවිදි කොට බුදුන් හමුවට ගෙන ආහ. භාග්‍යවතුන් වහන්සේ සුභද්ද උපසම්පදා කොට කමටහන් වදාළහ. සුභද්ද බුදුන්ගෙන් කමටහන් ගෙන තනිව විවේකව අප්‍රමාදීව කෙලෙස් තවන වෙර ඇතිව වාසය කරන්නේ නොබෝ කලකින්ම පිළිසිඹියාපත් රහත් ඵලයට පැමිණියේය.

උන්වහන්සේ භාග්‍යවතුන් වහන්සේගේ පශ්චිම ශ්‍රාවක බවට පත්ව බුදුන් කරා පැමිණ වැඳ හුන්හ.

මැදියම ඉක්මයත්ම පශ්චිම යාමයෙහි භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන්ට අවවාද කරමින් අනඳ තෙරුන් අමතා ආනන්ද ඔබලාට පාවචනය අතීත ශාස්තෘකය, ඔබලාට ශාස්තෘවරයෙක් නැත කියා සිතිය හැකිය. ආනන්ද, එය එසේ නොසිතිය යුතුය. ආනන්ද, මා විසින් ඔබලාට යම් ධර්මයක් චිනයක් දේශනා කරන ලද ද පනවන ලද ද එය මාගේ ඇවෑමෙන් ඔබලාගේ ශාස්තෘවරයායි. මේ අයුරින් අභිසම්බෝධියෙහි පටන් පිරිනිවන දක්වා මෙදෑතුර පන්සාලිස් වසක් යමක් දේසනා කරන ලද ද තෙපලන ලද ද ඒ සියල්ල ත්‍රිපිටකය, පඤ්චනිකාය, නවාංගය, සුවාසුදහසක් ධර්මස්කන්ධය, මහාපදේස වශයෙන් පවතී. මම තනිවම පිරිනිවෙමි. මම දැන් තනිව ඔබලාට අවවාද කරමි. අනුශාසනා කරමි. මා පිරිනිවි පසු මේ සුවාසූදහසක් ධර්මස්කන්ධය ඔබලාට අනුශාසනා කරන්නේය. අවවාද කරන්නේයයි භාග්‍යවතුන් වහන්සේ බොහෝ කරුණු දක්වා පුතුනට ධන දායාද දෙන පියෙකු මෙන් භික්ෂූන්ට ධර්ම දායාද බෙදමින් නැවතත් භික්ෂූන් ඇමැතු සේක. මහණෙනි, දැන් මම ඔබලා අමතමි. සංස්කාරයෝ නැසෙන සුලුය. නොපමාව සම්පාදනය කරව්. මේ තථාගතයන් වහන්සේගේ පශ්චිම වචනයයි.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ප්‍රථම ධ්‍යානයට සම වන්හ. ප්‍රථම ධ්‍යානයෙන් නැගී දුතියධ්‍යානයට සමවන්හ. දුතියධ්‍යානයෙන් නැගී තතියධ්‍යානයට සමවන්හ. තතියධ්‍යානයෙන් නැගී චතුර්ථ ධ්‍යානයට සමවන්හ. චතුර්ථධ්‍යානයෙන් නැගී ආකාසානඤ්චා යතනයට සමවන්හ. ආකාසානඤ්චායතනයෙන් නැගී විඤ්ඤා නඤ්චායතනයට සමවන්හ. විඤ්ඤානඤ්චායතනයෙන් නැගී ආකිඤ්චඤ්ඤායතනයට සමවන්හ. ආකිඤ්චඤ්ඤායතනයෙන් නැගී නේවසඤ්ඤානාසඤ්ඤායතනයට සමවන්හ. නේවසඤ්ඤා නාසඤ්ඤායතනයෙන් නැගී සඤ්ඤාවේදයිත නිරෝධයට සම වන්හ. එයට සමවන් භාග්‍යවතුන් වහන්සේගේ ආස්වාස ප්‍රශ්වාස නොවීය.

ආස්වාස ප්‍රශ්වාස අභාවය දුටු අනඳ තෙරණුවෝ ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ පිරිනිවි සේක්දැයි අනුරුද්ධ තෙරුන් වහන්සේගෙන් විමසූහ. ආනන්ද, තවම භාග්‍යවතුන් වහන්සේ නොපිරිනිවිසේක. සඤ්ඤා වේදයිත නිරෝධයට සමවන්හයි කීහ. අනුරුද්ධ තෙරුන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේ සමඟම නේව සඤ්ඤා නාසඤ්ඤායතනයෙන් නැගීම තෙක් සමවත් සමවැද දැන් භාග්‍යවතුන් වහන්සේ නිරෝධයට සමවන්හ. නිරෝධය තුළ කාල ක්‍රියාවක් නැතැයි දනිති. භාග්‍යවතුන් වහන්සේ සඤ්ඤා වෙදයිත නිරෝධ සමාපත්තියෙන් නැගී නේවසඤ්ඤානාසඤ්ඤායතනට සමවන්හ. ඉන් නැගී ආකිඤ්චඤ්ඤායතනයට සමවන්හ. ඉන් නැගී විඤ්ඤානඤ්චායතනයට සමවන්හ. ඉන් නැගී ආකාසානඤ්චා-යතනයට සමවන්හ. ඉන් නැගී චතුර්ථධ්‍යානයට සමවන්හ. ඉන් නැගී තෘතීයධ්‍යානයට සමවන්හ. ඉන් නැගී දුතියධ්‍යානයට සමවන්හ. ඉන් නැගී ප්‍රථමධ්‍යානයට සමවන්හ. ප්‍රථම ධ්‍යානයෙන් නැගී දුතියධ්‍යානයට සමවන්හ. දුතියධ්‍යානයෙන් නැගී තෘතීයධ්‍යානයට සමවන්හ. තෘතීයධ්‍යානයෙන් නැගී චතුර්ථධ්‍යානයට සමවන්හ. චතුර්ථධ්‍යානයෙන් නැගී සමනන්තරවම පිරිනිවී සේක.

පිරිනිවනත් සමඟම බිහිසුණු ලොමු ඩැහැ ගන්වන මහාභූමික මීපාවක් විය. දෙව් බෙර පැළී ගියේය. අහස ශුෂ්ක ගර්ජනා කළේය. අකල් විදුලිය නික්මුණේය. ක්ෂණික වර්ෂා ඇතිවිය. එවිට සියලු දස සහස්‍රී ලෝක ධාතුවෙහි දෙවියෝ රැස්ව පුහුදුන් දෙවියෝ තමන් දරාගත නොහැකිව කෙස් විසුරුවා ගෙන අඬක් හිස අත් බැඳ අඬති. කඳු පෙරළෙන්නාක් මෙන් පෙරළෙති. කැරකෙති. හාත්පසින් කැරකෙති. අහෝ සුගතයන් වහන්සේ ඉතා ඉක්මනින් පිරිනිවෙති. ලොව ඇස් ඇත්තවුන් වහන්සේ ලොවට ඇසක්වූ සුගතයන් වහන්සේ අතුරුදහන් වෙතියි කියායි. වීතරාගී දෙවියෝ සිහියෙන් නුවණින් ඉවසති. අහෝ සංස්කාර ඒකාන්තයෙන් අනිත්‍යයහ. ඒකාන්ත නොවෙති. පෙරළෙන සුලුය. භාග්‍යවතුන් වහන්සේ පිරිනිවි කල්හි අවීතරාගී භික්ෂූහු සමහරු දෙයත් බැඳ හඬති. භාග්‍යවතුන්

වහන්සේ ඉක්මනින් පිරිනිවීසේක. කවුරු නම් අපට අවවාද අනුශාසනා දෙනසේක් ද? කවුරු නම් බණ දෙසනසේක් ද? අහෝ අපි අනාථ වූයෙමු. මෙතැන් පටන් සදා සුපිරිසිදු රන්කැටපතක් බඳු බුදුමුවමඬල දක්නට නොලබන්නෙමු. දෙතිස් මහපුරිස් ලකුණින් හා අසීති අනුව්‍යඤ්ජනයෙන් සුසැදි සිරිසුගතරුව නොදකිමු. මිහිරි ධම් දේශනා නො අසමු යනාදිය කිය කියා හඬති, වැලපෙති.

විතරාගී භික්ෂූහු සිහියෙන් නුවණින් ඉවසා සිටිති. සංස්කාර අනිත්‍යයහ - පෙ- එසේ නොවේ වායි කොයින් ලැබේදැයි කියායි. අනුරුද්ධ තෙරණුවෝත් අනඳ තෙරණුවෝත් භික්ෂූන්ට දැහැමි කතා කරමින් රාත්‍රි ඉතිරි කොටස ගත කළහ. අහෝ මරණ ස්වභාවයෙහි බලවත්කමක මහත. දසබල ඇති වජ්‍ර වැනි කය ඇති දසබලධාරී බුදුවරුන්ටත් බිය නොවෙයි. ලජ්ජා නොවෙයි. අත නොහාරියි. සාරාසංඛ්‍ය කප් ලක්‍ෂයක් පැරැම් පිරූ, බුද්ධෝත්පාදය බලාපොරොත්තු වූ දස දහසක් සක්වළ දෙවියන් විසින් ආරාධනා කරන ලද, ජම්බුදීපාවතරණයෙහි දස දහසක් සක්වළ කම්පා කිරීම් ආදි අනෙක ප්‍රකාර පෙළහර දැක්වූ, මවුකුසින් බිහිවීමෙහිදී මහා බ්‍රහ්මාදි දෙවියන් විසින් පිළිගත්, උපන් කෙණෙහි ලෝකපාලයන් විසින් සුමට සුසිරු රන්දැලින් පිළිගත්, උපන් කෙණෙහිම සත්බුමු පියුම් පිට සිට සිංහනාද කළ, සතර පෙරනිමිති දැකීමෙන් රජසැප ඉවත ලූ, ඒ භාග්‍යවතුන් වහන්සේගේ ශරීරය සෙට අදාහනය කරමුයි අතිරේකතර නැටුම් ගැයුම් වැයුම් ආදියෙන් ද ගඳමල් ආදියෙන් ද සත්කාර කරමින් සත්වන දිනය ගත කළහ.

සත්වන දවස්හි සියලු රටවැසි මිනිස්සු නත් වැදෑරුම් ධජ පතාකාදියෙන් සියලු සල්වනය සැරසූහ. රටවැසි සියලු බ්‍රාහ්මණ ගෘහපති මහාසාරයන් විසින් කළ සත්කාරවල නිමක් නැත. දෙවියන් කළ සත්කාර පොළොවෙහි පටන් බඹලොව තෙක් පමණ නැත. කුසිනාරාවේ මල්ලයන්ට මෙසේ සිත්විය. අපි භාග්‍යවතුන් වහන්සේගේ දේහය නැටුමින් ගැයුමින් මලින් ගඳින් සත්කාර කරමින්

ගරුකාර කරමින් සම්මාන කරමින් නුවර දකුණින් දකුණට ගෙන ගොස් දකුණට උතුරින් බැහැර ආදාහනය කරමු කියායි. එකල මැදිවියෙහි සිටි ශක්ති සම්පන්න ප්‍රමුඛ මල්ලයෝ අට දෙනෙක් හිසෙහි නහා නොයිඳුල් පිළී හැඳ අපි බුද්ධශරීරය ඔසවමුයි රන් පලගෙයි තුබූ බබළන සත්රුවනින් විසිතුරු රන්වන් සිරුර එසවීමට අසමත් වෙති. එවිට මල්ලරජවරුන් දිවැස් ඇත්තවුන්ගෙන් අග්‍රප්‍රාප්ත අනුරුද්ධ තෙරුන්ගෙන් එයට කාරණ කිම්දැයි විමසූහ.

තෙරුන් වහන්සේ දිවැසින් ඒ කරුණ බලා වාසෙට්ඨයිනි, ඔබලාගේ බලාපොරොත්තුව එකකි. දෙවියන්ගේ අභිප්‍රාය එකකි. ස්වාමීනි, දෙවියන්ගේ අභිප්‍රාය කුමක් ද? අපි තථාගත දේහය නැටුම් ගැයුම් වැයුම් වලින් සත්කාර කරමින් නගරයේ උතුරින් උතුරට ගෙන ගොස් උතුරු දොරටුවෙන් නුවරට ඇතුළුව නගරය මැදට පැමිණ නැගෙනහිර දොරටුවෙන් නික්ම නගරයට නැගෙනහිර මල්ලයන්ගේ මකුටබන්ධන නම් චෛත්‍යයක් ඇත. එහි භාග්‍යවතුන් වහන්සේගේ දේහය ආදාහනය කරමු යනු දෙවියන්ගේ අභිප්‍රායයි. එසේ නම් ස්වාමීනි, දෙවියන්ගේ අභිප්‍රාය පරිදි එය වේවා. එකල්හි කුසිනාරාව දණක් පමණ අහසින් වැගුරුණු මදාරා මල්වලින් ගැවසී ගත්තේ විය. සියලු නුවර වැස්සෝ ද රට වැස්සෝ ද මේ බුද්ධ දේහයෙහි අවසන් දැක්මයයි සාකච්ඡා කොට බුද්ධ දේහයට පූජා සත්කාර මල් ධජ පතාකාදිය ද ගෙන රැස් වූහ. එවිට ඒ මල්ලයෝ අටදෙන බුද්ධ දේහය ඔසවා ගත්හ. ගෙන යන බුද්ධ දේහයට දේවතාවෝ ද කුසිනාරාවෙහි මල්ලයෝ ද දිව්‍යමය වූ ද මානුෂික වූ ද මලින් ගඳින් සත්කාර කරමින් නුවරින් උතුරට ගෙන උතුරු දොරටුවෙන් නුවරට පිවිස මධ්‍ය නගරයට ගෙන ආහ.

එකල්හි පුහුදුන් දිව්‍ය මනුෂ්‍යයෝ රන් ඇදෙහි හොවා ගෙන යන බුද්ධ දේහය දැක ඉවසා ගත නොහැකිව හැඬූහ. විලාප කීහ. මිනිසුන් දේහය ඔසවා ගෙන යද්දී බන්ධුලමල්ල සේනාපතිහුගේ බිරිඳ වූ මල්ලිකා දේවිය සිය සැමියාගේ මරණයෙහි පටන් නොපැළඳ තිබූ මහාලතා පසාධනය ගෙන මෙයින් බුදුන් පුදමියි මැඳ සුවඳ

දියෙන් සෝදා දොරටුවෙහි සිටියාය. ඕ තොමෝ බුද්ධ ශරීරය දොරටුවට පැමිණි කල මොහොතක් බුද්ධ ශරීරය බහාලවයි බහාලවා ඒ ආභරණය බුදුසිරුරෙහි හිස පටන් සිරිපා දක්වා සිටින සේ පැළඳවූවාය. රුවන්මුවා ආභරණය පැළඳ වූ භාග්‍යවතුන් වහන්සේගේ රන්වන් සිරුර අතිශයින් බැබළිණ.

ඕතොමෝ ඒ දැක පහන් සිතින් ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, සසර සැරිසරන තුරු මා මේ ආභරණයෙන් බැබළේවා. බබළන ආභරණය මෙන් මාගේ ශරීරය ද බැබළේවායි ප්‍රාර්ථනා කළාය. ඉක්බිති මල්ලයෝ බුද්ධ ශරීරය ඔසවා නුවර මැදින් ගෙන ගොස් නැගෙනහිර දොරටුවෙන් නික්ම නුවරට නැගෙනහිරින් පිහිටි මල්ලයන්ගේ මකුටබන්ධන නම් චෛත්‍යස්ථානයට ගෙන ගොස් තථාගත ශරීරයෙහි කෙසේ පිළිපදින්නෙමු දැයි අනඳ තෙරුන් ගෙන් විමසූහ. එවිට අනඳ තෙරුණුවෝ "වාසෙට්ඨයෙනි, සක්විති රජුගේ සිරුර නොයිදුල් සළුවෙන් වෙළති. නොයිදුල් සළුවෙන් වෙළා පෙළෑ කපුයෙන් වෙළති. පෙළෑ කපුයෙන් වෙළා නොපෙළෑ පිළියෙන් වෙළති. මේ ක්‍රමයෙන් පන්සියයක් සළු යුගලයෙන් ද පන්සියයක් කපු පටලයෙන් ද වෙළා සක්විති රජුගේ ශරීරය ලෝහ තෙල් දෙණක බහා වෙනත් තෙල් දෙණකින් වසා සියලු ගඳදරින් චිතකය කොට සක්විති රජසිරුර ආදහනය කරති. සතරමං සන්ධියෙහි සක්විති රජුගේ ස්තූපය කරති. මෙසේ සක්විති රජුගේ ශරීරයෙහි පිළිපැදිය යුතුය. බුද්ධ ශරීරයෙහි ද එසේ පිළිපැදිය යුතුය. එය බොහෝ කල් හිත සුව පිණිස පවතී.

ඉක්බිති කුසිනාරාවේ මල්ලයෝ කියන ලද පරිදි පන්සියයක් පිළී සඟළින් ද කපුපටල පන්සියයකින් ද තථාගත දේහය වෙළා සුවඳ තෙල් පිරවූ රන් දෙණක සිරුර බහා රන්දෙණකින් වසා සත්විසිරියන් උස චිතකය සඳුන් අරටුවෙන් හා සියලු සුගන්ධයෙන් කරවා මහත් සත්කාර කරමින් බුද්ධ දේහය එහි තැබූහ. එසමයෙහි මහාකාශ්‍යප තෙරුන් වහන්සේ පාවානුවරින් කුසිනාරාවට වූ දික් මඟට පිළිපන්හ. පන්සියයක් පමණ මහාභික්ෂුසංඝයා සමඟිනි.

එකල්හි තෙරුන් වහන්සේගේ සියලු භික්ෂු පිරිවර මනාව වැඩුණු බමුණු ගහපති සියුමැලිබැවින් යුක්තවූවාහු මද්දහනෙහි ගල් පොළොව වැනි භූමියෙහි පයින් යාමෙන් ක්ලාන්ත වූහ. තෙරුන් වහන්සේ ඒ දැක මේ භික්ෂූහු ක්ලාන්තයහ. යායුතු තැන ද දුරය. ටිකක් විවේක ගෙන වෙහෙස නිවා සවස කුසිනාරාවට ගොස් බුදුන් වඳිමියි සිතා මගින් ඉවත්ව ගසක් මුල හිඳිනා සමකඩ අතුරා වාඩිවූහ. පිරිවර භික්ෂූහු ද එහි ගස මුල හුන්හ.

එවේලෙහි එක්තරා ආජීවකයෙක් කුසිනාරාවෙන් මහහැළියක් පමණ මදාරා මලක් ගෙන කුඩයක් මෙන් දරමින් මහමඟ ඉදිරියෙන් එමින් සිටියේය. කසුප් තෙරණුවෝ දුරින්ම එන ආජීවකයා දැක "ආජීවකයාගේ අතෙහි මදාරා මලක් ඇත. මෙය හැමදා මිනිස් ලොව නොපෙනෙයි. යම් විටක සෘද්ධි විකුර්වණයක් හෝ බෝසතුන්ගේ මවුකුස පිළිසිඳ ගැනීමක් හෝ මවුකුසින් නික්මෙන කලක හෝ බුදුවන කල හෝ දම්සක් පවත්වන කල හෝ දක්නට ලැබේ. අද කිසිවෙකු විසිනුත් කළ සෘද්ධි විකුර්වණයක් නැත. බෝසතුන්ගේ මවුකුස පිළිසිඳ ගැනීමක් ද මවුකුසින් නික්මීමක් ද නැත. උන්වහන්සේගේ අභිසම්බෝධිය ද නොවේ. දම්සක් පැවැත්ම ද නොවේ. යමක ප්‍රාතිහාර්‍යයක් ද නැත. දේවෝරෝහණය ද නොවේ. ආයුසංස්කාර හැරීමක් ද නොවේ. මාගේ ශාස්තෘන් වහන්සේ මහලුය. පිරිනිවි සේක් විය හැකිය. දැන් ඔහුගෙන් අසමි" යි සිතා වාඩි වී ඇසුවොත් ශාස්තෘන් වහන්සේ කෙරෙහි අගෞරවයක් විය හැකියයි එකෙණෙහිම සිටි තැනින් නැගිට ඉවත්ව සන්නාහ රහිත ඡද්දන්ත ඇත්රජකු මෙන් තථාගතයන් වහන්සේ විසින් දෙන ලද රතු වලා පැහැති, පාංශුකූල චීවරය පෙරවා දසැඟිලි එකතු කළ ඇදිලි හිසෙහි තබා බුද්ධ ගෞරවයෙන් යුතුව ආජීවක ඉදිරියට පැමිණ "ඇවැත්නි, අපගේ ශාස්තෘන් වහන්සේ දන්නෙහිදැයි" ඇසීය. එසේය ඇවැත්නි. දනිමි. ශ්‍රමණ ගෞතමයන් පිරිනිවි සත්වන දිනය අදයි. මා මේ මදාරා මල ගත්තේ එතැනිනියි කීය.

එහිදී අවීතරාගී භික්ෂූහු එපවත් අසා තමන් වාවා ගත

නොහැකිව සමහරු හිස අත් බදාගෙන හඬති. කඳු කඩා වැටෙන්නාක් මෙන් පෙරළෙති. හාත්පසත් පෙරළෙති. වීතරාගී භික්ෂූහු සිහියෙන් නුවණින් ඉවසා සිටියහ. එවේලෙහි සුභද්ද නම් මහලු පැවිදිතෙම ඒ භික්ෂූන්ට "ඇවැත්නි, කමක් නැහැ. ශෝක නොවව්. නොවැලපෙව්. ඇත්තෙන්ම අපි ඒ මහාශ්‍රමණයාගෙන්, මිදුණෙමු. අපි මෙය තොපට කැපය මෙය තොපට නොකැපයයි බෙහෙවින් පීඩාවට පැමිණියෙමු. දැන් ඉතින් අපි යමක් කැමති නම් එය කරමු. යමක් අකමැති නම් එය නොකරමුයි" භික්ෂූන්ට කීය. මහකසුප් තෙරණුවෝ එයසා හෘදයප්‍රහාරයක් මෙන්, හිස මත වැටුණු ආයුධයක් මෙන් සිතමින් උන්වහන්සේට ධර්මසංවේගය උපණ. ඒ භාග්‍යවතුන් වහන්සේ පිරිනිවී සතියක් පමණි. අදත් උන්වහන්සේගේ රන්වන් සිරුර තිබෙයි. භාග්‍යවතුන් වහන්සේගේ ශාසනය බොහෝ දුක් විඳීමෙන් ඇති වූවකි. මෙබඳු පාපයක් උපන්නේය. කටුවක් උපන්නේය. මෙවැනි කථා වැඩියාමෙන් අන්‍යයෝ ද මෙවැනි සභායකයින් ලැබ සසුන දුබල කෙරෙති. මේ මහල්ලා මෙතැන්හිදීම රෙදි කඩක් හඳවා අළු ඉස්වා එලවා දමන්නෙම් නම් මනුෂ්‍යයෝ ද ශ්‍රමණ ගෞතමයන්ගේ ශරීරය තිබියදීම ශ්‍රාවකයෝ අවවාද දෙති කියා අපට දොස් දක්වතියි සිතූහ.

ටිකක් ඉවසමි. භාග්‍යවතුන් වහන්සේ විසින් දෙසූ ධර්මය සකස් නොකළ මල් ගොඩක් මෙනි. සුළඟට හසු වූ මල් මෙන් පාවී යයි. එසේම මෙවැනි පුද්ගලයන් නිසා නොබෝ කලකින්ම සද්ධර්මය ඇතුරුදහන් වෙයි. එබැවින් මම ධර්ම විනය සංග්‍රහ කරන්නෙමි. එසේ කල දැඩි හුයකින් එක් රැස් කළ ඇමුණූ මල් මෙන් මේ ධර්ම විනය නිශ්චලව පවතී. මේ නිසාම භාග්‍යවතුන් වහන්සේ මට තුන් ගව්වක් පෙරගමන් කළසේක. අවවාද කළ සේක. උපසම්පදාව දුන් සේක. කයින් කය සාධාරණ පාංශුකූල චීවරය පරිවර්තනය කොට දුන්සේක. චක්‍ර ලක්ෂණයෙන් සමලංකෘත වූ අත්තල අහසෙහි සොලවා චන්දොපමපටිපදාව දේශනා කරන සේක් මා කාය සාක්ෂ්‍ය කොට දේශනා කළ සේක. තමන් වහන්සේ හා සම කොට තැබීමෙන් මට අනුකම්පා කළ සේක. තෙවරක්ම සකල සාසන රත්නය මට

පැවරූ සේක. මා වැනි භික්ෂූන් සිටිද්දී මෙවැනි පාපීහු ශාසනයෙහි සහාය නොලබත්වා. යම්තාක් අධර්මය නොදිලේ ද විනය බැහැර නොවේ ද අවිනය ප්‍රකට නොවේ ද විනය බැහැර නොවේ ද අධර්මවාදීහු බලවත් වෙත් ද ධර්මවාදීහු දුබල වෙත් ද අවිනයවාදීහු බලවත් නොවෙත් ද විනය වාදීහු දුර්වල නොවෙත් ද ඒතාක් මම ධර්මයත් විනයත් සංගායනා කරමි. භික්ෂූහු තමන්ට පොහෝනා තරම් ගෙන කැප නොකැප කථා කරති. එවිට මේ පාපියා තෙමේම නිග්‍රහයට පැමිණේ. නැවත හිස ඔසවන්නට නොහැකිවෙයි කියා සිතා කිසිවෙකුටත් නොදන්වා දැහැමි කතාවෙන් භික්ෂූන් අස්වසමින් "ඇවැත්නි, කම් නැත. නොවැලපෙවු. ඇවැත්නි, භාග්‍යවතුන් වහන්සේ වීසින් සියලු ප්‍රිය මනාප දෙයින් වෙන්වීම ඉවත් වීම. වෙනස් බවට පත් වීම මූලදීම දේශනා කරන ලද්දේ නොවේ ද? උපන් හටගත් රැස්කරන ලද නැසෙන වෙනස්වනසුලු දෙය එසේ නොවේවායි යන මෙය කොයින් නම් ලබන්නහු ද මෙය නොවන්නේමය.

තෙරණුවෝ මෙසේ භික්ෂූන් සනසා උන්වහන්සේලා සමඟ කුසිනාරාවටම වැඩියහ. එකල ප්‍රමුඛ මල්ලයෝ සිව් දෙනෙක් හිසෙහි නහා නොපෙළූ රෙදි හැඳ අපි භාග්‍යවතුන් වහන්සේගේ ශරීරය ආදාහනය කරන්නෙමුයි තල්පතින් සලන්නාහු ගිනි පිඹින්නාහු දල් වන්නට අසමත් වෙති. එවිට ඒ කුසිනාරා වැසි මල්ලයෝ වටහා ගත නොහැකිව මෙය අනුරුද්ධ තෙරුන්ට සැලකළහ. උන්වහන්සේ ඒ බව දැන "වාසෙට්ඨයිනි, ඔබලාගේ අභිප්‍රාය එක් විධියකි. දෙවියන්ගේ අභිප්‍රාය එක් විධියකියි" කීහ. ස්වාමීනි, දෙවියන්ගේ අභිප්‍රාය කෙබඳු ද? වාසෙට්ඨයිනි, කසුප් තෙරුන් වහන්සේ පාවා නුවරින් කුසිනාරාවට පන්සියයක් පමණ භික්ෂූන් පිරිවරා දික්මඟට පිළිපන්හ. යම්තාක් කස්සප තෙරුන් වහන්සේ බුදුසිරිපා සියතින් වඳින සේක් ද එතෙක් භාග්‍යවතුන් වහන්සේගේ චිතකය නොදැල්වේවා යනු දෙවියන්ගේ අභිප්‍රායයි කීහ. ස්වාමීනි, දෙවියන්ගේ අභිප්‍රාය පරිදිම වේවායි තෙරුන් වහන්සේගේ පැමිණීම බලාපොරොත්තුවෙමින් සිටියහ.

ඉක්බිති මහාකාශ්‍යප තෙරණුවෝ කුසිනාරාවෙහි මල්ලයන්ගේ මකුටබන්ධන චෛත්‍යස්ථානයෙහි බුද්ධ චිතකය වෙත පැමිණ උත්තරාසංගය එකාංස කොට ඇදිලි බැඳ තෙවරක් පැදකුණු කොට අභිඤ්ඤාසිතින් ආවර්ජනය කරමින් බුදුසිරස මෙතැන්හි විය. බුදු සිරිපා මෙතැන්හි යයි සලකා සිරිපා සමීපයෙහි සිට අභිඤ්ඤාපාදක චතුර්ථ ධ්‍යානයට සමවැද එයින් නැගී "අර සහස්‍ර චක්‍රලක්ෂණ යුත් දසබලයන් වහන්සේගේ සිරිපා කපු පටල පන්සියයත් සළු සඟළ පන්සියයත් සහිත රන්දෙණ ද සඳුන් චිතකය ද දෙබේ කොට මාගේ උත්තමාංගයෙහි පිහිටන සේක්වායි අධිෂ්ඨාන කළහ. අදිටනත් සමඟම ඒ සියල්ල දෙබෑ කොට වලාකුළින් දෙසඳක් මෙන් දෙහිරක් මෙන් බුදුසිරිපා නික්මියේය. කසුප් තෙරණුවෝ ලීලෝපේත වූ සුරත් තල ඇති රන්වන් බුදු සිරිපා ගොප්මස තෙක් දැඩිව අල්වා ගෙන සිය හිසෙහි තබා වැන්දාහ. ස්වාමීනි ලෝක නායකයන් වහන්ස, මේ සිරිපාවලින් පෙර තුන්ගව්වක් මට පෙරගමන් කළ සේක. අහෝ මට අනුකම්පා කළ භාග්‍යවතුන් වහන්ස, මාගේ මේ අවසන් සිරිපා දර්ශනයයි. මේ අවසන් වන්දනාව යයි. නැවත නැවත හිස තබා පන්සියයක් භික්ෂූන් සමඟ බුදු සිරිපා වන්දනා කළහ. එතන රැස් වූ සියලු භික්ෂූහු ද වන්දනා කළහ.

ඉක්බිති සියලු මහජනයා ඒ අසිරිය දැක එක් විටම මහානාද පැවැත්වූහ. ගඳ මල් ආදිය පුදා කැමැති පරිදි වන්දනා කළහ. තෙරුන් වහන්සේ වැඳනා කළ පසු අලංකෘත පැහැති දහසක් අරයෙන් සැදි චක්‍රලක්ෂණ පිහිටි බුදු සිරිපා නැවත තෙරුන්ගේ අතින් මිදී අගරු සඳුන් ආදිය නොසොල්වා යථාස්ථානයෙහිම පිහිටියේය. බුදු සිරිපා වෙළෑ අයුරින්ම පැවැත්තේය. සිරිපා නික්මෙද්දී හෝ පිවිසෙද්දී කපු පුළුන්රොදක් හෝ පිළීවාටියක් හෝ තෙල් බින්දුවක් හෝ සඳුන් අගරු කැබල්ලක් හෝ තිබූ කැනින් සෙලවීමක් නම් නොවීය. සියල්ල නිසි තැනම සිටි ලෙසම පැවැත්තේය. බුදු සිරිපා නොපැනී ගිය කල නැගී බැස ගිය සඳ හිරු මෙන් විය. මහජනයා හැඬූහ. පිරිනිවී වේලාවටත් වඩා අධිකතර හැඬීම් විය. බුදු සිරිපා පිවිසි කෙණෙහිම චිතකය දැල්විණි.

ඇවිල ගැනීමත් සමඟම උපුල් පියුම් පුණ්ඩරීක කුමුදු සෙව්වන්දි ආදි මල් අහසින් වැටී චිතකයෙහි වැගිරෙයි. නන් අසිරි පහළ විය. බුද්ධ දේහය දැවෙද්දී සිවි සම් මස් නහර සෙම කියා යමක් හෝ එහි හළු ටිකක් හෝ නැත්තේමය. ඇට පමණක් ශේෂ විය. පෙර එකට සමූහව පැවැත්ම නිසා ශරීර නම් විය. දැන් භාග්‍යවතුන් වහන්සේගේ අධිෂ්ඨාන වශයෙන් විසුරුණු සමන් කැකුළු බඳු වූ සේදූ මුතු බඳු ධාතු අවශේෂ විය. දීර්ඝායුෂ්ක බුදුවරුන්ගේ ශරීරය රන්කඳක් මෙන් එකඝනම වෙයි. අල්පායුෂ්ක වූ අපගේ භාග්‍යවතුන් වහන්සේ ලෝකානුකම්පාවෙන් මෙසේ සිතූහ. මම බොහෝ කල් නොසිට පිරිනිවෙමි. මාගේ ශාසනය ද හැම තැන්හිම නොපැතිරිණ. එබැවින් පිරිනිවි මාගේ ධාතු විසිරේවා. අබැටක් පමණ මාගේ ධාතු ගෙන තමන් වසන තන්හි චෛත්‍යයක් කොට පුදනු ලබන්නාහු ස්වර්ග පරායණ වෙත්වායි සිතා ධාතු විසිරීම අධිෂ්ඨාන කළහ.

කෙතෙක් ධාතු නොවිසිරිණ ද? කෙතෙක් විසිරිණ ද? සතර දළදා, දෙඅකු, උණ්හීසය යන මේ සත්ධාතූහු නොවිසිරුණහ. සෙස්ස විසිරුණේය. එයින් හැමට කුඩා ධාතුව අබැටක් පමණ විය. මහා ධාතු කඩසහල් පමණ විය. මහත් මැදින් කැඩුණු ධාතු මුංඇට පමණ විය. ඉතිරි පන්සියයක් වස්ත්‍ර යුගලයෙන් දෙකක් දැවී ගියේය. අභ්‍යන්තර බාහිර සියල්ල දැවී ගිය පසු අහසින් දෙදිය දහරක් පහළ වී චිතකය නිවීමට චිතකය පිරිවරා සිටි සල්ගස්හි වෙළෙප් අතරින් නික්ම චිතකය නිවීය. හාත්පසින් පොළොව පැළී නගුලිස් පමණ දියදහරා පළිගු මෙන් උඩ නැග චිතකය නිවීය. කුසිනාරා නුවර මල්ලයෝ ද රන්රිදී කළ පුරවාගෙන ආ සුවඳ දියෙන් චිතකය නිවූහ. රන්රිදීමුවා අට කළයකින් දිය ඉස සඳුන් චිතකය නිවා මල්ලරජවරු සභාගාරයෙහි සිව්දෑගඳ පිරිබඩ ගන්වා ලදපස්මල් ඉස මත්තෙහි රෙදි වියන් බඳවා රන්තරු ආදියෙන් සරසා සුවඳදම් මල්දම් රුවන්දම් එල්වා මිණිදඬුවල රෙදිවලින් පස්වනක් කොඩි ඔසවා හාත්පස ධජ පතාකාදියෙන් වටකොට සුපිරිසිදු උක් කෙසෙල්

ද පුන් කලස් ද තබා දඬුවැට පහන් දල්වා සැරසූ ඇත් කඳ මත සධාතුක රන් දෙණ තබා මලින් ගඳින් පුද කොට සාධුක්‍රීඩා කරමින් දෙවිනුවරක් බඳු අලංකාර නගරයට වැඩමවා සභාගාරයෙහි සත්රුවන්මුවා පලඟක තබා සේසත් දැරූහ. ඉක්බිති කුසිනාරා වැසි මල්ලයෝ ශාරීරික ධාතු සත් දිනක් සභාගාරයෙහි සක්කිපඤ්ජරයක් කොට ප්‍රාකාරයක් මෙන් වට කොට නැටුම් ගැයුම් වැයුමින් මලින් ගඳින් සත්කාර කළහ. ගරුකාර කළහ. සම්මාන කළහ. පූජා කළහ.

වෙදේහි පුත්‍ර අජාතසත්තු මගධ රජ භාග්‍යවතුන් වහන්සේ කුසිනාරාවෙහි පිරිනිවි සේකැයි ඇසීය. කෙසේ ඇසී ද? පළමුවෙන්ම ඔහුගේ ඇමැතියෝ අසා මෙසේ සිතූහ. ශාස්තෘන් වහන්සේ නම් පිරිනිවි සේක. නැවත උන්වහන්සේ ගෙන ආ නොහැකිය. පුහුදුන් ශ්‍රද්ධාවෙන් අපගේ රජුට සමාන වූවෙක් නැත. ඉදින් එතුමා මේ විධියෙන්ම ඇසුවොත් හදවත පැළී යනු ඇත. අප විසින් රජ රැකිය යුතුය කියායි. ඔවුහු රන්දෙණ තුනක් ගෙන්වා චතුමධුරයෙන් පුරවා රජු වෙත ගොස් මෙසේ කීහ. දේවයන් වහන්ස, අපි ආරක සිහිනයක් දුටුවෙමු. එය සන්සිඳවීම පිණිස ඔබ වහන්සේ දුහුල් සළුවක් ඇඳ නාසය පමණක් පෙනෙන සේ චතුමධුර දෙණක සයනය කළ යුතුයි කියායි. රජ අර්ථකාමීන්ගේ බස් අසා දරුවෙනි, එසේ වේවායි පිළිගෙන එසේ කළේය.

එක් පණ්ඩිත ඇමැතියෙක් ආහරණ මුදා කෙස් විසුරුවාගෙන තථාගතයන් වහන්සේ පිරිනිවි දිසාවට මුහුණලා ඇදිලි බැඳ රජුට මෙසේ කීය. "දේවයන් වහන්ස, මරණයෙන් මිදෙන කෙනෙක් නම් නැත. අපගේ ආයු වඩන චෛත්‍යස්ථාන වූ පුණ්‍යක්ෂේත්‍ර වූ අභිෂේක දක්වන්නා වූ ඒ භාග්‍යවතුන් වහන්සේ කුසිනාරාවෙහි දී පිරිනිවි සේකැයි කියායි. රජ අසමින් ම කදුළු වගුරුවමින් විසංඥව බලවත් ශෝක වේගයෙන් චතුමධුර දෙණෙහි මූර්ච්ඡා විය. ඉක්බිති ඇමැතියෝ රජු ඔසවා දෙවෙනි දෙණෙහි හොවාලූහ. රජ චතුමධුර සිහිල් රස පහසින් සිහි ලැබ දරුවනි, කුමක් කියන්නාහුදැයි විමසීය. මහරජ, ශාස්තෘන් වහන්සේ පිරිනිවි සේකැයි කීහ. ඇසීමෙන් නැවතත් රජ සිහි නැතිව චතුමධුර දෙණෙහි මූර්ච්ඡාවිය. එවිට ඇමැතියෝ ඔහු

ඔසවා තුන්වෙනි දෙණෙහි හොවාලූහ. අභිනව සිහිල් රස පහසින් ලැබූ සිහි ඇති රජ දරුවෙනි. කුමක් කියන්නාහුදැයි ඇසීය. මහරජ, ශාස්තෘන් වහන්සේ පිරිනිවියහයි කීහ. රජ නැවත සිහි නැති විය. එවිට ඔහු ඔසවා නහවා කළවලින් හිසෙහි දිය නෑවූහ. රජ සිහි ලැබ අසුනින් නැගිට සුවඳ කැවූ නිල් මිණිවන් කෙස් රන් පුවරුවක් වැනි පිටෙහි විසුරුවාගෙන පබළු පැහැති සුමට ඇඟිලි යුත් අත්වලින් පපුවට ගසමින් රන් බිස්සක් වැනි උර තලයෙහි කදුළු වගුරවමින් හඬ හඬා උන්මත්තක වේශයෙන් ඇතුළු වීදියට දිවීය. නළඟනෝ ද තථාගත වියොග ශෝකයෙන් වූ රජුගේ විප්‍රකාර මුදනු කැමැත්තාහු කම්පිත හදින් කදුළු වැකි මුහුණින් හඬ හඬා රජුපසුපසින් වීදියට බැස්සා හ.

ඉක්බිති රජ සැරසුණ නළඟනන් පිරිවරා නුවරින් නික්ම වහ වහා ජීවක අඹුදයනට පිවිස යමක වැඩහිඳ භාග්‍යවතුන් වහන්සේ දහම් දෙසූ සේක් ද ඒ බලා තමන්ට සම දුක්ඛිතයකු වැනි ශූන්‍ය ධර්මාසනය වැළඳගෙන හැඬීය. ස්වාමීනි, සර්ව්ඥයන් වහන්ස, භාග්‍ය-වතුන් වහන්ස්ේ මෙහි හිඳ දහම් දෙසූ සේක් ද දේශනා නැමැති සිහිල් නිමල දියෙන් මාගේ ශෝකදාහ දුරුකළ සේක් නොවේ ද? ඔබ වහන්සේ දේශනා හඬු තුඩින් මාගේ සෝතැවුල් බැහැර කළ සේක් නොවේ ද? පෙර නිහඬව සිටි සාපරාධී මටම නොපොහොනා මුවින් අමතන ලද 'සේක් නොවේ ද? දැන් ඔබ වහන්සේගේ සරණ පතා ආ වැලපෙන මට පිළිතුරක් නොදෙන සේක් ද? ඇයි භාග්‍යව-තුන් වහන්සේ වෙනදා මෙවැනි වේලාවන්හි ඔබ වහන්සේ මහබික්සඟන පිරිවරා දඹදිව චාරිකාවෙහි වැඩි සේකැයි අසමි. දැන් වනාහි නොගැළපෙන නුසුදුසු පුවතක්ම අසමි. මේ ආදිය කියා සැටක් පමණ ගාථාවෙන් බුදුගුණ මෙනෙහි කොට බුද්ධානුස්ම-රණයෙන් හටගත් සිහියෙන් තමන් සනසවා මාගේ හැඬීමෙන් වැලපීමෙන් කිසි වැඩක් නොවන්නේය. දසබල ධාතූන් ගෙන්වා ගනිමියි සිතීය.

ඉක්බිති නුවරට ගොස් කුසිනාරාවරුන්ට පනිවිඩයක් යැවීය. යවා මෙසේත් සිතීය. ඉඳින් දුන හොත් මැනවි, නොදුන හොත්

ගන්නා උපායකින් ගනිමියි සිවුරඟ සෙන් සන්නාහ කොට තෙමේම නික්ම දූතයකු යැවීය. මෙසේ විශාලාවෙහි ලිච්ඡවියෝ ද කිඹුල්වත ශාක්‍යයෝ ද අල්ලකප්පයේ මල්ලයොධයෝ ද රාමගාමයෙහි කෝලියයෝ ද වේඨදීපක බමුණෝ ද පාවෙය්‍යක මල්ලයෝ ද සියලු සත් නුවර වැසි රජවරු කුසිනාරා වැසි මල්ලයන්ට පනිවිඩත් යවා තුමූ ද පිටත්වූහ. ඔවුහු අවුත් කුසිනාරාව වටකොට පනිවිඩ යැවූහ. භාග්‍යවතුන් වහන්සේ ක්ෂත්‍රියයෙකි. බුද්ධධාතු කොටසක් දිය යුතුය. ථූපයක් කරමු. එබැවින් අපට ධාතු හෝ දෙව් යුද්ධ හෝ කරව් කියායි.

එයැසූ කුසිනාරා රජවරු ක්ෂත්‍රිය මානයෙන් තම බලය පෙන්වමින් මෙසේ කීහ. "අපි ශාස්තෘන් වහන්සේට පනිවිඩ නොයැවීමු. ගොස් කැඳවාගෙන නොආයෙමු. ඔබලා ඔබලාගේ ගම්-කෙත්හි උපන් රුවන් අපට නොදෙන්නහුය. දෙවියන් සහිත ලෝකයෙහි බුද්ධරත්නය සම වෙන රත්නයක් නැත. මෙබඳු උත්තම රත්නයක් ලබා අපි නොදෙමු. තොපි පමණක් මවුකිරි පානය කළාහු නොවන්නහුය. අපිත් තන කිරි බීවෙමු. තොපි පමණක් පිරිමි නොවන්නහුය. අපිත් පිරිමි වෙමු. හොඳයි, යුද වදිමුයි උනුන් කලහාකාර දක්වා හසුන් පිළිහසුන් යවා මානගර්ජනා කරති. බොහෝ කල් පැරණි කළ සුරාමණ්ඩ රැස්කර ශූර යෝධයන් රැස් කොට යුද්ධ සන්නාහ ගැන්වූ ඇත්සේනා රැස් කොට පවනට බඳු වේගයෙන් දුවන අස්සේනා රැස් කොට කොඩි නගන ලද තුරඟුන් යෙදූ රථසේනා රැස්කොට යුදට සැරසුණ කල්හි ඒ මල්ල රජවරු සභාගාරයට පිවිස ජීවමාන බුදුන් බඳු බුද්ධ ධාතු රත්නයට වැඳ, ස්වාමීනි ලෝක නාථයන් වහන්ස, මේ සත් රජවරු ඔබ වහන්සේගේ ධාතු ගැනීම පිණිස අප සමඟ යුද්ධයට ආහ. අපි ඔබ වහන්ස්ගේ ධාතු මමත්වයෙන් ඔවුන් සමඟ යුද වදිමුයි කියා නැවත නැවත වැඳ වැඳ පැදකුණු කොට දිව්‍ය යෝධයන් මෙන් නන්පැහැ දිලිසෙන විවිධායුධ ගත් අත් ඇතිව නුවර දොර හරවා නික්මෙන්නට පටන් ගත්හ. යුද්ධයෙහි කාහට ජය අත්වේ ද? කුසිනාරා වරුන්ට ජය අත්වෙයි. කුමක් හෙයින් ද? ධාතුපූජා සඳහා පැමිණි දෙවියෝ

ඔවුන්ගේ පක්ෂයෙහි වූහ. භාග්‍යවතුන් වහන්සේගේ ධාතුමහායනය නිසා ඔවුන්ටම ජය වන්නේය.

එසමයෙහි කුසිනාරාවෙහි පණ්ඩිත ව්‍යක්ත ප්‍රමුඛ, බිඳුණුවුන් සමඟි කරන සමඟි වූවන් තහවුරු කරන සමගිය කැමැති සමගියෙහි ඇලුණු සමගියෙන් සතුටු වන සමඟි කරන වදන් තෙපලන දෝණ නම් බමුණෙක් විය. ඔහු ඒ විවාදය අසා මේ රජවරු බුදුන් පිරිනිවි තැන විවාද කරති. මෙය නොගැළපෙන්නකි. මේ කලහයෙන් පලක් නැත. එය සන්සිඳුවමියි නික්ම මෙස ගමනයක මෙන් සංග්‍රාම කෝලාහලය පැන නැඟි කල්හි එයින් ජනිත යුදබෙර හඬ පවත්නා කල්හි දොණ බමුණු තෙම උස් තැනක සිට මහහඬ නගා දෙබණ වරකින් පමණ පරිමිත දෝණ ගර්ජනා නම් වූවක් කීවේය. එහි පළමු බණවර එක පදයකුත් නෑසුණේය. දෙවන බණවර කෙළවර පින්වත්නි, ගුරුතුමාගේ හඬ බඳු යයි සියල්ලෝ නිහඬ වූහ. දඹදිව් තලයෙහි කුලගෙයක උපන් කිසිවෙක් ඔහුගේ අතවැසි නොවූවෙක් නොවූහ. ඉක්බිති හෙතෙම තම වදන් අසා නිහඬව තුෂ්ණිම්භූත-වූවන් බව දැන මෙසේ කීය.

> භවත්නි, මාගේ මේ එකම වාක්‍යය අසව්. අප බුදුහු ක්ෂාන්ති වාදී වූසේක. ඒ උත්තම පුද්ගලයන්ගේ අභාවයෙන් ප්‍රහාරයක් වුවහොත් කෙසේ ද? භවත්නි, සියලු දෙනම හිතවත් ව සමගිව සතුටින් අටකොටසක් කරමු. තථාගතයන් වහන්සේගේ ස්තූපයෝ පැතිර යෙත්වා. ඇස් ඇත්තවුන් වහන්සේ කෙරහි බොහෝ දෙන පැහැදුණාහුය.

ආචාර්‍යයන්ගේ වචනය අසා රජවරු මොළොක් වූහ. එසේ නම් ගුරුතුමනි, ඔබම භාග්‍යවතුන් වහන්සේගේ ධාතු අටකොට සක්ව සමසේ බෙදනු මැනවැයි කීහ. එසේ කරමුයි ඒ දොණ බමුණු තෙම ඒ සමූහ ඇති ගණ ඇති රජවරුන්ට කීය. මෙපමණකින් භාග්‍යවතුන් වහන්සේගේ අභිප්‍රාය සපිරෙයි. කරුණු තුනක් නිසා භාග්‍යවතුන් වහන්සේ මහත් උත්සාහයෙන් මෙහි වැඩි සේක. භාග්‍යවතුන් වහන්සේ මෙසේ දකිති. මා වෙනත් තැනක පිරිනිවිය

හොත් මහාසුදස්සන සූත්‍ර දේශනාවට හේතුවක් නොවේ. කුසිනාරාවේ පිරිනිවි කල්හි දෙව්ලොව පිදිය යුතු සැපත් මම මනු ලොවදී විඳියෙමියි, දෙබණවරකින් සරසා මහාසුදස්සන සූත්‍රය දේශනා කරමි. මාගේ ඒ දේශනාව අසා මහජනයා කුසල් කළ යුතු යයි හඟිත්. තවෙකක් දකිති. මා වෙන තැනක පිරිනිවිය හොත් සුභද්ද මා නොදක්නේය. හෙතෙම බුදුන් විසින් ම හික්ම විය යුත්තෙකි. ශ්‍රාවකයෝ ඔහු හික්මවීමට නොහැකිවෙති. කුසිනාරාවෙහි පිරිනිවෙන මා කරා පැමිණ හෙතෙම ප්‍රශ්න අසයි. ප්‍රශ්න විසඳීම් කෙළවර සරණයෙහි පිහිටා මා වෙත මහණ උපසම්පදා ලැබ් කමටහන් ගෙන මා ජීවත් වෙද්දීම රහත්ව පශ්චිම ශ්‍රාවක වන්නේය. තවෙකක් දකිති. මා වෙන තැනක පිරිනි කල්හි ධාතු බෙදීමෙහි මහාකලහයක් වන්නේය. ලේ ගංගාවක් ගලයි. මා කුසිනාරාවෙහි පිරිනිවි කල්හි දොණ නම් බ්‍රාහ්මණ තෙම ඒ විවාදය සංසිඳුවා ධාතු බෙදන්නේය. මේ තුන් කරුණින් භාග්‍යවතුන් වහන්සේ මෙසේ මහත් උත්සාහයෙන් මෙහි පැමිණිසේකැයි දත යුතුයි.

ඒ රජවරු ආයුධ බහා තබා සාමීචි කතා කරමින් සැරසූ දේව සභාව වැනි සන්ථාගාර ශාලාවට පිවිසියහ. සමගි වූ ඔවුන් මැද දෝණ බමුණු තෙම රන්දෙණ විවෘත කළේය. විවෘත කරනු සමඟම රන්වන් රැස් බබළ බබළා නික්මුණේය. රජවරු රන් දෙණෙහි රන් රැස් විහිදුවන සවීඥධාතු දැක කම්පිත හදින් කඳුළු වගුරුවමින් ගොත ගසන වදනින් බදාදිලිව වදිමින් "භාග්‍යවත් සවීඥයන් වහන්ස, පෙර අපි ඔබ වහන්සේගේ දෙතිස් මහ පුරිස් ලකුණින් හෙබි සවනක් රැසින් විසිතුරු රන් සිරුර දුටිමු. දැන් වනාහි රන්වන් ධාතු පමණක් ඉතිරිය. භාග්‍යවතුන් වහන්ස, මෙය ඔබ වහන්සේට නොගැළපෙන්නකැයි වැලපුණාහ. අහෝ මේ අනිත්‍යතා ධර්මය බලවත්ය. මාරබල දිනූ දසබලයන් වහන්සේත් අත නොහරි. මෙසේ ඇති කල අන් කවුරුන් විසින් ජීවිතයෙහි ආශා කළ යුතු ද කියා විලාප කීහ. එවිට දොණ බ්‍රාහ්මණ තෙම එවේලෙහි ඔවුන්ගේ පමා බව දැක භාග්‍යවතුන් වහන්සේගේ දකුණු දළදාව ගෙන තලප්පාවෙහි සඟවා

ගත්තේය. පසුව අටකොටසකට සම සේ බෙදීය. සියලු ධාතු ප්‍රකෘති නැලියෙන් සොළොස් නැලියක් විය. එක් එක් නගරවාසීහු දෙනැලිය දෙනැලිය ලබාගත්හ.

බමුණා ධාතු බෙදද්දීම සක් දෙවිඳු සදේවක ලෝකයාගේ සැක සිඳීමට සමත් සිව්සස් කථාවට හේතු වූ භාග්‍යවතුන් වහන්සේගේ දකුණු දළදාව කවුරුන් විසින් ගන්නා ලදැයි බලන්නේ බමුණා විසින් ගත් බව දැක මේ බමුණුතෙම දළදාවට සුදුසු සත්කාර කිරීමට අසමත් වෙයි. එය ගනිමියි තලප්පාවෙන් ගෙන රන් කරඬුවක තබා දෙව් ලොවට ගෙන ගොස් සිළුමිණි සෑයෙහි තැන් පත් කළේය. බ්‍රාහ්මණයා ද ධාතු බෙදා දළදාව නොදැක හොරෙන් ගත් බැවින් කවුරුන් විසින් මාගේ දළදාව ගන්නා ලද දැයි ඇසිය නොහැකි විය. හෙතෙම තමාගේ දොෂාරෝපණ බියෙන් මටත් කොටසක් දෙවයි කීමට ද අසමත් විය. එහෙයින් මම ධාතු බෙදන ලද කුම්භය ගෙන එයින් සෑයක් කරමියි සිතා භවත්නි, මේ කුම්භය මට දෙව්. මමත් කුම්භයෙන් ථූපයක් කොට පූජා කරන්නෙමියි කීය. ඔවුහු බ්‍රාහ්මණයාට කුම්භය දුන්හ. එවිට පිප්ඵලියෙහි මොරිය රජවරු භාග්‍යවතුන් වහන්සේ කුසිනාරාවෙහි පිරිනිවියහයි අසා අජාසත් රජු ආදීන් මෙන් කුසිනාරාවෙහි මල්ලයන්ට පනිවිඩ යවා යුද සූදානමින් පිටත් වූහ. මල්ලයෝ "සවීඥ ධාතු කොටසක් නැත. ධාතු බෙදන ලදි. මෙතැනින් අඟුරු ගෙන යව්සි කීහ. ඔවුහු එතනින් අඟුරු ගෙන ගියහ.

එකල්හි වේදෙහි පුත්‍ර අජාතශත්‍රු මගධ රජ කුසිනාරාවෙහි පටන් මගධ රට දක්වා මෙදැතුර පස්විසි යොදුන් මග අට ඉස්බක් පුළුල්ව සම කොට මල්ලයෝ මකුටබන්ධයත් සත්‍යාගාරයත් අතර යම්බදු පූජාවක් කළාහුද එසේ පස්විසි යොදුන් මඟ පූජා කරමින් රන් දෙණෙහි බහාලූ ධාතු සත්තිපඤ්ජරයක තබා කුසිනාරාවෙන් පිටත් විය. රජ කොතැනක හෝ වණ්ණ ගන්ධ සම්පන්න මල් දකී ද එතැන සත්තිපඤ්ජරය නවතා සාධුක්‍රීඩා කොට මල් අවසන් වූ කලම යයි. එකල මිසදිටුවෝ ශ්‍රමණ ගෞතමයන් පිරිනිවී තැන්

පටන් බලහත්කාර සාධුක්‍රීඩාවලින් වෙහෙසට පත් වූවෝ වෙමු. අපේ සියලු කටයුතු විනාශයයි උද්ඝෝෂණය කරමින් සිත් දූෂ්‍ය කොට දළ වශයෙන් අසූදහසක් පමණ අපායෙහි උපන්නාහ. ක්ෂීණාශ්‍රව රහතන් වහන්සේලා ඒ කරුණ දැක සක් දෙව්රජු වෙත ගොස් දිව්‍යරාජය, ධාතු ගෙන යන උපායක් කරවයි කීහ.

සක් දෙව්රජ ස්වාමීනි, පුථුජ්ජනයන් අතර අජාසත් රජුට සමවූවෙක් නම් නැත. ඔහු මගේ වචනය වත් නොකරයි. නමුත් මාර විහිංසාවක් වැනි මහාවිහිංසාවක් දක්වමි. ඔබ වහන්සේලා මහරජ, අමනුෂ්‍යයෝ කිපුණාහුයයි කිව මැනව. එවිට ඔහු ඉක්මනින් වැඩමවනු ඇත කියා ශක්‍රතෙම ඒ ශබ්දය කළේය. තෙරවරු රජු වෙත ගොස් මහරජ, අමනුෂ්‍යයෝ කිපුණාහ. වහා ධාතු වැඩමවනු මැනවැයි කීහ. ස්වාමීනි, තවමත් මාගේ සිත් පිරීමක් නැත. එ නමුත් වැඩමවමු කියා ධාතු ගෙන සත්වන දින රජගහ නුවර ථූපයක් කොට පූජාවක් ද කළේය. සෙසු රජවරු තමතමන්ගේ බලානුරූපව වැඩමවා තම තමන්ගේ ස්ථානවල ස්තූප තනා පූජා කළහ. කුසිනාරාවෙහි මල්ලයෝ කුසිනාරාවෙහිම ධාතු ථූපය තනා පූජා කළහ. දෝණ බමුණු තෙම කුම්භස්තූපය කොට පූජා කළේය. පිප්ඵලිමෞර්යයෝ පිප්ඵලි වනයෙහි අංගාර ථූපය තනා පූජා කළහ. මෙසේ ශාරීරික ස්තූප අටකි. නව වැන්න කුම්භස්තූපයයි. දස වැන්න අංගාර ස්තූපයයි. මෙය මෙසේ දත යුතුය.

> ඇස් ඇත්තවුන් වහන්සේගේ ශාරීරික ධාතු අට ද්‍රොණයෙකි. සත් ද්‍රොණයක් දඹදිව පූජා කරති. පුරිෂෝත්තමයන් වහන්සේගේ එක් ධාතු ද්‍රෝණයක් රාම ග්‍රාමයෙහි නාරජවරු පූදති. එක් දළදාවක් දෙවියන් විසින් පූදන ලදි. එකක් කලිඟු පුරයෙහි පූදනු ලැබේ. තවෙකක් කාලිංග රාජ්‍යයෙහි ද එකක් නාරජවරු ද පූදති.

කුසිනාරා මල්ලයන් සවීඥධාතුවලට සත්කාර දක්වා ස්තූප පිහිටවූ කල්හි පසුව බොහෝ මිනිස්සු පැමිණ මහකසුප් තෙරුන් ද

අනඳ තෙරුන් ද හමුව මෙසේ කිහ. ස්වාමීනි, අපට ශාරීරිකධාතු නොලැබිණ. සත්කාර කිරීම පිණිස අපටත් භාග්‍යවතුන් වහන්සේ පරිභෝග කළ සිවුරු ආදි පිරිකරක් ලැබුණ හොත් සත්කාර කොට පිහිටක් ලැබුවෝ වෙමු කියායි. තෙරුන් වහන්සේලා ඔවුන්ට පිරිකර බෙදා දුන්නාහ. වජිර නුවර වැස්සෝ වජිර නුවර මුතු පැසෙහි පාත්‍රය බහා තැන්පත් කොට කොඩි ඔසවා සත්කාර කළහ. වේනකයෝ සෑගෙයක් කරවා කෙළක් අගනා පර්යංකයක සිවුර තබා සත්කාර කළහ. පැළලුප්නුවර කුක්කුටාරාමයෙහි ඩබරාවෙහි කායබන්ධනය බහා තඹමුවා පාපුටුවක තබා රිදී සෑයෙක රන් සතින් අලංකාර කොට සත් කාර කළහ. අපරාන්තයෙහි කුරරඝරයෙහි නිසීදනය තබා කළුගල් අතුරුවා රන් සෑයක් කොට ඉඳුනිල්මිණි සතින් සරසා සත්කාර කළහ. පච්චත්ථරණය දේවපුත්‍ර විෂයෙහි මකුට නගරයෙහි මිනිස්සු සෑගෙයක් තනා කෙළක් අගනා පලඟක තබා පුදකළහ. මිථිලා නුවර මනුෂ්‍යයෝ නිවාසනය පළිගුමුවා සෑය රිදියෙන් සරසා එහි තබා මිණිසත් ඔසවා සත්කාර කළහ. විදෙහ රට උත්තර නියම්ගමෙහි රන් සෑයක් කොට පෙරහන තබා සත්කාර කළහ. කරය ඉදිකටුව සහ ඉදිකටුගුලාව කුරුරට ඉඳිපත් නුවර පළිඟු කරඬුවක බහා රන් සෑයක් කොට රන්මුවා මලින් පිදූහ. කුඤ්චික උපාහන පැස යන පිරිකර උසීර බමුණුගම මනුෂ්‍යයෝ සත්රුවන්මුවා කරඬුවක බහා සත් රුවන්මුවා සෑයක් කොට පිදූහ.

බුදුන් පිරිනිවි කල්හි සැරියුත් තෙරුන්ගේ සද්ධිවිහාරික සරහු නම් රහත් තෙර තමන්ගේ ශ්‍රමණ උපාධ්‍යායන් සහිත භික්ෂූන් දස-දහසක් පරිවරා බුද්ධ චිතකය පැදකුණු කරමින් නොනිවුණු ගින්නෙහි අත දමා ග්‍රීවාස්ති ධාතුව ගෙන අහසින් අවුත් ලංකාවෙහි මිණි සෑයෙහි තැන්පත් කළහ. සීවල චූළසුමන යන බුද්ධශ්‍රාවක දෙනම නාග-භවනයෙන් මේඝවර්ණ පාෂාණ ගෙනවුත් එයින් වසා ආරක්ෂා පිණිස සමන් දෙවිරජු තබා ගියහ. ධාතු බෙදීමට පෙර මහාකච්චායන තෙර ධාතු නමක් ගෙන සඳුන් කරඬුවක තබා පෝත නුවර අස්සක රජුගේ පුත් සුජාත කුමරුට දී සෑයක් කරවා එහි ධාතු තැන්පත් කළේය. මෙසේ භාග්‍යවතුන් වහන්සේ පිරිනිවි කල්හි බොහෝ ස්තූප පිහිටවූහ.

බුදුන් පිරිනිවීමට පෙර ස්තූප අටක් පිහිටියේ වෙයි. භාග්‍යවතුන් වහන්සේගේ ප්‍රථම බෝධියෙහි තපස්සු භල්ලුක නම් වෙළෙඳුන් දෙදෙනා සරණ දෙක්හි පිහිටා සනාථව භාග්‍යවතුන් වහන්සේගෙන් සත්කාර පිණිස පූජා වස්තුවක් යැද ඉඳුනිල් බමර උම්මාරපුෂ්පවල සොභා මැඩලීමට සමත් නිල්වන් කේශ ධාතු ලබා දඹරුන් කරඬුවක තැන්පත් කොට අසිතඤ්ජන නුවරට ගෙන ගොස් නැගෙනහිර දොරටුවෙහි පළිඟු අතුරුවා මුංවන් ගලින් අසූ රියන් උස සෑයක් කරවා ඉඳුනිල්මිණිමුවා කඤ්චුකයක් කරවා අතරතුරෙහි පබළුවලින් සරසා සතර දිසාවෙහි රියසක් පමණ රන් පියුම් සාදවා ඒ පියුම් කෙමිවල තල් කඳක් පමණ සුදු රුසිරු මුතු කලප් විසුරුවා සත්රුවන්මුවා වේදිකාව රිදියෙන් සරසා සත්රුවන්මුවා ඡත්‍ර නංවා තමන්ගේ සියලු විභව සම්පතින් පූජා කළහ.

පූර්ව බෝධියෙහි ලෝක නායකයන් වහන්සේ බුද්ධත්වයෙන් නව මසක් ගිය තැන දුරුතු පුන්පොහෝදින අහසින් ලක්දිවට වැඩ නොමිනිසුන් දමනය කොට දෙවියන්ට අනුකම්පාවෙන් ධර්ම දේශනා කළ සේක. දේශනා කෙළවර නොයෙක් කෙළ ගණන් දෙවියන්ට ධර්මාවබෝධය විය. සමන්තකූට වාසී සුමන දේවරාජයා සෝවාන් ඵලයෙහි පිහිටා බුදු සිරිපා සිරසින් වැඳ ස්වාමීනි, ඔබ වහන්සේ දඹදිව වැඩි කල්හි අප කාට නම් සත්කාර කළ යුතු ද? අපහට සත්කාරානුරූප යමක් දුන මැනවයි අයැදියේය. භාග්‍යවතුන් වහන්සේ ඉඳුනිල්මිණි පැහැති කුණ්ඩලාකාර කෙස් මිටක් දුන් සේක. සමන් දෙව් රජ එය රත්කරඬුවක බහා මලය පර්වතවාසී දසකෙළක් නාගයන්ට කියා එක් එක් ඇටයක් බැගින් සත්රුවන් වැලි ගෙන්වා සත් රියන් උස එක්සිරියන් පිරිමඩුලු ඇති ථූපයක් කළේය. සමන් දෙව්රජ එහි ධාතු-කරඬුව තැන්පත් කොට පූජා කළේය. භාග්‍යවතුන් වහන්සේ ඔවුන්ට දම් දෙසා උරුවේලාවට ම වැඩි සේක. බුදුන් වැඩි පසු සමන් දෙව්රජ ස්තූපයට ඉඳුනිල්මිණිමුවා කඤ්චුකයක් කළේය. ආනන්දය, මෙසේ බුදුන් නොපිරිනිවි කල්හි ද බොහෝ ස්තූප පිහිටියේය.

> උන් වහන්සේගේ තෙජසින් මේ මහපොළොව අලංකාර විය, පසැස් ඇත්තවුන් වහන්සේගේ ශාරීරික ධාතූන් වහන්සේලා

සත්කාරයෙන් සත්කාර ලැබූවන් ද සත්කාර කරනු ලැබූහ. දෙව් රජුන් ද නාරජුන් ද පුදන ලද එසේම මිනිස් ලොව රාජශ්‍රේෂ්ඨයන් විසින් ද පුදන ලද ඒ ධාතූන් වහන්සේලාට ඇදිලි බැඳ නමස්කාර කරමි. බුද්ධොත්පාදය කප් සියයකිනුත් දුර්ලභය.

පරිනිර්වාණ කථා නිමිත්තය.

ලෝකනාථ භාග්‍යවතුන් වහන්සේ පිරිනිවි කල්හි ධාතු බෙදූ දින රැස් වූ සත්ලක්ෂයක් භික්ෂූන්ට සංඝස්ථවිරවූ මහාකාශ්‍යප තෙරණුවෝ බුදුන් පිරිනිවි සත් දිනකින් සුභද්ද මහලු පැවිද්දහු විසින් "ඇවැත්නි, කම් නැත. ශෝක නොකරව්. අපි ඒ මහා ශ්‍රමණයාගෙන් මිදුණෙමු. මෙය තොපට කැපය. මෙය තොපට නොකැපයයි බෙහෙවින් අපි වෙහෙසට පත් වූයෙමු. මෙවක් පටන් යමක් කැමැති නම් එය කරමු. යමක් අකැමති නම් එය නොකරමු"යි කියන ලද වචනය සිහිකරමින් නැවත මෙවැනි සංඝ සන්නිපාතයක දුර්ලභත්වය සිතමි. පාවචනය අතීතශාස්තෘකයයි කල්පනා කරන පාප භික්ෂූහු පක්ෂයක් ලබා නොබෝ කලකින්ම සද්ධර්මය අතුරුදහන් කරන්නාහ යන්න සිදුවිය හැක්කකි. ධම්මවිනය පවත්නා තාක් ප්‍රවචනය අතීතශාස්තෘක නොවේ. බුදුරජාණන් වහන්සේ විසින් මෙසේ වදාරන ලද්දේය. ආනන්දය, මා විසින් ඔබලාට යම් ධර්මයක් විනයක් දෙසෙන ලද ද පනවන ලද ද එය මාගේ ඇවෑමෙන් ඔබලාගේ ශාස්තෘන් වහන්සේය කියායි. එබැවින් මම යම්සේ මේ ශාසනය දිගුකල් පවත්නේ ද චිරස්ථායි වෙයි ද, එසේ මම මේ ධර්මය ද විනය ද සංගායනා කරවන්නෙමි නම් මැනවැයි සිතුහ.

මට භාග්‍යවතුන් වහන්සේ කාශ්‍යප, මේ හණවැහැරි පාංශුකූලය ඔබ දරන්නැයි කියා සාධාරණ චීවර පරිභෝගයෙන් අනුග්‍රහ කළසේක. මහණෙනි, මම යම්තාක් කැමැති නම් කාමයන්-ගෙන් වෙන්වම අකුසල ධර්මයන්ගෙන් වෙන්වම විතර්ක සහිත විචාර

සහිත විවේකයෙන් හටගත් ප්‍රීතිය හා සැපය ඇති ප්‍රථමධ්‍යානයට පැමිණ වාසය කරමි. එමෙන් මහණෙනි, කාශ්‍යප ද යම්තාක් කැමති නම් - පෙ - ප්‍රථමධ්‍යානයට පැමිණ වාසය කරයි කියා මේ ආදි ආකාරයෙන් නව අනුපුබ්බවිහාර ෂඩභිඥා ආදි භේද ඇති උතුරු මිනිස්දහම්හි තමන් වහන්සේ හා සම තැන තැබීමෙන් අනුකම්පා කළ සේක. එසේම අහසෙහි අත දිග හැර චන්ද්‍රොපම පටිපදාවෙන් ද ප්‍රශංසා කළ සේක. භාග්‍යවතුන් වහන්සේ තම පුත්‍රයාහට සම්පත් ප්‍රදානයෙන් කුලවංශය පිහිටුවන්නාවූ සක්විති රජකු මෙන් භාග්‍යවතුන් වහන්සේ මේ තෙම මාගේ ඇවෑමෙන් සද්ධර්මවංශය පිහිටුවන්නේය යන මේ අසාධාරණ අනුග්‍රහයෙන් ද මේ මහත් ප්‍රශංසාවෙන් ද අනුග්‍රහ කළ සේකැයි සිතා ධර්ම විනය සංගායනාව සඳහා භික්ෂූන් උත්සාහවත් කරමින් මහකසුප් තෙරණුවෝ භික්ෂූන් ඇමතූහ.

ඇවැත්නි, එක් සමයක මම පාවා නුවරින් කුසිනාරාවට පන්සියයක් පමණ මහාභික්ෂුසංඝයා සමඟ මහමඟට පිළිපන්නේ වෙමියි සියලු සුභද්ද බ්‍රාහ්මණය සවිස්තරව පවසා ඇවැත්නි, අපි දැන් අධර්මය දීප්තිමත් වීමට පෙර ධර්මය බැහැරවීමට පෙර අවිනය දීප්තිමත් වීමට පෙර විනය බැහැර වීමට පෙර අධර්මවාදීන් බලවත් වීමට පෙර ධර්මවාදීන් දුබල වීමට පෙර අවිනයවාදීන් බලවත් වීමට පෙර විනය වාදීන් දුබල වීමට පෙර ධර්මයත් විනයත් සංගායනා කරමුයි කීහ. එවිට භික්ෂූහු උන් වහන්සේට "එසේ නම් ස්වාමීනි, තෙර භික්ෂූන් රැස් කරන සේක්වායි, කී කල්හි තෙරුන් වහන්සේ සියලු නවාංග ශාස්තෘ ශාසන පර්යාප්තිධර පෘථග්ජන සෝවාන් සකෘදාගාමී අනාගාමී ශුෂ්කවිදර්ශක රහත් යන නොයෙක් දහස් ගණන් භික්ෂූන් හැර සියලු ත්‍රිපිටක පර්යාප්ති භෙදධාරී පිළිසිඹියාපත් මහානුභාව ඇති බොහෝ සෙයින් භාග්‍යවතුන් වහන්සේ විසින් එතදග්‍රයෙහි තැබූ ත්‍රිවිද්‍යා ආදි භේද සහිත එකුන්පන්සියයක් රහතන් වහන්සේලාම තෝරා ගත්හ.

කවර හේතුවකින් තෙරණුවෝ එකක් අඩු කළාහු ද? අනඳ

තෙරුන්ට ඉඩ සැලසීම සඳහායි. උන්වහන්සේ ඇතිව ද නැතිව ද ධර්ම සංගායනා කිරීමට නොහැකිය. උන් වහන්සේ සේඛයෙකි. කළ යුතු දේ ඇත්තෙකි. එහෙයින් එක්ව කළ නොහැකිය. උන්වහන්සේට දසබල දේශිත සූත්ත ගෙය්‍යාදි අප්‍රත්‍යක්ෂ දෙයක් නම් නැත. එහෙයින් නැතිව ද නොකළ හැකිය. මෙසේ සේඛයෙකු වුවත් ධර්ම සංගීතියට බොහෝ උපකාර වත් බැවින් තෙරුන් වහන්සේ තෝරාගත යුතුමය. කුමක් නිසා තෝරා නොගත් සේක් ද? අනුන්ගෙන් උපවාද දුරුකරනු පිණිසය. තෙරණුවෝ ආයුෂ්මත් ආනන්දයන් සමඟ අතිශයින් විශ්වාසවත් වූහ. උන්වහන්සේගේ කෙස් පැසී තිබෙද්දී මේ දරුවා පමණ නොදනී යයි කුමාර වාදයෙන් අවවාද කළහ. ශාක්‍ය කුලයෙහි උපන් උන්වහන්සේ තථාගතයන් වහන්සේගේ සහෝදරයෙකි. සුළුපියාණන්ගේ පුත්‍රයාය. එහි ලා සමහර භික්ෂූහු ඡන්දයෙන් අගතියට යාමක් මෙන් සිතා අසේඛ පිළිසිඹියාපත් බොහෝ භික්ෂූන් හැර සේඛ, පිළිසිඹියා නොපත් අනඳ තෙරුන් තෝරා ගත්හයි උපවාද කරන්නාහ. ඒ පරූපවාදය ප්‍රතික්ෂේප කොට අනඳ තෙරුන් හැර සංගීතිය කළ නොහැකියි භික්ෂූන්ගේ අනුමතියෙන් ආනන්දයන් ගනිමියි සිතා තෝරා නොගත්හ.

එවිට ඒ භික්ෂූහු අනඳ තෙරුන් ඇරබ ඉල්ලා සිටියහ. ස්වාමීනි, මේ අනඳ තෙර සේඛ වුවත් ඡන්ද දෝස භය මෝහ යන අගතියකට නොයන්නෙකි. භාග්‍යවතුන් වහන්සේ වෙත බොහෝ කොට ධර්ම විනය උගත්තේය. එබැවින් ස්වාමීනි, අනඳ තෙරුන් තෝරාගත මැනව කියායි. එකල්හි කසුප් තෙරණුවෝ භික්ෂූන්ගේ අනුමතියෙන් අනඳ තෙරුන් තෝරා ගත්හ. එකල්හි අනඳ තෙරුන් සමඟ පන්සියයක් මහතෙරවරු වූහ. ඒ භික්ෂූහු අපි කොතැනක ධර්මයත් විනයත් සංගායනා කරමුදැයි කීහ. එවිට උන්වහන්සේලා රජගහ නුවර වනාහි මහාගෝචරයෙකි. බොහෝ සෙනසුන් ඇත්තේය. අපි රජගහ නුවර වස්වැස ධර්ම විනය සංගායනා කරමු. වෙනත් භික්ෂුවක් රජගහ නුවර වස් නොඑළඹිය යුතුයයි සිතූහ. කුමක් නිසා උන්වහන්සේලාට මෙසේ සිත් වීද? මෙය අපගේ ස්ථාවර කර්මයකි.

කිසි විසභාග පුද්ගලයෙක් සඟමැදට පිවිස බාධා කරතැයි කියායි.

එවිට මහකසුප් තෙරණුවෝ ඤත්ති දුතිය කම්යෙන් භික්ෂු සංඝයාට ඇස්වූහ. එහි වනාහි බුදුන් පිරිනිවීමෙන් විසි එක්වන දිනයයි. බුදුහු වෙසක් පුන් පොහෝදා අලුයම පිරිනිවියහ. සතියක් රන් වත් සිරුර ගඳින් මලින් පිදූහ. මෙසේ සතිය් සාධුක්‍රීඩා දවස් නම් විය. ඉන් පසු සතියක් චිතකය ගින්නෙන් දැවිණ. සතියක් සත්තිපඤ්ජරයක් කොට සභාගාර ශාලාවෙහි ධාතු පූජා පැවැත්වූහ. මෙසේ එක් විසි දිනය ගතවිය. පොසොන් මස පුර පක්ෂයෙහි පස්වන දින ධාතු බෙදූහ. ධාතු බෙදූ දිනයෙහි රැස් වූ භික්ෂු සංඝයාට සුභද්ද මහලු පැවිද්දහු විසින් කළ අනාචාරය දන්වා කී පරිදි භික්ෂූන් තෝරා සංඝයාට දන්වා තෙරුන් වහන්සේ භික්ෂූන් ඇමතූහ. ඇවැත්නි, දැන් ඔබලාට සතලිස් දිනක් ඉඩ ඇත. ඉන්පසු අපට මේ මේ පළිබෝධය ඇතැයි කිව නොහැකිය. එබැවින් මෙදැතුර යමෙකුට රෝග පළිබෝධයක් හෝ ආචාර්‍ය්‍ය උපාධ්‍යාය පළිබෝධයක් හෝ රැඳීම් සිවුරු කිරීම් ආදී ආත්මපළිබෝධයක් ඇත්නම් ඒ පළිබෝධ නසා කටයුතු දේ කරව කියායි. මෙසේ කියා තෙරුන් වහන්සේ සිය පන්සියයක් පිරිස සමඟ රජගහ නුවරට ගියහ. අනුරුද්ධ තෙරණුවෝ ද දෙසිය පනසක් භික්ෂූන් සමඟ රජගහ නුවරට ගියහ. අනඳ තෙරණුවෝ ද භික්ෂූන් දෙසිය පනසක් සමඟ සැවැත් නුවර බලා චාරිකාවෙහි පිටත් වූහ.

පිළිවෙළින් සැවැතට පත් තෙරුන් දැක සැවැත් නුවර මිනිස්සු තෙරුන් වහන්සේ වැඩි සේකැයි පහන් දුම් ගඳමල් ආදිය ගෙන පෙරගමන් කොට පා වැඳ ආනන්ද ස්වාමීනි, පෙර සෙවණැල්ලක් මෙන් භාග්‍යවතුන් වහන්සේ සමඟම යන්නෙහිය. අද කුමකට තනිව ආයෙහි ද? බුදුන් කොහි තබා මෙහි වැඩිසේක් දැයි කිය කියා හැඬූහ. බුදුන් පිරිනිවි දිනයෙහි මෙන් මහාවිලාපයක් විය. එහිදී අනඳ තෙරණුවෝ අනිත්‍යතා ප්‍රතිසංයුක්ත ධර්ම කථාවෙන් මහජනයා සනසා දෙව්රමට වැද බුදුන් වැඩ සිටි ගඳකිළිය වැද දොර හැර හිස් ගඳකිළිය දැක තමන් දරාගත නොහැකිව මහහඬින් හැඬූහ. ඉක්බිති

ඇඳ පුටු බැහැර කොට ගසා පිරිසිදු කොට ගඳකිළිය හැමද රොඩු කුණු බැහැර කොට ඇඳපුටු ගෙන නිසි තැන්හි තබා බුදුන් සිටි කල්හි මෙන් කළයුතු සියලු වත් කළහ. එසේ කරද්දී නහන කොටු හමදිද්දී පැන් තබද්දීත් ගඳකිළියට වැද භාග්‍යවතුන් වහන්ස, මේ පැන් සනහන වේලාව නොවේ ද? මේ බණ දෙසන කාලය නොවේ ද? මේ භික්ෂූන්ට අවවාද කරන කාලය නොවේ ද? මේ සැතපෙන වේලාව නොවේ ද? මේ මුව දෝනා කාලය නොවේ ද? ආදි වශයෙන් හඬන්නට වූහ.

එවිට එක්තරා දෙවියෙක් උන්වහන්සේට "ස්වාමීනි, ආනන්දයෙනි, ඔබ වහන්සේ මෙසේ වැලපෙන කල අන්‍යයන්ට කෙසේ දෙසන සේක්දැයි" සංවේගයට පැමිණවිය. ඔහුගේ වචනයෙන් සංවේගයට පත් හදින් සිහි ලැබ තමන් ධෙය්‍යමත් වූහ. තථාගත පිරිනිවනෙහි පටන් උන්වහන්සේ සිටීම් ඉඳීම් බහුලබව නිසා දොස් කෝප වූ කය සැතැප්වීමට දෙවන දිනයෙහි කිරි විරේචනයක් පානය කොට විහාරයෙහිම සිටියහ. තුන් වන දින චෙතිය තෙර පසුම්හණ කොට සුභ මාණවකගේ ගෙදරට වැඩ සුභ විසින් ප්‍රශ්න කරන ලදුව දීඝනිකායෙහි සුභසූත්‍ර නම් දේශනාව කළහ. අනඳ තෙරණුවෝ දෙව්රම් වෙහෙරෙහි කඩතොලු පිළිසකර කරවා වස් විසීම ළංවූ කල ධම්සංග්‍රාහක තෙරවරුන් සමඟම රජගහ නුවරට ගියහ. එසමයෙහි රජගහ නුවර පිරිවරා අටළොස් මහා විහාරයක් විය. ඒ සියල්ල හැරදැමූ ගරාවැටුණු අබලන් ඒවා විය. පන්සියයක් පමණ ඒ මහතෙරවරු ඒවා ප්‍රකෘතිමත් කරමින් මෙසේ සිතූහ. භාග්‍යවතුන් වහන්සේ විසින් ඇවැත්නි, කඩතොලු පිළිසකර කිරීම වර්ණනා කරන ලදි. අපි මාසය මුල කඩතොලු පිළිසකර කරමු. මාසය මැද රැස්ව ධම්යත් විනයත් සංගායනා කරමු කියායි. උන්වහන්සේලා එකච්ඡන්දව දෙවන දින රජ දොරටුවට ගොස් සිටියහ. සැහැල්ලු සිතින් පැමිණි අජාසත් රජ තෙරවරුන් වැඳ ස්වාමීනි, කුමකට වැඩි සේක්දැයි කළයුතු කිස විමසූහ. අටළොස් මහාවිහාරය පිළිසකර සඳහා අත්තම් දැනුම් දුන්හ. රජ අත්තම් කරන මිනිසුන් දුන්නේය.

තෙරුන් වහන්සේලා මාසය මුල සියලු විහාර පිළිසකර කරවා "මහරජ විහාර පිළිසකර කිරීම් නිම විය. දැන් ධම් විනය සංග්‍රහය කරමු"යි රජුට කීහ. රජ යහපත ස්වාමීනි, කරනු මැනව. මාගේ ආඥා චක්‍රයයි. ඔබ වහන්සේලාගේ ධම්චක්‍රයයි. ස්වාමීනි, කුමක් කළ යුතු දැයි දන්වනු මැනව. මහරජ, ධම් විනය සංග්‍රහ කරන භික්ෂූන් සඳහා වැඩ හිඳිනා තැන් අවශ්‍යය. ස්වාමීනි, කොතැන්හි කළයුතු ද? මහරජ, වේහාර පර්වත පාර්ශ්වයෙහි සප්ත පර්ණිගුහා ද්වාරයෙහි කිරීම මැනවි. රජ මැනවි ස්වාමීනියි තෙරුන් වැඳ පිළිගෙන එකෙණෙහිම අත්තම්කරු මිනිසුන් රැස් කරවා විස්කම් නිම්ාණයක් හා සමානව යෙදූ ටැම් සොපාන මාලාකම් ලතාකම් ආදියෙන් විසිතුරු මුළු ලොව රමණීය වූ දැකිය යුතු සාරමණ්ඩිත මඩුවක් කරවා විවිධ මල්දම් එල්බෙමින් බබළන සොඳුරු වියනින් යුත් නන්වන් පුෂ්පෝපහාරයෙන් විසිතුරු මැනවින් නිම වූ සමතල භූමි කම්ාන්ත ඇති බඹවිමනක් සේ සැරසූ ඒ මහාමණ්ඩපයෙහි අනර්ඝ වූ පන්සියයක් කැප ඇතිරිලි පනවා දකුණු දිශාව නිසා උතුරු දිශාව බලා ථෙරාසනය මණ්ඩප මධ්‍යයෙහි පනවා නැගෙනහිර බලා භාග්‍යවත් බුදුරජාණන් වහන්සේට යෝග්‍ය අසුනක් බඳු ධම්ාසනය පනවා ඇත් දත් කැටයමින් විසිතුරු විජිනිපත එහි තබා "ස්වාමීනි, මාගේ කටයුතු නිමා විය. ඔබ වහන්සේලා කළයුතු කටයුතු කරනු මැනව"යි සැළකළේය.

ඒ තෙරවරු ඇසළ පුන් පොහෝදින පොහෝ කොට පෑළවි දිනයෙහිම රැස්ව වස් එළඹුණහ. උන් වහන්සේලා වස් එළඹ රජුට දැන් වූහ. කටයුතු දිනයෙහිම සමහර භික්ෂූහු අනඳ තෙරුන් පිළිබඳව මෙසේ කීහ. මේ භික්ෂු සංඝයා අතර එකම භික්ෂු නමක් විෂගඳ පතුරවමින් හැසිරෙයි කියායි. එයසා අනඳ තෙර මේ භික්ෂු සංඝයා අතර විෂගඳ පතුරුවන වෙනත් භික්ෂු නමක් නැත. ඒකාන්තයෙන් මොවුහු මා සඳහා කියතියි සංවේගයට පත්වූහ. සමහරු උන් වහන්සේට මෙසේ කීහ. ඇවැත්නි, හෙට පක්ෂයෙහි පස්වෙනි දින රැස්වීමය. මේ ඔබ වහන්සේ සේඛය. කළ යුතු දේ ඇත්තහුය. එබැවින්

රැස්වීමට යාම නොසුදුසුය. නොපමා වනු මැනව කියායි. ඉක්බිති අනඳ තෙරණුවෝ "හෙට රැස්වීම යි. මා සෙබව රැස්වීමට යෑම සුදුසු නොවේ" කියා සිතා රෑ බොහෝ වේලාවක් කායගතාසතියෙන් සක්මනෙනුත් කල්ගෙවා විශේෂයක් උපදවාගත නොහැකිව "භාග්‍යවතුන් වහන්සේ ආනන්ද, ඔබ කළ පින් ඇත්තෙහිය. ප්‍රධන් වැඩීමෙහි යෙදෙව. වහා රහත් වන්නෙහියයි වදාළ සේක් නොවේ ද? බුදුවරුන්ගේ කථාවෙහි දොසක් නම් නැත. මම ව්‍යායාරම්භ කළෙමි. මගේ සිත උද්ධච්චය සඳහාම පවතී. මම සමව ව්‍යායාම කරමියි" සිතා රෑ අලුයම සක්මනෙන් බැස පා දොවා විහාරයට වැද ඇඳෙහි හිඳ මඳක් විවේක ගනිමියි කය ඇඳට යොමු කළහ. එවිට පොළොවෙන් මිදුණු දෙපා ඇති කොට්ටයට නොපැමිණි හිස ඇති උන්වහන්සේගේ සිත මේ අතර උපාදා රහිතව ආස්‍රවයන්ගෙන් මිදුණේය. තෙරුන් වහන්සේගේ ඒ රහත් බව සිවු ඉරියව් රහිත වූවකි. මේ ශාසනයෙහි නොහිඳ නොසිට සක්මන් නොකොට අර්හත්වයට පත්වූ භික්ෂුනම කවරෙක්දැයි කී කල්හි අනඳ තෙරණුවෝ යයි කීම වටී. ඉක්බිති ඒ මහතෙරවරු පක්ෂයෙහි පස්වන දිනය වූ දෙවන දවස්හි කළ කටයුතු ඇතිව පාත්‍ර තැන්පත් කොට සිවුරු එකාංස කොට දම්සභාවෙහි රැස් වූහ. එවේලෙහි අනඳ තෙරණුවෝ රහත්වම දැන් මම සන්නිපාතය මැදට පිවිසීමට සුදුස්සෙමියි සතුටු සිතින් සිවුර ඒකාංසකොට නටුවෙන් ගිලිහුණු ඉදුණු තල්පලක් මෙන් ද පණ්ඩු කම්බලයක තැබූ ජෝතිරංග මිණක් මෙන් ද වලා රහිත ගුවන්හි නැගුණු පුන් සඳක් මෙන් ද ළහිරු රැස් පහස ලැබ විකසිත පියුමක් මෙන් ද පිරිසිදු පැහැබර සශ්‍රික මුව ශෝභාවෙන් තමන්ගේ අරහත්ව ප්‍රාප්තිය දක්වන්නාක් මෙන් අහසින් අවුත් තමහට පත් ආසනයෙහි වැඩහුන් සේක.

උන්වහන්සේ දැක මහකසුප් තෙරණුවන්ට "ඒකාන්තයෙන් රහත්බව ලත් ආනන්දයෝ ශෝභමාන වෙති. ඉදින් ශාස්තෘන් වහන්සේ වැඩ සිටියේක් නම් ඒකාන්තයෙන්ම අද ආනන්දයන්ට සාධුකාර දෙන සේකැයි සිතා දැන් මම ශාස්තෘන් වහන්සේ දිය

යුතු සාධුකාරය දෙමියි තෙවරක් සාධුකාර දුන්හ. අනඳ තෙරුන් මෙසේ වැඩි කල කසුප් තෙරණුවෝ භික්ෂූන් ඇමැතූහ. ඇවැත්නි, කුමක් පළමුව සංගායනා කරමු ද? ධර්මය ද විනයදැයි විමසූහ. භික්ෂූහු මෙසේ කීහ. ස්වාමීනි, කාශ්‍යපයන් වහන්ස, විනය නම් බුද්ධ ශාසනයෙහි ආයුෂයයි. විනය ඇති කල්හිම සසුන පිහිටියේ නම් වෙයි. එහෙයින් පළමුව විනය සංගායනා කරමුයි කීහ. එසේ නම් ඇවැත්නි, කවුරුන් ධුර කොට විනය සංගායනා කළ යුතු ද? ආයුෂ්මත් උපාලි තෙරුන් යයි භික්ෂූහු පැවසූහ. කුමක් නිසා භික්ෂූහු මෙසේ කීවාහු ද? කිම අනඳ තෙර ප්‍රමාණවත් නොවන්නේ ද? උන්වහන්සේ ප්‍රමාණවත් නොවන්නෝ නොවෙති. එසේද වූවක් බුදුන් ජීවමාන සමයෙහිම විනය පර්යාප්තිය නිසා උපාලි තෙරුන් එතදග්‍රස්ථානයෙහි තැබූ සේක. එහෙයින් උපාලි තෙරුන් විමසා විනය සංගායනා කරමුයි කීහ. ඉක්බිති මහාකාශ්‍යප තෙරණුවෝ විනය විමසීම සඳහා තමන් වහන්සේම සම්මත කළහ. ඇවැත්නි, සංඝයා වහන්සේ මාගේ වචනය අසත්වා. ඉදින් භික්ෂූන්ට සුදුසු කාලය නම් මම උපාලි තෙරුන් ගෙන් විනය විමසම් කියායි. උපාලි තෙරණුවෝ ද විසඳීම පිණිස සම්මත කරති. ස්වාමීනි, සංඝයා-වහන්සේ මාගේ වචනය අසන සේක්වා. ඉදින් සංඝයාට සුදුසු කාලය නම් ආයුෂ්මත් මහා කාශ්‍යයන් වහන්සේ විසින් විමසන ලද විනය මම විසඳමි කියායි.

මෙසේ තමන් වහන්සේ සම්මත කොට ගෙන උපාලි තෙරණුවෝ හුනස්නෙන් නැගී සිවුර එකාංස කොට ස්ථවිර භික්ෂූන් වැඳ ධර්මාසනයෙහි හිඳ ඇද්දත් කැටයමින් විසිතුරු විජිනිපත ගෙන හුන්හ. එවිට කසුප් තෙරණුවෝ ධුරාසනයෙහි හිඳ උපාලි තෙරුන්ගෙන් විනය විමසූහ. ආයුෂ්මත් උපාලි ස්ථවිරයනි, භාග්‍යවතුන් වහන්සේ විසින් කොහිදී ප්‍රථම පාරාජිකාව පැනවූ සේක් ද? ස්වාමීනි, විශාලාවෙහිදීය. කවරකු අරභයා ද? සුදින්න කලන්දක පුතු අරභයායි. කවර වස්තුවෙක්හි ද? මෛථුන ධර්මයෙහිය. එවිට කසුප් තෙරණුවෝ උපාලි තෙරුන්ගෙන් ප්‍රථම පාරාජිකා වස්තුව

විමසූහ. නිදානය ද විමසූහ. පුද්ගලයා ද ප්‍රඥප්තිය ද විමසූහ. ඉක්බිති අනු ප්‍රඥප්තිය ද විමසූහ. විමසූ විමසූ දෙය උපාලි තෙරණුවෝ විසඳූහ. ප්‍රථම පාරජිකාව සංග්‍රහයට නැගූ කල්හි පන්සියක් රහතන් වහන්සේලා සංගායනාරූඪ කළ පරිදිම ගණසජ්ඣායනා කළ සේක.

සජ්ඣායනය අරඹද්දීම සාධුකාර දෙන්නාක් මෙන් ජලය කෙළවර කොට ඇති මේ මහාපොළොව කම්පා විය. එනයින්ම සෙසු පාරාජිකා ද සංගායනාරූඪ කොට මේ පාරාජිකා කාණ්ඩයැයි තැබූහ. ඉක්බිති තෙලෙස් සංඝාදිශේෂ තෙරස කාණ්ඩයයි තැබූහ. ශික්ෂාපද දෙකක් අනියත යයි තැබූහ. ශික්ෂාපද තිහක් නිස්සග්ගිය පාචිත්තිය යයි තැබූහ. දෙයානූ ශික්ෂාපදයක් පාචිත්තියයි තැබූහ. ශික්ෂාපද සතරක් පාටිදේසනීය කියා තැබූහ. ශික්ෂාපද පන් සැත්තෑවක් සේඛියායි තැබූහ. ධර්ම සතක් අධිකරණ සමථයයි තැබූහ. මෙසේ විස්සක් අධික දෙසියයක් ශික්ෂාපද මහාවිභංගයයි කියා තැබූහ.

මහා විභංගාවසානයෙහි පෙර පරිදිම මහපොළොව කම්පා විය. ඉක්බිති භික්ෂුණී විභංගයෙහි ශික්ෂාපද අටක් මෙය පාරාජිකා කාණ්ඩයයි තැබූහ. සතළොස් ශික්ෂාපදයක් සතළොස් සංඝාදිසේස කාණ්ඩයයි තැබූහ. ශික්ෂාපද තිහක් නිස්සග්ගිය කියා තැබූහ. ශික්ෂාපද එකසිය හැටහයක් පාචිත්තියයි තැබූහ. ශික්ෂාපද අටක් පාටි-දේසනීයයි තැබූහ. ශික්ෂාපද හැත්තෑපහක් සේඛියායි තැබූහ. ධර්මසතක් අධිකරණ සමථයයි තැබූහ. මෙසේ ශික්ෂාපද තුන්සිය එකොලහක් භික්ෂුණීවිභංගයයි කියා තැබූහ. මේ උභතොවිභංගය විභංග නම් වෙයි. බණවර සූසැටක් තැබූහ. උභතො විභංගාවසාන යෙහි ද කී නයින් මහපොළොව කම්පා විය. මේ ක්‍රමයෙන් බණවර අසූවකින් පරිමිත පරිවාරය ද සංගායනා කොට මෙය විනය පිටකය කියා තැබූහ. මාතෘකාව තබා විනය පිටකය සංගායනා කොට අවසානයේ කී නයින් මහපොළොව කම්පා විය. උපාලි තෙරණුවෝ විනය සංගායනා අවසානයෙහි විජිනිපත තබා ධර්මාසනයෙන් බැස තෙර භික්ෂූන් නැමැද තමනට පත් අසුන්හි වාඩි වූහ

විනය සංගායනා කොට ධර්ම සංගායනා කරනු කැමැතිව මහකසුප් තෙරණුවෝ භික්ෂූන් විමසූහ. ධර්ම සංගායනා කරන කල කවර පුද්ගලයෙකු ධූර කොට කරමුද කියායි. අනඳ තෙරුන් ධූර කොටයයි භික්ෂූහු කීහ. එවිට කාශ්‍යප තෙරණුවෝ සංඝයාට දැනුම් දුන්හ. ඇවැත් සංඝයා වහන්ස, මට ඇහුම් කන් දුන මැනව. ඉදින් සංඝයාට සුදුසු කල් නම් මම අනඳ තෙරුන්ගෙන් ධර්ම විමසමි. අනඳ තෙරණුවෝ ද එසේම සංඝයාට දන්වා අසුනින් නැගී සිවුර එකාංස කොට ථෙර භික්ෂූන් වැඳ ධර්මාසනයෙහි හිඳ විජිනිපත ගත්හ. එවිට කාශ්‍යප තෙරණුවෝ ඇවැත්නි, කුමක් පළමුව සංගායනා කරමුදැයි භික්ෂූන් විමසූහ. ස්වාමීනි, සූත්‍රාන්ත පිටකයයි. සූත්‍රාන්ත පිටකයෙහි සංගායනා සතරකි. එයින් කුමක් පළමුව සංගායනා කරමු ද? දීඝනිකාය සංගීතියයි. ස්වාමීනි, දීඝනිකාය සංගීතියෙහි සූත්‍ර තිස් හතරකි. වර්ග තුනකි. ඉන් පළමුවෙන් කවර වර්ගය ද? ස්වාමීනි, සීලක්ඛන්ධවර්ගයයි. සීලකඛන්ධ වර්ගයෙහි සූත්‍රාන්ත දහ තුනකි. එයින් කවර සූත්‍රය ද? ස්වාමීනි, බ්‍රහ්මජාල සූත්‍රයයි. ත්‍රිවිධ සීලයෙන් අලංකෘත කුහන ලපනාදි නානා විධ මිච්ඡාජීව නසාලන දෙසැට මිසදිටු දැල් නිරවුල් කරන සහස්‍රී ලෝකධාතුව කම්පා කරවන එය පළමුව සංගායනා කරමු.

එවිට මහ කසුප් තෙරණුවෝ අනඳ තෙරුන්ට මෙසේ කීහ. ආයුෂ්මත් ආනන්දය, භාග්‍යවතුන් වහන්සේ බ්‍රහ්මජාල සූත්‍රය කොහිදී දේශනා කළ සේක්ද? ස්වාමීනි, රජගහ නුවරටත් නාලන්දාවටත් අතර අම්බලට්ඨිකාවෙහි රාජාගාරයෙහිදීය. කවරකු අරභයා ද? සුප්පිය පරිබ්‍රාජක සහ බ්‍රහ්මදත්ත මාණවක අරභයායි. කිනම් වස්තුවෙක්හි ද? ත්‍රිවර්ණ වර්ණනයෙහිය. මහකසුප් තෙරණුවෝ අනඳ තෙරුන්ගෙන් බ්‍රහ්මජාල සූත්‍ර වස්තුව ද විමසූහ. නිදානය ද විමසූහ. පුද්ගලයා ද විමසූහ. අනඳ තෙරණුවෝ විසඳූහ. විසඳීම් අවසන පන්සියයක් රහතන් වහන්සේලා ගණසජ්ඣායනා කළහ. එකල්හි සහස්‍රලෝකධාතු මහාපෘථුවිය කම්පාවිය. මෙසේ බඹදැල් සූතුර සංගායනා කොට ඉන්පසු සාමඤ්ඤඵල සූත්‍රය මෙබඳු පුච්ඡා

විසර්ජනානුක්‍රමයෙන් බ්‍රහ්මජාලය සමග සියලු සුත්‍රාන්ත දහ තුන සංගායනා කොට මේ සීලක්ඛන්ධ නමැයි කියා තැබූහ. අනතුරුව සූත්‍ර දසයෙකින් යුත් මහාවග්ගය අනතුරුව සූත්‍ර එකොළොසකින් යුත් පාතියවග්ගදැයි වග් සංග්‍රහ ඇති සූතිස් සුතුරකින් යුත් සූසැට බණවරකින් පරිමිත දීඝනිකාය සංගායනා කොට මේ දීඝනිකාය නමැයි කියා ආයුෂ්මත් ආනන්දයෙනි, මෙය ඔබගේ නිශ්‍රිතයන්ට උගන්වන්නැයි අනඳ තෙරුන්ටම භාර කළහ.

ඉක්බිති අසූ බණවරකින් පරිමිත මජ්ඣිමනිකාය සංගායනා කොට දම්සෙනෙවි සැරියුත් තෙරණුවන්ගේ නිශ්‍රිතයන්ට ඇවැත්නි, මෙය ඔබලා පරිහරණය කරන්නැයි භාර කළහ. අනතුරුව බණවර සියයකින් පරිමිත සංයුක්තනිකාය සංගායනා කොට, ඔබවහන්සේගේ ශිෂ්‍යයන්ට උගන්වනු මැනවයි මහකසුප් තෙරණුවන්ට භාර කළහ. අනතුරුව බණවර දෙදහසකින් පරිමිත අංගුත්තරනිකාය සංගායනා කොට ස්වාමීනි, මෙය ඔබගේ සිසුන්ට උගන්වනු මැනවැයි අනුරුද්ධ තෙරුන්ට පැවරූහ. ඉන්පසු ධම්ම සංගණී, විභංග, ධාතුකථා, පුග්ගලපඤ්ඤත්ති, කථාවත්ථු, යමක, පට්ඨාන යන සියුම් ඥාණ ගෝචර තන්තිය වූ අභිධම්ය සංගායනා කොට මෙය, අභිධම් පිටකය නමැයි පන්සියයක් රහතන් වහන්සේලා ගණසජ්ඣායන කළහ. කී පරිදිම පොළොව කම්පා විය. ඉන්පසු ජාතක, මහානිද්දේස, පටිස-ම්භිදාමග්ග, අපදාන, සුත්තනිපාත, බුද්දකපාඨ, ධම්මපද, උදාන, ඉතිවුත්තක, විමානවත්ථු, පෙතවත්ථු, ථෙරගාථා, ථෙරීගාථා, බුද්ධවංස, චරියාපිටක යන මේ පෙළ සංගායනා කොට බුද්දකග්ගථ නමැයි කියා අභිධම් පිටකයෙහිම සංගායනාරූඪ කළහ. මෙසේ මේ සම්බුද්ධ වචනය රස වශයෙන් එක් බඳුය. ධම් විනය වශයෙන් දෙවැදෑරුම්ය. පිටක වශයෙන් ත්‍රිවිධය. ආගම වශයෙන් චතුර්විධය. නිකාය වශයෙන් පඤ්චවිධය. අංග වශයෙන් නව විධය. ධම් ස්කන්ධ වශයෙන් සුවාසූ දහස්විධ යයි දත යුතුයි. මේ ප්‍රභේදය ව්‍යවස්ථාපනය කොටම සංගීතිය සත් මසකින් නිමකළහ. සංගීති අවසානයෙහි මහාකාශ්‍යප තෙරණුවන් විසින් මේ දසබල ශාසනය පස්වාදහසක් පමණ කල්

පැවැත්මට සමත් කරන ලදැයි හටගත් ප්‍රමෝදයෙන් සාධුකාර දෙන්නාක් මෙන් ජලපොළොව කෙළවර කොට ඇති මේ මහ පොළොව අනෙක ප්‍රකාරයෙන් කම්පා විය. බෙහෙවින් කම්පාවිය. වෙව්ලා ගියේය. අනේක ආශ්චර්‍යයෝ ද පහළ වූහ.

සංගීතිකථා නිමි

ඉක්බිති මහාකාශ්‍යප තෙරණුවන්ගේ පරිනිර්වාණය වර්ණනා කරමි. මහසුප් තෙරණුවෝ පන්සියයක් රහතුන් සමඟ සප්තපර්ණි ගුහාද්වාරයෙහි ධර්ම සංගීතිය කොට ඒ රජගහ නුවර වේළුවන විහාරයෙහිම භික්ෂු සංඝයා සමඟ විසූහ. එකල්හි අජාසත් රජ මහ කසුප් තෙරුන් තථාගතයන් වහන්සේ මෙන් හඟිමින් බික්සඟන සහිත තෙරුන්ට සිව්පසයෙන් නිරන්තරවම උවටැන් කළේය. තෙරුන් වහන්සේ එක් විටෙක ධාතූන්ට අනතුරු දැක ඉඳින් මම ධාතු නිධානයක් නොකෙළෙමි නම් නොබෝ කලකින් ධාතූන් වහන්සේලා අතුරුදහන් වෙති. එහෙයින් මම ධාතු නිධානය කරමි. ධාතු පවත්නා විට බුදුන් සිටින්නාක් මෙනි කියා සිතා රජුවෙත ගොස් ධාතු නිධානයක් කිරීම සුදුසු යයි කීහ. රජ මැනව ස්වාමීනියි තෙරුන්ගේ කීම මුදුනින් පිළිගෙන ස්වාමීනි, නිධාන කර්මාන්තය මට භාරය. සෙසු ධාතු කෙසේ ගෙන එන සේක් ද? මහරජ, ධාතුගෙන ඊම ඔබට භාර නොවේ. එය අපටම භාරයයි කීහ. හොඳයි ස්වාමීනි, ඔබ වහන්සේ ධාතු ගෙන එනු මැනව. මම නිධානය කරමියි කීය.

එවිට මහකසුප් තරණුවෝ ඒ ඒ රජකුලවලට පුද කිරීමට පමණක් තබා සෙසු ධාතු ගෙන ආහ. රාමගාමයෙහි ධාතු නාගයෝ පිදූහ. ඒ ධාතුවලට අනතුරක් නැත. අනාගතයෙහි ලක්දිව මහා-විහාරයෙහි මහසෑයෙහි පිහිටන්නේ යයි තෙරුන් වහන්සේ නොගෙනාහ. සෙසු සත්නුවර ධාතු ගෙනවුත් රජගහ නුවරින් නැගෙනහිර සිට මෙතැන යම් පාෂාණයෙක් ඇද්ද. එය අතුරුදන්

වේවා. පස් පිරිසිදු වේවා. ජලය මතු නොවේවායි අධිෂ්ඨාන කළහ. ඉක්බිති රජ ඒ ස්ථානය මිනිසුන් ලවා සාරවා එයින් ගොඩදැමූ පස්වලින් ගඩොළු තනා අසූ මහාශ්‍රාවකයන්ට චෛත්‍ය කරවීය. රජ මෙහි කුමක් කරන්නේදැයි විමසන්නවුන්ට මහාශ්‍රාවකයන් සඳහා චෛත්‍යයයි කියති. කිසිවෙක් ධාතු නිධානයක් බව නොදනිති. අසූරියන් පමණ එතැන ගැඹුරු වූ කල්හි යට ලෝතහඬු අතුරුවා එහි ථූපාරාමයෙහි චෙතිය සරය පමණ තඹලෝමුවා ගෙයක් කරවා සුදුහඳුන්මුවා කරඬු අටක් ද ස්තූප අටක් ද කරවීය. ඉක්බිති බුද්ධධාතු සුදුහඳුන් කරඬුවක බහාලීය. එය ද අනිකක බහාලීය. මෙසේ සුදුහඳුන් කරඬු අට එකතු කොට මේ ක්‍රමයෙන්ම සුදුහඳුන් කරඬු අට සුදු හඳුන් ස්තූප අටක බහාලීය.

සුදුහඳුන් ථූප අට රත්හඳුන් කරඬු අටක බහාලීය. රත්හඳුන් කරඬු අට රත්හඳුන් ථූප අටක බහාලීය. රත් හඳුන් ථූප අට දළකරඬු අටක බහාලීය. දළකරඬු අට දළථූප අටක බහාලීය. දළථූප අට සවිරත්නකරඬු අටක බහාලීය. සවිරත්නකරඬු අට සවිරත්න ස්තූප අටක බහාලීය. සවිරත්න ථූප අට රන්කරඬු අටක බහාලීය. රත්කරඬු අට රන්ථූප අටක බහාලීය. රන්ථූප අට රිදීකරඬු අටක බහාලීය. රිදීකරඬු අට රිදීථූප අටක බහාලීය. රිදීථූප අට මිණිකරඬු අටක බහාලීය. මිණිකරඬු අට මිණිථූප අටක බහාලීය. මිණිථූප අට ලෝහිතංකකරඬු අටක බහාලීහ. ලෝහිතංකකරඬු අට ලෝහිතංක ථූප අටක බහාලීහ. ලෝහිතංකථූප අට මසාරගල්ලකරඬු අටක බහාලීහ. මසාරගල්ලකරඬු අට මසාරගල්ලථූප අටක බහාලීය. මසාරගල්ලථූප අට පළිඟුකරඬු අටක බහාලීය. පළිඟුකරඬු අට පළිඟුථූප අටක බහාලීහ. හැමට පළමු පළිඟුමුවා චෛත්‍යය ථූපාරාම චෛත්‍යසරය පමණ වෙයි. එහි උඩ සවිරත්නමය ගෙයක් කරවීය. ඒ මත රන්මුවා ගෙයක් කරවීය. ඒ මත රිදීමුවා ගෙයක් ද ඒ මත තඹලෝගෙයක් ද කරවීය. එහි සවිරත්නමය වැලි විසිරුවා දිය ගොඩ මල් ලක්ෂගණන් විසුරුවා පන්සිය පනස් ජාතක අසූ මහා-ශ්‍රාවකයන් ද සුදොවුත් මහරජු ද මහාමායාදේවිය ද සත් සහජාතයන් ද සියල්ල රනින් ම කරවා පන්සියයක් රන් පහන් ද පන්සියයක් රිදී පහන් ද සුවඳ තෙලින් පුරවා දුහුල් වැටි තැබ්බවීය.

ඉක්බිති කාශ්‍යප තෙරණුවෝ මල් නොමැළවේවා. සුවඳ හානි නොවේවා. පහන් නොනිවේවායි අධිෂ්ඨාන කළහ. අනාගතයෙහි පියදාස නම් කුමාරතෙම සේසත් නංවා අශෝක නම් සක්විතිවෙයි. හෙතෙම මේ ධාතු පතුරුවා හරනේයයි රන් පටෙහි අකුරු ලියවීය. ඉක්බිති රජ තමාගේ අධිකාරය දැක ප්‍රීති හරිත හදින් අභිවර්ධනය වූ ශ්‍රද්ධාවෙන් පඤ්චප්‍රසාදයෙන් පුදා පසඟ පිහිටුවා වැඳ නැඟී මුලපටන් දොරවල් වස්වා නික්ම ලෝහදොර වසා යතුරු මුදු ලණුවක ගැටගසා එහිම මහත් මැණික් කඳක් මත තබා අනාගතයෙහි දිළිඳු රජෙක් මේ මැණික ගෙන ධාතූන්ට සත්කාර කෙරේවායි අකුරු කෙටවීය. ඉක්බිති සක්දෙව්රජ ධාතු ආරක්ෂාව පිණිස විශ්වකර්මයන් අමතා දරුව, අජාසත් රජු විසින් ධාතුනිධානයක් කරන ලදි. එහි රැකවල් ලවයි කීය. ඔහු පැමිණ බලසංඝාට යන්ත්‍රය යෙදීය. එහි රූප පළිඟුවන් කඩු ගෙන පවනට බිඳු වේගයෙන් ධාතු ගර්භය වටා කැරකෙයි. යන්ත්‍රය යොදා එකම ඇණයකින් සවිකොට ධතු ගර්භය වටා හාත්පසින් ගලින් වට කොට මත්තෙහි එකම ගලකින් වසා පස් දමා පොළොව සමතල කොට ඊ මත පාෂාණමය ථූපයක් පිහිටුවීය.

මෙසේ ධාතු නිධානය නිමවූ පසු මහාකාශ්‍යප තෙරුන් වහන්සේ ඒ වේළුවනයෙහිම වසමින් කල් ගෙවූහ. මෙසේ කල් ගෙවූ තෙරුන් වහන්සේ එක් රැයක එල සමවතින් නැඟී සිය ආයු සංස්කාරය බැලූහ. මම දැන් එක්සිය විසිවයස් වූයෙමි. මාගේ ආයු සංස්කාරය කෙතෙක් පවතීදැයි විමසද්දී ආයුසංස්කාරය පිරිහුණ බැව් දැන කවදා පිරිනිවෙම්දැයි බලන්නාහු අදම රැය ගෙවීමෙන් පිරිනිවන්පාමි. කොහි පිරිනිවෙම් දැයි ඒරජගහ නුවරම අවට බිම් පියස බලන්නාහු කුක්කුටසම්පාත නම් තුන් පර්වතය අතර පිරිනිවෙමියි සිතූහ.

උන් වහන්සේ මෙසේ සිතා රැය පහන් වූ කල සිරුරු පිළිදැගුම් කොට භික්ෂු සංඝයා රැස් කරවා ඇවැත්නි, ඔබලා ශාස්තෘ ශාසනයෙහි අප්‍රමාදව පිළිවෙත් අප්‍රමාදයෙන් සම්පාදනය කරව්. මම ද ඇවැත්නි, පිරිනිවීමට සුදුසු ආයුසංස්කාර ඇත්තෙමි. අද

සවසම කුක්කුට සම්පාත නම් තුන් කඳු අතරෙහි පිරිනිවෙමියි කීහ. එවිට පුහුදුන් භික්ෂූහු තෙරුන්ගේ පිරිනිවන අසා තමන් දරාගත නොහැකිව අහෝ ඒකාන්තයෙන්ම අපි අනාථ වීමු. ශාස්තෘන් වහන්සේ පිරිනිවියත් ආයුෂ්යන් වහන්සේ ජීවත්වීම ශාස්තෘන් වහන්සේ මෙනැයි සිතුවෙමු. දැන් උන් වහන්සේ පිරිනිවෙති. කවරෙක් නම් අපට අවවාද අනුශාසනා දෙත් ද කිය කියා වැලපුණහ. රහතන් වහන්සේලාට ධර්ම සංවේගය ඇති විය. අහෝ සංස්කාරයෝ ඒකාන්තයෙන් අනිත්‍යයහ. අස්ථිරය. වෙනස්වන සුලුය කියායි. තෙරණුවෝ භික්ෂු සංඝයා අනිත්‍යතාප්‍රතිසංයුක්ත ධර්මකථායෙන් සනසා ඉදින් ඔබ වහන්සේලා මාගේ පිරිනිවන දකිනු කැමැත්තාහු නම් කුක්කුට සම්පාත පර්වත ප්‍රදේශයෙහි රැස්ව බලනු මැනවැයි ද කීහ.

තෙරුන් වහන්සේ පිණ්ඩපාත වේලාවෙහි නැගී අඳනය ඇඳ විදුලිය වැනි කාය බන්ධනය බැඳ නව විටක් පොළොව කම්පා වීමට සමත් සර්ඥයන් වහන්සේ විසින් දෙන ලද මේඝවර්ණ පෘථුල ගරුක පාංශුකුල මහාචීවරය පොරවා පාත්‍රය ගෙන මිණිසන්නාහයෙන් සන්නාහ ගන්වන ලද මහඇතෙකු මෙන් ධීරගමනින් සංසුන් ඉඳුරන් ඇතිව සන්සුන් මනසින් වියදඬු පමණ දුර බලමින් සෝභමාන පැවිදි වෙසින් රජගහ නුවර පිඬු පිණිස වැඩියහ. උන් වහන්සේ ගෙපිළිවෙළින් පිඬු සිඟා දන් වැළඳූහ. එදින භික්ෂු සංඝයා ද දන් වළඳා තෙරුන්ගේ පිරිනිවන බලමුයි උනුන් අමතා ඔබින් මොබින් නික්ම රැස් වූහ. වෙනත් දිව්‍යමනුෂ්‍යයෝ ද තෙරුන්ගේ පිරිනිවන අසා ගඳ මල් ආදි පූජා සත්කාර ගෙන කුක්කුටසම්පාත පර්වත බිම් පියසෙහි රැස් වූහ.

මහාකස්සප තෙරණුවෝ ද දන් වළඳා මෙසේ සිතූහ. අජාසත් රජ අපට බහූපකාරය. සංඝයාගේ ප්‍රත්‍ය දායකයෙකි. රත්නත්‍රය මාමකය. බුදුසසුනෙහි බැඳීම් ඇත්තේය. ඔහුට ද දන්වා පිරිනිවෙමියි අසුනින් නැගිට මනාව හැඳ පෙරව මද්දහනෙහිම රජගහ නුවරට පිවිසියහ. තෙරුන් වඩින වේලෙහි රජ අනුභව කොට යහන් ගැබට

වැද නිදන්නේ වෙයි. රජගෙට පිවිසෙන තෙරුන් දුටු ඇමැතියෝ "අප රජුගේ උපාධ්‍යායයන් වහන්සේ මහමද්දහනෙහිම වඩිති. කුමකට දැයි අසුනින් නැගිට පෙරගමන් කොට වැඳ සිටියහ. තෙරුන් වහන්සේ උපාසකයෙනි, රජතුමා කොහිදැයි ඇමැතියන්ගෙන් විමසූහ. ස්වාමීනි, නිදතියි කියා උන්වහන්සේ වැඩි කරුණ ඇසූහ. තෙරණුවෝ ඔව් උපාසකවරුනි, මම රජුටත් දන්වා අද සවසම පිරිනිවිමෙයි කීහ. ස්වාමීනි, කොහි පිරිනිවෙන සේක් ද? කුක්කුට-සම්පාත පර්වතයන් අතරැයි මෙපමණක්ම කියා වැඩියහ.

තෙරුන් වහන්සේ විහාරයෙහි හැමදීම් ආදි කළයුතු වත් කොට මහත් භික්ෂු සංඝයා පිරිවරා කුක්කුටසම්පාත පර්වතය බලා පිටත් වූහ. උන්වහන්සේ එතනට වැඩ එහිම පිරිනිවන දැක්වීම සඳහා අහසට පැන නැග සත් තල් කඳක් පමණ අහසෙහි සිට දෘශ්‍යමාන කයින් සිට පළමුව දකුණු කයින් ගිනි ජාලාවක් විසිර වූහ. වම් කයින් ජලධාරාවක් විසිර වූහ. ඉක්බිති වම් කයින් ගිනිකඳ දකුණු කයින් ජලය ද එසේම උඩු කයින් ජලය ද හැට කයින් ගින්න ද නැවත යට කයින් ජලය ද උඩු කයින් ගින්නද කිසි විටක සිරුරෙන් ගිනි දැල් ද කිසි විටක සියල් සිරුරින් දිය දහරා ද විසිර වූ සේක. කිසි විටෙක මෘදුව හැසිරෙන මඳ පවනින් සැලෙන රළ පෙන සහිත සැලෙන බබළන ජලය හා ගින්න ද එක්වර දක්වා දහම් දෙසූහ. වරෙක මලින් පලින් සැදි හිමවත් පර්වතය දැක් වූහ. කිසිවිටෙක පස්වනක් පියුමෙන් සැදි මහමුහුද වැනි ජලතලා දැක්වූහ. කිසි විටෙක දොළොස් යොදුන් පිරිමඩුලු ඇති සිව්රඟ සෙන් පිරිවැරූ සත්රුවනින් යුත් සක්විති රුව දක්වති. කිසි විටෙක තුන් ගව් පමණ අබරණින් සැරසුණ තව්තිසාදෙව් ගණ පිරුවැරූ සක් දෙවිඳු රුව දක්වති. කිසි විටෙක තුන් යොදුන් අත්බවෙන් යුත් බඹගණ පිරිවැරූ මහබඹරුව දක්වති.

මෙසේ තෙරුන් වහන්සේ නන්වැදෑරුම් ප්‍රාතිහාර්‍ය දක්ව දක්වා අහසෙහි සිට දහම්දෙසා අහසින් බැස භික්ෂූන්ට ද දන්වා තෙපව් අතරට පිවිස මම මෙතැන්හිම පිරිනිවෙමියි සිතූහ. සිතත්

සමඟම දෙව්සමූහයා හැඳ ඇතුරුහ. ඇඳ වටා නිලුපුල්, පියුම්, කුමුදු, පුණ්ඩරික පිරූ පුන්කලස් තැබූහ. ඇඳ සතර කොණ දුම්ලොපු සතරක් ද දඬුවැටපහන් සතරක් ද තැබූහ. නොයෙක් පුෂ්පසත්කාර ද අනර්ඝ පිළීවියන් ද මල් පහන් ද තැබූහ. තෙරුන් වහන්සේ සයනයට නැඟ හිඳ අධිෂ්ඨානයක් කළහ. මාගේ ආයුසංස්කාරය හළ කෙණෙහිම මේ තුන් පර්වතය එකිනෙක එක්ව යටිකුරු කළ පාත්‍රයක් මෙන් යහන් ගැබක් බවට පත් වේවා. මේ මල් ද නොපරවේවා. පහන් සතර ද ධූප සතර ද නොනිවේවා. මිනිසුන්ගේ සියයක් ආයු පිරිහී දසවස් ආයු කාලයෙහි අන්තර කල්පයක් වෙයි. අන්තර කල්පය ගෙවී මනුෂ්‍යයෝ ආයුෂයෙන් වැඩී අසංඛ්‍යායුෂ්ක වෙති. ඉක්බිති මිනිසුන්ගේ ඒ ආයු පිරිහි අසූදහසක් අවුරුද්දට ආයු වූ කල්හි මහ පොළොව යොදුනක් පමණ උසට වැඩේ.

එකල්හි ආර්‍ය්‍ය මෛත්‍රෙය නම් සම්‍යග් සම්බුද්ධයන් වහන්සේ ලොව උපදනා සේක. උන්වහන්සේ දම්සක් පවත්වා දොළොස් යොදුනක් පැතිරි පිරිස් පිරිවරා මෙතැනට පැමිණ තමන් වහන්සේම මාගේ ශරීරය ඔසවා චක්‍ර ලක්‍ෂණ ලලිත රතු මෘදු දකුණු අත් තලෙහි තබා භික්‍ෂු සංඝයා මැද දෙව් මිනිසුන් මැද මාගේ ශරීරය දක්වති. ඔබලා මේ තෙරුන් දන්නහු ද? මෙතෙම මාගේ දෙටුසොහොයුරු ගෞතම සම්බුදුන්ගේ කාලයෙහි මහාකාශ්‍යප නම් මහාශ්‍රාවකයාය. තෙලෙස් ධූතාංගධාරීය. තමන් පාංශුකූලිකව පාංශුකූලිකයන්ගේ ගුණ කියන්නේය. තමන් තෙචීවරිකව තෙචීවරිකයන්ගේ ගුණ කියන්නේය. තමන් පිණ්ඩපාතිකව - පෙ- එකාසනිකව පත්ත පිණ්ඩිකව ඛලු-පච්චාභත්තිකව ආරඤ්ඤකව රුක්ඛමූලිකව අබ්භෝකාසිකව සොසානිකව යථාසන්තතිකව නේසජ්ජිකව නේසජ්ජිකයන්ගේ ගුණ කියන්නේය. පැවිදි වූ තැන් පටන් පිරිනිවන දක්වා ඇඳෙක පිට නොදිගහැරියේය. අතිඋත්කෘෂ්ට ධූතාංගධාරී අල්පේච්ඡ සන්තුෂ්ට විර්‍යාරබ්ධව කුලයෙහි හෝ ගණයෙහි නොලැග පිරිසිදු ආජීවයෙන් ගුවන් තලයෙහි පිරිපුන් සඳමෙන් බුදු සසුනෙහි ප්‍රකට විය. මේ අයුරින් උන්වහන්සේ මහාපොළොව කුඩා කොට මාගේ ගුණ ඉතා

ගැඹුරුකොට ප්‍රකාශ කරන සේක. මහමෙර පහත් කොට මාගේ ගුණ උස් කොට ප්‍රකාශ කරන සේක. එකෙණෙහිම මාගේ ශරීරයෙන් ගිනිදැල් නැඟී තථාගතයන් වහන්සේගේ අත් තලයෙහිම දැවී යේවා කියායි.

නැවත මෙසේත් අධිෂ්ඨාන කළහ. යම් විටක අජාසත් රජ මාගේ පිරිනිවන අසා වඳිනු කැමැතිව මෙතනට පැමිණේ ද එවිට මේ තුන් පර්වතය වෙන් වේවා. රජ වැඳ නිම වූ පසු මේ පර්වත එක් වේවා කියායි. මෙසේ අදිටන් කොට තෙරුන් වහන්සේ ඒ මැද හෙව අනුපාදිශේෂ නිර්වාණ ධාතුවෙන් පිරිනිවි සේක. එකෙණෙහි තෙරුන්ගේ අදිටන් බෙලෙන් තුන් පර්වතය එක්ව මුනින් නැවූ පාත්‍රයක් මෙන් ඒකඝන විය. එවිට ඒ භික්ෂු සංඝයා ආදි කොට ඇති දෙව් මිනිස්සු පර්වතයෙන් වැසුණු තෙරුන්ගේ ශරීරය නොදැක එක් විටම ඇඬූහ. වැලපුණහ. පර්වතයෙන් බැහැරවම පුදසත්කාර කළහ. නොයෙක් ආශ්චර්ය ද පහළ විය. එකල රජ මැඳුරෙහි ඇමැතියෝ තෙරුන් වැඩි පසු සාකච්ඡා කළහ. ඉදින් අවදි වී රජ තෙරුන්ගේ පිරිනිවන අසා තෙරුන්ට ඇති දැඩි සෙනෙහෙ බලයෙන් දැඩි සෝක සන්තාපයෙන් තැවුණු හදින් කළුරිය කළ හැකිය. අපි දැන් උපායකින් රජුගේ ජීවිතය රැකගනිමු කියායි.

ඔවුහු මෙසේ සාකච්ඡා කොට වෙදුන් කැඳවා එපුවත ඔවුන්ට කියා කුමක් කටයුතුදැයි ඇසූහ. එවිට ඒ වෙදවරු එසේ නම් ඖෂධ ප්‍රයෝග යොදමුයි කීහ. එකෙණෙහි එක් දෙණක් ගෙන උක් රසයෙන් පිරවූහ. එකක් කිරිවලින් ද එකක් දීමණ්ඩයෙන් ද එකක් ගිතෙල් මණ්ඩයෙන් ද එකක් ගඳකලලින් ද එකක් මැටි කලලින් ද එකක් සිසිල් දියෙන් ද පිරවූහ. මෙසේ සත් දෙණක් ඖෂධ ප්‍රයෝගයෙන් පුරවා රජ අවදි වන තුරු බලා සිටියහ. එවිට රජ අවදි වී සයනයෙන් නැඟී ගැබින් නික්ම මහමඬුවෙහි එසවූ සේසත් ඇති සිහසුනෙහි වාඩිවිය. එවිට ඔවුහු තෙරුන් වැඩි බව සැලකළහ. දේවයන් වහන්ස, ඔබ වහන්සේගේ උපාධ්‍යාය මහාකාශ්‍යප තෙරණුවෝ මෙහි වැඩියහ. කුමකට ද? ඔබ වහන්සේට දැන්වීම පිණිසයි. උන්වහන්සේ කොහි

වසක්ද දේවයිනි, පිරිනිවෙනු කැමැත්තාහ. කවදා පිරිනිවෙත් ද? දේවයිනි, දැන් සැන්දෑවෙහිය. එය අසා රජ තෙරුන් කෙරෙහි වූ දැඩි සෙනෙහෙ බලයෙන් ක්ෂත්‍රිය මාන අමතකව තමන් දරා ගත නොහැකිව බලවත් ශෝක සන්තාපයෙන් උණුසුම් කයින් විසංඥව වැටුණේය.

එවිට ඒ හිතකාමී ඇමැතියෝ රජු ඔසවා උක්රස දෙණෙහි ගිල්වූහ. ඇමැතියෝ එයින් ඔසවා කිරි දෙණෙහි හොවාලූහ. රජ කිරෙහි බලයෙන් සැනසුම ලබා නැවතත් තෙරුන් වැඩි කරුණ ඇසීය. ඇමැතියෝ එපරිදිම කරුණ දැන්වූහ. රජ යළිත් සිහිසුන්ව කිරි දෙණෙහි ඇද වැටුණේය. ඇමැතියෝ රජු ඔසවා දී දෙණෙහි හොවාලූහ. මේ ක්‍රමයෙන් ගිතෙල් මණ්ඩ දෙණෙහි හොවාලූහ. ඉක්බිති ගඳකලල් දෙණෙහි මැටි කලල් දෙණෙහි සිහිල් දිය දෙණෙහි හොවාලූහ. රජ මහාඖෂධ ප්‍රයෝගයෙන් හා උත්සාහයෙන් අස් වැසුම් ලබා හවත්නි, මාගේ උපාධ්‍යායයන් වහන්සේ කොහි පිරිනිවෙනු කැමැති වූ සේක්දැයි විමසූහ. දේවයිනි, කුක්කුටසම්පාත පර්වතයෙහිය. ඉක්බිති රජ සියලු රජගහ නුවර සෝෂා කොට ඡත්‍ර, ධජ, පතාක, බෙර, පටහ, ශංඛ, පණව ආදිය ද විවිධ පූජොපකරණාදිය ද ගෙන සිව්රඟසෙන් සහිතව නුවරින් නික්ම කුක්කුටසම්පාත පර්වතස්ථානයට පැමිණ තුන්කඳු ඒකඝනව ඇති බව දැන දරුවනි, උපාධ්‍යායයන් වහන්සේගේ සිරුර කොහි තිබේදැයි මහජනයාගෙන් ඇසීය. දේවයිනි, මේ පර්වත තුන ඇතුළත යයි කීහ.

එයසා රජ කවර නම් උපායකින් උපාධ්‍යායයන්ගේ ශරීරය පුදනු හැකි වන්නේ දැයි සිතන්නේ සත්‍යක්‍රියාව හැර වෙනත් උපායක් මට නැතැයි සිතා දණමඬල පොළොවෙහි තබා පසඟ පිහිටුවා වැඳ හිසෙහි ඇදිලි බැඳ දේවතාවෝ සිටිත් නම් මාගේ වචනය අසත්වා. උපාධ්‍යායයන් වහන්සේ කෙරෙහි මාගේ බලවත් ප්‍රීතියත් ශ්‍රද්ධාවත් ඉදින් සත්‍යයක් නම් මේ තුන් පර්වතය වෙන් වේවායි සත්‍යක්‍රියා කළේය. රජුගේ අදිටන් බෙලෙන් මෙන්ම මහාකාශ්‍යප තෙරණුවන්ගේ අධිෂ්ඨාන බලයෙන් තුන් පර්වතය වජ්‍රයෙන්

බිඳිගියාක් මෙන් වෙන් විය. ඒ අසිරිය දුටු මහජනකාය විස්මය පත්ව පිළිසිසැරීම්, අසුරු ගැසීම්, අත්පොළසන් දීම්, ලක්ෂ ගණන් සාධු කාරදීම් කළහ. රජ ද ඇඳමත හෝනා දේවතාවන් පිදූ පුදසත්කාර සහිත තෙරුන්ගේ සිරුර දැක ආශ්චර්ය අද්භූතව ප්‍රමුදිතව අනවරතයෙන් වැගිරෙන කඳුළු දහරාවෙන් තෙත්.මුවමඬලින් අඬ අඬා ළඟට ගොස් තෙරුන්ගේ පා හිසින් නැමැද නැවත නැවත වැඳ ඡත්‍ර, ධජ, පතාක, දීප, ධූප, ගන්ධ මාලාදියෙන් පිදීය. එම ස්ථානයෙහිම සාධුක්‍රීඩා කළේය. සතියක් ඇවෑමෙන් ඒ තුන් පර්වතය එක්ව ඒකඝන විය. එවිට රජ මහජනයා සමඟ බැසගිය හිරු මෙන් තෙරුන්ගේ සිරුර නොදැක බලවත් සොවින් හඬ ා නැමැඳ මහ ජනයා සමඟින් නුවරට පිවිසියේය. තෙරුන්ගේ ශරීරය අද දක්වාත් පවත්නේය. යම් දිනක මෛත්‍රෙය සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ ලොව උපදනා සේක් ද එතෙක් විනාශ නොවන්නේය. නොවිසි-රෙන්නේය. කුණු වීමකට පත් නොවන්නේය. අනාගතයෙහි ආයුෂ්මත් මෛත්‍රෙය සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ ලොව ඉපිද උන් වහන්සේගේ අත්තලයෙහිම තෙරුන්ගේ ශරීරය දැවෙන්නේය. මෛත්‍රෙය ලෝකනායකයන් වහන්සේ එම ස්ථානයෙහි තෙරුන්ගේ ධාතු චෛත්‍යය ලෝකපූජිත කරවන සේක.

මහාකාශ්‍යප තෙරුන් වහන්සේගේ මේ පරිනිර්වාණ කතාව නිමියේය.

අනාගතයෙහි මෛත්තෙය්‍ය නම් නායකයාණෝ සම්‍යක් සම්බුද්ධ වන සේක. උන්වහන්සේගේ අභිනීහාරය පවසමි. එය අසව්.

මෙයින් සොළසැකි කප්ලක්ෂයකින් මත්තෙහි පෙර බුදුවරුන් වෙත විවරණ ලත් මෙතේ බෝසතාණෝ සියලු බෝසතුන් විසින් පුරන ලද දාන, සීල, නෙක්ඛම්ම, පඤ්ඤා, විරිය, ඛන්ති, සච්ච අධිට්ඨාන, මෙත්තා, උපෙක්ඛා දස පාරමිතා දස උපපාරමිතා දස පරමත්ථපාරමිතා යන සමතිස් පැරුම් පුරා සම්බුදුබව අවබෝධ කරනු පිණිස සසර සරමින් ලොකාර්ථචර්යා ඥාත්‍යර්ථචර්යා බුද්ධිචර්යායෙහි යෙදෙමින් ධන-දාර-පුත්‍ර-අංග-ජීවිත යන පංච මහාපරිත්‍යාග කොට බෝධිසම්භාරයන් කැටි කරමින් නුවණ මුහුකරවීම් මුහුකුරුවා පිළිවෙළින් සොළසැකි කප් සුවහසක් පසුකොට මේ හද්‍ර කල්පයෙහි අප බුදුන් කලම දෙව්ලොවින් සැව සැවතින් තුන් යොදුන්වූ සමෘද්ධිමත් භවභොග සම්පන්න සංකස්ස නුවර සිරිවඩ්ඪ මහාසාර ගෘහපතියාගේ මහමෙහෙසි කුස පිළිසිඳ ගත්හ. දසමස් ඇවෑමෙන් මවුකුසින් බිහිව මහත්වූ යස ඉසුරු සැපයෙන් වැඩී දිසාපාමොක් ආචාරීන් වෙත සියලු සිප් හැදෑරූහ. මවුපිය ඇවෑමෙන් සියලු ධනදායාද පිළිගෙන මහපිරිවර සහිත වූහ.

එකල අප බුදුහු පරමාභිසම්බෝධිය අවබෝධ කොට අභිසම්බොධියෙන් සත්වන අවුරුද්දෙහි සැවැත්නුවර ගණ්ඩ අඹරුක්මුල තීර්ථකමාන දමනය පිණිස දස දහසක් සක්වළ දෙවිගණ සහිත සතිස් යොදුන් පිරිමඬලෙහි රැස් පිරිස් මැද සියලු බුදුවරයන් විසින් ආචීර්ණ අනන්‍යසාධාරණ ජලගිනි මුදාලන යමාමහ පෙළහර පාමින් යමකපාටිහාරිය ඤාණයෙහි සිට -

බුද්ධවිෂය වූ අනෙකප්‍රකාර සෘද්ධිප්‍රාතිහාර්ය කළ සේක. ශාස්තෘ ශරීරයෙන් පැන නැගි නිල් කහ රතු සුදු මදටිය පබසර රස් දුවයි. පැතිරෙයි. එකිනෙක බබළයි. විපුල සවනක් රස් සියල් දිගුන් බබුළුවයි. ශාස්තෘන් වහන්සේ එහි අහස

සිටිමින් හිඳිමින් සක්මන් කරමින් සයනය කරමින් ඉර හඳ දෙක අතින් ස්පර්ශ කරන සේක. සිරුරින් ජලය නික්මවති. ඉක්බිති ගිනි නික්මවති. ශාස්තෘන් වහන්සේ උඩුකය යටිකය පෙරළා ජල ගිනි මුදාලති. ජල මිදූ කයින් ගිනි ද ගිනි මිදූ කයින් ජලය ද නික්මවති. බොහෝ වූ ජල ගිනි යමක යමකව දක්වමින් යමකප්‍රාතිහාර්ය කළ සේක.

ඒ භාග්‍යවතුන් වහන්සේගේ රන්වන් සිරුරින් රන්රස විහිදි - යේය. දසදහසක් සක්වළ පැතිර භවාග්‍රය දක්වා උඩ නැගෙයි. සියලු සක්වළ සරසන කලක් මෙන් විය. පළමු පළමුවැන්න හා දෙවැනි දෙවැන්න එක් ඇසිල්ලෙහි මෙන් පවතී. නමුත් දෙක එකම ඇසිල්ලෙහි පැවතීමක් නොමැත. බුදුවරයන් වහන්සේලාගේ භවඞ්ගපරිවාසයෙහි ලහුකතාවෙන් ද පස්වැදෑරුම් චිණ්ණවසිතාවෙන් ද එක් ඇසිල්ලෙහි පවත්නාක් මෙන් දැනේ. ඒ ඒ රශ්මියෙහි ආවර්ජන පරිකර්ම අධිෂ්ඨාන වෙන වෙනම කළයුතු වෙයි. නිල්රස් පිණිස නීලකසිණයට පැමිණෙයි. කහරස් පිණිස පීතකසිණයට පැමිණෙයි. රතු සුදු රස් පිණිස ලොහිත ඔදාත කසිණයි. ගිනිකඳ සඳහා තෙජොකසිණයට සමවදී. දියදහර සඳහා ආපෝ කසිණයයි. මෙසේ වෙන් වෙන් පරිකර්ම අධිෂ්ඨාන ඇත්තේමය. කුමක් නිසා මෙසේ වන්නේ ද? භාග්‍යවතුන් වහන්සේගේ සිතෙහි අදණ්ඩතාවෙනි. එහෙයින් එක ඇසිල්ලෙහි බබළන ගිනි ජල රැස නික්මෙයි.

එසේම මාන අහංකාර රහිත මාන නසා දමන ඒ භාග්‍යවතුන් වහන්සේ ගණ්ඩ අඹරුක් මුල්හි පවත්වන ලද යමාමහපෙළහර අවසන්හි අසූකෙළ දහසක් ප්‍රාණීන්ට ධර්මාවබෝධය විය. බුද්ධසිංහ තෙජසින් මඩනා ලද තීර්ථකයන්ගේ අභිමාන නසා විස්මයෙන් විසල් දෙනුවන් ඇති දෙවිමිනිසුන් විසින් පවත්වන ලද ක්‍රීඩා හා සාධුකාර මුසු තුරුගොස් මැද දෙව්මිනිස් ලෝහි දහසක් නත් අසිරි අද්භූත පහළ වෙද්දී මහමෙරට මහපොළොවට වඩා වැඩි ගුණ යුත් මවුගුණයට ප්‍රත්‍යුපකාර කරනු කැමතිව අතීත බුදුවරු මේ පෙළහර දක්වා තව්තිසාවෙහි වස් එළඹ මෑණියන්ගේ කිරිමිල පිණිස අභිධර්ම

පිටකය දේශනා කරන සේකැයි දැන දොළොස් යොදුන් දිගුපුළුල් දෙව් මිනිස් මහණ බමුණු පිරිස් ඉදිරියෙහිම චක්‍රලක්ෂණාදි නන් වරලකුණු හෙබි සිරිපා ඔසවා යුගඳුරු මුදුනෙහි තැබූහ. අනතුරුව වම්පය ඔසවා සිනෙරු මුදුනෙහි තැබූහ. මෙසේ අටදහස් සැටදහස් යොදුන් තැන වූ තුන් පියවර දෙපා තැබීමෙන් විය. ශාස්තෘන් වහන්සේ පා දිගුකොට ඉක්මවූහ කියා නොසැලකිය යුතුය. බුද්ධවිෂය අචින්ත්‍යය. අචින්තනීය බොධිසම්භාර පිරීමේ විපාකයයි. භාග්‍යවතුන් වහන්සේ පා තබන කල ඒ පර්වත සක්ලකුණු අනුභසින් පාමුලට පැමිණ පා පිළිගත්තේය. ශාස්තෘන් වහන්සේ ඇක්මී කල නිසිතැන පිහිටියේය.

මෙසේ පොළෝතලයෙන් පදව්‍යතික්‍රම දක්වා තව්තිසාවට වැඩිසේක. එවිට ශක්‍රයා දෙවිගණ සමග භාග්‍යවතුන් වහන්සේට පෙරගමන් කොට පරසතුරුක් මුල පඬුඇඹුල් සලසුන පැවරීය. එවිට විසුද්ධ දෙව දෙවාතිදෙව භාග්‍යවතුන් වහන්සේ පණ්ඩුකම්බල සමාන පබළුවන් රැස් සමූහයෙන් බබළන පඬුපත් පැහැයෙන් බබළන පඬුඇඹුල් සලසුන මැද වැඩහිඳ ස්වකීය ශරීර ශෝභායෙන් දෙවියන්ගේ ශොභා මැඩ යුගඳුරු මත දහසක් රසින් හෙබි හිරු මෙන් බබළමින් අනුපම වර්ණ කාන්ති සිරිශොභායෙන් බබළන රුචිර සකල සුරවිමානයන් සහ අමරපති සහිත සුරගණ විලාසයන් අභිභවනය කරමින් භාග්‍යවතුන් වහන්සේම බබළන සේක.

> පුරුෂොත්තම භාග්‍යවතුන් වහන්සේ යම්දාක තව්තිසාවෙහි පරසතු රුක්මුල පඬු ඇඹුල් සලසුනෙහි වැඩසිටිසේක් ද එහි උන්වහන්සේ යුගඳුරු මුදුනෙහි හිරුමෙන් වැඩ සිටි සේක. ඒ මුනිවරයාණෝ පහකළ කෙලෙස්මලින් බබළන සේක. දසලෝකධාතුවෙහි දේවතාවෝ රැස්ව පර්වත මස්තකයෙහි හුන් තථාගතයන් වහන්සේ ඇසුරු කරති. වර්ණයෙන් කිසිදු දෙවියෙක් සම්බුද්ධයන් වහන්සේට වඩා නොබබළයි. සියලු දෙවියන් අභිභවා එකම බුදුහුම බබළති.

කුමකින් බබළයි ද? සම්මා සම්බුදුහු ආභරණ රහිතයහ. තන් පැහැයෙන් අගනා සත් රුවනින් විසිතුරු ඔටුනු අලංකාර නැත්තාහ. දෙවියෝ නම් සැකසූ මකුට කුණ්ඩල මුක්තාහාරාදි නන් පැහැ වස්ත්‍රාදි අලංකාර ඇත්තෝය. සුරපති ශක්‍රයාගේ රතුඅගරු පැහැ කම්බල, පියුම්පැහැ පණ්ඩුකම්බලශිලාලොකයෙන් බබළන පරසතුරුක් ආලෝකය හාත්පස සිය යොදුනක් පැතිරෙයි. සැට ගැලක් පුරා ලන අබරණින් සැරසි සක්දෙව්පති බබළ බබළා ඉදිරියෙන් සිටී. සියලු රමණීය දෙව්ඵයන් නන් අයුරු වර්ණ ගන්ධයෙන් සොඳුරු කුසුම පලු පල්ලවයෙන් සුසොභිතව හාත්පස හොබවයි. මහාපුරුෂලක්ෂණ සම්පත්තියෙන්, කෙතුමාලාවෙන්, බ්‍යාමප්‍රභායෙන්, අසූ අනුව්‍යංජනයෙන්, සුන්දර සවනක් රසින් යන අතිරෙකතර සොභායෙන් යුතුව මකුටාදි අලංකාරයෙන් තොරවම සීල සමාධි ප්‍රඥා විමුක්ති විමුක්ති ඥානදර්ශනාලංකාරයෙන් අලංකෘතව අතිශය ශොභාසම්පන්න සේක. ලොව සියලු ශිල්පීහු ද සියලු සෘද්ධිමත් පිරිස ද භාග්‍යවතුන් වහන්සේගේ රූපයට සම ප්‍රතිරූපයක් කිරීමට නොහැකි වෙති. එයින් කීහ.

> බුද්ධශරීරයෙහි යම් ලක්ෂණ වෙයි ද ඒ එකිනෙක සියක් පිනෙන් හටගත්තේය. එබඳු ගුණයුත් ඒ බුදුරුව අසමයයි කීහ. උන්වහන්සේ රජුන්ගේ රජ වෙති. තිදසපුරවැසි දෙවියන්ට දෙවි වෙති. බ්‍රහ්මාධිපතීන්ට අතිබ්‍රහ්ම වූ බුදුරජාණන් වහන්සේ සිරිනිකෙතයක් වෙති.

මහත් තේජස් ශ්‍රීවර්ණයෙන් ද පුණ්‍යසම්භාර ඵලානුභාවයෙන් ද නිපන් වර්ණවත් ආලොකයෙන් ද දෙව්නුවර උයන් වීමන් කප්තුරු පරසතුරුක්, පඬුඇඹුල් සලසුන ශ්‍රියාව ද දසදහසක් සක්වළ අමරමධුකර සමූහ ශොභාව ද සිය සිරියෙන් අභිභවමින් වැඩහුන් සේක. එහෙයින් කියන ලදි.

> සියලු දෙවියන් අභිභවා එකම බුදුරජාණෝ බබළන සේක. ඒ දෙවදෙවයාණෝ දෙවගණයා මැද සිනෙරු මස්තකයෙහි වැඩ හුන් සේක. සුරසිරිසොභා මැඩ තරුවලට සඳමෙන් අත්‍යන්ත

ලාවණ්‍යයට නිකෙත වූ නයනාභිරාම රන්පර්වතයක් මෙන් කාන්තිමත් ශ්‍රීධර සම්බුද්ධරූපය ශක්‍රාදි දෙවියෝ සතුටින් දුටහ.

එවිට සනරාමරගුරුවූ සම්මා සම්බුදු මාතාව වූ මහොපකාරවත් මහාමායා දෙවිය දෙවියෙක්ව දෙව්පුතුන් පෙරටු කොට තුසිත-පුරයෙන් පැමිණියේය. ඉක්බිති සියලු දෙවියෝ එන්නාවූ ජින වර මෑණියන් දැක තුටුපහටුව උදම් සිතින් "නිදුකාණෙනි, සැබැවින් අපට සොඳුරු ලාභයකි. අපට කදිම ලැබීමකි. මහොපකාරවත් ජිනවරමාතාව මෙහි පැමිණියාය. එතුමිය නිසා අපි ගඟතූපම සියුම් ගැඹුරු උත්තුංග සද්ධර්ම දෙශනයක් අසන්නට ලබමු. බුද්ධොත්පාදය දුර්ලභය. ක්ෂණ සම්පත් දුර්ලභය. සත්පුරුෂ සමාගමය දුර්ලභය" යි අත්පා කුකුසක් වටපිට බැල්මක් හෝ නැතිව පවන් රහිත වේලෙහි නිසල මහසාගර ජලය මෙන් නිසලව වාඩිවී සිටියහ. බුද්ධමාතාවෝ දිව්‍යසභා මධ්‍යාසනයෙහි වැඩහුන් බුද්ධශරීරයෙන් නිකුත් රැස් දහරට වැද භාග්‍යවතුන් වහන්සේ වැඳ දකුණු පසින් වාඩිවූහ. මෙසේ වාඩිවූ මෑණියන්ට කෘතඥ කෘතවේදී දිපදුත්තම භාග්‍යවතුන් වහන්සේ සිය අසුනෙහි මුදුන්පත් සුලලිත අපරිමිත කිරණින් සුන්දර රූපයෙන් බබළමින් නොඑක් කල්පවල නොඑක් ජාතිවල මවුකිරිමිල ද පෝෂණික මිල ද දෙනු කැමතිව සිය මෑණියන් කායශාක්‍ෂ්‍ය කොට ගැඹුරින් ගැඹුරක් පොවන්නාක් මෙන් අටඟිත් යුත් අත්‍යන්ත කර්ණරසායන ශ්‍රවණීය අතිමධුර සොෂයෙන් සොෂා කොට මෑණියන් අමතා මෑණියනි, කිරිමිල පුදමි. පොෂණික මිල පුදමි"යි සම්බුදුවරුන්ට ආවේණික සප්තප්‍රකරණ අභිධර්ම දේශනාව දේශනා කළ සේක.

කුසලාධම්මා අකුසලා ධම්මා අව්‍යාකතා ධම්මා ආදි නයින් අභිධර්මය දේශනා කළහ. මෙහි අභිධම්ම නම් කවර අර්ථයෙන් අභිධම්ම නම් වෙයි ද? විශේෂ ධර්මාතිරේකය යන අර්ථයෙනි. අභිධම්ම අතිරේක ශ්‍රේෂ්ඨ බව ප්‍රකට කරයි. එහි අභිශබ්දය අභික්කන්තාය රත්තියා අභික්කන්තවණ්ණා ආදියෙහි මෙනි. යම්

සේ නගන ලද ඡත්‍ර කොඩි අතරින් අතිරේකතර වර්ණ සලකුණින් යුත් යම් ඡත්‍රයක් තිබේ නම් එය අතිච්ඡත්තයයි කියනු ලැබේ. ඒ අතිරේක ප්‍රමාණයේ නන් පැහැති ධජය අතිධජයයි කියනු ලැබේ. යම් සේ එකට රැස්වූ රජකුමරුන්ගෙන්, දෙවියන්ගෙන් යමෙක් ජාති ගොත්‍ර, භොග, යස, ඉසුරු ආදියෙන් සම්පන්න සම්පන්නතර කුමාරයෙක් වෙයි ද ඔහු අභිරාජකුමාරයයි කියනු ලැබේ. යමෙක් යස, වර්ණ, ඉසුරු සම්පතින් අතිරේකතර නම් විශේෂතර නම් ඒ දෙවියා අතිදෙව යයි කියනු ලැබේ. එවැනි බ්‍රහ්මයා අතිබ්‍රහ්මයයි කියනු ලැබේ. එමෙන් මේ අභිධර්මය ධර්මාතිරේක ධර්ම යන විශේෂාර්ථයෙන් අභිධර්මයයි කියනු ලැබේ. මෙකී ධර්මාතිරේක ධර්ම විශේෂයෙන් විශේෂ අතිරේකතර ගුණයෙන් හෙබි මෑණියන් ට ගුණ ප්‍රත්‍යුපකාර කිරීම සුදුසු හෙයින් භාග්‍යවතුන් වහන්සේ කුසලාධම්මා අකුසලා ධම්මා අව්‍යාකතා ධම්මා යි දේශනා කළ සේක.

කුමක් හෙයින් කුසලා පාඨය පළමුවත් අකුසලා පාඨය පසුවත් කියන ලද ද? ලොකොත්තම බවත් පරම අභිවෘද්ධිදායක බවත් නිසා කුසල පළමුව කියන ලදි. එම කුසලයට ප්‍රතිපක්ෂ බව දැක්වීම පිණිස අකුසල පසුව දක්වන ලදි. අව්‍යාකත ධර්මයෝ නම් න ව්‍යාකතා අව්‍යාකතා යනු විසින් කුසල් අකුසල් වශයෙන් නොකියන ලද්දාහුය. කියන ලද දේවල නිරවද්‍ය සැප විපාක ලක්ෂණ කොට ඇත්තේ කුසලයි. සාවද්‍ය දුක් විපාක ලක්ෂණ කොට ඇත්තේ අකුසලයි. අවිපාක බව ලක්ෂණ කොට ඇත්තේ අව්‍යාකත යි. අටුවාවෙහි වනාහි "කවරධර්මයෝ කුසල් ද? චාතුර්භූමික කුසලයෝය. මේ කුසලධර්මයෝය. අකුසල ධර්මයෝ කවරහු ද? දොළොස් අකුසල චිත්තෝත්පාදයෝය. මේ අකුසල ධර්මයෝය. අව්‍යාකත ධර්මයෝ කවරහු ද? චාතුර්භූමික විපාකයෝය. භූමිවල කිරියා හෝ වෙති. කෙසේ ද? රූප නිබ්බාන යන මේ ධර්මයෝ අව්‍යාකත වෙති. මේ ආදි නයින් ධම්මසංගණී විභංග ධාතුකථා පුග්ගල පඤ්ඤත්ති කථාවත්‍ථු යමක පට්ඨාන යන සප්තප්‍රකරණ අභිධර්ම පිටකය දේශනා කළ සේක.

සිවුසස් දක්නා සම්බුද්ධ ලොකනාථයාණෝ සතරාකාර ධම්මසංගිණිය ප්‍රකාශ කොට අනතුරුව අටළොස් හේදයකින් යුත් විභඞ්ගය ආරම්භ කළහ. ඉක්බිති ජිනයන් වහන්සේ ධාතු භෙදප්‍රකාශක ධාතුකථාව ද ඉක්බිති පුග්ගල පඤ්ඤත්තිය ද සියලු කෙලෙස් යුද නැසූ අසම ලොකනායකයාණෝ කථාවත්‍ථුප්පකරණය ද යමකවිසයාතීත නීල ලොමධාරී නායකයාණෝ යමකය ද අනතුරුව මහාවීරයාණෝ නානා නය ප්‍රතිමණ්ඩිත අතිගම්භීර පට්ඨාන නම් ප්‍රකරණය ද දේශනා කළ සේක.

මෙසේ අනන්ත නය ප්‍රතිමණ්ඩිත සූවිසි සමන්තපට්ඨාන නම් මහාප්‍රකරණය දේශනා කළ සේක. ඒ භාග්‍යවතුන් වහන්සේ තෙමසක් පුරා නිතොරව ගලන ගගනගංගාව සේ අබිදම් දෙසා නිමවූ සේක. දේශනා කෙළවර බුද්ධමාතා මහාමායා දේවිය බුදුන් හමුවෙහිම කෙලශානුසය තුන නසා දහසක් නයින් සැදි සෝවාන්පෙලෙහි පිහිටියාය. එහිදී බුද්ධමාතාව ප්‍රමුඛ අසූකෙළක් දෙවියන්ට ධර්මාභිසමය විය.

සම්බුද්ධයන් වහන්සේ කුමකට සුරලොව වඩින සේක් ද? සගසැප ශෝභාව කුමක් ද? භාග්‍යවතුන් වහන්සේගේ අනුරාගය කුමක් ද? බුදුවරයන් වහන්සේලා රාගයෙහි ඇලුණෝ නොවෙති. ස්වර්ගය පැතීමක් නැත්තේමය . එසේ ද වුවත්,

මෙය සියලු බුදුවරයන් වහන්සේලාගේ ධර්මතාවයි. එහෙයින් මාන දෘෂ්ටි දුරුකරන යමක ප්‍රාතිහාර්යය කොට මෙලොව හැර තාවතිංසයට පැමිණෙති. තුන් පිටකයෙන් අභිධර්මය දෙසූහ. පුරුෂෝත්තමයාණෝ බුද්ධ සම්බුද්ධ ප්‍රවේණි ධර්මය සිදු කළහ. දිවකුරු බුදුහු සපුගස් මුල්හි පෙළහර කොට තවුතිසාවට වැඩියහ. සකල බුද්ධ ප්‍රවේණිගත විජම් දෙසා කිරිමිලවූ සෝවාන්ඵලය සුමෙධා බිසොවට දුන්හ. කොණ්ඩඤ්ඤ බුදුහු කොළොම්රුක්හි පෙළහර කොට සුජාතාවට

සෝවාන්පල දුන්හ. සුමංගල බුදුහු අඹරුක්හි පෙළහර කළහ. උත්තරා මාතාවට සෝවාන්පල දුන්හ. සුමන බුදුහු සෝණ රුක්හි පෙළහර පා සිරිමා දෙවියට අගපල දුන්හ. රෙවත බුදුහු කුඹුක් රුක්හි පෙළහරින් පසු සෝවාන් පල ලබා දුන්හ. සොභිත බුදුහු පෙළහරින් පසු සුධම්මා බිසොවට අගපල ලබා දුන්හ. අනොමදස්සි බුදුහු අඹරුක් මුල පෙළහර කොට යසෝධරා මෑණියන්ට අගපල දුන්හ. පදුම බුදුහු අසණ රුක්මුල පෙළහර කොට අසමා දෙවියට සෝවාන් පල ලබා දුන්හ. නාරද බුදුහු අනොමා බිසවට අගපල දුන්හ. පදුමුත්තර බුදුහු කොළාම් රුක් මුල්හි පෙළහර කොට සුජාතා දේවියට අගපල දුන්හ. සුමේධ බුදුහු රත්කරවී රුක්මුල පෙළහර පා සුදත්තා දේවියට අගපල දුන්හ. සුජාත බුදුහු අසණ රුක්මුල පෙළහර කොට පභාවතී දේවියට ද පියදස්සි බුදුහු අඹරුක් මුල පෙළහර කොට චන්දා දේවියට ද අත්‍රථදස්සි බුදුහු කොසඹ රුක්මුල පෙළහර කොට සුදස්සනා දේවියට ද ධම්මදස්සි බුදුහු කොළොම් රුක්මුල පෙළහර පා සුනන්දා දේවියට ද සිදුහත් බුදුහු අඹරුක් මුල පෙළහර පා සුපස්සියා දෙවියට ද තිස්ස බුදුහු පෙළහර දක්වා පදුමා දේවියට ද ඵුස්ස බුදුහු නුග රුක්මුල පෙළහර කොට සිරිමා බිසොවට ද විපස්සි බුදුහු නෙල්ලිගස මුල පෙළහර පා බන්ධුමතී දේවියට ද සිඛී බුදුහු කොළාම් ගස මුල පෙළහර පා පභාවතී දෙවියට ද වෙස්සභූ බුදුහු ධනපති දෙවියට ද කකුසඳ බුදුහු කොසඹගස් මුල්හි පෙළහර පා විසාඛා දෙවියට ද කොනාගමන බුදුහු අඹරුක් මුල පෙළහර පා සිරිමා දෙවියට ද කාශ්‍යප බුදුහු මිදෙල්ල රුක් මුල පෙළහර දක්වා ඔජාපතී බිසොවට ද අබිදම් දෙසා කිරිමිල වූ සෝවාන් අගපල ලබා දුන්හ.

ශාක්‍යසිංහ ගෞතමයාණන් වහන්සේ ගණ්ඩ අඹරුක් මුල්හි අසිරිමත් යමාමහ පෙළහර දක්වා තුන් පියවරින් තව්තිසාවට වැඩි සේක. මෑණියන් ප්‍රමුඛ කොට අභිධර්මය දෙසූ සේක.

මහාමායා දේවියට විජම් දෙසා කිරිමිලත් උතුම් සෝවාන් පලයත් දුන්සේක.

ඉක්බිති ජනහද පුබුදු කළ උතුමන්ටත් උතුම් වරදායක භාග්‍යවතුන් වහන්සේ වප් පුන් පොහෝ දින වස් පවාරණයෙන් ශක්‍රයාහට "දිව්‍යරාජය, මිනිස් ලොවට යන්නෙමි"යි වදාළහ. "මැනවි ස්වාමීනි" යි දෙවාතිදෙවයාණන්ගේ වචනය අසා සක්දෙවිඳු හිණිමං තුනක් මැවීය. එකක් රන්මුවාය. එකක් මිණිමුවාය. එකක් රිදීමුවාය. එහි පාදයෝ සංකස්සපුර දොරටුවෙහි පිහිටියෝ ය. ඉන් දකුණු පස රන්මුවා හිණ දෙවියන්ට වෙයි. වම්පස රිදීමුවා හිණ බ්‍රහ්මයන්ට වෙයි. මැද මිණිමුවා හිණ තථාගතයන් වහන්සේට ය.

එසමයෙහි මිනිස්ලොව මිනිස්සු වප් පුන් පොහෝ දින භාග්‍යවතුන් වහන්සේ දෙව්ලොවින් සකස් පුර දොරට වඩිනසේකැයි දිවැස්ධාරීන්ගෙන් අගතැන් පත් අනුරුත් තෙරුන්ගෙන් අසා තුටුපහටුව නන් අයුරු පුදසත්කාර ගෙන ඔබිනොබින් අවුත් සකස්පුර දොර රැස්වූහ. එවිට මුළු ලෝමුදුන් තථාගතයන් වහන්සේ සිනෙරු මුදුනෙහි මිණිහිණිහිස සිටම උදාගිරි මුදුන්හි පෙරදිගින් නැගි ළහිරු මෙන් සවනක් සත් දද පතාකායෙන් සරසන ලද්දාක් මෙන් දිලියෙන ගිනිකඳක් මෙන් දිලිසෙමින් දස දහසක් සක්වළ අතරක් නැතිව ජන සමූහයා විසින් කරන ලද උතුම් පුද සත්කාර සම්මාන දැක අසාධාරණ බුද්ධානුභාවය දක්වමින් නන් අයුරින් යමාමහපෙළහර පාමින් ලොකවිවරණ නම් පෙළහර කළ සේක. දස දහසක් සක්වළ දෙවියෝ ශාස්තෘන් වහන්සේ දැකීම පිණිස පැමිණ රැස්වූහ.

සැණකෙළිවෙස් දැරූ දෙව, යක්ෂ, ගාන්ධර්ව, කින්නර, නාග, සුපර්ණ, සිද්ධ, විද්‍යාධර සියල්ලෝ එකට රැස්ව තථාගතයන් වහන්සේ අනුව යති. වන්දනා කරති. ස්තුති කරති. නිරන්තර පූජා කරති. යශස්වී තථාගතයන් වහන්සේ සිනෙරු මුදුනෙහි සිට ලොකවිවරණ නම් පෙළහර දැක්වූහ. දෙවියෝ මිනිසුන් දුටහ. මනුෂ්‍යයෝ දෙවියන් දුටහ. උනුන් දැක ඔවුහු මහනදින්

නාද කළහ. අහෝ ලොව මහාපුදුමයකි. ලොමු ඩැහැගන්නා අසිරියකි. දෙවියෝත් මනුෂ්‍යයෝත් අන්‍යොන්‍යයන් දකිති. මහාද්භුත බුද්ධොත්පාදය ලොව අතිශයින් දුර්ලභය. ලාභයෙන් උතුම් ලාභය වූ දැන් ඒ බුදුන් ලැබ උන්වහන්සේ අද්භුත දෙවොරොහණ පෙළහර දක්වා ලොකනායකයාණෝ රමණීය සංකස්ස නගරයට බට සේක.

භාග්‍යවතුන් වහන්සේ රන්හිණෙන් බසිද්දී දස දහසක් සක්වළ දෙවියෝ බටහ. රිදී හිණෙන් දසදහසක් සක්වළ මහබඹහු බටහ. මිණිහිණෙන් සම්මා සම්බුදුහු පමණක්ම බට සේක. එවිට පංචසිඛ ගාන්ධර්ව දිව්‍යපුත්‍රයා බෙළුවපණ්ඩු වීණාව ගෙන බුදුන් ඉදිරියෙහි වයමින් මියුරු රසගී කිය කියා බැස්සේය. සුයාම දෙව්රජ හා සන්තුසිත දෙව්රජ සඳරැස් දහරවන් ලොහිතඞ්කමණි වජ්‍රමණි එබූ සෙමෙර ගෙන දෙපසින් භාග්‍යවතුන් වහන්සේට පවන් සල සලා බැස්සහ. සහම්පති මහාබ්‍රහ්මයා යොදුනක් පමණ සේසත බුදුන් මුදුනට ඔසවමින් බැස්සේය. සක්දෙව් රජ බුදුන් කැටිව දෙදෙව්ලොව දෙව්පිරිස් සමග බැස්සේය. මාතලි දෙව්පුත් දිවකුසුම් පිරි රන්සුමුඟක් ගෙන බුදුන් ඉදිරියෙහි ඉස ඉස බැස්සේය. එවිට ඒ භාග්‍යවතුන් වහන්සේට පූජාසත්කාර සම්මාන තව්තිසා භවනයෙන් පොළෝ-තලය තෙක් හැපී ඒකාබද්ධව පැවැත්තේය.

ඉක්බිති සර්වලක්ෂණ විභූෂිත දෙහ ඇති සකලශ්‍රීධර සර්ව-සත්ත්ව නයනකාන්ත සර්වාකාරපරිපූර්ණ උත්තම ශාස්තෘ වූ භාග්‍යවතුන් වහන්සේ සකලසුන්දර කිරණින් උපසොභිත අනුපම බුද්ධලීලාවෙන් අචින්ත්‍ය කුශලඵල නිෂ්පන්න බුද්ධශ්‍රියෙන් අනුපම දසබල වර විලාසයෙන් අතිශයින් බබළන සේක. උන්වහන්සේ හිමිදිරි පාන්දර මිණිහිණින් බැස සඞ්කස්ස නගර ද්වාරාභිමුඛ සිලාතලයෙහි දකුණු සිරිපා තැබූ සේක. එය අචල චෙතිය නම් වූයේය. එදවස්හි අනුපම ප්‍රභා යුත් භාග්‍යවතුන් වහන්සේ පළමු ලක්ෂණ විලාස කාන්ති තෙජොභාසයෙන් වැඩි රන් මඬුලුතලගත සියක් ගිතෙල්කළ ඉසින ලද දැල්වෙන ගිනිකඳක් සේ බැබළෙන්නාට

වූහ. එවිට සුගතශ්‍රාවක ශාරිපුත්‍ර තෙරණුවෝ මොග්ගල්ලාන අනුරුද්ධාදි තෙරවරුන් සමඟ පෙරගමන් කොට නුදුටුවිරූ රුවක් මෙන් අභිරූපතර බුදුරුව දැක දණමඩල බිම තබා දොහොත් මුදුන් දී නාථයන් වහන්සේගේ සෞම්‍යදර්ශන ඇති මුවමඬල බල බලා මෙසේ පැවසූහ.

> ශාස්තෘන් වහන්සේ තුසිත පුරයෙන් මිහිබට සේක. මෙවන් මිහිරි සුන්දර රුවක් මා විසින් කිසිදා දැක නැත. අසාත් නැත.

මෙසේ අනුපම බුදුසිරි දැක දැක සතිස් යොදුන් පිරිමඬුල්ලෙහි පිරී සිටි දෙව්මිනිස් පිරිසෙහි බුදුබව නොපැතූ කෙනෙක් නම් නැත්තාහ. යටත් පිරිසෙයින් තිරිසන්ගත සත්ත්වයෝ ද බුදුබව පැතූහ.

> මහර්ධිමත් අසිරිමත් අසම ලොකනායකයන් වහන්සේ මෙන් අපිදු බුදුවන්නෙමු කියා යි.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ රන්ගල් තලාවක මුවගණ මැදට වන් අහීත කෙසර සිංහරාජයකු මෙන් එහි සිට රැස්වූ පිරිසට ධර්ම දේශනා කරමින් සරස්වතී ශ්‍රීනිකෙත වන් බුදුමුව පොබයා මේ ගාථාව වදාළ සේක.

> නෛෂ්ක්‍රම්‍යොපසමයෙහි ඇලුණු ධ්‍යානයෙහි යෙදුණු යම් ධිරයෝ වෙත් ද ඒ සිරිමත් සම්මා සම්බුදුවරයන් වහන්සේලාට දෙවියෝ ද කැමැති වෙති.

දේශනාවසානයෙහි තිස්කෙළක් පමණ ප්‍රාණීන්ට ධර්මාවබෝධය විය. ඉක්බිති ධර්මරාජ වූ භාග්‍යවතුන් වහන්සේ එහි සිටම සසුන් පිළිපන් කල්‍යාණ පෘථග්ජනාදීන්ගේ ගුණ පළකිරීම පිණිසත් අන්‍යතීර්ථකයන්ගේ හිස් බව දැක්වීම පිණිසත් පෘථග්ජන බහුශ්‍රැතයන් විෂයෙහි පැනයක් ඇසූහ. පුහුදුන් බහුශ්‍රැතයෝ තමන් විෂයෙහි ප්‍රශ්නය විසඳා සොතාපන්නයන් විෂයෙහි ප්‍රශ්නය විසදීමට අසමත් වූහ. සෝතාපන්නයෝ සකදාගාමීන් විෂයෙහි ප්‍රශ්න විසදීමට අපොහොසත් වූහ. සකදාගාමීහු අනාගාමීන් විෂයෙහි ප්‍රශ්න විසඳීමට

නොහැකි වූහ. අනාගාමීහු රහතන් විෂයෙහි පැන විසඳීමට අපොහොසත් වූහ. සෙසු මහාශ්‍රාවකයෝ මුගලන් තෙරුන් විෂයෙහි පැන විසඳීමට අසමත් වූහ. මුගලන් තෙරණුවෝ සැරියුත් තෙරුන් විෂයෙහි පැන විසඳීමට අසමත් වූහ. සැරියුත් තෙරණුවෝ බුද්ධ විෂයෙහි පැන විසඳීමට අපොහොසත් වූහ. එවිට තෙරණුවෝ බුදුරදුන්ගේ අදහසෙහි සැක කරති. විචිකිච්ඡා කරති. බුද්ධ විෂයෙහි ප්‍රශ්නයම සිත සිතා නිශ්ශබ්ද වූහ.

එවිට නැණවතුන් මැද අතිවිශිෂ්ට වූ අනන්තඤාණ වූ භාග්‍යවතුන් වහන්සේ උන්වහන්සේගේ නයඤාණය පිණිස ශාරිපුත්‍රයෙනි, මෙය විය. නුවණින් අනුපස්සනා කරවයි වදාළහ. උන්වහන්සේට නයඥානයෙන් පසු එම ප්‍රශ්නය සියක් නයින් දහසක් නයින් ලක්ෂයක් නයින් අවබෝධ විය. තෙරණුවෝ ශාස්තෘන් වහන්සේ විසින් දෙන ලද නයෙහි සිට බුද්ධ විෂයෙහි ප්‍රඥාවෙන් බුද්ධවිෂයෙහි ප්‍රශ්නය විසඳූහ. එතැන් පටන් භාග්‍යවතුන් වහන්සේ හැර අන් කිසිවෙක් සැරියුත් තෙරුන්ගේ ප්‍රශ්නයක් විසඳීමට සමත් නොවෙති. එහෙයින් තෙරුන් වහන්සේ ශාස්තෘන් වහන්සේ ඉදිරියෙහි "ස්වාමීනි, මම සකල ප්‍රදේශ වැස්සක නමුත් මෙතෙක් බිඳු මුහුදෙහි වැටුණේය, පොළවෙහි මෙපමණය. පර්වතයෙහි මෙපමණය කියා සියල්ල ගෙන කීමට සමත් වෙමි"යි සිංහනාද කළහ. එවිට භාග්‍යවතුන් වහන්සේ ශරිපුත්‍රයෙනි, ඔබගේ සමත් බව දනිමි යි වදාළහ. උන්වහන්සේගේ ප්‍රඥාවට උපමාවක් නැත්තේය. එහෙයින් කියන ලදි.

> මාගේ බුද්ධියට ලක් කැබිය හැකි කිසිවක් නැත්තේය. ගඞ්ගාවෙහි වැලි ක්ෂය වෙයි. සාගර ජලය ක්ෂය වෙයි. පොළොවෙහි පස් ක්ෂය වෙයි. ලොකනාථයන් වහන්සේ හැර යම් සෙසු ප්‍රාණීහු ඇත් ද සැරියුත් තෙරණුවන්ගේ ප්‍රඥාවෙන් දහසයෙන් කොටසකුත් නොඅගී.

එදා මෙතේ බෝසත්හු දෙවොරොහණ සමාගමයෙහි බුද්ධ ප්‍රශ්න සැරියුත් තෙරුන් විසඳනු අසා "කිසිවෙකුටත් දන් නොදී සිල්

නොරැක පින් නොකොට සත්කාර නොකොට බෝමැඩ මාරබල පරදා සර්වඥතාඥානය නොලැබිය හැකිය. දැන් මම ගිහි බැමි කඩා පැවිදි වෙමි"යි සිතා එදිනම මහාසැපසම්පත් පරිත්‍යාග කොට නෑපිරිස් හැරදමා සිය පිරිවර දහසක් සමග ශාස්තෘන් වහන්සේ වෙත පැවිදිවූහ. උන්වහන්සේ පැවිදි උපසම්පදා ලැබ ත්‍රිපිටක බුද්ධ-වචනය ඉගෙන සියගණන් පුද්ගලයන්ට ඉගැන්වූහ. උන්වහන්සේ දක්ෂිණාවිභඞ්ග සමාගමයෙහි මහාප්‍රජාපති දෙවිය පිදූ සළුසඟළ සිය වස්සාග්‍රයෙන් ලැබ එක් සළුවක් බුද්ධ ගන්ධකුටියෙහි වියනක් කොට දෙවැන්න ඉරා පේළි කොට වියන් කෙළවර එල්ලූහ. එකල දානානිශංස පාරගත භාග්‍යවතුන් වහන්සේ ආර්ය මෛත්‍රෙය බෝධිසත්ත්ව භික්ෂූන් වහන්සේගේ මහඅදහස් දැන භික්ෂුසඞ්ඝයා මධ්‍යයෙහි විවරණ ප්‍රකාශ කළහ.

"මහණෙනි, ඔබලා සළුසඟළකින් බුද්ධපූජා කළ මේ භික්ෂූන්ම දක්නහු ද? අනාගතයෙහි මේ භද්‍රකල්පයෙහිම මෛත්‍රෙය්‍ය නම් බුදු වන්නාහ. මේ බරණැස කෙතුමතී නම් රාජධානිය වෙයි. එහි සංඛ නම් සක්විති රජෙක් වන්නේය. ඔහුගේ සුබ්‍රහ්ම නම් පුරෝහිත මෙතේ බෝසතුන්ගේ පිය වෙයි. පුරෝහිතයන්ගේ බ්‍රහ්මවතී නම් අගබිරිඳ මෙතේ බෝසතුන්ගේ මෑණියෝ වෙති. නාරුක් බෝධියයි කියායි. උන්වහන්සේ ඒ විවරණ අසා සතුටු සොම්නසින් බුදුබව සෙට ලැබෙන්නක් සේ සිතා වඩාත් සොම්නස්ව මහණදම් පුරා බෝධිකාරක දහම් පුරා ජීවිතාවසානයෙහි තුසීපුර උපන්හ.

උන්වහන්සේ දසකරුණකින් සෙසු දෙවියන් අභිභවා සිටිති. දිව්‍ය ආයු, වර්ණ, සැප, ආධිපත්‍යය, ඓශ්වර්ය, රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශයෙන් යුතුව මහත් දෙව්සැප අද දක්වාත් අනුභව කරති. මෙකල උන්වහන්සේ සිටින බව කෙසේ දතයුතු ද? මේ කථාවයි. තම්බපණ්ණි දීපයෙහි රොහණ ජනපදයෙහි කම්බෝජ ගම මලය දෙව නම් රහතන් වහන්සේ නමක් වසති. උන් වහන්සේ දිනක් පෙරවරු හැඳපෙරව පාසිවුරු ගෙන කම්බෝජගමට පිවිසියහ. පිවිසෙන විටම කිසියම් මිනිසෙක් උපුල්මල් අටක් ගෙන ඒ ගමට

යන්තේ ශාන්තදාන්ත වේශධාරී ඉරියාපථ සම්පන්න තෙරුන් දැක පහන් සිතින් තෙරුන් ළඟට ගොස් ඒ මල් දී වැඳ යන්නට ගියේ ය.

තෙරණුවෝ ඒ මල් ගෙන මෙසේ සිතූහ. "මේ මල් වර්ණ ගන්ධ සම්පන්නය. මහාචෛත්‍යයට, මිහින්තලාවට නැත්නම් මහාබෝධියට පුදන්නෙමි ද?" කියායි. එවිට උන්වහන්සේට මේ මල් භාග්‍යවතුන් වහන්සේගේ දළදා නිදන් කළ සිළුමිණි සෑයට පුද කරන්නෙමියි මේ අදහස ඇති විය. පිණ්ඩපාතයට තව වේලා ඇතැයි සිතා එකෙණෙහිම තෙරණුවෝ සෘද්ධියෙන් අහසට නැග අතදිග හරින තරම් කලකින් විජයොත් පහය ඉදිරියෙහි සිටගත්හ. විජයොත්පාය ඉදිරියෙන් දකුණුපස සක්දෙව් රජහු විසින් බුදුරදුන්ගේ දළදාව සහ කෙශධාතු සිළුමිණි සෑතුළ බහා යොදුනක් වට මිණිසෑයක් පිහිටුවන ලද්දේය. තෙරහු අටඋපුල්මලින් එය පුදා පැදකුණු කොට වැඳ පසෙක සිටියහ. සක්දෙව්රජ තෙරුන් දැක සපිරිවරින් තෙරුන් වෙත පැමිණ වැඳ පසෙක සිටියේය.

තෙරණුවෝ සක්දෙව් රජුගෙන් "දෙව්රජ, මෙතේ බෝසත්හු මෙහි පැමිණෙත් දැ" යි විමසූහ. "එසේය ස්වාමීනි, අද අටවකට පැමිණෙති. දැන් එති"යි කීය. ඔවුන් කථාකරද්දීම නැගෙනහිර දෙසින් මහපිරිවරින් එක් දිව්‍යපුත්‍රයෙක් එයි. ඔහු දුටු තෙරණුවෝ "දෙව්රජ, මේ මෙතේ බෝසත්හු දැ"යි ශක්‍රයාගෙන් විමසූහ. "ස්වාමීනි, මෙතේ බෝසත්හු නොවෙති. වෙනත් දිව්‍යපුත්‍රයෙකි"යි ශක්‍රයා කීය. "ඒකවරෙක් ද?'" පෙර අනුරාධපුරයෙහි සන්නාලිකමින් මෙතෙම ජීවත් විය. බොහෝ පින්කම් කළේය. මොහුට තන්තවායයි කියනු ලැබේ. එවිට ඔහු පැමිණ සෑය වැඳ බබළමින් දකුණුපස සිටියේය. ඔහු සිටි කල්හි එක් දෙවියෙක් මහපිරිවරින් එයි. තෙරහු ඔහු දැක "දිව්‍යරාජය, මේ මෙතේ බෝසත්හුදැ"යි ශක්‍රයාගෙන් විමසූහ. "ස්වාමීනි, මෙතේ බෝසත්හු නොවෙති" "මේ තෙම කවරෙක් ද ?" "දුටුගැමුණු අබාරජුගේ මලණුවෝ ය. මහයසස් ඇත්තෝය. සද්ධා-තිස්ස නම් වෙති ශක්‍රයා කීය. ඔහු ද පැමිණ සෑය වැඳ උතුරු දෙසින් සිටියේ ය. තවද පසුපසින් දිව්‍ය පුත්‍රයෙක් සපිරිවරින්

පැමිණෙයි. තෙරහු ඔහු දැකත් එසේම ශක්‍රයාගෙන් විමසූහ. බෝසත්හු නොවෙතී ශක්‍රයා කීය. මෙතෙම කවරෙක් ද? තථාගතයන් වහන්සේට ථූපයක් කරවූ දුට්ඨගාමිණි අභයයි. ඔහු ද මෙහි එතී කීය. ඔහු ද අවුත් සෑය වැඳ නැගෙනහිරින් බබළ බබළා සිටියේය.

එවිට ඔවුන්ගේ පිටුපසින් මෙතේ බෝසත්හු ශ්‍රියාවෙන් ශොභමානව එති. උන්වහන්සේගේ සතර පසින් සමලංකෘත දෙවඟනෝ සතර දෙනෙක් සපිරිවරින් එති. තෙරුන් වහන්සේ ඒ දැක "දිව්‍යරාජය, මේ දෙවඟනෝ මිනිස්ලොව කවර පින් කළා හු ද? ඔවුන්ගෙන් එකියක් විචිත්‍රවර්ණ විචිත්‍රරශ්මි විචිත්‍රාභරණ විචිත්‍රවස්ත්‍ර ඇත්තීය. එකියක් රක්තවර්ණ රශ්මි ආභරණ වස්ත්‍ර ඇත්තීය. එකියක් තඹකහවර්ණ රශ්මි ආභරණ වස්ත්‍ර ඇත්තීය. එකියක් පීතවර්ණ රශ්මි ආභරණ වස්ත්‍ර ඇත්තීය." යි විමසූහ. සක්දෙව්රජ එකරුණ දක්වමින් මෙසේ කීය.

> ආඪ්‍යවූ කොසඹෑ නුවර කුම්බ නම් නගරයක විසිතුරු මල් පුදා ඒ දෙවිය දකුණුපස සිටී. නාගදීපයෙහි තෙරණියක් වී තමාම උපුල් නෙලා මහසෑයට පූදා චම්පසින් ඒ දේවිය සිටී. ලක්දනව්වෙහි කිනිහිරිගම ඉපිද කිනිහිරිමල් පුදා ඒ දේවිය පිටුපසින් සිටී. පෙර ගඞ්ගාපාර්ශවයෙහි පුණ්ණ නම් ගම ඉපිද පැන් පලතුරු පුදා ඒ දේවිය නැගෙනහිර දෙසින් සිටී. එකල්හි එබඳු වූම දෙව්පුත්හු ද දෙවඟනෝ ද අප්‍රමාණව මෙතේ බෝසතුන් පිරිවරා අහසෙහි යති. සරාකල්හි බබළන පුන්සඳ මෙන් ඒ වර්ණ රූපයෙන් දෙවියන් මැද බබළති. මෙසේ අලාමක වර්ණයෙන් මෙතේ බෝසතාණෝ දෙවියන් මැදට බබළ බබළා පැමිණියහ.

උන්වහන්සේ පැමිණ සිඑමිණිසෑය වැඳ පැදකුණු කොට මලියදෙව තෙරණුවන් වෙත අවුත් පසෙක සිට "ස්වාමීනි, කොහි සිට ආසේක්දැ"යි ඇසූහ. "දිව්‍යරාජය ජම්බුද්වීපයෙනි." කිම ස්වාමිනි, දඹදිව මිනිස්හු මා සම්භාවනා කරත් ද? දිව්‍යරාජය, සම්භාවනා

කරන්නාහ. කුසල් කොට හැමදා මෙතේ බුදුන් දක්නට ලැබේවා කියා ඔබ ප්‍රාර්ථනා කරන්නාහ"යි කීහ. මෙතේ බෝසත්හු මෙසේ ප්‍රකාශ කළහ.

> යම් කිසි කුසලයක් කොට මිනිස්සු එසේ ප්‍රාර්ථනා කරති. මම සසර බියෙන් බිය පත්වූවන්හට භවඉෙන් මුදන්නෙක් වෙමි. අවිද්‍යා ප්‍රභව කොට මොහජාලයෙහි වෙළී චතුරොඝ-යෙන් මුසපත්වූ ලොකයට මම කෙළවර දක්වන්නෙමි. කෙලෙස් මඬ තැවරුණු තෘෂ්ණා සොරු ඇසුරු කරන දික් සසරමඟ මුළා වූවන්ට මම සදහම් දෙසමි. සඤ්ජීව, කාලසූත්‍ර නිරයන්හි පුන පුනා තැවෙන අවීචියෙහි ගැලි වසන සත්ත්වයන් මම නිවා ලන්නෙමි. අඥාන බැම්මෙන් බැඳුණ තණ්හා දාස වසඟයට පත් සත්ත්වයන් බැමි සිඳ නිවනට පමුණුවන්නෙමි. දෙසැට මිසදිටු කවාට අටඟිමඟ යතුරින් ප්‍රාණීන්ට විවර කරන්නෙමි. රාග දොස අඳුරින් වැසුණු අනත්ත සතුන් මුදා ඥානසලාක දී නුවන් පිඹිසිදු කරන්නෙමි. ශොකාතුරයන් දුක්ඛිතයන් ජරාමරණින් පීඩිතයන් උතුම් ඥාන ඖෂධය දී පිළියම් කරන්නෙමි. මොහඳුරෙන් මුළාවූ දෙවි-මිනිසුන්ට නැණ එලිය දී එම අඳුර බිඳින්නෙමි. අපාය බැමි ඇති අසරණව එයම පරායණ කොට ඇති ලෝකය අපායෙන් නගා පිහිට පෙන්වා ලන්නෙමි.

මෙසේ ප්‍රකාශ කොට මෙතේ බෝසත්හු තෙරුන් වැඳ සපිරිවරින් තුසිතභවනයටම ගියහ. තෙරුන් වහන්සේ ද මිනිස් ලොවට ආපසු පැමිණ කම්බොජගම පිඬු පිණිස පිවිසියහ. එතැන් පටන් මෙතේ බෝසතුන් තුසිත භවනයෙහි දිවසැපත් විඳින බව මිනිස් ලොව ප්‍රසිද්ධ විය. ඔබලා මෙතේබුදුන් අනාගතයෙහි බුදුවන බව තත්වූ පරිද්දෙන් දැන දැන් කුසල් කරව්. මෙතේ බුදුන් වෙත පැමිණෙව්.

ඉන් අනතුරුව ආර්ය මෛත්‍රෙය සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ කාලයෙහි උපත වර්ණනා කරන්නෙමු. මේ බුදු සසුන

අතුරු දහන් වූ පසු මිනිසුන්ගේ සියවස් ආයු අනුක්‍රමයෙන් අඩුවී දසවස් ආයු ඇතිවූ කල සත්‍යන්තර කල්පය ඇති වෙයි. එය වැඩී අසංඛ්‍යායුෂ්ක වෙයි. එය නැවත පිරිහී දහස් වූ කල මේ බරණැස ආලකමන්දා රාජධානිය මෙන් කෙතුමතී නම් රාජධානිය වෙයි. දිගින් දොළොස් යොදුනි. පළලින් සත් යොදුන් වන්නේය. එහි මැද පෙර මහාපනාද විසින් පරිභොග කළ යොදුනක් දිග අඩයොදුන් පළල පස්විසි යොදුන් උස සත්රුවන්මුවා ප්‍රාසාදය තෙමේම ගඟින් උඩනැඟී සිටිනේය. ඒ සංඛරජ කවරෙක් ද? පෙර මහාපනාද රජු පින් කරන කල පියා දෙටු නලකාරයෙක් විය. මෙහි ලා පිළිවෙළ කතාව කිව යුතුය.

මේ කල්පයෙහි කසීරට එක් දෙටු නලකාරයෙක් පුතෙකු සමග නලකම් පිණිස වනයට ගියේය. වනමැද ගඟින් එපිට බට ගසින්ම ගැවසි ඉවුරු ඇති මහවිලක් විය. නලකාරයා විලට ගොස් බට කපා මිටි බැඳ ගෙට ගෙනවුත් ද්‍රෝණි පෙට්ටි කුඩාදිය තනා ඒ මුදලින් ජීවත් වෙයි. එකල උතුරු හිමවත ගන්ධමාදන පර්වතයෙහි නන්දමූල බෑවුම්හි පළිඟුමිණි ගුහාවෙක බොහෝ පසේබුදුවරු වසති. උන්වහන්සේලාගෙන් එක් නමක් මිනිස් වාසයෙහි වස් වසනු කැමතිව පාන්දරින්ම නැගිට පාසිවුරු ගෙන රනහංසයකු මෙන් පස්වනක් පෑ ඇති, වලා මැඩ අහසින් අවුත් නලකාරගමට නුදුරු ජලසෙවණ ඇති වනයකට බැස කඳ අතුපතර කොළ පැළ සහිත රුක්මුලෙක හුන්හ.

දෙටු නලකාර ද උදැසනින්ම පුතු සමඟ නලකම් පිණිස වනයට යන්නේ අතරමඟ ගසක් මුල හුන් පසේබුදුන් දැක සතුටු සොම්නස්ව පිටුපස එන පුතු අමතා "පුත, ආර්යයන් වහන්සේගේ පා වඳිමුයි පාරෙන් ඉවත්ව වෙත ගොස් පසඟ පිහිටුවා වැඳ පසෙකට වී "ස්වාමීනි, කොහි වඩින සේක්ද?"යි ඇසීය. පසේබුදුහු "පින්වත, වස්විසීම ආසන්නය. කොහි කොහි නමුත් ගොස් ආවාසයක් සොයමි" කීහ. "ස්වාමීනි, මෙහි වස් විසීම සුදුසු ද?" "උපාසකය, වසමි" කීහ. එයසා සතුටට පත් පියපුත්හු "ස්වාමීනි, ටිකක් සිටිනු

මැනව. දැන් දානය වෙලාවයි. පසුව බලමු"යි කියා එවිටම පසේබුදුන් වීලට කැටිව ගොස් වළඳවා පුතු සමග තෙමේ ද අනුභව කොට ගොස් මහවිල්තෙරින් බට කපා කණු ආදිය සඳහා අත්තික්කා ගසක් ද පරාළ උපකරණාදියට හුණගස් ද සෙවිලි පිණිස කුසතණ ද කපා කුටිද්‍රව්‍ය රැස් කොට අත්තික්කා ටැම් සිටුවා බටගසින් බිත්ති සකසා තණ සෙවිලි කොට කුටිය නිමවා දොර යොදා පවුරින් වටකොට ඉදිරිපස සක්මනක් ද තනා දියගොඩමලින් සරසා පසේබුදුන්ට පූජා කළහ.

"ස්වාමීනි, අපට වැඩ පිණිස හිත සුව පිණිස තෙමස මෙහි වැඩ සිටිය මැනැවැ"යි ආරාධනාත් කළහ. පසේබුදුහු ඒ දෙදෙනාට අනුකම්පාවෙන් එහි වස්විසූහ. පියපුත්හු තෙමස සිවුපසයෙන් උවටැන් කොට වස් අන්තයෙහි තුන් සිවුරින් පිදූහ. උන්වහන්සේ කැමති තාක් එහි වැස ඔවුන්ට දන්වා හිමවතටම වැඩියහ. නලකාර දෙපළ මේ අයුරින් වස්සාන සතක් සත් පසේබුදු කෙනෙකුන් පන්සලෙහි වැස්වූහ. පළමු ලෙසින් උවටැන් කොට තුන් සිවුරු පිදූහ. ඒ පින් බෙලෙන් ඔවුහු මිය තව්තිසාවෙහි උපන්හ. එකිනෙකාහට විවිධ වර්ණ රුචිර වස්ත්‍රාභරණයෙන් සැරසි ලක්ෂගණන් දෙවඟනන් සහිත දිව්‍යමය නැටුම් ගැයුම් වැයුම් නදින් පිරි රුවනින් සැරසූ නලකාර දෙවපුත්‍ර විමාන නම් රන්විමන් පහළ විය. ඔවුහු නලකාර දෙවපුත්‍ර නමින් එහි ඉපිද මහදෙව්සැප වින්දාහ. මහසම්පත් දුටු දෙව්ගණ ආශ්චර්ය අද්භූතව ඔවුන් වෙත පැමිණ මෙසේ කීහ.

> කවර නම් පින්කමකින් දෙවියන් විස්මය කරවන අතිශෝභන විමානය ලැබුවාහු ද?

දෙටුනලකාර දෙවිපුත් මෙසේ කීය.

> අපි පෙර මිනිසුන් අතර නලකාරයෝ වීමු. පියපුත් දෙදෙන සමඟියෙන්ම එයින් ජීවත් වූයෙමු. එකල හිමවතින් එක් පසේබුදු කෙනෙක් වැඩියහ. උන්වහන්සේට සක්මනක් සහිත කුටියක් කළෙමු. ටැම් උදුම්බරම විය. බටදඬු ආවරණය විය.

තණපතින් සෙවිලි කළෙමු. එවන් කුටියක් පුද කළෙමු. එයම පුදා එයින් චුත වීමු. දෙදෙනාහට එක් එක් අද්භූත විමාන ලැබුවෙමු. මෙසේ පසේ බුදුවරයන් වහන්සේලා කෙරහි ඇලී පින් කළෙමු. එහි අපමණ විපාක දෙව්ලොව විඳිමු.

එයසා විස්මය පත් සියලු දෙව සමූහයා "අහෝ පින්පල විශිෂ්ටය. බොහෝ පුරුදු කිරීමෙන් මහාවිපුල පල වෙයි කියා උදන් ඇනූහ.

එකල විදෙහ රට මිථිලා නුවර සුරුචි නම් රජෙක් විය. මහමෙහෙසිය සුමෙධා නම් වූවාය. දෙවිය පුතකු පතා උදෑසනින් නැගිට හිසෙහි නහා සුදුවත් හැඳ උපොසථාඞ්ග ඉටා ඇතුළු සිරියහන් ගැබ සිල් මෙනෙහි කරමින් හුන්නාය. ඇගේ සිල් තෙදින් සිනෙරු මුදුනෙහි වූ දහස් යොදුන් උස චෛජයන්ත ප්‍රාසාදය කම්පා විය. සක්දෙව්රජ මෙනෙහි කරන්නේ සුරුචිරජ මහමෙහෙසි සුමෙධා දෙවිය පුතකු පතා සිල් රක්නා බව දුටුවේය. මම ඇයට පුතකු ලබා දෙමි. කවරකු දෙමිදැයි පරීක්ෂා කරන වේලෙහි නලකාර දෙදෙන දුටුවේය. ඔවුහු එකල චුතව තව්තිසාවෙන් උඩ දෙව්ලොව උපදිනු කැමැත්තෝ වූහ.

ශක්‍රයා එකරුණ දැක තරුණ නලකාර දෙව්පුතු වෙත ගොස් "නිදුකාණනි, ඔබ මිනිස් ලොවට යායුතුය"යි කීය. දිව්‍යරාජය, මනුෂ්‍යලොකය පිළිකුල්ය. එහි මිනිස්සු දානාදි පින් කොට දෙව් ලොව පතති. දැන් දෙව්ලොව සිටින මම කුමට මනුලොව යන්නෙම් ද? නිදුකාණනි, එසේ නොසිතන්න. දෙව්ලොව විඳින සැප ඔබට මනුලොව විඳිය හැකිය. පිළිගන්නැ"යි කීය. හෙතෙම පිළිගත්තේය. ශක්‍රයා ඉසිවෙස් මවාගෙන සුමෙධා මෙහෙසිය වෙත ගොස් සිල් ආවර්ජනා කරමින් යහන්ගැබ හුන් දෙවියට දෙවිය, නොසිතනු මැනව. පිනැති උතුම් පුතෙක් ඔබට උපදී. නොපමා වන්නැයි"කියා දෙව්ලොව ගියේය. දෙවිය සතුටු වූවාය. තරුණ නලකාර දෙව්පුත් ඒ රෑ පාන්දර දෙව්ලොවින් චුතව සුමෙධා බිසොව කුස පිළිසිඳ ගත්තේ ය. දසමස් ගෙවා පිනැති පුතකු වැදුවාය. එවේලෙහි

මහජනයා ස්වාමියකු ලදුම්හයි සතුටු සිතින් මහාඝොෂා කළහ. එහෙයින් මහරජ ඔහුට මහාපනාද කියා නම් තැබීය.

මහාපනාද මහකුමර පෙරහරින් වැඩී සොළොස් වියෙහි සියලු ශිල්පවල නිමාවට පත්විය. රජ පුතු දැක සතුට පිරි හදින් ඔහු අභිෂේක කරනු පිණිස වඩුවකු කැඳවා "දරුව, අපගේ නිවේසනයට ළඟ ප්‍රාසාදයක් තනව. අද ම පුතු අභිෂෙක කරමි" කීය. ඔහු මැනව දෙවයිනි, කියා බිම් පරීක්ෂා කළේය. එවිටම මහාපනාදයන්ගේ පින් තෙදින් සක්දෙව්රජුගේ පඬුඇඹුල් සලසුන උණුවිය. ශක්‍රයා එකරුණ දැන විස්කම් දෙව්පුතු අමතා දරුව යන්න. මහාපනාද කුමරුට යොදුනක් දිග පස්විසි යොදුන් උස සත්මහල් රුවන් පහයක් මවන්නැ"යි පිටත් කළේය. විස්කම් දෙව්පුත් වඩුවෙස් ගෙන මොහොතකින් ඒ වඩුවන් වෙත අවුත් "ඔබලා උදේ ආහාර ගෙන එව්" කියා යවා බිම බැලී ය. "ඉඳින් මොහු පෙර පොළෝතලයෙහි ප්‍රසාද සහිත සිතින් බටගසින්ම කුටියක් කළේ ද, පැන් වැඩී ද, එයින් යොදුනක් දිග අඩයොදුන් පළල පස්විසි යොදුන් උස සත්මහල් රුවන් පහයක් පහළවේවා" යි කියන්නාක් මෙන් අත්ලෙන් පොළවට ගැසීය. තැළීමත් සමඟම කී ආකාරයේ රුවන් පහයක් අහස එල්ලෙන්නාක් මෙන් සොඳුරු සිරින් මතුවිය.

එය දුටු රටවැසි මිනිස්සු අසිරි අද්භූත සිතින් උදම්ව ඇඟිලි විසිරවීම් පිළිසිසෑරීම් ලක්ෂගණන් අත්පොළසන් දීම් ආදිය පවත්වමින් "අපොයි ආශ්චර්යයි. අද්භූතයි. පින් පල බොහොම විශාලයි. අපට ලාභයකි. අපට මෙවන් පිනැති රජකුගේ ලැබීම ලාභයකැ"යි මුව නොසෑහෙන්නා සේ කිය කියා උදන් ඇනූහ. ලක්ෂ ගණන් පුදපඬුරු රජුට පිරිනැමූහ. එකල සුරුචිරජ කාසි විදෙහ දෙරට වැස්සන් සමඟ මහාපනාදයන්ගේ ප්‍රාසාදාරෝහණ මංගලය ද අභිෂේකමංගලය ද ආවාහමංගලය ද යන තෙමඟුල එක් කොට සත් අවුරුද්දක් සැණකෙළි කළේය. මහාපනාද රජ සිය පින් බල බලා ගම් නියම්ගම් රට වැසියන් ගෙන ආ පුද පඬුරු දන් දුන්නේ ය. දිවිහිමියෙන් දන් පින් කොට ආයු කෙළවර සිහියෙන් නිදා පිබිදියකු සේ දෙව්ලොව උපන්නේය.

මහාපනාද රජුගේ අභාවයෙන් පසු ප්‍රාසාදය සතියක් තිබී එයම ඉදිරි යටිගංදියෙහි වැටී ගිලී ගියේය. එහිම විසීමට කැමතිවූ බොහෝ ක්ෂත්‍රිය නෑයෝ මැරී එහිම මස් කැසුබූ මැඬි බවට පත්වූහ. එය මතු අනාගතයෙහි දෙවුනලකාර දෙව්පුත් සඳහා විනාශ නොවන්නේය. මහාපනාද රජ බුද්ධාන්තරයක් දෙව්ලොව මහසැප විඳ මේ අපගේ බුදොත්පාදයෙහි දෙව්ලොවින් චුතව භද්දිය නුවර අසූකෙළක් භවභොග මහසැපතින් පිරි භද්දිය මහසිටුහුගේ පුත් භද්දජි නම් කුමාර විය. ඔහුට තුන් සෘතුවට තුන් පහයක් විය. එක් එක් පහයෙහි සාර සාර මස වසයි. එක් පහයක සිට නානා නළඟනන්ගේ නැටුම් මැද දෙවියකු මෙන් බබළමින් මහපිරිවරින් අනික් පහයට යයි. එහිදී භද්දජි සිටුපුත්හුගේ යසස් බලමුයි සියලු නගරය කැළඹෙයි.

එක් කලෙක සකල ලෝකානුකම්පාවෙහි කෙළපැමිණි භාග්‍යවතුන් වහන්සේ මහපාන්දර දෙවිරම මහකුළුණු සමවතින් නැඟී හිඳ ප්‍රාකාර කඳු ගල් අඳුකාරයෙන් නොවැළකෙන උතුම් දිවැසින් මුළුලෝමඬල බලන සේක් භද්දජි කුමරුන්ගේ රහත්බවට හෙතුසම්පත් දැක බොහෝ බික්සඟුන් සමඟ භද්දිය නුවරට වැඩ ඔහුගේ නුවණ මේරීම බලාපොරොත්තු වෙමින් ජාතිවනයෙහි වසති. වස් පැවරූ භාග්‍යවතුන් වහන්සේ "උපාසකවරුනි, මම තුන් මසක් සිට අද පිටත් වන්නෙමි"යි දැන්වූහ. "ස්වාමීනි, අපට අනුකම්පාවෙන් සෙට වඩින සේක්වා"යි ආරාධනා කළ නුවරවැස්සෝ දෙවැනි දින නානාකාර ඛාද්‍ය භෝජ්‍ය සකසා ගඳදම් මල්දම් ආදියෙන් විසිතුරු මඩුවක් නුවර මැද තනා අසුන් පනවා භාග්‍යවතුන් වහන්සේට කල් දැන්වූහ. භාග්‍යවතුන් වහන්සේ සුරත් දෙපට හඳනය හැඳ විදුලිය වන් කාබහන් බැද බඳුවද, විදුලියටත් අතිරේක මිහිරි රත් සඟළසිවුර පෙරවා මුං වන් සෙල්මුවා පාත්‍රය ගෙන මහ බික්සඟන පිරිවරා අපරිමිත කල්හි රැස් කළ මහපින්පලින් නිපන් නොසිතිය හැකි බුදු සිරින් යුතුව සොඳුරු පැහැයෙන් සිය සිරුරින් නිකුත් සවනක් රසින් සියලු දිසාවන් හොබවමින් නුවරට වැඩ මහාමණ්ඩපයෙහි පැනවූ

උත්තම වර බුද්ධාසනයෙහි වැඩහුන්සේක. භික්ෂු සංඝයා ද පිළිවෙළින් පැනවූ අසුන්හි වැඩ සිටියහ.

මිනිස්සු බුදුපාමොක් බික්සඟනට මහදන් පිදූහ. භාග්‍යවතුන් වහන්සේ දන් වළඳා මහජනයා මැද වැඩහිඳ කර්ණරසායන අෂ්ටාංග සමුපෙත බඹගොස් විහිදුවමින් හත්තානුමොදනාව ඇරඹූහ. එවේලෙහි හද්දජි කුමරු පෙර පරිදි පහයෙන් පහයට ගිය නමුත් එදා කිසිවෙක් ඔහු බැලීමට නොඅාහ. හෙතෙම මහජනයා නොදැක පිරිවර මිනිසුන්ගෙන් "මා වෙනදා පහයෙන් පහයට යද්දී මුළු නුවර කැළඹී මඟ දෙපස ජනයා සිටිති. අද කිසිවෙක් නැත. මක් නිසාදැ"යි විමසීය. "ස්වාමීනි, නොදන්නෙහි ද?" "ඔව් නොදනිමි" "සම්මා සම්බුදු ස්වාමීහු ලොව උපන්හ. උන්වහන්සේ තෙමසක් ජාතිවනයෙහි වස් වැස අද වඩින සේක. උන්වහන්සේ නුවර මැද භික්ෂුසංඝයා සමඟ දන් වළඳා දැන් බණ වදාරන සේකැ"යි මහජනයා කීහ.

කුලපුත් බුද්ධ යන වචනය අසා පස්වනක් ප්‍රීතීන් පිනා මහත් විස්මයට පත්ව "අපොයි මම බෙහෙවින් පමාවීමි. මට මහාහානි යකි. අතිශයින් දුර්ලභ පහළවීමක් වූ හිතෛෂී භාග්‍යවතුන් වහන්සේ පහළව තෙමසක් මෙහි වසද්දීත් නොදත්තෙමි. නින්දාවේවා" යි සිතා වහා මාලිගයෙන් බැස සපිරිවරින් ගොස් බුද්ධ චීථියට පිවිසියේ දුරදීම යුගඳුරු මුදුනෙහි ළහිරු වන් ආදිච්චබන්ධු භාග්‍යවතුන් වහන්සේ දුටුවේය. බුදුන් දැකීමත් සමඟම පුදුමයට පත් සිතින් නොතැනිගත් හිසින් ලොමු දැහැගැනීම් සහිතව රන්රසෙහි ගිලෙන්නාක් මෙන් බුදුරැස් ජාලා තුළට වැද උන්වහන්සේ ළඟට ගොස් පසඟ පිහිටුවා වැඳ පසෙක හිඳ බණ ඇසීය. විනේදන අදහස් දන්නා ලොකනාථයාණෝ අමාවැසි වස්නාක් මෙන් ත්‍රිවිධ කල්‍යාණ නොයෙක් නයදහසින් යුත් ආර්ය සද්ධර්මය කුළුගන්වා පිළිවෙළ කථාව දෙශනාකළ හ. දෙශනාවසානයෙහි කුලපුත් හුනස්නෙහිම සවිකෙලෙසුන් නසා සිවු පිළිසිඹියාපත් රහත් පලයට පැමිණියේය. වෙනත් බොහෝ දෙනා ද සෝවාන් ඵලාදියට පත් වූහ.

එවිට භාග්‍යවතුන් වහන්සේ හද්දජි කුමරුගේ පියවූ හද්දට

"මහසිටුවරය, ඔබගේ පුත්‍රයා සැරසිලි සහිතවම බණ අසා රහත් විය. එහෙයින් අදම ඔහුගේ පැවිද්ද හෝ පිරිනිවීම විය යුතුය යි වදාළහ. එයසා සිටුතෙම "එසේ නම් ස්වාමීනි, පැවිදි කළ මැනව. හෙට උන්වහන්සේ කැටිව බික්සඟන හා සමඟ ගෙට වැඩිය මැනවැයි" කීය. බුදුහු නිහඬතාවෙන් පිළිගෙන විහාරයට ගොස් ඔහු පැවිදි කළහ. උපසම්පදා කළහ. මව්පියෝ සතියක් බුදුපාමොක් මහසඟනට දන් පිදූහ. එහි සතියක් සිට භාග්‍යවතුන් වහන්සේ භද්දජි තෙරුන් ද කැටිව බික්සඟන සමඟ චාරිකා චරණයෙහි යෙදෙමින් කෝටිග්‍රාමයට වැඩි සේක. ගම්වැස්සෝ පෙරගමන් කොට මහදන් පිදූහ. භාග්‍යවතුන් වහන්සේ දම් දෙසා බික්සඟුන් පිරිවරා ගංතෙර සිටියහ. කෝටිගම්වැස්සෝ නැව් ඈඳා තථාගතයන් වහන්සේට හා භික්ෂුසංඝයාට සැලකළහ.

භාග්‍යවතුන් වහන්සේ නැව් ඈඳුත්තෙහි සිට භද්දජි තෙරුන් අමතා "භද්දජි, එන්න. අප සමඟ එකම නැවට නඟින්නැ"යි වදාළහ. භද්දජි තෙරණුවෝ ශාස්තෘන් වහන්සේ සමඟ එක් නැවෙහි හුන්හ. නැව ගඟ මැදට පැමිණි කල ශාස්තෘන් වහන්සේ "භද්දජි ඔබ මහාපනාද කාලයෙහි විසූ පහය දැන් කොහිදැ"යි විමසූහ. "ස්වාමීනි, මෙතැන ගිලී ඇත." "භද්දජි පෙන්වන්න." තෙරුන් වහන්සේ ශාස්තෘන් වහන්සේට වැඳ සෘද්ධි බලයෙන් ප්‍රාසාදයෙහි කොත ඇඟිල්ලෙන් ඔසවා අහසට එසවූහ. එවිට ප්‍රාසාදයෙහි නාග මස් කැසුබු මැඩියන්ව උපන් පෙර නෑයෝ හැලී දියට වැටුණාහ. ඔවුන් දුටු භාග්‍යවතුන් වහන්සේ "භද්දජි ඔබේ නෑයෝ වෙහෙසෙති" වදාළහ. තෙරහු ප්‍රාසාදය අත් හළහ. එය නිසි තැනම පිහිටියේ ය.

මහජනයා එය දැක පුදුමවූහ. ගංතෙර සිටි මිනිස්සු භාග්‍යවතුන් වහන්සේ විසින් පතුරුවන ලද සොඳුරු සවනක් රසින් තැවරී ගොස් හටගත් විස්මයෙන් කුතුල් සිතින් දුව පනිමින් උනුන් අමතා "බලව් මේ කිමෙක්ද? කුමන රශ්මියෙක්දැ?යි කීහ. සවනක් රසින් බබළන ඡත්‍ර ධජ පතාකාලංකාරයෙන් සරසන ලද රුවන් පිරි මහනැවක් බඳු සුන්දර භගවත්රූව දැක මේ මෙහි පැමිණි රුවන් නැවකැයි

කීහ. ගිනිකඳක් සේ දිලෙන යතිගණ පිරිවැරූ භාග්‍යවතුන් වහන්සේ දැක මේ රන්නැවක් නොවේ. අපට අනුකම්පාවෙන් මෙහි වැඩි හිතෙෂී භාග්‍යවතුන් වහන්සේයයි උදම් සිතින් ගංතෙර රැස්ව උන්වහන්සේට පෙරගමන් කළහ.

ශාස්තෘන් වහන්සේ ළහිරුමඩල මෙන් රැස්-පිහිදුවමින් පැනවූ අසුනෙහි හුන්සේක. ඒ සියලු දෙන ගඳ දුම් මලින් බුදුන් පුදා වැඳ හුන්හ. හික්ෂූහු දහම්කතාවක් උපදවනු පිණිස ස්වාමීනි, කවර කලෙක භද්දජි තෙරහු මේ පහයෙහි විසූහුදැ"යි භාග්‍යවතුන් වහන්සේගෙන් විමසූහ. එවිට සකලඥෙය පාරගත බුදුහු ලිලොපෙත රක්ත කම්බලයක සිට කෙසර සිංහයකු මෙන් පිරිස් මැද මහාපනාද ජාතකයෙහි සියලු අතීත කථාව දක්වා මේ ගාථාව වදාළ සේක.

> ඒ රජ පනාද නම් විය. මාලිගය රත්මුවා විය. සොළොස් යොදුන් උසය. දහස් ගණන් කොටස් ඇත්තේය. සියගණන් මුදුන් ඇත්තේය. හරිතමය ධ්වජ යුක්තය. හැමදා සදහසක් නළුවෝ නැටූහ. භද්දජි කියන්නාක් මෙන් එකල්හි මෙසේ විය. මම එකල සක්දෙව්රජ වීමි.

මෙසේ භාග්‍යවතුන් වහන්සේ මහජනකාය මැද අප්‍රමාදීව කළ පින්පලසම්පත් ප්‍රකාශ කරමින් මහාපනාද ජාතකය වදාළ සේක.

එයසා මහජනයා එතැන් පටන් ආවාස පූජාවෙහි ඇලුම් කරන්නට වූහ. නැවත හික්ෂූහු භාග්‍යවතුන් වහන්සේගෙන් "ස්වාමීනි, එසේ නම් කුමක් හෙයින් මේ ප්‍රාසාදය අතුරුදන් වීදැ"යි විමසූහ. "මහණෙනි, අනික් නලකාර දෙව්පුත්හුගේ අනුභසිනි. හෙතෙම පෙර මොහු සමග එක්ව පින් කොට දෙව්ලොව උපන්නේය. අනාගතයෙහි කෙතුමතියෙහි සංඛ නම් සක්විති රජ වන්නේය. ඔහුගේ පරිභෝගය සඳහා ද මෙය මතු වන්නේය. එබැවින් අතුරු දහන් වීය"යි බුදුහු වදාළහ. මෙකරුණ නිසාම භාග්‍යවතුන් වහන්සේ එහි ධාර්මික ධර්මරාජ සතරමහා දිවයින් දිනූ සත්රුවනින් සම්පන්න සංඛ නම් සක්විති රජෙක් වන්නේය"යි වදාළ සේක. සත්රුවන් නම් චක්‍රරත්නය,

හස්ති රත්නය, අශ්ව රත්නය, මණිරත්නය, ස්ත්‍රීරත්නය, ගෘහපති රත්නය, පුත්‍ර රත්නය යි. සූරචීර පරසෙන් මැඩීමෙහි සමත් දහසකට වැඩි පුත්හු ඔහුට වෙති. ඔහු මේ සාගරය කෙළවර කොට ඇති පොළොව දණ්ඩෙන් සැතින් තොරව දැහැමින් දිනා වාසය කරන්නේය.

ඒ රජුට අර්ථයෙන් ධර්මයෙන් අනුශාසනා කරන අභිවාදන ප්‍රත්‍යුපස්ථාන විභවදානයෙන් සත්කාර ලත් සුබ්‍රහ්ම නම් අග්‍ර පුරොහිතයෙක් වන්නේය. ඔහුට බ්‍රහ්මවතී නම් අගබිරියක් වෙයි. එසමයෙහි මෙතේ බෝසත්හු සොළසාසංඛ්‍යකප්ලක්ෂයක් පෙරුම් පුරා පංචමහාපරිත්‍යාග කොට තුසිත භවනයෙහි උපන්හ. බුදොත්-පාදය බලාපොරොත්තුවූ දෙවියන් විසින් ආයාචනා කරන ලදුව පස්මහ බැලුම් බලා කුසීපුරෙන් සැව සුබ්‍රහ්මපුරොහිත භාර්යා කුස පිළිසිඳ ගන්නාහ. කියන ලද පරිදි පෙළහර වන්නේය. දසමස් ඇවෑමෙන් ඉසිපතන මිගදායෙහි පෙළහරින් මවුකුසින් බිහිවන්නාහ. අටවස් දහසක් ගිහිගෙයි වසන්නාහ. සිරි, වඩ්ඪමාන, සිද්ධත්ථ නම් තුන්පහයෙක්[1] වෙයි. චන්දමුඛී ප්‍රමුඛ ලක්ෂයක් ස්ත්‍රීහු උවටැන් කරන්නාහ. සතර නිමිති දැක චන්ද්‍රමුඛී බැමිණිය බ්‍රහ්මවඩ්ඪන නම් පුතු වැදූ කල මහබිනික්මන් කරන්නාහ.

මහබිනික්මන් සිතූ සැණින් පහය කුඹල්සකක් මෙන් කැරකී හිරුවිමන මෙන් අහස බබුළුවමින් යන්නේය. මෙතේ බෝසතාණෝ ප්‍රාසාදයෙන්ම මහබිනික්මන් කොට එදිනම විසිරියන් උස විපුල රුචිර කඳ පත් ඇති තිස්රියන් ශාඛා සහිත රිය සකක් පමණ මලින් බර නාරුක වෙත පැමිණ සම්බෝධිය ලබන්නාහ. මෙතේ බුදුහු බොධිය අසල සත්සති ගෙවා ධර්ම දේශනාවට බඹහු විසින් අයදනා ලදුව කෙතුමතී නුවර අසල ඉසිපතන වන උයන්හි සංඛරජු ප්‍රමුඛ දොළොස් යොදුන් පිරිස මැද දම්සක් පවත්වති. අසංඛ්‍ය සත්ත්වයන්ට ධර්මාවබෝධය වන්නේය.

සංඛ රජ සක්රුවන සහිත සත්රුවන සමඟ සක්වළ කෙළවර

කොටැති සතර මහදිවයින් සහිත සක්විති රජය මෙතේ බුදුන්ට පූජා කරන්නේ ය.

> ගිහි ආර්යශ්‍රාවකයෝ සපිරිවර මෙතේ සම්මා සම්බුදුරදුන්ට සිවුපසයෙන් උපස්ථාන කරන්නාහ. සංඛ රජ තමාගේ අභිප්‍රායානුකූලව සත්රුවන් රාශිය දුගීමගීයාචකාදීන්ට දන් දී කෙළක් පිරිවර සමග මෙතේ බුදුන් වෙත එහි භික්ඛු පබ්බජ්ජාවෙන් පැවිදි වන්නේය. සප්තශ්‍රාවක පාරමී ඤාණයෙහි පරතෙර පත්ව අසොක තෙර නමින් ප්‍රාඥ ශ්‍රාවකයන් අතර ප්‍රමුඛ ශ්‍රාවක වන්නේය. විජය නම් තෙර අග්‍රඋපස්ථායක වෙයි. ඒ සර්වඥයන් වහන්සේට ජිතමිත්ත නම් සෘද්ධි මතුන්ට අග්‍ර දෙවැනි අග්‍ර ශ්‍රාවකයෙක් ද වන්නේය.

එතැන් පටන් මෛත්‍රෙය තථාගතයන්ට දොළොස් යොදුන් නිබඳ පිරිස වන්නාහ. රහත් පිරිස යොදුනක් පමණ වෙති. සූසැට-රියන් බෙර පනව සක් නාල සොඹයෙන් හා ගීත වාදිතයෙන් සත්කාර කරනු ලබන පිරිස සමග චාරිකා කරති. ධම්සභාවෙහි තුන් යොදුන් සත් රුවන් මුවා යූපයක් වෙයි. ජනපද චාරිකාවෙහි යෙදෙන මෛත්‍රෙය තථාගතයන් වහන්සේගේ පිරිස සතිස් යොදනෙක වෙති. පිණ්ඩ චාරිකාවෙහි පියවරක් පියවරක් පාසා මහපියුම් නැගෙයි. එහි එක් එක් පෙති තිස් තිස් රියන් දික් වෙයි. කෙසුරු සොළොස් රියන් පමණ වෙයි. කෙමිය දොළොස් රියන්වෙයි. රොන් ලාස්සක් පමණය. මෙතේ බුදුහු අටඅසූරියන් උස් වෙති. දෙබාහු අතර අටළොස් රියන් වෙයි. පාදය එකෙලොස් රියන් වෙයි. දොළොස් රියන් දිග කෙමී ඇක්මෙන කල රොන් සකල ශරීරයෙහි විසුරුවමින් උඩ නැගෙයි. භත්තානුමොදනා සොඹය දොළොස් යොදුන්හි පවතී. විස්සටඨ විඤ්ඤුඝ්‍ය්‍ය, ගම්භීර, මංජු, විසාරි, සවනීය, නින්නාද, ගම්භීර මේඅටඟින් යුතු බඹගොස දොළොස් යොදනෙක පැතිර පවතී.

නාරුක් බෝධිය වර්ණ ගඳ සම්පන්නව සුපුෂ්පිතවම

පවත්නේය. පිරිනිවි කල්හි පරවෙයි. මෙතේ බුදුන් ජීවමාන සමයෙහි සතුන්ගේ චුති උත්පත්ති නැත්තේය. මෙවැනි අසිරිමත් සමාගමයක් වන්නේ ය.

අනාගතයෙහි මේ දඹදිව පරම විපුල සමෘද්ධියට පත්වන්නේය. ක්ෂෙමය, නිරුපද්‍රැතය. නිල්වන් ළාතණ ගැවසි සමබිම් පෙදෙස් වන්නේය. එහි බොහෝ ජනයා වාසය කරති. මිනිසුන් ආකීර්ණ ගම් නියම්ගම් ජනපද ඝන සන්නිවෙස සහිතය. මිනිස්සු හැමදා නොකඩ හැල්සහල්බත් බොජුන් ඇත්තෝ වෙති. ගොවිතැන් වෙළඳාම් ආදි කර්මාන්ත ව්‍යාපාර රහිතව අවිවැසි විඩා රහිතව වස්ත්‍රාභරණාදි උපකරණ සහිත කප්රුක් පහළ වෙයි. මිනිස්සු ආරාම උයන් පොකුණුවල ක්‍රීඩා කොට සැනහී කප්රුකින් සොඳුරු සළු හැඳ නනබරණින් සැරසී කුලගොත්වලට ගැළපෙන වේස සම්පත් දරා සුවපහසු ඇත්තෝ වන්නාහ. සුවපහසු ඇති සත්ත්වයෝ උනුන්ට වෛර නොඋපදවන්නාහ. මෙත් සිත් ඇත්තෝ වන්නාහ. දීඝායු වන්නාහ. අටානූවක් රෝග කිසිදා නොවෙයි. තුන් ආබාධය පමණක්ම වෙයි. බුද්ධ ධම්ම සංඝ මාමක වන්නාහ. මහනිරයවල් හිස් වෙයි. දෙව්ලෝ සපිරෙයි. මහත් අමාමග ඇතිවෙයි. අමා දොරටු විවෘතවූයේ වෙයි.

එහෙයින් එම සම්පත් නොවරදවනු කැමත්තහු විසින් මේ බුදුසසුනෙහි දාන සීලභාවනාදියෙහි උත්සාහ කොට කල්‍යාණමිත්‍ර සෙවනයෙන් පාපමිත්‍රයන් දුරු කිරීමෙන් කුසල් රැස් කිරීමෙහි යෙදෙන්නවුන් විය යුතුය.

යමෙක් අනාගත සම්පත් බලාපොරොත්තු වෙත් නම් පින්කම් කරන්නවුන්ට ඒකාන්තයෙන් පැමිණිය හැකි වෙති. ආරාම රෝපණ වන රෝපණ කරත් ද, යමෙක් පාලම් තැනීම කරත් ද, ළිං පොකුණු දුර්ගමයන්හි හේදඬු කරත් ද, විහාර අඩ්ඪයොග ප්‍රාසාද මණ්ඩප ගිනිහල් සක්මන් සහිත පිරිවෙන් කරත් ද, බොධිරොපණ චෛත්‍යප්‍රතිෂ්ඨාපන කෙරෙත් ද, යමෙක් සිවුපසයෙන් සංඝයාට

උපස්ථාන කරත් ද, මනාව සිල් රකිත් ද, බණ අසත් ද, මවුපිය උපස්ථානය මැනවින් කරත් ද, සර්වඥ ධාතු චෛත්‍යයට දීප ධූප විලෙපනයෙන් සුණින් සත්කාර කොට වඳිත් ද, පහන් සිතින් ස්තුති කරත් ද, යමෙක් දීපවෘක්ෂයෙන් වෙදිකාවලින් ධජ ඡත්‍ර ඇගෑ, පතාකා, චාමර, පුන්කලසින් සත්කාර කරත් ද, ශ්‍රද්ධාවත් වෙත් ද, දන් දී සිල් රැක තෙරුවන්හි පහන් සිතින් දිවිහිම් කොට බොහෝ පින් රැස් කොට එයින් චුතව දෙව්ලොව උපදනාහ. ඔවුහු ඒ ස්වර්ගයෙහි බොහෝ කල් වැස එයින් සැව මිනිසුන් අතර ඉපිද පින් බෙලෙන් මෛත්‍රෙය බුදුරජාණන් වහන්සේ හමුවන්නාහ. සකල ලොකානුකම්පක මෛත්‍රෙය සර්වඥයන් වහන්සේ මෙහි යමෙකු කුඩා හෝ ලොකු යම් යම් පිනක් කරන ලද ද ඒ සියල්ල ප්‍රකාශ කරන්නාහ. උන්වහන්සේ මහමොහඳුර බිඳින සදහම් දෙසන සේක. කෙළගණන් ප්‍රාණීන්ට ධර්මාවබෝධය වෙයි. ස්ත්‍රී පුරුෂයෝ මෙහි යම් යම් පින් කොට එහි ඵල මෙතේ බුදුන් හමුවෙහි ලබන්නාහ.

අනාගතකථා නිමි

මේ ධම්මපිණ්ඩය වනාහි අනුපූර්ව පූර්වාචාර්ය වචන පරම්පරානුසාරයෙන් බුද්ධධර්මයට පටහැණිවූවන් විෂයෙහි අහිත සිත් ඇති විචිත්‍ර කථික ජිනවර ධම්මොදය නම් ධර්මභාණයන් විසින් අභිසංස්කරණයෙන් දක්වන ලද්දේ ම ය.

කාලත්‍රයවර්තී සකලඥෙය පාරගත අලාමක ප්‍රඥාරශ්මියෙන් බබළන අඥානාන්ධකාර නසන අනාවරණ ඥාන ඇති සම්බුද්ධ සූර්යයාට නමස්කාර කරමි.

සකල ක්ලෙශයන් වියලවන එකායන මාර්ගය වූ නානා නය විචිත්‍ර, නිෂ්ප්‍රපඤ්ච, නිඃශ්වාස වාතයෙන් නෙසෙල්විය හැකි මහමෙර වන් ධර්මය ද එසේම නමස්කාර කරමි.

උභයාන්තය ඉක්මවූ අචල වූ දුක් තරණය කළ අනුසයපඞ්කය ඉක්මවූ අවංකගමන් ඇති අංගණයන්ගෙන් විමුක්ත සම්බුද්ධ පුත්‍ර සමූහයා වූ සංඝයා ද සිරසින් නමස්කාර කරමි.

මෙසේ රත්නත්‍රය නැමද අනතුරුව බුද්ධවංස පරිදීපක ධර්ම සම්පිණ්ඩය අටුවාවත් ගැටපදයත් සංකලනය කොට කියමි. ආදියෙහි පටන් කල්ප ප්‍රමාණය කිව යුතුය. මෙහිලා කප්ප ශබ්දය බොහෝ අර්ථවල යෙදෙයි. සංසාර ආයු තණ්හා දිට්ඨි පටිභාග විනය සමණ පඤ්ඤත්ති අභිසද්දහන ඉරියාපථ කප්පන උපකප්පන සමන්තකප්ප ආදි තෙලෙසක දක්නට ලැබේ. කීව දීඝො නු ඛො භන්තෙ කප්පො යන මෙහි සංසාර කලප්ලයයි. තිට්ඨතු භන්තෙ භගවා කප්පං යන මෙහි ආයුකල්පයයි. තණ්හාවම තණ්හා කල්පයයි. දිට්ඨියම දිට්ඨි කල්පයයි. සප්පු කප්පෙන වත භො සාවකෙහි සද්ධිං මන්තයමානො න ජානිම්හ ආයස්මා සාරිපුත්තො යන මෙහි සමානතාවෙහිය. කප්පෙනතථා හොති කප්පකතො සො ජීනො, මෙහි විනය කල්පයෙහිය. අත්තූපානාමි භික්ඛවෙ පඤ්චහි සමණ කප්පෙහි ඵලං පරිභුඤ්ජිතුං මෙහි ශ්‍රමණකල්පයෙහිය. නිග්‍රොධකප්පො ඉති තස්ස නාමං මෙහි ප්‍රඥප්තියෙහිය. ඔකප්පති යමෙතං භොතො ගොතමස්ස යථා අරහතො සම්මාසම්බුද්ධස්ස මෙහි අභිසද්දහනයෙහිය. සෙය්‍ය-

ථාපි භික්ඛවෙ යෙ කෙචි පාණා චත්තාරො ඉරියාපථ කප්පෙ කප්පෙන්ති මෙහි ඉරියවුවෙහිය. කප්පති ගාමන්තර කප්පො මෙහි කප්පනයෙහිය. පෙතානං උපකප්පති මෙහි උපකල්පනයෙහි ය. කෙවලකප්පං ජේතවනං ඔභාසෙය්‍ය මෙහි සමන්ත කල්පයයි.

මෙහි ලා සංසාර කල්පය දත යුතුයි. ඒ කල්පය ශූන්‍යකල්පය, අශූන්‍ය කල්පය කියා දෙයාකාරය. ශූන්‍ය කල්පයෙහි බුදු පසේබුදු සක්විත්තෝ නූපදිති. එහෙයින් පින්වත් ගුණවත් පුද්ගලයන්ගෙන් හිස් නිසා ශූන්‍යකල්පයයි කියැවේ. අශූන්‍යකල්පය පස්වැදෑරුම්ය. සාරකප්ප, මණ්ඩකප්ප, සාරමණ්ඩකප්ප, වරකප්ප, භද්දකප්ප වශයෙනි. ගුණයෙන් හිස් ලොව, සාර රහිත ලොව ගුණසාර උපදවන සම්මාසම්බුදුවරයන්ගේ පහළවීමෙන් සාරකප්පයයි කියැවේ. උපන් ගුණ ඇති ලොව දෙවන බුදුකෙනෙකුන් පහළවන කල මණ්ඩකප්ප යයි කියැවේ. තුන් බුදුකෙනෙකුන් උපදනා කල්පය සාරමණ්ඩ නම් වෙයි. යම් කපක සිවුබුදුකෙනක් උපදිත් ද පළමුවැන්නා දෙවැන්නාට ද දෙවන්නා තුන්වැන්නාට ද තුන්වැන්නා සතර වැන්නාට ද විවරණ දෙයි. එහි අස්වැසුම් ලත් මිනිස්සු තම ප්‍රණිධිවශයෙන් කියති. එය පළමුකපට වඩා විශිෂ්ට නෙයින් වරකප්ප නම් වෙයි. යම් කපක පස් බුදු කෙනෙක් උපදිත් ද එහෙයින් භද්දකප්ප නම් වෙයි. මේ භද්‍රකල්පය නුග අත්තික්කා මල් මෙන් අතිදුර්ලභය. යම්දාක පටන් අප බුදුරජාණන් වහන්සේ විසින් අභිනීහාර කරන ලද ද දීපංකර බුදුන් පටන් සාරාසංඛ්‍ය කල්ප ලක්ෂය තුළ එක් කපක හෝ පස්බුදු කෙනෙක් නූපන්හ.

තණ්හංඞ්කර, මෙධඞ්කර, සරණඞ්කර, දීපඞ්කර යන සිවුබුදුවරු එක් වරකල්පයක උපන්හ. ඉන් පසු එක් අසංඛ්‍යයක් බුද්ධශූන්‍ය විය. අසංඛ්‍ය කල්පය අවසානයෙහි එක් සාර කල්පයක කොණ්ඩඤ්ඤ නම් බුදුහු උපන්හ. ඉන් පසුව ද අසංඛ්‍යයක් බුද්ධශූන්‍ය විය. ඒ අවසන වරකල්පයක මංගල, සුමන, රෙවත, සොභිත යන සතර බුදුවරු උපන්හ. එයින් පසු අසංඛ්‍යයක් බුද්ධශූන්‍ය විය. එකාසංඛ්‍ය කප්ලක්ෂයකින් මත්තෙහි සාරමණ්ඩ

කල්පයක අනොමදස්සි, පදුම, නාරද නම් තුන් බුදු කෙනෙක් උපන්හ.

නැවත කප් සත්සියයක් බුද්ධ ශූන්‍ය විය. ඉක්බිති සිව් අනූකපකට මතු එක් සාර කල්පයක සිද්ධත්ථ නම් බුදුහු උපන්හ. උන්වහන්සේගේ පසුකාලයේ කල්පයක් බුද්ධ ශූන්‍ය විය. මෙයින් දෙයානූකපකට මතු මණ්ඩ කල්පයක තිස්ස, පුස්ස නම් බුදුවරු දෙනමක් උපන්හ. උන්වහන්සේලාගෙන් පසු මෙයින් ඒකානූ කපකින් මත්තෙහි එක් සාර කල්පයක විපස්සී බුදුහු උපන්හ. උන්වහන්සේ-ගෙන් පසු එකුන් සැට කපක් බුද්ධ ශූන්‍ය විය. එයින් එක් තිස්වන කප්හි එක් මණ්ඩ කල්පයක සිඛී, වෙස්සභූ බුදුවරු උපන්හ. ඒ කප ගෙවී එක්තිස් කපක් ලොව බුදුවරු නූපන්හ. මේ භද්‍ර කල්පයෙහි කකුසඳ, කොනාගමන, කස්සප, අප භාග්‍යවත් ගෞතම යන බුදුවරු ද අනාගතයෙහි ආර්‍ය්‍ය මෛත්‍රෙය බුදුහු ද උපදිති. මෙසේ යම් කල්පයක් පස් බුදු කෙනෙකුන්ගෙන් යුක්ත වූයේ ද ඒ සුන්දර කල්පය භද්‍ර කල්පයයි කියවේ. මෙසේ ශූන්‍ය අශූන්‍ය වශයෙන් කල්පය දෙවැදෑරුම් වේ.

කල්ප පර්යාය වශයෙන් මෙහි නන් වැදෑරුම් අන්තර කල්ප ඇත. සංවට්ට කප්ප, සංවට්ටට්ඨායි කප්ප, විවට්ට කප්ප, විවට්ටට්ඨායි කප්ප, මහාකප්ප යනුවෙනි. එහි අන්තර කල්පය සත්ථන්තර කප්ප, දුබ්භික්ඛන්තර කප්ප, රෝගන්තර කප්පයයි තෙවැදෑරුම්ය. ප්‍රථම කල්පික මිනිස්සු අසංඛ්‍යායුෂ්ක වූහ. පසුව ලෝභාදී අධර්මයෙන් මැඩී අධර්මයෙහි හැසිර ආයුසයෙන් පිරිහී ගියහ. අසංඛ්‍යායුෂ්ක මිනිසුන් පිරිහී පිළිවෙළින් දසවස් ආයු වූ කල්හි ඔවුන්ගේ දොෂ අධිකත්වයෙන් ඔවුනොවුන් කෙරෙහි තියුණු වෛර හටගත්තේය. තියුණු ක්‍රෝධ තියුණු මනෝපදෝස තියුණු වධකසින් ඇතිවිය. මවුපියන්ට ද දරුවන් කෙරෙහි තියුණු වෛර ඇතිවිය. දරුවන්ට මවුපියන් කෙරෙහි ද සහෝදර සහෝදරියන්ට සහෝදර සහෝදරියන් කෙරෙහි ද තියුණු වෛර ඇති විය. එකල ඔවුහු ඔවුනොවුන් කෙරෙහි මෘග සංඥා ඇති කළහ. ඔවුන්ගේ අත්වල තණ සැත් පහළ විය. යටත් පිරිසෙයින් තණ පතක් හෝ අතින් අතගෑ කල්හි

අයුධයක්ම විය. ඔවුහු තණ සැතින් මේ මෘගයෙකි යන සංඥාවෙන් ඔවුනොවුන් දිවි නැසූහ. එකල ඔවුන්ට මෙසේ සිතිණ. අපි එක පුරුෂයෙකු වත් නොමරමු. කිසිවෙක් අප නොමරත්වා. මේ ලෝක විනාශය උදාව ඇත්තේය. එක තැන සිටීමෙන් දිවි බේරාගත නොහැකිය. අපි තණ ගහනයකට හෝ නදී දුර්ගයකට හෝ පර්වත විෂමයකට හෝ ගොස් වනමුල් ඵල කරවමු කියායි.

ඔවුහු ඒ ඒ තැන වනගහනාදියට වැදී සතියක් වන මුල් ඵලයෙන් යැපුණහ. සතිය ඇවෑමෙන් වනගහනාදියෙන් නික්ම උනුන් වැළඳගෙන හවත්නි, සත්ත්වයෝ ජීවත් වෙතියි සතුටු වෙමින් විවාද නොකරමින් මෙසේ කීහ. මේ වනාහි අකුසල දහම් සමාදන් වීමෙන් මෙවෙනි වෛරයක් ඤාති විනාශයක් සිදුවිය. අපි ප්‍රාණඝාතය දුරු කරමු නම් මැනවි. ඔවුහු මේ කුසල ධර්මය සමාදන්ව ජීවත් වන්නාහු ආයුෂයෙන් වැඩුණහ. ආයුෂයෙන් වර්ණයෙන් වැඩෙමින් දසවස් ආයු ඇත්තවුන්ට විසිවස් ආයු ඇති දරුවන් ඇති විය. ඔවුහු මේ කුශලධර්මය සමාදන් වීමේ විපාකය දකිමින් වැඩි වැඩිය අදත්තාදානයෙන් වැළකීම ආදි කුසල් දහම් දියුණු කළහ. ඒ කුශලධර්ම සමාදාන හේතුවෙන් විසිවස් ආයු ඇති මිනිසුන්ට සතලිස් ආයු ඇති දූ පුත්තු ඇති වූහ. මේ ක්‍රමයෙන් ආයු වැඩී අවුරුදු ලක්ෂය අසංඛ්‍යය දක්වා වැඩී ගියේය. මේ සත්ථන්තර කල්පයයි.

දොළ උත්සන්න ප්‍රජාවෙහි උපන් සත්ථන්තර කල්පයෙහි නොනැසී යම් අය වෙත් නම් ඔවුහු බෙහෙවින් නිරයෙහි උපදිති. කුමක් හෙයින් ද උනුන් කෙරෙහි බලවත් ආඝාත ඇති හෙයිනි. මෘග සංඥාවෙන් ප්‍රාණඝාතයෙන් වෙන්වූ යම් සත්ත්වයෝ ඇත් ද ඔවුහු ඒ අතර නොවූහ. යම් කලෙක ලෝහ උත්සන්න ප්‍රජාවෙහි සත් මසක් දුබ්භික්ඛන්තර කල්පය වෙයි ද එහි එම දුර්භික්ෂාන්තර කල්පයෙන් නොනැසුණාහු බොහෝ සෙයින් ප්‍රේත විෂයෙහි උපදිති. අහරපැන් දෙන සත්ත්වයෝ එහි නොවූහ. යම් විටක මෝහ උත්සන්න අට මස්හි රෝගාන්තර කල්පය වී ද යමෙක් ඒ රෝගාන්තර කල්පයෙහි නොනැසුණාහු ද බොහෝ සෙයින් ඔවුහු සඟීයෙහි

උපදිති. කුමක් හෙයින් ද ඔවුන්ට අහෝ ඇත්තෙන්ම සත්ත්වයන්ට මෙබඳු රෝගයක් නොවෙනවානම් කියා මෙත් සිත උපදී. ගිලන් පස බෙහෙත් දායකයෝ එහි නොවූහ. මෙසේ අන්තරකල්පය තෙවැදෑරුම්ය. ඒ මේ අන්තර කල්පය සංවට්ට කල්පය නොපැමිණීම, අතරෙහිම ලෝක විනාශය වෙයි. මෙය අන්තර කල්පයයි.

මහණෙනි, මේ අසංඛ්‍ය කල්ප සතරෙකි. සතර කුමක් ද? සංවට්ටය, සංවට්ටට්ඨායීය, විවට්ටය, විවට්ටට්ඨායීය යනුයි. මහණෙනි, මේ අසංඛ්‍ය කල්ප සතර එක් මහාකපකි. එහි ඒ සංවට්ට කල්පය ආපොසංවට්ට, තෙජොසංවට්ට, වායෝ සංවට්ටයයි තුනකි. සංවට්ට සීමා නම් ආභස්සර සුභකිණ්ණ වේහප්ඵලයි. යම් කල්පයක් තේජසින් වැනසෙයි ද එවිට ආභස්සරයෙහි පටන් යට ගින්නෙන් දැවේ. යම් කලෙක ජලයෙන් වැනසෙයි ද සුභකිණ්ණයෙන් යට ජලයෙන් වැනසෙයි. යම් කලෙක වායුවෙන් වැනසෙයි ද වේහප්ඵලයෙන් යට වාතයෙන් වැනසෙයි. විස්තර වශයෙන් වනාහි කිසිදාක එක් බුද්ධ ක්ෂේත්‍රයක් වැනසෙයි. බුද්ධ ක්ෂේත්‍රය ජාති ක්ෂේත්‍ර, ආණා ක්ෂේත්‍ර, විෂය ක්ෂේත්‍ර කියා තෙවදෑරුම්ය. ජාති ක්ෂේත්‍රය දස-දහසක් සක්වළ කෙළවර කොට ඇත්තේය. තථාගතයන්ගේ පිළිසිඳගැනීම් ආදියෙහි කම්පාවෙයි. ආණා ක්ෂේත්‍රය කෙළ ලක්ෂයක් සක්වළ කෙළවර කොට ඇත්තේය. ධජග්ග පිරිත ආටානාටිය පිරිත මෝරපිරිත යන මේ පිරිත්හි ආනුභාවය එතෙක් තැන් පවත්නේය. විෂය ක්ෂේත්‍රය අනන්ත අප්‍රමාණ වේ. තථාගතයන් වහන්සේ යම්තාක් කැමති නම් ඒ තාක් ඒ සියල්ල දැන ගනිති. දතයුත්ත යම්තාක් ද ඒතාක් ඤාණය වේ. ඤාණය යම්තාක් ද දතයුත්ත ඒතාක් වෙයි. දත යුත්ත අවසන් කොට ඤාණය පවතී. ඤාණය අවසන් කොට දත යුත්ත පවතී. දතයුත්ත ඉක්මවා ඤාණ මාර්ගයක් නැත. ඤාණය ඉක්මවා දතයුතු දෙයක් නැත. මෙසේ විෂයක්ෂේත්‍රය අනන්ත අප්‍රමාණ වේ.

මෙසේ මේ තුන් බුදුකෙත්හි එකම ආඥා ක්ෂේත්‍රය වැනසේ. පිහිටද්දීත් එකක්වම පිහිටයි. එහිම විනාශයත් පිහිටීමත් වේ. යම් කලෙක්හි කල්පය ගින්නෙන් නැසෙයි ද පළමුවෙන්ම කල්ප විනාශ

මහාමේඝය නැගී කෙළලක්ෂයක් සක්වළ එක් මහවැස්සක් වසී. තුටු පහටු මිනිස්සු සියලු බීජ ගෙන වපුරති. ශස්‍ය හරකුන් කන පමණට වැඩුණු කල්හි ගද්‍රභ හඬ නඟ නඟා එක් බිඳකුදු නොවසී. යම් දවසක නතර වූයේ ද වෂ්ාව නතර වූයේමය. මේ සඳහා භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරන ලද්දේමය. "මහණෙනි, ඒ කාලය අවුරුදු සිය ගණන් අවුරුදු දහස් ගණන් අවුරුදු ලක්ෂ ගණන් වැස්ස නොවසී." එකල්හි වැස්සෙන් ජීවත්වන සත්ත්වයෝ මැරී බඹලොව උපදිති. මල් ඵලයෙන් ජීවත් වන්නෝ ද මැරි බඹලොව උපදිති. මෙසේ දිගු කල් ගෙවීමෙන් ඒ ඒ තැන ජලය සිඳෙයි. එවිට ක්‍රමයෙන් මස් කැසුබෝ මැරී බඹලොව උපදිති. නිරය සත්ත්වයෝ හත්වන හිරු උදාවීමෙන් වැනසෙති. එකල්හි ධ්‍යානයෙන් වෙන් වූවෝ නැත. සියල්ලෝ බඹලොවම උපදිති. මොවුන් අතුරෙන් කිසිවෙක් දුර්භික්ෂයෙන් පීඩිතව දැහැන් ලැබීමට අභව්‍ය වෙති. ඔවුහු කෙසේ එහි උපදිත් ද? දෙව් ලොවදී ලැබූ ධ්‍යාන වශයෙනි.

එකල්හි අවුරුදු ලක්ෂයක් ඇවෑමෙන් කල්ප විනාශය වෙතැයි ලෝකව්‍යූහ නම් කාමාචාර දෙවියෝ හිස් මුදා කෙස් විසුරුවා හඬන මුහුණින් අතින් කදුළු පිස පිස රතු රෙදි ඇඳ බොහෝ රූපධාරීව මිනිස් පියසෙහි ඇවිද ඇවිද මෙසේ කියති. "නිදුකාණෙනි, මෙයින් වෂ්ී ලක්ෂයක් ගිය පසු කල්ප විනාශය වෙයි. මේ ලෝකය වැනසෙයි. මහමුහුදත් සිඳෙයි. මේ මහපොළොව සිනෙරු පර්වතය දැවෙයි. වැනසෙයි. බඹලොව දක්වා විනාශවෙයි. නිදුකාණෙනි, මෙත් වඩව්. කරුණාව, මුදිතාව, උපෙක්ෂාව වඩව්. මවට උවටැන් කරව්. පියාට උවැටන් කරව්. කුලදෙටුවන් පුදන්නෝ වව්, කියායැ. ඔවුන්ගේ බස් අසා මනුෂ්‍යයෝ ද දෙවියෝ ද බෙහෙවින් මහාසංවේගයට පත්ව සෘජු මෘදු සිත් ඇතිව මෛත්‍රී ආදි පින් කොට දෙව්ලොව උපදිති. එහි දිව්‍යමය ක්ෂුධාහෝජනය අනුභව කොට වසන්නාහු කිසුණු පිරියම් කොට ධ්‍යාන ලබති. එයින් වෙනස් අය අපරපරියාය වේදනීය කම් රහිතව සසර සැරිසරන සත්ත්වයෙක් නම් නැත. ඔවුහු ද එහි එහිම ධ්‍යාන ලබති. මෙසේ දෙව්ලොව ලැබූ ධ්‍යාන හේතුවෙන්

සියල්ලෝ බඹලොව උපදිති. වෂීාව නැතිව දිගුකල් ගෙවීමෙන් දෙවෙනි හිර උදාවෙයි. උදා වෙද්දී රාත්‍රි සීමාවක් නොපෙනේ. එක හිරක් උදාවෙයි. එක හිරක් බැසයයි. අවිච්ඡින්න සූයස්‍යතාපයම ලොව පවතී.

යම් සේ වනාහි ප්‍රකෘති සූයස්‍යයා කෙරෙහි සූයස්‍ය දිව්‍යපුත්‍රයා වෙයි ද කල්ප විනාශක සූයස්‍යයා එසේ නැත. එහි ලා ප්‍රකෘති සූයස්‍යයා පවතින විට අහසෙහි වලාකුළු ද අළුරොටු ද ගැවසෙයි. කල්ප විනාශක සූයස්‍යයා පවතිද්දී දුම් වලා පහව කැඩපතක් මෙන් අහස නිර්මල වෙයි. පඤ්ච මහානදිය හැර සෙසු කුඩාගංගාවල ජලය සිඳෙයි. එයින් දිගු කලක් ගියපසු තෙවන හිරු උදාවෙයි. එය උදා වීමෙන් පස්මහ ගංගාව ද සිදෙයි. එයිනුත් දිගු කලක් ඇවෑමෙන් සිවුවන හිරු ද පායයි. එය පහළ වීමෙන් හිමවත මහාගංගාවල ප්‍රභවයන් වූ සිංහප්‍රපාතාදිය ද මන්දාකිණි කර්ණමුණ්ඩ, රථකාර, අනෝතත්ත, ඡද්දන්ත, කුණාල යන සත්මහාවිල් ද වියලෙයි. එයින් දිගු කලක් ඇවෑමෙන් පස්වන හිරු උදාවෙයි. එය උදාවූ කල්හි ක්‍රමයෙන් මහමුහුදෙහි ඇඟිලි පුරුකක් තෙමෙන පමණ වත් වතුරක් ඉතිරි නොවේ. එයින් දිගු කල් ඇවෑමෙන් සවන හිරු උදාවෙයි. එය උදාවීමෙන් මුළු සක්වළ එකම දුම්ගොඩක් වෙයි. දුමෙන් තෙතමනය සිදී කෝටි ලක්ෂයක් සක්වළම මේ සක්වළ මෙන් වේ.

එයින් දිගු කලක් ගිය පසු සත්වන හිරු උදාවෙයි. එය උදාවීමෙන් මුළු සක්වළ එකම ගිනිජාලාවක් බවට පත් වේ. කෙළ ලක්ෂයක් සක්වළ යොදුන් සිය ගණන් වූ සිනේරු කුට දැවී අහසෙහිම අතුරුදහන් වෙයි. ඒ ගිනි ජාලාව උඩ නැගී චාතුර්මහාරාජිකය ගනී. එහි රන්විමන් රිදීවිමන් මිණිවිමන් දවා තව්තිසාව ගනී. මේ ක්‍රමයෙන් ප්‍රථමධ්‍යාන භූමිය දක්වා ගනී. එහි තුන් බඹලොව දවා ආභස්සරයෙහි හැපී සිටී. අනුමාත්‍රවූ හෝ සංස්කාරයක් ඇති තෙක් නොනිවේ. සියලු සංස්කාර ක්ෂය වීමෙන් ගිතෙලින් දැල්වූ පහන් සිළුවක් මෙන් හළුවත් ඉතිරි නොකොට නිවෙයි. යට අහසත් උඩ අහසත් එකක් වෙයි. මහා අන්ධකාරයකි. දිගු කල් ඇවෑමෙන් මහා

මේඝයක් නැගී පළමුව සියුම් වැස්සක් වසී. පියුම්දඬු, සැරයටි, මොහොල්, තල්කඳන් සා ධාරා ඇතිව වසිමින් අවිහ බඹලොව දක්වා කෙළ ලක්ෂයක් සක්වළ අභ්‍යන්තරය පුරවා අතුරුදහන් වෙයි. ඒ ජලය හරහටත් යටටත් මහා වාතය නැගී ඝන කරයි. පියුම් පතක් මත දියබිඳු මෙන් මහත් ජල රාශිය ඝන කරයි. විවර සෑදීමෙන් ඒ ඒ තැන් විවරවේ. එයම වාතයෙන් කැටි කොට ඝන කොට ක්ෂය කිරීමෙන් යටට බසී. එසේ පහත් වූ ජලයෙහි බඹලොව පිහිටි තැන බඹලොව ද කාමාවචර දිව්‍ය ලෝක ද පහළවෙයි. පළමු පෘථිවි ස්ථානය පහත් වූ පසු බලවත් වාතය ඉපිද දිය කඳ රඳවයි. එය කට වැසූ ඩබරාවක දිය මෙන් ක්‍රමයෙන් පහත බසී. මෙසේ සිදීයන කල්හි මිහිරි දිය සිදී මත්තෙහි රසපොළොව හට ගනී. එය වර්ණ සම්පන්න ද වෙයි. ගන්ධරස සම්පන්න ද වෙයි. පැන් නොමුසු කිරිබතක මතු පිට මෙනි.

එකල්හි ආභස්සර බඹලොව පළමුව උපන් සත්ත්වයෝ ආයු ගෙවීමෙන් පෙර පින් ගෙවීමෙන් එයින් මැරී මේහි උපදිති. ඔවුහු ඕපපාතික, මනොමය ප්‍රීතිය අනුභව කරන, තමන් බබළන, අහස්හි හැසිරෙන, සුභස්ථායි වූවාහු බොහෝ දිගු කල් සිටිති. එකල්හි සඳහිරු නොදිස්වෙයි. රෑදාවල් නොපෙනෙයි. මස් අඩමස් නොපෙනෙයි. ඍතු සංවත්සර නොපෙනෙයි. ස්ත්‍රී පුරුෂයන් නොපෙනෙයි. දිගු කලක් ගෙවීමෙන් එක්තරා සත්ත්වයෙක් ලොල් ඇතිව පින්වත්නි, මේ කුමක් වන්නේ ද, වර්ණවත් ප්‍රියමනාප සුගන්ධවත් රස ඇති මෙය කෙබඳු වන්නේ ද කියා හටගත් ලෝභයෙන් රසපඨවිය ඇඟිල්ලෙන් ගෙන දිවග තැබීය. දිවග තැබූ කෙණෙහිම සත් දහසක් රසනහරවල පැතිර මනාපව දෘෂ්ටි තණ්හාව ද ඔහුට ඇතිවිය. ඔහුගේ දෘෂ්ටානුගතියට පත් වෙනත් සත්ත්වයෝ ද රස පඨවිය අනුභව කොට තණ්හාවෙන් මැඩී කඩා කෑමට උපක්‍රම කරති. එවිට ඒ සත්ත්වයන්ගේ ස්වයං ප්‍රභාව අතුරුදහන් විය. ස්වයං ප්‍රභාව අතුරුදහන් වූ කල නිත්‍ය අන්ධකාරය විය. ඔවුහු අඳුර දැක බියවෙති. එකල ඔවුන්ගේ බිය නසා සුරස බව උපදවන පිරිපුන් පනස් යොදුන් ඇති හිරුම-

ඬල පහළ වෙයි. ඔවුහු එය දැක ආලෝකය ලැබූයෙමුයි තුටු පහටුව බියෙන් සිටි අපගේ බිය නසා සූරභාවය උපදවමින් නැගී ආ නිසා සූරයෙක් වේවායි සූයාී කියාම ඔහුට නම් කරති. සූයාීයා දවස ආලොකවත් කොට අස්තංගත විය. එවිට එම සත්ත්වයෝ අපි ආලොකයක් ලැබුවෙමු. එයත් අපට දක්නට නැතැයි නැවත බිය වෙති. වෙනත් ආලෝකයක් අපට ලැබුණොත් මැනවයි සිතූහ.

එවිට ඔවුන්ගේ සිත් දන්නා එකුන් පනස් යොදුන් සඳමඬල පහළ වෙයි. ඔවුහු ඒ එලිය දැක වැඩි වැඩියෙන් සතුටු සතුටුව මෙතෙම අපගේ කැමැත්ත දැනගෙන මෙන් පැන නැගි බැවින් චඳ්‍රයයි කියා නම් කරති. හඳ පහළ වූ කල නැකැත් තරු පහළ වෙයි. සඳ හිරු පහළ වූ දිනම මහමෙර සක්වළ හිමවත් පර්වත පහළ වෙයි. ඒවා පෙරපසු නොව මැදින් පසළොස්වක් දිනයෙහිම පහළ වෙයි. කෙසේ පහළ වන්නේ ද? යම් සේ තණබත් ඉදෙන කල එක්විටම බුබුළු උපදී. එක් එක් පසින් ථූප ථූප වෙයි. සමහරක් මිටි මිටි වෙයි. ඇමහරක් සමසම වෙයි. එමෙන් ථූප ථූප තැන්වල පර්වත වේ. පහත් පහත් තැන්වල සාගර වෙයි. සමසම තැන්වල දිවයින් වෙයි. එක් එක් සක්වළ මහාද්වීප සතරක් වෙයි. කුඩා දිවයින් දහසක් පිරිවර වෙයි. ඒ එක් එක් සක්වළ දිගු පුළුලින් දොළොස් යොදුන් දහසක් වෙයි. වටින් වටින් සාරසිය පනස් යොදුන් වෙයි.

> සතිස් ලක්ෂ දසදහස් තුන්සිය පනස් යොදුන් සියලු පරිමණ්ඩල ඇත්තේය. සතර නහුත දෙලක්ෂයක් මේ මහාපෘථුවිය මෙතෙක් ගණය.

එය දරා සිටි ජලය

> අට නහුත සාරලක්ෂයක් වූ ඝන ඇති ජලය වාතයෙහි පිහිටියේය.

එය දරා සිටි වාතය

> නවලක්ෂ සැට දහසක් යොදුන් අහසට නැගී සිටි මාරුතය වේ. මෙය ලෝකයෙහි පිහිටීමයි.

මෙසේ පිහිටි,

අසූසාර දහසක් යොදුන් මුහුදෙහි ගැලුණු සිනෙරු පර්වත රාජයා එකෙණෙහිම උස්ව නැග්ගේය.

සිනේරු පර්වතයෙහි නැගෙන හිර පැත්ත රිදීය. දකුණු පස ඉදුනිල්මිණිමුවාය. බටහිර පළිඟුමයය. උතුරු පස සඹණිමය වෙයි.

මෙසේ උපාර්ධයකට සමානව ක්‍රමයෙන් දිව්‍යමය නානා රත්නයන්ගෙන් විසිතුරු සාගරයෙහි ගැලී ඇති යුගන්ධර, ඊසධර, කරවික, සුදස්සන, නේමින්ධර, විනතක, අස්සකණ්ණ යන මේ සත්කුළුපව් වරම් රජවරුන්ට ආවාසව දෙවියන් යකුන් ඇසුරු කරන ලදුව මහමෙර වටා පිහිටියේය. හිමවත්හි පංචපර්වත යොදුන් සියයක් උසය. දිගින් පළලින් යොදුන් තුන් දහසකි. අසූ සාරදහසක් කුටවලින් යුක්තය.

මේ දඹදිව ප්‍රකට කරන්නා වූ දඹරුක පනස් යොදුන් වටය. කඳ පනස් යොදුන් උසය. හාත්පසින් පනස්යොදුන් ශාඛා ඇත්තේය. මෙසේ සියල්ල යොදුන් ගණනින් වූ දඹරුක වේ. සත් යොදුන් පුළුල්ය. එකෙණෙහි උස්ව නැගුණු දඹරුකෙහි අනුභසින් දඹදිව ප්‍රකට වෙයි.

මේ සක්වළෙහි මහාද්වීප සතරකි. ජම්බුදීප, අපරගෝයානදීප, උත්තරකුරුදීප, පුබ්බවිදේහදීප යනුවෙනි. මේ දඹරුක මෙන් උතුරුකුරු දිවයිනෙහි කල්පවෘක්ෂයයි. අපරගෝයානයෙහි කොළොම් රුකය. පූර්වවිදේහයෙහි සිරීස රුකය. එහි දඹදිව දස දහස් යොදුන් වෙයි. අපරගෝයානය සත්දහස් යොදුන් වෙයි. උතුරුකුරු දිවයින අටදහස් යොදුන් වෙයි. පූර්වවිදේහය සත් දහස් යොදුන් වෙයි. දඹදිව කරත්ත අඹරාවක සටහන් ඇත්තේය. අපරගෝයානය අඹ, අඩසඳ සටහන වේ. උතුරුකුරු දිවයින චතුරශ්‍රය. පූර්වවිදේහය වෘත්තාකාරය. ඒවා අතර මහාසමුද්‍රයයි. ඒ සතර මහාදිවයිනට පිරිවර වශයෙන් එක එකට පන්සියය වශයෙන් දෙදහසක් පිරිවර දිවයින් වේ. මේ දඹදිව දසදහසක් යොදුන් ප්‍රමාණය. එහි සාරදහසක් යොදුන් ප්‍රමණ

ප්‍රදේශය ජලයෙන් පැතිර පවතී. දහසක හිමවත පිහිටියේය. හිමාලය පර්වතය හාත්පසින් ගලා බස්නා පඤ්ච මහාගංගාවෙන් විසිතුරුය. හිමාලයෙහි මහවිල් සතෙක් වෙයි. ඒවා කුමක් ද? අනෝතත්ත, කර්ණමුණ්ඩ, රථකාර, ඡද්දන්ත, කුණාල, මන්දාකිණි, සීහප්පපාත යනුයි. මේ සත් මහවිල් දිගු පුළුලින්, ගැඹුරෙන් පනස් යොදුන් වේ. පරිමණ්ඩලයෙන් එකසිය පනස් යොදුන් වේ.

එහි අනෝතත්ත විල පඤ්ච පර්වතයෙන් වටවිය. සුදස්සන කූට, චිත්තකූට, කාලකූට, ගන්ධමාදනකූට, කේලාසකූට යන මේ පස් පර්වතයෙන් වටවිය. සුදර්ශනකූටය ස්වර්ණමයය. දෙසිය යොදුනක් උසය. ඇතුළත වක් කාකමුඛ සටහන් ඇත්තේය. එම විල පිරිවරා සිටි චිත්‍රකූටය සප්තරත්නමයය. කාලකූටය අඤ්ජනමය වෙයි. ගන්ධමාදනකූටය මසාරගල්ලමය වෙයි. සියලු සුවඳින් යුක්තය. සියලු නානාප්‍රකාර සුවඳින් ගැවසී ගත්තේය. මෙසේ සියලු පර්වත සුදස්සනකූටයට සමානව උස්ව ඒ විල වසාගෙන සිටී. හිර සඳ දකුණින් හෝ උතුරින් ගමන් කරන විට පර්වත අතුරින් එලිය කරයි. කෙළින් යද්දී එලිය නොකරයි. එහෙයින් ඊට අනෝතත්ත යන නම ඇති විය. පළිඟු වැනි නිර්මල සීතල ජලයෙන් පිරි මස් කැස්බන් සහිත කිසිවෙකු නොබොන පිරිසිදු පැහැදිලි දිය ඇත්තේය. ඒ විල සතර පැත්තෙහි සිංහමුඛ ගජමුඛ අස්සමුඛ උසභ මුඛයයි සතර මුඛයෙක් වෙයි. මේ සතර මුඛයෙන් සතර මහාගංගා ගලා බසී. නැගෙනහිර දෙසින් නිකුත් නදිය ඒ විල තුන් වරක් පැදකුණු කොට අනික් තුන් මුඛයෙන් නිකුත් ගංගාවලට නොවැද නැගෙනහිර හිමවතෙහි ද උතුරු හිමවතෙහි ද මිනිස් විෂයට ගොස් නැගෙනහිරින් මුහුදට වදී. දකුණු දිශාවෙන් නිකුත් නදිය එයම තෙවරක් පැදකුණු කොට උතුරු දෙසින් සෘජුව ගල්තලා මතින් සැටයොදුනක් ගොස් පර්වතයෙහි හැපී එයින් නැගී තුන් ගව්වක් පමණ දියඳහරක් වී සැට යොදුනක් අහසින් ගොස් තියග්ගල නම් ගලෙහි හැපෙයි. ඒ ගල ජලදහරා වේගයෙන් බිඳී පනස්සතර යොදුන් පමණ තියග්ගල නම් පොකුණ සැදුණේය. ඒ පොකුණු තෙර කඩාගෙන සැටයොදුන්

පමණ ගලකට වැද එතැනින් ඝන පාෂාණය බිඳ උමගින් සැට-යොදුනක් ගොස් ගිජ්ඣනම් තිරච්ඡාන පර්වතයෙහි හැපී අතෙහි පසැඟිලි මෙන් දහරා පසක්ව පවතී. පැවති තැන ගංගා, යමුනා, අචිරවතී, සරභූ, මහී යන මේ පස්මහගඟ හටගත්තේය.

මේ ගඟ තෙවරක් අනෝතත්තවිල පැදකුණු කොට ගිය තන්හි ආවර්තගංගා නම් විය. සෘජුව ගල්තල මතින් සැටයොදුනක් ගිය තැන ආකීර්ණගංගා නමි. සැටයොදුනක් ආකාශයෙන් ගිය තැන ආකාශ ගංගා යි කියැ වේ. තියග්ගල පාෂාණයෙහි පතස් යොදුන් අවකාශයෙහි සිටී තැන තියග්ගල පොකුණ යයි කියැවේ. පොකුණු තෙර බිඳගෙන පාසාණයට පිවිස සැට යොදුනක් ගිය තැන බහල-ගංගායි කියැවේ. උමගින් සැට යොදුනක් ගිය තැන උමංගංගායයි කියැවේ. ගිජ්ඣ නම් තිරච්ඡාන පර්වතයේ හැපී පසඳ්ව ධාරාවක්ව පැවැති තැන ගංගා, යමුනා, අචිරවතී, සරභූ, මහි යන පස් මහාගංගා නම් විය. ඒ අතර මහපොකුණු පිහිටියේය. වයඹ දිගින් නිකුත් ගංගා අමනුෂ්‍ය පථයෙන් ගොස් මහ මුහුදට වදී. සිංහ මුඛයෙන් නිකුත් නදී තෙරෙහි සිංහයෝ බොහෝ වෙති. ඇත් මුඛයෙන් නිකුත් නදී තීරයෙහි ඇත් අස් උසභයෝ බොහෝ වෙති. මෙසේ හිමවත සියලු ආශ්චය්‍යීවලට නිවාසයකි. ඒ හිමවත හාත්පස සීදන්ත සාගරයෙහි දඹරුක වෙයි. එහි ඕජස් ඇති කල්පස්ථායි වණ්ණ ගන්ධ රස ඔජා සම්පන්න ඵල ඇත්තේය. මේ ලෝකයෙහි කල්පස්ථායි රුක් සතෙක් වෙයි.

පළොල්, හිඹුල්, ජම්බු, දෙවියන්ගේ පරසතු, කොළොම්, කල්ප වෘක්ෂ, සීරිස යන සතයි.

> පළොල් අසුරයන්ගේ ද හිඹුල් සුපර්ණයන්ගේ ද දඹ මෙහි මිනිසුන්ගේ ද පරසතු දෙවියන්ගේ ද වෙයි. කොළොම් අපර ගොයානයෙහිය. කප්රුක උතුරුකුරු දිවයිනෙහිය. සිරීසය පූර්වවිදේහයෙහිය. මේවා කල්පස්ථායී වෙයි. කඳ පස් මහ ශාඛා උස පරිමණ්ඩලය සියල්ල එක හා සමානය. කල්පස්ථායීව මැනවින් සිටියේය.

චක්‍රවාට පර්වතය වනාහි

දෙයාසූ යොදනක් මහමුහුදෙහි ගැලුණේය. චක්‍රවාට පර්වතය එපමණම උඩ නැගුණේය. එය වට කොට මේ ලෝක ධාතුව පිහිටියේය.

මේ සක්වළ ගැබෙහි මේ සඳහිරු දෙදෙනම අනුපරිවර්තනය වේ. පළමුව සූර්‍යයා උපදී. චන්‍ද්‍රයා පසුව උපදී. සූර්‍යයා රන් විමනක් තුළ වාසය කරයි. පිටතින් පළිගු වට කොට ඇත. දෙකම උෂ්ණය. චන්‍ද්‍රයා මිණිවිමනක් තුළ වාසය කරයි. එය රිදියෙන් වටකොට ඇත්තේය. දෙකම සිසිල්ය. ප්‍රමාණයෙන් වනාහි චන්‍ද්‍රයා සෘජු එකුන් පනස් යොදනකි. වටින් තුන් යොදුනක් අඩු එකසිය පනස් යොදුනකි. සූර්‍යයා සෘජු පනස් යොදුනකි. වටින් එකසිය පනස් යොදුනකි. චන්ද්‍රයා පහතින් ද සූර්‍යයා උඩින් ද වේ. ඔවුන් අතර දුර යොදුනකි. චන්‍ද්‍රයා සෘජුව සෙමින් යයි. සරසට වහා යයි. දෙපස නැකැත්තරු ගමන් කරයි. චන්‍ද්‍රයා දෙන වසුපැටියා ළඟට මෙන් ළංවෙයි. නැකත් තමන්ගේ තැන අත නොහරියි. සූර්‍යයාගේ සෘජු ගමන ශීඝ්‍රය. තිරස් ගමන මන්දය. ඔහු අමාවක්හි යොදුන් ලක්‍ෂයක් සඳමඬලෙහි ආලෝකයට යයි. එවිට හඳ රේඛාවක් මෙන් පැනේ. පක්‍ෂයෙහි දෙවන දින ලක්‍ෂයකි. මෙසේ පූර්ණමී පෙහෙවස් දින දක්වා ලක්ෂය ලක්‍ෂය අලෝකයට යයි. එවිට චන්‍ද්‍රයා ක්‍රමයෙන් වැඩී පොහෝ දිනයෙහි පරිපූර්ණවෙයි. යළි පෑළවිය දවසෙහි යොදුන් ලක්‍ෂයක් හැර දමා යයි. දියවකෙහි ද ලක්‍ෂයකි. මෙසේ පොහෝදින දක්වා දිවෙයි. එවිට චන්‍ද්‍රයා අනුක්‍රමයෙන් පිරිහී පොහෝ දවසෙහි මුළුමනින් නොපෙනේ. චන්‍ද්‍රයා යට ද සූර්යයා මත්තෙහි ද වෙයි. මහා පාත්‍රයකින් පැන් පාත්‍රයක් මෙන් සඳමඬල වැසෙයි. මද්දහනෙහි සෙවණැල්ල මෙක් චන්‍ද්‍රයාගේ ඡායාව නොපෙනේ. ඡායාව නොපෙනෙන කල්හි දුර සිටියවුන්ට දිවා පහනක් මෙන් නොපෙනී යයි.

ඔවුන්ගේ වීථි කෙතෙක් ද? මෙහිලා අජවීථි, නාගවීථි, ගෝවීථි වශයෙන් වීථි වේ. එළුවන්ට දිය පිළිකුල්ය. හස්තීන්ට මනාපය. හරකුන්ට ශීත උෂ්ණ සමානය. යම් විටක සඳ හිරු අජවීථියට

නගිද්ද එකල එක වැසි බිංදුවකුදු නොවසී. නාග වීථියට නැගි කල්හි අහස බිඳුණාක් මෙන් වැගිරෙයි. ගෝ වීථියට නැගි කල්හි සෘතු සමතාව පවතී. සඳහිරු සමසක් මහමෙරින් නික්මෙති. සමසක් ඇතුළත හැසිරෙති. ඔවුහු ඇසළ මාසයෙහි මහමෙර සමීපයෙහි නොහැසිරෙති. ඉන් දෙමසකින් නික්ම බැහැර හැසිරෙමින් ඉල් මස මැදම යති. ඉක්බිති චක්‍රවාටයට අභිමුඛව ගොස් තෙමසක් සක්වළ සමීපයෙහි හැසිර නැවත නික්මී බක්මස මැදින් ගොස් ඉන් පසු දෙමසක් සිනේරුව වෙතින් පැන යළි ඇසළ මස සීනෙරු සමීපයෙහි හැසිරෙති. කෙතෙක් තැන් ආලෝක කරත් ද? එකවර තුන් දිවයිනක් ආලෝක කරවති. කෙසේ ද? මේ දිවයිනෙහි ඉර උදාවන කල්හි පූර්වවිදේහයෙහි මධ්‍යාහ්නයයි. උතුරුකුරු දිවයිනෙහි අස්තංගත වන කල්හි අපරගෝයානයෙහි මධ්‍යාහ්නයයි. පූර්ව-විදේහයෙහි උදාවන විට උතුරුකුරු දිවයින්හි මධ්‍යාහ්නයයි, අපරගෝයානයෙහි අස්තංගත වන විට මෙහි මධ්‍යම යාමයයි. උතුරුකුරු දිවයිනෙහි උදාවන කල්හි අපර ගෝයානයෙහි මධ්‍යාහ්න-යයි. මෙහි අස්තංගත වන කාලයෙහි පූර්වවිදේහයෙහි මැදියමයි. අපර ගොයානයෙහි උදාවන විට මෙහි මධ්‍යාහ්නයයි. පූර්වවිදේහයෙහි අස්තංගමනය වන විට උතුරුකුරු දිවයිනෙහි මධ්‍යාහ්නයයි. මෙසේ එකම සක්වළ ගැබ සඳහිරු ආලෝක කරති. එතැන් පටන් රෑ දාවල් ප්‍රකට විය.

එසේම රාත්‍රි පසළොසක් අඩමසකි. දෙඅඩමසක් එක් මාසයකි. මෙසේ මස් අඩමස් ප්‍රකට විය. සිව්මසක් එක සෘතුවකි. තුන් සෘතුවක් එක් සංවත්සරයකි. මෙසේ සෘතු සංවත්සර ප්‍රකට විය. මෙපමණකින් මේ ලෝකය විවර්ත විය. ඉක්බිති පඨවිරසය අනුභව කරන එම සත්ත්වයෝ ක්‍රමයෙන් ඇතැම්හු වණ්ණවත් වෙති. ඇතැම්හු දුර්වර්ණ වෙති. එහි වණ්ණවත්හු දුර්වණ්ණයන්ට අවමන් කරති. ඔවුන්ගේ අභිමාන හේතුවෙන් ඒ රස පොළොවත් අතුරුදහන් වෙයි. බිම් හතු පහළ වෙයි. නයි හතු මෙනි. එමෙන් පහළවෙයි. එය ද වණ්ණ ගන්ධ රස සම්පන්න වෙයි. ඔවුන්ට එනයින්ම ඒවාත් අතුරු දහන් වෙයි. භූමි

පට්ටක අතුරුදහන් වූ කල බදාලතා පහළ වෙයි. ඒ ක්‍රමයෙන් ඒ වාත් අතුරු දහන් වෙයි. බදාලතා අතුරුදහන් වූ පසු වගා නොකොට පැසෙන හැල් පහළ වෙයි. නොකළු දහයියා රහිත සුවඳ වී පහළ වේ. ඉන් පසු ඔවුන්ට භාජන පහළ වේ. ඔවුහු හැල් භාජනයෙහි බහා පාෂාණ මත තබති. තෙමේම දැල්වී නැගී එය පිසයි. ඒ බත සමන්මල් බඳුය. ඊට සූපයෙන් හෝ ව්‍යඤ්ජනයෙන් ප්‍රයෝජනයක් නැත. යමක් යමක් බුදිනු කැමති වෙද්ද ඒ ඒ රසයම සෑදෙයි. ඒ ඒ ඖදාරික ආහාර ගන්නා ඔවුන්ට මල මුත්‍ර පැනෙයි.

එවිට ඒවා නික්මීම සඳහා වසමුඛ ආදිය ඇතිවෙයි. පුරුෂයාට පුරුෂ බවත් ස්ත්‍රියට ස්ත්‍රීත්වයත් පහළ වේ. එහිදී ස්ත්‍රිය පුරුෂයා වෙතත් පුරුෂයා ස්ත්‍රිය වෙතත් අවේලාවෙහි හැසිරෙයි. අවේලාවෙහි හැසිරීමෙන් කාම පරිභෝගය උපදී. ඉක්බිති මෛථුනය ඇසුරු කරති. ඔවුන්ගේ අසත්ධම් සේවනය නිසා විඥයන් විසින් ගරහනු ලබන්නාහු වෙහෙසනු ලබන්නාහු ඒ අසත්ධම්ය වැඩීම හේතු කොට ගෙවල් තනති. ගෙවල වසන්නාහු අනුක්‍රමයෙන් එක්තරා අලසයෙකුගේ දෘෂ්ටානුගතියට පැමිණ රැස් කරති. එතැන් පටන් කළු ඇට දහයියා සහිත වී ඇති වෙයි. වගාවත් ද නිසරු වෙයි. වැටී ඔවුහු විලාප කියමින් භවත්නි, ඒකාන්තයෙන් ම සත්වයන් කෙරෙහි පාපධම් ඇති විය. අපි පෙර මනොමය වීමු. ප්‍රීතිය අහරකොට ස්වයංප්‍රභාව අන්තරීක්ෂයෙහි හැසිරෙමින් දීර්ඝායු ඇත්තෝ වූ යෙමු. දිගුකල් ඇවෑමෙන් වර්ණ ගන්ධ රස සම්පන්න රස පඨවිය නැතිවිය. අපි එක් පුරුෂයෙකු සම්මත කොට ගත හොත් මැනවි. ඔහු අපට නැසිය යුත්තකු නසයි. ගර්හා කළ යුත්තකු ගරහයි. නෙරපිය යුත්තකු නෙරපයි. අපි ඔහුට හැල් කොටසක් දෙමු කියා කතිකා කළහ.

සත්ත්වයන් මෙසේ තීරණය කළ කල්හි මේ කල්පයෙහි මේ භාග්‍යවතුන් වහන්සේම බෝසත්ව එකල ඒ සත්ත්වයන් අතර අතිශය රූප සම්පන්නව දැකුම්කළුව මහේශාක්‍යතරව බුද්ධිසම්පන්නව සංග්‍රහ නිග්‍රහ කිරීමට සමත්ව විසූහ. උන් වහන්සේ වෙත පැමිණ "පින්වත් සත්ත්වය, මනාව පහකළ යුත්තවුන් පහකරව. ගර්හා කළ

යුත්තන් ගරහව. නෙරපිය යුත්තන් නෙරපව. අපි ඔබට හැල් කොටසක් දෙමුයි"කීහ. උන්වහන්සේ ඔවුන්ගේ වචනය පිළිගත්හ. ඔහු මහජනයා විසින් සම්මත නිසා මහාසම්මත නම් වූහ. ක්ෂේත්‍රයන්ට අධිපති නිසා ඛත්තිය නම් වූහ. දැහැමෙන් සෙමෙන් පාලනය කරන නිසා රජයයි කියා ද නම් තුනකින් ප්‍රකට වූහ. ලෝකයෙහි යම් ආශ්චර්‍ය ස්ථානයක් වී නම් බෝසත්හුම එහි ආදි පුරුෂයාණෝ වූහ.

බෝසතුන් ආදි කොට ඔවුහු ක්‍රමයෙන් ක්ෂත්‍රිය, බ්‍රාහ්මණ වෛශ්‍ය, ක්ෂුද්‍රවර්ණ පිහිටුවා ගත්හ. එහි කල්ප විනාශක මහා වැස්සෙහි පටන් ජලය නැතිව යෑම තෙක් මේ අසංඛ්‍ය කල්පය සංවර්තයයි කියනු ලැබේ. කල්ප විනාශ ජල ගිනි අවසන් කොට කෙළ ලක්ෂයක් සක්වළ පුරාලන සම්පත් මහාමේඝය දක්වා මේ දෙවෙනි අසංඛ්‍යය සංවර්තස්ථායි කල්ප නමී. සම්පත් මහාමේඝයෙහි පටන් ඉර හඳ නටගන්නා තුරු මේ අසංඛ්‍යය විවර්තයයි කියනු ලැබේ. ඉර හඳ පහළවීමෙහි පටන් කල්ප විනාශක මහාමේඝය දක්වා වූ මේ සිව්වන අසංඛ්‍යය විවර්තස්ථායි යනුවෙන් කියනු ලැබේ. මේ අසංඛ්‍ය කල්ප සතර මහාකල්පයක් වෙයි. ගින්නෙන් නැසීමත් පිහිටීමත් මෙසේ දත යුතු ය.

යම් කාලයක කල්පය ජලයෙන් නැසේ ද පළමුවෙන්ම කල්ප විනාශ මහාමේඝය නැඟී පෙර කී ක්‍රමයෙන් විස්තර කළ යුතුය. විශේෂය මෙයයි. පළමු කල්පයෙහි දෙවෙනි සූර්‍යයා පහළ වූයේ යම් සේ ද මෙහිදී ද කප නස්නා මහාවැසි නැගෙන්නේය. කම්පා කරමින් වසී. වැසි ධාරාවලින් පහරනු ලැබූ ගල් පර්වත දිය වී යයි. ජලය හාත්පස පිරීයයි. පොළොවෙහි පටන් ද්විතීයධ්‍යාන භූමිය තෙක් ජලයෙන් පිරෙයි. එහි තුන් බඹ ලොව දිය කොට සුභකිණ්ණයෙහි හැපී සිටී. අණුමාත්‍ර සංස්කාරයක් හෝ පවත්නා තාක් නොසන්සිඳේ. දියෙහි ගැටුණු සියල්ල විනාශ වූ කල්හිම වහා සන්සිඳෙයි. අතුරු දහන් වෙයි. යට අහසත් උඩ අහසත් එකක් වෙයි. මහා අන්ධකාරාදිය කී පරිදිමය. ආභස්සර බ්‍රහ්මලෝකය ආදි කොට

ලෝකය හටගනී. සුභකිණ්ණයෙන් ආභස්සරාදි තැන්වල සත්ත්වයෝ උපදිති. කල්ප විනාශ මහාමේඝයේ පටන් කල්ප විනාශ ජලය සිඳීම තෙක් මෙය එක් අසංඛ්‍යයකි. -පෙ- දිය සන්සිඳීමෙහි පටන් සම්පත් මහාමේඝය දක්වා මෙය දෙවෙනි අසංඛ්‍යයයි. -පෙ- සම්පත් මහාමේඝයෙහි පටන් ඉර හඳ හටගැන්ම දක්වා මේ තුන්වන අසංඛ්‍ය යයි -පෙ- ඉරහඳ පහළ වීමෙහි පටන් කපනස්නා මහාමේඝය දක්වා මෙය සතර වන අසංඛ්‍යයයි. එය විවර්තස්ථායි නම් වේ. මේ අසංඛ්‍යය සතර එක් මහාකල්පයකි. ජලයෙන් හටගැනීමත් විනාශයත් මෙසේ දත යුතුය.

යම් කලෙක කල්පය වාතයෙන් විනාශ වේ ද පළමුව කප නස්නා මහාවර්ෂා ඇතිව කී පරිද්දෙන්ම විස්තර කළ යුතුය. එහි විශේෂය මෙයයි. මෙහි දෙවෙනි සූර්‍යයා මෙන් මෙහි දෙවන කප නස්නා වාතය හටගනී. පළමුව සියුම් ධූලි සියුම් වැලි මහවැලි ගල්කැට පාසාණ කුළුගෙවල් පමණ ගල් සෑම තැන්වල පිහිටි මහගස් උදුරයි. ඒවා පොළොවෙන් අහසට නැගී නැවත නොඑයි, එහිම සුණු විසුණු වී අභාවයට යයි. ක්‍රමයෙන් යට මහපොළොවෙහි පටන් වාතය හට ගෙන පොළොව පෙරළා අක්මුල් කොට අහසෙහි පාකරයි. යොදුන් සියයක් පමණ පොළොව දෙයොදුන් තුන් යොදුන් සතර පස් යොදුන් සියක් යොදුන්ව කැඩී වාත වේගයෙන් උඩ ගොස් අහසෙහි සුණු විසුණු වී අභාවයට යයි. සක්වළ ගලත් මෙර-ගලත් වාතයෙන් උඩ ගසා අහසෙහි පොළවෙහි ඇති ඒවා එකිනෙක ගැටී සුණු විසුණු වී වැනසෙයි. මේ ක්‍රමයෙන් භූම්‍යස්ථ විමාන ද වනසා සදෙව්ලොව ද වනසා කෙළ ලක්ෂයක් සක්වළ විනාශ කරයි. එහිදී චක්‍රවාට චක්‍රවාට සමඟ ද හිමවත් හිමවත් සමඟ ද මහමෙර මහමෙර සමඟ ද එකිනෙක ගැටී සුණු විසුණු වී වැනසෙයි. පොළොවෙහි පටන් තෘතීයධ්‍යාන භූමිය තෙක් වැනසෙයි. එහි තුන් බඹලොව වනසා වේහප්ඵලයෙහි හැපී සිටී. සංස්කාරගත සියල්ල නසා තෙමේත් නැසේ. යට අහසත් උඩ අහසත් එකක් වෙයි. මහා අන්ධකාර වෙයි. සියල්ල කී පරිද්දෙනි.

මෙහි සුභකිණ්ණ බ්‍රහ්මලොකයෙහි පටන් ලෝකය පහළ වෙයි. වේහප්ඵලයෙන් චුතව සුභකිණ්ණාදියෙහි සත්ත්වයෝ උපදිති. කල්ප විනාශ මහාවර්ෂාවේ පටන් කල්ප විනාශ වාතය දක්වා මෙය එක් අසංඛ්‍යකල්පයකි -පෙ- වාත විනාශයෙහි පටන් සම්පත් මහවැසි දක්වා දෙවන අසංඛ්‍යයයි. -පෙ- සම්පත් මහවැස්සෙහි පටන් ඉර හඳ පහළවීම දක්වා තුන් වන අසංඛ්‍යයයි. -පෙ- ඉරහඳ හට ගැනීමෙහි පටන් කප නස්නා මහවැසි දක්වා සතරවන අසංඛ්‍යයයි. එය විවර්තස්ථායි නම් වෙයි. මේ සතර කප එක් මහ කපකි. වාතයෙන් හටගැනීමත් විනාශයත් මෙසේ දත යුතුය. කුමක් නිසා මෙසේ ලොව විනාශ වෙයි ද? අකුසල හේතුවෙනි. අකුසල් මුල් උපන් කල්හි මෙසේ ලොව වැනසෙයි. හෙද රාගය උත්සන්න වූ කල්හි ගින්නෙන් වැනසේ. ද්වේෂය උත්සන්න වූ කල්හි ජලයෙන් වැනසේ. සමහරු ද්වෙෂය උත්සන්න වූ කල්හි ගින්නෙන් වැනසෙයි. රාගය උත්සන්න වූ කල්හි ජලයෙන් වැනසෙයි කියා කියති. ථෙරවාදීහු වනාහි මෝහය උත්සන්න වූ කල්හි වාතයෙන් වැනසෙතැයි කියති.

මෙසේ විනාශ වන විට නිතොරව සත්වරක් ගින්නෙන් නැසෙයි. අටවන වර ජලයෙන් නසී. නැවත සත්වරක් ගින්නෙන් නැසී අටවන වර ජලයෙන් නසී. මෙසේ අටවන අටවන වර වැනසී සත්වරක් ජලයෙන් වැනසී නැවත සත් වරක් ගින්නෙන් නැසෙයි. මේ අයුරින් තෙසැට කපක් ඉක්ම යයි. මේ අතර ජලයෙන් විනාශ වූ වාරය සමඟ ගෙන වාතයෙන් නැසීමත් සමඟ පිරිපුන් සූසැට කපක් ආයු ඇති සුභකිණ්ණයත් විනාශ කරමින් ලෝක විනාශය කරයි. කියන ලදී-

> සත්වරක් වන සේ සත්වරක් ගින්නෙන් ද අටවන වර ජලයෙන්ද මෙසේ අටවරක් වූ සිව් සැට කපක් පිරීමෙන් වායු විනාශ වාර පැමිණෙන්නේය.

පෙර විසීම් සිහි කරන කල්හි එක් කල්පයක් සිහි කරන

භික්ෂුනම මේ කල්පවල නොයෙක් සංවර්ත කල්ප නොයෙක් විවර්ත කල්ප නොයෙක් සංවර්ත විවර්ත කල්ප සිහිකරයි.

කල්ප පරිච්ඡේදකථා නිමි

(විපච්ඡිතෙය්‍යාති සද්දමෙය්‍ය, අසම්භාවනීයෝ අසම්පනෙනාති අත්ථෝ, තිරියං ඕධිනාති පරිච්ඡෙදෙන අස්ස භවෙ. චන්දපරිකරොති, චන්දපරිකර පනත්ථෝ....[1]) තණ්හංකර බුදුන්ට රුක්අත්තන ගස බෝධියයි. මේධංකර බුදුන්ට කැල ගස බෝධියයි සරණංකර, දීපංකර බුදුවරුන්ට පුලිල ගස බෝධියයි. කොණ්ඩඤ්ඤ බුදුන්ට සල්ගස බෝධියයි. මංගල, සුමන, රේවත, සොභිත යන බුදුවරුන්ට නාරුක බෝධිය යි. අනෝමදස්සි බුදුන්ට කුඹුක් ගස බෝධියයි. පදුම, නාරද බුදුවරුන්ට සෝණ ගස බෝධියයි. පියුමතුරා බුදුන්ට හොර ගස බෝධියයි. සුමේධ බුදුන්ට කොසඹ බෝධියයි. සුජාත බුදුන්ට වේළු බෝධියයි. පියදස්සි බුදුන්ට කුබුක්බෝධියයි. සුජාත බුදුන්ට හුණ බෝධියයි. අත්‍ථදස්සි බුදුන්ට සපු බෝධියයි. ධම්මදස්සි බුදුන්ට රත්කරවිබෝධියයි. සිද්ධත්ථ බුදුන්ට කණිකාර බෝධියයි. තිස්ස බුදුන්ට සොණ බෝධියයි. ඵුස්ස බුදුන්ට නෙල්ලි බෝධියයි. විපස්සි බුදුන්ට පළොල් බෝධියයි. සිඛී බුදුන්ට විපස්සි බුදුන්ට පළොල් බෝධියයි. වෙස්සභූ බුදුන්ට සල්බෝධියයි. කකුසඳ බුදුන්ට සිරීස බෝධියයි. කොනාගමන බුදුන්ට අත්තික්කා බෝධියයි. කාශ්‍යප බුදුන්ට නුගරුක් බෝධියයි. ගෞතම බුදුන්ට ඇසතු බෝධියයි.

මේ බෝධිය මහාපෘථුවියෙහි නැබ මැද උපදනා බව කියන ලදි. එහෙයින් පෙර බුදුවරුන්ගේ පලඟ පිහිටි තැන්හිම උපදනේය.

1. පෙළෙහි එන මෙසේ දක්වා ඇති කොටස පද, පාඨ වශයෙන් බෙහෙවින් අවුල් වියවුල් ව ඇති නිසා සියල්ල සිංහලට නැඟිය නොහැකි බැවින් ඒ තුළ තැනින් තැන සඳහන් බුදුවරයන් වහන්සේලා සහ උන්වහන්සේලාගේ බෝධි පිළිබඳ විස්තරය පමණක් ගළපා පරිවර්තනය කර ඇති බව සලකන්න.

බෝ පලඟ පිහිටි තැන ලෝක විනාශයේදී හැමට පසුව වැනසේ. ලෝ පිහිටන කල්හි පළමුවම පිහිටයි. කෙසේ පිහිටන්නේ ද? මනුෂ්‍යලෝකස්ථානය වාතබලයෙන් හටගනී. ජලයෙහි පිහිටයි. ජලමත උපුල් පත් මෙන් පොළොව සතව පිහිටයි. දියමත උපුල් පත් මෙන් පිහිටි ඒ පොළොවෙහි නැබ මැද හෙවත් හරිමැද පෙර නිමිති බව දක්වමින් එක් පියුම් ගසක් උපදී. එහි ධර්මතා වශයෙන් ඒ කල්පයෙහි බුදුවරු උපදිත් නම් මල් පිපෙයි. බුදුවරු නූපදිත් නම් මල් නොපිපෙයි. එක් බුදුකෙනෙක් උපදිත් නම් එක් මලක් පිපෙයි. දෙනමක් උපදිත් නම් මල්දෙකක් උපදී. තුන් නමක් සතර නමක් පස් නමක් උපදිත් නම් මල් තුනක් හතරක් පහක් වශයෙන් උපදී. පිපෙන මල් ද එකම නාලයෙහි කිණිහිරිමල් මෙන් උපදියි.

එකල්හි සුද්ධාවාස බ්‍රහ්මයෝ නිදුකාණෙනි, පෙරනිමිති බලන්නට යමු කියා මහාබෝධි පර්‍යංකස්ථානයට පැමිණෙති. බුදුවරුන් නූපදින කල්පවල මල් නොපිපෙයි. ඔවුහු මල් නොමැති ගස් දැක භවත්නි, ලෝකය අන්ධකාරය. මෝහයෙන් මුළා වූ සත්ත්වයෝ අපායෙහි පිරෙති. සදෙව්ලොවත් බඹලොවත් හිස් වෙයි. කියා නොසතුටට පත්වෙති. පිපෙන කාලයෙහි මල් දැක අහෝ මහත් ආලෝකයක් ඇති වන්නේය. සර්‍වඥ බෝධිසත්ත්වයන් වහන්සේ මව් කුස පිළිසිඳීමෙහි නික්මීමෙහි අබිනික්මන් කිරීමෙහි බුදුවීමෙහි දම්සක් පැවැත්වීමෙහි යමාමහපෙළහර දැක්වීමෙහි ආයුසංස්කාර අත් හැරීමෙහි පිරිනිවීමෙහි ප්‍රාතිහාර්‍ය දකිමු. සතර අපා පිරිහෙයි. සදෙව්ලොවත් බඹලොවත් පිරෙයි කියා සතුටුව උදම් අනමින් තමන්ගේ බ්‍රහ්මලෝකවලටම යති. මේ භද්‍ර කල්පයෙහි පියුම් පහක් පිපුණේය. ඒ නිමිති පරිදි පිළිවෙළින් සිව් බුදුකෙනෙක් උපන්හ. පස්වැනි බුදුහු උපදනාහ. කකුසඳ කෝනාගමන කස්සප බුදුවරුන් පිරිනිවි කල්හි උන්වහන්සේලාගේ ශාසන ද අතුරු දහන් වූ කල්හි සිරීස උදුම්බර නිග්‍රොධ බෝරුක් ද අතුරුදහන් විය. මේ අපගේ බුදොත්පාදයෙහි අපට අනුකම්පා කළ බෝසත්හු සාරා-සංඛ්‍ය කප් ලක්ෂයක් සමතිස් පැරුම් පුරා තුසිපුර දෙවියන්ගේ ආරාධනා පිළිගෙන දසසහස්‍රී ලෝකධාතු කම්පා කිරීමාදි අනේක

ප්‍රකාර ප්‍රාතිහාර්‍ය දක්වමින් වලා ධූම රජස් ආදියෙන් විරහිතව නිකුත් සූර්‍යයා මෙන් මවුකුසින් නික්මෙති. උන් වහන්සේ උපදනා දිනයෙහිම ඇසතු බෝධිය උපදියි.

පාපී මාරයා උපන් බෝරුක දැක බියව නොසතුටට පත්ව මෙසේ සිතීය. "මේ බෝරුක මුල ඔකාවස් කුලයෙන්, මහබිනික්මන් නික්ම සව්‌‍හථී සිද්ධාත්‍ථකුමරා සම්‍යක් සම්බෝධිය අවබෝධ කරන්නේය. බොහෝ සත්ත්වයෝ මාගේ විෂයයෙන් මිදෙන්නාහ" කියායි. මෙසේ සිතා එක් පුතෙකු පිරිවර සහිතව බෝරුක වෙත නවතා සව්‌‍හථී සිද්ධාත්‍ථ කුමරා යම්දාක මෙහි පැමිණේ ද එදා ඔබ මට දැනුම් දෙවයි කීය. ඔහු පියාගේ වචනය ගෙන එහිම වාසය කළේය. බෝසත්හු එකුන්තිස් වසක් ගිහිගෙයි සිට ජීර්ණ ව්‍යාධි, මෘත ප්‍රව්‍රජිත යන සතර දේවදූතයන් දැක කලකිරුණු සිතින් සසර ආදීනව දැක මධ්‍යම රාත්‍රියෙහි උතුම් කන්‍ථක අසුපිට නැගී සහජාත ඡන්නයන් සමඟ නුවර දොරටුවෙහි දී පාපී මාරයා විසින් පොළොඹ වන ලද සක්විති රජය ද ප්‍රතික්‍ෂේප කොට නොනැවති මහබිනික්මන් කොට එක් රැයින්ම තුන් රජය ගෙවා ආනෝමා නදී තීරයට පැමිණියහ. කවර තුන් රජය ද කපිලවත්‍ථු, දේවදහ, කෝලිය රාජ්‍යයන්ය.

බෝසත්හු අනෝමා තීරයෙහි, පැවිදිව උරුවේලාවෙහි සාවුරුදු ප්‍රධන් ව්‍යායම වඩා වෙසක් පුණුපොහෝ දින උරුවේලාවෙහි සෙනානිගමයෙහි සුජාතාව පිදූ දෙවියන් විසින් දිව ඕජස් බහාලූ කිරිබත වළඳා සල්වනයෙහි දිවාවිහාර කොට සවස්හි අටඉස්බක් පුළුල් දෙවියන් විසින් මවන ලද මඟින් බෝරුක බලා වඩින සේක් අතර මඟ සොත්‍ථිය බමුණහු විසින් දෙන ලද අටතණමිට ගෙන මහාබෝධියට දකුණින් පැමිණ තෙවරක් පැදකුණු කොට ඊසාන දික්හි තුදුස් රියන් තණ ඇතිරි අතුරා පර්යංකයෙන් නැගෙනහිර බලා හුන්හ. එවිට මාරයාගේ පුත් එසේ ආ බෝසතුන් දැක වහා ගොස් මාරයාට දැන්වීය. ඉක්බිති මාරයා "යව්, සව්‌‍හථී සිද්ධාත්‍ථ කුමරු රාග පාශයෙන් බැඳගෙන එව්" කියා දූවරුන් තිදෙන යැවීය.

ඔවුහු තුෂ්ණීම්භූතව අවලස්ථානයෙහි හුන් බෝසතුන් නැටුම් ගැයුම් සිනාවීම් තෙපලීම් බැලීම් ආදි විවිධ උපායවලින් එතැනින් සොලවනු නොහැකිව මාරයා වෙත පැමිණ පියාණෙනි, එතැනින් සෙලවීමට වත් නොහැකි වීමුයි කීහ. ඉක්බිති මාරයා ක්‍රොධයෙන්ම අපමණ මරබල ගෙන තෙමේම බෝසතුන් වෙත ගියේය. පාළියෙහි කී පරිද්දෙන්ම ගත යුතුය.

මාරයා බියකරු ගොර බිරම් වේශ ගත් ආයුධධාරී මරසෙන් ගෙන එහි පැමිණියේය. එවිට බෝධිසත්ත්වයෝ දානසීලාදී සමතිස් පැරුම් යොධයන් සහිතව සතිස් යොදුන් පරිමණ්ඩල වූ මරසෙන් තුන් ආකාරයකින් පරදවා රාත්‍රි තුන්යමහි ත්‍රිවිද්‍යාව සාක්ෂාත් කොට සර්ව්ඥතාඥානය අවබෝධ කළහ.

> නැවත නැවත දුක් උපදවන ගෘහ කාරකයා සොයමින් නොදැක නොයෙක් ජාති සංසාරවල සැරිසැරීමි.

වඩුව, මම ආත්මභාව නමැති ගෙය සදනා තෘෂ්ණාව සොයමින් යම් නුවණකින් එය මට දත හැකි වේද ඒ ඤාණය සඳහා සසර නොයෙක් ජාතීන්හි සැරිසැරීමි. අනිබ්බිසං යනු, ඒ නුවණ නොවිඳිමින් නොලබමින් ම සැරිසැරුවෙමි. හැසිරුණෙමි යන අර්ථයි. යළි යළිත් උපත දුකෙකි. මේ උපතට නැවත නැවත එළඹීම දුකෙකි. වඩුවා නුදුටු විට ගෘහය තවදුරටත් පවතියි. එබැවින් සොයමින්ම සැරිසැරුවෙමි. ගහකාරක දිට්ඨොසි යනු, ගෙය සදන්නාණෙනි, ඔබ දක්නා ලද්දේ වෙහි. සර්ව්ඥතාඥානය අවබෝධ කරන්නාවූ මා විසින් ගෙය සදන්නා දක්නා ලද්දෙහිය. පුනං පුන ගෙහං න කාහසි යනු, යළිත් මේ සසරෙහි ආත්මභාව සංඛ්‍යාත ගෙය නොසාදන්නෙහිය. නොකරන්නේය යන අරුත්ය. සබ්බා තෙ ඵාසුකා භග්ගා යනු, ඔබගේ ඒ කෙලෙස් අර මවිසින් බිඳින ලදි. ගහකූටං විසංඛිතං යනු, මේ ආත්මභාව නමැති ගෘහයෙහි කැණිමඬල මවිසින් විසුරුවා හරිනලදි. විසංඛාරගතං චිත්තං යනු, මගේ සිත නිවනට එළැඹිණි. එය නිවනට පත්විය යන අරුත්ය. එහි

පටිච්චසමුප්පාදො යනු, කවරක් නිසා හටගත්තේ ද? ඔවුනොවුන් නිසා උපදින බැවින් පටිච්ච සමුප්පාදයයි කියනු ලැබේ. විනිශ්චය වශයෙන් මෙහි පටිච්ච යනු අහෙතුකවාද ප්‍රතික්ෂේප කිරීමයි. සම යනු විසමවාදයන් ප්‍රතිෂෙධයයි. උප්පාදො යනු, ස්පර්ශය දැක්වීමෙන් සත්ව භාවය ප්‍රතික්ෂේප කිරීමයි.

වෙනත් (විස්තර) ක්‍රමයක් ද වේ. පටිච්ච යන්නෙන් සමුදය සත්‍යය දක්වයි. සමුප්පාදො යන්නෙන් දුඃඛ සත්‍යය දක්වයි. තවත් ක්‍රමයක් ද වේ. පටිච්ච යනු, හෙතු දැක්වීමයි. සමුප්පාදො යනු, සඵශය දැක්වීමයි. තවද ක්‍රමයෙකි. එහි පටි යනු, පැවැත්මේ අරුත්හි උපසර්ගයකි. පටිච්ච යනු අපේක්ෂාර්ථයෙහි නිපාතයෙකි. ස යනු, එක්වීම් අරුත්හි උපසර්ගයකි. උප යනු පහළවීමෙහි අරුත් ඇති නිපාතයෙකි. පාද යනු, ධාතු නිෂ්පත්තියෙහි යෙදෙන්නකි. ඇල්ම අනපේක්ෂිතව එක්වීම් වශයෙන් හටගැන්ම නිපැයීම නමැති සංස්කාර නොවේයයි පටිච්ච සමුප්පාදයයි කියනු ලැබේ. මෙසේ පස්වැදෑරුම් නිරුක්තීන්ගෙන් උපසර්ග, නිපාත, ධාතු, සමවාය, සංයෝග ආදි නිරුත්ති පටිසම්භිදාවන්හි මුදුන් පත්වූ භාග්‍යවතුන් වහන්සේ පටිච්ච සමුප්පාද යන්නෙන් (ඉහතකී අහෙතුවාද විසමවාද ආදිය) වළක්වාලන සේක. එහි අවිද්‍යාදි ධර්ම පටිච්චසමුප්පාදයි දත යුතුයි. භාග්‍යවතුන් වහන්සේ විසින් මෙය පවසන ලද්දේමය.

"මහණෙනි, ඔබලාට ප්‍රතීත්‍යසමුත්පාදය දෙසන්නෙමි. මහණෙනි, ඒ ප්‍රතීත්‍යසමුත්පාදය කවරේ ද? අවිද්‍යාව ප්‍රත්‍ය කොට සංස්කාර වෙයි. සංස්කාර ප්‍රත්‍යයෙන් විඤ්ඤාණය වෙයි. විඥාන ප්‍රත්‍යයෙන් නාමරූප වෙයි. නාමරූප ප්‍රත්‍යයෙන් ෂඩායතන වෙයි. ෂඩායතන ප්‍රත්‍යයෙන් ස්පර්ශය වෙයි. ස්පර්ශ ප්‍රත්‍යයෙන් වෙදනාව වෙයි. වෙදනා ප්‍රත්‍යයෙනේ තෘෂ්ණාව වෙයි. තෘෂ්ණා ප්‍රත්‍යයෙන් උපාදානය වෙයි. උපාදාන ප්‍රත්‍යයෙන් භවය වෙයි. භව ප්‍රත්‍යයෙන් ජාතිය (උපත) වෙයි. ජාතිය ප්‍රත්‍ය කොටගෙන ජරා මරණ ශොක පරිදෙව දුක්ඛ දොමනස්ස උපායාසයෝ හටගනිති. මෙසේ හුදු දුඃඛ සමූහයාගේ හටගැනීම වෙයි. මහණෙනි, මෙය පටිච්චසමුප්පාදයයි කියනු ලැබේ.

ඉදින් ඒ ධර්මයෝ අන්‍යෝන්‍ය ප්‍රත්‍යය වීමෙන් සියල්ලෝ බලවත් වෙත් නම් භාග්‍යවතුන් වහන්සේ කුමන කරුණකින් අවිද්‍යාව පළමු කොට කියන ලද්දේ ද? අවිද්‍යාව අවබෝධ කිරීම් වටහා ගැනීම් වශයෙන් ප්‍රධාන වන බැවින් අවිද්‍යාව පළමුව කියන ලදි. අනතුරුව සංසාර ගති ගමනට ප්‍රධාන වූ සංස්කාරයෝයි. ප්‍රතිසන්ධියට ප්‍රධාන වූ විඤ්ඤාණයයි. ආත්මභාවය ඇති කිරීමට ප්‍රධාන නාමරූපයි. එක් රැස් වීම ප්‍රධාන වූ ෂඩායතනයි. රැස් වීමට එක්වීමට ප්‍රධානවූ ස්පර්ශයයි. භවය ගෙන දීමෙහි ප්‍රධාන වේදනාවයි. භව ආස්වාදය ගැනීම ප්‍රධාන වූ තෘෂ්ණාව යි. භවය දැඩි කොට ගැනීම ප්‍රධාන වූ උපාදානයයි. හටගැනීම ප්‍රධානවූ භවයයි. භවය හට ගැනීම ප්‍රධාන වූ උපතයි. දුකට මුල් වීමට ප්‍රධාන වූ ජරාමරණ සොකපරිදේව දුක්ඛ දොමනස්ස උපායාසයෝයි. ඔවුනතුරින් යමක් නොදැනීම වේද එය අවිද්‍යාව නමි. කවර අරුතකින් අවිද්‍යාව නම් වේද? එහි ප්‍රඥාව නැතැයි අවිද්‍යායි. ඒ අවිද්‍යාව කුමක්ද? දුකෙහි නොදැනීම, දුක හට ගැනීම නොදැනීම, දුක නැති වීම නොදැනීම, දුක නැති කරන පිළිවෙත නොදැනීම, පූර්වාන්තය නොදැනීම, අපරාන්තය නොදැනීම, පූර්වාන්ත අපරාන්තයන් නොදැනීම, ප්‍රත්‍යයන් ඇසුරු කොට හටගන්නා ධර්මයන් නොදැනීම යන යම් මෙබඳු වූ, නොදැනීමක් නොදැකීමක් නොවැටහීමක් වැළකීමක් අනවබෝධයක් අකුශල මූල වූ මෝහයක් වේද මෙය අවිද්‍යාවයි කියනු ලැබේ.

ඒ අවිද්‍යාව නම් සියලු ප්‍රත්‍යය ධර්මයන්ට මුල් වූයේ යි. ප්‍රධාන වූයේ යි. රජෙකු වූයේයි. යම් සේ රජ තෙමේ ආරක්ෂිත අමාත්‍ය පිරිවර සහිත සේනාව ගෙන රාජ්‍යය කරන්නේ ද එසේ මේ අවිද්‍යාව ද රජෙකි. සංස්කාර නමැති සේනාවෙන් රක්නා ලද්දේයි. විඤ්ඤාණ නමැති අමාත්‍යවරයා ඇත්තේයි. නාමරූප සළායතන මාලිගයයි. ස්පර්ශය පඤ්චකාම ගුණයයි. වේදනාව මිත්‍රයායි. මිත්‍රයා කෙරෙහි ඇල්ම තෘෂ්ණාවයි. විහිංසාව උපාදානයයි. විවිධ දඬුවම් යළි යළිත් දීම භවයි. ඓශ්වර්ය සම්පත්තිය ජාතියයි. ජරාමරණ දෙපාර්ශ්වය විපත්තියයි. යම් හෙයකින් අවිද්‍යාව ප්‍රත්‍යය ධර්මයන්ට මුල් වූයේ ද

එහෙයින් මේ සූත්‍රයෙහි අවිද්‍යාව පෙරටුව කියන ලදි. මෙසේ අවිද්‍යාව ආදි කොට ජරාමරණ අවසානය දක්වා ප්‍රතීත්‍ය සමුත්පාදය දේශනා කළ සේක. ජරාමරණාදිය ප්‍රතීත්‍ය සමුත්තපන්න ධර්මයෝයි දත යුතුය.

භාග්‍යවතුන් වහන්සේ විස්තර කියන ලද්දේමය. "මහණෙනි, ප්‍රතීත්‍ය සමුත්පන්න ධර්මයෝකවරහු ද? මහණෙනි, ජරාමරණය, අනිත්‍යය. සංස්කෘතය, ප්‍රතීත්‍යසමුත්පන්නය, ගෙවීම, වැයවීම නැතිවීම ස්වභාවය කොට ඇත්තේය. මහණෙනි, ජාතිය අනිත්‍යය - පෙ - මහණෙනි, භවය අනිත්‍යය. උපාදානය අනිත්‍යය. තෘෂ්ණාව අනිත්‍යය. වේදනාව අනිත්‍යය. ස්පර්ශය අනිත්‍යය. ෂඩායතනය අනිත්‍යය. නාමරූප අනිත්‍යය. සංස්කාර අනිත්‍යය. අවිද්‍යාව අනිත්‍යය. සංස්කෘතය ප්‍රතීත්‍යසමුත්පන්නය. ගෙවීම විනාශවීම විරාගය හා නිරෝධය ස්වභාව කොට ඇත්තේය. මහණෙනි, මේවා ප්‍රතීත්‍යසමුත්පන්න ධර්මයයි කියනු ලැබේ.

පටිච්චසමුප්පන්නධම්මා යනු, ඒ ඒ ප්‍රත්‍යයන්ගෙන් හටගත් ධර්මයෝයි. මෙය සැකෙවින් අරුතයි. පටිච්චසමුප්පාද යන්නෙන් ප්‍රත්‍යය ධර්මයෝ දත යුත්තාහ. භාග්‍යවතුන් වහන්සේ විසින් ප්‍රතීත්‍යසමුත්පාද - සමුත්පන්න දේශනාව සූත්‍රයෙහි කියන ලදි. මහණෙනි, ප්‍රතීත්‍යසමුත්පාදය කවරේ ද? මහණෙනි, ජාති ප්‍රත්‍යයෙන් ජරාමරණ වෙයි. භව ප්‍රත්‍යයෙන් ජාතියයි. උපාදාන ප්‍රත්‍යයෙන් භවයයි. තෘෂ්ණා ප්‍රත්‍යයෙන් උපාදානයයි. වෙදනා ප්‍රත්‍යයෙන් තෘෂ්ණාවයි. ස්පර්ශප්‍රත්‍යයෙන් වේදනාවයි. ෂඩායතන ප්‍රත්‍යයෙන් ස්පර්ශයයි. නාමරූප ප්‍රත්‍යයෙන් ෂඩායතනයි. විඥාන ප්‍රත්‍යයෙන් ෂඩායතනයි. සංස්කාර ප්‍රත්‍යයෙන් විඥානයයි. අවිද්‍යා ප්‍රත්‍යයෙන් සංස්කාරයෝයි. තථාගතවරුන් පහළව සිටියදී හෝ නොපහළව සිටියදී මේ ධර්මයන්ගේ ස්වභාවය වූ ධර්මනියාමතාව වූ ප්‍රතීත්‍ය-සමුත්පාදය පවතීමය. තථාගතවරු එය අවබෝධ කරති. වටහා ගනිති. අවබෝධකර වටහාගෙන කියති. දෙසති, පැහැදිලි කරති. විවරණය කොට දක්වති.

තවද මෙහි නියාමතාව, බීජනියාම, කම්මනියාම, චිත්ත නියාම, උතුනියාම, ධම්මනියාම වශයෙන් පස් ආකාර වෙයි. එහි බීජනියාමය යනු කුමක් ද? මෑ පඳුර උතුරු දෙසට පිහිටීම් වශයෙන් ද කළුවැල කැරකී යාම් වශයෙන් ද පොල්ගසේ පට්ටය තද බවට පැමිණ වීම් වශයෙන් ද හිරු දෙසට නැමෙන මල් හිරු අනුගමනය කිරීම් වශයෙන් ද මුං මෑ කොළ හිරු දෙසට උස්ව යාම් වශයෙන් ද පැවැත්ම බීජ නියාමය නම්. කම් නියාමය නම් කුමක් ද? සහජ අන්ධභාවය ඇති කිරීම මිනිසුන්ගේ පැහැපත්බව, කැත බව, කුදු බව, මිටි බව ආදිය ඇති කිරීම යන මෙය කම්නියාමයයි. චිත්තනියාමය කවරේ ද? දුරයාම, තනිව හැසිරීම, සිරුරක් නැති බව ගුහාවක් ඇසුරු කොට ඇති බව යන මේවා චිත්ත නියාමය නම්. උතු නියාමය කවරේ ද? ශීත කාලයෙහි ශීත, උෂ්ණ කාලයෙහි උෂ්ණය, යන මේවා උතු නියාමයයි. ධම් නියාමය කවරේ ද? තථාගතවරුන් ඇති විට හෝ නැති විට ඉදප්පච්චයතා පටිච්චසමුප්පාදයේ පැවැත්මයි. එහෙයින්,

පොළව සයුර සමග විනාශ විය. එසේම සෙසු රජවරු ද වැනසෙති. අහස පමණක් පවතියි කියන ලදි.

ලොව සම්බුදුවරුන් පහළව සිටියදී හෝ පිරිනිවන් පෑ කල්හි හෝ ප්‍රත්‍යයෝ පවතිති. මෙයින් සාරාසංඛ්‍ය කල්ප ලක්ෂයකට මත්තෙහි තණ්හඞ්කර නම් සම්බුදුන් වහන්සේ ලොව පහළව ප්‍රත්‍යයාකාරය අවබෝධ කොට බුදු කිස නිමවා පිරිනිවන් පෑ සේක. උන්වහන්සේ පිරිනිවන් පෑ විට ප්‍රත්‍යයෝ නොනැසුණහ. සරණඞ්කර සම්බුදුන් වහන්සේ ද ප්‍රත්‍යයාකාරය අවබෝධ කොට පිරිනිවන් පෑ සේක. එසේම දීපඞ්කර, කොණ්ඩඤ්ඤ, සුමඞ්ගල, සුමන, රෙවත, සොභිත, අනොමදස්සි, පදුම, නාරද, පදුමුත්තර, සුමේධ, සුජාත, පියදස්සි, අත්‍ථදස්සි, ධම්මදස්සි, සිද්ධත්ථ, තිස්ස, ඵුස්ස, විපස්සි, සිඛී, වෙස්සභූ, කකුසන්ධ, කොනාගමන, කාශ්‍යප හා අපගේ ගෞතම යන සම්බුදුන් වහන්සේලා බුදුව ප්‍රත්‍යයාකාරය අවබෝධ කොට පිරිනිවියහ. එහෙත් ප්‍රත්‍යය ධම්යෝ නොනැසී පවතිති.

මෙසේ අතීත බුදුවරුන් පිරිනිවන් පෑ කල්හි ද ප්‍රත්‍යයන් නොනැසුණු බැවින් අනාගතයෙහි පහළවන බුදුවරු ද ප්‍රත්‍යයාකාරය අවබෝධ කරන්නාහුමය.

එය අරහයා ධම්රාජ වූ භාග්‍යවතුන් වහන්සේ නොයෙක් භවයන්හි පුරුදු පුහුණු කරන ලද සුචරිතානුභාවයෙන් පැන නැඟුණු උතුම් ධම්සනයෙහි වැඩ හුන් සේක. මහණෙනි, අවිද්‍යා හේතුවෙන් සංස්කාරයෝ වෙතැයි යනාදියෙන් අවිද්‍යාවෙහි සිට මරණය කෙළවර කොට ප්‍රත්‍යධම්යන් දෙසා මෙසේ මහණෙනි, එසේම පැවතීමක් නොවෙනස්වීමක් වේද එය ප්‍රතීත්‍යසමුත්පාදයයි දෙසූ සේක. මෙසේ ප්‍රතීත්‍යසමුත්පාදය දෙසන ලද භාග්‍යවතුන් වහන්සේ විසින් වෙනස් නොවී පැවතීම් (තථතා) ආදියෙන් ද ප්‍රත්‍යය ධම්යෝම ප්‍රතීත්‍යසමුත්පාදයයි කියන ලදි. ජරාමරණාදි ධම්යන්ගේ ප්‍රත්‍යය ලක්ෂණය වූ මේ ප්‍රතීත්‍යසමුත්පාදය දුක අඛණ්ඩව විදීම රසය කොට ඇත. අවිද්‍යා ආදි ඒ ඒ ප්‍රත්‍යයන්ගෙන් ඒ ඒ ධම්ය හටගන්නා බැවින් ප්‍රතීත්‍ය සමුත්පාදයයි කියනු ලැබේ. මෙහි පටිච්ච සමුපපාදය දෙපරිද්දෙකින් සිදුවෙයි. යම් හෙයකින් එය වටහාගනු ලබන්නේ සුවය සඳහා පවතී ද එහෙයින් එය වටහාගැනීමට සුදුසු වෙයි. ප්‍රතිවේධය හෙවත් වටහාගැනීම ඇති වීමත් සමඟම දහසක් ධම්යෝ උපදිත්. එය තනි හේතුවෙන් හෝ අහෙතුවෙන් ද නොවේ. සමුප්පාදයම පටිච්ච නමි. එය සමුප්පාදයයි. තවද සමඟ එක්ව උපදීනුයි ද සමුප්පාද නමි. ප්‍රත්‍යයන්ගේ එක්වීම නිසා ප්‍රත්‍යයන්ගෙන් තොරව හටගැනීමක් නොවැටහෙයි. එයට හේතු සමූහයකි. යම් සේ ලෝකයෙහි සෙමට හේතුවන ගුළිය සෙම්හගුළයි කියනු ලැබේද, එසේම සසුනෙහි සුවයට ප්‍රත්‍යය වීමෙන් බුදුවරුන්ගේ උපත සුඛො බුද්ධානං කියයි ද එහෙයින් පටිච්චසමුප්පාදයයි කියනු ලැබේ.

එසේම මේ පටිච්චසමුප්පාදය මෙහි ඵල ව්‍යවහාරයෙන් බුද්ධයයි දත යුතුය. නැතහොත් වෙන් වෙන්වූ සුවයෙන් මිදුණේයයි හේතුව කියන ලදි. ඒ මේ ප්‍රතීත්‍ය සමුත්පාදය සංස්කාරාදීන්ට අවිද්‍යාදි හේතු ඇති කරන බැවින් එක් එක් ශීර්ෂයෙන් නිර්දේශ කරන ලදි.

ඒ හේතු සමූහය සාධාරණ ඵල ඉපදවීම් අරුතින් ද නොවෙනස්ව පැවතීමේ අරුතින් ද ඒවායින් යුක්ත වූවන්ගේ අන්‍යොන්‍ය තනි තනි සුවයන් ඉක්මිණැයි ද වශයෙන් ගෙන පටිච්චයි කියනු ලැබේ.

මෙසේ භාග්‍යවතුන් වහන්සේ විසින් ප්‍රතීත්‍ය සමුත්පාදය ඉදිරිපත් කිරීමෙන් ශාස්වතාදී දෘෂ්ටීන්ගේ හා උච්ඡේද ආදී දෘෂ්ටීන්ගේ අභාවය ප්‍රකාශ කරන ලදි. මේ දෙකින්ම ඥානයෝනිය දක්වන ලද්දේය. මේ පටිච්චසමුප්පාදය යනු මාර්ග යන අර්ථ ඇත්තේ ද වෙයි. එම මාර්ගයට ගැනීමේදී ආචාර්ය මතයෙන් දොස් නොනැගෙන පරිදි ස්වකීය ධර්මමාර්ග නොයික්මවමින් විනයට අනුලොම්ව මහාපදේශයන්ට අනුකූලව ධර්මය ප්‍රකට කරමින් අර්ථය ගෙන එය අර්ථවත් කළ යුතුය. ප්‍රකෘතියෙන්ම භවයේ ප්‍රතීත්‍යසමුත්පාද න්‍යායය පිළිබඳ අර්ථවර්ණනාව දුෂ්කරය.

> "සත්‍යය, සත්වයා ප්‍රතිසන්ධිය හා ප්‍රත්‍යයාකාරය හෙවත් පටිච්චසමුප්පාදය යන මේ කරුණු සතර වටහා ගැනීම දුෂ්කරය. දේශනා කිරීම ද බෙහෙවින් දුෂ්කරය."

එබැවින් ආර්‍යමාර්ගාධිගමයන්ට පත්වූවන් හැර අන් අයට ප්‍රතීත්‍ය සමුත්පාදයේ අර්ථවර්ණනාව දුෂ්කරය. මම ප්‍රත්‍යයාකාර වර්ණනාව තුලනය කරමින් කියනු කැමැත්තේ දෙශනානයින් යුක්තවූ ආචාර්ය මාර්ගයට බැස ගනිමින් එහි විස්තර වර්ණනාව අරඹමි. සමාහිත සිතින් එය මනාව අසවු. පූර්වාචාර්යවරුන් විසින් මෙය කියන ලදි.

> යමෙක් මෙය මනා කොට අසන්නේ ද හෙතෙම පූර්වාචාර්‍ය වරුන් විසින් ලද අධිගම විශේෂයන් ලබන්නේය. එම පූර්වාචාර්‍යයන් ලද අධිගම විශේෂයක් ලබා මාරයාගේ නොදැක්මට පත්වන්නේය.

යම් කිසි පුද්ගලයෙක් මේ ප්‍රතීත්‍යසමුත්පාද ධර්මය මෙහි අර්ථය මෙයයි සිත්හි තබා ඒකාන්තයෙන්ම මේ ප්‍රතිපදාවෙන් ජාති ජරා ව්‍යාධි මරණ ශෝක පරිදේව දුක්ඛ දොමනස්සයන්ගෙන් මිදෙන්නේ යයි මැනවින් අසන්නේ ද පූර්වාචාර්ය විශේෂ සංඛ්‍යාත වූ මාර්ග

ඵලයත් ලබන්නේය. එය ලබා මාරරාජයාගේ නොදැක්මට යන්නේය. ගොධිකතිස්ස තෙරුන් මෙනි.

ඒ තෙරුන් වහන්සේ මාරයා විසින් වළහන ලද සිතැත්තේ අනුසය රෝගයකින් පෙළුණේ සයවරක් උත්සාහ කොට ද ධ්‍යානයෙන් පිරිහීමට පත්වූහ. පිරිහුණු ධ්‍යාන ඇති මගේ භවගමන අනියතයැයි සිතූ උන්වහන්සේ දැන්ම අවියක් ගෙන දිවි නසාගන්-නෙමැයි සිතා කෙස් බාන අවිය ගෙන ගලනාලය සිඳ ගැනීමට ඇඳෙහි වැදහොත්හ. පෙර සේම අනුසය රෝගය උපන් කල්හි අවිය අතට ගත්හ. එකෙණෙහිම උන්වහන්සේ රහත් බවට පත්ව පිරිනිවන් පෑහ.

ඉක්බිති මාරයා උන්වහන්සේගේ ප්‍රතිසන්ධි විඥානය කොහි පිහිටියේදැයි සිතා දුම් ගොඩක් මෙන් ද අඳුරු පිඬක් මෙන් ද වී සියලු දිශාවන්හි තෙරුන්වහන්සේගේ විඥානය විමසා බලන්නේ විඥානය පිහිටි තැන සොයා ගැනීමට නොහැකිව තරුණයකුගේ වෙසක් ගෙන බෙලුවපණ්ඩු විණාව ද රැගෙන බුදුන්වහන්සේ වෙතට එළඹ මෙසේ විමසීය.

> මම උඩ ද යට ද හරහ ද දිසා අනුදිසාවන්හිද සොයන්නේ තෙරුන්ගේ විඥානය නොදකිමි. ගොධික තෙරණුවෝ කොහි ගියාහු ද?
>
> බුදුරජාණන් වහන්සේ ඔහුට මෙසේ කී සේක.
>
> යමෙක් ධෛර්‍යවත් වූයේ ශීලයෙන් යුක්ත වූයේ ධ්‍යාන වඩන්නේ ධ්‍යානයෙහි ඇලුණේ වේද හෙතෙම ජීවිතය අපේක්ෂා නොකරන්නේ රහත් බවට පැමිණෙන්නේය.
>
> ගොධික තෙමේ මාරසේනාව සිඳ යළි උපතකට නොපැමිණ මුල් සහිත තෘෂ්ණාව සිඳ පිරිනිවනට පත්වූයේය.
>
> ශෝකයෙන් මැඩුණු මාරයාගේ වීණාව කිහිල්ලෙන් වැටිණි. ඉක්බිති නොසතුටට පත් ඒ යක්ෂයා එහිම අතුරුදහන් වූයේ ය.

මෙසේ පූර්වාචාර්‍ය විශේෂ සංඛ්‍යාත මාර්ගාධිගමයකට පැමිණ මාරයාගේ නොදැක්මට යන්නේය. මෙසේ ඇති කල්හි ප්‍රතීත්‍ය සමුත්පාද ධර්මය අසවු. මනාව මෙනෙහි කරවු. කියන්නෙමි. නුවණින් මෙනෙහි කිරීමෙන් තොරව ප්‍රතීත්‍ය සමුත්පාද ධර්මය අවබෝධ කිරීමට නොහැක. එය ගැඹුරුවූයේ මෙන්ම ගැඹුරු ලෙස පෙනෙන්නේ ද වේ. මෙය ගැඹුරුය. ගැඹුරු ලෙස පෙනේයයි බුදුරජාණන් වහන්සේ විසින් පවසන ලදි. කුණු වී කලු පැහැ ගැන්වුණු කොළ ඇති පැරණි දියක් මෙනි. එය දණ පමණට වූවත් පුරුෂයන් සත්දෙනකුගේ උස පමණ මෙන් හැගෙයි. එසේම ප්‍රතීත්‍ය සමුත්පාදය නො ගැඹුරු සේ වැටහෙයි. මැණික් ගඟක පැහැදුණු දිය මෙනි. එහි මිනිසුන් සත්දෙනකුගේ උස ඇතිවත් දණ පමණට ලෙස ගැඹුර පෙනෙයි.

ප්‍රතීත්‍යසමුත්පාදය සිවු ආකාරයකින් ගැඹුරුය. ගැඹුරු ලෙස වැටහෙන්නේය. කවර සතර ආකාරයකින් ද යත්? අර්ථයෙන් ගැඹුරු බැවින් ගැඹුරුය. ධර්මයෙන් ගැඹුරු බැවින් ගැඹුරුය. දේශනාවෙන් ගැඹුරු බැවින් ද ගැඹුරුය. අවබෝධයෙන් ගැඹුරු බැවින් ද ගැඹුරුය. මේ ආකාර සතරින් ප්‍රතීත්‍යසමුත්පාදය ගැඹුරු වූයේ ද ගැඹුරු ලෙස වැටහෙන්නේ ද වෙයි. කෙසේ නම් අර්ථයේ ගැඹුරු බැවින් ගැඹුරු වේ ද? ඒ ජරාමරණයන්ට ජාතිය ප්‍රත්‍යය වීමෙන් ද ජාතියට භවය, භවයට උපාදානය, උපාදානයට තෘෂ්ණාව, තෘෂ්ණාවට වේදනාව, වේදනාවට ස්පර්ශය, ස්පර්ශයට ෂඩායතන, ෂඩායතනයන්ට නාමරූප, නාමරූපයන්ට අවිද්‍යාව ප්‍රත්‍යය වීම නිසා හටගැනීම් අර්ථයෙන් ගැඹුරුය. ධර්මගම්භීරතාව කෙසේ ද? අවිද්‍යාව සංස්කාර-යන්ට ප්‍රත්‍යය වීමෙන් ගැඹුරුය. සංස්කාරයන්ට විඥානය ප්‍රත්‍යය වීමෙන් ගැඹුරුය. මේ ආදී වශයෙනි. දේශනා වශයෙන් ගැඹුරු වන්නේ කෙසේ ද? ඒ සූත්‍රයෙහි පටිච්ච සමුප්පාදය අනුලෝම වශයෙන් දෙසනු ලැබේ. කිසි තැනක ප්‍රතිලෝම වශයෙන් ද තවත් කිසි තැනක අනුලෝම ප්‍රතිලෝම වශයෙන් ද කියන්නෙමැයි සිතා භාග්‍යවතුන් වහන්සේ බුද්ධවිෂයක වූ ප්‍රත්‍යයාකාරයෙහි සිංහනාද කරමින් ආයුෂ්මත් අනඳ තෙරුන්ට මෙසේ වදාළ සේක. ආනන්ද

එසේ නොවේ. ආනන්ද එසේ නොවේ. ආනන්ද ප්‍රතීත්‍යසමුත්පාදය ගැඹුරුය. ගැඹුරුසේ වැටහෙන්නේ ද වේ. මහාප්‍රාඥයාට ස්වකීය ප්‍රකට වූ ඥානයෙන් ගැඹුරුවූ ද ප්‍රතීත්‍යසමුත්පාදය බෙහෙවින් පැහැදිලි වූවක් ලෙස හැඟෙයි. අන් අයට එය පැහැදිලියයි නොසැලකිය යුතුය. ඔවුනට එය ගැඹුරුමය. ගැඹුරු ලෙස වැටහේමය. මෙසේ භාග්‍යවතුන් වහන්සේ තෙරුන් ප්‍රතීත්‍යසමුත්පාදය කෙරෙහි උනන්දු කරවා මෙසේ ද කී සේක. මට එය බෙහෙවින් පැහැදිලි වූවක් ලෙස හැඟෙතැයි නොකියව. ඉදින් ඔබට එය පැහැදිලිව වැටහේ ද එබැවින්ම නුඹ තමන්ගේ ස්වභාව වශයෙන් සෝවාන් වූයෙහිය. මවිසින් දෙන ලද දහම් තයෙහි පිහිටා සෝවාන් මගට පිළිපන්නෙහිය.

ආනන්දය, මේ නිවන ද ගැඹුරු වූ ප්‍රතීත්‍යසමුත්පාදය ද කෙසේ නම් පැහැදිලි වූයේ ද? කාමරාගාදි සතර කෙලෙසුන් මුලිනුපුටා සකෘදාගාමී මාර්ග ප්‍රත්‍යක්ෂ කරන්නෙහිය. අට කෙලෙසුන් මුලිනුපුටා අරහත් ඵලය ප්‍රත්‍යක්ෂ කරන්නෙහිය. මෙය ඔබට පැහැදිලි සේ වැටහේ නම් සැරියුත් මුගලන් දෙදෙනා කුමක් හෙයින් එකාසංඛ්‍ය කල්ප ලක්ෂයක් ශ්‍රාවකපාරමී ඥානය සම්පූර්ණ කළාහු ද? කල්ප ලක්ෂයක් අධික කොට ඇති අසංඛ්‍ය දෙකක් ප්‍රත්‍යෙකබුද්ධ ඥානය සඳහා පාරමිතා සම්පූර්ණ කළ යුතු වන්නේ ද? කල්ප ලක්ෂයක් අධික කොට ඇති අසංඛ්‍ය සතරක් හෝ අටක් හෝ දහසයක් සම්මා සම්බුද්ධත්වය සඳහා පාරමිතා පූරණය කළ යුතු වන්නේ ද? ප්‍රතීත්‍ය සමුත්පාදයෙහි ඇති ගැඹුරු බව නිසාමය. එය පැහැදිලි ලෙස වැටහේ නම් මේ විශේෂාධිගමයන්ගෙන් ඇති ප්‍රතිඵලය කුමක් ද? ප්‍රදේශඥානයෙහි පිහිටි ඔබ වැනි ශ්‍රාවකයෙක් ඉතා ගැඹුරු වූ ප්‍රතීත්‍ය සමුත්පාදය ඉතා පැහැදිලි ලෙස හැඟේයයි කියන්නේය. ඔහුගේ මේ වචනය බුද්ධවචනය සමඟ ප්‍රතිවිරුද්ධ වෙයි.

ආනන්ද මේ ප්‍රතීත්‍යසමුත්පාදය අවබෝධ කළ මට ද සාරාසංඛ්‍ය කල්ප ලක්ෂයක් පාරමිතා පිරීමට සිදුවිය. ප්‍රත්‍යයාකාරය අවබෝධ කිරීම උදෙසා නොදුන් දානයක් නම් නැත. නොපිරූ

පාරමිතාවක් නම් නැත. අද ප්‍රතීත්‍යසමුත්පාදය අවබෝධ කරන්-නෙමැයි නිරුත්සාහයෙන් මෙන් මා මාරබලය මැඩලද්දී ද මේ මහපොළොව දැඟුලක් පමණකුදු නොසැළිණ. එසේම මැදුම් යමෙහි දිවැස පිරිසුදු කිරීමෙහිදී ද එසේ නොවීය. එහෙත් පැසුළුයම ඉතා අළුයමෙහි අවිද්‍යා සංස්කාරයන් නව ආකාරයකින් දුටු කෙණෙහිම දස දහසක් ලෝකධාතුව යකඩයකින් තළනු ලබන කංසතාලයක් මෙන් හඬ ලක්ෂයක් මුදමින් වාතයෙන් කැළඹුණු පියුම් පතක දිය බිඳු මෙන් නොයෙක් ආකාරයෙන් කම්පා වූයේය. ආනන්ද, ප්‍රතීත්‍යසමුත්පාදය මෙසේ ගැඹුරුය. ගැඹුරු ලෙස පෙනේමය. මේ ප්‍රතීත්‍යසමුත්පාද ධර්මය, නොදැනීමෙන් නොවැටහීමෙන් මේ ජනතාව අවුල් වූ නූල් පන්දුවක් මෙන් බබුස් තණ ගොඩක් මෙන් දුගති සංඛ්‍යාත සසරෙහි නොනැවතී ගමන් කරති.

මෙසේ මහානිදාන සූත්‍රයෙහිදී භාග්‍යවතුන් වහන්සේ ප්‍රතීත්‍ය-සමුත්පාදය ගැඹුරු බවත් ගැඹුරු සේ වැටහෙන බවත් ප්‍රකාශ කළ සේක. එහි අනනුබෝධය යනු ඥාන වශයෙන් නොවැටහීමයි. අප්පටිබොධො යනු, තීරණ, ප්‍රහාණ, පරිඥාන වශයෙන් අවබෝධ නො කිරීමයි. තන්තාකුලජාතා යනු, තන්තුවක් නූලක් මෙන් අවුල් වූයේයි. නූලක් අවුල්ව ගිය විට මෙය මූලය මෙය අගයයි සිතා ගැනීමට දුෂ්කර වෙයි. එසේම සත්වයෝ මෙම ප්‍රත්‍යයාකාරය නොදැනීමෙන් අවුල් වියවුල් වූවෝ වෙති. ප්‍රත්‍යයාකාරය සෘජු කොට ගැන්මට නොහැකි වෙති. දැඩි උත්සාහයක යෙදී ද එය සෘජු කොට ගැන්මට අසමත් වෙති. බෝධිසත්වයන් සම්‍යක් සම්බුද්ධ බෝධි-සත්වයන් හා ප්‍රත්‍යෙකබුද්ධ බෝධිසත්වයන් හැර අන්‍ය සත්වයෙක් තමන්ගේ හැකියාවෙන්ම මෙම ප්‍රතීත්‍යසමුත්පාදය සෘජු කොට ගැනීමට සමත් වන්නේ නම් නොවේ. ගුලාගුණඨිකජාතා යනුවෙන් සූත්‍රයෙහි දැක්වෙන්නේ කැඳ දමා සකසන ලදුව එකිනෙක ගැට-ගැසුණු නූල් පන්දුවක් හෝ අවුල් වියවුල් වූ කුරුළු කූඩුවකි. එසේ සත්වයෝ ද ප්‍රතීත්‍යසමුත්පාදයෙහි ප්‍රත්‍යයන්හි පැකිළෙමින් ප්‍රතීත්‍යසමුත්පාදය සෘජු කොට ගත නොහැකිව වටහා ගත

නොහැකිව දෙසැට මිසදිටු නමැති දැලෙහි පැටලී අවුල් වියවුල් වෙති. මුඤ්ජබබ්බජහූතා යනු, මුදුතණ හා බබුස් තණ මෙන් වුවාහුයි. මෙම තණ ද අවුල්ව ගිය විට අග්මුල් සොයා ගත නොහැකි වෙයි. එසේම සත්වයෝ ද තම උත්සාහයෙන් ප්‍රතීත්‍ය සමුත්පාදය නොදැන අවුල් වියවුල් වූවෝ වෙති. විවිධ මිථ්‍යාදෘෂ්ටි ගැනීම් වශයෙන් සසර දුකට වැටීම වළක්වා ගත නොහෙති. එම සූත්‍රයෙහි අපාය යනු නිරය, තිරච්ඡානයොනිය පෙත්තිවිසය, අසුරකාය යන සතර අපායයි. ඒ සියල්ලම වැඩීම හෙවත් අභිවෘද්ධි සංඛ්‍යාත ආය නොමැති බැවින් අපායයි. ඒවා දුකට ගති වන බැවින් දුග්ගති නම් වෙයි.

> ස්කන්ධ පිළිවෙළ මෙන්ම ධාතු ආයතනයන් නොසිඳී පැවැත්ම සංසාරයයි කියනු ලැබේ.

ඒ සියල්ල නොනැවතී පවතියි. මෙයින් චුත වූයේ යළි යළිත් පිළිසිඳ ගනිමින් ත්‍රිවිධ භවයන්හි සතර යෝනීන්හි පස්වැදෑරුම් ගතීන්හි සප්ත විඤ්ඤාන ස්ථිතීන්හි නව සත්වාවාසයන්හි මහසුමුදුරෙහි කැඩී විසුරුණු නැවක් මෙන් ද සෙක්කුවෙහි යෙදූ ගොනුන් මෙන් ද නොනැවතී භ්‍රමණය වන්නේමය. ඒ භාග්‍යවතුන් වහන්සේ බුද්ධත්වයට පත්ව සත් දිනක් බෝ පලඟෙහි වැඩහුන් සේක. අනිමිස ලෝචනයෙන් බෝධිය පුදමින් සත් දිනක් ද රුවන් පලඟෙහි සත් දිනක් ද රුවන් ගෙහි සත් දිනක් ද අජපාල නිග්‍රොධ මූලයෙහි සත් දිනක් ද මුචලින්ද මූලයෙහි සත් දිනක් ද ගෙවූ සේක. අටවැනි සතියෙහි යළි අජපාල නිග්‍රොධ මූලයෙහි විවේකයෙන් විසූ උන්-වහන්සේට සියලු බුදුවරුන්ට ආවේණික ධර්මතාවක් වූ "අධිගතො ඛො ම්‍යායං ධම්මො" යනාදි මේ සිතිවිල්ල පහළ විය. එහි අධිගතො යනු, අවබෝධ කරන ලදියි. ඛො යනු, නිපාත පදයෙකි. මෙ යනු මා විසින්. ධම්මො යනු මේ චතුරාර්ය සත්‍ය ධර්මයයි. ගම්භීරො යනු, පැහැදිලි ප්‍රකට බව ප්‍රතික්ෂේප කිරීමයි. බුද්ධවචනයක් වූ මෙය පොළව දරා සිටින දියකඳ මෙන් ගැඹුරුය. දැකීමට දුෂ්කර බැවින් දුරනුබෝධය. දුකසේ අවබෝධ කට යුතුයි. සුවසේ අවබෝධ කිරීමට නොහැකිය. සන්තො යනු, නිවුණේයි. පණීතො යනු, ප්‍රණීතය.

අතක්කාවචරෝ යනු, තර්කයෙන් වෙනස් කළ නොහැකිය. ප්‍රකට කළ නොහැකිය. ඥානයෙන්ම ප්‍රකට කළ යුතුය යන්නෙන් අතක්කාවචර නමි. නිපුණෝ යනු, සියුම් වූයේයි. පණ්ඩිතවෙදනීයෝ යනු, ධම්මානුධම් ප්‍රතිපත්තියෙහි පිහිටි පණ්ඩිතයන් විසින් දත යුතු ය. ආලයරාමා යනු මේ ලෝකයෙහි සත්වයෝ පඤ්චකාම ගුණයන්හි ඇලෙති. එකසියඅට වැදෑරුම් තෘෂ්ණාව හැසිරෙන නිවාසය ආලයයි කියනු ලැබේ. ඒ ආලයන්ගෙන් සතුටු වෙතැයි ආලයරාම නමි. යම්සේ මොනවට සැදුම් ලද මල් එල බඳුනක් ලැබීමෙන් සතුටු වේ ද එමෙන්ම මේ කාමාලය තෘෂ්ණාලයන්ගෙන් සත්වයෝ සතුටු වෙති. සංසාර වෘත්තයෙහි තුටු වෙමින් උකටලී නොවෙමින් වෙසෙත්, ඔවුන්ට භාග්‍යවතුන් වහන්සේ ඒ ආලය දෙකම උයන් බිමක් මෙන් දක්වන සේක් ආලයරාමා බො පනායං පජා යනාදිය පැවසූ සේක. යං ඉදං යනු, මේ ප්‍රතීත්‍යසමුත්පාදය සඳහා යම් මේ යන අර්ථය දැක්විය යුතුයි. ඉදප්පච්චයතා පටිච්චසමුප්පාදො යනු, මෙම හේතූන්ගේ ප්‍රත්‍යය වීම ඉදප්පච්චයතා නමි. ඉදප්පච්චයතා වූයේ ද පටිච්චසමුප්පාද වූයේ ද එයමය. ඉදප්පච්චයතා පටිච්ච-සමුපපාදො නමි. සංස්කාරාදීන්ට ප්‍රත්‍යය වන අවිද්‍යාදීන්ට පය්‍යාය වචනයෙකි. සඛ්ඛ සංඛාරසමථො යනු, නිවනමයි.

යම් හෙයකින් නිවනට පැමිණ සියලු සංස්කාරයෝ බිඳී යත් ද ව්‍යුපසමනයට යත් ද එහෙයින් සඛ්ඛසංඛාර සමථො යි කියනු ලැබේ. සබ්බූපධිපටිනිස්සග්ගෝ යනු, යම් හෙයකින් එම නිවනට පැමිණ සියලු උපධි විනාශයට යයි. සියලු තෘෂ්ණා නැසී යයි. සියලු කෙලෙස් රාගයෝ වැනසෙති. සියලු දුක් නිරුද්ධ වෙයි. එහෙයින් නිවන සබ්බූපධිපටිනිස්සග්ග යනු ද තණ්හාක්ඛය, විරාග නිරෝධ නිබ්බාන යනු ද කියනු ලැබේ. වාන යනු තෘෂ්ණාවයි. ඒ තෘෂ්ණාව භවයෙහි ප්‍රතිසන්ධි පෙළෙන් එකට මසා ලන්නේයි ගෙන වානයයි කියනු ලැබේ. ඒ වාන සංඛ්‍යාත තෘෂ්ණාවෙන් නික්මුණු තැන නිවනයි. සො මමස්ස කිලමථො යනු, නොදන්නවුන්ට දෙසීම නම් මට විඩාවකි. එය මෙසේ වෙහෙස සඳහා වේය යන අරුත්ය. මගේ

පෙරුම් පුරන කල්හි රාග ද්වේෂ සහිතව සිටියදීම පැමිණි යාචකයන්ට මනාව සරසන ලද හිස සිඳ ගෙලින් ලේ ගෙන හැර ඇස් උගුලා කුල වංශය බබුළුවන පුතා ද මගේ සිත අනුව හැසිරෙන ප්‍රිය බිරිඳ ද දෙන විට ද වෙනත් ක්ෂාන්තිවාදී වැනි ආත්මභාවයන්හි කැපුම් කෙටුම් ලබන විට ද ශරීර වෙහෙසක් නොවීය. නොදන්නාවූ අනුන්ට දෙසීම නම් වූ යමක් වේද එය මට වෙහෙසකි යනු මෙහි අදහසයි.

අපිස්සුදං යනු, නිපාතයෙකි. අනච්ඡරිය යනු, ආශ්චර්‍යවත් නොවූයේයි. පටිභංසු යනු, ප්‍රතිභාණ සංඛ්‍යාත ඥානයට ගොදුරු වූවාහුයි. කිච්ඡෝ යනු, දුක්ඛප්‍රතිපදාවයි. බුදුවරුන්ට මාඝී සතරක් සුබා පටිපදා නම්වෙයි. පාරමිතා සපුරන කල්හි හිස, හදවත, ඇස්, ලේ, අඟ, පසඟ, ජීවිත, අඹු දරුවන් වැනි අත්හැරීමට දුෂ්කර දේ අත්හරින විට ඒ දුක උසුලයි. එබඳු දුෂ්කර දෙයක් සිදු කරන්නා විසින් අවබෝධ කටයුතු ප්‍රතිපදාව සඳහා මෙය කියන ලදි. හලං යන මෙහි හ කාරය නිපාත මාත්‍රයෙකි. අලං (සුදුසුය) යන අරුත්ය. පකාසිතුං යනු පැවසීමටය. මෙසේ දුෂ්කර සේ අවබෝධ කළ ධර්මය දෙසීමට සුදුසු වෙයි. රාග දෝස පරෙතෙහි යනු, රාගදෝෂයන්ගෙන් ස්පර්ශ කරන ලද්දවුන් විසිනි. නායං ධම්මෝ සුසම්බුධෝ යනු, මේ ධර්මය ඔවුන් විසින් අවබෝධ නොකරන ලද්දේයි. පටිසොතගාමිං යනු, නිවීණාදීන්ට ප්‍රතිශ්‍රොත වූයේයි. අනිච්ච දුක්ඛ අනාත්ම අසුභ වශයෙන් එය චතුස්සත්‍ය ධර්මයයි. රාගරත්තා යනු, කාමරාග භවරාග දිට්ඨිරාගයෙන් රත් වූවාහුය. මැඩුණාහුය. න දක්ඛිං යනු, අනිත්‍ය දුක්ඛ අනාත්ම අශුභ වශයෙන් නොදකිත්. තමොක්ඛන්ධෙන ආවුතා යනු අවිද්‍යා අඳුරු මැඳ සිටින්නෝයි.

අපෙපාස්සුකතාය යනු, නිරුත්සාහීබවිනි. නොදෙසීමට කැමැත්තෙන් යන අරුත්ය. සහම්පතිස්ස යනු, හෙතෙම කාශ්‍යප බුදුරදුන්ගේ සසුනෙහි සාසක නම් තෙර වූයේ පළමු ධ්‍යානය උපදවා ප්‍රථමධ්‍යාන භූමියෙන් කල්පයක් ආයු ඇති බ්‍රහ්මයකු වී උපන්නේය. මෙතෙම මෙම සූත්‍රයෙහි සහම්පතී බ්‍රහ්මායි දන්නා ලැබේ. ඔහු සඳහා

බ්‍රහ්මාණෝ සහම්පතිස්ස යි කියන ලදි. අප්පරජක්ඛජාතිකා යනු, ප්‍රඥා නමැති ඇසෙන් රාග දෝස මෝහ රජස් අඩුව පවතින ස්වභාවය ඇත්තෝයි. පාතුරහොසි මගධෙසු පුබ්බෙ ධම්මෝ අසුද්ධෝ සමලෙහි චින්තිතෝ යනු, ස්වාමිනි, ලෝකනාථයන් වහන්ස, පෙර මගධයෙහි කෙලෙස් සහිත ෂට්ශාස්තෘන් විසින්-සිතන ලද අපිරිසුදු ධර්මයක් පහළ විය. ඔවුන් පළමුවම ඉපිද සියලු දඹදිව කෙලෙස් කටු අතුරන්නාක් මෙන් අපිරිසිදු වූ මිථ්‍යාවාදදෘෂ්ටි ධර්මයක් දෙසනලදි. අවාපුරෙතං අමතස්ස ද්වාරං යනු, අමෘත වූ නිර්වාණයට ද්වාරය වූ ආර්‍යමාර්ගය විවෘත කරනු මැනවි. සුණන්තු ධම්මං විමලෙනානු බුද්ධං යනු, ස්වාමිනි, මේ සත්වයෝ රාග දෝස මොහ යන කෙලෙස් සහිත වූවෝය. ඒ රාග දෝස මෝහයන් නැති බැවින් පිරිසිදු වූ සම්මාසම්බුදුන් වහන්සේ විසින් අවබෝධ කරන ලද්දා වූ චතුරාර්ය සත්‍ය ධර්මයයි.

සෙලෝ යථා පබ්බකමුද්ධනිට්ඨිතෝ යථාපි පස්සෙ ජනතං සමන්තාතෝ යනු, යම්සේ ශෛල පර්වත මුදුන්ක සිටි ඇස් ඇති මිනිසෙක් හාත්පස ජනතාව දක්නේ ද සොඳුරු සර්ව්ඥතාඥාන ඇති සමන්තචක්ඛු වූ ඔබ වහන්සේ ධර්ම්ප්‍රාසාදයට නැග තෙමේ ශෝක නොකරන්නේ ශෝකයෙන් යුක්තවූ ජාති ජරාවන්ගෙන් මැඩුණා වූ ජනතාව බලනු මැනවි. උට්ඨෙහි වීර විජිතසඞ්ගාම සත්ථවාහ අනණ චිචර ලොකෙ දෙසස්සු භගවා ධම්මං අඤ්ඤාතාරෝ භවිස්සන්ති යන්නෙහි උට්ඨෙහි යනු, ඒ භාග්‍යවතුන් වහන්සේට ධර්ම්දේශනාවෙහි හැසිරීම සඳහා අයදිමින් කියයි. වීර යනු, භාග්‍යවතුන් වහන්සේ වීර්යවත් බැවින් වීරය. දෙවපුත්ත මාර හා ක්ලෙශමාරයන් පැරදූ බැවින් විජිතසංගාම නමි. ජාති කාන්තාරාදියෙන් එතෙර වනු සඳහා වෙනෙය්‍ය ජනයන් මෙහෙයවීමට සමත් බැවින් සත්ථවාහ නමි. කාමච්ඡන්දයෙන් ගැනීම් නැති බැවින් අනණයයි දත යුතුය. අපාරුතා යනු, අරිනු ලබන්නා වූ මා විසිනි. අමතස්ස ද්වාරං යනු, ආර්ය-මාර්ගයයි. අමෘත සංඛ්‍යාත නිවනට දොර ම විසින් ඇර තබන ලදැයි දක්වයි. පමුඤ්චන්තු සද්ධං තමා ඇතුළු සියල්ලෝ මුදත්වා යන අරුත්ය. මම ද සතරකට බෙදා දක්වනලද මේ ප්‍රණීත වූ උතුම්

ධර්මය කායවාක් වෙහෙසකැයි යන හැඟීමෙන් නොදෙසීමි. දැන් පින්වත් ජනයිනි, ශ්‍රද්ධා භාජනය එළවන්න. ඔබලාගේ ප්‍රාර්ථනා පුරවන්නෙමි. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ කවරකුට නම් මේ ධර්මය දෙසන්නෙම්දැයි සිතා ආළාර උද්දක යන දෙදෙනා කලුරිය කළ බව දැන පස්වග තවුසන්ගේ බොහෝ උපාකර ගැන සලකා එකම දිනයකින් අටළොස් යොදුන් මග පයින්ම වැඩමවා ඉසිපතනයට සපැමිණියහ.

මෙහි ඉසිපතනං යනු, බුදුන් නූපන් කල්හි බුද්ධාන්තර කාලයෙහි පසේ බුදුවරු සත්දිනක් ගන්ධමාදන පර්වතයෙහි නිරෝධ සමවතින් වැඩසිට එයින් නැගිට නාගලතා නම් වූ දැහැටි දඬු වළඳා පාසිවුරු ගෙන අහසින් අවුත් එහි වැඩහිඳ සිවුරු පොරවා බරණැස පිඬු පිණිස හැසිර යන කල්හි ද එම පර්වතයේම අහසට නැග වඩිති. මෙසේ සෘෂීහු බැස එයින් නැග යන්නුයි ඉසිපතන නම්. නැතහොත් අතීතයෙහි සෘෂිවරුන් වූ සම්මාසම්බුදුවරු දම්සක් පැවැත්වීම සඳහා එහිම රැස් වෙතියි ඉසිපතනය නම්. මිගදායං යනු මුවන්ට ජීවිත දානය දීම් වශයෙන් ලද නම් ඇති රාජෝද්‍යානයයි. එහි පස්වග තවුසෝ දුරදීම එන්නා වූ තමන් සලකාගන්නට නොහැකි වූවාහු නැගිට පෙරගමන් ආදි පිළිසඳර කරත්.

භාග්‍යවතුන් වහන්සේ පනවන ලද අසුනෙහි වැඩ හුන්සේක් ඔවුනට බුද්ධ බලය දක්වා ඇසළ පුන් පොහෝ දිනයෙහි උතුරසල නැකත පවත්නා විට අන්තද්වය ත්‍රිපරිවෘත්ත ද්වාදසාකාර ඇති උතුම් වූ ධර්මචක්‍රය පැවැත්වූ සේක. කෙසේ නම් භාග්‍යවතුන් වහන්සේ අන්තද්වය පෙරළීම පැවැත්වූ සේක් ද? දෙව මෙ භික්ඛවෙ අන්තා පබ්බජිතෙන න සෙවිතබ්බාති පෙළෙහි කියනලද ආකාරයෙනි. කවර දෙකක් ද යත් කාමසුඛල්ලිකානුයෝගය හා අත්තකිලමථානුයෝගයයි. වස්තුකාමයන්හි බැඳීම් වශයෙන් කාම සුඛල්ලිකානු යෝගයයි. වස්තුකාම හා කිලෙසකාම යනුවෙන් දෙකකි. වස්තුකාමයෝ කවරහුදයත්? සිත් ගන්නාසුලු රූප ශබ්ද ගන්ධ රස ස්පර්ශ ඇතිරිලි පොරෝනා දැසිදස් එළබැටළු කුකුල් හූරු ඇත් අස් ගව කෙත්වත්

රන් රිදී රට ගම්නියම්ගම් දනවු රජදහන් කොටුගෙවල් වශයෙන් එන යම්කිසි සිත් බැඳගන්නා දේ වස්තුකාම නම්. අතීතකාම, අනාගත කාම, වර්තමානකාම, ආධ්‍යාත්මික කාම, බාහිර කාම, ආධ්‍යාත්මික බාහිර කාම, ලාමක කාම, මධ්‍යම කාම, ප්‍රණීතකාම, අපායගත කාම, නිරයගත කාම, මානුෂක කාම, දිව්‍යමය කාම, නිර්මාණය කරන ලද කාම, අනුන් විසින් නිර්මාණය කරන ලද කාම, නොරක්නා ලද කාම, තමන්ගේ කරගත් කාම, සියලු කාමාවචර ධර්ම රූපාවචර වූ තෘෂ්ණා වස්තුක වූ තෘෂ්ණාවට ආරම්මණ වූ කර්මය බවට පමුණුවන අර්ථයෙන් ඇලීම් ඇති කරන අර්ථයෙන් හා මත් කරවන අර්ථයෙන් ද කාම වූ සියල්ලයි. ඡන්දය කාමයෙකි. රාගය කාමයකි. ඡන්දරාගය කාමයකි. සංකල්පය කාමයකි. කාමයන්හි යම් වූ කාමඡන්දයක්, කාමරාගයක්, කාමනන්දියක්, කාම තෘෂ්ණාවක්, කාමස්නේහයක්, කාම පාසයක්, කාමදාහයක්, කාම මුළාවක්, කාම ගවේෂණයක්, කාම-යෝගයක්, කාමෝඝයක්, කාමුපාදානයක්, කාමච්ඡන්ද නීවරණයක් වේද මෙය කිලෙස කාමයයි. එහෙයින් භාග්‍යවතුන් වහන්සේ මෙසේ පැවසූ සේක.

> ඒකාන්තයෙන්ම හෙතෙම කැමති වෙයි. කාමය මුල් කොට සංකල්ප උපදියි. එය සංකල්පනය නොකරයි. මෙසේ කාමය ඇති නොවෙයි.

මේවා කිලෙස කාමයෝ යි කියනු ලැබෙති. මෙසේ මේ කාමසුඛයන්හි ඇලීම කාමසුඛල්ලිකා නම්. කාමසුඛයට ඇලීමෙහි නිරතවීම කාම සුඛල්ලිකානුයෝගයයි.

අත්තකිලමථානුයෝගය කුමක් ද? යම්කිසි ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් අචේලකයෙක් හෝ වෙයි. ආචාර රහිත හෝ වෙයි. අත ලෙව කන්නේ හෝ වෙයි. එන්නැයි කීවාම නොඑන සිටින්නැයි කීවාම නොසිටින පළමුව දුන් අහර නොපිළිගන්නා උදෙසා කළ අහර නොපිළිගන්නා නිමන්ත්‍රණ නොපිළිගන්නා හැළි කටින් ගෙන දුන් අහර, එළිපත අතර කොට දුන් අහර, දඬු අතර කොට දුන්

අහර, මොහොල අතර කොට දුන් අහර, වළඳන දෙදෙනෙකුගෙන් එකකු නැගී දුන් අහර, පුරුෂාන්තරයට ගිය ස්ත්‍රිය දුන් අහර, ගැබිණියක විසින් දුන් අහර, කිරිපොවන්නියක දුන් අහර, සමාදන් කොට පිදූ අහර, බල්ලන් සිටින තැන දුන් අහර, මැස්සන් සිටින තැන දුන් අහර නොපිළිගන්නේ වෙයි. මත්ස්‍ය මාංස නොපිළිගනී. රා නොබොයි. මෙර නොබොයි. කාඩි නොබොයි. පිණ්ඩපාතය ලබා එක ගේකින් නවතී. එක ආලෝපයකින් නවතී. ගෙවල් දෙකකින්, ආලෝප දෙකකින්, ගෙවල් සතකින්, ආලෝප සතකින්, නවතී. තැටියකින් දෙකකින් සතකින් යැපෙයි. දවසක් හැර දවසක් වළඳයි. දෙදවසක් හැර සත්දවසක් හැර අහර වළඳයි. මෙසේ මෙවැනි අඩ- මසක් හැර හෝ වළඳමින් විපර්යාස බත් බොජුනෙහි යෙදී වාසය කරයි. ඔහු සාමාක ධාන්‍ය කන්නෙක් හෝ වෙයි. තණ හෝ බුදින්නේ වේ. නීවාර ධාන්‍යයෙන් හෝ යැපෙන්නෙක් වේ.අමු බුදින්නේ හෝ වෙයි. පුනක්කු කන්නේ හෝ වෙයි. ගොම කන්නේ හෝ වෙයි. වන මුල් ඵලාහාරයෙන් යැපෙයි. පවත්තඵල හොජී හෝ වෙයි.

ඔහු හණ වැහැරි දරන්නේ වෙයි පටපිළි හෝ දරන්නේය. පාංශුකුල දරන්නේය. අඳුන්දිවිසම් හෝ දරන්නේය. කුස වැහැරි දරන්නේය. වැහැරි සිවුරු දරන්නේය. ඵල වැහැරි දරන්නේය. කේශ කම්බල දරන්නේය. ව්‍යාළ කම්බල දරන්නේය. බකමුහුණු පිහාටු දරන්නේය. කෙස් රැවුල් ලොම් ආදි මිශ්‍රණ ද දරන්නේය. තැගිටම සිටින්නේ හෝ වෙයි. ආසන ප්‍රතික්ෂේප කරයි. උක්කුටුකයෙන් හිඳියි. කටු ඇඳෙහි නිදයි. දවස තුන් වරක් දියෙහි ගිලීමෙහි යෙදීමෙන් වාසය කරයි. මෙසේ කය තැවීම හාත්පසින් තැවීමෙහි යෙදී වාසය කරයි. මෙසේ තමහට විඩා ගෙන දීම අත්තකිලමථයයි. අත්ත-කිලමථයෙහි යෙදීම අත්තකිලමථානුයෝගයයි. මෙසේ මේ කම් සැපයෙහි ද අත්තකිලමථයෙහි ද යෙදීම අනුයුඤ්ජනය සේවනය වැරදි ග්‍රහණය අත් නොහැරීමක් ඇත්ද මෙය කාමසුඛල්ලි-කානුයෝගයත් අත්තකිලමථානුයෝගයත් වේ.

න නිබ්බිදාය යනු, කෙලෙස් නිරුද්ධ කිරීම පිණිස කෙලෙස් සන්සිදුවීම පිණිස නොවෙයි යනුයි. සිව් සස් දහම් දැනීම පිණිස නොවෙයි. තෘෂ්ණාවන් නිවීම පිණිස නොවෙයි. අත්‍ථ යනු, පහත්ය. අනුපගම්ම, නොපැමිණෙයි. චක්ඛුකරණී යනු, මාර්ගදර්ශනය ඇති කරන. ඤාණකරණී යනු, මාර්ග අවබෝධ කරවන. උපසමාය යනු, සියලු කෙලෙස් සන්සිඳුවීම පිණිස. කතමා ච සා මජ්ඣිමා පටිපදා යනු, සම්‍යග් දෘෂ්ටි ආදියයි. ඒ සම්‍යග් දෘෂ්ටිය කුමක්ද? යම් ප්‍රඥාවක් ප්‍රජානන, විචය, සලක්ඛණ, පණ්ඩිච්ච, කොසල්ල, නේපුඤ්ඤ උපපරික්ඛා, භූරිමේධා, පරිනායිකා, විපස්සනා, සම්පජඤ්ඤ, පථ, පඤ්ඤා, පඤ්ඤින්ද්‍රිය, පඤ්ඤාබල පඤ්ඤාසත්ථ, පඤ්ඤාපාසාද. පඤ්ඤාආලෝක පඤ්ඤා ඕභාස, පඤ්ඤා පජ්ජෝත, පඤ්ඤාරතන, ආමොහ, ධම්මවිචය, යන නම්වලින් හඳුන්වනු ලැබේ ද මෙය සම්‍යග් දෘෂ්ටියයි. ඒ ප්‍රඥාවම සම්මා දිට්ඨියයි කියවේ.

සම්මා සංකප්පය කුමක් ද? නෙක්ඛම්ම සංකප්ප, අව්‍යාපාද, අවිහිංසා යයි සම්මාසංකප්ප තුනකි. මෙය සම්මාසංකප්පයයි කියනු ලැබේ. සම්මාවාචා කුමක් ද? මුසාවාදයෙන් වැළකීම, කේලමින් වැළකීම, පරුෂ වචනයෙන් වැළකීම, හිස් බසින් වැළකීමයි. මෙය සම්මාවාචායි කියනු ලැබේ. සම්මාකම්මන්තය කුමක් ද? ප්‍රාණඝාතයෙන් වෙන් වීම, සොරකමින් වෙන් වීම, කාමයන්හි වැරදි සහගත හැසිරීමෙන් වෙන් වීමයි. මෙය සම්මාකම්මන්තයයි කියනු ලැබේ. සම්මාආජීවය කුමක් ද? මෙහි ආර්‍යශ්‍රාවකයා මිථ්‍යා ආජීවය අතහැර ජීවිකාව කරයි. මෙය සම්මාආජීවය කියා කියැවේ. සම්මා වායාමය කුමක් ද? නූපන් කුසලධර්ම ඉපදවීමට කැමැත්ත උපදවයි. වෑයම් කරයි. වීර්‍ය්‍ය ආරඹයි. සිත දැඩි කොට ගනී. ප්‍රධන් වඩයි. උපන් කුසල ධර්ම බොහෝ බවට පරිපූරණයට විපුල කිරීමට කැමැති වෙයි. -පෙ- ප්‍රධන් වීර්‍ය්‍ය වඩයි. නූපන් අකුසල ධර්ම නොඉපදවීමට කැමැත්ත ඇති කරයි -පෙ- වීර්‍ය්‍යවඩයි. උපන් ලාමක අකුසල ධර්ම ප්‍රහාණය පිණිස කැමැත්ත උපදවයි. -පෙ- ප්‍රධන් වීර්‍ය්‍ය වඩයි. මේ සම්මා වායාමයයි කියනු ලැබේ. සම්මා සති කුමක් ද? සතර

තැනෙක්හි සිහියයි. කයෙහි සිහිය, වේදනාවෙහි සිහිය, සිතෙහි සිහිය, ධර්මයන්හි සිහිය. මේ සම්මාසතියයි. සම්මා සමාධිය කුමක් ද? ප්‍රථම ධ්‍යානය, ද්විතීයධ්‍යානය, තෘතීයධ්‍යානයයි, මේ සම්මා සමාධියයි. මේ ආර්‍ය අෂ්ටාංගික මාර්ගයම මධ්‍යම ප්‍රතිපදා නම්. චක්ඛුකරණී යනු, ප්‍රඥා චක්ෂුස ඇති කිරීමයි. ඤාණකරණී යනු මාර්ග ප්‍රතිවේධ ඤාණ දර්ශනය ඇති කිරීමයි. උපසමාය යනු, කෙලෙස් උපසමනය පිණිසයි. සිව් මඟ දැන ගැනීම පිණිසත් සිවුසස් අවබෝධ කිරීම සඳහාත් තෘෂ්ණාක්ෂය කිරීම සඳහාත් පවතී.

මේ අන්ත දෙක දුරලන සත්‍ය කෘත්‍ය කෘත වශයෙන් සතරක් වීම ද්වාදසාකාර නම් වේ. තවද මෙහි වීසතාකාර සොළසාකාර පංචදසාකාර ද්වාදසාකාර ද ඇත්තේය. විසි ආකාරය කෙසේද? දුක්ඛසත්‍යයෙහි ධර්ම දොළසකි. සමුදය සත්‍යයෙහි තුනකි. නිරෝධ සත්‍යයෙහි එකකි. මාර්ග සත්‍යයෙහි සතරකි. දුක්ඛ සත්‍යයෙහි දොළොස් දහම කුමක් ද? ජාති දුක, ජරාදුක, මරණ දුක, සෝක, පරිදේව, දුක්ඛ, දෝමනස්ස, උපායාස දුක, අප්‍රියන් සමඟ එක් වීම් දුක. ප්‍රියයන්ගෙන් වෙන් වීම් දුක. කැමැති දේ නොලැබීම් දුක. කෙටියෙන් රූප වේදනා සඤ්ඤා සංඛාර විඤ්ඤාණ යන පස්කඳ දුකකි. මේ දොළොස් දහම දුක්ඛ සත්‍යයෙහි ඇත්තේය. සමුදය සත්‍යයෙහි තුන් දහම කුමක් ද? කාම තණ්හාව, භව තණ්හාව, විභව තණ්හාව යන මේ ධර්ම තුන සමුදය සත්‍යයෙහි වේ. නිරෝධ සත්‍යයෙහි එකම ධර්මය කුමක් ද? ඒ තෘෂ්ණාවගේම නිරවශේෂ විරාගය, නිරෝධය, ත්‍යාගය, හැර දැමීම, මිදීම, අනාලය බවයි. මේ නිරෝධ සත්‍යයෙහි එක් දහමයි. මාර්ග සත්‍යයෙහි සතර දහම කුමක් ද? සෝවාන්, සකදාගාමී, අනාගාමී, අරහත් මාර්ගයි. මේ සතර මාර්ග සත්‍යයෙහි ධර්ම සතරයි. වීසතාකාරය මෙයයි.

සොළසා කාරය කෙසේ ද? දුක්ඛ සත්‍යයෙහි සතරකි. සමුදය නිරෝධ මාර්ග සත්‍යයන්හි ද එසේය. දුක්ඛ සත්‍යයෙහි සතර කුමක් ද? දුකෙහි පීඩනාර්ථය, සංඛතාර්ථය, සන්තාපාර්ථය, විපරිණාම අර්ථය යන සතර දුක්ඛ සත්‍යයෙහි වෙයි. ආයූහන අර්ථය නිදා-

නාර්ථය සංයෝගාර්ථය සහ පළිබෝධ අර්ථය සමුදය සත්‍යයෙහි වේ. නිස්සරණාර්ථය විවේකාර්ථය සංසට්ඨාර්ථය, අමෘතාර්ථය, යන සතර නිරොධ සත්‍යයෙහි ඇත්තේය. මාර්ගයෙහි නියාානාර්ථය හේතු අර්ථය, දර්ශනාර්ථය, අධිපති අර්ථය යන සතර මාර්ග සත්‍යයෙහි වෙයි. මේ සොළසාකාරයයි. විභාග, විනිච්ඡය, ලක්ෂණ, භේද, අත්ථුද්ධාර, අනූනකත්‍තාව, ක්‍රම, ජාති ආදීන්ගේ නිශ්චය ඤාණ කෘත්‍ය ඇතුළත් ප්‍රභේද, උපමාන, එකවිධ, සභාග, විසභාග වශයෙන් යන මෙය පසළොස් ආකාරය නම්.

ද්වාදශාකාරය කුමක් ද? පළමුව සඞ්ලක්ෂණ වශයෙන් එක් පදයකි. ද්විතීයාදිය අනිකට නිදසුන් කිරීමෙන් ස.ම.නි.දු. වලින් ම.දු.ස.නි. ක්‍රමයෙන් පළමුවැන්න රහිතව ක්‍රමයෙන් බෙදන්නේය. පළමුවන ස්වලක්ෂණ ඒක පදයි. කෙසේ ද? දුක්ඛය පීළනාර්ථයි. සමුදය ආයූහනාර්ථයි. නිරොධය නිස්සරණාර්ථයි. මාර්ගය නීයාානාර්ථයි. මෙය සඞ්ලක්ෂණ ඒක පදය නම්. දුතියාදිය අනිකට නිදර්ශන වශයෙන් කෙසේ ද? ස,ම,නි. සමුදය දර්ශනයෙන් සංඛත ලක්ෂණ දුක්ඛ සත්‍යය දක්වයි. මාර්ගය දැක්වීමෙන් සන්තාප ලක්ෂණ දුකඛ සත්‍ය දක්වයි. නිරොධ දර්ශනයෙන් විපරිණාම ලක්ෂණ දුක්ඛ සත්‍යය දක්වයි. දුක්ඛ දර්ශනයෙන් නිදාන ලක්ෂණ සමුදය සත්‍යය දක්වයි. නිරොධ දර්ශනයෙන් සමප්‍රයෝග ලක්ෂණ සමුදය සත්‍යය දක්වයි. මාර්ග දර්ශනයෙන් පළිබෝධ ලක්ෂණ සමුදය සත්‍යය දක්වයි. ස.මා. යන්නෙහි සමුදය දර්ශනයෙන් විවේක ලක්ෂණ නිරොධ සත්‍යය දක්වයි. මාර්ග දර්ශනයෙන් අසංඛත ලක්ෂණය දක්වයි. දුක්ඛ දර්ශනයෙන් අමෘත ලක්ෂණ නිරෝධය දක්වයි. සමුදය දර්ශනයෙන් හේතු ලක්ෂණ මාර්ග සත්‍යය දක්වයි. නිරෝධ දර්ශනයෙන් දර්ශන ලක්ෂණ මාර්ග සත්‍යය දක්වයි. දුක්ඛ දර්ශනයෙන් අධිපති ලක්ෂණ මාර්ග සත්‍යය දක්වයි. මෙසේ පර නිදර්ශන වශයෙන් ද්වාදශාකාර නම් වෙයි. මෙසේ මේ අනේකාකාර වූ ධම්චක්‍රය පැවැත්වූ සේක. නැවත සත්‍ය, කාත්‍ය, කෘත වශයෙන් දක්වමින්

සත්‍ය කෘත්‍ය කෘත ඤාණ වශයෙන් චතුරාර්‍ය සත්‍යය තිපරි

වෘත්ත ද්වාදශාකාර වූ ධර්මචක්‍රය මහර්ෂීන් වහන්සේ විසින් දේශනා කරන ලදි.

ෂඩ් ඥාන විජෘම්භනය කෙසේ ද? ඇස ඇති කරයි. නැණ ඇති කරයි. උපසමය පිණිස වෙයි. අභිඥා පිණිස වෙයි. සම්බොධය පිණිස වෙයි. නිවන් පිණිස වෙයි. මේ ෂඩ් ඥාන විජෘම්භනය ආර්යාකර සම්භූත වේ. ආයුෂ්මත් ශ්‍රාවකයන්ට ආකර වූවක් වන්නේය. එහි ධම්මචක්ඛු යනු සොතාපත්ති සකදාගාමි අනාගාමි මාර්ගයි. මෙහි ධම්මචක්ඛු යනු සොතාපත්ති මාර්ගයම ගන්නා ලදි. යං කිඤ්චිසමුදය ධම්මං සබ්බං තං නිරොධධම්මං යනු, නිරුද්ධ වීම් ස්වභාවයයි. නැතහොත් සමුදයධම්මං යනු, මාර්ගයයි. නිරොධ ධම්මං යනු, නිර්වාණාරම්මණය උපදවන යනුයි. දුක් නැසීමයි. විනාශ කිරීමයි.

භාග්‍යවතුන් වහන්සේ අනුපිළිවෙළ දහම් දෙසූහ. එය මෙසේයි. දාන කථා, සීල කථා, ස්වර්ග කථා, කාමයන්ගේ ආදීනව පහත් බව සකිලිටි බව, නෛෂ්ක්‍රම්‍යයෙහි ආනිසංස ප්‍රකාශ කළහ. මෙසේ අනුපිළිවෙළිනි. දානයට අනතුරුව සීලය සීලයට අනතුරුව ස්වර්ගය ස්වර්ගයට අනතුරුව මාර්ගයයි. එහි භාග්‍යවතුන් වහන්සේ දාන කතාව වදාළ සේක. මේ දානය නම් සැපයට නිදානයයි. සම්පත්වල මූලයයි. භෝගයනට පිහිටයි. විසමගතයන්ට ආරක්ෂාවයි. පරායණයයි. මෙලොව පරලොව දානයට සමාන අවශ්‍ය පිහිටක් ත්‍රාණයක් ගති-පරායණයක් නැත. මෙය අවශ්‍යයෙන්ම රුවන්මුවා සිහසුනක් සමානය. පිහිට වීම් අර්ථයෙන් මහපොළොව සමානය. ආලම්බන අර්ථයෙන් ආලම්බන රැහැනක් බඳුය. දුකින් නිදහස් වීම් අර්ථයෙන් දැඩිව සැලෙන නැවක් බඳුය. භයින් ආරක්ෂා කිරීම් අර්ථයෙන් මනාව ඉදිකළ නගරයක් මෙනි. මසුරු මල ආදිය සමග නොතැවරෙන අර්ථයෙන් පියුමක් වැනිය. ඒ කෙලෙස් දවාලන අර්ථයෙන් ගිනි-කඳක් බඳුය. පහසුවෙන් ළඟාවිය නොහැකි අර්ථයෙන් සර්පයෙකු වැනිය. නොතැතිගැනීම් අර්ථයෙන් කේශර සිංහයෙකු බඳුය. අභිමංගල සම්මත අර්ථයෙන් පණ්ඩර වෘෂභයෙකු බඳුය. ක්ෂේම-භූමියට පැමිණවීම් අර්ථයෙන් වලාහක අස්සරාජයෙකු බඳුය. මේ

දානය දෙව්සැපත් දෙයි. සක්සැප මරසැප සක්විති සැප ඇමතිසැප ගෘහපති සැප ශ්‍රාවකපාරමිතා ඤාණය, ප්‍රත්‍යෙක බුද්ධ ඤාණය, සර්ඥතාඥානය ලබා දෙයි. මේ ආදි දානගුණ යුත් කථා දෙසා දන් දෙන්නහුටම සීලසමාදානය කළ හැකියයි දනට අනතුරුව සීල කතාව දේශනා කළහ.

මේ සීලය නම් අවශ්‍යයෙන්ම පිහිටකි. ආරක්ෂාවකි. ගති පරායණයකි. මෙලොව සැප සම්පත්වලට සීලය වැනි අවශ්‍ය පිහිටක් අරමුණක් ආරක්ෂාවක් නැත්තේය. සීලය සමාන මල් පළඳනාවක් නැත. සීලාලංකාරයෙන් සැරසුණ ජනයා සිල්සුවඳ තවරා සිල්මල් පැළඳගත් පුද්ගලයන් දැක දෙවියෝ ද සෑහීමට නොපත් වෙති. මෙවැනි සීල ප්‍රතිසංයුක්ත කතා වදාරා මේ සිල් නිසා ස්වර්ගය ද ලැබිය හැකියයි දැක්වීම සඳහා සීලයට අනතුරුව සඟී කතා දෙසූහ.

මේ සඟීය නම් ඉෂ්ටය කාන්තය මනාපය. මෙහි නිතර ක්‍රීඩා ඇත්තේය. නිති සම්පත් ලබන්නේය. චාතුර්මහාරාජික දෙවියෝ අනූදහසක් අවුරුදු දිවසැප ලබති. තව්තිසා දෙවියෝ තිස් කෙළ සැට දහසක් අවුරුදු සැප විඳිති. මේ ආදි සගගුණ මුසු ධම් කථා දෙසූහ. සඟී කථාවෙන් පොළඹවා නැවත ඇතු සරසා සොඬ කපන්නාක් මෙන් මේ සඟීය අනිත්‍යය අස්ථිරය. එහි ඡන්දරාගය නොකටයුතුයයි දැක්වීමට කම්සැප මඳ ආස්වාද ඇත්තේය. විඩා බොහෝය. මෙහි ආදීනව බහුලයයි ආදි ක්‍රමයෙන් කාමයන්ගේ ආදීනව ලාමක බව සකිලිටි බව දෙසූහ. එහි ආදීනව යනු, දොෂයි. ඕකාර යනු, පහත් බව ලාමක බවයි. සංකිලෙස යනු, එයින් සතුන් සසර කෙලෙසෙන බවයි. භාග්‍යවතුන් වහන්සේ මෙසේ කාමාදී-නවයෙන් තැති ගන්වා නෛෂ්ක්‍රම්‍යයෙහි අනුසස් ප්‍රකාශ කරති. පැවිද්දෙහි ගුණ ප්‍රකාශ කරති යන අර්ථයි.

බුද්ධානං සාමුක්කංසිකදේසනා යනු, තමන් උකහා ගත් තමා විසින්ම උපුටාගත් සඞයම්භූඥානයෙන් දුටු අනුන්ට සාධාරණ නොවූ යන අසථියි. එය කවර නම් ආයස්‍යසත්‍ය දේශනාවක් කරත් ද? දුක්ඛ, සමුදය, නිරොධ, මාගී සත්‍යයයි. ධම්මචක්ඛුං යනු, සොතාපත්ති

මාඝියයි. දිට්ඨධම්මා යනු, මොහු විසින් ආර්‍යසත්‍ය ධර්මය දක්නා ලද්දේයි. දිට්ඨධම්ම නම් සෙසු තැන්හි ද මේ ක්‍රමයයි. තරණය කළ විචිකිච්ඡා ඇත්තේ තිණ්ණවිචිකිච්ඡායි. ඔහුගේ කෙසේ ද? කෙසේ ද? යන කතා පහවූයේ විගත කථං කථී නම්. පර ප්‍රත්‍යයෙන් අනුන් සඳහා මෙහි සිටීයයි කීමක් නැත්තේ අපරපච්චයෝ සත්ථු සාසනේ කියා කියවේ. පඨමං භගවා ධම්මියා කථාය සන්දස්සෙයි යන ආදියෙහි ඉහලෝකාර්ථය දැක්වූහ. ඉහලෝකාර්ථය දක්වමින් අනිත්‍යයයි දැක්වූහ. දුක්ඛයයි දැක්වූහ. ධාතු ස්කන්ධ දැක්වූහ. ආයතන දැක්වූහ. පටිච්චසමුප්පාදය දැක්වූහ. උදයව්‍යය වශයෙන් පඤ්චස්කන්ධයන්හි පනසක් ලකුණු දැක්වූහ. පර ලෝකාර්ථය දක්වමින් අකුසල විපාක ක්‍රියා දැක්වූහ. නරකය තිරිසන් යෝනිය ප්‍රේත විෂය අසුර කාය දැක්වූහ. තුන් අකුසලයන්හි විපාක සදෙව් ලොව සම්පත් නව බඹලොව සම්පත් දැක්වූහ.

සමාදපෙසී යනු, චතුපාරිශුද්ධිසීල තෙලෙස් ධුතාංග දස කථාවත්ථු ආදි කලණ දහම් සමාදන් කර වූහ. සමුත්තේජෙසි යනු, මනාව තෙද ගැන්වූහ. අතිශයින් සැනසූහ. මෙලොවත් පරලොවත් තැතිගන්වා බියගන්වා ප්‍රත්‍යක්ෂ වූවාක් මෙන් පෙන්වූහ. ඉහලෝකාර්ථ දෙසමින් දෙතිස් කම්කටොලු පස්විසි මහාභය ප්‍රභේද ආදියෙන් බියගන්වා තැතිගන්වා භාග්‍යවතුන් වහන්සේ දේශනා කරන කල්හි අත් පිටුපසට තබා දැඩි බැම්මෙන් බැඳ සතර මං සන්දියෙහි පහර සියයකින් බියගන්වා ගෙනයනු ලබන්නාක් මෙන් ද උලෙකින් අනින්නාක් මෙන් ද මතැතකු ලවා මඩිනු ලබන්නාක් මෙන් ද බිය වෙයි. පරලෝකාර්ථ දෙසද්දී නිරයෙහි උපන්නාක් මෙන් ද දෙව්සැප විඳින්නාක් මෙන් ද වෙයි. සම්පහංසෙසි යනු, ලැබූ ගුණයෙන් මෙහෙය වූහ. මහානිසංස කොට දෙසූහ යන අර්ථයි.

පුච්ඡාවලිකකීළිතං යනු, දරුවන් වැලි තලාවෙහි වැලි ගොඩවල් ගසා හිඳ කරන සෙල්ලම් සාණං යනු, වැහැරියෙන් කළ වස්ත්‍රයි. පකුධ යනු, කුබුක් ගසයි. අංග මගධ වාසිනො යනු, අංගරට වැස්සෝ ද. මගධ රටවැස්සෝ ද වෙති. අන්තරට්ඨකේසු යනු, උඳුවප්

අවපස එකොළොස්වන දිනයේ පටන් දූරුතුමස පෙරපස සතරවන දවස දැයි මෙසේ දෙමස අතර අටදවසක් පමණ වූ හිම වැටෙන සමයෙහි අන්තරට්ඨිකහිමපාතසමය වෙයි. මඤ්ඤාමුබී යනු, ගිනිකබල්ය. අඩ්ඩුඩ්ඩානිපාටිහාරිය සහස්සානි යනු, එක්දහස් පන්සියයකි. ඉහලෝකාර්ථය සඳහා ගිනි නොදැල්වෙන භේදයෙන් දහසකි. නොනිවීම් භේදයෙන් දහසකි. පඤ්චමඤ්ඤාමුබී- සතානං යනු, අඹ දඹ ආමලක, අරළු පරසතු ප්‍රාතිහාය්‍යීයන් සමඟ අතිරේක ප්‍රාතිහාය්‍ය් එක්ලක්ෂ පනස් දහසක් ප්‍රාතිහාය්‍යීයි දත යුතුයි.

අඩ්ඪතියපරිබ්බාජකසතානි යනු, දෙසිය පනසක් පරිබ්‍රාජකයෝ වෙති. මෙහි ජාති මදෝ යනු, ජාති හේතුවෙන් උපදී. අනුන් විසින් නොදත යුතු යයි මදය උපදියි. -පෙ- මදය කුමක් ද? යම් මදයක් මජ්ජනාවක් මජ්ජනත්ව බවක් ඇද්ද මෙය මදයයි කියවෙයි. කුසල්දහම් නොමනාකොට කරනබව මදයයි. පුරුෂකාරයෙන් හටගත් අහංකාරය හැඟවීම සාරම්භයයි. අත්‍රිච්ඡතාව කුමක් ද? අනුන්ගේ ලාභයෙන් නොසතුටු වූවහුගේ බහුල කම්පාවයි. මහිච්ඡතාව කුමක් ද? ලාභයෙන් නොසතුටු වුවහුගේ බහුතර මහත් කම්පනයයි. පාපිච්ඡතාව කුමක් ද? මෙලොව සමහරු ශ්‍රද්ධාව නැතිවම මා ශ්‍රද්ධාවන්තයෙකැයි දැන ගනිත්වායි කැමැතිවෙති. දුසිල්ව සිල්වත්ය කියා ද. අල්පශ්‍රැතව බහුශ්‍රැතය කියා ද -පෙ- දුෂ්ප්‍රාඥ ව ප්‍රාඥ යයි කියා ද දැනගනිත්වා යන මෙබඳු ඉච්ඡාවන් පාපිච්ඡතාවයි. ලොල්බවම ලෝලුප්පයයි. පාපස්සය කුමක් ද? මේ කුණු ශරීරය මණ්ඩනය විභූෂණය සුවඳ ගැන්වීම ලේප ගැන්වීමයි. අසභාග වුත්තිය කුමක් ද? මවුපියන් කෙරෙහි හෝ ආචය්‍ය් උපාධ්‍යාය යන් කෙරෙහි හෝ බුද්ධ ධම් සංඝයා කෙරෙහි හෝ අනුකූල නොවීම සතුරුවීම අනාදර වීමයි. අරතිය කුමක් ද? ප්‍රාන්ත සේනාසනයන්හි වෙනත් අධිකුශල ධම්යන්හි නොඇල්මයි. නොසතුටයි. තන්දි යනු, අලස බවයි. විජම්භිකා යනු කාය විජම්භනයයි. භත්තසම්මදෝ යනු, අනුභව කළනුගේ බත්මතයයි. චෙතසෝ ලීනත්තං යනු, සිතෙහි නොසුදුසු බවයි. කුහනය කුමක් ද? ලාභ සත්කාර ප්‍රසංශා රැස්

කරන පාපේච්ඡා ඇත්තහුගේ ප්‍රත්‍යය ගැනීමාදී ඉරියව් සටහන්ය. බැම හැකිළ වීම්ය. ලපනා කුමක් ද? අනුන් ඇමතීම අනුන් හා සල්ලාප කිරීමයි. නේමිත්තිකතාව කුමක් ද? අනුන්ගේ යම් නිමිති කීම්, ඇඟවීම් හාත්පස කථා කිරීම්ය. නිප්පෙසිකතාව කුමක් ද? අනුන්ට ආක්‍රොශ කිරීම ගැරහීමයි. ලාභහේතු ලාභනිජිගිංසනතාව කුමක් ද? ලාභ සත්කාර ප්‍රසංශා හේතුවෙන් පාපේච්ඡව ආශා ස්වභාවයෙන් මෙයින් ලද ආමිසය අන් තැනට ගෙන යයි. අන්තැනින් ලත් ආමිසය මෙහි ගෙන එයි. මානය කුමක් ද? මඤ්ඤනාවයි. මඤ්ඤිත බවයි. උත්තම ධජග්‍රාහයයි. සිතෙහි ඇති කොඩියක් බඳු සිතයි. මෙය මානයයි. උමානෝ යනු, උමඤ්ඤනාවයි. උහීලනයයි. අධිමානය කුමක් ද? නොපත් දෙයෙහි පත් බව හැඟීමයි. නොකළ දෙය කරන ලදැයි යන හැඟීමයි. අවබෝධ නොකළ දෙයෙහි අවබෝධ කළෙමියි හැඟීමයි. අස්මි මානය කුමක් ද? රූපයෙහි වෙමි යන මානයයි. වේදනා සංඥා සංඛාර විඤ්ඤාණයන්හි ද එසේමය. මිච්ඡාමානය කුමක් ද? මෙහි ඇතැමෙක් පාපක කම්‍යතනයෙන් හෝ පාපී දෘෂ්ටියෙන් මානයට පැමිණේ. ජපකරයි. නැයන් අරභයා ගේහසිත විතර්කය ඇති කරයි. ජනපද ආදියෙහි ද මේ ක්‍රමයයි. අමරාවිතර්කය කුමක් ද? දුෂ්කර කාය්‍යයක යෙදුණේ හෝ මිථ්‍යාදෘෂ්ටිගත වූ හෝ විතර්කයයි. අනුප්‍රඥප්ති විතර්කය කුමක් ද? ජාති කුල ගෝත්‍ර කුල පුත්‍රාදි අන්‍යයෝ මට අවමන් නොකරෙත්වා යනුයි.

ක්‍රෝධය කුමක් ද? යම් ක්‍රොධයෙක් වෙයි ද? ක්‍රෝධ කිරීම ක්‍රෝධ කරන බවයි. වෛරය ලුහුබැඳීම් ලක්ෂණ ඇත්තේයි. උපනාහය නම්, ක්‍රෝධය මණ්ඩනය කිරීමයි. ගුණ මකා දැමීම මක්ඛයයි. ද්වේෂ කිරීමෙහි අත නොහැරීම පලාසයයි. නසන තන්හි යුගග්‍රහණය. පලාසයයි කියවේ. පරසම්පත් ලාභ සත්කාරයෙහි අන්‍යයන් එයින් පිරිහෙළීමේ ලක්ෂණ ඇත්තේ ඊර්ෂ්‍යාවයි. තමන්ගේ සම්පතෙහි අනුන් බැහැර කිරීම මච්ඡරියයි. මායාව කුමක් ද? කය වචනයෙන් දුශ්චරිතයෙහි හැසිර එය සැඟවීමට ප්‍රසිද්ධිය කැමැති වෙයි. මා

ගැන නොදැනගනිත්වායි කල්පනා කරයි. මා නොදැන ගනිත්වායි කියයි. මා නොදැන ගනිත්වායි කයින් උත්සාහ කරයි. මෙය මායායි. කියැ වෙයි. සාඨෙය්‍යය කුමක් ද? සඨබවයි. සඨ වීමයි. සඨවන බවයි. එයම කරන බවයි. අවිද්‍යාව කුමක් ද? දුකෙහි අඥාන බව දුක්ඛ සමුදය දුක්ඛ නිරෝධය දුක්ඛ නිරෝධ-ගාමිණි පටිපදාවෙහි නොදැනීමයි. මෙය අවිජ්ජායි කියනු ලැබේ. භවතණ්හාව කුමක් ද? භවයෙහි යම් භව ඡන්දයක් භව රාගයක් භව නන්දියක් භවයෙහි ගැලීමක් ඇද්ද එයයි. භවදිට්ඨිය කුමක් ද? ආත්මයත් ලෝකයත් වන්නේ ද යන දෘෂ්ටියයි. විභවදෘෂ්ටිය කුමක් ද? ආත්මයත් ලෝකයත් නොවෙයි කියා වන දෘෂ්ටියයි. ශාස්වත දෘෂ්ටිය කුමක් ද? ආත්මයත් ලෝකයත් සදාකාලිකය යන දෘෂ්ටියයි. උච්ඡේද දිට්ඨිය යනු, ආත්මයත් ලෝකයත් සිඳෙයි යන දෘෂ්ටියයි. අන්තවාද දෘෂ්ටිය කුමක් ද? ආත්මයත් ලෝකයත් අන්තවත්ය යන දෘෂ්ටියයි. අනන්තවාද දෘෂ්ටිය කුමක් ද? ආත්මයත් ලෝකයත් අනන්තවත්ය යන දෘෂ්ටියයි. පුබ්බන්තානුදිට්ඨිය කුමක් ද? පූර්‍වාන්තය අරභයා උපදින දෘෂ්ටියයි. අපරාන්තානුදිට්ඨිය කුමක් ද? අපරාන්තය අරභයා උපදින දෘෂ්ටියයි.

අහිරිකය කුමක් ද? ආධ්‍යාත්මික වරද නොදැක්මයි. අනොත්තප්පය කුමක් ද? බාහිර වැරදි නොදැක්මයි. ඔහුගේ ස්වභාවය දුක්ය යනු දොවචස්සතාවයි. පාපමිත්‍රතාව කුමක් ද? යම් ඒ සැදැහැ නැති නොපහන් මිථ්‍යාදෘෂ්ටික පුද්ගලයෝ වෙත්ද ඔවුන්ගේ සේවන භජන පර්යුපාසනයයි. යම් සෘජු නොවන බවක් ඇද්ද එය අජ්ජවතාවයි. වංක බව කුටිල බවයි. අමද්දවය කුමක් ද? මෘදු නොවන බවයි. කර්කශ බවයි. යම් නොයිවසීමක් ඇද්ද එය අක්ඛමතාවයි. අධිමානතාවයි. මේ සියල්ල දුසිල් බවය. සුරත නොවන බවයි. සිඹිල නොවූ බව අසාකල්ලයයි. යම් ඒ වචනයක් එරුෂ ද කර්කශ ද පරපුටු කාකාදීන් මෙන් සුඛ සම්භාවනා නැත්තේ ද මෙය ආමිසයෙන් හෝ ධම්මයෙන් හෝ අප්පටිසන්ථාරයයි. ඉන්ද්‍රියයන්හි අගුත්තද්වාරතාව කුමක් ද? යම් මේ ඡඩින්ද්‍රියවල අනාරක්ෂාව අගෝපනයයි. භොජනයෙහි අමාත්‍රඥබව කුමක් ද? බොජුන්හි අසන්තුට්ඨිතාව

පමණ නොදැන්මයි. මුට්ඨස්සතිය කුමක් ද? සිහියෙහි අනුස්සතියෙහි මුළාවන බවයි. අසම්පජඤ්ඤය කුමක් ද? යම් ඥානයක් නොදැක්මක් අනවබෝධයක් ඇත් නම් එයයි. මේ සියල්ලම දුස්සීලබවයි. සීලවිපත්තියයි.

දිට්ඨිවිපත්තිය කුමක් ද? දුන් දෙයෙහි විපාක නැත. පිදූ දෙයෙහි විපාක නැත. හොඳ නොහොඳ කම්වල ඵල විපාකයක් නැත කියා දැකීමයි. පංචඔරම්භාගිය සංයෝජන ආධ්‍යාත්මික සංයෝජන නම්. උද්ධම්භාගිය සංයෝජන පස බාහිර සංයෝජන නම්. තුන් අකුසල් මුල් කුමත් ද? ලෝභය දෝසය මෝහයයි. තුන් දුශ්චරිත කුමක් ද? කාය දුශ්චරිත වාක්දුශ්චරිත මනෘදුශ්චරිතයි. තුන් සංයෝජන කුමක් ද? සක්කායදිට්ඨි විචිකිච්ඡා සීලබ්බතපරාමාසයයි. තුන්බිය කුමක් ද? ජාතිභය, ජරාභය, මරණභයයි. තුන් කම් නම් රාග දෝස මෝහයි. තුන් දිට්ඨායතන නම් මෙලොව කිසියම් මහණෙක් හෝ බමුණෙක් මෙසේ කියන්නේ වෙයි. මෙසේ සැපයක් හෝ දුකක් හෝ නොදුක් නොසැපයක් හෝ විඳී නම් සියල්ල පෙර කළ හෙයිනි. ඒ සියල්ල ඊශ්වර නිර්මාණ හේතුවෙනි. ඒ සියල්ල හේතු රහිත ප්‍රත්‍ය රහිතයි. අංග තුන නම් රාග දෝස මෝහයි. තුන් විසම නම් රාග දෝස මෝහයි. අකුසල විතර්ක තුනකි. කාමවිතර්ක ව්‍යාපාද විතර්ක විහිංසා විතර්කයි. ආසව තුනකි. කාමාසව භවාසව දිට්ඨාසවයි. කිඤ්චන තුනකි. රාග දොස මොහයි. ගිනි තුනකි. රාග දෝස මෝහයි. කසට තුනකි. රාග, දෝස, මෝහයි. අකුසල සංඥා තුනකි. කාම සංඥා ව්‍යාපාද සංඥා විහිංසා සංඥායි. අකුසල ධාතු තුනකි. කාමධාතු ව්‍යාපාදධාතු විහිංසාධාතුයි. තණ්හා තුනකි. කාමතණ්හා භවතණ්හා විභවතණ්හායි. ඒසනා තුනකි. කාම ඒසනා භව ඒසනා බ්‍රහ්මචරිය ඒසනායි. ශාස්වතාදි දෘෂ්ටි පර්යේෂණයයි. විධා තුනකි. ශ්‍රේෂ්ඨ වෙමි. සමාන වෙමි. හීන වෙමි කියායි. දුෂ්කෘත තුනකි. කාය දුෂ්කෘත වචී දුෂ්කෘත මනෝ දුෂ්කෘතයි.

ආශ්‍රව සතර කුමක් ද? කාමාසව, භවාසව, දිට්ඨාසව, අවිජ්ජාසවයි. ග්‍රන්ථ සතරකි. අභිජ්ඣා ග්‍රන්ථය, ව්‍යාපාද ග්‍රන්ථ, සීලබ්බත

පරාමාස ග්‍රහ්, ඉදං සච්චාභිනිවේසකාය ග්‍රහ්යයි. ඕඝ සතරකි. කාම ඕඝ, භව ඕඝ, දිට්ඨි ඕඝ, අවිජ්ජා ඕඝයයි. තණ්හුප්පාද සතරකි. සිවුරු හේතුවෙන් හෝ පිණ්ඩපාත හේතුවෙන් හෝ සේනාසන හේතුවෙන් හෝ ඉතිහවාභව හේතුවෙන් හෝ තණ්හාව උපදී. විපර්යාස සතරකි. අනිත්‍යයෙහි නිත්‍යයයි සංඥා විපර්යාසයකි. දුකෙහි සැපයයි. සංඥා විපර්යාසයකි. අනාත්මයෙහි ආත්මයයි, සංඥා විපර්යාසයකි. අසුභයෙහි සුභයයි සංඥා විපර්යාසයෙකි. අනාර්ය ව්‍යවහාර සතරකි. නොදුටු දෙයෙහි දුටුයෙමියි කියන බව නො ඇසූ දෙයෙහි ඇසුයෙමියි කියන බව. අමුතයෙහි මූත වෙමියි කියන බව නොදත් දෙයෙහි දන්නෙමියි කියන බවයි. උපාදාන සතරකි. කාම, දිට්ඨි, සීලබ්බත, අත්තවාද උපාදානයි. අගති ගමන සතරකි. ඡන්ද, දොස, භය, මෝහ අගතිගමනයයි. දුශ්චරිත සතරකි. ප්‍රාණඝාතය, අදත්තාදානය, කාමමිච්ඡාචාරය, මුසාවාදයයි. භය සතරකි. ජාති, ජරා, ව්‍යාධි, මරණ භයයි. දෘෂ්ටි සතරකි. සැප දුක් තමා විසින් කරන ලැදැයි සත්‍ය වශයෙන් ස්ථිර වශයෙන් දෘෂ්ටිය උපදී. සැප දුක අනුන් විසින් කරන ලදැයි දෘෂ්ටිය උපදී. සැප දුක අපරකාරයයි දෘෂ්ටිය උපදී. සැප දුක අධිච්චසමුප්පන්නයයි දෘෂ්ටිය උපදී.

ඔරම්භාගිය සංයෝජන පහ කුමක් ද? සක්කායදිට්ඨි, විචිකිච්ඡා සීලබ්බතපරාමාස. මිච්ඡාදිට්ඨි. ව්‍යාපාදයි, උද්ධම්භාගිය සංයෝජන පහ කුමක් ද? රූපරාග අරූපරාග මාන උද්ධච්ච අවිජ්ජායි. මසුරුකම් පහකි. ආවාස, කුල, ලාභ, වණ්ණ, ධම් මසුරු බවයි. සංග පහකි. රාග, දොස, මෝහ, මාන දිට්ඨිසංගයි. සල්ල පහකි. රාග, දොස, මෝහ, මාන දිට්ඨිසල්ලයි. චෙතොඛීල පහකි. ශාස්තෘන් වහන්සේ කෙරෙහි සැක කරයි. විචිකිච්ඡා කරයි. නොපිළිගනී. නොපැහැදෙයි. ධම්යෙහි, සංඝයා කෙරෙහි, ශික්ෂාවන්හි, සබ්‍රම්සරුන් කෙරෙහි නොපැහැදෙයි. නොසතුටට පත් වෙයි. චිත්තවිනිබද්ධ පහකි. කාමයන්හි පහ නොවූ රාග ඇත්තේ වෙයි. රූපයන්හි පහ නොවූ රාග ඇත්තේ වෙයි. ඇති තරම් බඩ පිරෙන තුරු අනුභව කොට නිදි සැපයෙහි යෙදී වාසය කරයි. වෙනත් දේවනිකායක් අරභයා

බඹසර හැසිරෙයි. මෙහි සිත බැඳගෙන මිටෙහි තබා ගත්තාක් මෙන් ගන්නා බැවින් චිත්ත- විනිබද්ධ නම්. නීවරණ පහකි. කාමච්ඡන්ද, ව්‍යාපාද, ථීනමිද්ධ, උද්ධච්ච කුක්කුච්ච, අවිජ්ජා නීවරණයි. ආනන්තරිය කම් පහකි. මව මැරීම, පියා මැරීම, රහතන් මැරීම, දුෂ්ට සිතින් තථාගතයන් වහන්සේගේ ලේ සෙලවීම, සංඝභේදයයි. දෘෂ්ටි පහකි. ආත්මය සංඥී වෙයි. නොවෙයි. ආත්මය නෙවසංඥී වෙයි. ආත්මය නාසංඥී වෙයි. සිටින්නා වූ සත්ත්වයාගේ උච්ඡේදය විනාශය විභවය පනවයි. වෛර පහකි. ප්‍රාණ ඝාතය, අදත්තාදානය, කාම මිථ්‍යා චාරය, මුසාවාදය, රහමෙර පානයයි. ව්‍යසන පහකි. ඤාති ව්‍යසනය, භෝග, සීල, දිට්ඨි, රෝග ව්‍යසනයයි. තොඉවසීමෙහි ආදීනව පහකි. බොහෝ දෙනාට අප්‍රිය වේ, අමනාප වේ, වෛර බහුල වෙයි. මුළාව මියයයි, මරණින් මතු දුගතියෙහි උපදී. බිය පහකි. ජීවිත භය, නින්දා භය, පිරිස් පිරිහීමේ භය, මරණ භය, දුගති භයයි. දිට්ඨ ධම්ම නිබ්බාන වාද පහකි. මෙලොව ඇතැම් ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ මෙසේ දක්නේ මෙසේ කියන්නේ වේ, භවත්නි, මේ ජීවිතය පස්කම් ගුණයෙන් යුතුව සපුරා පරිහරණය කළ හැකි නම් මෙපමණකින් මේ ජීවිතය ඉහාත්මයෙහි ම පරම නිර්වාණයට පැමිණියේ වෙයි කියායි.

විවාද මූල සයකි. ක්‍රෝධය, මකුබව, ඉරිසියාව, මසුරුබව, සඨබව, පාපේච්ඡතාවයි. ඡන්දරාග දොෂධම් සයකි. නොමනා රූපයන් හි සිතෙහි ඡන්ද රාගය, සරාගි බව. ශබ්ද ගන්ධ රස ඵොට්ඨබ්බ, ධර්මයන්හි ද එසේමය. විරොධ වස්තු සයකි. මනාප රූපයන් විෂයෙහි සිතේ ඇතිවන වෛරය, විරුද්ධ බව නොකැමැති බව නොසතුටු බවයි, ශබ්දාදියෙහි ද එසේය. නිගරු කිරීම් සයකි. ශාස්තෘන් වහන්සේ කෙරෙහි ගෞරව රහිත වෙයි, ධර්මය, සංඝයා, ශික්ෂා, පිළිසඳර, සබ්‍රහ්මචාරීන් කෙරෙහි ගෞරව රහිත වෙයි, පරිහානීය ධර්ම සයකි. කම්මාරාමතා, භස්සාරාමතා, නිද්දාරාමතා, සංගණිකාරාමතා, වසුරාමතා, පරාමතා යි. සොම්නස් සහිත විසිම් සයකි. ඇසින් රූප දැක කනින් ශබ්ද අසා නාසයෙන් ගඳ ආඝ්‍රාණය

කොට දිවින් රස දැන කයින් ස්පශී කළයුතු දෙය ස්පශී කොට මනසින් ධම් දැන සතුටු විය යුතු තැන් හි හැසිරෙයි. දොම්නස් සහිත විමසීම් සයකි. ඇසින් රූප දැක - පෙ - මනසින් ධර්ම දැන දොම්නස් තැන් සොයමින් වසයි. උපෙක්ඛා සහිත විමසීම් සයකි. ඇසින් රූප දැක - පෙ - මනසින් දහම් දැනූ උපෙක්ෂා කටයුතු දහම් විමසමින් හැසිරෙයි. ගේහසිත සොම්නස් සයකි. මනාප රූපයන්හි ගේහසිත සොම්නස් සැප සොම්නස් සිතුවිලි ඇතිවෙයි. ශබ්දාදියෙහි ද එසේය. ගේහසිත දොම්නස් සයකි. අමනාප රූප ශබ්දාදියෙහි දුක් දොම්නස් ඇති කරයි. ගේහසිත උපෙක්ෂා සයකි. රූප ශබ්දාදියෙහි මැදිහත්, සිතුවිලි ඇති කරයි. දෘෂ්ටි සයකි. මාගේ ආත්මය ඇත කියා හෝ ආත්මය මගේය කියා හෝ ආත්මය දනිමි කියා හෝ තමාගේ ආත්මය දනිමි කියා හෝ තමා කෙරෙහි ආත්මය දනිමි කියා හෝ දෘෂ්ටි ඇති වෙයි.

අනුසය සතකි. කාමරාග අනුසය, පටිඝ, මාන, දිට්ඨි, විචිකිච්ඡා, භවරාග, අවිජ්ජා අනුසයයි. පරියුට්ඨාන සතකි. කාමරාග පරියුට්ඨාන, පටිඝ, මාන, දිට්ඨි, විචිකිච්ඡා, භවරාග, අවිජ්ජා පරියුට්ඨානයි. සංයෝජන සතකි. කාම රාගාදි සංයෝජනයි. අසද්ධම් සතකි. අ ශ්‍රද්ධාව, අහිරික, ආනොත්තප්ප, අල්පශ්‍රැතතාව. කුසීතබව, මුළාසිහි ඇතිබව, දුෂ්ප්‍රාඥ බවයි. දුශ්චරිත සතකි. ප්‍රාණ ඝාතය. අදින්නාදානය, කාමමිච්ඡාචාරය, මුසාවාදය, පිසුණාවාචා, ඵරුසා වාචා, සම්පප්-ඵලාපයයි. මාන සතකි. මාන, අතිමාන, මානාතිමාන, ඕමාන, අධිමාන, අස්මිමාන, මිච්ඡාමානයි. දෘෂ්ටි සතකි. මෙ ලොව කිසියම් ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් මෙසේ කියන්නේ වෙයි. මෙසේ දන්නේවෙයි. යම් මේ මවුපියන්ගෙන් හටගත් සතර මහාභූතයන් ගෙන් නිපන් රූපවත් ආත්මභාවයක් ඇද්ද එය කය බිඳීමෙන් නැතිවෙයි. විනාශ වෙයි. මරණින් මතු නො වෙයි. භවත්නි, මෙපමණ කින් මේ ආත්මය, නැසී යන්නක් වෙයි. මේ ආදි වශයෙන් විභංගයෙහි කියන ලදි.

කිලේස වතුඋ අටකි. ලෝභ, දෝස, මෝහ, මාන, දිට්ඨි,

විචිකිච්ඡා, පීන, උද්ධච්චය යි. කුසීතවත්තු අටකි. මෙහි භික්ෂුනමකට කළ යුතු කටයුතු තිබේ. ඔහුට මෙසේ සිතේ. මා විසින් කළ යුතු වැඩ ඇත්තේය. එය කරන මාගේ කය ක්ලාන්ත වේ. දැන් මම නිදා ගනිමි. ඔහු නිදයි. වීර්‍යය පටන් නොගනී. නොපැමිණි තැනට පැමිණීමට අවබෝධ නොකළ දේ අවබෝධ කිරීමට පසක් නොකළ දේ පසක් කිරීමට වෑයම් නොකරයි. මේ ආදිය විභංගයෙහි දක්වන ලදි. අෂ්ට ලෝක ධර්මයන්හි හිතෙහි ගැටීම් අටකි. එනම් ලාභයෙහි ඇලීම අලාභයෙහි විරොධය යසසෙහි ඇලීම අයසෙහි විරෝධය ප්‍රශංසාවෙහි ඇලීම නින්දාවෙහි විරෝධය සැපයෙහි ඇලීම දුකෙහි විරෝධයයි. අනාර්‍ය ව්‍යහාර අටකි. නොදුටු දෙයෙහි දිට්ඨමියි කීම, දුටු දෙයෙහි නොදුට්ඨමියි කීම, ඇසූ දෙයෙහි නො ඇසීමියි කීම, නොඇසූ දෙයෙහි ඇසීමියි කීම, මුතයෙහි අමුතයයි කීම, අමුතයෙහි මුත යයි කීම, දත් දෙයෙහි නොදනිමියි කීම්, නොදත් දෙයෙහි දනිමියි කීමය. මිච්ඡත්ත අටකි. මිච්ඡාදිට්ඨි, මිච්ඡා සංකප්ප, මිච්ඡා වාචා, මිච්ඡා කම්මන්ත, මිච්ඡා ආජීව, මිච්ඡා වායාම, මිච්ඡා සති, මිච්ඡා සමාධියයි. පුරුෂ දෝෂ අටකි. මේ සාසනයෙහි භික්ෂුවකට භික්ෂූහු ඇවැතින් චෝදනා කරති. ඒ භික්ෂුනම භික්ෂූන් චෝදනා කරන කල්හි මතක නැත. මතක නැතැයි අසිහියෙන් මඟ හරී. මේ ආදිය විභංගයෙහි දක්වන ලද්දේමය. අසංඥීවාද අටකි. ආත්මය අරූපීය, මරණින් මතු නො ඇති අසංඥී වෙතැයි පනවති. නේව සඤ්ඤි නාසඤ්ඤිවාදී ආත්මය වෙයි. මරණින් මතු අසඤ්ඤී වෙතැයි පනවති. අරූපාදියෙහි ද මේ ක්‍රමයයි.

ආඝාත වත්තු නවයකි. අනර්ථය කළේ යයි ආඝාතය වෙයි. අනර්ථයෙහි හැසිරෙයි කියා ආඝාතය හටගනී. මතු අනර්ථය කරන්නේ යයි ආඝාතය හටගනී. මාගේ ප්‍රියයාට මනාපියාහට අනර්ථය කළේය, කරයි, මතු කරන්නේ යයි ආඝාතය හට ගනී. මාගේ අප්‍රියයාට අමනාපියාට අර්ථය කළේය, කරයි, මතු කරන්නේය කියා ආඝාතය හට ගනියි. පුරුෂමල නවයකි. ක්‍රෝධය, මකු බව, ඉරිසියාව, මසුරුබව, මායාව, සඨබව, මුසාව, පාපේච්ඡතාව, මිසදිටුවයි. මානය නව වැදෑරුම් ය. මම ශ්‍රේෂ්ඨයාට ශ්‍රේෂ්ඨ වෙමි, සමාන

වෙමි, හීන වෙමි කියා මානය උපදී. මම සමානයාට ශ්‍රේෂ්ඨ වෙමි, සමාන වෙමි, හීන වෙමි කියා මානය උපදී. මම හීනයාට ශ්‍රේෂ්ඨවෙමි, සමාන වෙමි හීන වෙමි, කියා මානය උපදී. තෘෂ්ණා මූලික ධර්ම නවයකි. තෘෂ්ණාව හේතු කොට සෙවීමය. සෙවීම හේතු කොට ලැබීමයි. ලැබීම හේතු කොට නිශ්චයයි, නිශ්චය හේතු කොට ඡන්ද රාගයයි, ඡන්දරාගය හේතු කොට එහි බැස ගැනීමයි. බැස ගැනීම හේතු කොට පරිග්‍රහයයි. පරිග්‍රහය හේතු කොට මසුරු බවයි. මසුරු බව හේතු කොට ආරක්ෂාවයි. ආරක්ෂාව මුල්ව දඬු ගැනීම් කලහ විග්‍රහ ආදියයි. ඒ හේතුවෙන් කේලාම් ආදි නොයෙක් ලාමක අකුසල දහම් හට ගනී. ඉඤ්ජිත නවයකි. වෙමි, මෙය වෙයි, මෙය නොවෙයි, රූපී වෙයි, රූපී නොවෙයි, සඤ්ඤීවෙයි, සඤ්ඤීනොවෙයි, නේව-සඤ්ඤී නාසඤ්ඤී වෙයි නෙවසඤ්ඤී නාසඤ්ඤි නොවෙයි. එන්දන නවය ද එසේය. පඤ්චිත නවය ද සංඛත නවය ද එසේය.

ක්ලේශ වස්තු දසයකි. ලෝභ, දෝෂ, මෝහ, මාන, දිටඨි, විචිකිච්ඡා, ථීන, මිද්ධ, උද්ධච්ච, අහිරික, අනොත්තප්පයයි, ආසාත වත්තු දසයකි. මට අනර්ථ කළේය, කරයි, මත්තෙහි කරන්නේය කියා ආඝාතය උපදී, මාගේ ප්‍රියයාට අනර්ථ කළේය, කරයි, මතු කරන්නේය කියා ආඝාතය උපදී, මාගේ අප්‍රියයාට අර්ථය කළේය, කරයි, මතු කරන්නේ ය කියා ආඝාතය උපදී, අස්ථානයෙහි ආඝාතය හටගනී. අකුසල කම්පථ දහයකි. ප්‍රාණඝාත, අදත්තාදාන, කාමමිච්ඡාචාරය, මුසාවාදය, කේලාම් කීම, එරුෂ වචනය, හිස් වචන කීම, විසමලෝභය, ක්‍රෝධය, මිථ්‍යා දෘෂ්ටියයි, සංයෝජන දහයකි, කාමරාග, පටිඝ, දිටඨි, විචිකිච්ඡා, සීලබ්බතජරාමාඝ, භවරාග, ඉස්සා, මච්ඡරිය, අවිජ්ජා සංයෝජනයි, මිචඡත්ත දසයකි. මිච්ඡා දිටඨි -පෙ- මිච්ඡා සමාධි, මිච්ඡා ඤාණ, මිච්ඡා විමුක්තියයි. දස වස්තුක මිච්ඡා දිටඨිය නම් දීමෙහි විපාක නැත. පූජාවෙහි විපාක නැත. යාගයෙහි විපාක නැත. හොඳ නොහොඳ කර්මයෙහි විපාක නැත. මෙලොව නැත. පරලොව නැත. මව නැත. පියා නැත. මැරී ඉපදීමක් නැත. මෙලොව පරලොව සත් මාර්ගයට බැසගත් මෙලෝ පරලෝ මනා නුවණින් දැක ප්‍රකාශ කරන මහණ බමුණෝ නැත යනුයි. දස වස්තුක අන්තග්‍රාහි දෘෂ්ටි

නම් ශාස්වත වාද සතරය, එකච්ච සස්සත වාද සතරය, අමරාවික්ඛෙප සතරය, අධිච්චසමුප්පන්නක දෙකය. සංඥීවාද සොළසය. අසඤ්ඤීවාද අටය. නේවසඤ්ඤී වාද අටය, උච්ඡෙදවාද සතය, දිට්ඨධම්ම වාද පසයි.

එකසිය අටවැදෑරුම් තෘෂ්ණාව කුමක් ද? රූප තණ්හාව, -පෙ- ධම්ම තණ්හාව මේ අරමුණු වශයෙනි. නම් වශයෙන් තණ්හා සයක් දක්වන ලදි. ඒ තෘෂ්ණාවන්හි එක් එක් තෘෂ්ණාව ප්‍රවෘත්ති ආකාරයෙන් තෙවැදෑරුම් වෙයි. එහිලා රූපයෙහි කාම තණ්හා භව තණ්හා විභව තණ්හායි. ශබ්දා දියෙහි ද එසේමය. මේ අටළොස් තෘෂ්ණාවයි. ඒවා ආධ්‍යාත්මිකව අටළොසක් ද බාහිරව අටළොසක් ද කියා සතිසක්වෙයි. මෙසේ අතීත සතිසකි, අනාගත සතිසකි, වර්තමාන සතිසකි කියා එකසිය අටක් වෙයි. නම් වශයෙන් මේ එක් සිය අටක් වූ තණ්හාවයි.

මෙහි ලට්ඨිවන යනු, තාල වනයෙහිය. සුප්පතිට්ඨිත චෙතියෙ යනු, නුගරුක් මුල්හිය. උරුවේලා යනු, උරුවේලාවෙහි විසූ බැවින් උරුවේල නම් වෙයි. ඔහු අමතමින් භවත් උරුවේල නිවාසි යයි කීහ. නිශ්‍රය බැවිනි. කිස්ස බො වදානො යනු, අනුශාසක වරයායි. කාමිත්ථියො යනු, මේ රූපාදි පඤ්ච කාමයෙහි සංඥාව කියයි. එතං මලං යනු, මේ සියලු රූපාදි කාම ප්‍රභේදයෝම මල නම් වෙයි. උපධීසු යනු, ස්කන්ධ කෙලශ උපධීන්හි. නරඤ්ඤං යනු, නොඇලුණෙමි, අථ බො චරහි, කථඤ්ච හි පදං යනු, නිර්වාණය ශාන්තයි යනුයි. නිවුණු බැවින් ශාන්තය. අනුපධිකං යනු, කෙලශ උපධි නැති බැවින් අනුපධිකයි. අකිඤ්චනං යනු, රාග දොස, මෝහ, කිඤ්චන රහිත බවයි. අනඤ්ඤ භාවං යනු, තමන් විරතවූ මගින්ම අවබෝධ කටයුතුය. අනඤ්ඤ ඤෙය්‍යං යනු, වෙනත් කරුණකින් නොව මාර්ගයෙන්ම අවබෝධ කටයුතුය යන අර්ථයි. සිංගි සුවණ්ණං නික්ඛං යනු, පිඩු කළ සුවර්ණයම සුවර්ණ පිණ්ඩය යනු අර්ථයි. මෙහි දසවාසො යනු ප්‍රථම ධ්‍යානාදි දස සමාපත්ති කියවේ. දසවාසෝ යනු මෙහි ලා දස පාරමිතාවයි.

දාන, සීල, නෙක්ඛම්ම, පඤ්ඤා, පඨවන වියාඨය, ඛන්ති, සච්ච, අධිට්ඨාන, මෙත්තා, උපේක්ඛා යන මේ දසයයි.

මේ දස පාරමිතාවන්හි නිවාසී බැවින් දසවාසොයි දත යුතුයි. දසබලෝ යනු, මෙහි තථාගත බල දසය දත යුතුය. දස තථාගත බලය කුමක් ද? ස්ථානය ස්ථාන වශයෙන්ද, අස්ථානය අස්ථාන වශයෙන් ද තත් වූ පරිද්දෙන් දනී. අතීත අනාගත කම් සමාදානයන්ගේ විපාකය ස්ථාන වශයෙන් හේතු වශයෙන් තත් වූ පරිද්දෙන් දනී. සබ්බත්ථගාමිණි පටිපදාව තත් වූ පරිද්දෙන් දනී. අනෙක ධාතු නානාධාතු තත් වූ පරිද්දෙන් දනී. සත්ත්වයන්ගේ නානාධිමුක්ති-කතාව තත් වූ පරිද්දෙන් දනී. පරසත්ත්වයන්ගේ පර පුද්ගලයන්ගේ ඉන්ද්‍රිය පර අපර බව තත් වූ පරිද්දෙන් දනී. ධ්‍යාන විමෝක්ෂ සමාපත්තිවල සංකිලේසය ව්‍යවදානය උත්ථානය තත් වූ පරිද්දෙන් දනී. පුබ්බේනිවාසානුස්මෘති ඥානය තත් වූ පරිද්දෙන් දනී. දිවැස දිව කන තත් වූ පරිද්දෙන් දනී. ආශ්‍රවක්ෂය ඥානය තත් වූ පරිද්දෙන් දනී. මේ දස බල ඤාණ නම් වේ. තථාගත ඤාණ බලයෙන් යුක්ත නිසා දසබල යයි කියනු ලැබේ. දසධම්මවිදූ යනු, දස කුසල- කම්පථ දන්නා වූ, දස කුසලකම්පථ කුමක් ද? ප්‍රාණඝාතයෙන් වැළකීම අදින්නාදානයෙන්, කාමමිච්ඡාචාරයෙන්, මුසාවාදයෙන්, කේලමින්, පරුෂ වචනයෙන්, හිස් වචනයෙන්, වැළකීම විෂමලෝභ නැති බව, ව්‍යාපාද රහිත බව, සම්‍යග් දෘෂ්ටිය යන මෙය දසකුසල කම්පථ නමි. මේ දසකුසල කම්පථධම්යන් දත් හෙයින් දසධම්ම- විදූයයි කියනු ලැබේ.

නොයෙසේ නම් දසධම්මවිදූ යනු, දස කථාවත්‍ථු ධම්යන් දන්නාවූ, තෙමේ අල්පේච්ඡව අල්පේච්ඡතාවෙහි ගුණ කියයි. සන්තුෂ්ටව සන්තුෂ්ටිතාවෙහි ගුණ කියයි. ප්‍රවිවේකව ප්‍රවිවේකයෙහි ගුණ කියයි. -පෙ- අසංසට්ඨව අසංසට්ඨතාවෙහි ගුණ කියයි. වියාරබ්ධව වියාරම්භයෙහි සීලසම්පන්නව සීල සමාදානයෙහි සමාධි සම්පන්නව සමාධි සම්පදාවෙහි ඤාණ සම්පන්නව ඤාණ සම්පදාවෙහි විමුක්ති සම්පන්නව විමුක්ති සම්පදාවෙහි විමුක්ති

ඤාණදස්සන සම්පන්නව විමුක්තිඤාණදස්සන සම්පදාවෙහි ගුණ කියයි. දසෙහි උපෙතො යනු, අසේඛ අංග දසයෙන් උපෙත වූ යුක්ත වූ.

කවර දස අංගයෙන් ද? අසේඛ සම්මා දිට්ඨියෙන් යුක්ත වූයේ වෙයි. -පෙ- අසේඛ සම්මා සමාධියෙන්, අසෙඛ ඤාණයෙන්, අසේඛ විමුක්තියෙන් යුක්ත වූයේ වෙයි. ධීර වූ ප්‍රඥාවෙන් යුක්ත සුවදුක්හි නො ඇලුණු ප්‍රාඥයන්ට ධීරයි කියති . සබ්බාපධිදන්තො යනු, සියලු චක්ෂුරාදි ඉන්ද්‍රියයන්හි උපධීන්හි දැමුණු, මනාව දමනයවූ බුදොා යනු, තමන් වහන්සේ සිව්සස් මනාව අවබෝධ කළ සේක්නුයි බුඬ නම්. ප්‍රජාවට අවබෝධ කරවන සේක්නුයි බුඬ නම්. මෙහි වේළුවනං යනු, ඒ උයනෙහි නමය. එය උණ ගසින් වට වූයේය. පිටත අටළොස් රියන් උස පවුරින් වටකරන ලද්දේය. නිල් පැහැයෙන් අතිමනෝහරය. හුණ ගසින් වටවූ හෙයින් වේළුවනයයි කියති. මෙහි ලේනුන්ට, අහර දුන් හෙයින් කලන්දක නිවාපයයි ද කියනු ලැබේ.

පෙර එක්තරා රජෙක් එහි උයන්කෙළි පිණිස පැමිණියේය. සුරාමදයෙන් මත් වූ හෙතෙම දහවල් නිදන්නට විය. පිරිවර ද රජ නිදතියි සිතා මල්ඵල සඳහා ඔබ මොබ ගියහ. එවිට එක් කළුසර්පයෙක් සුරා ගඳින් ගස් බෙනයකින් නික්ම රජු ළඟට ආයේය. එදුටු ගසට අධිපති දේවතාවා රජුගේ දිවි රැක දෙමියි ලෙහෙන වෙසින් පැමිණ රජුගේ කන ළඟ කෑගැසීය. රජ අවදි විය. සර්පයා ආපසු ගියේය. රජ ඒ දැක මේ ලෙහෙනා මට ජීවිතය දුන්නේ යයි එතැන් පටන් ලෙහෙනුන්ට ගොදුරු තැබ්බවිය. අභය දානය ද ප්‍රසිද්ධ කළේය. එහෙයින් කලන්දක නිවාප නම් විය.

භාග්‍යවතුන් වහන්සේ රජගහ නුවර ඇසුරෙහි බිම්සර රජු පුදකළ කලන්දකනිවාප නම් වේළුවනයෙහි ඒහි භික්ෂු පැවිද්දෙන් පැවිදි වූ ෂඩභිඥාලාභී රහතන් වහන්සේලාම වූ එක් දහස් දෙසිය පනහක් භික්ෂූන් වහන්සේලා ප්‍රමුඛ සිව් පිරිස් සහිතව වැඩ සේක. මෙහි විජිතමාරෝ යනු, ඛණ්ඩකමාර, කිලේසමාර, මච්චුමාර, දේවපුත්ත මාරයයි මාරයෝ සතර දෙනෙකි. ඛණ්ඩක මාරයා කෙබඳු ද?

පටිසන්ධිසිත දුන් කල්හි ප්‍රථම විඤ්ඤාණය පහළ වූ කල්හි කලලරූපය ඇති වූ කල්හි සමතිසක් වූ කම්ජ රූපයන් පහළ වූ කල්හි ආයුස පිරිහේ. ගලා බස්නා ජල ස්‍රෝතසක් මෙන් නිරන්තර ගෙවීමෙන් මරණය දක්වා පැමිණේ. මේ ක්ෂණික මාරයායි. කිලේස මාර නම් කෙබඳු ද? රාග දෝස මෝහයෙන් ව්‍යාකුල වූ සත්ත්වයෝ පුන පුනා සසරින් නොමිදෙති. නිරන්තර මරණයට පත් වෙති. මෙය කිලේසමාර නමි. මෘත්‍යුමාර කෙබඳු ද? ඔහු දෙපරිදිය. කාල මාර අකාල මාර වශයෙනි. කාල මාර කෙබඳු ද? පටිසන්ධි සිතෙහි පටන් පරියන්තය දක්වා වූ කර්මානුරූප ආයුෂයෙන් මැරෙයි. අකාල මාර කෙබඳු ද? බොහෝ වූ අනතුරු වලින් ආයු කෙළවරට නොපැමිණ අතරත මැරෙයි. මේ අකාල මාර නමි.

දේවපුත්ත මාර කෙබඳු ද? මාරයාගේ පූර්වයෝගය කිව යුතුයි කාරණා ඇතිව මාර නම් වේ. පුනර්භවයෙහි බැඳුණු සියලු සත්ත්වයන් නැවත නැවත තුන් වරක මරාලන හෙයින් මාරයයි කියනු ලැබේ. පව් වැගිරවීම් පාප සංකල්ප ඔහුට ඇති බැවින් පාපිමා කියා ද කියනු ලැබේ. කාමාවචර සයටම අධිපති බැවින් කාමදේව කියා ද කියනු ලැබේ. සියලු බුදුවරයන් වහන්සේලාගේ වංශය පවත්වන්නේ යයි ද කියනු ලැබේ. දේවපුත්තමාර නම් මෙසේය. සියලු සිව් මරුන් සම්‍යග් සම්බුද්ධයන් වහන්සේලා දිනූහ. එහෙයින් භාග්‍යවතුන් වහන්සේලා විජිතමාර වෙති. අවිදූ අඳුරෙන් මුළා වූ ලොවට මඟ නුවණ ආලෝකය කරවන හෙයින් ලෝකාලෝකකර නම් වෙති. උල්කා සංඛ්‍යාත ධර්මාලෝකය දල්වා ලන හෙයින් ධර්මොක්කං සම්පජ්ජලිතොයි කියනු ලැබේ. භව බැඳුම් සංඛ්‍යාත කාමගුණ සිඳලන සේකැයි භවබන්ධන විදාරණ නම් වෙති. නාථ යනු සත්ත්වයන්ගේ ආසය අනුශය චරිතාධිමුක්තිභේද අනුරූපව දහම් දෙසීමට සමත් බැවින් ධම්මං වෝ භික්ඛවේ දෙසිස්සාමි යනු අස්වන්නේය යන අර්ථයෙන් නාථ නම් වෙති. නැත හොත් සාධු-භික්ඛවේ කාලේන කාලං අත්ථසම්පත්ති පච්චවෙක්ඛෙය්‍ය ආදි වශයෙන් එක් එක් දෙයට ප්‍රතිපක්ෂ විරුද්ධ ධර්මවලින් භික්ෂූන් මඟහැරවීමට යෝග්‍ය ශික්ෂාපද පැනවීම් වශයෙන් මෙලෝ පරලෝ

යහපත සඳහා කරුණාවෙන් දක්වාලන හෙයින් නාථ නම් වෙති.

සූත්‍රාන්ත වශයෙන් ඒ ඒ සත්ත්වයන්ගේ කෙලෙස් අනුසය කරුණාවෙන් ප්‍රඥාවෙන් දැක දක්වාලන හෙයින් නාථ නම් වෙති. අභිධම් වශයෙන් සංස්කාරයන් අනිත්‍යාදි වශයෙන් පරීක්ෂා කොට ප්‍රඥාවෙන් පිරිසිඳ දක්වා ලන හෙයින් නාථ නම් වෙති. දෙවියන් සහිත ලෝකයෙහි අසම පුද්ගල බැවින් කිසිවෙකු විසිනුත් නොප-වත්වන ලද ධම් දේශනා කරන බැවින් ඊශ්වරාජ්‍ඨයෙන් නාථ නම් වෙති. දැහැමි කථාවෙන් දැක්වීම් තෙදගැන්වීම් සතුටු කරවීම් නිසා නාථ නම් වෙති. එසේම ප්‍රණිධාන කාලයෙහි පටන් මම මිදී මුදවන්නෙමියි ප්‍රාර්ථනා කළ හෙයින් නාථ නම් වෙති. සත්ත්වහිත පතන බැවින් ද නාථ නම් වෙති. සත්ත්වයන් නිවන් මඟට පමුණුවන හෙයින් නායක නම් වෙති. සන්සුන් කාය වාක් මනෝ ගති යුතු බැවින් සමාහිත නම්. පහවූ රාග දෝස මෝහ ඇති බැවින් වීතරාග වීතදෝස වීතමෝහ නම් වෙති. නිකෙලෙස් බැවින් ගගන මැද පත් උපක්ලෙශයන්ගෙන් මුත් පූන්සඳ මෙන් බබළන හෙයින් නික්කිලෙස නම්.

අෂ්ට ලෝකධම්යෝ කවරහු ද? ලාභ, අලාභ, අයස, යස, නින්දා, ප්‍රශංසා, සුඛ, දුක්ඛ යනු මේ අෂ්ට ලෝක ධර්මවලින් අකම්පිත වූ භාග්‍යවතුන් වහන්සේ නිශ්වාස වාතයෙන් නොසැලෙන මහමෙර මෙන් මඳකුදු කම්පා නොවෙති. ඒ භාග්‍යවතුන් වහන්සේ සුඛ දුක්ඛ ආදියෙහි තාදී වෙති. එහෙයින් ලෝක ධම්යෙන් කම්පා රහිත යයි කියන ලදි. ඊශ්වර ගුණ අට කුමක් ද? අනිමා, මහිමා, ලඝිමා, පත්‍ථිතා, පකාසිතා, ඊසතා, වසිතා, යත්‍රකාමාවසායතා යන අටයි. අනිමා යනු, සියුම් ආත්මභාව නිර්මාණයයි. මහිමා යනු, මහත් ආත්මභාව නිර්මාණයයි. ලඝිමා යනු, වාතය මෙන් ශීඝ්‍ර ගමන් ඇති බවයි. පත්‍ථිතා යනු අන්‍ය ශරීරවලට පිවිසීමයි. පකාසිතා යනු, ප්‍රකට බවයි. ඊසතා යනු, කැමැති විෂය නිර්මාණයයි. වසිතා යනු, ප්‍රාතිහාය්‍ය කිරීමෙහි දක්නා ලැබෙන ආවජ්ජන, සමාපජ්ජන, වුට්ඨාන, අධිට්ඨාන, පච්චවෙක්ඛන යන පඤ්ච වසීභාවයයි. වසිතා යනු,

වසී භාවයයි. යත්‍ර කාමාවසාය යනු අතීතානාගත අනුස්මරණයයි. අෂ්ට ගුණ ඊශ්වරත්වය මෙයයි. එයින් යුක්ත බැවින් අනිමා මහිමාදි අට්ඨගුණ- මිස්සරෙහි සමන්නාගතො යයි කියනු ලැබේ.

දසබල ඤාණ කුමක් ද? ස්ථාන ස්ථාන වශයෙන් ද අස්ථාන අස්ථාන වශයෙන් ද තත් වූ පරිද්දෙන් දනී. අතීත අනාගත වර්තමාන කර්ම සමාදානයන් ස්ථාන වශයෙන් හේතු වශයෙන් තත් වූ පරිදි දනී. සබ්බත්ථගාමිණි පටිපදාව තත් වූ පරිදි දනී. අනෙක ධාතු නානා ධාතු ලෝකය තත් වූ පරිදි දනී. සත්ත්වයන්ගේ නානා අධිමුක්තික තාව තත් වූ පරිදි දනී. පර සත්ත්වයන්ගේ පර පුද්ගලයන්ගේ ඉන්ද්‍රිය පර අපර බව තත් වූ පරිදි දනී. ධ්‍යාන විමෝක්ෂ සමාධි සමාපත්තීන්ගේ සකිලිටි බව ව්‍යවදානය උට්ඨානය තත් වූ පරිදි දනී. පුබ්බනිවාසඤාණය තත් වූ පරිදි දනී. දිබ්බසෝතය තත් වූ පරිදි දනී. ආස්‍රවක්ෂය ඤාණය තත් වූ පරිදි දනී. මේ දස බල ඤාණයි. බුදු රදුන්ගේ චතුර් වෛශාරද්‍යඥාන කුමක් ද? මෙසේය. මහණෙනි, තථාගත විසාරදඤාණ සතරකි. යමකින් යුත් තථාගතයන් වහන්සේ ආසභ ස්ථානය ප්‍රතිඥාකරත් ද පිරිස්හි සිංහනාද කරත් ද බ්‍රහ්ම චක්‍රය පවත්වත් ද ඒ විසාරදඤාණ සතරකි. කවර සතර ද? සම්මා සම්බුදු බව ප්‍රතිඥා කරන ඔබවහන්සේ විසින් අවබෝධ නොකරන ලද මේ ධර්මයෝ ඇතැයි ලෝකයෙහි සහධාර්මිකව චෝදනා කළ හැකි ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ දෙවියෙක් හෝ මාරයෙක් හෝ බ්‍රහ්මයෙක් හෝ නැත්තේය. මහණෙනි, ඊට නිමිති නොදකිමි. එහෙයින් මහණෙනි, ක්ෂෙමව අභයව විශාරදව වාසය කරමි. ක්ෂීණාශ්‍රව බව ප්‍රතිඥාකරන ඔබ වහන්සේගේ මේ ආස්‍රව ක්ෂීණ නොවීයයි -පෙ- අන්තරායකරධර්ම යමක් දේශනා කරන ලද නම් ඒවා ඇසුරු කිරීමෙන් අන්තරායක් නැතැයි කියන -පෙ- යමක් සඳහා ඔබ වහන්සේ ධර්මය දේශනා කරන ලද නම් එය කරන්නහුගේ දුක් නැසීම සඳහා නොවන්නේ යයි කියන -පෙ- බඹෙක් නැත්තේය. එහෙයින් අභයව විශාරදව වාසය කරමි. මහණෙනි, මේ සතර විශාරද ඥානයි.

සම්බුද්ධ ඤාණ කුමක් ද? දුකෙහි ඤාණය, දුක්ඛසමුදයෙහි ඤාණය, දුක්ඛනිරොධයෙහි ඤාණය. දුක්ඛනිරෝධගාමිණි පටිපදාවෙහි ඤාණය, අත්‍ථපටිසම්භිදා ඤාණය, ධම්මපටිසම්භිදා ඤාණය, නිරුත්තිපටිසම්භිදා ඤාණය, පටිභාණපටිසම්භිදා ඤාණය, බුද්ධඤාණය, ශ්‍රාවකයන්ට අසාධාරණ වූ ඤාණ සය කුමක් ද? ඉන්ද්‍රියපරොපරියත්ති ඤාණය, සත්ත්වයන්ගේ ආසයානුසය ඤාණය, මහාකරුණාසමාපත්ති ඤාණය, යමකපාටිහාරිය ඤාණය, සබ්බඤ්ඤුත ඤාණය, අනාවරණ ඤාණයයි.

අටළොස් බුද්ධධම් නම් කුමක් ද? බුදුරජාණන් වහන්සේගේ අතීතංසයෙහි අප්‍රතිහත ඤාණය, එසේම අනාගතංස ඤාණය, පච්චුප්පන්න ඤාණය, මේ තුන් ධර්මයෙන් යුක්ත වූ භාග්‍යවතුන් වහන්සේගේ සියලු කායකර්ම ඤාණපූර්ව ඤාණපරිවර්ත වේ. වාක්කර්මය ද මනොකර්මය ද එසේය. මේ සනුවණින් යුත් භාග්‍යවතුන් වහන්සේගේ ඡන්දහානියක් ධර්මහානියක් වීර්‍ය හානියක් සමාධි හානියක් ප්‍රඥා හානියක් විමුක්ති හානියක් නැත. මේ දොළොස් ධර්මයන්ගෙන් යුත් තථාගතයන් වහන්සේට හානියක් නැත. පලා යාමක් නැත. දන්ධායිත බවක් නැත. අව්‍යාවෘත මනසක් නැත. මේ අටළොස් බුද්ධධම් නමි.

සත්තිස් බෝධිපාක්ෂික ධර්ම නම් කුමක් ද? සතර සතිපට්ඨානය, සම්‍යක්ප්‍රධාන සතරය, ඉද්ධිපාද සතරය, ඉන්ද්‍රිය පසය, බල පසය, බොජ්ඣංග සතය. ආර්‍ය අෂ්ටාංගික මාර්ගයය. මේ සත්තිස් බෝධි පාක්ෂික ධර්මයි. මහතියා අනුභාවෙන සමන්නාගතො යනු, මහානුභාව යනුයි. වෘෂභයෙකු බදු පුරිෂ තෙමේම පුරිසාසභ නමි. තවද ගවයන් සියයකට දෙටු වූයේ උසභයි. ගවයන් දහසකට දෙටුවූයේ නිසභයි. ගවයන් ලක්ෂයකට දෙටු වූයේ දැකුම්කළු සියලු පරිශ්‍රමයන් ඉවසන මහබර දරන හෙණ හඬිනුත් කම්පා නොවන වෘෂභයා ආසභ නමි. මෙහි ලා ඔහුම අභිප්‍රේතයි, පඤ්චංග සමන්නාගත ආසභයා යම් සේ ද පුරිසාසභයාත් එසේය. භාග්‍යවතුන් වහන්සේ සතර සතිපට්ඨාන නම් සිව්පා ඇත්තාහ. සිව් පිරිසිදු සිල් නැමැති නිර්මල පඬෙර

සිරුරු ඇත්තාහ. වීර්‍යය නැමති සුපිරිසිදු වලඟ ඇත්තාහ. පටිවේධඤාණ දේසනාඤාණ නමැති අං යුවල ඇත්තාහ. සමථ විදර්ශනා නමැති දෙනුවන් ඇත්තාහ. මෛත්‍රී දයා නැමැති දෙකන් ඇත්තාහ. අෂ්ට ලෝකධර්ම සෙණහඬින් අකම්පිතව නොතැතිගෙන පහවූ බියෙන් සිව්විශාරද දේශනා නැමැති ගැඹුරු මහගර්ජනා ශබ්දයෙන් අට පිරිස් නැමැති ගවගණ මැද සෝභමාන වෙති. මෙසේ පුරුෂයා වෘෂභයෙකු මෙනැයි පුරිසාසභ නම්. උසභ යනු, ශ්‍රේෂ්ඨාධිකයායි. එහෙයින් නරශ්‍රේෂ්ඨ නරොත්තම යන අර්ථයි. එහෙයින් භාග්‍යවතුන් වහන්සේ මහණෙනි, වෘෂභ යනු අර්හත් සම්‍යග් සම්බුද්ධ තථාගතයන් වහන්සේට විශේෂණයකැයි වදාළහ. නාගයෙකු වැනි පුරුෂයා පුරුෂනාග නම්. මෙහි නාගො යනු, ආගු නම් පාපයයි. එය නොකෙරේහුයි නාග නම් වේ. රාග දොෂ මෝහා දී කෙලශ ඡන්දයට නොයේනුයි නාග නම්. හස්ති නාගයෙකුට සමාන බැවින් ද නාග නම්. උන් වහන්සේ උප්පාද ව්‍යයඤාණ නම් විමල දෙනුවන් ඇත්තාහ. තියුණු ඤාණ දළ ඇත්තාහ. සමථ විදර්ශනා මහකුඹු ඇත්තාහ. සති සම්පජඤ්ඤ නැමැති දෙකන් ඇත්තාහ. සතිපට්ඨාන නමැති සිව්පා ඇත්තාහ. කරුණා ජල පතුරුවන කොපුල් ඇත්තාහ. සුවාසූදහසක් ධර්මස්කන්ධ නමැති රුසිරු කඳ ඇත්තාහ. දඹදිව් තලයෙහි මහජනකාය සනසමින් මෛත්‍රියෙන් පරිභාවිත සද්ධර්ම දේශනා සිසිල් සොඬ දියෙන් විසුරුවමින් අනුන්ගේ ආක්‍රොශ පරිභව නමැති හී සැත් තෝමරාදියෙන් විදින ලදුව ඒ තථාගත හස්ති මහා නාග රාජයා හැසුරුණහ.

> මම දුන්තෙන් විදින ලද හීතල ඉවසන්නාවූ ඇතෙකු මෙන් ආක්‍රොශ පරිභව ඉවසමි. බොහෝ ජනයා දුස්සීලය.

යන අර්ථ වදන් තෙපලමින් ලෝක හිත අර්ථයම සාදනසේක. එහෙයින් නාගයෙකු වැනි පුරුෂයා පුරිෂනාග නම්. ශාස්තෘන් වහන්සේ විසින් අතිකක් ද වදාළහ.

මහණෙනි, හස්තීනාග යනු, තථාගතයන් වහන්සේට විශේෂණයකි. සිංහයෙකු වැනි පුරුෂතෙම යන තන්හි සිංහයෝ සතර

දෙනෙකි. තිණසීහ, කාළසීහ, පණ්ඩුසීහ, කේසරසීහ යනුවෙනි. එහි තිණසීහ නම් සුදු දෙනක මෙන් තණ බුදියි. කාළසීහයා කළු ගොනෙකු බඳුය. තණ කොළ කයි. පණ්ඩුසීහයා පඬුපත් පැහැති දෙනක බඳුය. මස් බුදියි. කේශර සිංහයා වනාහි ලාරසින් පිරිකම් කළාක් වැනි මුහුණින් ද වාලධි කෙළවරින් ද සතර පාදාන්තයෙන් ද යුක්තය. මුදුනෙහි පටන් පැහැදිලි ලාරේඛායෙන් සැරසුවාක් මෙන් තුන් රොදක් පිට මැදින් ගොස් තුනටියෙන් දකුණට කැරකී සිටී. ඔහුගේ කඳෙහි ලක්ෂයක් අගනා කම්බිලියකින් වට කළාක් මෙන් කේශර සහිත වේ. සෙසු තැන් සුදෝ සුදු හැල්පිඬු මෙන් ද සක් සුණුපිඬු මෙන් ද වේ. මේ කේශරසිංහ නමි. ඔහුට ජාතිසීහ කියා ද කියනු ලැබේ. මෙහි අදහස් කරන ලද්දේ ඔහුය. භාග්‍යවතුන් වහන්සේ ගිරිගුහාවකින් නික්මුණු කේශර සිංහයෙකු මෙන් ධර්මාසනයෙහි සිට විශාරදව සද්ධර්ම දේශනා සිංහනාද පවත්වති.

භාග්‍යවතුන් වහන්සේ මහණෙනි, මෘගරාජ සිංහයා සවස් වේලෙහි ගුහායෙන් නික්මෙයි. නික්ම ඇඟ සලයි. සලා හාත්පස සිවු දිශාව බලයි. බලා තෙවරක් සිංහනාද කරයි. සිංහනාද කොට ගොදුරු පිණිස යයි. මහණෙනි, තිරිසන් ගත යම් ප්‍රාණීහු වෙත් ද ඔවුහු මෘගරාජ සිංහයාගේ ශබ්දය අසා බෙහෙවින් බියට සංවේගයට සන්තාපයට පත්වෙති. බිල්හි වසන්නෝ බිල්වලට වදිති. දියෙහි වසන්නෝ දියට පිවිසෙති. පක්ෂීහු අහසට නගිති. මහණෙනි, ගම් නියම්ගම් ජනපද රාජධානිවල බැඳ සිටී ඇත්තු බැමි කඩා කැළඹී මළ මු පහකරමින් ඒ මේ අත දුවති. මහණෙනි, තිරිසන් ගත සතුන් අතර මෘගරාජ සිංහයා මෙසේ මහර්ද්ධිමත්ය, මහානුභාව සම්පන්නය. එමෙන් මහණෙනි, තථාගත අර්හත් සම්මාසම්බුද්ධ විජ්ජාචරණසම්පන්න සුගත ලෝකවිදූ අනුත්තර පුරිසදම්මසාරථී වූ දෙව් මිනිසුන්ට ශාස්තෘ වූ බුද්ධ භගවත් තථාගතයන් වහන්සේ ලොව උපදිති. උන්වහන්සේ දෙවියන් සහිත මරුන් සහිත බඹුන් සහිත මහණ බමුණන් සහිත දෙවිමිනිසුන් සහිත මේ ලෝකය තමන් වහන්සේ අභිඥාවෙන් ප්‍රත්‍යක්ෂ කොට දන්නා සේක. උන්වහන්සේ මුල කලණ මැද අග කලණ අර්ථවත් ව්‍යඤ්ජනවත් සර්ව්‍රකාරයෙන් පිරිපුන්

පිරිසිදු බඹසර දේශනා කරනසේක. මේ රූපයයි. මේ රූප සමුදයයි. මේ රූප අස්තංගමයයි. -පෙ- මේ විඤ්ඤාණ අස්තංගමයයි කියායි.

මහණෙනි, යම් ඒ දීර්ඝායුෂ්ක පැහැපත් සැප බහුල උස් විමන්-වල බොහෝ කල් වසන දෙවියෝ වෙත් ද ඔවුහු තථාගතයන් වහන්සේගේ දහම් අසා බෙහෙවින් සංවේගයට බියට සන්ත්‍රාසයට පත් වෙති. පින්වත්නි, ඒකාන්තයෙන්ම අනිත්‍යවූම අපි අනිත්‍ය නොවෙතැයි සිතුවෙමු. ඒකාන්ත නොවූම අපි ඒකාන්තයයි සිතු වෙමු. අශාස්වතවූ අපි ශාස්වතයයි සිතීමු. තෙමේම භවත්නි, ඒකාන්තයෙන්ම අනිත්‍ය වේ. ඒකාන්ත නොවෙයි, විපරිණාම ස්වභාව ඇත්තෝ වෙමු කියාය. මහණෙනි, තථාගතයන් වහන්සේ දෙවියන් සහිත ලෝකයෙහි මෙසේ මහර්ධිමත් මහානුභාව සම්පන්න වෙති. මෙසේ සීහනාදයට සම බැවින් සීහ වෙති. සීහපුබ්බද්ධකාය හා සම බැවින් සීහයි. සීහහනු සමාන බැවින් සීහයි. සීහවිලාස සමාන විලාස සම්පන්න බැවින් සීහයි.

නැතහොත් සිංහයා ඉවසීමෙන් ද නැසීමෙන් ද යම් සේ සිංහයයි කියනු ලැබේ ද එසේ තථාගත සිංහයාණෝ ලෝකධර්ම ඉවසීමෙන් ද පරප්‍රවාද නැසීමෙන් ද සිංහයයි කියනු ලැබේ. යම්සේ සිංහයා සිංහ බලයෙන් යුතුව සියලු තැන්හි විශාරදව ලොමු දැහැ ගැනීම් රහිතව මෘග සමූහයා මැද සිටී ද එසේ තථාගත සිංහයාණෝ තථාගතබල සමන්නාගතව කැත් පිරිසෙහි හෝ බමුණු පිරිසෙහි හෝ ගහපති පිරිස්හි හෝ මහණ පිරිස්හි හෝ සවිමහරජ පිරිස්හි හෝ තව්තිසා පිරිස්හි හෝ මරපිරිස්හි හෝ බඹ පිරිස්හි හෝ මේ අට පිරිස්හි සැමතැන විශාරදව රෝමෝද්ගම රහිතව නානා දේශනා විලාස සම්පන්නව සිංහනාද කරති. මෙසේ සර්‍වාකාර සම්පූර්‍ණ හෙයින් ජිනවරසීහ නම් වන්නාහ. සිංහයෙකු වැනි පුරුෂයා පුරුෂසිංහ නමි. උතුම් වූයේ ද පුරුෂවූයේ ද පුරිසුත්තම නමි. ලොව උපදින උත්වහන්සේ අදුනියව තනිවම උපදනාහ. අපරිමිත කාලයෙහි රැස් කළ පුණ්‍ය සම්භාර බලයෙන් උපන් ශරීර ඇතිව පරමාශ්චර්යව අද්භූත සම්පන්නව පොළොතෙලෙහි පටන් අවීචිය කෙළවර කොට

ඇති යට ද උපරි භවාග්‍රය ද සරස අපරිමාණ ලෝක ධාතුවල ද රූපයෙන් හෝ ගුණයෙන් හෝ තථාගතයන්ට සමවූවෙක් නැත. උත්තරීතරයෙක් නම් කොයින් ද? එහෙයින් මේ භාග්‍යවතුන් වහන්සේ පුරිසුත්තම යයි කියනු ලැබේ.

අභිරූපො යනු, පුණ්‍යසම්භාර ඵලයෙන් යුක්ත වන බැවින් අතිශයින් රූමත්ය. ඒ භාග්‍යවතුන් වහන්සේගේ රූපය තමන් වහන්සේම චිණ්නා කරමින් මහණෙනි, පුණ්‍ය විපාකය එළඹ සිටියේ ප්‍රිය වෙයි. යම් දිසාංගයන් නිසා සුන්දර වන්නේ නම් ඒ අංග දීර්ඝව පිහිටයි. යම් කෙටි අංග නිසා සුන්දර වන්නේ නම් ඒ අංග කෙටිව පිහිටයි. යම් අංග මහත්වීම නිසා සුන්දර වන්නේ නම් ඒ අංග මහත්ව පිහිටයි. එහෙයින්,

> ලෝකයෙහි ප්‍රතිභාසම්පන්න මහර්ධිමත්හු සිටිත් නම් ඔවුන් එක්ව මුනීන්ද්‍රයන් වහන්සේගේ යථා ස්වභාව රූපය නිර්මාණය කරත් නම් සියලු ශිල්ප දක්වා සියලු ශිල්ප කැටි කළත් සලකුණු මාත්‍රයකටවත් නොපැමිණෙයි. එසේ කල බුදුරුවක් කෙසේ නම් කරන්නේ ද? මෙලොව සුගත රූපයක් තැනීමට සමත් බුදුවරයන් වහන්සේ නමක් හැර අන් කිසිවෙක් නැත්තේ ය. කළ කෙනෙක් හෝ කරන කෙනෙක් හෝ මතු කරන්නෙක් හෝ නැත්තේය.
>
> එහෙයින් බුද්ධ දේහයෙහි යම් ලක්ෂණ ඇත්තේ ද ඒ එකිනෙක සිය පින් බෙලෙන් හටගත්තේය. දෙතිසක් පමණ ගුණයෙන් යුත් ඒ බුද්ධ රූපය අසමයයි කියනු ලැබේ.

මෙසේ අභිරූප වූ භාග්‍යවතුන් වහන්සේ මහජන සිත් පහදවානුයි පාසාදික නුමි. දැකීමට යෝග්‍ය හෙයින් දස්සනීයය. ප්‍රසාද සෞම්‍ය ඇස් දල්වා උන්වහන්සේ දැකීම ද බහූපකාර වෙයි. නොයෙක් සිය ගණන් ආත්මභාවවල ඇස්වල රෝගයක් හෝ දෝෂයක් හෝ කිළුටක් හෝ පණුවෙක් හෝ ඇති නොවේ. මිණි විමනක විවෘත කවුළුවක් මෙන් පසාදප්‍රසාද යුත් ඇස් ඇති වේ. බුදුන් දැකීමෙහි මේ විපාකයි. එහෙයින් භාග්‍යවතුන් වහන්සේ

දර්ශනීය වෙති. පරම වණ්ණ සෞන්දර්යයෙන් සමන්නාගත වෙති. සොඳුරුබව පොක්ඛරතායයි කියනු ලැබේ. වණ්ණපොක්ඛරතාය යනු, වණ්ණ සම්පත්තිය යන අර්ථයි. නොඑසේ නම් පොක්ඛරං යනු ශරීරයයි. වණ්ණං යනු, වණ්ණයයි. මෙසේ වණ්ණං යනු ද පොක්ඛරං යනු ද වණ්ණපොක්ඛර වෙයි. ඒ වණ්ණපොක්ඛර බව වණ්ණ-පොක්ඛර තාවයි. තවද අර්ථයකි. අභිරූපො යනු, අන් දෙවිමිනිසුන්ට වඩා අධිකතර රූප ඇත්තේ යනුයි. දස්සනීයෝ යනු, දවසම බලා සිටිනවුන්ට ද අතෘප්තිකරය යන්නයි. දැකීමෙන්ම සිත පැහැදවීම් ඇති කරන්නේ පාසාදිකයි. පරමාය වණ්ණපොක්ඛරතාය සමන්-නාගතො යනු, උතුම් සුපිරිසිදු වණ්ණයෙන් ද ශරීර සලකුණු සම්පත්තියෙන් ද යුක්ත වූයේය යන අර්ථයි. සමන්තභද්දකො යනු, ඇම තන්හි සොඳුරු බවයි. මිත්‍ර අමිත්‍ර මැදහතුන් විසින් පවත්වනු ලබන මෙත් සිත් ඇත්තේ යනුයි. යම් කිසිවෙක් බුද්ධ රූපය දැක සිය ශක්තිය යොදා විවිධ උපායෙන් ඒහා සමාන වස්තුවක් ගැනීමට නොහැකි වෙයි. භාග්‍යවතුන් වහන්සේගේ දර්ශනය අප්‍රමාණ බව මෙහි දැක්වේ.

දෙතිස් මහාපුරුෂ ලක්ෂණ කවරේ ද? ඒ භාග්‍යවතුන් වහන්සේ සුප්පතිට්ඨිතපාද වෙති. ආයතපණ්හි, දීඝංගුලි, මුදුතළුණහත්ථපාද, ජාලහත්ථපාද, උස්සංඛපාද, ඒණිජංඝා යන ලක්ෂණවලින් යුතු වෙති. සිටි වනම නොනැමී දෙඅත්ලෙන් දෙදණ පිරිමදිති. කොසොහිත වත්ථ ගුය්හ වෙති. සඩ්ණිවණ්ණ වෙති. රන් පැහැ සම් ඇත්තාහ. සියුම් සිවි ඇත්තාහ. සියුම්සම නිසා සිරුරෙහි රජස් දැලි නොතැවරේ. ඒකේකලෝම වෙති. ලෝම කූපයෙහි එකම ලෝමයක් වෙයි. උද්ධග්ගලෝම වෙති. උඩු අක් ඇති ලෝම අඳුන් පැහැයෙන් කුණ්ඩලාකාරව දකුණට කැරකී ඇත. බ්‍රහ්මුජ්ජුගත්ත. සත්තුස්සද, සීහ පුබ්බද්ධකාය චිතංත රංස, නිග්‍රොධපරිමණ්ඩල ලක්ෂණයන්ගෙන් ද සොභමාන වෙති. උන් වහන්සේගේ ශරීරය යම් පමණ ද බඹය ද එපමණම වෙයි. සමවත්තක්ඛන්ධ, රසග්ගසග්ගි, සීහහනු, චත්තාලීස දන්ත, සමදන්ත, අවිවරදන්ත, සුසුක්කදාඨ, පහුතජිව්හා, කරවීකභාණි, බ්‍රහ්මස්සර, අභිනීලනෙත්ත, ගොපඛුම වෙති. සුදුමුදු පුළුන් රොදක්

වන් ඌර්ණය බැම අතර වූයේය. උණ්හීසසීස වෙති. මේ දෙතිස් මහා පුරුෂ ලක්ෂණයි.

අසීති අනුව්‍යඤ්ජන කෙසේ ද? ඒ භාග්‍යවතුන් වහන්සේ තුංගනඛ, තම්බනඛ, සිනිද්ධනඛ, පටිච්ඡන්නසීස, වට්ටංගුලි, චිතංගුලි, අනුපුබ්බංගුලි, සමථුල්ලපාද, අව්සමපාද, සිනිද්ධහත්ථපාද, තම්බහත්ථපාද, ථුල්ලඵස්සපණ්හි, සමතුස්සාදනලේඛා, ගම්භීර ලේඛා, ආයතලේඛා, අබ්භොච්ඡින්නලේඛා, අනුපුබ්බලේඛා, ලම්බහනු, ථුල්ලගෝපඛ, පරිපුණ්ණජාණුමණ්ඩල, සමන්තපාසාදික, පරමවිසුද්ධපභා, සීහ-වික්කන්තචාර, නාගවික්කන්තචාර, උසභවික්කන්තචාර, හංස-වික්කන්තචාර, අව්සමචාර, පදක්ඛිණාවත්තමාන, පරිපුණ්ණව්‍යඤ්ජන, සුචිගත්ත, කුටිසෝදර, අනුත්තානොදර, තම්බමුඛ, පීණගණ්ඩ, අව්සමගණ්ඩ, විගත ගණ්ඩ දොස, අනු පක්කුට්ඨඉන්ද්‍රිය. අනිඳ්ඛිත්තින්ද්‍රිය, සුචින්ද්‍රිය, තම්බජිව්හා, අනුපමපද, ගජගජ්ජිතසර, සුමධුරමංජු ඝොස, පරිපුණ්ණඝොතින්ද්‍රිය, අසීති කේස, සමන්තකේස, අසන්තංගතකේස, අලුලිතකේස, නිප්පතකේස, සුකේලිතකේස, අඵලිත කේස, දක්ඛිණා-වත්තකේස, මේ අසීති අනුව්‍යඤ්ජන නම් වේ. භාග්‍යවතුන් වහන්සේ මෙසේ දෙතිස් මහා පුරුෂ ලක්ෂණයෙන් අසීති අනුව්‍යඤ්ජනයෙන් විසිතුරු රූපකායයෙන් නානා වණ්ණයෙන් හෙබි නීල පීත ලොහිත ඕදාත මංජෙට්ඨ ප්‍රභාවස්වර යන සවනක් රසින් බබළන දේහ ඇතිව දෙව්දුනු පැහැති රුසිරු කේතුමාලායෙන් වළඳනා ලද හිස් පෙදෙස් ඇතිව දොළොස් රියන් පමණ බ්‍යාමප්‍රභායෙන් සමලංකෘත සකලාංගයෙන් යුතුව අතිශයින් බබළන සේක.

> සුපිපි සාලරාජයෙකු වැනිවූ ද අහස්කුස සඳමඩල වැනිවූ ද මධ්‍යාහ්න සූර්‍යයා බඳුවූ ද නරොත්තමයන් වහන්සේ බබළන සේක.

එහි සුථුල්ලසාලරාජං යනු, සෘජු මහත් දිග් කඳින් නැගුණු අතු පැළයෙන් සිසිල් මූලපටන් අග දක්වා සුපිපි සාලරාජයායි. මෙසේ සීල නැමැති මුල් සමාධි නැමැති කඳ ප්‍රඥා නැමැති අතු අභිඤ්ඤා නැමැති මල් විමුක්ති නැමැති ඵල සහිත බුද්ධ මහාසාල

රාජයාණෝ බබළති. චන්ද්‍රයා ගගනෙ යථා යනු, යම්සේ වලාකුළු මිදුම් රජස් රාහු යන උපක්ලෙශයන්ගෙන් මිදුණු එකුත් පනස් යොදුන් වූ අහස්හි බබළන පුන්සඳ මඬලයි. මෙසේ සදාකල්හි කෙලෙසුන්ගෙන් මුත් අනන්ත මෛත්‍රී ආලෝකයෙන් සවනක් රස් සමූහයෙන් වටවූ නිමල අනාවරණඥාණයෙන් පිරිපුන් මඬුලු ඇති මුදිතා භාවනාවෙන් ජනිත සෞම්‍ය සුභාව ඇති කරුණා සීතල රශ්මියෙන් විනේය ජන නැමැති කුමුදු පුබුදු කළ තථාගත සඳමඬල බැබළීය. මජ්ඣන්තිකෙ ච සුරියං යනු, මධ්‍යාහ්න වේලෙහි බබළන පිරිපුන් පනස් යොදුන් ඉර මඬලයි. ඤාණ තේජසින් අවිද්‍යාන්ධකාර නසා ඇති දේ දක්වන ඤාණාලෝකයෙන් විනේයජන පියුම් පුබුදාලන බුද්ධ දිවාකරයන් වහන්සේ දෙස බැලීය. නරාසභං යනු, නරඋසභ බුද්ධ වීරයන් වහන්සේයි. දසබල ජිනවරයන් වහන්සේ දෙස බැලීය.

පිරිනිවන් කථාවෙහි භාග්‍යවතුන් වහන්සේ විශාලාව සමීපයෙහි බේළුව ගම්හි පශ්චිම වස විසූහ. එහිදී ක්‍රෑර ඵරුෂ විසභාග අතිශයින් බලවත් අබාධයක් හටගත්තේය. මාරණන්තිකා යනු, මරණයට සමීප, සත්‍ථා සතෝ සම්පජානෝ අධිවාසෙසි යනු, සිහිය මනාව පිහිටුවා නුවණින් පිරිසිඳ දැන ඉවසූහ. අවිහඤ්ඤමානෙන යනු, කී පරිදි වේදනාවෙන් ඔබ මොබ නොපෙරළෙමින් දුක් නොවෙමින් ඉවසූහ. විරියෙන යනු, පූර්වභාග වීර්‍යයෙන් සහ ඵල සමවත් වීර්‍යයෙනි. පටිනාමෙත්වා යනු, යටපත් කොට. සංඛාරං යනු, මෙහි ජීවිත පටිසංඛාරයයි. යමකින් ජීවිතපටිසංඛරණය කරයි ද, කැඩෙන දෙය සම්බන්ධ කොට තබයි ද ඒ ඵල සමාපත්ති ධර්මය ද ජීවිත සංඛාර නමි. මෙහි ලා එය අදහස් කරන ලදි. එය අධිෂ්ඨාන කොට. මධුරකජාතො විය යනු, ස්වාමීනි, මාගේ මේ ශරීරය හටගත් තදබර කමින් උලෙහි හිඳවූවාක් මෙනි. දිසාපි මෙ න පක්ඛ්‍ඛායති යනු, නොවැටහෙයි. නොයෙක් කාරණා නිසා එළඹ නොසිටී. ධම්මානි මෙ නප්පටිභන්ති යනු, සතිපට්ඨානාදි ප්‍රකට ධර්මයන් ද මට නොවැටහෙයි. ආයු සංස්කාර අත් හැරීමෙහි මහාභූමිචලනයක් මහපොළොව කම්පාවක් හුදෙක් එක් සක්වළක පමණක් නොවෙයි. එකල්හි දසසහස්‍රී ලෝකධාතුව කම්පා විය. ප්‍රකම්පා විය. හිංසනකො යනු,

භයභීතකරවූ, දේවදුන්දුභියො ඵලිංසු යනු, දෙව්බෙර අහසෙහිම වැටුණේය. සුක්ඛගජ්ජිතං ගජ්ජි යනු, නොකල් විදුලිය නික්මිණ. ඛණිකා වැසි වැස්සේයයි කියන ලදි. හිරඤ්ඤවතී නදියෙන් එතෙර මල්ල රජවරුන්ගේ සල්වන උයන උපවත්තනයයි. කුසිනාරාවෙහි නැගෙනහිරට ගොස් උතුරට හැරුණු කල ඇති නිසා උපවත්තන යි කියන ලදි. අන්තරෙන යමකසාලානං උත්තර සීසකං යනු, ඒ ඇදෙහි හිස පැත්තෙන් එක් සල් ගසක් වෙයි. පා පසින් එකක් වෙයි. ඉන් එක් තරුණ සල්ගසක් හිස ළඟ ද එකක් පා ළඟ ද වෙයි. යමක සල් නම් මුල කඳ ශාඛා අංකුර පත්‍ර එකිනෙක වැළඳගෙන පැවැති සල්ගස් යනුයි.

විහාරො යනු, මණ්ඩලමාල විහාරය අභිප්‍රේතයි. කපිසීසකං යනු, දොරබා කෙළවර ඇති අගුළු දණ්ඩයි. එහි ඵල්බ හඬමින් සිටියේය. මෙත්තෙන කායකම්මෙන යනු, මෙත් සිත් වශයෙන් පැවැත් වූ මුව දොවනාදි කායකර්මයෙනි. හිතෙන යනු, හිත වැඩ කැමැත්තෙනි. සුඛෙන යනු, සොම්නස් මුහුණිනි. අද්වයෙන යනු, දෙපැත්තක් නැති. මෙසේයි. කිඳිවෙක් ඉදිරියෙහිම කෙරෙති. කිසිවෙක් අනභිමුඛයෙහිම කරති. අභිමුඛයෙහි නොකරති. මෙසේ බෙදා නොකිරීමෙනැයි කියන ලදි. අප්පමාණෙන යනු, ප්‍රමාණ රහිතවයි. එහෙයින් සක්වළ ද බාදා සහිතය. භවාග්‍රය ද ඉතා පහත්ය. ඔබ විසින් කරන ලද කාය වාක් මනඃ කර්ම බහුලයයි දක්වති. එහි කුඩ්ඩනගරකෙ යනු, නගරප්‍රතිරූපක ප්‍රාසාද ඇති කුඩානගරයයි. උජ්ඣංගල නගර සාඛා නගර යනු, යම්සේ ගසක කුඩා අතු ඇත්තේ ද එමෙන් වෙනත් මහා නගරවල ශාඛා වැනි කුඩා නගරයෙක්හි.

ඛත්තියමහාසාලා යනු, මහාසාර බවට පත් මහා භොගස්කන්ධයන්ගෙන් සමන්විත යන අර්ථයයි. ක්ෂත්‍රිය මහා සාරයෝ නම් කෙළ සියගණන් කෙළ·ලක්ෂගණන් ධනය නිධන් කොට ඇත්තේය. දවස දවස වියදම එක් කහවනු ගැලකි. සවස ගැල් දෙකක් ගෙට එයි. බ්‍රාහ්මණමහාසාරයෝ නම් අසූ කෙළක් ධනය නිධන් කොට ඇත්තාහු වෙති. දවස පිරිවැය එක් කහවනු කුම්භයකි. සවස කහවනු

ගැලක් ගෙට පිවිසෙයි. ගෘහපති මහාසාරයෝ තම් සතලිස් කෙළක් ධනය නිධන් කොට ඇත්තෝය. දවසෙහි වියදම කහවනු අමුණු පන්සියයකි. සවස කහවනු කුම්භයක් ගෙට එයි. ආනන්ද, කුඩා නගරය කැයි මෙසේ නොකියන්න. -පෙ- ආනන්ද, මම ද මේ නගරයෙහි සම්පත් ප්‍රකාශ කිරීමට නොයෙක් වර හිඳිමින් සිටිමින් මහත් උත්සාහයෙන් දැඩි වීර්‍යයෙන් මෙහි පැමිණියෙමි යි වදාරා භූතපුබ්බං යන ආදිය වදාළහ. ආනන්ද, මේ පෙදෙසෙහි සවරක් ශරීරය බහාලූ බව දනිමි. එද සත්තරතනයෙන් යුත් සක්විති රජවම කළෙමි. මේ සත්වන ශරීරය බහා තැබීමයි. ආනන්ද, තථාගතයන් වහන්සේ අටවරක් ශරීරය බහාලූ තැනක් දෙවියන් සහිත ලෝකයෙහි මම නොදකිමි.

සුභද්දො පරිබ්බාජකො යනු, හෙතෙම වනාහි ප්‍රකට බමුණු මහාසාර කුලයකින් පැවිදි වූවෙකි. කංඛාධම්මො යනු, විපරීත ධර්මයයි. කුමක් හෙයින් අද මෙසේ කියන ලද්දේ ද? එබඳු නිශ්‍රයයක් ඇති බැවිනි. පෙර පින් කරන කාලයෙහි සොහොයුරෝ දෙදෙනෙක් වූහ. වැඩිමලා මහාකාළ නම්. බාලයා චුල්ලකාළ නම්. ඔවුහු එක්ව ගොවිතැන් කළහ. බණ්ඩි කාලයෙහි වැඩිමලා බාලයා සමඟ සාකච්ඡා කළේය. සොහොයුර, බුදුන්ට සත්කාර කිරීම අපට පැවරී ඇත. අපි උන්වහන්සේට කෙසේ සත්කාර කරමුදැයි කියායි. සොහොයුර, ඔබම කියන්න. එසේ නම් ඔබ මාගේ අදහස් පරිදි කරන්න. අපගේ සොළොස් කිරියක් පමණ කුඹුරෙහි බණ්ඩි හැල් ඇත. ඒ හැල් බණ්ඩි පළා බුදුන්ට සුදුසුසේ පිස දන් දෙමුයි කීහ. බාලයා මෙසේ කීය. තරුණ ගොයම් නසනු කැමැත්තෙහි ද? එසේ කිරීමෙන් කාටත් පලක් නැත. ඊට මාගේ කැමැත්තක් ද නැත. එසේ නම් සොහොයුර, ඔබේ කොටස ඔබ රැක ගන්නැයි සොළොස් කිරියක් පමණ කුඹුර මැදින් බෙදා අට කිරියක් සීමා කොට තමා සන්තක හැල් බණ්ඩි බොහෝ දෙනා සමඟ පළා ගෙට ගෙන ගොස් නොයිදුල් කිරෙන් පිසීය. කුමක් හෙයින් හැල්බණ්ඩි පිදීමෙහි මහත් උත්සාහයක් දැරී ද? ඔහු දිනක් කුඹුරට ගොස් එක් හැල් බණ්ඩියක් ගෙන එය පළා ටිකක් කෑවේය. එය ඉතා රසවත් විය.

ඔහු මෙසේ සිතීය. මේ හැල් බණ්ඩි බෙහෙවින් රසවත්ය. මෙය මා බුදුන්ට සුදුසු සේ පිස පිදිය යුතු වන්නේය. මාගේ මේ දානය, කිසිවෙකුත් නොදුන්නකැයි. අන්‍යයෝ කියති. මෙසේ සිතා එය පිස චතුමධුර බහා විපස්සි. සම්මා සම්බුදුන් ප්‍රමුඛ අටසැට දහසක් හික්ෂූන්ට පුදා ස්වාමීනි, මගේ මේ අගසස් දානය අග්‍රධර්මය හැමට පළමුව අවබෝධ කිරීම පිණිස පවතීවායි පැතීය. එකෙණෙහි ඒ හැල් බණ්ඩි පළාගත් තැන් සම්පූර්ණ වූයේමය. ඒ දුටු මහාකාළ සතුටු සොම්නස්ව පින් කෙතෙහි දුන් දනෙහි විපාක මෙලොව දීම දිටිමි. ලෝකයෙහි පින්කෙතෙහි පිදූ දාන විපාකය මහත්යයි උදන් ඇනීය. මෙසේ හෙයින් කවරෙක් නම් දන් නොදෙන්නේ ද? කවරෙක් නම් දන්පල නොඅදහන්නේදැයි සිතා සැදැහැයෙන් පැසෙන කාලයෙහි පුටුකග්ග දානය ද දුන්නේය. කපන කාලයෙහි සයනග්ග දානය ද උප්පිඩි කරන කාලයෙහි චේනග්ග දානය ද කලාප කරන කාලයෙහි කලාපග්ග දානය ද කමතට ගන්නා කල්හි බලග්ග දානය ද මඩින කල්හි මද්දග්ග දානයද කමතින් ගෙනියන කල්හි බල-හණ්ඩග්ග දානය ද කොටු පුරවන කාලයෙහි කොට්ඨග්ග දානය දැයි එකම ශස්‍යයෙහි බුදුපාමොක් බික් සඟනට නව අගහස් දනක් දුන්නේය.

ඒ ශස්‍යය අඩුවක් නැතිව වඩාත් සමෘද්ධිමත් විය. බුදුවරු ලෝකයේ සිටින තාක් ඒ ශස්‍ය රැඳෙන්නේමය. ඔහුගේ බාල සොහොයුරු චුල්ලකාළ ඒ අසිරිය දැක හටගත් ශ්‍රද්ධාවෙන් බික් සඟුන් සහිත භාග්‍යවතුන් වහන්සේට දන් දී ස්වාමීනි, මාගේ සොහොයුරු තෙම අගසස් දන් දී අගදහම් පැතීය. මාගේ මේ පසු දන අනාගතයෙහි අවසාන කාලයෙහි අවසන් ධර්මාවබෝධයට හේතු වේවායි ප්‍රාර්ථනා කළේය. වැඩිමල් කෙළෙඹි තෙම දිවි හිමි කොට දානාදි පූජා පවත්වා ආයු කෙළවර දෙව්ලොව උපන්නේය. හෙතෙම එක් අනූකපක් දෙවි මිනිසුන් අතර සැරිසරා අප බුදුන් උපන් කල්හි පඤ්චවර්ගීයයන්ට ප්‍රමුඛ කොණ්ඩඤ්ඤ නම් ව ඉසිපතනයෙහි භාග්‍යවතුන් වහන්සේ දෙසූ දම්සක් සුතුර අවසානයෙහි පළමුවම අටළොස් කෙළක් බඹුන් සමඟ සෝවාන් පෙලෙහි පිහිටියේය.

ඉක්බිති ශාස්තෘන් වහන්සේ මා විසින් දුකසේ ගෙන එන ලද ධර්මය පළමුවම දැන ගත්තේයයි මේ තෙම අඤ්ඤාකොණ්ඩඤ්ඤ නමැයි උන් වහන්සේ අමතා දස දහසක් සක්වළ දෙවිගණ මැද අඤ්ඤාසි වත හො කොණ්ඩඤ්ඤා අඤ්ඤාසි වත හො කොණ්ඩඤ්ඤා යි වදාළ සේක. එවක් පටන් අයුෂ්මත් කොණ්ඩඤ්ඤ තෙරුන්ට අඤ්ඤාත කොණ්ඩඤ්ඤ කියාම නම් විය.

බාල සොහොයුරු චුල්ලකාළ කුසිනාරාවෙහි ප්‍රකට බමුණු මහසල් කුලයකින් පැවිදිව සුභද්ද පරිබ්‍රාජක නම් විය. පෙර කල හෙතෙම පසුව දන් දුන් බැවින් බුදුන් පිරිනිවෙන කල්හි උන්වහන්සේ දකිනු කැමැතිවිය. එහිදී සුභද්ද සම්‍යග් සම්බුද්ධ ශාස්තෘන් වහන්සේ දුන් කමටහන් ගෙන අසුනින් නැගී බුදුන් වැඳ උයන්හි පසෙක රුක් මුලෙක්හි ඉඳ කය කෙළින් තබා සිහි පෙරදැරි කොට තම සිරුරෙහිම තම පඤ්චස්ඛන්ධයෙහිම අනිච්චං දුක්ඛං අනත්තායි තිලකුණු නංවා උපකෙලශයන්ගෙන් මිදුණු විදර්ශනා ඉපදවීය. උදයව්‍යය ඤාණය උපදනාකල්හි පහන් සිලක් මෙන් උපදී. අලුතින් අලුතින් ඉපිද පැරණි පැරණි උපන් දේ සිදෙයි. එමෙන් නව නව ස්කන්ධ ඉපිද පැරණි පැරණි ස්කන්ධ බිදීයයි.

මෙසේ මේ ධර්මයෝ නූපන් ධර්මයෝ උපදිති. උපන් ධර්මයෝ නිරුද්ධ වෙති. අලුත් අලුත්ව සංස්කාර එළඹ සිටී. නිත්‍ය නොවන්නේය. හිර උදාවෙහි පිනිබිඳු මෙන් අස්ථිරය. දිය බුබුළු මෙන් අසාරය. දියෙහි ඇඳි ඉරි මෙන් තාවකාලිකය. අලාතචක්‍ර ගාන්ධර්වනගර මෙන් බොහෝ පරිවර්තනාකාරව වැටහෙයි. මෙසේ ප්‍රථම තරුණ විදර්ශනාඥානය අවබෝධ කරන ලද්දේ වෙයි. උදයබ්බයානුපස්සනා ඤාණයට අනතුරුව සියලු සංස්කාරයන්ගේ බය වය භේද සහිත නිරෝධාරම්මණ භංගානුපස්සනා ඤාණය උපදී. අනතුරුව සියලු සංස්කාරයන්ගේ උප්පාද ඨිති පවත්ති නිමිත්ත විසඳා භේදයම දකී. එවිට ජීවත් වනු කැමැති බියගුලු පුරුෂයෙකුට සිංහ ව්‍යාඝ්‍ර දිවි වලස් යක්ෂ රාක්ෂස සැඩබලු මතැත් ගොර සපුන් සොහොන් දිලියන අඟුරුවළ ආදිය මෙන් බිය දැනේ. ඔහුට අතීත සංස්කාර නිරුද්ධය.

වර්තමාන සංස්කාර නිරුද්ධවේ. අනාගතයෙහි නිරුද්ධ වන්නේ යයි දක්නහුට භයතුපට්ඨාන ඤාණය උපන්නේ වෙයි. භයතුපට්ඨාන ඤාණය ඇසුරු කරන ඔහුට තුන් භවය දිලියෙන අඟුරුවලින් පිරුණු තැනක් මෙන් වැටහෙයි. මෙයින් සංවේගයට පත්ව හාත්පසින් ආදීනවම දනී. එපරිදි තෙරුන් වහන්සේ හාත්පසින් රස රහිත ආස්වාද රහිත ආදීනවම දකිති.

ඒ ආදීනව ඤාණය උපන් කල්හි සියලු සංස්කාරයන්ගේ ආදීනව දකිමින් එහි කලකිරෙයි. උකටලී වෙයි. නොඇලෙයි. චිත්‍රකූටයෙහි ඇලුනු සඞ්ඝ හංසරාජයෙක් අසූචි වළක නොඇලී සත් මහවිල්හිම ඇලෙන්නාක් මෙන් මේ තෙරුන් වහන්සේ නිවන් නසන්නාවූ සංස්කාරයන්හි නොඇලෙති. සත් අනුපස්සනාවන්හිම ඇලෙති. එකෙණෙහිම නිබ්බිදාඤාණය උපදී. නිබ්බිදානුපස්සනා-ඤාණයට අනතුරුවම සියලු සංස්කාරගතයන්ගෙන් මිදෙනු කැමැතිවෙති. නික්මෙනු කැමැති වෙති. දැලකට අසු වූ මසෙකු මෙන් සර්පමුඛයට පත් මැඩියෙකු මෙන් කුඩුවක දැමූ වලිකුකුළකු මෙන් දැඩි බැම්මකට පත් මුවකු මෙන් අහිකුණ්ඨිකයෙකුට අසුවූ සර්පයෙකු මෙන් මහමඩෙහි එරුණු ඇතෙකු මෙන් ගුරුළකුට අසුවූ නාගයෙකු මෙන් රාහු මුඛයට පත් චන්ද්‍රයා මෙන් එයින් මිදෙනු කැමැති වෙති.

මෙසේ ඒ ආයුෂ්මතුන්හට ද සියලු සංස්කාරයන්ගෙන් මිදෙනු කැමැත්තම ඇතිවිය. එකෙණෙහි මුඤ්චිතුකාමතා ඤාණය උපදී. මුඤ්චිතුකාමතා ඤාණයට අනතුරුව පටිසංඛාරානුපස්සනා ඤාණය උපදී. නැවත ඒ සංස්කාරයන්හි පටිසංඛාරානුපස්සනා ඤාණයෙන් ත්‍රිලක්ෂණයට ආරෝපණය කරයි. අනිත්‍ය වශයෙන් දුක් වශයෙන් අනාත්ම වශයෙන් ශූන්‍ය වශයෙන් සලකා සංස්කාර ගන්නේවෙයි. හෙතෙම මෙසේ පටිසංඛාරානුපස්සනා ඤාණයෙන් සියලු සංස්කාර ශූන්‍යය හිස්යැයි බැහැර කරමින් මමය මාගේ යයි ගත යුත්තක් නැතැයි දැක බියත් කලකිරීමත් හැර සංස්කාරයන්හි උදාසීනව මධ්‍යස්ථවූයේ උපේක්ෂක වූයේ වෙයි. බිරිඳ අත්හළ පුරුෂයෙකු

මෙනි. පුරුෂයෙකුට ඉෂ්ට කාන්ත මනාප බිරියක් සිටී. ඔහු මොහොතක්වත් ඇගෙන් වෙන් වෙන්ට නොකැමැති වෙයි. ඔහු ඒ ස්ත්‍රිය වෙනත් පුරුෂයෙකු සමඟ සිටිනු හෝ හිඳිනු හෝ කථාකරනු හෝ සිනාසෙනු හෝ නිදනු හෝ දැක කිපී නොසතුටට පත් වේ. පසු කාලයෙහි ඒ ස්ත්‍රියගේ දොස් දැක මිදෙනු කැමැතිව ඇය නෙරපා හරියි. ඇය නොපිළිගනී. එතැන් පටන් කොයි කවුරු සමඟ හෝ කිසියම් යමක් හෝ කරනු දැක නොකිපෙයි. දැනගැනීමට දොම්නසට පත් නොවෙයි. දැකීමට උදාසීන වෙයි.

එපරිද්දෙන් ආයුෂ්මතුන් වහන්සේ සියලු සංස්කාරයන්ගෙන් මිදෙනු කැමැතිව පටිසංඛාරානුපස්සනාවෙන් සංස්කාරයන් සලකමින් මමය මාගේ යයි ගත යුත්තක් නොදැක භයත් නිර්වේදයත් පහකොට සියලු සංස්කාරයන් හි උදාසීනවෙයි. ඉන් අනතුරුව සංඛාරුපෙක්ඛා ඤාණය උපදී. මෙසේ මේ අට වැදෑරුම් නුවණ ඉපදීමෙන් අනතුරුව මනෝද්වාරාවජ්ජනය උපදී. මනෝද්වාරාවජ්ජනයට අනතුරුව පළමු ජවන් සිත උපදී. පළමු ජවන් සිතට අනතුරුව දෙවන ජවන් සිත උපදී. දෙවන ජවන් සිතට අනතුරුව තෙවන ජවන් සිත උපදී. තෙවන ජවන්සිත තෙවැදෑරුම් අනුලෝමයන් සමඟ ගොත්‍රභූ ඤාණය උපදී. කුමන අර්ථයකින් ගොත්‍රභූ නම් වෙයි ද? පුථුජ්ජන ගොත්‍රභූ යනු පුථජ්ජන භූමියයි. පුථුජ්ජන නාමය මැඩ අරිය ගොත්‍රභූ නම් ආර්‍ය්‍ය භූමියට ආර්‍ය්‍ය නාමයෙහි බැස අනුභව කරන හෙයින් ගොත්‍රභූ නම් වෙයි. ගොත්‍රභූඤාණයට අනතුරුව නිර්‍වාණාලම්බනය වෙයි. කවර අර්‍ථයකින් නිබ්බාන නම් වෙයි ද? වානයයි තණ්හාවට කියනු ලැබේ. සියලු කෙලෙස් දරථ සියලු අකුසල අභිසංස්කාර සමනය කරයි, සන්සිඳුවයි, නිවාලයි යනු නිබ්බානයයි. එය ආලම්බන වශයෙන් ත්‍රිවිධ කෙලශානුසය පළවා හැර දහසක් නයින් ප්‍රතිමණ්ඩිත වූම සෝතාපත්ති මාර්ගඥානය උපදී. සොතාපත්ති මාර්ග ඥානයෙන් ප්‍රහීණ වන ත්‍රිවිධ කෙලශයෝ කවරහු ද? සක්කායදිට්ඨි, විචිකිච්ඡා සීලබ්බතපරාමාසයයි.

කවර අර්ථය කින් සක්කායදිට්ඨි නම් වෙයි ද? සත්කායයෙහි

යම් දෘෂ්ටියක් වෙයි ද එය සක්කාය දිට්ඨියයි. ධර්මයන්ගේ යථා ස්වභාවය සොයමින් වෙහෙසෙයි නම් සැක කරයි නම් එය විචිකිච්ඡාවයි. බුදුන් දහම් සංඝයා කෙරෙහි ශික්ෂායෙහි පූර්වාන්තයෙහි අපරාන්තයෙහි පූර්වාන්තාපරාන්තයෙහි ඉධප්පච්චයතා පටිච්ච සමුප්පාදයෙහි සැක කරයි ද එය විචිකිච්ඡා නම්. මේ සසුනින් බැහැරව මහණ බමුණන්ගෙන් සීලයෙන් සුද්ධි ව්‍රතයෙන් සුද්ධිය ඇතැයි යන මෙබඳු දෘෂ්ටිය සීලබ්බතපරාමාසයයි. මේ තුන් කෙලෙශ නම්. අනුසය දෙක කුමක් ද? දිට්ඨානුසය ද විචිකිච්ඡානුසය ද වේ. පස් වැදෑරුම් සිත කුමක් ද? දිට්ඨිගතසම්ප්‍රයුක්ත සිත් සතරක් විචිකිච්ඡා සිතත් එක්ව පස් සිත දත යුතුය. මෙසේ ඒ සියල්ල සෝතාපත්ති ඤාණයෙන් නිරවශේෂයෙන් ප්‍රහීණ වෙයි. මෙහි සොතාපත්ති යනු කුමන අර්ථයකින් සොතාපත්ති වෙයි ද? ස්‍රෝතසට පැමිණියේයි සොතාපන්න නම්. තවද ස්‍රොතස පස් වැදෑරුම්ය. නදීසෝත, ගංගාසෝත, සමුද්දසොත, භවසොත, කණ්ණසොත වශයෙනි. මේ ආදිය ස්‍රොතස්ය. මේ හැර ධම් ස්‍රොතසටත් ඤාණ ස්‍රෝතසටත් පැමිණියේනුයි සෝතාපන්න නම්. මාර්ග ඤාණයෙන් පැමිණිය යුතු ඵලය සෝතාපත්තියයි කියනු ලැබේ. මාර්ගය නම් කෙලෙස් නසා යේනුයි මාර්ග නම්. නිර්වාණය සොයන්නේනුයි මාර්ග නම්. සෝතාපත්ති මාර්ග ඤාණයට අනතුරුව රාග දොෂ මෝහයන් තුනී වූ සකදාගාමී මාර්ගඥානය උපදී.

කවර අර්ථයකින් සකදාගාමී නම් වෙයි ද? එක් වරක්ම මෙලොවට පැමිණ දුක් කෙළවර කෙරේනු යි සකදාගාමී නම් වෙයි. සකදාගාමී මාර්ගඥානයට අනතුරුව කෙලෙශඛය අනුසයඛය චිත්තඛය ක්‍ෂය කොට අනාගාමී මාර්ගඥානය උපදී. කෙලෙශඛය කුමක් ද? කාමරාග කිලේසය ද ව්‍යාපාද කිලේසය ද වෙයි. අනුසයඛය කුමක් ද? කාමරාගානුසය සහ පටිඝානුසයයි. දෙසිත කුමක් ද? දොම්නස් සහිත දොසමුලික මෝහමුලික දෙසිතයි. ඒ සියල්ල අනාගාමී මඟ නැණින් අශේෂව ප්‍රහීණ වෙයි. අනාගාමී මගනැණට අනතුරුව කෙලෙස් පස ද අනුසය තුන ද සිත් පස ද නසා අර්හත්මාර්ගඥානය උපදී. කෙලෙස් පහ කුමක් ද? රූපරාග අරූපරාග මාන

උද්ධච්ච අවිජ්ජායි. මේ පස් කෙලෙස් රහත් මඟ ඤාණින් ප්‍රහීණ වෙයි. අනුසය තුන කුමක් ද? භවරාගානුසය මානානුසය අවිජ්ජානුසයයි. මේ තුන් අනුසය රහත් මඟඤාණින් ප්‍රහීණ වෙයි. සිත් පහ කුමක් ද? දිට්ඨිගතවිප්පයුත්ත සිත් සතරත් උද්ධච්ච සිතත්ය. මේ සිත් අරහත් මඟඤාණින් ප්‍රහීණ වෙයි. අර්හත්මාර්ගඥානයට අනතුරුව ඵලය උපදී.

හෙතෙම රහත් ඵලයට පත්ව රහත්ව ක්ෂීණාස්‍රව විය. කවර අර්ථයෙන් අරහා යයි කියනු ලැබේ ද? සියලු කෙලෙසුන් නැසූ නිසා අරහත් වෙති. අනාදිමත් කල්පයන්හි පැවැති සංසාරචක්‍රය නැසූ හෙයින් රහත් නම් වෙති. සිව්පසයට යෝග්‍ය නිසා රහත් නම් වෙති. පව් කිරීමෙහි රහසක් නැති හෙයින් අරහත් නම් වෙති. කවර අර්ථයකින් ක්ෂීණාස්‍රව වෙද්ද? සතර ආස්‍රවයන් ක්ෂය කළ හෙයින් ඛීණාසව යයි කියනු ලැබේ. සතර ආස්‍රව කුමක් ද? කාමාසව භවාසව දිට්ඨාසව අවිජ්ජාසවයි. කවර අර්ථයකින් ආසව නම් වෙයි ද? බොහෝ කල් පැවැති හෙයින් ආසව නම්. බෝහෝ කල් පැවැත්මේ අර්ථයෙන් ආසව නම් වන්නේ කෙසේ ද? යම්සේ භාග්‍යවතුන් වහන්සේ මහණෙනි, අවිද්‍යාවෙහි පෙර කෙළවර නොපැනෙයි. මෙතනින් පෙර අවිද්‍යාව නොවීය. ඉක්බිති පසුව හටගත්තේය. මහණෙනි, භවතණ්හාවෙහි භවදෘෂ්ටියෙහි පෙර කෙළවර නොපැනෙයි. මෙතැනින් පෙර භවතණ්හාව භවදෘෂ්ටිය නොවීය. ඉන්පසු හටගත්තේයයි වදාළ හෙයිනි. මෙපමණකින් දිගුකල් පැවැත්මෙන් ආසව නම් වීයයි දත යුතුය. වැගිරවීම් වශයෙන් හෝ ආසව නම් වේ. ඇසින් රූප වැගිරේ. වගුරුවයි. ගලාබසී. පවතී. එසේ කනින් ශබ්ද, නාසයෙන් ගඳ, දිවෙන් රස, කයින් ස්පර්ශ, මනසින් ධම් වැගිරෙයි. ගලා බසී. පවතී. මෙසේ වැගිරවීම් අර්ථයෙන් ද ආස්‍රවයයි කියනු ලැබේ. මේ සතර ආස්‍රව නුවණින් ප්‍රහීණ කරන ලදි. මුල් සුන් කරන ලදි. කරටිය කැපූ තල් ගසක් මෙන් කරන ලදි. නොහටගන්නා බවට පත් කරන ලදි. මතු නූපදින ස්වභාවයට පත් කරන ලදි. එහෙයින් ක්ෂීණාස්‍රවයයි කියන ලදි. උන්වහන්සේ අර්හත් වෙති. ක්ෂීණාස්‍රව වූහ. දුක පිරිසිඳ දත්හ. සමුදය ප්‍රහීණ විය. නිරෝධය

පසක් කරන ලදි. මඟ වඩන ලදි. කෘතකෘත්‍ය වෙති. කළ කිස නිමා විය. දෙවියන් සහිත ලෝකයාට පරම අග්‍ර දක්ෂිණෙය්‍ය වූහ.

නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස යන මෙහි නමො යනු, නම වන්දන සත්කාර බහුමාන සාදර පූජා ඇදිලි-බැඳීම් සාමීචිකථා වැඩීම් යනුයි. තස්ස යනු, උභය ලෝකාර්ථ සාධක දෙවිමිනිස් මුදුන්හි පිහිටි පරම ශාස්තෘදේවවූ ලෝකනාථයන් වහන්සේ දැක්වීමයි. භගවතො යනු, විපුල ජවන හාස තික්ඛණ ගම්භීර නිබ්බේධික යන ප්‍රඥා ඇති භාග්‍යවතුන් වහන්සේ නිදර්ශිතයි. නැතහොත් භගවතො යනු, සකල කෙලශ භග්ග හඤ්ජන විධ්වංසන විදාරණ විනාසන විමුඤ්චන කළ භාග්‍යවතුන් වහන්සේ නිදර්ශිතයි. අරහතො යනු, සංසාර චක්‍රය පවත්වන සකල කෙලශයන් මුලිනුපුටා ලූ භාග්‍යවතුන් වහන්සේ නිදර්ශිතයි. සම්මා යනු, මනා න්‍යායයෙන් කාරණයෙන් හේතුවෙන් ප්‍රත්‍යයෙන් ප්‍රතිපදාවෙන් හටගත් අග්‍රමාර්ගයෙහි පිහිටියාවූ නිරූපධීන් වහන්සේ නිදර්ශිතයි. බුද්ධස්ස යනු, උතුම් සත්තිස් බෝධිපාක්ෂික ධර්මධාරීන් වහන්සේ නිදර්ශිත යි.

මේ ව්‍යඤ්ජන පරිච්ඡේදය දැක්වීම යන අර්ථයි.

ජිනෝත්තමයන් වහන්සේට ද ධර්මයට හා සංඝයාට ද නමස්කාර කොට සම්බුද්ධ පරම්පරාගත සාතත්තකී නම් මහා නිදානය ප්‍රකාශ කරමි.

සම්පිණ්ඩිතනිදානකථාව නිමී

කැලණිය විශ්වවිද්‍යාලය
බෞද්ධ හා පාළි අධ්‍යයන අංශාධිපති
ශ්‍රී කල්‍යාණි රාජමහාවිහාරාධිපති
ආචාර්ය කොල්ලුපිටියේ මහින්ද සඞ්ඝරක්ඛිත ස්ථවිරයන් විසින්
හුදීජන පහන් සංවේගය පතා
සම්පිණ්ඩිතමහානිදාන නම් පාළිග්‍රන්ථය අළලා හෙළබසින් ලියූ
පැරණිබුදුසිරිත නිමියේයි.



